


# පර්සි ජැක්සන් සහ
# අවසන් ඔලිම්පියානුවා

පරිවර්තනය

**සචින්දි ආරියතිලක**

Scanned with CamScanner

පරිවර්තකගේ වෙනත් කෘති

- පර්සි ජැක්සන් සහ අකුණු හොරා
- පර්සි ජැක්සන් සහ රාක්ෂ සයුර
- පර්සි ජැක්සන් සහ ටයිටන්ගේ ශාපය
- පර්සි ජැක්සන් උපදෙවි ලිපිගොනු
- 'පර්සි ජැක්සන් සහ වංගගිරියේ සටන

අධ්‍යාපන අමාත්‍යාංශය

බලපත්‍රය

පොතේ නම : පර්සි ජැක්සන් සහ අවසන් ඔලිම්පියානුවා

කර්තෘ : සවින්දි ආරියතිලක — බලපත්‍ර අංකය : අප්‍රඋම/2/12448

1952 පෙබරවාරි මස 29 දින නිකුත් කරන ලද ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ වූ උපකෘත ස්වභාෂා ද්විභාෂා සහ ඉංග්‍රීසි පාඨශාලාවන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 19/ඊ ඡේදයේ යටතේ අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්තුමන් විසින් පාසල් පුස්තකාල පොතක් වශයෙන් අනුමත කරන ලදී.

2017 සැප්තැම්බර් මස 20 වන දින
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල
බලපත්‍රය අවලංගු වන දිනය 2022-09-19

විජිත වෙලගෙදර
ලේකම්
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය

Rick Riordan's Percy Jackson and the Olympians - Book 5

# THE LAST OLYMPIAN

Rick Riordan

# පර්සි ජැක්සන් සහ අවසන් ඔලිම්පියානුවා

පරිවර්තනය

සවින්දි ආරියතිලක

ආශිර්වාද ප්‍රකාශකයෝ
ගිරිඋල්ල පාර, මීරිගම
033 2275419

Scanned with CamScanner

## පර්සි ජැක්සන් සහ අවසන් ඔලිම්පියානුවා

පරිවර්තනය : සචින්ද්‍රි ආරියතිලක

ISBN : 978-955-679-113-2

ප්‍රථම මුද්‍රණය - 2016 පෙබරවාරි

ආශිර්වාද ප්‍රකාශන
නො.70, ගිරිඋල්ල පාර, මීරිගම
දුරකථන : 033 2275419

මෙම සිංහල පරිවර්තනයේ අයිතිය © සචින්ද්‍රි ආරිතිලක

සියලුම හිමිකම් ඇවිරිණි.

කර්තෘ ගේ අවසරයකින් තොරව මෙම පරිවර්තනය
සම්පූර්ණයෙන්ම හෝ එහි කොටස් හෝ
උපුටාගැනීම, මුද්‍රිත හෝ ලිඛිත, ඉලෙක්ට්‍රොනික හෝ
කවර මාධ්‍යයකින් හෝ පිටපත් කිරීම, පළ කිරීම, විකාශනය කිරීම,
අනුවර්තනය කිරීම හා ව්‍යාජ ලෙස සැකසූ පිටපත්
අලෙවි කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ

පරිගණක පිටු සැකසුම හා කවර නිර්මාණය
චාමින් විජේරත්න - 0777 577299

මුද්‍රණය
ආශිර්වාද ප්‍රින්ටර්ස්, 70, ගිරිඋල්ල පාර, මීරිගම.

## පරිවර්තිකාවගෙන්...

ලොව පුරා පාඨකයින් මිලියන ගණනකගේ හද බැඳගත් පර්සි ජැක්සන් කතා මාලාවේ අවසන් කොටස වන 'පර්සි ජැක්සන් සහ අවසන් ඔලිම්පියානුවා' පොතේ පරිවර්තන කටයුතු අවසන් කළ මේ මොහොතේ මගේ හිතට වදනින් කිව නොහැකි තරමේ සතුටක් මෙන් ම, පුංචි දුකකුත් දැනෙන්නේ පාඨක ඔබගේ මෙන් ම මගේ හදවතටත් ළබැඳි මිතුරෙකු, දඟකාර සොහොයුරෙකු ලෙසින් සමීප වූ පර්සි ජැක්සන්ට අදින් පසු සමු දීමට සිදුවන නිසාවෙනි.

වසරක කාලයක් තුළ මේ කතා මාලාවේ පොත් හය ම ඔබ අතට පත් කිරීමට මම දැරූ වෑයමට සහයෝගය දුන් අයට මේ මොහොතේ දී ස්තුති කළ යුතු ම ය. මාගේ ලේඛන කටයුතුවලට නිරතුරුව දිරි දෙමින් ළඟ රැඳෙන කසුන්ට, මා පරිවර්තනය කරන පිටුවෙන් පිටුවට කියවමින්, ගුණ දොස් විචාරන සොහොයුරිය ශිල්පාට සහ මගේ පවුලේ අයට තුති පිදීමට මෙය අවස්ථාවක් කර ගනිමි. පොතේ මුද්‍රණ හා ප්‍රකාශන කටයුතුවල බර උසුලන 'ආශිර්වාද ප්‍රකාශකයෝ' අධිපති චාමින් විජේරත්න මහතාට හා මෙලනි අමරතුංග මහත්මියට ද බෙහෙවින් ස්තුතිවන්ත වෙමි.

එමෙන් ම, ලොකු කුඩා භේදයකින් තොරව 'පර්සි ජැක්සන්' ආදරයෙන් වැලඳ ගත් පාඨක ඔබටත් ඒ ස්තුතිය නිතැතින් ම හිමි වේ. මගේ පරිවර්තන රසවිඳ ඔබ ලබා දුන් ප්‍රතිචාර මගේ ලේඛන කලාවට අති මහත් රුකුලක් වූ බව නොකියා ම බැරි ය.

සචින්ද්‍රි ආරියතිලක
මැදගහවතුර
නාවලපිටිය

Scanned with CamScanner

# 01

# පුපුරන ද්‍රව්‍ය සමඟ ගිය නැවේ සවාරිය

ලෝක විනාශය පටන් ගත්තේ පෙගසස් කෙනෙක් මගේ කාරයේ වහලය මතට ගොඩ බැවට පස්සෙයි.

ඒ වෙනකල් ම මම හිටියේ වැදගත් හවස් වරුවක් ගත කරමිනුයි. අවුරුදු දහසය ලබන්න තවත් සතියක කාලයක් තිබුණු නිසා මට නීත්‍යානුකූලව වාහන පදවන්න අවසර තිබුණේ නැහැ, ඒත් මගේ අම්මා සහ බාප්පා, පෝල්, මාවයි මගේ යාළුවා රේචල්වයි දකුණු වෙරළේ තිබුණු පෞද්ගලික වෙරළ තීරයකට කැඳවාගෙන ගියාට පස්සේ පෝල් මට එයාගේ ප්‍රියස් කාරය කෙටි දුරක් පදවාගෙන යන්න ඉඩ දුන්නා.

දැන්, ඔයා හිතන්නේ මොනවද කියලා මම දන්නවා, අයියෝ, එයා නම් කිසිම වගකීමක් නැති මනුස්සයෙක් නේ, බ්ලාහ්, බ්ලාහ්, බ්ලාහ්. ඒ වුණාට පෝල් මං ගැන සෑහෙන හොඳින් දන්නවා. මම රාක්ෂයින්ව පෙති ගහන හැටි සහ පුපුරා යන පාසල් ගොඩනැගිලිවලින් එළියට පනින හැටි පවා එයා දැකලා තියෙනවා. ඉතින් මම ජීවිතේට කරලා තියෙන අනතුරුදායක ම වැඩේ කාරයක් යාර දෙතුන් සීයක් පදවාගෙන යන එක නෙවෙයි කියලා එයා තේරුම් අරන් ඉන්න ඇති.

කොහොම හරි, රේචල් සහ මම ඉදිරියට ම පදවාගෙන යමින් සිටියා. එදා අගෝස්තු මාසයේ උණුසුම් දවසක්. රේචල් එයාගේ රතු කොණ්ඩය පිටුපසට කර පෝනි ටේලයකට ගැට ගසාගෙන, එයාගේ

Scanned with CamScanner

පිහිනුම් ඇඳුම් කට්ටලයට උඩින් සුදු පාට කමිසයක් ඇඳගෙන සිටියා. එයාට තිබුණේ රන් ඩ්‍රැච්මා මිලියනයක පෙනුමක්.

"ඔන්න, ඔය හරියෙන් නවත්තන්නකෝ!" එයා මට කිවුවා.

අපි අත්ලාන්තික් සයුරට මුහුණලා පිහිටි උස් වැටියක් මත කාරය නතර කළා. සාගරය කියන්නේ කවදත් මම කැමති ම තැන්වලින් එකක්, ඒත් අද ඒක පෙනුණේ වෙනදාටත් වඩා ලස්සනටයි - ඒක වීදුරුවක් තරම් සුමටව කොළ පාටින් දිලිසෙමින් තිබුණේ හරියට මගේ තාත්තා ඒක අපි වෙනුවෙන් ම නිසලව තියාගෙන හිටියා වගෙයි.

අහ්, මට කියන්න බැරි වුණා නේ, මගේ තාත්තා තමයි පොසෙයිඩන්. එයාට ඒ වගේ වැඩ කරන්න පුළුවන්.

"ඉතින්," රේචල් මට හිනාවක් පෑවා. "අර ආරාධනාව ගැන මොකද?"

"ඔහ්... හරි." මම උද්‍යෝගිමත් බවක් පෙන්වන්න උත්සාහ කළා. මං අදහස් කළේ, එයා මට ශාන්ත තෝමස්වල තිබුණු එයාලගේ පවුලේ නිවාඩු නිකේතනයේ දවස් තුනක් ගත කරන්න යන්න කතා කරලයි තිබුණේ. ඒ වගේ අවස්ථා මට හැමදාම ලැබෙන ඒවා නෙවෙයි. අරුමෝසම් නිවාඩුවක් කියලා මගේ පවුලේ අය හිතුවේ ලෝන්ග් අයිලන්ඩ් වෙරළෙන් හොයාගත්ත ලාබ කැබින් කාමරයක, කුලියට ගත්ත චිත්‍රපටි කීපයකුයි, සීත කළ පීසා දෙක තුනකුයි එක්ක සති අන්තයක් ගත කරන එකයි. ඒත් මෙන්න රේචල්ගේ පවුලේ අය මාව බටහිර ඉන්දීය කොදෙව්වලට එක්ක යන්න කැමැත්තෙන් ඉන්නවා.

ඒ ඇරත් මට නිවාඩුවක උවමනාව බරපතළ ලෙස දැනුණා. මගේ ජීවිතේ අමාරු ම ගිම්හානය වුණේ මේකයි. දවස් දෙක තුනකට හරි විරාමයක් ගන්නවා කියන අදහස පවා ආසා හිතෙන දෙයක් වුණා.

ඒ වුණත්, දැන් ඕනෑ ම දවසක මොකක් හෝ ලොකු දෙයක් සිදු වෙන්න නියමිතව තිබුණා. මම හිටියේ ඕනෑ ම මොහොතක මෙහෙයුමකට 'කැඳවීමක්' බලාපොරොත්තුවෙන්. මට අවුරුදු දහසය ලැබුවා ම, නරක දේවල් සිද්ධ වෙනවා කියලා අනාවැකියක කියවිලයි තිබුණේ.

"පර්සි," එයා කතා කළා, "මේ කාලේ ඒ හැටි හොඳ නැහැ කියලා මම දන්නවා. ඒත් ඉතින් ඔයාට ඒක කොයි වෙලාවෙත් නරකයි නේ, නේද?"



එයා කියපු කතාවත් හරි.

"ඇත්තට ම මට යන්න ඕනෑ," මම දිවුරුවා. "ඒත් මේ-"

"යුද්ධෙ."

මම ඔළුව වැනුවා. ඒ ගැන කතා කරන්න මම අකමැති වුණත් රේචල් ඒක දැන සිටියා. අනිත් මනුෂ්‍යයෝ වගේ නෙවෙයි, රේචල්ට මීදුම හරහා - ඒ කියන්නේ මනුෂ්‍ය පෙනීම විකෘති කරන මායා පටලය හරහා දකින්න හැකියාව තිබුණා. එයා රාක්ෂයින්ව දැකලා තිබුණා. ටයිටන්ලා සහ එයාලගේ මිත්‍ර පාක්ෂිකයන්ට විරුද්ධව සටන් කරන උප දෙවිවරුන්ගෙන් සමහරක් එයාට මුණ ගැහිලත් තිබුණා. පහුගිය ගිම්හානේ කෑලි කැපිලා හිටපු ක්‍රෝනොස් රජා භයානක අලුත් රූපයක් ඇතිව මිනී පෙට්ටියෙන් නැගිටපු වෙලාවේ පවා රේචල් එතැන සිටියා. ඒ වගේම එයා ක්‍රෝනොස්ගේ ඇහැට නිල් පාට ප්ලාස්ටික් පනාවකින් දමා ගහලා මගේ නිත්‍ය ගෞරවය උපයාගෙන තිබුණා.

එයා මගේ බාහුව උඩින් අතක් තැබුවා. "ඒ ගැන හිතලා බලන්නකෝ, හරි ද? අපි තව දවස් දෙකක් යනකල් පිටත් වෙන්නෙ නැහැ. මගේ තාත්තා..." එයාගේ හඬ ඇන හිටියා.

"එයා ඔයාට වද දෙනව ද?" මම ඇහුවා.

රේචල් ඔළුව හෙල්ලුවේ අප්පිරියාවෙන්. "එයා මට හොඳින් සලකන්න බලනවා, ඒක ඔක්කොටම වඩා නරකයි. එන වාරෙ දී මාව ක්ලැරියන් බාලිකා විද්‍යාලෙට යවන්නයි එයාට ඕනෑවෙලා තියෙන්නෙ."

"ඔයාගේ අම්මා ගිය ඉස්කෝලෙට?"

"ඒක මේ නිව් හැම්ෂයර්වල තියෙන උසස් පන්තියේ ගෑනු ළමයින්ගේ මොට්ට නිමැවුම් පාසලක්. මම නිමැවුම් පාසලක ඉන්නවා ඔයාට හිතේ මවා ගන්නවත් පුළුවන් ද?"

ඒක මහා මෝඩ අදහසක් බව මමත් පිළිගත්තා. රේචල් කියන්නේ නාගරික කලා ව්‍යාපෘතිවලට යන, ඉන්න තැනක් නැතිව පාරේ ඉන්න මිනිස්සුන්ට කන්න දෙන, 'වඳ වී යාමේ තර්ජනයට මුණ පා සිටින කහ-උදරැති කොට්ටෝරුවන්ව බේරාගැනීමේ' පෙළපාළිවලට යන ජාතියේ කෙල්ලෙක්. එයා ගවුමක් ඇඳගෙන ඉන්නවා මම කවදාවත් දැකලා තිබුණේ නැහැ. ඉතින් එයා ජේත්තුකාර සමාජ පැලැන්තියක කෙනෙක් වෙන්න ඉගෙන ගන්නවා හිතේ මවාගන්න මට හරි ම අමාරු වුණා.

එයා සුසුමක් හෙළුවා. "එයා හිතන් ඉන්නේ මං වෙනුවෙන් හොඳ වැඩ ටිකක් කරොත්, මට දුක හිතිලා එයා කියන දේ අහයි කියලා."

"ඔයාලගේ ගමනට මාවත් එකතු කරගන්න එයා කැමති වුණේ ඒ නිසා?"

"ඔව්... ඒත්, පර්සි, ඔයා ඒක මට කරන ලොකු උදව්වක්. ඔයත් අපි එක්ක ගියොත් කොච්චර හොඳ ද. ඇරත්, මට ඔයා එක්ක කියන්න දෙයක් තියෙනවා-" එයා හිටි අඩියේ ම කතාව නතර කළා.

"කියන්න දෙයක් තියෙනවා?" මම ඇහුවා. "ඔයා කියන්නේ... ඒ ගැන කතා කරන්න අපිට සෙන්ට් තෝමස්වලට ම යන්න වෙන තරමට ඒක බරපතළ දෙයක් ද?"

එයා තොල් දෙක තදින් පියවා ගත්තා. "බලන්න, දැනට ඒක අමතක කරලා දාන්න. අපි සාමාන්‍ය කපල් එකක් වගේ බොරුවටවත් අඟවමු. අපි මේ ඇවිදින්න ඇවිල්ලා ඉන්නේ. දැන් අපි මුහුද දිහා බලාගෙන ඉන්නේ. ඒ වගේම මෙහෙම එකට ඉන්න ලැබුණු එකටත් අපිට සතුටුයි."

මොකක් හෝ දෙයක් එයාට වධ දෙන බව මට තේරුණා, ඒත් එයා නිර්භීත හිනාවක් මවා ගත්තා. ඉර එළියට එයාගේ කොණ්ඩය පෙනුණේ ගිනි දලු වගෙයි.

මේ ගිම්හානයෙන් වැඩි කාලයක් අපි එක්ව ගත කරලා තිබුණා. ඇත්තට ම, එහෙම කරන්න මම සැලසුම් කරලා තිබුණේ නම් නැහැ, ඒත් කඳවුරේ තත්ත්වය බරපතළ වෙන්න වෙන්න, රේචල්ට ඇමතුමක් දීලා එළියට ගිහින් හුස්මක්-කටක් ගන්න මට දැනුණ උවමනාවත් වැඩි වුණා. මාව පන්චිං බෑගයක් කරගෙන හිටපු රාක්ෂයින්ගෙන් එපිට සාමාන්‍ය මනුෂ්‍යයින්ගේ ලෝකයක් තියෙන බව මට ම සිහිපත් කර දෙන්න මට ඕනෑ වුණා.

"හරි," මම කිවුවා. "එහෙනම් මේ සාමාන්‍ය හවස් වරුවක් ගත කරන සාමාන්‍ය කපල් එකක්."

එයා ඔළුව වැනුවා. "එතකොට... මේ දෙන්නට දෙන්නා කැමතියි කියලා නිකමට වගේ හිතුවොත්, ඒ මෝඩ කොල්ලගෙන් හාද්දක් ගන්න කෙල්ල මොනවද කරන්න ඕනෑ, අහ්?"



"ඔහ්..." මට දැනුණේ මාවත් නිකං ඇපලෝගේ පූජනීය හරකෙක් වෙලා වගෙයි - මන්ද බුද්ධික, ඔල මොට්ටල සහ තද රතු පාට වෙලා. "මේ..."

මම රේචල් ගැන හිතලා නැහැ වගේ බොරුවට රඟපාන්න මට බැහැ. මම දැනගෙන හිටපු... සමහර ගෑනු ළමයින්ට වඩා එයත් එක්ක ඉන්න හරි ම පහසුයි. එයා එක්ක ඉන්නකොට මට මහන්සි වෙලා වැඩ කරන්නවත්, මගේ කට පරිස්සම් කරගන්නවත්, එයා කල්පනා කරන්නේ මොනවද කියලා තේරුම් ගන්න මගේ මොළේ පහුරු ගාන්නවත් ඕනෑ වුණේ නැහැ. රේචල් ගොඩක් දේවල් හැංගුවේ නැහැ. එයාට හැඟෙන දැනෙන දේ ගැන එයා ඔයාට දැනෙන්න ඉඩ අරිනවා.

මම ඊළඟට මොනවා කරන්න ඉඩ තිබුණ ද, මට විශ්වාසයක් නැහැ- ඒත් ඒ වෙලාවේ මම කොයි තරම් කලබල වෙලා ද හිටියේ කියනවා නම්, අහසෙන් පාත් වුණ යෝධ කළු රූපයේ කුර හතර ප්‍රියස් කාරයේ වහලය උඩට වුම්ප්-වුම්ප්-ක්‍රන්ච්! හඬින් ගොඩබාන තුරු ම මට දැනුනේ නැහැ.

''හේයි, බොස්,'' මගේ ඔළුව ඇතුළෙන් හඬක් කතා කළා. ''මරු කාර් එක!''

බ්ලැක්ජැක් කියන පෙගසස් මගේ පරණ යාළුවෙක්. ඒ නිසා එයා මේ දැන් කාරයේ වහලය මත ඇති කරපු වළවල් ගැන වැඩිය තරහා නොගෙන ඉන්න මම උත්සාහ කළා; ඒත් මගේ බාප්පා නම් ඒ ගැන සතුටු වෙයි කියලා මම හිතුවෙ නැහැ.

"බ්ලැක්ජැක්," මම සුසුමක් හෙළුවා. "ඔයා මොනවද-"

එයාගේ පිට මත සිටි කෙනාව මම දැක්කේ එතකොටයි. මගේ දවස වඩාත් සංකීර්ණ වෙන්න යන බව ඒ වෙලාවේ මට තේරුණා.

"කොහොමද, පර්සි?"

චාර්ල්ස් බෙකන්ඩොර්ෆ්, හෙෆාස්ටස් කැබිනයේ ජ්‍යෙෂ්ඨ උපදේශක කියන්නේ ගොඩක් රාක්ෂයින්ට අම්මා මුත්තා සිහි කරවන කෙනෙක්. එයාගේ යෝධ ඇඟ හැම ගිම්හානයක ම කම්මලේ වැඩ කිරීමෙන් හැඩිදැඩි වූ මස්පිඬුවලින් පිරිලා. මට වඩා අවුරුදු දෙකක් වැඩිමල් වූ එයා කඳවුරේ හිටපු හොඳ ම යුද සන්නාහ සාදන්නෙක්. එයා අති දක්ෂ යාන්ත්‍රික උපකරණත් හදලා තිබුණා. මීට මාසෙකට කලින්, එයා රාක්ෂ කණ්ඩායමක් රට හරහා රැගෙන යමින් තිබුණු

සංචාරක බසයක නාන කාමරයට ග්‍රීක ගිනි බෝම්බයක් සවි කරලා තිබුණා. වැසිකිළියට ගිය පළවෙනි හාර්පියා ෆ්ලෂ් කරන බොත්තම ඔබපු හැටියේ ඇති වූ පිපුරුමෙන් පස්සේ ක්‍රෝනොස්ගේ යක්ෂ හමුදා රංචුවේ කැලිවත් හොයාගන්න නැති වුණා.

බෙකන්ඩොර්ෆ් හිටියේ ප්‍රහාරයකට ගැළපෙන්න සැරසිලයි. එයා ලෝකඩ උර තහඩුවක් සහ හිස්වැසුමක් සමඟ කළු පාට හමුදා මෝස්තරයේ කලිසමක් හැඳ සිටියා. එයාගේ පසෙකින් කඩුවක් ගැට ගසා තිබුණා. එයා පුපුරන ද්‍රව්‍ය මල්ල උරහිසක එල්ලාගෙන සිටියා.

"වෙලාව හරි ද?" මම ඇහුවා.

එයා බරපතළ තාලෙට ඔළුව වැනුවා.

මගේ උගුරේ ගුළියක් හිර වෙනවා වගෙයි මට දැනුණේ. මේක කොයි වෙලාවේ හරි එන බව මම දැනගෙනයි හිටියේ. අපි සති ගාණක් තිස්සේ ඒක සැලසුම් කරා, ඒත් මගේ හිතේ පැත්තක් බලාපොරොත්තු වුණේ ඒක කවදාවත් සිදු නොවෙනවා නම් හොඳයි කියලයි.

රේචල් බෙකන්ඩොර්ෆ් දිහා බැලුවා. "හායි!"

"ඔහ්, හේයි. ඔයා රේචල් වෙන්න ඕනෑ. පර්සි මට කියලා තියෙනවා... අහ්, මං කිවුවෙ එයා ඔයා ගැන මතක් කරලා තියෙනවා."

රේචල් ඇහි බැමක් එසෙව්වා. "ඇත්තට? හොඳයි නේ." එයාගේ බැල්ම ප්‍රියස් රථයේ වහලයට කුරයෙන් තට්ටු කරමින් සිටි බ්ලැක්ජැක් වෙතට හැරුණා. "එහෙනම්, මං හිතන්නෙ ඔයාලට දූන් ලෝකෙ බේරගන්න යන්න තියෙනවා."

"හුඟක් දුරට," බෙකන්ඩොර්ෆ් එකඟ වුණා.

මම කර කියාගන්න දෙයක් නැතිව රේචල් දිහා බැලුවා. "ඔයා මගේ අම්මට කියනව ද-"

"මම එයාට කියන්නම්. එයා ඒකට පුරුදු වෙලා ඇති කියලා මට විශ්වාසයි. වහලෙට වුණේ මොකක්ද කියලා මම පෝල්ටත් කියන්නම්කෝ."

මම ස්තූතිය පාමින් ඔළුව වැනුවා. පෝල් මට එයාගේ කාරය ණයට දුන්න අන්තිම වතාව මේක වෙයි කියලා මට හිතුණා.

"සුබ පැතුම්!" මම ඒකට ප්‍රතිචාර දක්වන්නත් කලින් රේචල් මාව සිපගත්තා.



"දූන්, ගියොත් හොඳයි, අර්ධ-ලෝහිතයෝ. මං වෙනුවෙන් රාක්ෂයෝ ටිකක් මරලා එන්න."

මට අන්තිමට එයාව දකින්න ලැබෙද්දි, එයා දෑත් පපුව හරහා බැඳගෙන, ප්‍රියස් රථයේ රියැදුරු අසුන අසල අසුනේ වාඩි වී, බ්ලැක්ජැක් බෙකන්ඩොර්ෆ්ව සහ මාව රැගෙන අහසේ ඉහළට ම කැරකෙමින් පියාඹන දිහා බලා සිටියා. රේචල්ට මාත් එක්ක කතා කරන්න ඕනෑ වුණේ මොනවා ගැන ද කියලත්, ඒ ගැන දැන ගන්න තරම් කාලයක් මම ජීවත් වෙයි ද කියලත් මම පුදුම වුණා.

"ඉතින්," බෙකන්ඩොර්ෆ් කිවුවා, "මං හිතන්නේ අර පුංචි ජවනිකාව ගැන මම ඇනබෙත්ට කියනවට ඔයා කැමති නැතුව ඇති."

"ඔහ්, දෙයියනේ," මම කෙඳිරුවා. "ඒ ගැන නම් හිතන්නවත් එපා."

බෙකන්ඩොර්ෆ් තනියම හිනා වුණා. අපි දෙන්නා එක්ව අත්ලාන්තික් සයුරට ඉහළ අහසේ ඈතට පියාසර කළා.

★★★

අපිට අපේ ඉලක්කය දකින්න ලැබෙද්දි කළුවර වැටෙන්න ළං වෙලා. ඈත ක්ෂිතිජයේ ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා දිලිසෙමින් තිබුණා- ඒක කහ සහ සුදු පැහැයෙන් ආලෝකමත් කළ යෝධ සංචාරක නැවක්. ඈතින් බලද්දි ඒක ටයිටන් රජාගේ මූලස්ථානය නෙවෙයි, නිකං ම සාද පවත්වන නැවක් විතරයි කියලා ඔයාට හිතේවි. ඊට පස්සේ ඔයා ඒක කිට්ටුවට ගියා ම නැව ඉදිරිපසින් තබා ඇති යෝධ රූපය ඔයාට දකින්න ලැබේවි- ඒක ග්‍රීක කයිටෝනයකින් සැරසුණු, තද පාට කෙස් කලඹක් ඇති තරුණියකගේ ප්‍රතිමාවක්. දම්වැල්වලින් ගැට ගසා සිටි එයාගේ මුහුණේ භීතියට පත් බැල්මක් සටහන්ව තිබුණේ හරියට එයාට රැගෙන යන්න සිදු වී ඇති රාක්ෂයින්ගේ ගඳ දැනෙනවා වගෙයි.

ආයෙමත් ඒ නැව දකිද්දි මගේ බඩවැල් ගැට ගැහෙනවා වගෙයි දැනුණේ. මම ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩාවේ දි දෙපාරක් ම මැරෙන්න ගියා. දූන් ඒක එක එල්ලේම නිව්යෝක් බලා යාත්‍රා කරමින් තිබුණා.

"කරන්න ඕනෑ මොනවද කියලා ඔයා දන්නවා නේ?" බෙකන්ඩොර්ෆ් සුළඟට ඉහළින් මොර ගසා ඇහුවා.

මම ඔළුව වැනුවා. අපි නිව් ජර්සිවල නෞකාගාරයේ තිබුණු අත්හැර දමූ නැව් අපේ ඉලක්ක ලෙස පාවිච්චි කරමින් මෙයාට පෙරහුරු

කර තිබුණා. අපිට ඇත්තේ කොයි තරම් පුංචි කාලයක් ද කියලා මම දැනගෙන හිටියා. ඒ වුණත් ක්‍රෝනොස්ගේ ආක්‍රමණය පටන් ගැනීමට කලින් ම අවසන් කරන්න අපිට ඇති හොඳ ම අවස්ථාව මේක බවත් මම දැන සිටියා.

"බ්ලැක්ජැක්," මම කතා කළා, "අපිව පහළ ම නැව් අවරය උඩට බස්සන්න."

හරි, බොස්, එයා කිවුවා. කොල්ලෝ, මේ බෝට්ටුව මට පෙනෙන්න බැහැ.

අවුරුදු තුනකට කලින්, ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා නැව ඇතුළේ වහලෙක් විදිහට හිර වෙලා හිටිය බ්ලැක්ජැක් අන්තිමේ දි මගේ යාළුවන්ගෙන් සහ මගෙන් ලැබුණු පොඩි උදවුවෙන් එතැනින් පැන ගත්තා. මේක ඇතුළට ආපහු සැරයක් යනවට වඩා එයාගේ කේශර ටික චූටි පෝනියෙකුගේ වගේ ගොතන්න ඉඩ දෙන්න එයා කැමති වෙයි කියලා මට හිතුණා.

"අපි එනකල් ඉන්න එපා," මම එයාට කිවුවා.

''ඒත්, බොස්-''

"මාව විශ්වාස කරන්න," මම කිවුවා. "අපිට තනියම මේකෙන් පැන ගන්න පුළුවන්."

පියාපත් අකුළාගත් බ්ලැක්ජැක් කළු පාට වල්ගා තරුවක් වගේ නැව දෙසට වේගයෙන් පහත බැස්සා. හුළඟ මගේ කන් ඇතුළේ උරුවම් බෑවා. නැවේ ඉහළ තට්ටුවල රාක්ෂයින් මුර සංචාරයේ යෙදී ඉන්නවා මට පෙනුණා- ඩ්‍රැකනෙයි සර්ප ගැහැනු, යම බල්ලෝ, යෝධයින් සහ ටෙලිකීනයෝ ලෙස හඳුන්වන මනුස්ස පෙනුම ඇති සීල්-රාක්ෂයෝ එතැන සිටියා- ඒත් අපි උන්ව පසු කරගෙන කොයි තරම් වේගයෙන් ඇදී ගියා ද කියනවා නම් ඒ එකෙක්වත් අනතුරු ඇඟවීමේ සංඥා නාද කළේ නැහැ. නැවේ පහළ ම තට්ටුවට වෙඩිල්ලක් වගේ ඇදී ගිය බ්ලැක්ජැක් පියාපත් දෙපසට විහිදුවා සැහැල්ලුවෙන් ගොඩ බෑවා. බඩ දඟලමින් ඔක්කාරයට එන ගතියක් දැනෙද්දී මම අසු පිටින් බැස්සා.

සුබ පැතුම්,බොස්, බ්ලැක්ජැක් කිවුවා. ඔයාව මස් ගොඩක් කරන්න උන්ට ඉඩ දෙන්නෙපා!

එහෙම කියපු මගේ පරණ යාළුවා රෑ අහසට ඉගිලුණා. මම මගේ පැන සාක්කුවෙන් අරගෙන කොපුව ගැලවූවා, ඒත් එක්ක ම



රිප්ටයිඩ් එහි සම්පූර්ණ ප්‍රමාණයට පැන නැංගා- ගොම්මනේ දිලිසෙන මාරාන්තික දිව්‍යමය ලෝකඩ අඩි තුනක්.

බෙකන්ඩොර්ෆ් සාක්කුවෙන් කඩදාසි කැබැල්ලක් එළියට ගත්තා. ඒක සිතියමක් වෙන්න ඇති කියලා මම හිතුවත්, ටිකකින් මට තේරුණේ ඒක ඡායාරූපයක් කියලයි. එයා මලානික එළිය මැදින් ඒ දිහා- ඇෆ්‍රොඩයිට්ගේ දුවෙක් වුණ සිලේනා බියුරිගාඩ්ගේ සිනාමුසු මුහුණ දිහා බලා සිටියා. අවුරුදු ගාණක් තිස්සේ අපි එයාලට "මෝඩයෝ, ඔයාලා දෙන්නට දෙන්නා කැමතියි!" කියලා වදේ ගැහුවට පස්සේ, පහුගිය ගිම්හානයේ දී ඒ දෙන්නා යාන්තම් සෙට් වුණා. දැන් සිදුවෙමින් තිබුණු අනතුරුදායක මෙහෙයුම් සියල්ල මැද වුණත් බෙකන්ඩොර්ෆ් වෙන කවරදාටත් වඩා සතුටින් ඉන්න බව මට දකින්න ලැබුණා.

"අපි ආපහු කඳවුරට යනවාමයි," මම පොරොන්දු වුණා.

මම එක තත්පරයකට එයාගේ ඇස්වල කණගාටුවක් දැක්කා. ඊට පස්සේ එයා පරණ පුරුදු විශ්වාසී හිනාවෙන් මූණ පුරවා ගත්තා.

"ඕන ඔට්ටුවක්," එයා කිවුවා. "අපි ගිහිල්ලා ක්‍රෝනොස්ව ආපහු කෑලි මිලියනේකට පුපුරවලා දාමු."

★★★

බෙකන්ඩොර්ෆ් පෙරමුණ ගත්තා. පුහුණුවීම් කරලා තිබුණු විදිහට ම අපි පටු කොරිඩෝවක් දිගේ සේවා ඉණිමඟක් ළඟට ගියා. ඒත් අපිට ඉහළින් හඬවල් ඇසෙද්දී අපි ගල් ගැසුණා.

"උඹලගේ නහයවල් මොනවා කිවුවත් මට කමක් නෑ!" අර්ධ-මිනිස්, අර්ධ-බලු කටහඬක් ගෙරෙව්වා- ටෙලිකීනයෙක්. "උඹලට අර්ධ-ලෝහිතයෙක්ගේ ඉව වැටිච්ච අන්තිම වතාවේ එතැන තිබුණේ මස් පෙති සැන්ඩ්විච් එකක් විතරයි!"

"මස් පෙති සැන්ඩ්විච් ෂෝක්!" දෙවෙනි කටහඬක් ගෙරෙව්වා. "ඒත් අම්මා පල්ලා මේක නම් අර්ධ-ලෝහිතයන්ගෙ ම ඉවක්. උන් නැව් තට්ටුවේ ඉන්නවා!"

"බාහ්, උඹලගේ මොළේ විතරයි නැව් තට්ටුවේ නැත්තේ!"

උන්ගේ වාදය දිගින් දිගට ම ඇදී යද්දී බෙකන්ඩොර්ෆ් පඩිපෙළ පහළට අත දිගුකර පෙන්වූවා. අපි හැකි තරම් නිහඬව පහළට බැස්සා. තට්ටු දෙකක් පසු කර යද්දී ටෙලිකීන්ලාගේ හඬවල් නැසී යන්න පටන් ගත්තා.

අන්තිමේ දී, අපි ලෝහමය දොරටුවක් ළඟට ආවා. ''එන්ජින් කාමරය'' බෙකන්ඩොර්ෆ් තොල් මැතිරුවා.

එය තිබුණේ අගුළු දමලයි, ඒත් මල්ල තුළින් දම්වැල් කපනයන් කීපයක් එළියට ගත් බෙකන්ඩොර්ෆ් එහි අගුළ දෙකට කැපුවේ බටර් කපනවා වගෙයි.

ඇතුළත ධාන්‍ය ගබඩාවක් තරම් විශාල කහ පාට ටර්බයින් පේළියක් ගුමු හඬ දෙමින් කැලතෙමින් තිබුණා. එයට විරුද්ධ පස බිත්තියේ පීඩන පරිමාණ සහ පරිගණක පෙළ ගසා තිබුණා. ටෙලිකීනයෙක් පාලන පුවරුවක් මතට නැමීගෙන සිටියා, ඒත් එයා කරමින් සිටි රාජකාරිය තුළ කොයි තරම් ගැඹුරට ගිලී සිටියා ද කියනවා නම් අපිව එයාගේ අවධානයට හසු වුණේ නැහැ. සිනිඳු කළු සීල් ලොම් සහ මහත කකුල් කෙටි තිබුණු එයා අඩි පහක් විතර උසයි. එයාගේ හිස ඩොබ'මන් බල්ලෙකුගේ වගේ වුණත් එයාගේ තිය පහුරු පිරුණු දැත් නම් මනුස්ස පෙනුම ගත්තා. එයා ගොරවමින් සහ කොඳුරමින් යතුරු පුවරුවට කොටමින් සිටියා. සමහරවිට එයා සමාජ ජාලා වෙබ් අඩවියක් හරහා යාළුවන්ට පණිවුඩ යවමිනුයි ඉන්න ඇත්තේ.

මම පියවරක් ඉදිරියට තැබුවා, ඒත් එක්ක ම එයා තිගැස්සුණේ යම්කිසි වරදක ඉව දැනිලා වෙන්න ඇති. එයා පසෙක තිබුණු ලොකු රතු පාට අනතුරු ඇඟවීමේ සංඥා බොත්තම වෙතට පැන්නා, ඒත් මම එයාගේ පාර අවහිර කළා. එයා දත් අතරින් පිඹිමින් මට පහර දෙන්න පැන්නත් රිප්ටයිඩ්ගෙන් වැදුණු එක ම පහරින් එයා දූවිල්ලකට කුඩු වී ගියා.

"එකෙක් ඉවරායි," බෙකන්ඩොර්ෆ් කිවුවා. "තව පන්දාහක් විතර ඉතුරුයි." එයා කොළ පාට උකු දියරයක් පිරවූ බරණියක් මට දැමුවා- ග්‍රීක ගින්දර, ලෝකයේ ඇති වඩාත්ම භයානක මායා ද්‍රව්‍යයන්ගෙන් එකක්. ඊට පස්සේ එයා මට උප දෙවි වීරයින්ට අත්‍යවශ්‍ය තවත් ආම්පන්නයක් විසි කළා- ගම් පටි රෝලක්.

"ඕක පාලන පුවරුවට අලවන්න," එයා කිවුවා. "මම ටර්බයින් ගැන බලාගන්නම්."

අපි වැඩ පටන් ගත්තා. තෙතමනයෙන් සහ උණුසුමෙන් පිරුණු ඒ කාමරය ඇතුළේ දී වැඩි වෙලාවක් යන්න කලින් ම අපිව දාඩියෙන් පෙඟුණා.



නෞකාව නොනැවතී ඉදිරියට යාත්‍රා කරමින් තිබුණා. පොසෙයිඩන්ගේ පුතා වුණ නිසා ම මුහුදේ දී මගේ දිශා පිළිබඳ දැනීම අංග සම්පූර්ණයි. ඒ කොහොමද කියලා නම් මගෙන් අහන්න එපා, ඒත් අපි සිටියේ උතුරු අක්ෂාංශ 40.19 සහ බටහිර දේශාංශ 71.90 මත, නාවික සැතපුම් දහ අටක වේගයෙන් ඉදිරියට යමිනුයි. ඒ කියන්නේ එළි වෙද්දී මේ නැව නිව්යෝක් වරායට සේන්දු වේවි. අපිට මෙය නවත්වන්න ඇති එක ම අවස්ථාව මේක විතරයි.

මම දෙවෙනි ග්‍රීක ගින්දර බරණිය පාලන පුවරුවට අමුණා අවසන් වෙද්දි ම ලෝහමය පියගැට මත පාද වදින හඬක් ඇසුණා- පඩිපෙළ දිගේ කොයි තරම් සෙනඟක් පහළට එමින් හිටියා ද කියනවා නම්, එන්ජින් හඬ පරයා මට ඒ හඬ ඇසුණා. ඒක නම් හොඳ ලකුණක් නෙවෙයි.

මම බෙකන්ඩොර්ෆ්ගේ ඇස් දිහා බැලුවා. "තව කොච්චර වෙලා යයි ද?"

"ගොඩක් වෙලා." එයා එයාගේ අත් ඔරලෝසුවට තට්ටු කළා. අපේ දුරස්ථ පාලක පිපිරවීමේ උපකරණය වුණේ එයයි. "මට තව රිසිවරයට වයර් අමුණලා වෙඩිබෙහෙත් බඳින්න තියෙනවා. අඩු තරමේ තව විනාඩි දහයක්වත් යයි."

ඇහෙමින් තිබුණු අඩි හඬවල් අනුව බලද්දි අපිට තව තත්පර දහයක්වත් තිබුණේ නැති තරම්.

"මම එයාලව වෙන අතකට හරවන්නම්," මම කිවුවා. "කලින් කතා කරගත්ත තැනදි හම්බ වෙමු."

"පර්සි-"

"මට සුබ පතන්න."

එයා බලා සිටියේ ඊට විරුද්ධව වාද කරන්න උවමනාවෙන් වගෙයි. අපේ මූලික සැලසුම වෙලා තිබුණේ කිසිවෙකුගේ ඇස නොගැටී ඇතුළට ඇවිත්, ආපසු පිට වී යන්නයි. ඒත් දැන් අපිට සැලසුම හදිසියේ වෙනස් කරන්න සිද්ධ වෙලා තිබුණා.

"සුබ පැතුම්," එයා කිවුවා.

මම දොරෙන් පිටතට දිවුවා.

★★★

ටෙලිකීනයෝ දුසිම් බාගයක් විතර පඩිපෙළ පහළට දුව එමින් සිටියා. උන්ට හඬක් නගන්නවත් ඉඩ නොතියා මම රිප්ටයිඩ්ගෙන් උන්ව කපා දැමුවා. මම පඩිපෙළ ඉහළට ම දිවුවා- මම පසුකරගෙන ගිය ටෙලිකීනයා කොයි තරම් තදින් තිගැස්සුණා ද කියනවා නම් එයාගේ අතේ තිබුණු චූටි රාක්ෂ කෑම පෙට්ටියත් බිම වැටුණා. මම එයාව නොමරා ඇරියා - ඒකට එක හේතුවක් වුණේ එයාගේ කෑම පෙට්ටිය ලස්සන නිසයි, අනෙක් හේතුව එයාට අනතුරු ඇඟවීම නාද කරන්න ඉඩ දෙන්නයි. එතකොට එයාගේ යාළුවෝ එන්ජින් කාමරයට නොයා මගේ පස්සෙන් එයි කියලා මම බලාපොරොත්තු වුණා.

දොරක් හරහා හයවෙනි තට්ටුවට කඩා පැන්න මම නොනැවතී දිවුවා. ඒ බුමුතුරුණු දැමූ ශාලාව කාලෙකට කලින් අති සුඛෝපභෝගීව තියෙන්න ඇති බව මට විශ්වාසයි, ඒත් පහුගිය අවුරුදු තුන පුරාවට රාක්ෂයෝ අරක් ගෙන සිටීමෙන් එහි බිත්ති කඩදාසි, බුමුතුරුණු සහ පෞද්ගලික කාමරය පහුරු ගෑසී සෙවෙල බැඳී තිබුණේ හරියට මකරෙකුගේ උගුර ඇතුළේ වගෙයි. (ඇත්තටම ඔව්, අවාසනාවට, මම මේ කියන්නේ අත්දැකීමෙන්.)

කාලෙකට ඉහත දී, මම පළවෙනි වතාවට ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩාවට එද්දී ලූක් සංචාරකයින් කීප දෙනෙකුගේ සිහි විකල් කරලා, එයාලා රාක්ෂයෝ පිරුණු නැවක ඉන්න බව නොතේරෙන්න මීදුමෙන් ආවරණය කරලා ප්‍රදර්ශනයට වගේ නැවේ තියාගෙන හිටියා. දැන් ඒ සංචාරකයින්ගේ ලකුණක්වත් පෙනෙන්න තිබුණේ නැහැ. එයාලට සිද්ධ වෙන්න ඇති දේ ගැන හිතන්නවත් මම කැමති වුණේ නැහැ, ඒත් එයාලා දිනාගත් ලොතරැයි තෑගි අරන් එයාලට ගෙවල්වලට යන්න ඉඩ දෙන්න ඇති කියලා නම් මට තිබුණේ සැකයක්.

මම සක්මන් මළුවට ළඟා වුණා. ඒක නැවේ මැද කොටස පිරෙන්න ම හදපු ලොකු සාප්පු සංකීර්ණයක්. එතැන දී මම හිටි අඩියේ ම නැවතුණා. එහි අංගනය මැද වතුර මලක් තිබුණා. එය මැද ඇන තියාගෙන සිටියේ යෝධ කකුළුවෙක්.

මං 'යෝධ' කියලා අදහස් කළේ වෙළඳ පොලේ විකුණන්න තියෙන ලොකු කකුළුවෝ ගැන එහෙම නෙවෙයි. මම මේ කියන්නේ වතුර මලටත් වඩා ලොකු 'යෝධ කකුළුවෙක්' ගැනයි. ඒ රාක්ෂයා අඩි දහයක් වතුරෙන් ඉහළට නැගී සිටියා. උගේ පිට කටුව නිල් සහ කොළ පාටින් පුල්ලි වැටිලා, උගේ ඩැහි අඬු මගේ ඇඟටත් වඩා දිගයි.



ඔයා කවදා හරි කකුළුවෙකුගේ දළ ලෝම සහ කාපු කෑමවල ඉතිරි කැබලිවලින් පිරුණු, පෙණ වැගිරෙන කට දැකලා තියෙනවා නම්, වෙළඳ දැන්වීම් පුවරුවක් තරමට පිම්බුණු මේ සතාගේ කට ඊට වඩා හොඳ තත්ත්වෙක නොතිබුණ බව හිතේ මවාගන්න ඔයාට පුළුවන් වේවි. මගේ දිහාවට රවාගෙන බලා සිටි ඌගේ කළු ඇස් දෙකේ බුද්ධිමත් බවක් මට පෙනුණා- ඒ වගේම වෛරයකුත්. මම සමුද්‍ර දෙවියන්ගේ පුතා කියන කාරණාව මේ කකුළු මහත්තයා සමඟ ගනුදෙනු කරන්න මට කිසිම ලකුණක් දිනා දෙන පාටක් නම් තිබුණේ නැහැ.

"ෆ්ෆ්ෆ්ට්ට්," ඌ පිඹිද්දී මුහුදු පෙණ ඌගේ කටින් වැගිරුණා. ඌගේ කටින් හැමුවේ කුණු මාළු පිරවූ කෑනයක් සතියක් තිස්සේ අව්වේ තියලා වගේ ගඳක්.

අනතුරු ඇඟවීමේ සංඥා මොර දුන්නා. ඉක්මනින් ම මට ගනුදෙනු කරන්න ලොකු සෙනඟක් ලැබේවි. ඒ නිසා ම මම නොනැවතී යා යුතුව තිබුණා.

"හේයි, කකුළුවෝ." මම අංගනය කෙළවර වටෙන් අඟලින් අඟල ඉදිරියට ඇදුණා. "මම ඔයාගේ වටෙන් යන්නයි හදන්නේ, ඒ නිසා-"

කකුළුවා එතැනින් පැන්නේ හිතාගන්න බැරි වේගයකින්. දඩිබිඩි ගමනින් වතුර මලෙන් පිට පැන්න ඌ ඩැහැගැනීමට යමක් හොයන ඩැහි අඬු දිගු කරගෙන එක එල්ලේ මගේ දිහාවට ආවා. මම ටී-ෂර්ට් රාක්කයක් පෙරළාගෙන තෑගි කඩයක් ඇතුළට දිවුවා. ඩැහි අඬුවලින් ඉදිරි වීදුරු බිත්තිය කුඩු කර දැමූ කකුළුවා කාමරය හරහා පැත්තෙන් පැත්තට ආවා. මම තදින් හුස්ම ගනිමින් ආපසු එළියට දිවුවා, ඒත් කකුළු මහත්තයා අනෙක් පැත්තට හැරිලා මාව លුහුබැන්දා.

"අන්න!" මට ඉහළින් වූ සඳලු තලයෙන් කටහඬක් නැගුණා. "හොරෙන් ඇතුළට ආව එකා!"

හැමදෙනාගේ ම අවධානය වෙනතකට හරවන්න මම ගත්ත උත්සාහය නම් සාර්ථක වෙලා තිබුණා, ඒ වුණත් මට සටන් කරන්න ඕනෑ වුණේ මෙතැන දී නෙවෙයි. මාව නැවේ මැද්දට කොටු වුණොත්, මම කකුළු කෑමක් වෙන බව සහතික වුණා.

යක්ෂ ක්‍රිස්ටීසියානුවා මගේ ඇඟට පැන්නා. මම රිප්ටයිඩ්ගෙන් ගැසූ පහරට ඌගේ අඬුවක කෙළවර කැපී වෙන්වුණා. ඌ පිඹිමින්

Scanned with CamScanner

පෙණ වැගිරුවත්, එයින් ඌට වැඩිය රිදුණු පාටක් නම් පෙනුනේ නැහැ.

මේ සතාගෙන් ගැලවෙන පොටක් මම පරණ කතන්දරවලින් මතක් කරගන්න උත්සාහ කළා. වරක් රාක්ෂ කකුළුවෙක් ගැන කතාවක් ඇනබෙත් මට කියලා තිබුණා- හර්කියුලිස් එයාගේ ලොකු කකුලෙන් ඌව පාගලා පොඩි කරා කියල ද? ඒත් ඒක නම් මෙතැන දී වැඩ කරන්නෙ නැති වෙයි. මොකද මේ කකුළුවා මගේ සපත්තුවට වඩා චුට්ටක් විතර ලොකුයි නේ.

ඒ වෙලාවේ මට අමුතු සිතුවිල්ලක් පහළ වුණා. පහුගිය නත්තලේ දී මගේ අම්මයි මමයි පෝල් බ්ලෝෆිස්ව මොන්ටවුක්වල තිබුණු අපේ පරණ කැබිනයට කැඳවාගෙන ගියා. ඊට පස්සේ පෝල් මාව කකුළුවෝ අල්ලන්න එක්ක ගියා. දැලක් පුරවලා උන්ව අල්ල ගත්තට පස්සේ, උන්ගේ පිට වැස්මේ, හරියටම උන්ගේ අජුව බඩවල් මැද පුංචි පැළුමක් ඇති තැන පෝල් මට පෙන්වා දුන්නා.

දැන් තිබුණු එක ම ප්‍රශ්නය ඌගේ අජුව බඩට කිට්ටු වෙන එකයි.

මම වතුර මල දිහාවත්, දැනටමත් කකුළු අඩි පාරවල්වලින් සුමටව තිබූ කිරිගරුඬ පොළොව දිහාවත් බැලුවා. මම අතක් ඉදිරියට දිගු කරගෙන, වතුරට සිත ඒකාග්‍ර කළා. ඒත් එක්ක ම වතුර මල පුපුරා හැලුණා. වතුර තට්ටු තුනක් ඉහළට, සෑම අතට ම විසිරුණේ සඳලු තල, සෝපාන සහ වෙළඳ සැල්වල ජනේල නාවමින්. කකුළුවා එය ගණන් ගත්තේ නැහැ. ඌ වතුරට ආසා කළා. ඌ අඬු හප්පමින් පිඹිමින් පැත්තෙන් පැත්තට මගේ දිහාවට දුවගෙන එද්දී මම යටිගිරියෙන් බෙරිහන් දෙමින් එක එල්ලේ ම ඌ වෙතට දිවුවා.

"ආාාාහ්හ්හ්!"

අපි එකිනෙකා හැප්පෙන්න මොහොතකට කලින් මම බේස්බෝල් ක්‍රීඩකයෝ කරන විදිහට බිමට වැටිලා තෙත කිරිගරුඬ පොළොව මතින් කෙලින් ම සතා යටට ලිස්සා ගියා. ඒක හරියට ටොන් හතරක සන්නද්ධ රථයක් යටින් ලිස්සා යනවා වගේ වැඩක්. කකුළුවාට කරන්න තිබුණේ මාව චප්ප වෙන්න බිම ඉඳගන්න විතරයි. ඒත් මම කරන්න යන දේ ගැන ඌට තේරුම් යන්න කලින් මම ඌගේ පිට වැස්මේ ඇති පැළුම තුළට රිප්ටයිඩ් කිඳා බස්සවා, කඩු මිට අත හැර, සතාගේ පිටුපසින් එළියට ආවා.



රාක්ෂයා සූ හඬ නගමින් සැලුණා. ඌගේ ඇස් දිය වී ගියා. ඌගේ අභ්‍යන්තරය වාෂ්ප වී යද්දී පිට කටුව තද රතු පාටට හැරුණා. ඊට පස්සේ හිස් කටුව හඬ නගමින් පොළොවට ඇද වැටුණා.

මම කළ හුරුබුහුටි වැඩේ අගය කර කර ඉන්න මට වෙලාවක් තිබුණේ නැහැ. මගේ වටා සිටි සියලු ම රාක්ෂයෝ සහ උප දෙවිවරු නියෝග දෙමින්, අවි ආයුද අතට ගනිද්දී මම ළඟින් ම වූ පඩිපෙළ කරා දිවුවා. මම සිටියේ හිස් අතින්. මායා උපකරණයක් නිසා රිප්ටයිඩ් කොයි වෙලාවේ හරි මගේ සාක්කුව තුළින් මතු වේවි, ඒත් මේ වෙද්දි නම් ඒක තිබුණේ කකුළුවාගේ සුන්බුන්වලට යට වෙලයි. මට ඒක ආපහු ගන්න වෙලාවක් තිබුණේ නැහැ.

අටවෙනි තට්ටුවේ සෝපාන පිවිසුම් මගේ දී ඩ්‍රැකනෙයිලා දෙන්නෙක් ඇදී ඇවිත් මගේ පාර හරස් කළා. ඉණෙන් උඩට එයාලා කොළ පාට කොරපොතු සහිත හමක්, කහ පාට ඇස් සහ දෙකට බෙදුණු දිවක් ඇති ගැහැනු අයයි. ඉණෙන් පහළට, එයාලට දෙපා වෙනුවට තිබුණේ දෙබිඩි සර්ප කඳන් දෙකක්. එයාලා හෙලි සහ බර එල්ලූ දැල් අතැතිව සිටියා. එයාලා ඒවා පාවිච්චි කරන්නත් හොඳින් ම දන්න බව මම අත්දැකීමෙන් දැන සිටියා.

"මේ මොකක්ද?" එකියක් කිවුවා. "ක්‍රෝනොස්ට තෑග්ගක්!"

ඒ වෙලාවේ මට ගැරඬි මරන්න ආසාවක් තිබුණේ නැහැ. ඒත් මගේ ඉදිරිපස පුංචි මේසයක් මත නැවේ ආකෘතියක් තබා තිබුණා. එය පාදස්ථලයෙන් ගලවාගත් මම එයින් පළවෙනි ඩ්‍රැකනෙයිට දමා ගැසුවා. ඒක එයාගේ මුහුණේ වදිද්දී එයාව ඇදගෙන වැටුණා. එයාට උඩින් පැන්න මම එයාගේ යාළුවාගේ හෙල්ලය ඩැහැගෙන, එයාව වේගයෙන් කැරකුවා. එයා විසි වී ගිහින් සෝපානයේ වදිද්දී, මම නොනැවතී නැවේ ඉදිරියට ම දිවුවා.

"ඒකව අල්ලගන්නවා!" එයා බෙරිහන් දුන්නා.

යම බල්ලෝ උඩු බිරුවා. කොහෙන්දෝ පියඹා ආ ඊතලයක් උරුවම් බාමින් මගේ මූණ ළඟින් ගොස් පඩිපෙළ ළඟ මහෝගනී පුවරු ඇල්ලූ බිත්තියේ ඇමිණුණා.

මම ඒවා ගණන් නොගත්තේ රාක්ෂයින් මගේ පසුපස එන තාක් මට උන්ව එන්ජින් කාමරයෙන් ඈත් කර තබාගෙන, බෙකන්ඩෝර්ෆ්ට උවමනා කාල වේලාව ලබා දෙන්න හැකි නිසයි.

මම පඩිපෙළ දිගේ ඉහළට දුවද්දී, පොඩි කොල්ලෙක් පහර දෙන්න සූදානමින් පහළට දුවගෙන ආවා. එයාට තිබුණේ තින්දෙන් මේ දූන් ඇහැරුණ පෙනුමක්. එයා සන්නාහය ඇඳගෙන තිබුණෙත් බාගෙටයි. කඩුව ඇදගත් එයා "ක්‍රෝනොස්ට!" කියා මොර දුන්නත් ඒක ඇහුණේ තරහෙන් කළ රණ ඝෝෂාවකට වඩා බයෙන් කරපු කෑගැසීමක් වගෙයි. ඒ කොල්ලගේ වයස අවුරුදු දොළහකට වැඩි වෙන්න බැහැ- ඒ කියන්නේ මම මුලින්ම අර්ධ-ලෝහිත කඳවුරට ආව කාලේ හිටපු වයස වගෙයි.

ඒ සිතුවිල්ල මගේ ධෛර්යය අඩු කරවන්න සමත් වුණා. මේ පුංචි ළමයා මොළ-ශෝධනයකට ලක් වෙලා, දෙවිවරුන්ට වෛර කරන්න හුරු කරවලා තියෙන්නේ එයා අර්ධ ඔලිම්පියානුවෙක් වෙලා ඉපදුණු වරදටයි. ක්‍රෝනොස් එයාව පාවිච්චි කරමින් සිටියා, ඒ වුණත් මේ කොල්ලා හිතුවේ එයාගේ හතුරා මම කියලයි.

එයාට කරදරයක් කරන්න නම් මට කොහෙත්ම බැහැ. මේකට මට ආයුදයක් උවමනා වුණේ නැහැ. එයාගේ පහර වළකමින් ඉදිරියට අඩිය තැබූ මම එයාගේ මැණික් කටුව ඩැහැගෙන, ඒක බිත්තියේ හැප්පුවා. එයාගේ කඩුව හඬ නගමින් බිමට වැටුණා.

ඊට පස්සේ මම කලින් සැලසුම් කර නොතිබූ දෙයක් කළා. සමහරවිට ඒක මෝඩ වැඩක් වෙන්නත් ඇති. එය අපේ මෙහෙයුම අනතුරේ හෙළන බව සිකුරු වුණත් මට එය නොකර බැරි වුණා.

"ඔයාට ජීවත් වෙන්න ඕනෑ නම්," මම එයාට කිවුවා. "මේ දූන් ම නැවෙන් පිට වෙනවා. අනිත් උප දෙවිවරුන්ටත් කියනවා." ඊට පස්සේ මම එයාව පඩිපෙළ පහළට තල්ලු කර දැමුවා.

මම නොනැවතී ඉහළට ම ගියා.

ආපන ශාලාව පසුකර යන කොරිඩෝව දකිද්දී මගේ නපුරු මතකයන් ඇවිස්සුණාඃ මීට අවුරුදු තුනකට කලින් මම මෙහි ආව පළවෙනි වතාවේ ඇනබෙත්, මගේ අර්ධ සොහොයුරා ටයිසන් සහ මම මේක දිගේ හොර රහසේ ගිය හැටි මට සිහි වුණා.

මම දුවගෙන ගිහින් ප්‍රධාන එළිමහන් නැව් තට්ටුවට ගොඩ වුණා. නැව් තට්ටුවට එපිටින් අහස දම් පාටේ සිට කළු පාටට හැරෙමින් තිබුණා. සඳලු තල සහ ආපන ශාලා පොකුරක් ඇති වීදුරු කුලුනු දෙකක් මැද පිහිනුම් තටාකයක් දිලිසෙමින් තිබුණා. නැවේ ඉහළ කොටස පුරා ම තිබුණේ භය උපදවන හිස් බවක්.



මට කරන්න තිබුණේ අනෙක් පැත්තට යාගන්න එක විතරයි. ඊට පස්සේ මට පුළුවන් පඩිපෙළ දිගේ බැහැලා ගිහින් හෙලිපෑඩයට- ඒ කියන්නේ අපේ හදිසි රහස් හමුවට යොදාගත්ත තැනට යන්න. මොකක්හරි වාසනාවක් තිබුණොත් මට එතැන දී බෙකන්ඩොර්ෆ්ව මුණ ගැහෙයි. ඊට පස්සේ අපි දෙන්නා මුහුදට පනිනවා. වතුරේ දී මට තියෙන බලය අපි දෙන්නව ආරක්ෂා කරයි. ඊට පස්සේ අපි හැතැප්ම කාලක් දුරට ගිහින් දුරස්ථ පාලකයෙන් නැව පුපුරවා දානවා.

මම නැව් තට්ටුව හරහා බාගයක් දුර යද්දී ඇහුණු කටහඬින් මාව ගල් ගැහුණා. "ඔයා පරක්කුයි, පර්සි."

මට ඉහළින් වූ සඳලු තලය මත, කැළැල් ඇති මුහුණ හිනාවකින් සරසාගෙන බලන් හිටියේ ලූක්. එයා හරි ම සාමාන්‍ය විශ්වවිද්‍යාල කොල්ලෙක් වගේ කලිසමකින්, සුදු ටී-ෂර්ට් එකකින් සහ රබර් සෙරෙප්පු දෙකකින් සැරසී සිටියත් එයාගේ ඇස් දෙක ඇත්ත එළිදරවු කළා. ඒවා තනි රත්තරන් පාටයි.

"අපි දවස් ගාණක් තිස්සේ ඔයාලා එනකල් බලන් හිටියේ." මුලදී එයාගේ හඬ ඇහුණේ සාමාන්‍යයෙන් ලූක් කතා කරනවා වගේමයි. ඒත් ටිකකින් එයාගේ මූණ තදින් ගැහුණා. එයාගේ ඇඟ පුරා වෙවුලුමක් පැතිරුණේ හරියට එයා මේ දූන් නරක දෙයක් බිව්වා වගෙයි. ඊට පස්සේ එයාගේ කටහඬ බරැති, පෞරාණික සහ බලගතු ස්වරූපයක් ගත්තා- ඒ තමයි ටයිටන් රජා ක්‍රෝනොස්ගේ හඬ. එයාගේ කටින් පිටවුණ වචන පිහි තලයක් වගේ මගේ කොඳු ඇට පෙළ සූරාගෙන පහළ බැස්සා. "එනවා, මට ආචාර කරනවා."

"ඔව්, කරනකල් බලන් ඉන්නවා." මම කෙඳිරුවා.

ලයිස්ට්‍රිගෝනියානු යෝධයෝ පිහිනුම් තටාකය දෙපසට ම රොක් වුණේ හරියට ඉඟියක් ලැබෙන තුරු බලා ඉන්නවා වගෙයි. ඒ හැම එකෙක් ම අඩි අටක්වත් උස, අත්වල පච්චා කොටපු අයයි. එයාලා ලෙදර් සන්නාහවලින් සැරසිලා උල් කටු ගැසූ මුගුරු දරාගෙන සිටියා. ලූක්ට ඉහළ වහලය මතින් උප දෙවි දුනුවායෝ මතු වුණා. දෙපසින් වූ සඳලු තලවලින් බිමට පැන්න යම බල්ලෝ දෙන්නෙක් මට දත් විලිස්සා ගෙරෙව්වා. තත්පර ගාණක් තුළ දී මම මුළුමනින් ම කොටු වුණා. ඒක උගුලක්ඃ මම එන බව කල්තියා ම දූන නොහිටියා නම් එයාලා මේ තරම් හොඳින් ස්ථාන ගත වෙලා ඉන්න විදිහක් නැහැ.

Scanned with CamScanner

මම ඔළුව ඔසවා ලූක් දිහා බැලුවා. මගේ හිත ඇතුළේ තරහව කැකෑරෙන්න ගත්තා. ඒ ඇඟ ඇතුළේ ලූක්ගේ විඥානය තවමත් ජීවත් වෙනවා ද කියලවත් මම දැනගෙන හිටියේ නැහැ. සමහරවිට, එයාගේ කටහඬ වෙනස් වුණ විදිහට... එහෙමත් නැත්නම් සමහරවිට ඒ ක්‍රෝනොස් තවමත් අලුත් ඇඟට හුරු වෙමින් හිටපු නිසා විතරක් වෙන්න ඇති. ඒ කොහොම වුණත් එයින් වැඩක් නැහැ කියලා මම මට ම කියාගත්තා. ලූක් අනෙක් පැත්තට හැරිලා, දුෂ්ටයෙක් වුණේ ක්‍රෝනොස් එයාගේ ඇඟට ආවේශ වෙන්න ගොඩක් කාලෙකට කලිනුයි.

අන්තිමේ දී කොහොමත් මට එයාට විරුද්ධව සටන් කරන්න වෙනවා. ඉතින් දැන්ම ඒක නොකරන්නේ ඇයි? මගේ ඔළුව ඇතුළෙන් කටහඬක් ඇහුවා.

අර මහා අනාවැකියේ කියවුණ විදිහට අවුරුදු දහසය ලැබුවා ම මම ලෝකය බේරාගැනීමේ හෝ විනාශ කිරීමේ තීරණය ගන්නවා. ඒකට තිබුණේ තව දවස් හතක් විතරයි. ඉතින් මේ දැන් ම ඒක නොකරන්නේ ඇයි? මට ඇත්තට ම ඒ බලය තියෙනවා නම්, එක සතියකින් වෙන්න පුළුවන් වෙනස මොකක්ද? මට මේ දැන් ම ක්‍රෝනොස්ව විනාශ කරලා මේ තර්ජනය ඉවර කරන්න පුළුවන්. හේයි, මම මීට කලිනුත් රාක්ෂයෝ එක්ක වගේම දෙවිවරු එක්කත් සටන් කරලා තිබුණා.

මගේ හිත කියෙව්වා වගේ ලූක් හිනා වුණා. නෑ, එයා ක්‍රෝනොස්. මට ඒ බව සිහියේ තියාගන්න වුණා.

"ඉස්සරහට එනවා," එයා කිවුවා. "ඔය තරම් චණ්ඩියෙක් නම්."

රාක්ෂ සෙනඟ දෙපසට වුණා. මගේ පපුව දෙමෝලෙන් වී කොටද්දී මම පඩිපෙළ ඉහළට ගියා. කවුරු හරි පිටුපසින් මගේ පිටට අනිවි කියලා මට විශ්වාස වුණා. ඒත් එයාලා මට යන්න ඉඩ දුන්නා. සාක්කුව අතගා බලද්දී මගේ පෑන එහි ඇති බව මට දැනුණා, මම එහි කොපුව ගැලවූවා ම, රිප්ටයිඩ් කඩුවකට වැඩුණා.

ක්‍රෝනොස්ගේ ආයුදය එයාගේ අතේ මතුවුණා- ඒක අඩි හයක් දිග, අර්ධ-දිව්‍යමය ලෝකඩ, අර්ධ-මනුෂ්‍ය වානේ දෑකැත්තක්. ඒක දකිද්දී පවා මගේ දණහිස් ජෙලිවලට හැරුණා. ඒ වුණත් මගේ හිත වෙනස් වෙන්න කලින් මම එයාට පහර දෙන්න පැන්නා.



කාලය මන්දගාමී වුණා. මං අදහස් කළේ, ඇත්තට ම මන්දගාමී වුණා. මොකද ක්‍රෝනොස්ට ඒ බලය තිබුණා. මට දැනුණේ මම සිරප් ගොඩක් මැදින් යනවා වගෙයි. මගේ අත් දෙක කොයි තරම් බර වුණා ද කියනවා නම්, මට කඩුව ඔසවන්නත් අමාරු වුණා. ක්‍රෝනොස් හිනා වෙමින්, සාමාන්‍ය වේගයෙන් එයාගේ දෑකැත්ත කරකවමින් මම මගේ මරණය වෙත එන තුරු බලා සිටියා.

මම එයාගේ මායාවට විරුද්ධව සටන් කරන්න උත්සාහ කළා. මම වටේට තිබුණ මුහුදට- මගේ බලයේ මූලාශ්‍රයට සිත ඒකාග්‍ර කළා. ගතවුණු අවුරුද්දේ දී මම එයට සම්බන්ධ වීමේ හැකියාව වැඩි දියුණු කරගෙනයි තිබුණේ, ඒත් මේ වෙලාවේ නම් කිසිම දෙයක් වෙන පාටක් තිබුණේ නැහැ.

මම තවත් මන්දගාමී පියවරක් ඉදිරියට තැබුවා. යෝධයෝ මට ඔච්චම් කරද්දී, ඩ්‍රැකනෙයිලා සූ හඬ ගාමින් මහ හඬින් හිනා වුණා.

හේයි, මුහුද. මම කන්නලව් කරා. ඉක්මන් කරොත් නරක ද?

එක්වර ම මගේ බඩ ඇතුළේ වේගයෙන් ඇඹරෙනවා වගේ වේදනාවක් ඇති වුණා. රාක්ෂයින්ව බිමට ඇද දමමින් මුළු නැව ම එක පැත්තකට ඇල වුණා. පිහිනුම් තටාකයෙන් ගැලුම් හාරදහසක ලුණු වතුර රැල්ලක් ඉහළ නැගී මාව, ක්‍රෝනොස්ව සහ නැව් තට්ටුව මත සිටි සෑම දෙනාව ම නැහැවූවා. වතුර මගේ තුළට කාවදිමින්, කාල මායාව බිඳ දමද්දී මම පහර දීමට ඉදිරියට පැන්නා.

මම ක්‍රෝනොස්ට පහරක් ගැහුවා, ඒත් මම තවමත් වේගවත් මදි. එයාගේ මූණ දිහා බලලා මම කරගත්තේ වැරැද්දක්. ඒ මුහුණ ලූක්ගෙයි- කාලයක් මගේ යාළුවා වෙලා හිටපු කොල්ලාගෙයි. මම එයාට කොච්චර වෛර කළත්, එයාව මරන්න මට අමාරු වුණා.

ක්‍රෝනොස්ට නම් එහෙම පැකිළීමක් තිබුණේ නැහැ. එයාගේ දෑකැත්ත වේගයෙන් මගේ ඇඟට පහත් වුණා. මම පැත්තකට පැන්නා. අඟලකින් මාව මඟ ඇර ගිය ඒ දුෂ්ට තලය මගේ කකුල් අතර හරි මැද නැව් තට්ටුවේ කැපුමක් ඇති කළා.

මම ක්‍රෝනොස්ගේ පපුවට පයින් ගැසුවා. එයා පසුපසට විසිවුණා. ඒ වුණත් ලූක් සිටිය යුතු තරමට වඩා එයා බර වැඩියි. මට දැනුණේ ශීතකරණයකට පයින් ගැසුවා වගෙයි.

ක්‍රෝනොස් ආයෙමත් එයාගේ දෑකැත්ත වැනුවා. මම රිප්ටයිඩ් හරස් කරලා ඒ පහර වැළකුවා, ඒ වුණත් එයාගේ පහරේ

Scanned with CamScanner

බලගතුකමට මගේ කඩුවට හැකි වුණේ ඒක අහකට හරවන්න විතරයි. දෑකැත්තේ කෙළවර මගේ කමිස අත කපාගෙන ගිහින් මගේ අත සීරුවා. එය බරපතළ කැපුමක් විය නොහැකි වුණත්, මගේ ඇගේ ඒ පැත්ත ම වේදනාවෙන් පුපුරා ගියා. එක වතාවක් මුහුදු රාක්ෂයෙක් ක්‍රෝනොස්ගේ දෑකැත්ත ගැන කියපු කතාව ඒ වෙලාවේ මට සිහි වුණා: පරිස්සමෙන්, මෝඩයෝ, යන්තං හරි ගෑවුනොත්, මේ තලේ නුඹගෙ ආත්මය ඇඟෙන් වෙන් කරලා ගනී. එදා එයා අදහස් කළ දේ දැන් මට තේරුම් ගියා. මගේ ඇඟෙන් පිට වී යමින් තිබුණේ ලේ විතරක් නෙවෙයි. මගේ ශක්තිය, මගේ අධිෂ්ඨානය, මගේ අනන්‍යතාවය පවා ඇඟෙන් සිඳී යමින් තිබුණා.

ආපස්සට විසි වුණු මම, මගේ කඩුව වම් අතට මාරු කරගෙන ආයෙමත් පහර දෙන්න පැන්නා. මගේ කඩුව එයාගේ ඇඟ හරහා යා යුතුව තිබුණත්, ඒ වෙනුවට සිද්ධ වුණේ එයාගේ බඩේ වැදුණු තලය ඝන කිරි ගරුඬ කුට්ටියක හැප්පුණා වගේ පැත්තකට හැරවුණු එකයි. ඒ වගේ පහරක් දරාගන්න එයාට කොහෙත්ම පුළුවන්කමක් තියෙන්න බැහැ.

ක්‍රෝනොස් මහ හඬින් හිනා වුණා. "හරිම දුර්වල පාරක්, පර්සි ජැක්සන්. ලූක් මට කියනවා කඩු සටන්වල දී එයත් එක්ක කරට කර සටන් කරන්න නුඹට කවදාවත් බැරිලු."

මගේ පෙනීම බොඳ වෙන්න පටන් ගත්තා. මට තව වැඩි වේලාවක් නැති බව මම දැන සිටියා.

"ලූක්ට තිබ්බෙ ඉදිමිච්ච මොළයක්," මම කිවුවා. "ඒත් අඩු ගාණේ ඒක එයාගෙ ම ඔළු ගෙඩිය නේ."

"අන්තිම සැලසුම දිග අරින්න කලින්," ක්‍රෝනොස් කල්පනාබරව කිවුවා, "නුඹව දැන් ම මරන්න වෙන එක නම් ලැජ්ජාවක්. මම ඔලිම්පස් විනාශ කරන්න යන හැටි තේරුම් ගත්තා ම නුඹේ ඇස්වල මතුවෙන බය දකින්න තියෙනවා නම් මම හරි ආසයි."

"ඔහේට මේ බෝට්ටුව මැන්හැටන් කිට්ටුවටවත් අරන් යන්න ලැබෙන්නෙ නැහැ." මගේ දෑත් පුපුරු ගසමින් තිබුණා. මගේ ඇස් ඉදිරියේ කළු පාට පුල්ලි දඟර දැමුවා.

"ඒ කොහොමද කිවුවොත්?" ක්‍රෝනොස්ගේ රත්තරන් පාට ඇස් දිලිසුණා. අස්වාභාවික සහ මොකක්දෝ දුෂ්ට බලයකින් දැල්වී තිබුණු එයාගේ මූණ- ලූක්ගේ මූණ- පෙනුණේ වෙස් මුහුණක් වගෙයි.



"බාගදා නුඹ අර පුපුරන ද්‍රව්‍ය එක්ක හිටපු නුඹේ යාළුවා ගැන බලාපොරොත්තු තියන් ඉන්නවා වෙන්ඩැති?"

පහළ වූ තටාකට දිහා බැලූ එයා කතා කළා, "නකමුරා!"

සම්පූර්ණ ග්‍රීක යුද සන්නාහයකින් සැරසුණ ගැටවරයෙක් සෙනඟ මැදින් ඉදිරියට ආවා. එයාගේ වම් ඇහැ කළු රෙදි කෑල්ලකින් ආවරණය කර තිබුණා. ඇත්ත වශයෙන් ම මම එයාව දැන සිටියා: ඊතන් නකමුරා, නෙමෙසිස්ගේ පුතෙක්. පහුගිය ගිම්හානයේ දී මම එයාගේ ජීවිතේ බේරලා දුන්නා. මේ පුංචි නොසණ්ඩාලයා ඒකට කළගුණ පෙන්නුවේ ක්‍රෝනොස්ට ආපහු පණ දීලයි.

"සාර්ථකයි, මගේ උතුමාණෙනි," ඊතන් කතා කළා. "අපිට කියලා තිබුණු විදිහට ම අපි එයාව හොයාගත්තා."

එයා අත්පුඩියක් ගැහුවා ම යෝධයෝ දෙන්නෙක් චාර්ල්ස් බෙකන්ඩොර්ෆ්ව ඇදගෙන ඉදිරියට ආවා. මගේ හදවත නැවතුණා වගෙයි මට දැනුණේ. බෙකන්ඩොර්ෆ්ගේ එක ඇහැක් ඉදිමිලා, එයාගේ මූණ සහ දෑත් කැපුම් තුවාලවලින් වැහිලා තිබුණා. එයාගේ සන්නාහය නැති වෙලා, කමිසයත් මුළුමනින් ම වගේ ඉරිලා ගිහින්.

"නෑ!" මම මොර දුන්නා.

බෙකන්ඩොර්ෆ් මගේ ඇස් දිහා බැලුවා. ඊට පස්සේ එයා එයාගේ අත දිහාවට බැල්ම හැරවූයේ මට යමක් කියන්න උත්සාහ කරනවා වගෙයි. එයාගේ ඔරලෝසුව. උන් තවම එයාගෙන් ඒක අරගෙන නැහැ. ඒක තමයි පිපුරුම් උපකරණය. එයා පුපුරන ද්‍රව්‍ය සවි කරලා වෙන්න පුළුවන් ද?

අනිවාර්යයෙන් ම රාක්ෂයෝ ඒ වහාම ඒවා ගලවලා දාන්න ඇති.

"අපිට මූව නැව මැද ඉඳලා හම්බ වුණා," එක යෝධයෙක් කිවුවා, "එන්ජින් කාමරේට හොරෙන් රිංගන්නයි හැදුවේ. අපිට දැන් මූව කන්න පුළුවන් ද?"

"ඉක්මනට ම." ක්‍රෝනොස් ඊතන් දෙස රවා බැලුවා. "එයා බෝම්බ හයි කරලා නැහැ කියලා නුඹට විශ්වාස ද?"

"එයා එන්ජින් කාමරය දිහාවටයි යමින් හිටියේ, මගේ උතුමාණෙනි."

"නුඹ කොහොමද ඒක දන්නේ?"

Scanned with CamScanner

"එර්ර්ර්....." ඊතන් අපහසුවෙන් එහෙ මෙහෙ වුණා. "එයා හැරිලා හිටියේ ඒ පැත්තට. ඒ වගේම එයා අපිට ඒක කිවුවා. එයාගේ මල්ල පුරවලා පුපුරන ද්‍රව්‍ය තවම තියෙනවා."

හෙමින් හෙමින් මට එය තේරුම් යන්න පටන් ගත්තා. බෙකන්ඩොර්ෆ් උන්ව මෝඩයාට අන්දලා. එයාව අහුවෙන්න යන බව තේරුම් ගියා ම එයා එන්ජින් කාමරයට යමින් සිටින බව අඟවන්න අනෙක් පැත්තට හැරිලා. තවමත් එන්ජින් කාමරයට ගියේ නැති බව එයා උන්ට ඒත්තු ගන්වලා. ඒ කියන්නේ තවමත් ග්‍රීක ගින්දර පිපිරවීමට සූදානම් කරපු විදිහට ම ඇති!

ඒත් අපිට මේ නැවෙන් පිටවෙලා ගිහින්, පිපිරවීම කරන්න බැරි නම් එයින් පලක් නැහැ.

ක්‍රෝනොස් අවිනිශ්චිතව බලා සිටියා.

ඒ කතාව පිළිගන්න, මම යාඥා කළා. දැන් මගේ අත කොයි තරම් දරුණු ලෙස රිදුම් දුන්නා ද කියනවා නම් මට හිටගෙන ඉන්නත් අමාරු වුණා.

"එයාගේ මල්ල අරිනවා," ක්‍රෝනොස් නියෝග කළා.

එක යෝධයෙක් බෙකන්ඩොර්ෆ්ගේ උරහිසක එල්ලෙමින් තිබුණු පුපුරන ද්‍රව්‍ය මල්ල ඉරා ඇදගත්තා. එය තුළට එබී බැලූ එයා ගොරවමින් එය යටිකුරු කළා. භීතියට පත් වුණ රාක්ෂයෝ එක රැල්ලට ආපස්සට පැන්නා. ඇත්තටම ඒ මල්ල පුරවලා තිබුණේ ග්‍රීක ගින්දර බරණිවලින් නම්, ඒ වෙලාවේ අපි හැමෝවම පුපුරලා යන්න තිබුණා. ඒත් මල්ල තුළින් බිමට වැටුණේ පීච් ගෙඩි පුරවපු කෑන් දුසිමක් විතරයි.

කේන්තිය පාලනය කරගන්න උත්සාහ කරමින් ක්‍රෝනොස් තදින් හුස්ම ගන්න හඬ මට ඇසුණා.

"බාගදා, නුඹ," එයා කියුවා. "මේ උප දෙවියව අල්ලගන්න ඇත්තේ කුස්සිය ළඟ දි වෙන්ඩැති?"

ඊතන් සුදුමැලි වුණා. "මේ-"

"එතකොට, බාගදා නුඹ, ඇත්තටම එන්ජින් කාමරය බලන්න කාව හරි යවන්න නැතුව ඇති?"

බයෙන් පස්සෙන් පස්සට ගිය ඊතන් අනෙක් පැත්ත හැරිලා දිවුවා.

මම නිහඬව ශාප කළා. දැන් බෝම්බ නිෂ්ක්‍රීය කරන්න කලින් අපිට ඉතිරිව තිබුණේ විනාඩි ගාණක් විතරයි. නැවතත් බෙකන්ඩොර්ෆ්ගේ



දෑස් දිහා බැලූ මම නිහඬ ප්‍රශ්නයක් ඇසුවේ එයා ඒක තේරුම් ගනිවි කියන බලාපොරොත්තුවෙන්: කොච්චර වෙලාවක් ද?

එයා මහපටැඟිල්ල සහ අනෙක් ඇඟිලි වකුටු කර රවුමක් සෑදුවා. බිංදුවක්. පිපුරුම් උපකරණයේ කාල මාපකයේ පොරොත්තු කාලයක් නැහැ. එයාට එහි බොත්තම ඔබන්න හැකි වුණොත් එසැණින් ම නැව පුපුරා යාවි. ඒක පාවිච්චි කරන්න කලින් උවමනා තරම් දුරට යාගන්න අපිට කොහෙත්ම පුළුවන්කමක් නැති වේවි. ඊට කලින් රාක්ෂයෝ අපිව මරලා දායි, එහෙම නැත්නම් බෝම්බ නිෂ්ක්‍රීය කරයි, එහෙමත් නැත්නම් ඒ දෙක ම වෙයි.

ක්‍රෝනොස් ඇද වුණු හිනාවක් එක්ක මගේ දිහාවට හැරුණා. "මගේ අදක්ෂ උදවුකාරයෝ ගැන නුඹ මට ක්ෂමා කරන්න ඕනෑ, පර්සි ජැක්සන්. ඒත් ඒක ප්‍රශ්නයක් නෙවෙයි. දැන් අපි නුඹව අල්ලගෙන ඉවරයි. නුඹ මෙහෙ එන බව අපි සති ගාණක් තිස්සේ දැනගෙන හිටියා."

එයා ඉදිරියට දිගු කළ අතෙන් ටයිටන් රජාගේ සංකේතය වූ දෑකැත්තක හැඩයේ යන්තරයක් ඇමිණූ රිදී අත් පලඳනාවක් පහළට එල්ලුණා.

අතේ තිබුණ තුවාලය මගේ කල්පනා කිරීමේ හැකියාව මොට කරමින් තිබුණත් මම කෙඳිරුවා, "පණිවුඩ හුවමාරු කරන උපක්‍රමයක්... කඳවුරේ ඔත්තුකාරයෙක්."

ක්‍රෝනොස් කෙකර ගෑවා. "නුඹට යාළුවෝ විශ්වාස කරන්න බැහැ. එයාලා හැම වෙලාවෙ ම නුඹව පහතට ඇදලා දානවා. ලූක් ඒ පාඩම අමාරු පාරෙන් ඉගෙන ගත්තා. දැන් නුඹේ කඩුව බිම දාලා මට යටත් වෙනවා, නැත්නම් නුඹේ යාළුවාට මැරෙන්න වෙයි."

මම තදින් කෙළ පිඬක් ගිල්ලා. එක යෝධයෙක් බෙකන්ඩොර්ෆ්ගේ බෙල්ල වටේට අතක් තබාගෙන හිටියා. මම හිටියේ කොහෙත්ම එයාව බේරගන්න පුළුවන් තත්ත්වෙක නෙවෙයි. මම ඒකට උත්සාහ කළත්, මම කිට්ටු වෙන්නත් කලින් එයාව මරලා දමාවි. අපි දෙන්නව ම.

බෙකන්ඩොර්ෆ් එක වචනයක් තොල් මැතිරුවා: යන්න.

මම ඔළුව හෙල්ලුවා. මම කොහොමද නිකං ම එයාව දාලා යන්නේ.

දෙවෙනි යෝධයා තවමත් පීච් කෑන් අවුස්සමිනුයි සිටියේ. ඒ කියන්නේ බෙකන්ඩොර්ෆ්ගේ වම් අත නිදහස්. එයා හෙමින් සීරුවේ එය ඔරලෝසුව බැඳගෙන සිටි දකුණු මැණික් කටුව දෙසට එසවූවා.

Scanned with CamScanner

එපා! මට මොර දෙන්න ඕනෑ වුණා.

ඒ වේලාවේ පිහිනුම් තටාකය අසල සිටි සර්ප ගැහැනියක් පිඹින්න ගත්තා. "ඒකා මොනවද කරන්නේ? ඒකගේ මැණික් කටුවෙ මොකක්ද අර තියෙන්නේ?"

තදින් ඇස් වසාගත් බෙකන්ඩොර්ෆ් ඔරලෝසුව මතට අත ගෙන ගියා.

මට වෙන කරන්න දෙයක් නැති වුණා. මම මගේ කඩුව හෙල්ලයක් වගේ ක්‍රෝනොස් වෙතට විසි කළා. ඒක එයාගේ පපුවේ වැදී කිසිම හානියක් නොකර ඉව්තට පොළා පැන්නා, ඒත් ඒකෙන් එයාව තිගැස්සුණා. මම රාක්ෂ සේනාව තල්ලු කරගෙන දුව ගොස්, නැවේ බරාඳය මතින් අඩි සිය ගාණක් පහළින් වූ මුහුදට පැන්නා.

නැවේ ගැඹුරෙන් මට ගිගුරුම් හඬක් ඇසුණා. මට ඉහළින් රාක්ෂයෝ මොර දුන්නා. මගේ කන ළඟින් ම හෙල්ලයක් ඇදී ගියා. පියඹා ආව ඊතලයක් මගේ කලවයක් පසාරු කළා. ඒත් එයින් හටගත් වේදනාව දැනෙන්න තරම් කාලයක් මට තිබුණේ නැහැ. මුහුද තුළට වේගයෙන් කිඳා බැස්ස මම, මාව හැකි තරම් ඈතට අරන් යන්න දියවැල්වලට නියෝග කළා- යාර සීයක්, යාර දෙසීයක්.

ඒ තරම් ඈත සිටියත් පිපුරුමෙන් ලෝකය ම දෙදරනවා මට ඇසුණා. ඇදී ආ උණුසුමට මගේ ඔළුව පිටුපස දැවුණා. දෙපසින් ම පුපුරා ගිය ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා අති විශාල ගිනි බෝලයක් බවට හැරවූ කොළ පාට ගිනි දලු, සියල්ල දවා අළු කරමින් අඳුරු අහස දෙසට පෙරළුණා.

බෙකන්ඩොර්ෆ්, මම හිතුවා.

ඊට පස්සේ සිහිසුන් වූ මම නැංගුරමක් වගේ මුහුදු පතුල දෙසට කිඳා බැස්සා.

# 02

# මට මාළු නෑදෑයෝ ටිකක් මුණ ගැහුණා

උප දෙවි හීන නම් මහ ජරාවක්.

වැඩේ කියන්නේ, ඒවා නිකං ම නිකං හීන විතරක් නෙවෙයි නේ. ඒවාගෙන් දුර ඈතක සිදුවෙන දේවල්, පෙරනිමිති වගේම මගේ මොළේ හිරිවට්ටන විදිහේ හැම ජාතියක ම ගුප්ත පණිවුඩ පෙන්වනවා.

කඳු මුඳුනක් උඩ ඇති අඳුරු මාලිගාවක මම ඉන්නවා මට හීනෙන් පෙනුණා. අවාසනාවට වගේ ඒ තැන මම හඳුනා ගත්තාඃ ඒක තමයි ඔත්‍රිස් කන්ද- එහෙමත් නැත්නම් ටැමල්පයිස් නමින් හඳුන්වන කැලිෆෝනියාවේ පිහිටි කන්ද උඩ තියෙන ටයිටන්වරුන්ගේ මාලිගාව. කළු පාට ග්‍රීක කුලුනුවලින් සහ ටයිටන්ලාගේ ප්‍රතිමාවලින් වට වී තිබුණු ප්‍රධාන මණ්ඩපය රාත්‍රියට විවරව තිබුණා. කළු ගරුඬ පොළොවට පන්දම් එළි වැටී දිලිසෙමින් තිබුණා. කාමරය මැද, සන්නාහයෙන් සැරසුණු යෝධයෙක් පුනීලාකාර වලාකුළු සුළියක බරට යටවී දඟලමින් සිටියා- ඒ තමයි අහස ඔසවාගෙන සිටින ඇට්ලස්.

ලෝකඩ ගිනි අඟුරු බඳුනක් අසල සිටගෙන සිටි තවත් යෝධ පිරිමි දෙන්නෙක් ගිනි දලුවලින් දිස්වෙන රූප අධ්‍යයනය කරමින් සිටියා.

"එහෙමත් පිපිරිල්ලක්," එකෙක් කිවුවා. එයා ඇඳ සිටියේ තරු පිරුණු අහසක පෙනුම ගත් රිදි තිත් වැටුණු කළු පාට සන්නාහයක්. වක ගැසුණු බැටළු අං දෙකක් දෙපසින් ඇති යුද හිස්වැසුමකින් එයාගේ මුහුණ ආවරණය වී තිබුණා.

Scanned with CamScanner

"ඒකෙන් කමක් නෑ," අනෙකා කිවුවා. රන් පාට ලෝගුවකින් සැරසී සිටි මේ ටයිටන්ට තිබුණේ ක්‍රෝනොස්ගේ වගේ රත්වන් ඇස් දෙකක්. එයාගේ මුළු ඇඟ ම දිලිසුණා. එයාව දකිද්දි මට හිරු දෙවියා, ඇපලෝව සිහි වුණා. ඒ වුණත් මේ ටයිටන්ගෙන් එළිය ඊට වඩා රළුයි, මුහුණෙන් පළවුණු බැල්මත් ඊට වඩා කෲර පාටයි. "දෙවිවරු අභියෝග යට උත්තර දිලා තියෙනවා. ඉක්මනින් ම උන්ව විනාශ වෙලා යයි."

ගින්න තුළින් දිස්වුණු රූප ඇඳින ගන්න අමාරු වුණා: කුණාටු, කඩා වැටෙන ගොඩනැගිලි, භීතියෙන් බෙරිහන් දෙන මිනිස්සු.

"අපේ සේනාවන් පෙළ ගස්වන්න මම නැගෙනහිරට යන්නම්," රත්වන් ටයිටන් කිවුවා. "ක්‍රියෝස්, නුඹ මෙහෙ නැවතිලා ඔත්‍රිස් කන්ද මුර කරොත් හොඳයි."

බැටළු අං පැලඳගෙන හිටපු හාදයා අමනාපය පළ කරා. "හැම වෙලාවෙ ම අමන රස්සා ටික ලැබෙන්නේ මට තමයි. දකුණු දිසාවට අධිපති. තරු රටාවලට අධිපති. දැන් නුඹලා හැමෝම ගිහින් විනෝද වෙනකල් මම ඇට්ලස්ට තනි රකින්න ඕනෑ."

සුළි නංවන වලාකුළු යට ඇට්ලස් පීඩාවෙන් ගිගුරුවා, "මට මෙතැනින් පිටවෙන්න දෙනවලා, නුඹලට හෙණ ම ගහපි! නුඹලගෙන් හොඳ ම රණශූරයා මමයි. මට සටන් කරන්න දීලා, මේ බරට කර ගහපල්ලා!"

"කට වහගන්නවා!" රත්වන් ටයිටන් ගර්ජනා කළා. "නුඹට නුඹේ අවස්ථාව ලැබුණා, ඇට්ලස්. නුඹ ඒකෙන් අසාර්ථක වුණා. නුඹ ඔය ඉන්න තැන ම ඉන්නවටයි ක්‍රෝනොස් කැමති. එතකොට නුඹ ගැන කියනවා නම්, ක්‍රියෝස්, නුඹට පවරපු රාජකාරිය කරනවා."

"එතකොට නුඹට තව යුද හටයෝ ඕනෑ වුනොත්?" ක්‍රියෝස් ඇහුවා. "කබා කුරුත්තං ඇඳගෙන ඉන්න අපේ විශ්වාස කරන්න බැරි බෑණාගෙන් සටනක දී නම් නුඹට වැඩි උදවුවක් ලැබෙන එකක් නැහැ."

රත්වන් ටයිටන් මහ හඬින් හිනා වුණා. "එයා ගැන කරදර වෙන්නෙපා. ඇරත්, දෙවිවරුන්ට අපි මුලින් ම දෙන පුංචි අභියෝගය පාලනය කරගන්නත් අමාරු වෙයි. අපි තව කී දෙනෙක් ඉස්ටෝරුවේ තියාගෙන ඉන්නව ද කියලා උන්ට කිසිම අදහසක් නැහැ. මං අද කිවුවයි කියලා මතක තියාගන්න, තව ටික දවසකින් ඔලිම්පස් සුන්නදූලි



වෙලා යනවා. ඊට පස්සේ අපි මෙතැනදි ම මුණ ගැහිලා හයවෙනි යුගයේ උදාව සමරනවා!"

ගිනි දළු ගොඩකට හැරුණු රත්වන් ටයිටන් එතැනින් චුත වුණා.

"ඔහ්, ඇත්තට," ක්‍රියෝස් අවලාද නැගුවා. "එයාට ගිනි දළුවලට හැරෙන්න පුළුවන්. මට ලැබුණේ මේ තකතීරු බැටළු අං දෙක ඔළුවෙ දාගෙන ඉන්න විතරයි."

ඒ දර්ශනය මාරු වුණා. දැන් මම මණ්ඩපයෙන් පිටත, ග්‍රීක කුලුනක සෙවණැල්ල තුළ සැඟවී සිටියා. මට එහා පැත්තෙන් පිරිමි ළමයෙක් ටයිටන්ලාගේ කතාවට හොරෙන් කන් දෙමින් හටියා. කළු පාට සිනිඳු කොණ්ඩයක් සහ සුදුමැලි සමක් තිබුණු එයා කළු පාට ඇඳුම්වලින් සැරසී සිටියා- ඒ තමයි මගේ යාළුවා සහ හේඩීස්ගේ පුතා, නිකෝ ඩී ආන්ජෙලෝ.

එයා බරපතළ බැල්මක් ඇති මුහුණින් එක එල්ලේ මගේ දිහා බැලුවා. "ඔයාට පේනව නේ, පර්සි?" එයා රහසින් ඇහුවා. "ඔයාට ලැබුණ කාලය ඉවර වේගෙන එන්නේ. ඔයා හිතනව ද මගේ සැලසුම නැතුව ඔයාට එයාලව පරද්දන්න පුළුවන් කියලා?"

එයාගේ වචන සමුදුරු පතුල තරම් ශීතලෙන් මාව වසා ගත්තා. ඒත් එක්ක ම මගේ සිහින නැති වී ගියා.

★★★

"පර්සි?" ගැඹුරු කටහඬක් කතා කරනවා ඇහුණා.

මට දැනුණේ මගේ ඔළුව ඇලුමිනියම් දවටනයක ඔතලා, මයික්‍රොවේව් උඳුනකට දාලා අරන් වගෙයි. ඇස් ඇරලා බලද්දී මට විශාල, අඳුරු රූපයක් මගේ දිහාවට නැමීගෙන ඉන්නවා පෙනුණා.

"බෙකන්ඩොර්ෆ්?" මම බලාපොරොත්තු සහගතව කතා කළා.

"නැහැ, අයියා."

මගේ ඇස් නැවත නාභිගත වුණා. මම බලාගෙන හිටියේ සයික්ලොප්ස් කෙනෙක් දිහාවයි- විරූපී මුහුණක්, දුඹුරු පාට මී ලොම් වගේ හිස් කෙස් ගොඩක් සහ ඕනෑකමින් බලා සිටින දුඹුරු පාට, ලොකු තනි ඇහැක් ඇති කෙනෙක්.

"ටයිසන්?"

Scanned with CamScanner

මගේ සහෝදරයා දත් තිස්දෙක ම පෙන්නා නියෙව්වා. "යේ! ඔයාගේ මොළේ වැඩ!"

මට නම් ඒ ගැන එච්චර විශ්වාසක් තිබුණේ නැහැ. මගේ මුළු ඇඟ ම බර නැති සහ සීතල වෙලා. මගේ කටහඬත් ඇසුණේ වැරදියටයි. මට ටයිසන් කියන දේවල් ඇසුණත්, ඒක දැනුණේ සාමාන්‍ය හඬකට වඩා මගේ හිස්කබල ඇතුළේ කම්පනවලට ඇහුම්කන් දෙනවා වගෙයි.

මම ඇඳ උඩ වාඩි වුණා, ඒත් එක්ක ම සිනිඳු පොරෝනාව ඉවතට පාවෙලා ගියා. මම සිටියේ බෙලි කටු ඇල්ලූ බිත්ති ඇති කාමරයක, සිනිඳු මුහුදු පැළෑටිවලින් වියූ ඇඳක් උඩයි. පැසි පන්දු තරම් විශාල මුතු ඇට සිවිලිම වටා පාවෙමින්, එළිය සැපයූවා. මම හිටියේ මුහුද යටයි.

දැන්, පොසෙයිඩන්ගේ පුතා වුණ මට ඒක ප්‍රශ්නයක් නෙවෙයි. මට සාමාන්‍ය විදිහට ම වතුර යටදිත් හුස්ම ගන්න පුළුවන්, ඒ වගේම මට ඕනෑ නැත්නම් මගේ ඇඳුම් තෙමෙන්නෙත් නැහැ. ඒ කොහොම වුණත් මිටි හිසැති මෝරෙක් කාමරයේ ජනේලය හරහා පිහිනාගෙන ඇවිත්, මගේ දිහා සැලකිල්ලෙන් බලා ඉඳලා, කාමරයේ විරුද්ධ පැත්තෙන් සන්සුන්ව පිහිනාගෙන යනවා දැක්කා ම මට පොඩි තිගැස්සුමක් නොදැනුණාමත් නෙවෙයි.

"කොහෙද-"

"තාත්තිගෙ මාලිගාවෙ," ටයිසන් කිව්වා.

වෙන වෙලාවක නම්, එයින් මම පුදුමයටත් සතුටටත් පත්වෙන්න තිබුණා. මීට කලින් කවදාවත් මම පොසෙයිඩන්ගේ රාජධානියට ඇවිත් තිබුණේ නැහැ, ඇත්තටම මම අවුරුදු ගාණක් තිස්සේ ඒ ගැන සිහින මවමිනුයි හිටියේ. ඒත් දැන් මගේ ඔළුව රිදෙමින් තිබුණා. මගේ කමිසය තවමත් පිපුරුමෙන් ඇති වූ පිළිස්සුම් ලකුණුවලින් ලප වැටිලා. මගේ අතේ සහ කකුලේ තිබුණ තුවාල සුව වෙලා- ඒකට නම් මම මුහුදට බැස්සත් ඇති- ඒ වුණත් මට තවමත් දැනුණේ ලයිස්ට්‍රිගෝනියානු පාපන්දු කණ්ඩායමකට පෑගිලා චප්ප වෙලා වගෙයි.

"කොච්චර කාලයක්-"

"අපි ඔයාව හොයාගත්තේ ඊයෙ රෑ," ටයිසන් කිව්වා, "වතුරේ කිඳා බහිමින් ඉඳිද්දි."



"ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා?"

"ඩෝංංං! ගාලා පිපුරුවා," ටයිසන් තහවුරු කළා.

"බෙකන්ඩොර්ෆ් නැවේ හිටියා. ඔයාලා හොයාගත්ත ද..."

ටයිසන්ගේ මූණ අඳුරු වුණා. "එයාගේ ලකුණක්වත් නෑ. මට කණගාටුයි, අයියා."

මම ජනේලයෙන් එපිට පෙනෙන තද නිල් පාට වතුර දිහාවට ඇස් හරවා ගත්තා. බෙකන්ඩොර්ෆ් හිටියේ එන වාරේ සරසවියට යන්නයි. එයාට පෙම්වතියක් හිටියා, යාළුවෝ ගොඩක් හිටියා. එයාට ඉස්සරහට ගත කරන්න මුළු ජීවිතයක් ම තිබුණා. එයා එහෙම නිකං ම නැති වුණා වෙන්න බැහැ. සමහරවිට එයත් මම වගේ නැවෙන් පැන ගන්න ඇති. සමහරවිට එයත් නැවේ පැත්තකින් පනින්න ඇති... ඒත් ඊට පස්සේ? මට වගේ අඩි සිය ගාණක උසකින් වතුරට වැටිලා ජීවිතය බේරගන්න එයාට පුළුවන්කමක් නැහැ. පිපුරුමට කලින් උවමනා තරම් දුරට යාගන්නත් එයාට පුළුවන්කමක් නැහැ.

එයා මියගොස් ඇති බව මගේ ඇතුළාන්තයෙන් මම දැනගෙන හිටියා. එයා ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා විනාශ කරන්න එයාගේ ජීවිතය කැප කළා, ඒ තියෙද්දිත් මම එයාව අත ඇරලා ආවා.

මම මගේ හීනය ගැන කල්පනා කළා: පිපුරුම ඒ හැටි දෙයක් නොවෙන ගාණට ටයිටන්ලා ඒ ගැන කතා කරමින් හිටපු හැටි, නිකෝගේ සැලසුම- මම අවුරුද්දක් පුරා මඟ අරිමින් සිටි අනතුරුදායක අදහස- අනුව නොගියොත් මට කවදාවත් ක්‍රෝනොස්ව පරදවන්න බැරි වෙන බව එයා කියපු හැටි.

ඈතින් නැගුණු පිපුරුම් හඬකින් කාමරය දෙදුරුවා. මුළු මුහුද ම දහවල තරම් දීප්තිමත් කරමින් කොළ පාට එළියක් පැතිරුණා.

"ඒ මොකක්ද?" මම ඇහුවා.

ටයිසන් බලා සිටියේ හිතේ කරදරෙන් වගෙයි. "තාත්ති කියලා දෙයි. එන්න, එයා රාක්ෂයින්ව කුඩුපට්ටම් කරනවා."

★★★

නස්පැත්තියකට මැදිවෙලා නොතිබුණා නම්, ඒ මාලිගාව මම මේ තරම් කාලෙකට දැකපු පුදුමාකාර ම තැන වෙන්න ඉඩ තිබුණා. දිගු කොරිඩෝවක් කෙළවරට පිහිනා ගිය අපි ඉහළට විදින උණු දිය

Scanned with CamScanner

කඳකට මැදිව උඩට ගියා. අපි වහල මට්ටමට ළඟා වෙද්දී මට හුස්ම ගන්නත් අමතක වුණා.

ඒ මාලිගාව ඔලිම්පස් කඳු මුඳුනේ ඇති නගරය තරම් විශාලයි. එහි පුළුල් අංගන, උද්‍යාන සහ කුලුනු සවි කළ මණ්ඩප තිබුණා. කොරල් ජනාවාසවලින් සහ දිලිසෙන මුහුදු පැළෑටිවලින් උද්‍යාන හැඩ කර තිබුණා. සුදු පාට, එහෙත් දේදුනු වර්ණවලින් දිලිසෙන බෙලි කටුවලින් සෑදූ ගොඩනැගිලි විස්සක් තිහක් විතර දකින්න ලැබුණා. ඒවාගේ ජනේලවලින් මාළුවෝ සහ බූවල්ලෝ ඇතුළටත් පිටතටත් යමින් සිටියා. පාරවල් දෙපස අල්ලා තිබුණ මුතු කැට දිලිසුණේ නත්තල් විදුලි බුබුළු වගෙයි.

ප්‍රධාන අංගනය යුද භටයින්ගෙන් පිරිලා- ඉණෙන් පහළට මාළු වරල් සහ ඉණෙන් ඉහළට මිනිස් ඇඟවල් ඇති කිඳුරු මිනිස්සු. හැබැයි එයාලගේ හම නිල් පාටයි කියලා මම කලින් දැනගෙන හිටියේ නැහැ. සමහරු තුවාල ලැබූවන්ට සාත්තු කරමින් සිටියා. සමහරු හෙලි සහ කඩු මුවහත් කරමින් සිටියා. එක් අයෙක් අපිව පසු කරගෙන කඩිමුඩියේ පිහිනා ගියා. එයාගේ ඇස් දීප්තිමත් කොළ පාටයි. ඒ වගේම එයාට තිබුණේ මෝර දත්. ඒ වගේ දේවල් 'ලිට්ල් මර්මෙයිඩ්' කාටූන් එකෙන් ඔයාලට පෙන්වන්නෙ නැහැ නේ.

ප්‍රධාන අංගනයෙන් පිටත විශාල ආරක්ෂක විධි විධාන යොදා තිබුණා- මුර අටලු, තාප්ප සහ වැටලීම් වළක්වන අවි ආයුද- ඒත් ඒවායින් වැඩි ප්‍රමාණයක් තිබුණේ සුන්බුන් වෙලයි. අනෙක් ඒවා මම හොඳින් දැන සිටි අමුතු කොළ පාට ගිනි දැලුවලින් වැසී තිබුණා- ග්‍රීක ගින්දර, ඒවාට වතුර යට දී පවා ඇවිලෙන්න පුළුවන්.

මේවාට එපිටින් සමුද්‍රරු පතුල අන්ධකාරය තුළට ඇදී ගොස් තිබුණා. යුද ගිනි ඇවිලෙන හැටි මට පෙනුණා- බල ශක්ති කඳන් නිකුත් වෙන හැටි, පිපුරුම් ඇති වෙන හැටි වගේම සේනා එකිනෙක ගැටෙන හැටි. සාමාන්‍ය මනුෂ්‍යයෙකුට නම් මේ අඳුර මැදින් ඒවා පෙනෙන්නේ නැති වෙයි. මේ මොන කතා ද, සාමාන්‍ය මනුෂ්‍යයෙක් නම් මේ පීඩනයෙන් චප්ප වෙලා, සීතලෙන් ගල් ගැහිලා යයි. අඩු තරමේ මගේ තාප සංවේදි ඇස්වලටවත් සිදුවන දේ හරියට ම ඇඳින ගන්න අමාරු වුණා.

මාලිගා සංකීර්ණය කෙළවර වූ රතු කොරල්වලින් සෑදූ දේවස්ථානයක් පුපුරා ගියේ ගින්දර සහ හුමාලය පිටවෙන සුන්බුන් ඇතින් ම වූ උද්‍යානවලට පවා විසුරුවමින්. ඉහළින් වූ අඳුර මැදින්



සද්දන්ත රූපයක් මතු වුණා- ගොඩනැගිල්ලකටත් වඩා විශාල දැල්ලෙක්. ඌ හිටියේ දිලිසෙන දූවිල්ලකින් වැහිලයි- අඩු තරමේ, මම මුලින් හිතුවේ ඒ දූවිල්ලක් කියලයි. ඒත් ඒ රාක්ෂයාට පහර දෙන්න උත්සාහ කරන කිඳුරු මිනිස්සු බව ටිකකින් මට තේරුම් ගියා. මාලිගාව උඩට බැස්ස දැල්ලා, ඌගේ ග්‍රාහකවලින් පහර දුන්නේ සෙබළ මුළක් ම පොඩි කර දමමින්. ඒ වෙලාවේ උස ම ගොඩනැගිලිවලින් එකක වහලය මතින් අති දීප්තිමත් නිල් පාට ආලෝක ධාරාවක් නිකුත් වුණා. එය යෝධ දැල්ලාගේ වැදුණා ම, රාක්ෂයා දිය වී ගියේ වතුරට වැටුණ සායම් බිංදුවක් වගෙයි.

"තාත්ති," ටයිසන් ආලෝක ධාරාව පැමිණි තැනට ඇඟිල්ල දිගු කරමින් කිවුවා.

"එයා ද ඒක කළේ?" හදිසියේ ම මට වඩාත් බලාපොරොත්තු සහගත බවක් දැනුණා. මගේ තාත්තා අදහන්නත් බැරි තරම් බලගතුයි. එයා තමයි සමුද්‍රරට අධිපති දෙවියා. මේ වගේ ප්‍රහාරයක් පාලනය කරගන්න එයාට පුළුවන්, හරි ද? සමහරවිට එයා මටත් උදවු කරන්න ඉඩ දෙයි.

"ඔයත් යුද්දෙට ගියා ද?" මම ටයිසන්ගෙන් ඇසුවේ විස්මයෙන්. "ගිහිල්ලා ඔයාගේ සුපිරි සයික්ලොප්ස් ශක්තියෙන් ඔළු ගෙඩි චප්ප කරලා ආව ද?"

ටයිසන් හොට බලියාගත් හැටි දැක්කා ම මම ඇසුවේ නරක ප්‍රශ්නයක් බව මට තේරුම් ගියා. "මම හිටියේ... ආයුද හදහදා," එයා මිමිණුවා. "එන්න. අපි තාත්ති හොයාගෙන යමු."

★★★

මං දන්නවා, සාමාන්‍ය දෙමව්පියෝ ඉන්න අයට නම් මේක අමුතු කතාවක් කියලා හිතෙයි, ඒ වුණත් මම මගේ තාත්තව ජීවිතේට ම දැකලා තියෙන්නේ හතර පස් වතාවක් විතරයි. ඒකත් විනාඩි කීපයකට වඩා නෙවෙයි. ග්‍රීක දෙවිවරු කියන්නේ තමන්ගේ දරුවෝ පැසිපන්දු ක්‍රීඩා කරනවා බලන්න එන ජාතියේ අය නෙවෙයි නේ. ඒ කොහොම වුණත්, පොසෙයිඩන්ව දැකපු හැටියේ මට හඳුනාගන්න පුළුවන් වෙයි කියලයි මම හිතුවේ.

මම හිතලා තිබුණා වැරදියි.

විශාල විවෘත තට්ටුවක් වූ දේවස්ථානයේ වහලය අණ දෙන මූලස්ථානය බවට පත් කර තිබුණා. එහි පොළොවේ වූ මොසැයික්

නිර්මාණයෙන් මාලිගා භූමිය සහ එය වටා ඇති සමුද්‍රයේ සිතියමක් දක්වුණා. ඒත් හමුදා බල මුළු සහ මුහුදු රාක්ෂයින් නිරූපණය කරමින් තිබූ පාට පාට ටයිල් කැට, බලකායන් ස්ථාන මාරු කරද්දී සිතියමේ තැනින් තැනට ගමන් කළා. සැබෑ ජීවිතයේ දී ගොඩනැගිලි කඩා වැටෙද්දී, සිතියමෙත් එය ම සිදු වුණා.

මොසැයික් සිතියම වටා හිටගෙන, බැරෑරුම් මුහුණුවලින් යුතුව සටන අධ්‍යයනය කරමින් අරුම පුදුම රණ ශූරයින් සමූහයක් සිටියත්, ඒ එක්කෙනෙක්වත් මගේ තාත්තා වගේ පෙනුනේ නැහැ. මම සොයමින් සිටියේ අව්වට දුඹුරු පාටට හැරුණු හමක් සහ කළු රැවුලක් ඇති, බර්මියුඩා කොට කලිසමකින් සහ හවායි කමිසයකින් සැරසුණු හැඩිදැඩි පිරිමියෙක්.

ඒත් මෙතැන ඒ වගේ කෙනෙක් හිටියෙ නැහැ. එතැන සිටි එක් අයෙක් එක මාළු වරලක් වෙනුවට දෙකක් තිබුණ කිඳුරෙක්. එයාගේ හම කොළ පාටයි. එයාගේ සන්නාහයට මුතු ඇට වද්දා තිබුණා. එයාගේ කළු කොණ්ඩය පෝනි ටේලයකට ගැට ගසා තිබුණා. එයාට තරුණ පෙනුමක් තිබුණා, ඒ වුණත් මිනිස්-නොවන අයගේ වයස හරියට ම කියන්න අමාරුයි. එයාලා අවුරුදු දහසක් නැත්නම් තුන්දහසක් වයස අය වෙන්නත් ඉඩ තියෙනවා. එයා අසල සිටියේ සුදට හැරුණු ඝන රැවුලක් සහ අළු පාට කොණ්ඩයක් ඇති වයසක පිරිමියෙක්. එයාගේ යුද සන්නාහයේ බරින් එයාව පහතට නැමිලා වගෙයි පෙනුණේ. එයාට කොළ පාට දෑසකුත්, ඒවා වටේට හිනා වෙද්දී මතුවෙන රැළි ගොඩකුත් තිබුණා. ඒ වුණත් මේ වෙලාවේ නම් එයා හිටියේ හිනාවෙමින් නෙවෙයි. එයා හිටියේ ලොකු ලෝහමය යෂ්ටියකට වාරු වෙලා සිතියම අධ්‍යයනය කරමිනුයි. එයා ළඟින් ම සිටියේ පාවෙන කළු කෙස් කලඹක් සහ කකුළු අඬු වගේ අමුතු පුංචි අං ඇති ලස්සන ගෑනු කෙනෙක්. එයා කොළ පාට සන්නාහයකින් සැරසී සිටියා. ඒ වගේම එතැන ඩොල්ෆින් කෙනෙකුත් හිටියා. හරි ම සාමාන්‍ය ඩොල්ෆින් කෙනෙක් වුණත් ඌ සිතියම දිහා බලාගෙන හිටියේ බොහොම ඕනෑකමිනුයි.

"ඩෙල්ෆින්," වයසක මනුස්සයා කතා කළා. "පලයිමොන්වයි එයාගේ මෝර හමුදාවයි බටහිර පෙරමුණට යවන්න. අපි අර ලෙවියතන්ලගේ බලය නැති කරලා දාන්න ඕනෑ."



ඩොල්ෆින් චිරි-චිරි හඬින් කතා කළා, ඒ වුණත් මට ඌ කියූ දේ තේරුම් ගන්න හැකි වුණා: එහෙමයි, උතුමාණෙනි! ඌ වේගයෙන් පිහිනාගෙන යන්න ගියා.

මම කැලඹුණු සිතින් ටයිසන් දිහාවත්, ඊට පස්සේ ආයෙමත් අර වයසක පිරිමියා දිහාවත් බැලුවා.

ඒක වෙන්න පුළුවන් දෙයක් වගේ පෙනුනේ නැහැ, ඒ වුණත්... "තාත්තේ?" මම කතා කළා.

වයසක පිරිමියා ඔළුව ඔසවා බැලුවා. එයාගේ දෑස්වල තිබුණු දිස්නය මම හඳුනා ගත්තා, ඒ වුණත් එයාගේ මුහුණ... එයා අවුරුදු හතළිහකින් වියපත් වෙලා වගෙයි පෙනුණේ.

"හලෝ, පර්සි."

"මොනවද- මොනවද ඔයාට වුණේ?"

ටයිසන් මට වැළමිටෙන් ඇන්නා. එයා ඔළුව හොලවමින් හිටපු වේගයට ඒක ගැලවිලා වැටෙයි කියලා මට බය හිතුණා, ඒ කොහොම වුණත් පොසෙයිඩන් එයින් අමනාප වුණ බවක් පෙනුනේ නැහැ.

"ඒකට කමක් නෑ, ටයිසන්," එයා කිවුවා. "පර්සි, මගේ පෙනුම ගැන සමා වෙන්න ඕනෑ. මේ යුද්ධය මට බලපෑම් කරලා තියෙන්නේ."

"ඒත් ඔයා අමරණීය කෙනෙක් නේ," මම හෙමිහිට කිවුවා. "ඔයාට... ඔයා කැමති ඕනෑ ම විදිහකට පෙනී ඉන්න පුළුවන් නේ."

"මගෙන් පෙන්නුම් කරන්නේ මගේ රාජධානියේ තත්ත්වය," එයා කිවුවා. "එතකොට, මේ වෙලාවේ හැටියට ඒ තත්ත්වය බරපතළ එකක්. පර්සි, මම ඔයාට හඳුන්වලා දෙන්න ඕනෑ- මට බය ඔයාට මගේ ලෙෆ්ටිනන්ට් ඩෙල්ෆින්ව මඟ ඇරුණා. එයා තමයි ඩොල්ෆින්ලගෙ දෙවියා. මේ ඉන්නේ මගේ, එර්ර්ර්, බිරිඳ, ඇම්ෆිට්‍රයිට්. මගෙ වස්තුවේ-"

සීතල බැල්මකින් මගේ දිහා බලා උන් කොළ පාට සන්නාහයෙන් සැරසුණු ගැහැනු කෙනා ඊට පස්සේ දෑත් බැඳගත්තා, "සමා වෙන්න, මගේ උතුමාණෙනි. මාව යුද්ධය තියෙන තැනට උවමනා ඇති."

එයා ඉවතට පිහිනා ගියා.

මම සෑහෙන අපහසුවකට ලක් වුණා, කොහොම වුණත් මං හිතන්නේ එයාට දොස් කියන්න මට බැහැ. මීට කලින් කවදාවත් මම

ඒ ගැන වැඩිය හිතලා නොතිබුණත්, මගේ තාත්තට අමරණීය බිරිඳක් හිටියා. මගේ අම්මා ඇතුළු අනෙක් සියලු ම මනුෂ්‍ය කාන්තාවෝ සමඟ එයා ඇති කරගෙන තිබුණු ආලවන්තකම්... මෙහෙමයි, ඇම්ෆිට්‍රයිට් නම් ඒවාට වැඩිය කැමති වෙන්න නැතුව ඇති.

පොසෙයිඩන් උගුර පෑදුවා. "ඔව්, හොඳයි... එතකොට මේ ඉන්නේ මගේ පුතා, ට්‍රයිටන්. එර්ර්ර්, මගේ අනිත් පුතා."

"ඔබතුමාගේ පුතා සහ උරුමක්කාරයා," කොළ පාට හාදයා නිවැරදි කළා. එයාගේ මාලු වරල් යුවළ ඉදිරියටත් පසුපසටත් සැලෙමින් තිබුණා. එයා මට හිනාවක් පෑවත්, එයාගේ ඇස්වල නම් කිසිම මිත්‍රශීලී බවක් තිබුණේ නැහැ. "හලෝ, පර්සියස් ජැක්සන්. අන්තිමේ දී උදවු කරන්න ආව ද?"

එයා හැසිරුණේ හරියට මම පරක්කුයි, එහෙම නැත්නම් කම්මැලියි වගෙයි. වතුර යට දී කෙනෙක්ට රතු වෙන්න පුළුවන් නම්, ඒ වෙලාවේ මගේ මූණ එහෙම වෙන්න ඇති.

"මම කරන්න ඕනෑ මොනවද කියලා මට කියන්න," මම කිවුවා.

ට්‍රයිටන් හිනා වුණේ ඒක හරිම හුරතල් යෝජනාවක් වගෙයි- හරියට මම එයාට බුරපු හුරතල් බල්ලෙක් වගෙයි. එයා පොසෙයිඩන් වෙතට හැරුණා. "මම පෙරමුණ ගැන බලාගන්නම්, පියාණෙනි. බය වෙන්න එපා. මම පරාද වෙන්නෙ නැහැ."

එයා ආචාරශීලීව ටයිසන්ට ඔළුව වැනුවා. මට ඒ තරම්වත් ගෞරවයක් නොලැබුණේ කොහොමද? ඊට පස්සෙ එයා වතුර තුළට වේගයෙන් ඇදී ගියා.

පොසෙයිඩන් සුසුමක් හෙළුවා. එයා යෂ්ටිය එසෙව්වා ම ඒක එයාගේ හුරු පුරුදු ආයුදය- ත්‍රිශූලය බවට හැරුණා. එහි තුඩ නිල් පාට එළියකින් දිලිසුණා. එය වටා වතුර ශක්තියෙන් බුබුළු දැමුවා.

"ඒ ගැන මට කණගාටුයි," එයා මට කිවුවා.

අපිට ඉහළින් මතු වුණ සද්දන්ත මුහුදු සර්පයෙක් දඟර ගැහෙමින් වහලය දෙසට පහත් වෙන්න ගත්තා. දීප්තිමත් තැඹිලි පාට ඒ සතාට ව්‍යායාම ශාලාවක් වුණත් ගිල දමන්න හැකි තරම් ලොකු, උල් දත් පිරුණ කටක් තිබුණා.



ඔළුව ඔසවා බලන්නවත් කරදර නොවුණ පොසෙයිඩන්, එයාගේ යෂ්ටිය ඌ දිහාවට දිගු කර නිල් පාට විද්‍යුත් දහරාවකින් පහර දුන්නා. ඩෝංංං! රාක්ෂයා ගොල්ඩ් ෆිෂ්ලා මිලියන ගාණක් බවට හැරුණා. උන් බයෙන් හතර අතට පිහිනා ගියා.

"මගේ පවුල කරදරෙන් ඉන්නේ," මුකුත් නොවුණ ගාණට පොසෙයිඩන් කියාගෙන ගියා. "ඕෂිනස්ට විරුද්ධව සටන කෙරීගෙන යන්නේ ඒ හැටි සතුටුදායක විදිහට නෙවෙයි."

එයා මොසැයික් සිතියමේ කෙළවරකට ඇඟිල්ල දිගු කර පෙන්වූවා. ගොනෙකුගේ අං දෙකක් ඇති, අනෙක් අයට වඩා විශාල කිඳුරෙකුගේ රූපයකට එයා ත්‍රිශූලයේ මිටෙන් තට්ටු කළා. එයා පොකිරිස්සන් විසින් ඇදගෙන යන කරත්තයක් පදිනවා වගෙයි පෙනුණේ. ඒ වගේම එයා කඩුවක් වෙනුවට ලෙළවමින් සිටියේ පණ ඇති සර්පයෙක්වයි.

"ඕෂිනස්," මම කිවුවේ ඒ ගැන මතක් කරගන්න උත්සාහ කරමින්. "මුහුදට අධිපති වෙලා හිටපු ටයිටන්?"

පොසෙයිඩන් ඔළුව වැනුවා. "දෙවිවරුන්ගෙයි ටයිටන්ලගෙයි පළවෙනි යුද්දෙ දී එයා පැත්තක් නොගෙන මධ්‍යස්ථව හිටියා. ඒත් ක්‍රෝනොස් මෙදා පාර එයාව සටන් කරන්න පොලඹවාගෙන. මේක නම්... මෙහෙමයි, මේක හොඳ ලකුණක් නෙවෙයි. තමන් තෝරගන්න පැත්ත දිනන බව සහතික නැත්නම් ඕෂිනස් යුද්දෙට එකතු වෙන්නෙ නැහැ."

"එයා මහ මෝඩ පාටයි," මම කිවුවේ ශුභවාදී වෙන්න උත්සාහ කරමින්. "මං කියන්නෙ, සර්පයෙක් අරන් සටනට යන්නේ මොන මෝඩයා ද?"

"තාත්ති ඌව අඹරලා ගැට ගහයි," ටයිසන් ස්ථිර ලෙස කිවුවා.

පොසෙයිඩන් හිනාවක් පෑවත්, එයා හිටියේ මහන්සියෙන් හෙම්බත් වෙලා වගෙයි. "ඔයාලගේ විශ්වාසය මම අගේ කරනවා. අපි දැන් අවුරුද්දකට කිට්ටු කාලයක් යුද්දෙ කරගෙන ආවා. මගේ බලයන් දුර්වල වේගෙන එන්නේ. ඒ වුණත් එයා තවමත් මට පහර දෙන්න අලුත් බලවේග හොයාගන්නවා- මට අමතක වෙලා ගියපු, හද්දා පරණ මුහුදු රාක්ෂයෝ එහෙම."

මට ඈතින් පිපුරුම් හඬක් ඇසුණා. සැතපුම් බාගයක් විතර ඈතින් තිබුණු කොරල් කන්දක් යෝධ සත්තු දෙන්නෙකුගේ බරට

යට වී කැලිවලට කැඩී ගියා. මට උන්ගේ හැඩය යාන්තමින් වගේ හඳුනා ගන්න පුළුවන් වුණා. එයින් එකෙක් පොකිරිස්සෙක්. අනෙකා සයික්ලොප්ස් කෙනෙක් වගේ මිනිස් පෙනුම තිබුණ කෙනෙක්. ඒ වුණත් එයාව අඩු ගොඩකින් වට වෙලා තිබුණා. මුල දී මම හිතුවේ එයා යෝධ බූවල්ලෝ ගොඩක් ඇඳගෙන ඉන්නවා කියලයි. ඒත් ඒ එයාගේම අත් බව මට තේරුම් ගියේ පසුවයි- ඒ එහා මෙහා විසි වෙමින්, සටන් කරනා අත් සියයක්.

"බ්‍රයර්ස්!" මම කිව්වා.

එයාව දකින්න ලැබීම මට සතුටක් වුණා, ඒත් එයා හිටියේ පණ බේරගන්න සටන් කරනවා වගෙයි. එයාගේ වර්ගයාගෙන්- සයික්ලොප්ස්ලාගේ ඥාතියෝ වුණ අත්-සියයක් ඇත්තන්ගෙන් ඉතිරිව හිටපු අන්තිමයා එයයි. පහුගිය ගිම්හානයේ දී අපි එයාව ක්‍රෝනොස්ගේ හිරගෙයකින් ගලවා ගත්තා. ඊට පස්සේ එයා පොසෙයිඩන්ට උදවු කරන්න ආව බව මම දැනගෙන හිටියා. ඒ වුණත් එයින් පස්සේ මට එයා ගැන ආරංචියක් ලැබී තිබුණේ නැහැ.

"එයා හොඳට සටන් කරනවා," පොසෙයිඩන් කිව්වා. "අපිට එයා වගේ හමුදාවක් ම හිටියා නම් මම කැමතියි, ඒත් ඉතින් ඉන්නෙ එයා විතරයි නේ."

වියරුවෙන් ගර්ජනා කළ බ්‍රයර්ස් අඬු ගසමින් හපා කන්න දඟලන පොකිරිස්සව ඔසවනවා මම බලා සිටියා. එයා ඌව කොරල් කන්දෙන් එපිටට විසි කළා ම, පොකිරිස්සා අඳුර තුළට නොපෙනී ගියා. මෝටර් බෝට්ටුවක තල වගේ අත් සියය වේගයෙන් කරකවමින් බ්‍රයර්ස් ඌ පසුපස පිහිනා ගියා.

"පර්සි, අපිට වැඩි වෙලාවක් නැති වෙන්න පුළුවන්." මගේ තාත්තා කිව්වා. "ඔයාගේ මෙහෙයුම ගැන මට කියන්න. ඔයා ක්‍රෝනොස්ව දැක්ක ද?"

මම එයාට හැම දෙයක් ම කිව්වා. ඒ වුණත් බෙකන්ඩොර්ෆ් ගැන විස්තර කරද්දී මගේ කටහඬ පැටලුණා. පහළ බැලූ මට තුවාල ලැබූ කිඳුරු මිනිස්සු සිය ගාණක් අංගනයේ ඇතිරූ තාවකාලික ඇඳන් මත වැතිරී ඉන්නවා දකින්න ලැබුණා. හදිසියේ සෑදූ සොහොන් විය යුතු කොරල් ගොඩැලි පේළි ගණනාවක් මට පෙනුණා. ඒ වෙලාවේ මට තේරුම් ගියේ බෙකන්ඩොර්ෆ්ගේ මරණය පළවෙනි එක නොවෙන බවයි. එයා සිය ගණනකින්, සමහරවිට දහස් ගණනකින් එක්කෙනෙක්



විතරයි. මට මීට කලින් කවදාවත් නොදැනුණු තරමේ තරහක් සහ අසරණ බවක් දැනුණා.

පොසෙයිඩන් එයාගේ රැවුල අතගෑවා. "පර්සි, බෙකන්ඩොර්ෆ් වීරයෙක් විදිහට මරණය තෝරගත්තා. එතැන දී ඔයාගේ අතේ වරදක් නැහැ. ක්‍රෝනොස්ගේ හමුදාව අවුල් වෙලා යයි. එයින් වැඩි දෙනෙක් විනාශ වෙලා."

"ඒ වුණාට අපි එයාව මැරුවෙ නැහැ, එහෙම නේද?"

එය මගේ කටින් පිටවෙද්දිත්, ඒක බොරු බලාපොරොත්තුවක් බව මම දැන සිටියා. සමහරවිට අපි එයාගේ නැව පුපුරවා හැරලා, එයාගේ රාක්ෂයින්ව කුඩු කරලා දාන්න ඇති. ඒ වුණත් ටයිටන් රජාව ඒ තරම් ලේසියෙන් මරන්න පුළුවන්කමක් නැහැ.

"නැහැ," පොසෙයිඩන් පිළිගත්තා. "ඒ වුණත් ඔයාලා අපේ පැත්තට කාලය අරන් දුන්නා."

"ඒ නැවේ උප දෙවිවරු හිටියා." මම කිවුවේ පඩිපෙළ මත දී මට දකින්න ලැබුණු ළමයා ගැන හිතමින්. කොහොම වුණත් මම මගේ හිතට ඉඩ දීලා තිබුණේ රාක්ෂයින් සහ ක්‍රෝනොස් ගැන විතරක් හිතන්නයි. එයාලා දුෂ්ටයෝ නිසාත්, එයාලා මගේ නගරයට පහර දෙන්න යාත්‍රා කරමින් සිටි නිසාත් එයාලගේ නැව විනාශ කිරීම හොඳ දෙයක් බව මම මට ම ඒත්තු ගන්වා තිබුණා. ඒ ඇරත්, උන් සදහට ම මැරුණා වෙන්න බැහැ. රාක්ෂයෝ වාෂ්ප වෙලා ගියත්, අන්තිමේ දී කවදාහරි ප්‍රතිසංස්කරණය වෙනවා. ඒත් උප දෙවිවරු...

පොසෙයිඩන් මගේ උරහිස උඩින් අතක් තැබුවා. "පර්සි, ඒ නැවේ හිටියේ උප දෙවි සෙබළු කීපදෙනෙක් විතරයි. එයාලත් ක්‍රෝනොස් වෙනුවෙන් සටන් කරන්න තෝරගත්ත අය. බාගදා සමහරු ඔයාගේ අනතුරු ඇඟවීමට කන් දීලා පැනගන්න ඇති. එහෙම කරගන්න බැරි වුණා නම්... ඒ පාර තෝරගෙන තිබුණේ එයාලමයි නේ."

"එයාලගේ මොළ සුද්ධ කරලා!" මම කිව්වා. "දැන් එයාලා මැරිලා, හැබැයි ක්‍රෝනොස් තවම පණ පිටින්. ඉතින් මං කොහොමද හිත හදාගන්නේ?"

මම මොසැයික් සිතියම දිහාවට රවා ගත්තා- එහි පුංචි ටයිල් පිපුරුම්වලින් ටයිල් රාක්ෂයෝ විනාශ වෙමින් තිබුණා. පින්තූරයේ දී නම් ඒක හරිම ලේසි පහසු දෙයක් වගෙයි පෙනුණේ.

Scanned with CamScanner

ටයිසන් මගේ වටේට අතක් දමාගත්තා. ඒ වෙලාවේ වෙන කවුරුහරි එහෙම කරන්න උත්සාහ කළා නම්, මම එයාව පැත්තකට තල්ලු කරලා දමාවි, ඒත් ටයිසන් කියන්නේ ගොඩක් ලොකු, ඒ වගේම මුරණ්ඩු කෙනෙක්. මට ඕනෑ වුණත් නැතත් එයා මාව වැලඳ ගත්තා. " ඒක ඔයාගේ වැරැද්දක් නෙවෙයි, අයියා. ක්‍රෝනොස් හොඳට පුපුරන්නෙ නැහැ. ඊළඟ පාර අපි ලොකු පොල්ලකින් එයාට දෙමු."

"පර්සි," මගේ තාත්තා කිවුවා. "බෙකන්ඩොර්ෆ්ගේ කැප කිරීම නාස්ති වෙලා ගියේ නැහැ. ඔයාලා ආක්‍රමණ බලකාය විසුරුවලා දැම්මා. නිව්යෝර්ක් ටික කාලෙකට ආරක්ෂිතව තියෙයි. ඒකෙන් අනිත් ඔලිම්පියානුවන්ට වඩාත් ලොකු තර්ජනය එක්ක ගනුදෙනු කරන්න නිදහස ලැබෙනවා."

"වඩාත් ලොකු තර්ජනය?" මගේ සිහිනයේ දී රන්වන් ටයිටන් කියූ දේ ගැන මම කල්පනා කළා: දෙවිවරු අභියෝගයට උත්තර දීලා තියෙනවා. ඉක්මනින්ම උන්ව විනාශ වෙලා යයි.

මගේ තාත්තාගේ මුහුණ හරහා අඳුරු හෙවණැල්ලක් පාවී ගියා. "ඔයාට එක දවසකට ලැබුණ කරදර හිත් වේදනා හොඳටෝම ඇති. ඔයා ආපහු කඳවුරට ගියාම ඒක කයිරොන්ගෙන් අහගන්න."

"ආපහු කඳවුරට යන්න? ඒත් ඔයා මෙහෙ කරදරේක පැටලිලා නේ ඉන්නේ. මටත් උදවු කරන්න ඕනෑ!"

"ඔයාට බැහැ, පර්සි. ඔයාගේ රාජකාරිය තියෙන්නේ වෙන තැනක."

මට ඇහුණු දේ විශ්වාස කරන්නත් බැරි වුණා. මම පිටුවහලක් බලාපොරොත්තුවෙන් ටයිසන් දිහා බැලුවා.

මගේ සහෝදරයා තොල් හැපුවා. "තාත්ති... පර්සිට කඩුවෙන් සටන් කරන්න පුළුවන්. එයා දක්ෂයි."

"මං ඒක දන්නවා," පොසෙයිඩන් මෘදුව කිවුවා.

"තාත්තේ, මට උදවු කරන්න පුළුවන්," මම කිවුවා. "මං දන්නවා මට පුළුවන්. ඔයාට තව වැඩි කාලයක් මෙහෙ අල්ලගෙන යන්න බැරි වෙයි."

සතුරු සීමාවට පිටුපසින් ගිනි බෝලයක් අහසට නිකුත් වුණා. පොසෙයිඩන් එය ඉවතට හරවයි කියලා මම හිතුවත්, අංගනයේ පිටත කෙළවරකට වැටුණු එය පුපුරා ගියේ කිඳුරු මිනිසුන්ව වතුර හරහා



සීසීකඩ විසුරුවමින්. පොසෙයිඩන් වේදනාවෙන් ඇකිළුණේ මේ දැන් කවුරුහරි එයාට පිහියකින් ඇන්නා වගෙයි.

"ආපහු කඳවුරට යන්න," එයා තදින් ම කියා හිටියා. "ගිහිල්ලා කයිරොන්ට කියන්න දැන් වෙලාව හරි කියලා."

"මොකටද?"

"ඔයා අනාවැකිය අහන්න ඕනෑ. 'සම්පූර්ණ' අනාවැකිය ම."

එයා කියන්නේ මොන අනාවැකිය ගැන ද කියලා අහන්න මට උවමනා වුණේ නැහැ. 'මහා අනාවැකිය' ගැන මට අවුරුදු ගාණක් තිස්සේ අහන්න ලැබී තිබුණා. ඒත් කවුරුවත් ම මට ඒක සම්පූර්ණයෙන් කියලා තිබුණේ නැහැ. මම දැනගෙන හිටපු එක ම දේ ලෝකයේ ඉරණම තීන්දු කරන තීරණයක් මම ගන්න යනවා කියලා විතරයි- ඒත් මොකට කලබල වෙනව ද.

"ඒත් ඒ තීරණය මේක නම්?" මම ඇහුවා. "මෙහෙ නවතිනව ද, නැත්නම් පිට වෙනව ද කියන එක නම්? මම මෙහෙන් පිටවෙලා ගියාට පස්සෙ ඔයා..."

මට 'මැරුණොත් ' කියලා කියන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. දෙවිවරු මැරෙන්නේ නැහැ කියලා කිවුවත්, එය සිද්ධ වෙනවා මම දැකලා තිබුණා. මැරෙන්නේ නැති වුණත්, එයාලව ශූන්‍යයක් වෙන තුරු වියැකී යන්න, පිටුවහල් කරන්න, ඒ වගේම කලින් ක්‍රෝනොස් හිටියා වගේ ටාටරස් ආගාධයේ ගැඹුරු පතුලේ හිරගත කරන්න පුළුවන්කම තිබුණා.

"පර්සි, ඔයා යන්න ම ඕනෑ," පොසෙයිඩන් තදින් කිවුවා. ''ඔයාගේ අන්තිම තීරණය මොකක් වෙයි ද මම දන්නෙ නැහැ, ඒත් ඔයාගේ සටන තියෙන්නේ උඩ ලෝකේ. වෙන දෙයක් බැරි නම්, ඔයා කඳවුරේ ඉන්න ඔයාගේ යාළුවන්ට අනතුරු අඟවන්නවත් ඕනෑ. ක්‍රෝනොස් ඔයාලගේ සැලසුම් දැනගෙන හිටියා. ඔයාලා අතරේ ඔත්තුකාරයෙක් ඉන්නවා. අපි මෙහෙ බලාගන්නම්. අපිට වෙන විකල්පයක් නැහැ."

ටයිසන් මගේ අත තදින් අල්ලගත්තා. "මට ඔයා නැතුව පාළු වෙයි, අයියා!"

අපි දිහා බලාගෙන ඉඳිද්දි, අපේ තාත්තා තවත් අවුරුදු දහයකින් වයසට ගියා වගෙයි පෙනුණේ.

"ටයිසන්, ඔයාටත් කරන්න වැඩක් තියෙනවා, මගෙ පුතේ. එයාලට ඔයාව ආයුද ගබඩාවට ඕනෑ."

Scanned with CamScanner

ටයිසන් තවත් ටිකක් හොට බලියා ගත්තා.

"මම යන්නම්," එයා නහය ඉහළට ඇද්දා. ඊට පස්සේ එයා කොයිතරම් තදින් මාව වැලඳ ගත්තා ද කියනවා නම් තව පොඩ්ඩෙන් මගේ ඉළ ඇටත් කැඩෙනවා. "පර්සි, පරිස්සම් වෙන්න! රාක්ෂයින්ට ඔයාගේ පණ යන්ඩ ම මරන්ඩ දෙන්නෙපා!"

මම විශ්වාසයෙන් ඔළුව වනන්න උත්සාහ කළා, ඒත් ලොකු යාළුවාට ඒක දරාගන්න බැරිවුණා. එයා ඉකි බිඳිමින් අවි ආයුද ගබඩාවට, එයාගේ නෑදෑයන් හෙලි සහ කඩු සාදමින් සිටි තැනට පිහිනා ගියා.

"ඔයා එයාට සටන් කරන්න ඉඩ දෙන්න ඕනෑ," මම මගේ තාත්තට කිව්වා. "ආයුද ගබඩාවේ හිරවෙලා ඉන්න එයා චුට්ටක්වත් කැමති නැහැ. ඔයාට ඒක තේරෙන්නෙ නැද්ද?"

පොසෙයිඩන් ඔළුව හෙල්ලුවා. "ඔයාව අනතුරකට යවන්න සිද්ධ වෙලා තියෙන එක මට හොඳටෝම ඇති. ටයිසන් තාම පොඩි වැඩියි. මම එයාව පරිස්සම් කරන්න ඕනෑ."

"ඔයා එයාව විශ්වාස කරන්නයි ඕනෑ," මම කිව්වා. "පරිස්සම් කරන්න උත්සාහ කරන්න නෙවෙයි."

පොසෙයිඩන්ගේ ඇස් දැල්වුණා. මම ඕනෑවටත් වඩා දුර ගියා ද කියලා මට හිතුණා. ඒත් ඊට පස්සේ එයා මොසැයික් සිතියම දිහාවට ඇස් හරවා ගත්තා. එයාගේ උරහිස් එල්ලා වැටුණා. ටයිල් මත, පොකිරිස්සන්ගේ කරත්තයේ සිටි කිඳුරු හාදයා මාලිගාවට ළං වෙමින් සිටියා.

"ඔසිනස් කිට්ටුවට ම එනවා," මගේ තාත්තා කිව්වා. "මම එයාව මුණ ගැහෙන්න යුද්දෙට යන්න ඕනෑ."

මීට කලින් කවදාවත් මම තැති ගත් දෙවියෙක්ව දැකලා තිබුණේ නැහැ. ඒ වුණත් මගේ තාත්තා ටයිටන්ට මූණ දීලා කොහොම දිනාවි ද කියලා මට නම් තේරුනේ නැහැ.

"මට අල්ලගෙන ඉන්න පුළුවන්," පොසෙයිඩන් පොරොන්දු වුණා. "මම මගේ රාජධානිය අත අරින්නේ නැහැ. මට මේක කියන්න, පර්සි, ගිය ගිම්හානෙදී මම ඔයාට දුන්න උපන්දින තෑග්ග ඔයා ළඟ තාම තියෙනව ද?"

ඔළුව වැනූ මම මගේ කඳවුරු මාලය එළියට ඇදලා ගත්තා. මම අර්ධ-ලෝහිත කඳවුරේ හිටපු හැම ගිම්හානයක් වෙනුවෙන් ම පබළුව බැගින් එයට අමුණා තිබුණා. ඒ වුණත් ගිය අවුරුද්දේ ඉඳන් මම සෑන්ඩ් ඩොලරයකුත් එයට අමුණාගෙන හිටියා. තාත්තා ඒක මට දුන්නේ මගේ පහළොස් වෙනි උපන් දිනයටයි. ඒක 'වියදම් කරන්න' ඕනෑ වෙලාව මම දැන ගනීවි කියලයි එයා මට කියලා තිබුණේ, ඒ වුණත් මෙච්චර කාලෙකට නම් මට එයා අදහස් කළ දේ තේරුම් ගන්න බැරි වුණා. මට තේරුණු එක ම දේ ඉස්කෝලෙ ආපන ශාලාවේ ඇති කෑම අලෙවි යන්ත්‍රයට ඒක දාන්න බැරි බව විතරයි.



"වෙලාව ළඟ ළඟ ම එනවා," එයා දිවුරුවා. "වාසනාව තිබුණොත්, ලබන සතියේ එන ඔයාගේ උපන් දිනේට මම ඔයාව බලන්න එන්නම්. ඊට පස්සේ අපි ඒක ජයට ම සමරමු."

එයා හිනාවෙද්දී එක මොහොතකට මම එයාගේ ඇස්වල පරණ පුරුදු දිස්නය දැක්කා.

ඒත් එක්ක ම අපිට ඉදිරියෙන් මුළු මුහුද ම අඳුරු වුණේ හරියට තීන්තවලින් හැදුණු කුණාටුවක් පෙරළීගෙන එනවා වගෙයි. වතුර යට දී කොහෙත්ම වෙන්න බැරි වුණත් අකුණු පිපුරුවා. අයිස් වගේ සීතල යමක් ටිකෙන් ටික ළඟා වෙමින් තිබුණා. අපිට පහළින් සිටි හමුදාවන් අතරේ භීතිය රැල්ලක් වගේ පෙරළී යනවා මට දැනුණා.

"මම දැන් මගේ නියම දේවමය රූපය ආරූඪ කරගන්න ඕනෑ," පොසෙයිඩන් කිව්වා. "යන්න- ඒ වගේම සුබ පැතුම්, මගේ පුතේ."

මට එයාට ධෛර්යය දෙන්න, එයාව වැලඳ ගන්න, මොකක් හෝ කරන්න ඕනෑ වුණා, ඒ වුණත් මෙතැන කල් මරමින් ඉඳීම හොඳ දෙයක් නොවෙන බව මම දැනගෙන හිටියා. දෙවියෙක් එයාගේ සැබෑ ස්වරූපයට මාරු වෙද්දී පිටවෙන බලය කොයි තරම් විශාලයි ද කියනවා නම් ඒ දිහා බලා ඉන්න ඕනෑ ම මනුෂ්‍යයෙක් අළුවෙලා යනවා.

"සුබ පැතුම්, තාත්තේ," මම අමාරුවෙන් කියාගත්තා.

ඊට පස්සේ මම අනෙක් පැත්තට හැරුණා. මගේ උදවුවට මම සමුද්‍ර දියවැල් කැඳෙව්වා. වතුර මගේ වටේ සුළි නංවද්දී, මම වතුර මතුපිටට විසි වූ වේගයට සාමාන්‍ය මනුස්සයෙක් නම් බැලූනයක් වගේ පුපුරයි.

මම ආපහු හැරිලා බලද්දී දැකගන්න හැකි වුණේ මගේ තාත්තා ටයිටන් සමඟ සටන් කරද්දී පිටවෙන කොළ, නිල් එළි දහරාවන් සහ හමුදාවන් දෙකක ගැටුමෙන් දෙකට වෙන් වූ මුහුද විතරයි.

Scanned with CamScanner

03

# මම මැරෙන්න යන හැටි කල් තියා ම දැනගන්න ලැබුණා

ඔයාට අර්ධ-ලෝහිත කඳවුරේ ජනප්‍රිය කෙනෙක් වෙන්න ඕනෑ නම්, මෙහෙයුමකට ගිහින් නරක ආරංචියක් එක්ක ආපහු එන්න එපා.

මම සමුද්‍රරෙන් ගොඩට අඩිය තැබූ හැටියේ ම, මම ආ බව හැම තැන ම පැතිරුණා. අපේ වෙරළ තිබුණේ ලෝන්ග් අයිලන්ඩ් උතුරු අන්තයේයි. මිනිස්සු වැඩි දෙනෙකුට ඒක එතැන ඇති බවවත් නොපෙනෙන්න ඒ වෙරළට ඉන්ද්‍රජාලයක් කරලයි තිබුණේ. මේ වෙරළෙන් මතු වුණේ උප දෙවිවරු, දෙවිවරු හෝ ඇත්තට ම පාර වැරදිලා අතරමං වුණ පීසා රැගෙන යන කොල්ලෝ විතරයි. (එහෙමත් වෙලා තියෙනවා- හැබැයි ඒක වෙන ම කතාවක්.)

කොහොම හරි, එදා හවස් වරුවේ රැකවල් රාජකාරියේ යෙදී සිටියේ හර්මීස් කැබිනයේ කොනර් ස්ටොල්. මාව දැකලා කලබල වුණ පාරට එයා නැඟලා හිටපු ගහෙන් බිමට වැටුණා. ඊට පස්සේ එයා කඳවුරට සංඥා කරන්න හක් ගෙඩිය පිඹලා, මාව පිළිගන්න දුවගෙන ආවා.

කොනර්ට තිබුණේ එයාගේ විහිළු කොලොප්පම් කරන ගතියට ම ගැළපෙන ඇද වෙච්චි හිනාවක්. එයා සෑහෙන හොඳ කොල්ලෙක් තමයි, ඒ වුණාට එයා ළඟ පාතක ඉන්න හැම වෙලාවක ම ඔයා එක අතක් ඔයාගේ පසුම්බිය උඩින් තියාගෙන ඉන්න එක



ඇඟට ගුණයි. ඒ වගේම කිසිම හේතුවක් නිසාවත් එයාට ඔයාගේ ෂේවින් ක්‍රීම් බෝතලය අතට ගන්න ඉඩ තියන්න එපා. එහෙම නොකළොත් ඔයාට ඔයාගේ නිදන මල්ල ඒවාගෙන් පිරිලා තියෙනවා හොයාගන්න ලැබෙයි. දුඹුරු පාට කැරලි කොණ්ඩයක් තිබුණු එයා, එයාගේ සහෝදරයා ට්‍රැවිස්ට වඩා චුට්ටක් විතර උසින් අඩුයි. මට ඒ දෙන්නව වෙන් කරලා හඳුනා ගන්න පුළුවන් වුණ එක ම ලකුණ ඒකයි. ඒ දෙන්නා මගේ පරණ හතුරා ලූක්ට වඩා කොච්චර වෙනස් ද කියනවා නම්, එයාලා හැමෝම හර්මීස්ගේ පුත්තු කියලා විශ්වාස කරන්නත් අමාරු වුණා.

"පර්සී!" එයා මොර ගැසුවා. "මොනවද වුණේ? බෙකන්ඩෝර්ෆ් කොහෙද?"

ඒ වෙලාවේ මගේ මුහුණෙන් පළ වූ හැඟීම් දැකලා එයාගේ හිනාව දියවෙලා ගියා. "ඔහ්, නෑ. දුප්පත් සිලේනා. සියුස්ට ම ඔප්පු වෙච්චාවේ, එයා මේක දැනගත්තා ම..."

අපි දෙන්නා එක්ව වැලිපර මතට ගොඩ වුණා. යාර සිය ගාණක් ඈතින්, දැනටමත් කඳවුරේ සෙනඟ උද්‍යෝගයෙන් හිනාවෙමින් අපි දිහාවට දුවගෙන එමින් සිටියා. 'පර්සි ආපහු ඇවිල්ලා,' සමහරවිට එයාලා හිතමින් ඉන්න ඇති. 'එයා අපිව බේරගෙන! සමහරවිට එයා අපිට සිහිවටන එහෙමත් අරන් ඇවිත් ඇති!'

මම භෝජන මණ්ඩපය ළඟ නැවතිලා එයාලා එනතුරු බලා සිටියා. මම මොන තරම් පරාජිතයෙක් ද කියලා එයාලට කියන්න පහළට දුවන එකේ තේරුමක් නැහැ නේ.

දෙණි යාය පුරාවට ඇස් යැවූ මම එය මුල් ම වතාවේ දකින විට තිබුණු විදිහ සිහි කරගන්න උත්සාහ කළා. ඒක අවුරුදු බිලියන ගාණකට කලින් සිදු වුණ දෙයක් වගෙයි දැනුණේ.

කෑම මණ්ඩපයේ සිට බලද්දී ඔයාට හැම දෙයක් ම වගේ බලාගන්න පුළුවන්. දෙණි බිම වට කරගෙන නැගී සිටින කඳු වළල්ල. ඒවායින් උස ම එක, අර්ධ-ලෝහිත කන්ද උඩ තිබූ තාලියාගේ පයින් ගහ අත්තක රන් බැටළු ලොම් සළුව එල්ලාගෙන, මායා බලයෙන් කඳවුර හතුරන්ගෙන් ආරක්ෂා කරන හැටි. එහි මුරට සිටි මකරා පෙලියස් දැන් කොච්චර ලොකු වෙලා ද කියනවා නම්, මට මෙතැනට පවා ඌව පෙනුණා- ඌ ගහේ කඳ වටා දඟර ගැසී නිදාගෙන, ගොරවන වාරයක් පාසා දුම් පිට කරමින් සිටියා.

Scanned with CamScanner

මගේ දකුණු පසට වනාන්තරය පැතිරී තිබුණා. මගේ වම් පසින් දිස්න දෙන ඔරු පදින විල සහ මූණත් දිගේ ලෝදිය වැගිරෙන නගින බිත්තිය තිබුණා. කැබින් දොළහ- සෑම ඔලිම්පියානු දෙවියෙකුට ම එක බැගින්- පොදු අංගන වටා අශ්ව ලාඩමක හැඩයට ඉදි කර තිබුණා. දකුණේ ඈතට වෙන්නට ස්ට්‍රෝබෙරි යායවල්, ආයුද ගබඩාව සහ අහස් නිල් පාටින් පින්තාරු කර, වහලයේ රාජාලියෙකුගේ හැඩයේ ලෝකඩ සුළං කේතුවක් සවි කළ මහ ගෙදර දිස් වුණා.

සමහර දේවල් අතින් කඳවුර චුට්ටක්වත් වෙනස් වෙලා තිබුණේ නැහැ. ඒ වුණත් ගොඩනැගිලි හෝ කෙත් යායවල් දිහා බලලා ඔයාට යුද්ධය දකගන්න බැහැ. එය දකගන්න පුළුවන් වුණේ කන්දේ ඉහළට එමින් සිටි උප දෙවිවරුන්ගේ, සැටර්ලාගේ සහ ජල දෙවඟනන්ගේ මුහුණුවලිනුයි.

ගිම්හාන සෘතු හතරකට කලින් හිටිය තරම් සෙනඟක් දන් කඳවුරේ හිටියේ නැහැ. කඳවුරෙන් පිට වී ගිය සමහරු ආපහු කවදාවත් ආවෙ නැහැ. සමහරු සටන්වල දී මිය ගිහින්. තවත් සමහරු- අපි එයාලා ගැන කතා නොකර ඉන්නයි උත්සාහ කළේ- හතුරාට එකතු වෙන්න ගිහින්.

තවමත් මෙහි සිටී අය යුද්දෙන් පදම් වී හෙම්බත්ව සිටියා. මේ දවස්වල කඳවුරේ හිනා හඬක් අහන්න ලැබුණෙත් කලාතුරකින්. අඩු තරමේ හර්මීස් කැබිනයවත් ඉස්සර වගේ අනිත් අයට විහිළු කොලොප්පම් කළේ නැහැ. ඔයාගේ ජීවිතේ ම විහිළුවක් වගේ දනෙද්දී ප්‍රායෝගික විහිළුවක් කරලා සතුටු වෙන්න කාටත් අමාරුයි.

මුලින් ම මණ්ඩපයට පිම්මේ දුව ආවේ කයිරොන්. එයාට ඒක ලේසි දෙයක් වුණේ එයා ඉණෙන් පහළට සුදු පාට, කප්පාදු නොකළ අශ්වයෙක් නිසයි. ගිම්හානයේ දී එයාගේ රැවුල තවත් බූසියට වැවී තිබුණා. 'මගේ අනෙක් කාරය නරාශ්වයෙක් ' කියා මුද්‍රණය කළ කොළ පාට ටී-ෂර්ට් එකක් හැඳ සිටි එයා පිටේ දුන්නක් එල්ලගෙන හිටියා.

"පර්සි!" එයා කිවුවා. "දෙවිවරුන්ට ස්තුති වේවා. ඒත් කොහෙද..."

එයා එක්ක ම වගේ ඇනබෙත් දුවගෙන ආවා. ඇත්තටම එයාව දකිද්දී මගේ හදවත ටිකක් වේගයෙන් දුවන්න ගත්ත බව මම පිළිගන්න ඕනෑ. ඒ එයා පෙනුම ගැන සැලකිලිමත් වෙන කෙනෙක් නිසා නෙවෙයි. පහුගිය කාලයේ දී අපිට කොයි තරම් සටන් මෙහෙයුම්



කරන්න සිදු වෙලා තිබුණා ද කියනවා නම්, එයාට එයාගේ තඹ පාට කැරලි කොණ්ඩය පීරන්නවත් වෙලාවක් තිබුණේ නැහැ. ඒ වගේම එයා ඇඳුම් පැලඳුම් ගැනත් වැඩි සැලකිල්ලක් දක්වූ කෙනෙක් නෙවෙයි- එයා නිතර ම වගේ සැරසුණේ පරණ තැඹිලි පාට කඳවුරු ටී-ෂර්ට් එකකින් සහ කලිසමකිනුයි. ඉඳලා හිටලා ඒකට එයාගේ ලෝකඩ සන්නාහයත් එකතු වුණා. එයාගේ ඇස් කුණාටු අළු පාටයි. හුඟක් වෙලාවට අපි දෙන්නට එකිනෙකාගේ බෙලි මිරිකා ගන්න උත්සාහ නොකර කතාබහක් කරගෙන යන්නවත් බැරි වුණා. ඒ මොනවා වුණත්, එයාව දකිද්දී මට දනුණේ මගේ පියවි සිහිය නැති වෙනවා වගෙයි. පහුගිය ගිම්හානයේ, ලූක් ක්‍රෝනොස් බවට පත්වෙලා හැමදේම නොරිස්සුම් සහගත තත්ත්වයකට පත් වෙන්න කලින්, සමහර වෙලාවල දී මට හිතිලා තිබුණේ සමහරවිට... හොඳයි, සමහරවිට අපි දෙන්නට මේ එකිනෙකාගේ බෙලි මිරිකා ගන්න අවධිය පහු කරලා ඉස්සරහට යන්න පුළුවන් වෙයි කියලයි.

"මොනවද වුණේ?" එයා මගේ අත අල්ලා ගත්තා. "ලූක්ව-"

"නැව පිපුරුවා," මම කිවුවා. "එයාව විනාශ වෙලා නැහැ. මං දන්නෙ නැහැ කොහෙද-"

සිලේනා බියුරිගාඩ් සෙනඟ පීරගෙන ඉදිරියට ආවා. එයා පුරුදු විදිහට කොණ්ඩය පීරලා හෝ මේක්-අප් දමාගෙන සිටියේ නැහැ.

"චාර්ලි කොහෙද?" එයා වටපිට බලමින් ප්‍රශ්න කළේ හරියට බෙකන්ඩොර්ෆ් හැංගිලා ඉන්නවා කියලා හිතලා වගෙයි.

මම අසරණව කයිරොන් දිහා බැලුවා.

වයසක නරාශ්වයා උගුර පෑදුවා. "සිලේනා, මගෙ දරුවෝ, අපි මහ ගෙදරට ගිහින් මේ ගැන කතා කරමු-"

"නෑ," එයා කෙඳිරුවා. "නෑ, නෑ."

එයා අඬන්න පටන් ගත්තා ම, එයා වටේට සිටගෙන සිටි අපි කරකියා ගන්න දෙයක් නැතිව බලා සිටියා. මේ ගිම්හානය පුරාවට ම අපිට ගොඩක් අය අහිමි වෙලා තිබුණත්, ඒවායින් නරක ම අහිමි වීම වුණේ මෙයයි. බෙකන්ඩොර්ෆ් නැති වුණා ම මට දනුණේ මුළු කඳවුරේ ම නැංගුරම හොරු අරන් ගියා වගෙයි.

අන්තිමේ දී ඒරීස් කැබිනයේ ක්ලැරිස් ඉදිරියට ආවා. එයා සිලේනා වටේට අතක් දමාගත්තා. ඒ දෙන්නා අතරේ තිබුණේ අමුතු ම

මිතුරුදමක්- යුද දෙවියන්ගේ දුවෙක් සහ ආදරයට අධිපති දෙවඟනගේ දුවෙක් අතර යාළුකමක්- ඒත් පහුගිය ගිම්හානයේ දී සිලේනා ක්ලැරිස්ට එයාගේ පළවෙනි පෙම්වතා ගැන උපදෙස් දුන්නට පස්සේ ඉඳලා ක්ලැරිස් සිලේනාගේ පෞද්ගලික ආරක්ෂකයා වෙන්න තීරණය කරලා තිබුණා.

ක්ලැරිස් එයාගේ ලේ රතු පාට යුද සන්නාහයෙන් සැරසිලා, පට ලේන්සුවකින් කොණ්ඩය බැඳගෙන හිටියා. එයා රග්බි ක්‍රීඩකයෙක් වගේ උස මහත, මාංශ පේශි පිරුණු ඇඟක් ඇති කෙනෙක්. එයාගේ මුහුණේ වෙනස් නොවෙන රැවුමක් සටහන් වෙලා තිබුණා. ඒ වුණත් එයා සිලේනාට මෘදුව කතා කළා.

"මෙහෙ එන්ඩ, කෙල්ලේ," එයා කිවුවා. "අපි මහ ගෙදරට යමු. මම ඔයාට උණු චොකලට් බීමක් හදලා දෙන්නම්."

හැමදෙනා ම ආපසු හැරී දෙන්නා, තුන්දෙනා බැගින් කැබින් දෙසට යන්න ගියා. මාව දකීමෙන් තව දුරටත් කිසිවෙක් උද්‍යෝගිමත් වෙන බවක් පෙනුනේ නැහැ. කාටවත් පුපුරා ගිය නැව ගැන අහන්න ඕනෑ වුණෙත් නැහැ.

ආපසු නොයා නැවතුණේ ඇනබෙත් සහ කයිරොන් විතරයි.

ඇනබෙත් කම්මුල මත වූ කඳුළු බිංදුවක් පිස දමා ගත්තා. ''ඔයා මැරෙන්නෙ නැතුව ආවට මට සතුටුයි, පාසි මොළේ."

"ස්තූතියි," මම කිවුවා. "මටත් එහෙමයි."

කයිරොන් මගේ උරහිස උඩින් අතක් තැබුවා. "ඔයා කරන්න පුළුවන් හැමදේම කරන්න ඇති කියලා මට විශ්වාසයි, පර්සි. සිද්ධ වුණ දේ ගැන ඔයා අපිට කියනව ද?"

ඒක ආයෙමත් මතක් කරන්නවත් මට ඕනෑ වුණේ නැතත්, ටයිටන්වරු ගැන දැකපු හීනය ඇතුළුව, මුළු කතාව ම මම එයාලට කිවුවා. ඒ වුණත් මම නිකෝ ගැන සුළු විස්තරය අත් ඇරියා. මම මගේ හිත හදාගන්න තුරු නිකෝගේ සැලසුම ගැන කාටවත් හෙළි නොකරන්න නිකෝ මාව පොරොන්දු කරවාගෙන තිබුණා. ඇරත්, ඒ සැලසුම කොයි තරම් බය උපදවන එකක් ද කියනවා නම් ඒක රහසක් විදිහට ම තියාගන්න මමත් කැමති වුණා.



කයිරොන් පහළ වූ දෙණි බිම දෙසට බැල්මක් හෙළුවා. " මේ ඔත්තුකාරයා ගැනයි, අනිත් දේවලුයි සාකච්ඡා කරන්න අපි ඉක්මනින් ම යුද මන්ත්‍රණ සභාවක් කැඳවන්න ඕනෑ."

"පොසෙයිඩන් තවත් තර්ජනයක් ගැන කිවුවා," මම කිවුවා. "ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩාටත් වඩා ලොකු එකක් ගැන. මං හිතුවේ ඒක මගේ හීනෙ දී ටයිටන් කියපු අභියෝගය ගැන වෙන්නැති කියලා."

කයිරොන් සහ ඇනබෙත් බැල්මක් හුවමාරු කරගත්තේ හරියට මම නොදන්නා යමක් ඒ දෙන්නා දන්නවා වගෙයි. එයාලා එහෙම කරන එක මට පේන්න බැහැ.

"අපි ඒ ගැනත් සාකච්ඡා කරමු," කයිරොන් පොරොන්දු වුණා.

"තව දෙයක්." මම ගැඹුරු හුස්මක් ගත්තා. "මම මගේ තාත්තට කතා කළා ම, එයා වෙලාව හරි බව ඔයාට කියන්න කිවුවා. මම සම්පූර්ණ අනාවැකිය ම දැනගන්න ඕනෑ."

කයිරොන්ගේ උරහිස් එල්ලා වැටුණත්, එයා පුදුමයට පත් වූ බවක් පෙනුනේ නම් නැහැ. "මම බයෙන් හිටියේ මේ දවස ගැනයි. බොහොම හොඳයි. ඇනබෙත්, අපි පර්සිට ඇත්ත පෙන්නමු- සම්පූර්ණ ඇත්ත ම. අපි යමු අට්ටාලයට."

★★★

මීට කලින් මම තුන් වතාවක් අට්ටාලයට ගිහින් තිබුණා, ඒ කියන්නේ ඒකට යන්න මට තිබුණු උවමනාවට වඩා තුන් වතාවක්.

පඩිපෙළ මුදුනේ සිට ඉහළට ඉණිමඟක් තිබුණා. බාගෙට අශ්වයෙක් වුණ කයිරොන් ඒක දිගේ කොහොම යයි ද හිතලා මම පුදුම වුණා, ඒත් එයා ඒක කරන්න උත්සාහ කළේ නැහැ.

"ඒක තියෙන්නේ කොහෙද කියලා ඔයා දන්නවා නේ," එයා ඇනබෙත්ට කිවුවා. "කරුණාකරලා, ඒක පහළට අරන් එනව ද."

ඇනබෙත් ඔළුව වැනුවා. "එන්න යමු, පර්සි."

පිටත ඉර බැස යමින් තිබුණු නිසා අට්ටාලය වෙනදාටත් වඩා අඳුරු සහ බය දනවනසුලු වුණා. පරණ වීරයින්ගේ ජයඵලක හැම තැන ම ගොඩ ගසා තිබුණාඃ කඩතොලු වූ පලිහ, වීදුරු බරණිවල විනාකිරි දැමූ වෛවාරන්න රාක්ෂයින්ගේ ඔළු, 'මෙය ක්‍රයිසෝර්ගේ හොන්ඩා සිවික් රථයෙන් සොරකම් කරනු ලැබුවේ හර්මීස්ගේ පුත්‍රයා

ගස් විසිනි. 1988.' ලෙස සටහන් කළ ලෝකඩ ඵලකයක් මත තැබූ දාදු කැට දෙකක්.

මම වක ගැසුණු ලෝකඩ කඩුවක් අහුලා ගත්තා. ඒක කොයි තරම් දරුණු විදිහට නැමී තිබුණා ද කියනවා නම් කඩු තලය පෙනුණේ ඉංග්‍රීසි හෝඩියේ එම් අකුර වගෙයි. ලෝහය මත පෙරී තිබුණු මායා විෂවල කොළ පාට පැල්ලම් මට තවමත් දකින්න හැකි වුණා. එහි එල්ලා තිබුණු හැඳුනුම්පතේ පහුගිය ගිම්හානයේ දිනයක් සටහන් කර තිබුණා. එයින් කියවුණේ: කැම්පීගේ කෙටි වකුටු කඩුව. වංගගිරියේ සටනේ දී විනාශ කරන ලදී.

"බ්‍රයර්ස් අර ගල් කුට්ටි විසි කරපු හැටි ඔයාට මතක ද?" මම ඇහුවා.

ඇනබෙත් කට කොණකින් හිනා වුණා. "ඊට පස්සේ ග්‍රෝවර් ඇති කරපු කුලප්පුව?"

අපේ ඇස් එකිනෙකා ළඟ නැවතුණා. ගිය ගිම්හානයේ වෙනත් අවස්ථාවක් ගැන- සෙන්ට් හෙලේන්ස් කන්ද යට දී, මම මැරෙන්න යන බව ඇනබෙත් හිතපු වෙලාවේ එයා මාව සිපගත් හැටි මට සිහි වුණා.

උගුර පෑදූ එයා අහක බලා ගත්තා. "අනාවැකිය."

"හරි." මම කෙටි කඩුව බිමට දැම්මා. "අනාවැකිය."

අපි ජනේලය අසලට ගියා. එතැන කකුල් තුනේ බංකුවක් මත ඔරැකල් වාඩි වී සිටියා- එයා බතික් ගවුමකින් සැරසුණු, වේළී ඇකිළී ගිය ගැහැනු මමියක්. කළු පාට කෙස් රොදවල් එයාගේ හිස්කබලට ඇලී තිබුණා. එයාගේ ලෙදර් වගේ වේළුණු මුහුණෙන් වීදුරු ඇස් එළියට පැනලා. එයා දිහා බලද්දිත් මගේ ඇඟ හිරිවැටුණා.

ඉස්සර නම් ගිම්හාන වාරය අතරතුරේ දී ඔයාට කඳවුරෙන් පිටට යන්න ඕනෑ වුණොත්, ඔයා මේක උඩට ඇවිත් ගවේෂණයක් ලබාගන්න ඕනෑ. මේ ගිම්හානයේ දී ඒ නීතිය පැත්තකට දමලයි තිබුණේ. කඳවුරුකරුවෝ නිතර ම යුද මෙහෙයුම්වලට කඳවුරෙන් පිට වුණා. ක්‍රෝනොස් නතර කරන්න අපිට වෙන විකල්පයක් තිබුණේ නැහැ.

කොහොම වුණත්, ඒ අමුතු කොළ පාට මීදුම- ඔරැකල්ගේ ආත්මය- මට ඕනෑවටත් වඩා හොඳට මතක තිබුණා. ඒක ජීවත් වුණේ



මේ මමිය ඇතුළෙයි. දැන් එයා අප්‍රාණික පෙනුමින් හිටියත්, අනාවැකිය කියන වෙලාවට එයා හෙලවුණා. සමහර වෙලාවට එයාගේ කටින් ඝන මීදුමක් එළියට ගලා ඇවිත් අමුතු හැඩ නිර්මාණය කළා. වතාවක්, එයා පණිවුඩයක් දෙන්න අට්ටාලයෙන් පහළට බැහැලා, පිල්ලියක් වගේ කැලේ ඇතුළට ම ඇවිදගෙන ගිහින් පවා තිබුණා. එයා මහා අනාවැකිය වෙනුවෙන් මොනවා කරයි ද මට විශ්වාසයක් තිබුණේ නැහැ. එයා ඉන්න තැනින් නැගිටලා ටැප් නැටුමක්වත් නටයි කියලා මගේ හිතේ පැත්තක් බලාපොරොත්තු නොවුණාමත් නෙවෙයි.

ඒ වුණත් එයා කළේ මළමිනියක් වගේ- කොහොමත් එහෙම තමයි- උන් තැන ම ඉඳගෙන හිටිය එක විතරයි.

"මට නම් කවදාවත් මේක තේරුනේ නැහැ," මම මිමිණුවා.

"මොකක්ද?" ඇනබෙත් ඇහුවා.

"ඇයි ඒක මමියක් වුණේ කියලා."

"පර්සි, ඉස්සර එයා මමියක් වෙලා හිටපු කෙනෙක් නෙවෙයි. අවුරුදු දහස් ගාණක් පුරාවට ඔරැකල්ගේ ආත්මය ජීවත් වුණේ ලස්සන කන්‍යාවක් ඇතුළේ. ඒ ආත්මය පරම්පරාවෙන් පරම්පරාවට මාරුවෙමින් ගියා. අවුරුදු පනහකට කලින් මෙයත් එහෙමයි කියලා කයිරොන් මට කිවුවා." ඇනබෙත් මමියට අත දිගු කළා. "ඒත් මෙයා තමයි අන්තිමයා."

"මොනවද වුණේ?"

ඇනබෙත් මොනවදෝ කියන්න හැදුවත්, ඊට පස්සේ හිත වෙනස් කරගත්තා වගෙයි පෙනුණේ. "අපි ආව වැඩේ කරගෙන මෙතැනින් යන්න යමු."

මම බයෙන් වගේ ඔරැකල්ගේ වේළුණු මූණ දිහා බැලුවා. "එතකොට දැන් මොකද කරන්නේ?"

මමිය ළඟට ගිය ඇනබෙත් දෑත ඉදිරියට දිගු කළා. "ඕ ඔරැකල්, කාලය අත මායිමට පැමිණ තිබේ. මම ඔබෙන් මහා අනාවැකිය ඉල්ලා සිටිමි."

මම මගේ හිත දැඩි කරගත්තා, ඒත් මමිය හෙලවුණේවත් නැහැ. ඒ වෙනුවට, ඇනබෙත් එයා ළඟට ගිහින් එහි බෙල්ලේ වූ මාලවලින් එකක් ගලවා ගත්තා. මීට කලින් කවදාවත් මම ඒකේ ආභරණ ගැන වැඩි අවධානයක් දක්වා තිබුණේ නැහැ. මම හිතාගෙන හිටියේ හිපි මිනිස්සු

Scanned with CamScanner

පබළු මාලවලට එහෙම ගොඩක් කැමති නිසා එයා ඒවා දාගෙන හිටියා කියලයි. ඒත් ඇනබෙත් ආපහු මගේ පැත්තට හැරෙද්දී, එයාගේ අතේ ලෙදර් පසුම්බියක් තිබුණා- ඒක හරියට ඇමරිකානු ස්වදේශිකයින් ළඟ තියෙන පිහාටුවලින් ගෙතූ පටියක් ඇති බෙහෙත් මල්ලක් වගෙයි. ඒ පසුම්බිය විවර කළ එයා එය තුළින් එයාගේ සුළැඟිල්ල තරමේ පාච්මන්ට් කඩදාසි රෝලක් එළියට ගත්තා.

"වෙන්න බැහැ," මම කිවුවා. "ඔයා කියන්නේ, මම මේ තකතීරු අනාවැකිය කියන්න කියලා ඔයාලගෙන් ඉල්ලමින් හිටපු අර අවුරුදු ගාණ තිස්සෙ ම, ඒක තිබුණේ එයාගේ බෙල්ලෙ එල්ලලා කියල ද?"

"එතකොට හරි වෙලාව ඇවිත් තිබුණේ නැහැ," ඇනබෙත් කිවුවා. "මාව විශ්වාස කරන්න, පර්සි, මම මේක කියෙව්වෙ වයස අවුරුදු දහයෙ දි, හැබැයි මට තවමත් ඒ ගැන නපුරු හීන පේනවා."

"නියමයි," මම කිවුවා. "මට දැන්වත් ඒක කියවන්න පුළුවන් ද?"

"පහළ තට්ටුවේ යුද මන්ත්‍රණ සභාවෙ දි," ඇනබෙත් කිවුවා. "මේක ඉස්සරහා නෙවෙයි... ඔයා දන්නවා නේ."

ඔරැකල්ගේ වීදුරු ඇස් දිහා බැලුවා ම, මට එයත් එක්ක වාද කරන්න ඕනෑ වුණේ නැහැ. අපි අනෙක් අයට එකතු වෙන්න පහළ තට්ටුවට ගියා. ඒ වෙලාවේ මම දැනගෙන නොසිටියත්, ඒක මම අට්ටාලයට ගිය අන්තිම වතාවයි.

***

ජ්‍යෙෂ්ඨ උපදේශකයෝ පින්ග්-පොන්ග් මේසය වටේට රැස්ව සිටියා. මගෙන් ඇයි කියලා නම් අහන්න එපා, ඒත් ක්‍රීඩා කාමරය යුද මන්ත්‍රණ සභා පවත්වන නිල නොවෙන මූලස්ථානය බවට පත්වෙලයි තිබුණේ. ඒ කොහොම වුණත් ඇනබෙත්, කයිරොන් සහ මම ඒක ඇතුළට යද්දී නම් එතැන කෑගැසීමේ තරගයක් පවත්වනවා වගෙයි පෙනුණේ.

ක්ලැරිස් තවමත් සිටියේ සම්පූර්ණ යුද ඇඳුම් කට්ටලයෙන් සැරසි[illegible]යි. එයා එයාගේ විද්‍යුත් හෙල්ලය පිටේ ගැටගසාගෙන සිටියා. (ඇත්තටම, ඒක එයාගේ දෙවෙනි විද්‍යුත් හෙල්ලය. මොකද එයාගේ පළවෙනි එක මම කඩලයි තිබුණේ. එයා ඒ හෙල්ලය හැඳින්වූයේ 'අබ්බගාත කරන්නා' කියන තේරුම ඇති 'Maimer' නමිනුයි. ඒත් එයාට නෑසෙන්න අනිත් හැමෝම ඒකට කිවුවේ 'අබ්බගාතයා' කියන තේරුම ඇති 'Lamer' කියලයි.) එයා වල් ඌරු හිසක හැඩයේ යුද



හිස්වැසුමක් කිහිල්ලක් යට රඳවාගෙන, ඉණ පටියේ පිහියක් ගසාගෙන සිටියා.

එයා හිටියේ ඇපලෝ කැබිනයේ අලුත් ප්‍රධාන උපදේශක මයිකල් යෙව්ට මොර ගසමිනුයි. ඒක තරමක් විහිළු පෙනුමක් ගත්තේ ක්ලැරිස් එයාට වඩා අඩියක් විතර උස් වූ නිසයි. පහුගිය ගිම්හානයේ ඇති වූ යුද්ධයෙන් ලී ෆ්ලෙචර් මැරුම් කෑවට පස්සේ ඇපලෝ කැබිනය බාරගෙන තිබුණේ මයිකල්. අඩි හතරයි අඟල් හයක් උස මයිකල්ට තවත් අඩි දෙකක් විතර උසට මහන්තත්වකම තිබුණා. එයාගේ උල් නහය සහ ඇකිළුණු මූණුවර නිසා ද කොහෙදෝ එයාව දකිද්දී මට මතක් වුණේ මුගටියෙක්වයි.

"ඒක යුද්ධයෙන් දිනාගත්තෙ අපි!" එයා මොර දුන්නේ, ක්ලැරිස්ගේ මූණට ළං වෙන්න කකුලේ ඇඟිලිවලින් හිටගෙනයි. "ඔහේ ඒකට කැමති නැත්නම්, ඕනෑ කුදයක් ගහගන්නවා!"

මේසය වටේ හිටපු අනෙක් උදවිය සිටියේ හිනා නොවී ඉන්න උත්සාහ කරමින්- ස්ටොල් සහෝදරයෝ, ඩයනයිසියස් කැබිනයේ පොලක්ස්, ඩිමීටර් කැබිනයේ කේටී ගාඩ්නර්. අඩු තරමේ හෙෆාස්ටස් කැබිනය වෙනුවෙන් හදිසියේ පත් කළ අලුත් උපදේශක ජේක් මේසන් පවා යාන්තමින් හිනා වුණා. ඒ කිසිවක් ගැන කිසිම අවධානයක් නොදැක්වූයේ සිලේනා බියුරිගාඩ් විතරයි. එයා ක්ලැරිස්ගේ පැත්තකින් වාඩිවෙලා, හිස් බැල්මෙන් පින්ග්-පොන්ග් දැල දිහා බලා සිටියා. එයාගේ ඇස් රතු වී, ඉදිමී තිබුණා. එයා ඉදිරියේ තිබුණු උණු චොකලට් කෝප්පයට අතක් තියන්නවත් එයා කරදර වෙලා තිබුණේ නැහැ. එයාට එතැනට එන්න සිදු වී තිබීම අසාධාරණයක් වගෙයි පෙනුණේ. එයාට මේ දැන් බෙකන්ඩොර්ෆ්ව අහිමි වෙලා ඉදිද්දී, ක්ලැරිස් සහ මයිකල් දෙන්නා එයාගේ දෙපැත්තෙන් හිටගෙන, තේරුමක් නැති මෝඩ කාරණේකට රණ්ඩු කරනවා කියලා මට විශ්වාස කරගන්නත් බැරි වුණා.

"ඕක නවත්තනවා!" මම කෑගැසුවා. "ඔයාලා මොනවද කරන්නේ?"

ක්ලැරිස් මගේ දිහාවට රවා බැලුවා. "මයිකල්ට කියනවා ආත්මාර්ථකාමී ජඩයෙක් වෙන්ඩ එපා කියලා."

"ඔහ්, ඒක නම් නියමයි, ඔහේගෙ කටින් එහෙම කියද්දි," මයිකල් කිවුවා.

Scanned with CamScanner

"මම මෙතැනට ආවෙ සිලේනට උදවු කරන්ඩ විතරයි!" ක්ලැරිස් කෑගැසුවා. "එහෙම නැත්නම් මම මගේ පාඩුවේ කැබින් එකට වෙලා ඉන්නවා."

"ඔයා මොනවා ගැන ද කියවන්නේ?" මම ප්‍රශ්න කළා.

පොලක්ස් උගුර පෑදුවා. "එයාගේ, මේ, කාරණේ බේරුම් කරලා දෙනකල් ක්ලැරිස් අපි කාත් එක්කවත් කතා කරන්නේ නැහැලු. එයා දැන් දවස් තුනකින් කතා කරලා නැහැ."

"ඒ දවස් තුන කොච්චර ෂෝක් ද!" ට්‍රැවිස් ස්ටොල් කිවුවේ ආසාවෙන් වගෙයි.

"මොන කාරණේ ද?" මම ඇහුවා.

ක්ලැරිස් කයිරොන් වෙතට හැරුණා. "මෙතැන බාරකාරයා ඔයා නේ, නේද? අපිට උවමනා දේ මගේ කැබින් එකට ලැබෙනවා ද, නැද්ද?"

කයිරොන් එයාගේ කුර මත එහා මෙහා වුණා. "මගෙ දරුවෝ, මම කලිනුත් පැහැදිලි කරලා දුන්නා වගේ, මයිකල් හරි. මේකට වැඩි ම අයිතිවාසිකම තියෙන්නේ ඇපලෝ කැබින් එකට. අපිට මීට වඩා වැදගත් දේවල් තියෙනවා-"

"ආයෙත් අහලා," ක්ලැරිස් කඩා පැන්නා. "හැම වෙලාවෙ ම ඒරීස්ගේ උවමනා-එපාකම්වලට වඩා අනිත් දේවල් වැදගත්. අපි අපේ කටවල් වහගෙන, ඔහේලට ඕනෑ වෙද්දි පෙනී හිටලා, සටන් කරන්ඩ විතරක් හිටිය ම ඇති!"

"එහෙම කරනවා නම් කොච්චර ෂෝක් ද," කොනර් ස්ටොල් මැතිරුවා.

ක්ලැරිස් එයාගේ පිහිය ඩැහැගත්තා. "සමහරවිට මම මිස්ටර් ඩීගෙන් ඇහුවොත්-"

"ඔයා දන්නවා නේ," කයිරොන් එයාගේ කතාවට බාධා කළේ යාන්තමින් කේන්තියක් තැවරුණු කටහඬින්, "අපේ අධ්‍යක්ෂකතුමා, ඩයනයිසියස්, යුද්ධය නිසා කාර්යබහුලයි. මේ වගේ දේකට එයාට කරදර වෙන්න බැහැ."

"මට තේරුණා," ක්ලැරිස් කිවුවා. "එතකොට ජ්‍යෙෂ්ඨ උපදේශකයෝ? ඔහේලගෙන් කවුරුහරි මගේ පැත්තට ඉන්නව ද?"



දැන් නම් කවුරුවත් හිනා වුණේ නැහැ. එයාලා කවුරුවත් ක්ලැරිස්ගේ මූණ දිහා බැලුවෙත් නැහැ.

"හොඳයි," ක්ලැරිස් සිලේනා වෙතට හැරුණා. "මට කණගාටුයි. ඔහේ... මෙහෙම ඉන්න වෙලාවේ මේක පටන් ගන්ඩ මම හිතුවෙ නැහැ. කොහොම හරි, මම සමාව ඉල්ලනවා. ඔහෙගෙන් විතරක්. වෙන කාගෙන්වත් නෙවෙයි."

එයා කියපු එක වචනයක්වත් සිලේනාට ඇහුණු වගක් පෙනුනේ නැහැ.

ක්ලැරිස් පින්ග්-පොන්ග් මේසය මැදට එයාගේ පිහිය දමා ගැසුවා. "ඔහේලා හැමෝටම මේ යුද්දෙ ඒරීස් නැතුව කරගන්ඩ වෙයි. මම සෑහීමකට පත්වෙන කල්, මගේ කැබින් එකේ කවුරුවත් උදවුවට ඇඟිල්ලක්වත් උස්සන්නෙ නැහැ. සන්තෝසෙන් මැරියල්ලා."

ක්ලැරිස් කඩාගෙන බිඳගෙන කාමරයෙන් එළියට යද්දී, කිසිවක් කියාගන්න බැරි තරමට පුදුමයෙන් ගල් ගැසී උපදේශකයෝ හැමෝම බලා සිටියා.

"ඇති යන්තං ගැලවුණා." අන්තිමේ දී මයිකල් යෙව් කිවුවා.

"ඔයා විහිළු කරනව ද?" කේටී ගාඩ්නර් විරෝධය පෑවා. ''මේක නම් විනාශයක්!"

"එයා ඒක ඇත්තට කිවුවා වෙන්න බැහැ," ට්‍රැවිස් කිවුවා. ''එහෙම වෙන්න පුළුවන් ද?"

කයිරොන් සුසුමක් හෙළුවා. "එයාගේ අභිමානයට කැළැලක් වෙලා තියෙන්නේ. එයා හෙමීට සන්සුන් වෙයි." ඒත් එයා ඒක කිවුවෙ නම් ඒ හැටි විශ්වාසයකින් නෙවෙයි.

ක්ලැරිස් ඔය හැටි කේන්ති අරන් ඉන්නේ මොන කෙහෙම්මලක් නිසා ද කියලා අහන්න මට ඕනෑ වුණා, ඒත් මම ඇනබෙත් දිහා බැලුවා ම එයා "මම පස්සේ කියන්නම්" කියලා තොල් මැතිරුවා.

"දැන්," කයිරොන් කියාගෙන ගියා, "ඔයාලා කැමති නම්, උපදේශකවරුනි. ඔයාලා හැමෝටම අහන්න සැලැස්විය යුතුයි කියලා මම හිතන දෙයක් පර්සි අරන් ඇවිත් තියෙනවා. පර්සි- මහා අනාවැකිය."

ඇනබෙත් පාර්ච්මන්ට් රෝල මගේ අතට දුන්නා. වියළි සහ පැරණිවට දැනුණු එහි නූල ගලවන්න මම දඟලුවා. ඉරෙන්නේ නැති

වෙන්න අමාරුවෙන් කඩදාසිය දිග ඇරගත් මම එය කියවන්න පටන් ගත්තා:

"වැඩිමහල් දිවියන්ගේ අර්ධ-ලෝහිතයෙක්..."

"එර්ර්, පර්සි?" ඇනබෙත් මට බාධා කළා. "'දෙවියන්ගේ.' දිවියන්ගේ නෙවෙයි."

"ඔහ්, හරි," මම කිවුවා. මගේ වචන අන්ධතාවය මම උප දෙවියෙක් බව පෙන්වන සලකුණක් වුණත්, සමහර වෙලාවට නම් මට ඇත්තට ම ඒක පේන්න බැහැ. මම කලබල වෙන තරමට, මගේ කියවීමත් නරක අතට හැරෙනවා.

"වැඩිමහල් දෙවියන්ගේ අර්ධ-ලෝහිතයෙක්...

සියලු බාධකයන් අතරින් සොළොස් වියට ළඟා වේවි...."

මම පසුබාමින් ඊළඟ වැකිය දිහා බලා සිටියා. මගේ ඇඟිලි තුඩුවල හිරිවැටීමක් පැතිරෙන්න ගත්තේ හරියට කඩදාසිය සීතලෙන් මිදෙනවා වගෙයි.

"ලෝකය අනන්ත නින්දක ගිලෙනවා දකිමින්,

ශාපලත් තලයෙන් වීරයාගේ ආත්මය නෙලා ගනීවි."

හදිසියේ ම මගේ සාක්කුව ඇතුළේ රිප්ටයිඩ් තිබුණාට වඩා බරට දැනුණා. ශාපලත් තලය? රිප්ටයිඩ් ගොඩක් අයට දුක් වේදනා උරුම කර දීලා තියෙන බව වතාවක් කයිරොන් මට කිවුවා. මගේ ම කඩුවෙන් මට මැරෙන්න සිද්ධ වෙන්න පුළුවන් ද? එතකොට ලෝකය ම අනන්ත නින්දකට වැටෙන්නේ කොහොමද? ඒකෙ තේරුම මරණය නම්?

"පර්සි," කයිරොන් බල කරා. "ඉතුරු ටිකත් කියවන්න."

මට දැනුණේ මගේ කටින් එකක් වැලි පිරිලා වගෙයි. ඒත් මම අන්තිම පේළි දෙකත් කියෙවුවා.

"එක ම තීරණයක් ඔහුගේ... ඔහුගේ කාලය අවසන් කරමින්,

ඔලිම්පස් ආ-ආර-"

"ආරක්ෂණය," ඇනබෙත් මෘදුව කිවුවා. "ඒකෙ තේරුම බේරගන්නවා කියන එක."

"ඒකෙ තේරුම මම දන්නවා," මම ගෙරෙව්වා.



"ඔලිම්පස් ආරක්ෂණය හෝ නාශනය කරාවි."

මුළු කාමරය ම නිහැඬියාවක ගිලී තිබුණා. අන්තිමේ දී කොනර් ස්ටොල් කතා කළා, "නාශනය කරන එක හොඳයි නේ, එහෙම නේද?"

"නැහැ," සිලේනා කිවුවා. එයාගේ කටහඬ හිස්ව ඇසුණත්, එයා කතා කිරීම පවා මට පුදුමයක් වුණා. "නාශනය කරනවා කියන්නේ විනාශ කරනවට."

"කවුගාලා දානවට," ඇනබෙත් කිවුවා. "වනසනවට. සුන්නදූලි කරලා දානවට."

"තේරුණා." මගේ හදවත ඊයම් බරුවකට හැරිලා වගෙයි මට දැනුණේ. "ස්තූතියි."

හැමෝම බලා හිටියේ මගේ දිහාවයි- එයාලගේ බැල්මේ සැලකිල්ලක්, අනුකම්පාවක්, එහෙමත් නැත්නම් පොඩි බයකුත් තිබුණා.

කයිරොන් ඇස් වසා ගත්තේ යාඥාවක් කරනවා වගෙයි. අශ්ව වෙසින් ඉඳිද්දී එයාගේ ඔළුව ක්‍රීඩා කාමරයේ විදුලි බුබුළුවල ගෑවෙන නොගෑවෙන මට්ටමින් තිබුණා. "ඔයාට දැන් පේනවා නෙ, පර්සි, ඔයාට සම්පූර්ණ අනාවැකිය ම නොකියා ඉන්න අපි හිතුවෙ ඇයි කියලා. ඔයාගේ කර පිට පැටවිලා තිබුණු බර හොඳටම ඇති-"

"දන්නෙ ම නැතුව අන්තිමේ දී කොහොම හරි මම මැරෙන්න යනවා කියලා?" මම කිවුවා. "ඔව්, මට ඒක තේරෙනවා."

කයිරොන් දුක්බරව මගේ දිහා බලා සිටියා. මේ හාදයා අවුරුදු තුන්දාහක් වයසයි. එයා වීරයෝ සිය ගාණක් මැරෙනවා දැකලා තිබුණා. සමහරවිට එයා ඒකට කැමති නොවෙන්න ඇති, ඒත් එයා ඒකට හුරු වෙලයි හිටියේ. මගේ හිත සනසන්න උත්සාහ කරන එක බොරු වැඩක් බව එයා දැනගෙන ඉන්න ඇති.

"පර්සි," ඇනබෙත් කතා කළා. "ඔයා දන්නවා නේ, අනාවැකිවලට හැම වෙලාවෙ ම තේරුම් දෙකක් තියෙනවා. සමහරවිට ඇත්තට ම ඒකෙන් කියවෙන්නේ ඔයා මැරෙනවා කියන එක නොවෙන්න පුළුවන්."

"ආයෙත් අහලා," මම කිවුවා. "'එකම තීරණයක් ඔහුගේ කාලය අවසන් කරමින්,' කියන එකට තේරුම් ටොන් ගාණක් තියෙනවා, නෙහ්?"

Scanned with CamScanner

"සමහරවිට අපිට ඒක නතර කරන්න පුළුවන් වෙයි," ජේක් මේසන් ඉදිරිපත් වුණා. "'ශාපලත් තලයෙන් වීරයාගේ ආත්මය නෙලා ගනීවි.' අපි මේ කියන ශාපලත් තලය හොයාගෙන, ඒක විනාශ කරොත්. ඒකෙන් කියවෙන්නේ ක්‍රෝනොස්ගේ දෑකැත්ත ගැන වගෙයි, නේද?"

මම ඒ ගැන හිතලා තිබුණේ නැහැ, ඒත් ඒ ශාපලත් තලය රිප්ටයිඩ් ද නැත්නම් ක්‍රෝනොස්ගේ දෑකැත්ත ද කියන එක ප්‍රශ්නයක් නෙවෙයි. කොයි විදිහෙන් හරි, අපිට අනාවැකිය නවත්වන්න හැකිවෙයි ද කියලා නම් මට තිබුණේ සැකයක්. මම නම් කැමති වුණේ මොන විදිහකින්වත් මගේ ආත්මය නෙළා ගන්නේ නැතිව තියෙනවටයි.

"බාගදා අපි මේ පේළි ගැන පර්සිට කල්පනා කරලා බලන්න ඉඩ දුන්නොත් හොඳයි," කයිරොන් කිවුවා. "එයාට ටික කාලයක් ඕනෑ-"

"නෑ." මම අනාවැකිය දෙකට නමලා මගේ සාක්කුවට ඔබාගත්තා. මට විරෝධයක් සහ කේන්තියක් දැනුණත්, මම කේන්ති ගෙන සිටියේ කාත් සමඟ ද කියලා මට ම විශ්වාස නැහැ. "මට කාලය ඕනෑ නැහැ. මම මැරෙනවා නම් මැරිද්දෙන්. මට ඒ ගැන වද වෙවී ඉන්න බැහැ නේ, නේද?"

ඇනබෙත්ගේ දෑත් යාන්තමින් වෙවුලමින් තිබුණා. එයා මගේ ඇස් දිහා කෙලින් බැලුවෙවත් නැහැ.

"අපි මේක කරගෙන යමු," මම කිවුවා. "අපිට තව ප්‍රශ්න තියෙනවා නේ. අපි අතරෙ ඔත්තුකාරයෙක් ඉන්නවා."

මයිකල් යෙව්ගේ නළල රැළි ගැහුණා. "ඔත්තුකාරයෙක්?"

ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩාවේ දී සිදු වූ දේ ගැන මම එයාලට විස්තර කළා- අපි එන බව ක්‍රෝනොස් දැනගෙන සිටි හැටි, කඳවුරේ සිටි කෙනෙක් සමඟ පණිවුඩ හුවමාරු කර ගැනීමට එයා පාවිච්චි කර තිබූ දෑකැත්තක හැඩයේ රිදී යන්තරය ක්‍රෝනොස් මට පෙන්වූ හැටි.

සිලේනා ආයෙමත් අඬන්න පටන් ගත්තා, ඇනබෙත් එයාගේ කර වටේ අතක් දමාගත්තා.

"හොඳයි," කොනර් ස්ටොල් කිවුවේ අපහසුවෙන් වගෙයි, "මෙහෙ ඔත්තුකාරයෙක් ඇති කියලා අපි සැක කරේ අවුරුදු ගාණක



ඉඳලමයි, නේද? කවුරුහරි කෙනෙක් දිගින් දිගට ම ලූක්ට තොරතුරු දෙනවා- හරියට, අවුරුදු දෙකකට කලින් රන් බැටළු ලොම් සළුව තිබුණු තැන ගැන වගේ. කවුරු වුණත් එයා ලූක්ව හොඳට ම දන්න කෙනෙක් වෙන්න ඕනෑ."

එයාගේ බැල්ම ඉබේට ම වගේ ඇනබෙත් දිහාවට හැරුණා. ඇත්ත වශයෙන් ම, වෙන කාටත් වඩා හොඳට එයා ලූක්ව දැනගෙන හිටියා තමයි. ඒත් කොනර් ඉක්මනට වෙනතක් බලා ගත්තා. "ම්ම්, මම කිවුවේ, එයා ඕනෑ ම කෙනෙක් වෙන්න පුළුවන්."

"ඔව්." කේටී ගාඩ්නර් ස්ටොල් සහෝදරයින්ට රැව්වා. එයාලා දෙන්නා ඩිමීටර් කැබිනයේ තණ වැවූ වහලය චොකලට් ඊස්ටර් බනීලගෙන් සැරසුව දා ඉඳලා කේටී එයාලා සමඟ අමනාපයෙන් හිටියේ. "හරියට ලූක්ගේ සහෝදරයින්ගෙන් කෙනෙක් වගේ."

ට්‍රැවිස් සහ කොනර් දෙන්න ම එයා සමඟ දබර කරගන්න පටන් ගත්තා.

"නවත්තනවා!" සිලේනා මේසයට ගැසූ වේගයට එයාගේ උණු චොකලට් කෝප්පය ඉහිරුණා. "චාර්ලි මැරිලා, ඒ තියෙද්දී... ඒ තියෙද්දිත් ඔයාලා පොඩි ළමයි වගේ මෙතැන රණ්ඩු කරනවා!" එයා ඔළුව පහත් කරගෙන ඉකි බිඳින්න වුණා.

උණු චොකලට් මේසයෙන් පහළට වැගිරුණා. හැමෝම ලැජ්ජාවෙන් වගේ බලා සිටියා.

"එයා හරි," අන්තිමේ දී පොලක්ස් කිවුවා. "එක එක්කෙනාට දොස් කියා ගැනිල්ලෙන් වැඩක් වෙන්නේ නැහැ. අපි කරන්න ඕනෑ දෑකැත්තක හැඩේ යන්තරයක් එල්ලපු රිදී මාලයක් ගැන හෙවිල්ලෙන් ඉන්න එකයි. මට හිතෙන්නේ ක්‍රෝනොස් ළඟ එහෙම එකක් තිබුණා නම්, ඔත්තුකාරයා ළඟත් එකක් ඇති."

මයිකල් යෙව් අමනාපයෙන් ගෙරෙව්වා. "අපි අපේ ඊළඟ මෙහෙයුම සැලසුම් කරන්න කලින් මේ ඔත්තුකාරයාව හොයාගන්න ඕනෑ. ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා පුපුරවලා දැම්ම එකෙන් ක්‍රෝනොස්ව සදහට ම නතර කරන්න බැරි වෙයි."

"කොහෙත්ම නැහැ," කයිරොන් කිවුවා. "ඇත්ත වශයෙන්ම කියනවා නම් එයාගේ ඊළඟ ප්‍රහාරය දැනටමත් මඟ එනවා."

මම රවා බැලුවා. "ඔයා කියන්නේ පොසෙයිඩන් කියපු 'වඩාත් ලොකු තර්ජනය' ගැන ද?"

කයිරොන් සහ ඇනබෙත් මූණෙන් මූණ බලාගත්තේ හරියට දන් වෙලාව හරි කියන්න වගෙයි. එයාලා එහෙම කරන එක මට ජේන්න බැහැ කියලා මම කලිනුත් කිවුව ද?

"පර්සි," කයිරොන් කිවුවා. "ඔයා ආපහු කඳවුරට එනකල් මේ ගැන ඔයාට කියන්න අපිට ඕනෑ වුණේ නැහැ. ඔයාට ඔයාගේ... මනුෂ්‍ය යාළුවෝ එක්ක විවේක ගන්න ඕනෑ වුණා නේ."

ඇනබෙත්ගේ කම්මුල් රතු වුණා. මම රේචල් සමඟ කාලය ගත කළ බව එයා දැනගෙන ඉඳලා කියලා මට තේරුම් ගියා. ඒත් එක්කම මට වරදකාරී හැඟීමක් දැනුණා. ඊට පස්සේ මට වරදකාරී හැඟීමක් දැනීම ගැන තරහා ගියා. කඳවුරෙන් බැහැර යාළුවෝ ආශ්‍රය කරන්න මට අවසර තිබුණා නේ, නේද? ඒක ඉතින් හරියට...

"මොනවද වෙලා තියෙන්නේ කියලා මට කියන්නකෝ," මම කිවුවා.

කයිරොන් කෙටි කෑම මේසයෙන් ලෝකඩ කුසලානයක් අතට ගත්තා. වෙනදාට අපි චීස් උණු කරන්න පාවිච්චි කළ උඳුන් තැටිය මතට එයා වතුර ඉස්සා. එයින් ඉහළට නැගුණු හුමාලය මතට ප්‍රතිදීප්ත පහන්වල එළිය වැටී දේදුන්නක් මැවුණා. පසුම්බියෙන් රන් ඩ්‍රච්මාවක් ඩැහැගත් කයිරොන්, එය දුමාරය හරහා විසි කර, කොඳුරන්න ගත්තා, "ඕ අයිරිස්, දේදුන්නට අධිපති දේවතාවියනි, අපිට තර්ජනය පෙන්වන්න."

සැලෙමින් දිලිසුණ මීදුම තුළින් මට දුම් දමන ගිනි කන්දක හුරු පුරුදු දසුනක් පෙනුණා- සෙන්ට් හෙලේන්ස් කන්ද. මම බලා සිටියදී ම, කන්දේ එක පැත්තක් පිපුරුවා. ගින්දර, අළු සහ ලෝදිය එළියට පෙරළී ආවා. "-පසුගිය වසරේ සිදු වූ පිපුරුමටත් වඩා විශාලය," ප්‍රවෘත්ති නිවේදකයා කියමින් සිටියා. "කන්දේ විදාරණය වීම් අවසන් නැති බවට භූ විද්‍යාඥයින් අනතුරු අඟවයි."

ගිය අවුරුද්දේ පිපුරුම ගැන හැම විස්තරයක් ම මම දැනගෙන හිටියා. ඒක ඇති කළේ මමයි. ඒත් මේ පිපුරුම ඊට වඩා ගොඩාක් දරුණුයි. කන්ද කැලි කැඩෙමින් ඇතුළට කඩා වැටෙද්දී, දුමාරය මැදින් අපරිමාණ රූපාකායක් නැගී සිටියේ හරියට ඒක කාණු කටකින් ගොඩ එනවා වගෙයි. මීදුම එය මිනිසුන්ගේ දෑස්වලින් වසන් කරාවි කියලා



මම බලාපොරොත්තු වුණේ, මම දකපු දෙයින් මුළු රට පුරා ම භීතියක් සහ කැලඹීමක් ඇතිවිය හැකි නිසයි.

මීට කලින් මට මුණගැසී තිබුණ හැම දේකට ම වඩා ඒ යෝධයා විශාල වුණා. අඩු තරමේ මගේ උප දෙවි දෑස්වලටවත් ඌගේ රූපය අළු සහ ගින්දර මැදින් හරියට ම බලාගන්න බැරි වුණා. ඒ කොහොම වුණත් නොපැහැදිලි ලෙස මිනිස් ස්වරූපයක් ගත් ඌ කොයි තරම් විශාල ද කියනවා නම්, ඌට ක්‍රයිස්ලර් ගොඩනැගිල්ල බේස්බෝල් පිත්තක් වගේ පාවිච්චි කරන්න පුළුවන්කම තිබුණා. කන්ද බිහිසුණු වෙවුලුමකින් කම්පනය වුණේ හරියට අර රාක්ෂයා මහ හඬින් හිනා වෙනවා වගෙයි.

"ඒ එයා," මම කිවුවා. "ටයිෆූන්."

''ආපෝ නෑ, එයා තමයි අපේ යෝධ යාළුවා ලෙරෝයි! එයා එන්නේ අපිට උදවු කරන්න!'' වගේ කතාවක් කයිරොන් කියයි කියලා මම ඇත්තට ම බලාපොරොත්තු වුණා. ඒත් එච්චර වාසනාවක් කොහෙද. එයා නිකං ම ඔළුව වැනුවා විතරයි. "රාක්ෂයින් අතරින් වඩාත් ම බිහිසුණු එකා. මේ තරම් කාලෙකට දෙවිවරු මූණ දීලා තියෙන ලොකු ම තනි උවදුර. අන්තිමේ දී එයාව කන්ද යටින් නිදහස් කරලා. හැබැයි මේ දර්ශනය දවස් දෙකක් පරණයි. මේ තියෙන්නෙ අද සිද්ධ වෙන දේවල්."

කයිරොන් අත වනද්දී රූපය මාරු වුණා. මිඩ්වෙස්ට් තැනිතලාව හරහා කුණාටු වලාකුළු කඳක් පෙරළී එනවා මට දකින්න ලැබුණා. අකුණු විදුලි පිපුරුවා. ටොනේඩෝ පෙළක් ඉදිරියේ ඇති සියල්ල වනසමින්, නිවාස සහ ට්‍රේලර උගුලුවා දමමින්, රථ වාහන ගිනි පෙට්ටිවලින් සෑදූ සෙල්ලම් බඩු වගේ හතර වට විසි කර දමමින් ඇදී ගියා.

"අති විශාල ජල ගැල්මක්," නිවේදකයා කියමින් සිටියා. ''සියල්ල විනාශ කරමින් මෙම ප්‍රචණ්ඩ කුණාටුව නැගෙනහිර දෙසට ඇදී යද්දී දැනටමත් ප්‍රාන්ත පහක හදිසි ආපදා තත්ත්ව ප්‍රකාශයට පත්කර ඇත." බටහිරබඩ නගරයක් මතට පහත් වෙන කුණාටු කඳක සමීප රූපරාමු වෙතට කැමරාව යොමු වුණා. කුණාටුව තුළින් මට යෝධයාව දකගන්න හැකි වුණා- එයාගේ සැබෑ ස්වරූපයේ අංශු මාත්‍රයන් කීපයක්: දුමින් සෑදුණු අතක්, කඩ සාප්පු සංකීර්ණයක් තරමේ නිය පහුරු පිරුණු අතක්. එයා කේන්තියෙන් කළ ගර්ජනාවේ හඬ න්‍යෂ්ටික පිපුරුමක් වගේ තැනිතලාව හරහා පෙරළී ගියා. වලාකුළු

Scanned with CamScanner

අතරින් වේගයෙන් පහත බැස්ස ප්‍රමාණයෙන් කුඩා රූපාකායන් කිපයක් රාක්ෂයාව වට කරගත්තා. මට ක්ෂණික එළි දහරා දකින්න ලැබුණා. රාක්ෂයා එයාලට අතින් ගසන්න උත්සාහ කරන බව මට තේරුම් ගියා. මම ඇස් හීනි කර ඒ දිහා තදින් බලා සිටිද්දී අන්ධකාරය තුළට පියඹා යන රන්වන් කරත්තයක් පෙනුණු බව මට හිතුණා. ඊට පස්සේ මොකෙක්දෝ යෝධ කුරුල්ලෙක්- අති විශාල බකමූණෙක්- යෝධයාට පහර දෙන්න පියඹා ගියා.

"ඒ... දෙවිවරු ද?" මම ඇහුවා.

"ඔව්, පර්සි," කයිරොන් කිවුවා. "එයාලා දැන් දවස් ගාණක් තිස්සේ එයා එක්ක සටන් කරකර, එයාගේ වේගය අඩු කරන්න උත්සාහ කරනවා. ඒත් ටයිපූන් කෙලින් ම ඉස්සරහට එනවා- නිව්යෝක් දිහාවට. ඔලිම්පස් දිහාවට."

මම එය හිතට කාවදින්න ඉඩ ඇරියා. "මෙහෙට එන්න එයාට කොච්චර කාලයක් යයි ද?"

"දෙවිවරුන්ට එයාව නතර කරන්න බැරි වුණොත් ද? බාගදා දවස් පහක්. ඔලිම්පියානුවන්ගෙන් වැඩි දෙනෙක් එතැන ඉන්නවා... ඔයාගේ තාත්තා ඇරෙන්න. එයාට සටන් කරන්න එයාගෙ ම යුද්ධයක් තියෙනවා නේ."

"ඒත් එතකොට ඔලිම්පස් මුර කරන්නෙ කවුද?"

කොනර් ස්ටොල් ඔළුව හෙල්ලුවා. "බැරි වෙලාවත් ටයිපූන් නිව්යෝර්ක්වලට ආවොත්, කවුරු ඔලිම්පස් මුර කළත් වැඩක් නෑ."

නැවේ දී ක්‍රෝනොස් කියූ දේවල් මට සිහි වුණා: 'මම ඔලිම්පස් විනාශ කරන්න යන හැටි තේරුම් ගත්තා ම නුඹේ ඇස්වල මතුවෙන බය දකින්න තියෙනවා නම් මම හරි ආසයි.'

එයා කියන්න ඇත්තේ මේ ගැන ද: ටයිපූන්ගෙන් එල්ල කරන ප්‍රහාරයක් ගැන ද? ඇත්තෙන්ම ඒක බය හිතෙන දෙයක් තමයි. ඒත් ක්‍රෝනොස් කියන්නේ නිතර ම අපිව මෝඩයාට අන්දලා, අපේ අවධානය වෙනතකට හරවපු කෙනෙක්. එහෙම හිතද්දී මේක පැහැදිලි වැඩියි වගෙයි. ඒ වගේම මගේ හීනයේ දී, රන්වන් ටයිටන් ඉදිරියට නියමිත අභියෝග කීපයක් ගැන ම කතා කළේ හරියට ටයිපූන් එයින් පළවෙනි එක විතරයි වගෙයි.



"ඒක උපායක්," මම කිවුවා. "අපි දෙවිවරුන්ට අනතුරු අඟවන්න ඕනෑ. තව මොනවා හරි දෙයක් සිද්ධ වෙන්නයි යන්නේ."

කයිරොන් බරපතළ ලෙස මගේ දිහා බැලුවා. "ටයිපූන්ටත් වඩා නරක දෙයක්? මං හිතන්නෑ."

"අපි ඔලිම්පස් ආරක්ෂා කරගන්න ඕනෑ," මම බලකර කියා සිටියා. "ක්‍රෝනොස් තවත් ප්‍රහාරයක් සැලසුම් කරන් ඉන්නේ."

"එයාට එහෙම එකක් තිබුණා තමයි," ට්‍රැවිස් ස්ටොල් මට සිහිපත් කර දුන්නා. "ඒත් ඔයාලා එයාගේ නැව ගිල්ලුවා නේ."

හැමදෙනා ම මගේ දිහා බලා සිටියා. එයාලට ඕනෑ වුණේ මොකක් හෝ හොඳ ආරංචියක් අහන්නයි. එයාලට ඕනෑ වුණේ අඩු තරමේ මම එයාලට පුංචි බලාපොරොත්තුවක්වත් දී ඇති බව විශ්වාස කරන්නයි.

මම ඇනබෙත් දිහාවට බැල්මක් හෙලුවා. අපි දෙන්න ම හිතමින් සිටියේ එක ම දෙයක් බව මට තේරුම් ගියා: ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා කුටෝපායක් නම්? අපි අපේ මුරකාවල් පහත දමයි කියන බලාපොරොත්තුවෙන් ක්‍රෝනොස් අපිට එයාගේ නැව පුපුරවා හරින්න ඉඩ දුන්නා නම්?

ඒත් ඒ කතාව මම සිලේනා ඉදිරියේ කියන්න ගියේ නැහැ. එයාගේ පෙම්වතා ඒ මෙහෙයුමට ජීවිතේ ම පූජා කරලයි තිබුණේ.

"සමහරවිට ඔයා හරි ඇති." මම කිවුවා. හැබැයි මම ඒ එක වචනයක්වත් විශ්වාස කළේ නම් නැහැ.

මේ තත්ත්වය මීටත් වඩා දරුණු අතට හැරෙන විදිහ හිතේ මවාගන්න මම උත්සාහ කළා. දෙවිවරු මීට කලින් වතාවකදීත් මුළුමනින්ම වගේ පරදින්න ගිය අති දැවැන්ත රාක්ෂයෙක් සමඟ සටන් කරන්න මිඩ්වෙස්ට්වලට ගිහින්. මුහුදට අධිපති ටයිටන් ඔසිනස්ගේ වැටලීමට මැදිවෙලා කරන යුද්ධයෙන් පොසෙයිඩන් පරදින්න ළඟයි. ක්‍රෝනොස් තවමත් කොහේ හරි තැනක පණ පිටින් සිටියා. ඔලිම්පස්වලට ඇත්තෙන් ම කිසිම ආරක්ෂාවක් නැහැ. අර්ධ-ලෝහිත කඳවුරේ උප දෙවිවරු ඔත්තුකාරයෙක් මැද තියාගෙන තනිවෙලා.

ඔහ්, ඒ මදිවට අර පරණ අනාවැකියේ කියවුණ විදිහට, අවුරුදු දහසය ලැබුවා ම මම මැරෙන්නයි යන්නේ- ඒ කියන්නේ තව දවස්

Scanned with CamScanner

පහකින්, හරියට ම ටයිපූන් නිව්යෝක්වලට පහර දෙන්න ඉඩ තියෙන දවසේ. තව පොඩ්ඩෙන් ඒක අමතක වෙනවා.

"හොඳයි," කයිරොන් කිව්වා. "මං හිතන්නේ එක රැකට මේ හොඳටම ඇති."

එයා අතක් වැනුවා ම හුමාලය විසිරී ගියා. ටයිපූන්ගේ සහ දෙවිවරුන්ගේ කුණාටු යුද්ධය නොපෙනී ගියා.

"ඒක නම් හැල්ලුවක්," මම කෙඳිරුවා.

ඊට පස්සේ යුද මන්ත්‍රණ සභාව කල් තැබුවා.

# 04

# අපි ලෝහමය පාංශුකූලයක් ආදාහනය කළා

රේචල් එලිසබෙත් ඩෙයාර් මගේ පින්තූරයකට ඩාර්ට්වලින් දමා ගසනවා මම හීනෙන් දැක්කා.

එයා හිටියේ එයාගේ කාමරය මැද හිටගෙනයි... හරි, පොඩ්ඩක් ආපස්සට යමු. රේචල්ට කාමරයක් නැති බව මම ඔයාට පැහැදිලි කරන්න එපැයි. බෲක්ලින්වල තිබුණු එයාගේ පවුලේ මන්දිරයේ උඩ තට්ටුව ම අයිති වුණේ එයාටයි. එයාගේ මේ 'කාමරය' කාර්මික විදුලි බුබුළු සහ වහලයේ-සිට-පොළොවට ම උස ජනේල ඇති විශාල උඩු මහලක්. ඒක තට්ටු නිවාස සංකීර්ණයේ ඇති මගේ අම්මගෙ ගෙදර වගේ දෙගුණයක් විතර ලොකුයි.

සායම්වලින් වැසුණු එයාගේ බෝස් ඩොකින්ග් සිස්ටම් එකේ රොක් සංගීතය මහ හඬින් වාදනය වෙමින් තිබුණා. මම තේරුම් ගෙන තිබූ විදිහට, සංගීතය සම්බන්ධයෙන් රේචල්ගේ එක ම න්‍යාය වුණේ එයාගේ අයිපොඩ් එකේ එක වගේ ගීත දෙකක් තබා නොගැනීම සහ ඒවා හැමෙකක් ම අසාමාන්‍ය ඒවා වීම විතරයි.

එයා කිමෝනෝවකින් සැරසී සිටියා, එයාගේ කොණ්ඩය අවුල් වෙලා තිබුණේ නින්දෙන් නැගිටලා වගෙයි. එයාගේ ඇඳ අවුල් ජාලයක් වී තිබුණා. චිත්‍රකරුවන් පාවිච්චි කරන කැන්වස් ආධාරක පොකුරක් මතින් පොරෝනා එල්ලෙමින් තිබුණා. කිළිටි ඇඳුම් සහ

Scanned with CamScanner

පරණ කෑම දවටන බිම පුරා විසිරිලා. ඒ වුණත් ඔයාට ඒ තරම් ලොකු කාමරයක් තියෙනවා නම්, ඒ වගේ අවුල් ජාලයක් වුණත් එච්චර කැතට පෙනෙන්නේ නැහැ. ජනේලවලින් එපිට මෑන්හැට්න්වල රාත්‍රී අහස දිස් වුණා.

එයා පහර දෙමින් සිටියේ මම ඇන්ටියස් යෝධයාට විරුද්ධව නැගී සිටිනවා පින්තාරු කළ සිතුවමකටයි. ඒ සිතුවම රේචල් මීට මාස දෙකකට විතර කලින් ඇඳලා තිබුණ එකක්. ඒ සිතුවමේ මගේ මුහුණට සැහැසි බවින් කැලඹුණු බැල්මක් ලැබී තිබුණා- ඒක දිහා බැලුවා ම මම වීරයා ද නැත්නම් දුෂ්ටයා ද කියන්න අමාරුයි. රේචල් නම් කිවුවේ එදා ඒ සටන අවසන් වුණා ම මට ඇත්තටම තිබුණේ එහෙම පෙනුමක්ලු.

"උප දෙවියෝයි," තවත් ඩාර්ට් එකකින් කැන්වසයට දමා ගසමින් රේචල් කෙඳිරුවා. "එයාලගෙ මෝඩ ගවේෂණයි."

ඩාර්ට්වලින් වැඩි ප්‍රමාණයක් එහි වැදී ඉවත විසි වුණත්, කීපයක් එහි ඇමිණී තිබුණා. ඒවායින් එකක් මගේ නිකට යටින් එල්ලෙමින් තිබුණේ එළු රැවුලක් වගෙයි.

එයාගේ නිදන කාමරයේ දොරට කවුදෝ තඩිබෑවා.

"රේචල්!" පිරිමියෙක් කෑගැසුවා. "මොන කෙහෙම්මලක් ද ඔය කරන්නේ? ඕක නිවලා දානවා-"

දුරස්ථ පාලකය අහුලා ගත් රේචල් සංගීතය නැවැත්වූවා.

''ඇතුළට එන්න!"

මුහුණ තරහෙන් පෑගිරි කරගෙන, ආලෝකයේ සැරට තදින් ඇහිපිය ගසමින් එයාගේ තාත්තා ඇතුළට ආවා. එයාට තිබුණේ රේචල්ගේ කොණ්ඩයට වඩා තරමක් තද, මළකඩ පාට කොණ්ඩයක්. එය පැත්තකට ඇලවී තිබුණේ හරියට එයා කොට්ටය සමඟ කළ සටනකින් පරාද වෙලා වගෙයි. එයාගේ නිල් පාට සේද පිජාමා කමිසයේ සාක්කුව මත 'ඩබ්ලිව්.ඩී' අකුරු මසා තිබුණා. ඇත්තටම මං අහන්නේ, නමේ මුල් අකුරු සටහන් කරපු පිජාමා අඳින්නෙ කවුද?

"මොනවද මේ කරන්නේ?" එයා ප්‍රශ්න කළා. "පාන්දර තුනට නැගිටගෙන."

"නින්ද යන්නෑ," රේචල් කිවුවා.



සිතුවමේ, මගේ මුහුණේ ඇමිණී තිබුණු ඩාර්ටයක් බිමට වැටුණා. රේචල් ඉතිරි ඒවා පිටුපසට කර සඟවා ගත්තත් මිස්ටර් ඩෙයාර් ඒක දැක්කා.

"ඒ කියන්නේ... ඔයාගේ යාළුවා සෙන්ට් තෝමස්වලට එන්නේ නැහැ?" මිස්ටර් ඩෙයාර් මට කතා කළේ එහෙමයි. කවදාවත් 'පර්සි' කියලා නෙවෙයි. නිකං ම 'ඔයාගේ යාළුවා'. එහෙම නැත්නම් එයා මාව අමතද්දි 'ඉලන්දාරියා'. හැබැයි ඒ කලාතුරකින්.

රේචල්ගේ ඇහි බැමි හා වුණා. "මං දන්නෑ."

"අපි උදේට පිටත් වෙනවා," එයාගේ තාත්තා කිවුවා. "එයා තවම හිත හදාගෙන නැත්නම්-"

"මට හිතෙන්නේ එයා එන එකක් නැහැ," රේචල් මූසල හඬින් කිවුවා. "සතුටුයි ද?"

මිස්ටර් ඩෙයාර් දෑත් පිටුපසට කර බැඳගත්තා. ඊට පස්සේ එයා බැරෑරුම් මුහුණින් කාමරයේ ඉහළ පහළ ඇවිදින්න ගත්තා. එයා එයාගේ ඉඩම් සංවර්ධනය කරන සමාගමේ සභා ශාලාවේදිත් එහෙම කරලා, එයාගේ සේවකයින්ව බය ගන්වන හැටි මට මැවිලා පෙනුණා.

"ඔයාට තවමත් නරක හීන පේනවා ද?" එයා ඇහුවා. "ඔළුවෙ කැක්කුම එහෙම?"

රේචල් අතේ තිබුණ ඩාර්ට් ටික බිම දැමුවා. "මට තිබුණේ ඒක කවදාවත් ඔයාට නොකියා ඉන්න."

"මම ඔයාගේ තාත්තා," එයා කිවුවා. "මම ඔයා ගැනයි කරදර වෙන්නේ."

"ඔයා කරදර වෙන්නෙ පවුලේ නම්බුව ගැනයි," රේචල් කෙඳිරුවා.

එයාගේ තාත්තා එයට ප්‍රතිචාර දැක්වූයේ නැහැ- සමහරවිට එයා මීට කලිනුත් ඒ කතාව අහලා තියෙන්න ඇති, එහෙමත් නැත්නම් ඒක ඇත්ත නිසා වෙන්න ඇති.

"අපිට පුළුවන් ඩොක්ටර් ආර්ක්රයිට්ට කෝල් කරන්න," එයා යෝජනා කළා. "ඔයාගේ හැම්ස්ටර් මීයා මැරිච්ච වෙලාවේ ඔයාට හිත හදාගන්න එයා උදවු කරා නේ."

Scanned with CamScanner

"එතකොට මට වයස අවුරුදු හයයි," රේචල් කිවුවා. "ඒ වගේම නැහැ, තාත්තේ, මට ඩොක්ටර් කෙනෙක් ඕනෑ නෑ. මට මේ..."

එයා අසරණ තාලෙට ඔළුව හෙල්லුවා.

එයාගේ තාත්තා ජනේලය ඉදිරියේ නැවතුණා. එයා නිව්යෝර්ක් අහස් මායිම දිහා බලාගෙන හිටියේ හරියට එයා ඒකේ අයිතිකාරයා වගෙයි- ඒක ඇත්තක් නෙවෙයි නේ. එයා ඒකේ බාගයක අයිතිකාරයා විතරයි.

"මෙහෙන් ඈතට යන එකෙන් ඔයාට හොඳක් වෙයි," එයා තීරණය කළා. "පහුගිය කාලේ ඔයා ආශ්‍රය කළේ ඒ තරම් හොඳ අයව නෙවෙයි."

"මම ක්ලැරියන් බාලිකා විද්‍යාලෙට යන්නෙ නැහැමයි," රේචල් කිවුවා. "ඒ වගේම මගේ යාළුවන්ගෙන් ඔයාට වැඩක් නෑනේ."

මිස්ටර් ඩෙයාර් හිනාවක් පෑවා, ඒත් ඒක උණුසුම් හිනාවක් නෙවෙයි. ඒක හරියට 'ඔයා හැසිරුණේ කොච්චර මෝඩ විදිහට ද කියලා කවදාහරි ඔයාට ම තේරෙයි.' කියනවා වගේ හිනාවක්.

"ටිකක් නිදාගන්න බලන්න," එයා අවවාද කළා. "හෙට ය වෙද්දි අපි වැල්ලට ගිහින් ඉඳියි. ඒක හොඳ විනෝදයක් වෙයි."

"විනෝදේ," රේචල් ඒක ම කිවුවා. "හොඳ විනෝදේ."

එයාගේ තාත්තා කාමරයෙන් පිටවුණා. එයා දොර ඇර දමා තිබෙද්දි ම යන්න ගියා.

රේචල් මගේ සිතුවම දිහා ඇසිපිය නොහෙළා බලා සිටියා. ඊට පස්සේ එයා පොරෝනාවකින් වසා තිබූ අනෙක් කැන්වස් ආධාරකය වෙතට ගියා.

"ඒවා හීන විතරයි කියලා මම හිතනවා," එයා කිවුවා.

එයා කැන්වස් ආධාරකයේ ආවරණය ඉවත් කළා. එහි වූයේ කලබලෙන් ඇඳපු කටු සටහනක් විතරක් වුණත් රේචල් කියන්නේ දක්ෂ චිත්‍ර ශිල්පිනියක්. එහි තිබුණේ නො අනුමානව ම ලූක් පොඩි කාලයේ රූපයක්. කැළැල් නැති මුහුණ හිනාවකින් පුරවාගෙන සිතුවමේ සිටි එයාට වයස අවුරුදු නමයක් විතර ඇති. ඒ කාලයේ එයාගේ පෙනුම රේචල් කොහොම දැන ගත්තා ද, මට හිතාගන්න බැරි වුණා, ඒත් ඒ චිත්‍රය කොයි තරම් පැහැදිලි ද කියනවා නම් රේචල් එය අනුමානයෙන් සිතුවම් කළ එකක් නෙවෙයි කියලා මට හැඟුණා. ලූක්ගේ ජීවිතය



ගැන මම දැන සිටි තරමින් (ඒකත් වැඩිය නෙවෙයි), මේ පින්තූරයෙන් පෙන්නුම් කළේ එයා අර්ධ-ලෝහිතයෙක් බව දැනගෙන ගෙදරින් පැනලා යන්න කලින් කාලයයි.

රේචල් සිතුවම දිහා ඇසි පිය නොහෙළා බලා සිටියා. ඊට පස්සේ එයා ඊළඟ කැන්වස් ආධාරකයත් නිරාවරණය කළා. ඒකෙ තිබුණේ ඊටත් වඩා හිත කලඹවන චිත්‍රයක්. එයින් පෙන්නුම් කළේ එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල වටේටම අකුණු විදුලි කොටනවායි. එහි ඈතින් කැකෑරෙමින් තිබුණු අඳුරු කුණාටුවක වලාකුළු මැදින් අති දැවැන්ත අතක් පහළට එමින් තිබුණා. ගොඩනැගිල්ල පාමුල සෙනඟ රැස් වී සිටියා... ඒත් ඒ සාමාන්‍ය සංචාරකයින්ගෙන් සහ පදිකයින්ගෙන් සෑදුණු සෙනඟක් නෙවෙයි. එයාලා අතර හෙලි, කුන්ත සහ ධජ-හමුදාවක ආයිත්තම් මට දකින්න ලැබුණා.

"පර්සි," රේචල් කෙඳිරුවේ මම අසා සිටින බව දන්නවා වගෙයි, "මොනවද මේ වෙන්නේ?"

සිහිනය වියැකී යද්දී මගේ මතකයේ රැඳුණු අන්තිම දේ වුණේ එයා ඇසූ ප්‍රශ්නයට මට පිළිතුරු දෙන්න තිබුණා නම් කියලා කළ ප්‍රාර්ථනාවයි.

***

ඊළඟ උදෑසන, මට එයාට කතා කරන්න ඕනෑ වුණත්, කඳවුරේ දුරකථනයක් තිබුණේ නැහැ. ඩයනයිසියස්ට සහ කයිරොන්ට ස්ථාවර දුරකථනයක් ඕනෑ වුණේ නැහැ. එයාලට යමක් ඕනෑ වුණ වෙලාවට එයාලා ඔලිම්පස්වලට අයිරිස්-පණිවුඩයක් යවන එකයි කළේ. ඒ වගේම උප දෙවිවරු ජංගම දුරකථනයක් පාවිච්චි කළොත්, එයින් නිකුත් වෙන සංඥාවලින් හැතැප්ම සිය ගාණක් දුරින් ඉන්න රාක්ෂයෝ පවා ඇවිස්සෙනවා. ඒක හරියට: 'මෙන්න මෙතන මම ඉන්නවෝ! ඇවිල්ලා මගේ මූණ සමතලා කරපියෝ!' කියලා ගිනි සංඥාවක් යවනවා වගේ වැඩක්. කඳවුරේ ආරක්ෂිත සීමාව ඇතුළේ දි වුණත්, ඒ විදිහේ දැන්වීම් ප්‍රචාරය කරන්න අපිට ඕනෑ වුණේ නැහැ.

උප දෙවිවරුන්ගෙන් වැඩි දෙනෙකුට (ඇනබෙත් සහ තව කීපදෙනෙක් ඇරෙන්න) ජංගම දුරකථන තිබුණෙත් නැහැ. ඒ වගේම මට "හේයි, අනේ මට රේචල්ට කතා කරන්න ඔයාගේ ෆෝන් එක දෙන්නකෝ!" කියලා ඇනබෙත්ගෙන් ඉල්ලන්න කොහෙත්ම බැහැ නේ. ඉතින් දුරකථන ඇමතුමක් ගන්න නම්, මට කඳවුරෙන් පිටවෙලා,

ළඟ ම ඇති වෙළඳ සැල හොයාගෙන සැතපුම් කීපයක් පයින් යන්න වෙනවා. එහෙම කරන්න කයිරොන් මට ඉඩ දුන්නත්, මම එතැනට යද්දී, රේවල් සෙන්ට් තෝමස්වලට පිටත් වෙන ගුවන් යානයේ ඉඳීවි.

මම පොසෙයිඩන් මේසයේ තනියම වාඩි වෙලා, හිත් තැවුලෙන් පිරුණ උදේ කෑමක් ගත්තා. මීට අවුරුදු දෙකකට කලින් නිකෝ ලේ පිපාසිත ඇටසැකිලි පොකුරක් පාතාල ලෝකයට පිටුවහල් කළ තැන කිරි ගරුඬ පොළොවේ ඇති වී තිබූ පැල්ම දිහා මම දිගින් දිගටම බලා සිටියා. ඒ මතකය ඇත්තටම බඩගිනි වඩවනසුලු වුණේ නැහැ.

★★★

උදේ කෑමෙන් පස්සේ, ඇනබෙත් සහ මම කැබින් පරීක්ෂාව සඳහා ගියා. ඇත්තටම, ඒක ඇනබෙත්ගේ පිරික්සුම් වාරයයි. මට උදේ වරුවේ පැවරී තිබුණු රාජකාරිය වුණේ කයිරොන්ගේ වාර්තා පිළිවෙළට වර්ග කරන එකයි. ඒ වුණත් අපි දෙන්නට ම අපේ රාජකාරි පෙනෙන්න බැරි වුණ නිසා, එකතු වෙලා ඒවා කරන්න අපි තීරණය කළේ එතකොට ඒවාගේ එපාවෙන ගතිය අඩුවෙන නිසයි.

අපි පොසෙයිඩන් කැබිනයෙන් පරීක්ෂාව පටන් ගත්තා. ඒකෙ හිටියේ ඉතින් මම විතරයි නේ. එදා උදේ මම මගේ ඇඳ පිළිවෙළකට හදලා, (හොඳයි, එක විදිහකට) බිත්තියේ එල්ලෙමින් තිබුණු මිනටෝර් අඟ කෙලින් කරලයි තිබුණේ. ඒ නිසා මම මට ලකුණු පහෙන් හතරක් දාගත්තා.

ඇනබෙත් මූණ ඇද කළා. "ඔයා හරිම නිර්ලෝභී කෙනෙක් නේ." එයා පැන්සලේ කෙළවරෙන් පරණ කොට කලිසමක් ඉහළට එසෙව්වා.

මම ඒක උදුර ගත්තා. "හේයි, පොඩ්ඩක් මං ගැනත් හිතන්නකෝ. මේ ගිම්හානේ මගේ දේවල් අස් කරලා දෙන්න ටයිසනුත් නැහැ."

"පහෙන් තුනයි," ඇනබෙත් කිවුවා. ඒකට විරුද්ධව වාද කළොත් වෙන දේ දැනගෙන හිටිය නිසා, මම පාඩුවේ එතැනින් ඉදිරියට ගියා.

අපි ඇවිදගෙන යන අතරේ ම කයිරොන්ගේ වාර්තා මිටිය උඩින් පල්ලෙන් කියවන්න මම උත්සාහ කළා. එතැන උප දෙවිවරු, සොභාවික බලවේග සහ රට වටා ම සිටි සැටර්ලා විසින් අලුත් ම රාක්ෂ ක්‍රියාකාරකම් ගැන ලියා එවූ පණිවුඩ තිබුණා. ඒවා සෑහෙන හිත



කලබනසුලු වුණා. ඒ විදිහේ හිත කලබනසුලු දේවල්වලට අවධානය යොමු කරන්න මගේ ඒ.ඩී.එච්.ඩී මොළේ කැමති වුණේ නැහැ.

හැම තැනක ම පොඩි පොඩි සටන් පැතිරෙමින් තිබුණා. කඳවුරට අලුතින් එකතු වෙන ප්‍රතිශතය බිංදුවට ම බැහැලයි තිබුණේ. රට පුරා කරක් ගහන රාක්ෂයින් ගණන ගොඩක් වැඩි වී තිබුණු නිසා අලුත් උප දෙවිවරු හොයාගෙන, කඳවුරට අරන් ඒම සැටර්ලට අමාරු දෙයක් වෙලා තිබුණා. ආර්ටෙමිස්ගේ දඩයක්කාරියන් පෙරටුව යන අපේ යාළුවා තාලියා ගැන මාස ගාණකින් ආරංචියක් නැහැ. එයාලට සිද්ධ වුණ දේ ආර්ටෙමිස් දැන සිටින්න ඇති, ඒත් ඒ විස්තර බෙදාගන්න එයා කැමති වුණේ නැහැ.

අපි ඇෆ්‍රොඩයිට්ගේ කැබිනයට ගියා. ඒකට ලකුණු පහෙන් පහක් ලැබුණු බව කියන්නත් දෙයක් නෙවෙයි නේ. එයාලගේ ඇඳන් නියම පිළිවෙළට සකසා තිබුණා. හැම දෙනාගේම ඇඳුන් පාමුල වූ කුඩා අල්මාරි තුළ ඇඳුම් පාට අනුව වෙන්කර තිබුණා. ජනෙල් පඩි මත මල් පිපී තිබුණා. මුළු කැබිනය පුරා ම මිල අධික සුවඳ විලවුන් සැර පැතිරී තිබුණු නිසා එයාලගෙන් ලකුණක් අඩු කරන්න මට ඕනෑ වුණත්, ඇනබෙත් මාව නොසලකා හැරියා.

"හැමදාමත් වගේම අදත් වැඩේ නියමයි, සිලේනා," ඇනබෙත් කිවුවා.

සිලේනා උදාසීන ලෙස ඔළුව වැනුවා. එයාගේ ඇඳ පිටුපස බිත්තිය බෙකන්ඩෝර්ෆ්ගේ ඡායාරූපවලින් සරසා තිබුණා. එයා චොකලට් පෙට්ටියක් ඔඩොක්කුවේ තබාගෙන ඇඳ මත වාඩි වී සිටිනවා දැක්කා ම, එයාගේ තාත්තා ගමේ චොකලට් සාප්පුවක හිමිකරුවෙක් බව මට සිහි වුණා. එයා ඇෆ්‍රොඩයිට්ගේ අවධානය දිනාගෙන ඇත්තේ එහෙමයි.

"ඔයාට බොන්බොන් එකක් ඕනෑ ද?" සිලේනා ඇහුවා. "මගේ තාත්තා ඒවා එවුවේ. එයා හිතුවෙ- එයා හිතුවෙ ඒවගෙන්වත් මාව සතුටු කරන්න පුළුවන් වෙයි කියලා."

"ඒවා හොඳයි ද?" මම ඇහුවා.

එයා ඔළුව හෙල්ලුවා. "ඒවා නිකං කාඩ්බෝඩ් රහයි."

මගේ හිතේ නම් ඉතින් කාඩ්බෝඩ්වලට කිසිම අමනාපයක් නැති නිසා මම එකක් කාලා බැලුවා. ඇනබෙත් ඒක අතින් අතට

Scanned with CamScanner

යැව්වා. සිලේනාව පසුව බලන්න එන්න පොරොන්දු වෙලා අපි පිරික්සුම දිගටම කරගෙන ගියා.

අපි පොදු මිදුල හරහා යද්දී ඒරීස් සහ ඇපලෝ කැබින් දෙක රණ්ඩු කරමින් සිටියා. ගිනි බෝම්බවලින් සන්නද්ධ වූ ඇපලෝ කඳවුරුකරුවෝ දෙතුන් දෙනෙක් පෙගසිලා දෙන්නෙක් අදින කරත්තයකින් ඒරීස් කැබිනයට ඉහළින් පියඹා ගියා. මම මීට කලින් කවදාවත් ඒ කරත්තය දකලා තිබුණේ නැහැ, ඒ වුණත් ඒකට තිබුණේ සෑහෙන ආසා හිතෙන පෙනුමක්. මොහොතක් යන්න කලින් ඒරීස් කැබිනයේ වහලය ගිනි ඇවිලෙන්න පටන් ගත්තා. ඔරු පදින විලේ සිටි ජල දෙවඟනෝ එයට වතුර ගහන්න දුවගෙන ආවා.

ඊට පස්සේ ඒරීස් කඳවුරුකරුවෝ ශාපයක් මැතිරුවා, ඒත් එක්ක ම ඇපලෝ ළමයින්ගේ ඊතල සියල්ල රබර්වලට හැරුණා. ඇපලෝ ළමයි නොනවත්වා ම ඒරීස් ළමයින්ට විද්දත්, ඊතල අහකට පොළා පැන්නා.

අපි ළඟින් දිවූ දුනුවායෝ දෙන්නෙක්ව ඒරීස් ළමයෙක් කේන්තියෙන් ලුහුබැන්දේ කවි පද මොර ගසා කියමින්: "ශාප කරා ද මට? කරනෙමි හොඳ වැඩක්! කවියෙන් කතා කරනට මට බැහැ මුළු දිනක්!"

ඇනබෙත් සුසුමක් හෙළුවා. "ආයෙත් නම් ඒක එපා. කලින් වතාවේ ඇපලෝ කට්ටිය කැබින් එකකට ශාප කළා ම, එයාලට පද දෙකේ කවි කියවෙන එක නතර වෙන්න සතියක් ගියා."

මාව වෙවුලා ගියා. ඇපලෝ කියන්නේ දුනු ශිල්පයට වගේම කවියටත් අධිපති දෙවියා. එයාගේ කවි මට පෞද්ගලිකව ම අහන්න ලැබිලා තියෙනවා. ඊට වඩා හොඳයි හී ඇනුමක් කාලා මැරෙනවා.

"කොහොම හරි, එයාලා මොකටද මේ රණ්ඩු කරන්නේ?" මම ඇහුවා.

මාව නොසලකා හැරිය ඇනබෙත් කැබින් දෙකට ම ලකුණු පහෙන් එක බැගින් දෙමින් එයාගේ පිරික්සුම් ලේඛනයේ නොසැලකිලිමත් ලෙස සටහන් දැමුවා.

මම ඇස් ඉවතට නොගෙන එයා දිහා බලා ඉන්න බව මට ම තේරුම් ගියා. ඒක මහා මෝඩ වැඩක් වගේ දැනුණේ මම මීට කලිනුත් එයාව බිලියන වතාවක් විතර දකලා තියෙන නිසයි. මේ ගිම්හානයේ දී එයයි මමයි එක උසට ම වගේ ඇවිත් තිබීම නම් මට ලොකු සහනයක්



වුණා. ඒ වුණාට තවමත්, එයා මට වඩා මුහුකුරා ගිය කෙනෙක් වගෙයි පෙනුණේ. ඒක තරමක් බය ගන්වන දෙයක් වුණා. මං කියන්නේ, ඇත්තටම, එයා ඉස්සර ඉඳල ම හුරුබුහුටියි තමයි, ඒත් මේ ළඟක දී ඉඳන් එයා ඇත්තට ම ලස්සන වෙන්න පටන්ගෙන තිබුණා.

"අර පියාඹන කරත්තේ," අන්තිමේ දී එයා කිවුවා.

"මොකක්ද?"

"එයාලා රණ්ඩු කරන්නෙ මොකටද කියලා ඔයා ඇහුවේ?"

"ඔහ්, අහ්, හරි."

"ගිය සතියේ පිලඩෙල්ෆියාවල කරපු වැටලීමක දී එයාලා ඒක අල්ලගෙන තිබුණා. ලූක්ගේ උප දෙවිවරු වගයක් ඔය පියාඹන කරත්තේ එක්ක එහෙ ඉඳලා තිබුණා. සටන වෙලාවෙ දී ඇපලෝ කැබින් එකේ අය ඒක අල්ලගෙන, ඒත් ඒ වැටලීම මෙහෙයුවේ ඒරීස් කැබින් එකේ අය. එදා ඉඳලා ඒකේ අයිතිවාසිකමට එයාලා රණ්ඩු කරනවා."

මයිකල් යෙව් ඒරීස් කඳවුරුකාරයෙකුට බෝම්බ දාන්න වේගයෙන් පහළට එද්දී අපි බිමට පහත් වුණා. එයාට කඩුවෙන් අනින්න උත්සාහ කළ ඒරීස් කඳවුරුකාරයා කවි පද දෙකකින් එයාට බැණ වැදුණා. ඒකට නොසරුප් වචනවලින් එළිසමය පබඳින්න එයා සෑහෙන නිර්මාණශීලී වෙලා තිබුණා.

"අපි මේ පණ බේරගන්න යුද්ධ කරනවා," මම කිවුවා, "ඒ තියෙද්දී මෙයාලා ඔලමොට්ටල කරත්තයක් අල්ලගෙන බොරුවට රණ්ඩු කරනවා."

"එයාලා ඕක නතර කරලා දායි," ඇනබෙත් කිවුවා. "ක්ලැරිස් ඒක තේරුම් ගනී."

මට නම් ඒ ගැන ඒ හැටි විශ්වාසයක් දැනුනේ නැහැ. මොකද මම දැනගෙන හිටපු ක්ලැරිස් එහෙම කෙනෙක් නෙවෙයි.

මම තව වාර්තා කීපයක් කියවා බැලුවා, ඒ අතරේ ම අපි තව කැබින් කීපයක පිරික්සුම් කළා. ඩිමීටර් කැබිනයට ලකුණු හතරක් ලැබුණා. හෙෆාස්ටස් කැබිනයට ලකුණු තුනයි, හරි නම් එයාලගේ ලකුණු ගාණ ඊටත් වඩා අඩු විය යුතු වුණත්, බෙකන්ඩොර්ෆ් නැති වීමත් සමඟ එයාලා මූණ දී සිටි තත්ත්වය ගැන හිතලා අපි එයාලට බුරුලක් දුන්නා. හර්මීස්ට ලකුණු දෙකයි, ඒක නම් කොහෙත්ම

පුදුමයක් නෙවෙයි. තමන්ගේ දේවමය මව්පියන්ව නොදන්නා හැම කඳවුරුකරුවෙක්ව ම දම්මේ හර්මීස් කැබිනයටයි. ඒ වගේම දෙවිවරු කියන්නේ අමතකවනසුලු ජාතියක් නිසා, ඒ කැබිනය නිතර ම තිබුණේ සෙනඟ පිරිලා තදබද වෙලයි.

අන්තිමේ දී අපි ඇතීනා කැබිනයට ආවා. හැමදාමත් වගේ එදත් ඒක පිළිවෙළට පිරිසිදුවට තිබුණා. රාක්කවල පොත් පිළිවෙළකට අඩුක් කරලා. කැබින් ලාංඡනය ඔප දමලා. යුද සිතියම් සහ සැලසුම් පිටපත්වලින් බිත්ති සරසලා. හැඩි වී තිබුණේ ඇනබෙත්ගේ ඇඳ විතරයි. එය පුරා කඩදාසි විසිරිලා, එයාගේ රිදී පාට ලැප්ටොප් පරිගණකය තවමත් ක්‍රියාත්මකව තිබුණා.

"ව්ලාකාස්," ඇනබෙත් කෙඳිරුවා. සරලව කියනවා නම් ග්‍රීක භාෂාවෙන් තමන්ට ම මෝඩයා කියාගන්නෙ එහෙමයි.

එයාගේ අනුනායක, මැල්කම් හිනාවක් මැඩගත්තා. "ඔව්, මේ... අපි අනිත් හැම දෙයක්ම අස් කළා. ඔයාගේ සටහන් එහෙ මෙහෙ කරාට කමක් නැද්ද කියලා හිතාගන්න බැරි වුණා."

මං හිතන්නේ ඒක නම් මොළේ ඇති වැඩක්. ඇනබෙත් රාක්ෂයින් සහ එයාගේ දේවල් අදින මිනිස්සු වෙනුවෙන් පාවිච්චි කරන්න වෙන ම ලෝකඩ පිහියක් තියාගෙනයි හිටියේ.

මැල්කම් මට දත් නියෙව්වා. "ඔයාලා සෝදිසිය ඉවර කරනකල් අපි එළියට වෙලා ඉන්නම්කෝ." ඇනබෙත් එයාගේ ඇඳ අස් කරන අතරේ මුළු ඇතීනා කැබිනය ම දොරෙන් එළියට ගියා.

මම නොසන්සුන්ව එහා මෙහා වෙමින්, වාර්තා කිහිපයක් කියවන බව බොරුවට ඇඟෙව්වා. කඳවුරු නීතිවලට අනුව නම්, විරුද්ධ ලිංගික කඳවුරුකරුවෝ දෙන්නෙකුට... පිරික්සුමක් අතරේදිවත් තනියම කැබිනයක් ඇතුළේ ඉන්න තහනම්.

සිලේනා සහ බෙකන්ඩොර්ෆ් අතරේ සම්බන්ධය පටන් ගත්තට පස්සේ ඒ නීතිය සෑහෙන වතාවක් උඩට මතු වී තිබුණා. ඒ වගේම මම දන්නවා ඔයාලා සමහරු හිතනවා ඇති, උප දෙවිවරු හැමෝම දේවමය පැත්තෙන් එකිනෙකාට ඥාතීන් වෙනවා නේද, ඉතින් එතකොට එයාලා අතරේ ආදර සම්බන්ධයක් පටන් ගන්න එක අශික්ෂිත දෙයක් නෙවෙයි ද? කියලා. ඒත් කාරණේ මේකයි, උත්පත්තිය ගැන කතා කරද්දී, දෙවිවරුන්ට ඩී.එන්.ඒ නැති නිසා අපේ පවුල්වල දේවමය පැත්ත ගැන සලකන්නෙ නැහැ. උප දෙවියෙක් කිසිම වෙලාවක



තමන්ගේ දේවමය අම්මාට හෝ තාත්තාට දාව ඉපදුණු තවත් කෙනෙක් සමඟ සම්බන්ධයක් පටන් ගන්න හිතන්නෙවත් නැහැ. උදාහරණයකට ඇතීනා කැබිනයේ ළමයි දෙන්නෙක් වගේ? කොහෙත්ම නැහැ. හැබැයි ඇෆ්‍රෝඩයිට්ගේ දුවෙක් සහ හෙෆාස්ටස්ගේ පුතෙක්? එයාලා අතරේ නෑකමක් නැහැ. ඒ නිසා ඒක ප්‍රශ්නයක් නෙවෙයි.

කොහොම හරි, මොකක්දෝ අමුතු හේතුවකට ඇනබෙත් දිහා බලා ඉන්න අතරේ මම සිතමින් සිටියේ මේ ගැනයි. එයා ලැප්ටොප් පරිගණකය වසා දමා කෙලින් වුණා. ඒක ගිය ගිම්හානයේ එයාට ඩෙඩලස්ගෙන් තෑග්ගක් විදිහටයි ලැබුණේ.

මම උගුර පෑදුවා. "ඉතින්... ඒකෙන් වටින කියන තොරතුරු මොනවත් ලැබුණ ද?"

"මහ ගොඩක්," එයා කිවුවා. "ඩෙඩලස්ට කොච්චර අදහස් තිබිල ද කියනවා නම්, ඒවා ඔක්කොම තේරුම් ගන්න විතරක් මට තව අවුරුදු පනහක් විතර යයි."

"ඔව්," මම කෙඳිරුවා. "ඒක නම් ජොලි වැඩක් වෙයි."

එයා විසිරී තිබුණු කඩදාසි එකට එකතු කළා- ඒවායින් වැඩි ප්‍රමාණයක් ගොඩනැගිලිවල සිතුවම් සහ අතින් ලියූ සටහන්. කවදාහරි දවසක එයා වාස්තු විද්‍යාඥයෙක් වෙන්න බලාපොරොත්තුවෙන් ඉන්න බව මම දැන සිටියා. ඒ වුණත් එයා කරමින් සිටින වැඩ ගැන නො අසා ඉන්න තරම් මම පාඩම් ඉගෙන ගෙනයි හිටියේ. ඒ ගැන ඇහුවොත් එයාගෙන් එක එක කෝණ ගැනයි, භාරය දරන සන්ධි ගැනයි මට කන් දෙක පිරෙන්න අහගන්න පුළුවන්.

"ඔයා දන්නවා නේ..." එයා කලබලෙන් ඉන්න වෙලාවට කරනවා වගේ කෙස් රොදක් කන පිටුපසට තල්ලු කළා. "බෙකන්ඩොර්ෆුයි සිලේනයි අතරේ සිද්ධ වෙච්ච දේවල්. ඒකෙන් එක විදිහකට... වඩාත් වැදගත් දේ ගැන මට හිතන්න සැලැස්සුවා. තමන්ට ගොඩක් වැදගත් අයව නැති කරගන්න එක ගැන."

මම ඔළුව වැනුවා. මගේ මොළේ පුංචි පුංචි අහඹු විස්තර එකතු කරන්න පටන්ගෙන තිබුණා- හරියට, ඇනබෙත් තවමත් එයාගේ මොළේ වැඩි යුද ඉතිහාස මහාචාර්ය තාත්තාගෙන් ලැබුණු බකමූණු හැඩේ කරාබු දෙක පැලඳගෙන ඉන්න බව වගේ දේවල්.

"අර්ම්, ඔව්," මම ගොත ගැහුවා. "හරියට... ඔයාගේ පවුලේ අයත් එක්ක හැමදේම හොඳින් ද?"

Scanned with CamScanner

හරි ඉතින්, ඒක මහ මෝඩ ප්‍රශ්නයක් තමයි. ඒ වුණාට මම හිටියේ කලබල වෙලා නේ.

ඇනබෙත්ගේ මූණට බලාපොරොත්තු කඩවුණ පෙනුමක් ආවා, ඒත් එයා ඔළුව වැනුවා.

"මේ ගිම්හානේ මාව ග්‍රීසියට එක්ක යන්න මගේ තාත්තට ඕනෑ වුණා," එයා කිවුවේ ආසාවෙන් වගෙයි. "මට ඉස්සර ඉඳල ම ඕනෑ කරලා තිබුණේ-"

"පාර්තෙනන් බලන්න යන්න," මට මතක් වුණා.

එයා යාන්තමින් හිනාවක් පෑවා. "ඔව්."

"ඒකට කමක් නෑ. ඉස්සරහට තව ගිම්හාන තිවාඩු එයිනේ, නේද?"

ඒක කටින් පිටවූ හැටියේ ම, ඒක කොච්චර ගොන් කතාවක් ද කියලා මට තේරුම් ගියා. මම මූණ දෙමින් හිටියේ මගේ අන්තිම දවස් ටිකටයි. තව සතියක් ඇතුළත, ඔලිම්පස් බිඳ වැටෙන්න ඉඩ තිබුණා. දෙවිවරුන්ගේ යුගය ඇත්තට ම අවසන් වුණොත්, අපි දන සිටි ලෝකය අවුල් ජාලයක් තුළ දියවෙලා යාවි. උප දෙවිවරුන්ව වද වෙලා යන තුරු දඩයම් කරාවි. අපිට තවත් ගිම්හානයක් උදා නොවේවි.

ඇනබෙත් එයාගේ පිරික්සුම් ලේඛනය දිහා බලා සිටියා. "පහෙන් තුනයි," එයා කෙඳිරුවා, "කිසිම පිළිවෙළක් නැති ප්‍රධාන උපදේශකට. එන්න යමු. අපි ඔයාගේ වාර්තා ටික ඉවර කරලා කයිරොන්ට ගිහින් දෙමු."

මහ ගෙදරට යන මඟ දී අපි අන්තිම වාර්තාවත් කියෙව්වා. ඒක මේපල් කොළයක ලියා එවා තිබුණේ කැනඩාවේ සිටි සැටර් කෙනෙක්. පුළුවන්කමක් තිබුණා නම්, ඒ සටහන දැකලා මගේ තත්ත්වය තිබුණාටත් වඩා නරක අතට හැරුණා.

"'දයාබර ග්‍රෝවර්,'" මම එය හඬ නගා කියෙව්වා. "ටොරන්ටෝවට පිටත කැලෑවට යෝධ යක්ෂ බැජරයෙක් පහර දුන්නා. ඔයා කියපු විදිහට පැන්ගේ බලය කැඳවන්න උත්සාහ කළා. ප්‍රතිඵලයක් නැහැ. රුක් දෙවිවරු බොහෝමයකගේ ගස් විනාශ වුණා. ඔටාවාවලට පහු බහිමින් සිටිනවා. කරුණාකර උපදෙසක් ලබා දෙන්න. ඔයා කොහෙද? ග්ලීසන් හෙජ්, රැකවල්කරු.'"



ඇනබෙත්ගේ මුහුණ වේදනාවෙන් ඇකිළුණා. "ඔයාට එයා ගැන කිසිම ආරංචියක් ලැබුණෙ නැද්ද? ඔයාගේ සහකම්පන සම්බන්ධයෙන්වත්?"

මම දුර්මුඛව ඔළුව හෙල්លුවා.

පහුගිය ගිම්හානයේ පැන් මිය ගියාට පස්සේ ඉඳලා ම අපේ යාළුවා ග්‍රෝවර් ඈතින් ඈතට යන්න ගත්තා. විදාරිත වැඩිහිටියන්ගේ මණ්ඩලය එයාට සැලකුවේ පිටස්තරයෙකුට වගෙයි. ඒ වුණත් ග්‍රෝවර් තවමත් නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශ පුරා සැරිසරමින්, පැන්ගේ අවසන් උපදෙස ප්‍රචාරය කරමින්, ඉතිරිව ඇති කුඩා වන ලැහැබ් රැක ගැනීම සඳහා සොභාවික බලවේගයන් පොලඹවා ගනිමින් සිටියා. එයා කඳවුරට දෙතුන් වතාවක් ඇවිත් තිබුණේ එයාගේ පෙම්වතිය, ජුනිපර්ව බලලා යන්න විතරයි.

අන්තිමට මට අහන්න ලැබුණේ එයා මධ්‍යම උද්‍යානයේ රුක් දෙවිවරුන්ව සංවිධානය කරමින් සිටි බවයි. ඒත් දැන් මාස දෙකකින් කාටවත් ම එයාව දකින්න හෝ එයා ගැන අහන්න ලැබී තිබුණේ නැහැ. අපි එයාට අයිරිස්-පණිවුඩ යවන්න උත්සාහ කළා. ඒවා එකක්වත් එයා වෙතට ළඟා වුණේ නැහැ. මාව ග්‍රෝවර්ට සම්බන්ධ වෙන සහකම්පන සම්බන්ධයක් තිබුණු නිසා, එයාට මොකක් හෝ නපුරක් සිදු වුණොත් මට දැනෙයි කියලා මම බලාපොරොත්තු වුණා. වතාවක් ග්‍රෝවර් මට කිවුවේ එයා මැරුනොත්, සහකම්පන සම්බන්ධය මාවත් මරා දමන්න පුළුවන් කියලයි. ඒත් ඒක තවමත් එහෙමද කියලා නම් මට විශ්වාසයක් තිබුණේ නැහැ.

එයා තවම මැන්හැටන්වල ඉන්නව ඇති ද හිතලා මම පුදුම වුණා. ඒ වෙලාවේ මට සිහිනයෙන් දකින්න ලැබුණු රේචල්ගේ සිතුවම මතක් වුණා- නගරය වටා අඳුරු වලාකුළු රොක් වෙන හැටි, එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල පාමුල හමුදාවක් රැස් වී සිටි හැටි.

"ඇනබෙත්." මම එයාව ක්‍රීඩා පිටිය මැද නවතා ගත්තා. මම මේ කරන්න යන්නේ ඉල්ලගෙන කෑමක් බව තේරුණත්, මේ සම්බන්ධයෙන් වෙන කාව විශ්වාස කරන්න ද කියලා මම දැනගෙන හිටියේ නැහැ. ඒ වගේම, උපදේශයක් ඕනෑ වුණ හැම වෙලාවක ම මම යැපුණේ ඇනබෙත් මතයි. "අහන්න, මම අමුතු හීනයක් දැක්කා, මේ, රේචල් ගැන..."

මම එයාට මුළු හීනය ම, ලූක් පොඩි කාලේ චිත්‍රය ගැන පවා කිවුවා.

සෑහෙන වෙලාවක් යන තුරු එයා නිහඬව සිටියා. ඊට පස්සේ එයා පිරික්සුම් ලේඛනය කොයි තරම් තදින් එතුවා ද කියනවා නම් ඒක ඉරුණා. "දැන් මම ඔයාට මොනවද කියන්න ඕනෑ?"

"මන්දා. මම දන්න හොඳ ම උපාය දක්ෂයා තමයි ඔයා. ඔයා ක්‍රෝනොස් වෙලා මේ යුද්දෙ සැලසුම් කරමින් හිටියොත්, ඊළඟට ඔයා මොනවද කරන්නේ?"

"මම හතුරු අවධානය වෙන පැත්තකට හරවන්න ටයිපූන්ව යොදවනවා. ඊට පස්සේ, දෙවිගොල්ලෝ හැමෝම බටහිරට ගිහින් ඉන්න අතරේ කෙලින් ම ඔලිම්පස්වලට පහර දෙනවා."

"හරියට ම රේචල්ගේ චිත්‍රේ තිබුණා වගේ."

"පර්සී," එයා කිවුවේ තද වුණු හඬින්. "රේචල් කියන්නේ නිකං ම මනුෂ්‍ය කෙල්ලෙක් විතරයි."

"ඒ වුණාට එයාගේ හීන ඇත්ත නම්? අර අනිත් ටයිටන්ලා- එයාලා කිවුවේ ඔලිම්පස් දවස් ගාණක් ඇතුළත විනාශ වෙනවා කියලා. එයාලා ළඟ තව අභියෝග ඕනෑ තරම් තියෙනවා කියලා එයාලා කිවුවා. එතකොට අර ලූක් පුංචි කාලේ රූපෙ මොකක්ද-"

"අපිට තියෙන්නේ කොයිකටත් ලෑස්ති වෙලා ඉන්න එක විතරයි."

"කොහොමද?" මම ඇහුවා. "බලන්න අපේ කඳවුර දිහා. අපිට එකාට එකා රණ්ඩු කරගන්න එකවත් නතර කරන්න බැහැ. ඒ මදිවට දැන් මගේ ආත්මෙ නෙළා ගන්නකල් මට බලන් ඉන්න වෙලා."

එයා රෝල් කළ ලේඛනය බිමට දමා ගැහුවා. "මං දැනගෙන හිටියා ඔයාට අනාවැකිය පෙන්නන්න හොඳ නැහැ කියලා." එයා කතා කළේ කේන්තියෙන් සහ රිදුණු හඬින්. "ඒකෙන් සිද්ධ වුණ එක ම දේ ඔයා බය වෙච්චි එක විතරයි. ඔයා බය වුණා ම කරන්නේ දේවල්වලින් පැනලා දුවන එකයි."

මම එයා දිහා බලා සිටියේ මුළුමනින්ම පුදුමයෙන් තිගැස්සිලයි. "මම? පැනලා දුවනවා?"

එයා එක එල්ලේ මගේ මූණට එබුණා. "ඔව්, ඔයා. ඔයා මහ බයගුල්ලෙක්, පර්සි ජැක්සන්!"



අපි පොර කුකුල්ලු දෙන්නෙක් වගේ මූණෙන් මූණ බලාගෙන හිටියා. එයාගේ ඇස් රතු වෙලා තිබුණා. එක්වර ම මට තේරුම් ගියේ එයා මට බයගුල්ලා කියලා කතා කරද්දී, සමහරවිට එයා කියමින් ඉන්න ඇත්තේ අනාවැකිය ගැන නෙවෙයි කියලයි.

"අපිට තියෙන අවස්ථාවලට ඔයා කැමති නැත්නම්," එයා කිවුවා, "ඔයාට තිබුණේ රේචල් එක්ක අර නිවාඩුවට යන්න නේ."

"ඇනබෙත්-"

"ඔයා අපිත් එක්ක ඉන්න අකමැති නම්."

"ඒක සාධාරණ නැහැ!"

එයා මාව තල්ලු කරගෙන අඩි හප්පමින් ස්ට්‍රෝබෙරි යාය දිහාවට ගියා. යන මඟ තිබූ බෝලයකට එයා පයින් ගැසූ වේගයට ඒක එක තැන කැරකුණා.

★★★

එතැනින් පස්සේ මගේ දවස වඩාත් හොඳ අතට හැරුණා කියලා ඔයාට කියන්න මම කැමතියි. ඒත් ඇත්ත වශයෙන් ම එහෙම වුණේ නැහැ.

එදා හවස් වරුවේ අපිට බෙකන්ඩොර්ෆ්ගේ පාංශුකූලය ආදාහනය කරලා, අවසන් සමුදීම් කරන්න කඳවුරු ගිනිමැලය අසලට රැස් වෙන්න සිදු වුණා. ඒරිස් සහ ඇපලෝ කැබින් දෙක පවා ඒකට සහභාගී වෙන්න තාවකාලික සටන් විරාමයකට ඇවිත් තිබුණා.

බෙකන්ඩොර්ෆ්ගේ සළුව යුද ආරක්ෂක ඇඳුමක් වගේ ලෝහ පුරුක් එකට ඈඳා සාදා තිබුණා. ඒක පුළුස්සන්නේ කොහොමද කියලා මට තේරුම් ගන්න බැරි වුණත්, ඒක කරන්න ඉරණමේ උදවු ලැබෙන්න ඇති. ගිනි දළු මැද දිය වූ ලෝහය රන් පාට දුමකට හැරී අහසට නැඟුණා. සෑමවිට ම කඳවුරුකරුවන්ගේ චිත්ත ස්වභාවය පෙන්නුම් කරන කඳවුරු ගිනි මැලයේ ගිනි දළු අද තිබුණේ කළු පාටට හැරිලයි.

බෙකන්ඩොර්ෆ්ගේ ආත්මය ස්වර්ගයට යාවි කියලා මම බලාපොරොත්තු වුණා. සමහරවිට එයා නැවත උපදින්න තෝරාගෙන, ඒ ජීවිත තුනේදිත් නැවත ස්වර්ගයට යන වැඩ කරලා, අන්තිම ආත්මයේ දී ආශිර්වාදිතයින්ගේ දූපත්වලට වරම් ලබා ගනීවි. ඒක තමයි පාතාල ලෝකේ උසස් ම අයගේ මූලස්ථානය. එතැනට යෑමේ සුදුසුකම් ලබන අය හිටියා නම්, බෙකන්ඩොර්ෆ් එයින් කෙනෙක්.

ඇනබෙත් මට වචනයක්වත් නොකියා යන්න ගියා. කදවුරුකරුවන්ගෙන් බොහෝමයක් දෙනා තම තමන්ගේ හවස් වරුවේ ක්‍රියාකාරකම් සඳහා විසිරී ගියා. මම එතැනට වී සිටගෙන නිවී යන ගිනි දලු දිහා බලා සිටියා. ළඟපාත තැනක වාඩි වී සිලේනා අඬද්දී, ක්ලැරිස් සහ එයාගේ පෙම්වතා ක්‍රිස් රොඩ්‍රිගස් එයාව සනසන්න උත්සාහ කරමින් සිටියා.

අන්තිමේ දී එයාලා අසලට යන්න තරම් ධෛර්යයක් උපදවා ගන්න මට හැකි වුණා. "හේයි, සිලේනා, මට ඇත්තටම ගොඩාක් කණගාටුයි."

එයා නහය ඉහළට ඇද්දා. ක්ලැරිස් මගේ දිහාවට රවා බැලුවා. ඒත් ඉතින් එයා හැමෝම දිහා බලන්නෙ එහෙමනේ. ක්‍රිස් මගේ දිහා බැලුවේ ම නැති තරම්. පහුගිය ගිම්හානයේ දී ක්ලැරිස් එයාව වංගගිරියෙන් බේරගන්න කලින් එයා හිටියේ ලූක්ගේ පැත්තට එකතු වෙලයි. ඉතින් මං හිතන්නේ එයාට ඒ ගැන තවමත් වරදකාරී හැඟීමක් දැනෙන්න ඇති.

මම උගුර පෑදුවා. "සිලේනා, ඔයා දන්නවා නේ, බෙකන්ඩොර්ෆ් ඔයාගේ පින්තූරයක් අරගෙන ගියා. අපි සටනට යන්න චුට්ටකට කලින් එයා ඒක එළියට අරන් බැලුවා. එයාට ඔයා ගොඩක් වටින කෙනෙක්. ඔයා පහුගිය අවුරුද්ද එයාගේ ජීවිතේ හොඳ ම කාලේ කරලා තිබුණා."

සිලේනා ඉකි ගැසුවා.

"ඔය කෙරුවේ වැඩක්," ක්ලැරිස් කෙඳිරුවා.

"නෑ, ඒකට කමක් නෑ," සිලේනා කිවුවා. "ස්තූතියි... ඔයාට ස්තූතියි, පර්සි. මම දැන් යන්න ඕනෑ."

"ඔයාගේ තනියට එන්ඩ ද?" ක්ලැරිස් ඇහුවා.

ඔළුව සෙලවූ සිලේනා එතැනින් දිවුවා.

"පිටට පේනවට වඩා එයාගේ හිත හයියයි," ක්ලැරිස් කොඳුරා කිවුවේ එයාට ම වගෙයි. "එයා පණ නහගන්නැතුව ඉඳියි."

"ඔයාට ඒකට උදවු කරන්න පුළුවන්," මම යෝජනා කළා. "අපිට සටන් කරන්න උදවු කරලා ඔයාට පුළුවන් බෙකන්ඩොර්ෆ්ගේ මතකයට උපහාර කරන්න."



ක්ලැරිස් එයාගේ පිහියට අත යැවූවත් ඒක තව දුරටත් එතැන තිබුණේ නැහැ. එයා ඒක මහ ගෙදර පින්ග් පොන්ග් මේසය මැදට ගහලයි තිබුණේ.

"ඒක මගේ ප්‍රශ්නයක් නෙවෙයි," එයා ගෙරෙව්වා. "මගේ කැබින් එකට ගෞරවය ලැබෙන්නෙ නැත්නම්, මම සටන් කරන්නෑ."

එයා කතා කරන්නේ කවි පදවලින් නෙවෙයි කියලා මට තේරුණා. සමහරවිට එයාගේ කැබිනයේ අයව ශාපයට ලක් වෙද්දී එයා ඒ කිට්ටුව ඉන්න නැතුව ඇති, එහෙමත් නැත්නම් සමහරවිට ඒ ශාපයේ මායාව බිඳින්න එයා ළඟ ක්‍රමයක් තියෙන්න ඇති. ඇඟ පුරා පැතිරී ගිය හිරියක් සමඟ, මට හිතුණේ කඳවුරේ ඉන්න ක්‍රෝනොස්ගේ ඔත්තුකරුවා ක්ලැරිස් වෙන්න පුළුවන් ද කියලයි. එයා එයාගේ කැබිනයේ අයව සටනින් ඈත් කරලා තියාගෙන ඉන්නේ ඒ නිසා ද? ඒත් මම ක්ලැරිස්ට කොයි තරම් අකමැති වුණත්, ටයිටන්වරු වෙනුවෙන් ඔත්තු බලන එක එයාගේ ගතියක් නෙවෙයි කියලා මම දැනගෙන හිටියා.

"හරි එහෙනම්," මම එයාට කිවුවා. "මට මේක කියන්න ඕනෑ වුණේ නැහැ, ඒ වුණාට ඔයා මට ණයයි. මම නොහිටින්න ඔයා තාමත් රාක්ෂ සයුරේ සයික්ලොප්ස් ගුහාව අස්සේ කුණු වෙවී ඉන්න තිබුණා."

එයා දත්මිටි කෑවා. "වෙන ඕනෑ උදවුවක් ඉල්ලන්ඩ, පර්සි. මේක නම් බැහැ. ඒරීස් කැබින් එකට සෑහෙන වතාවක් සමච්චල් වෙලා තියෙනවා. ඔහේ හිතන්නෙ මිනිස්සු මගේ පිටිපස්සට කියන දේවල් මම දන්නෑ කියල ද?"

'හරි ඉතින්, ඒවා ඇත්ත නේ.' කියලා කියන්න මගේ කටට ආවත් මම දිව හපාගත්තා.

"එතකොට, මොකක්ද- ක්‍රෝනොස්ට අපිව පොඩි කරලා දාන්න ඇරලා ඔයා නිකං ම බලන් ඉන්න ද යන්නේ?" මම ඇහුවා.

"ඔහේට ඔච්චර තදට මගේ උදවු ඕනෑ නම්, අපිට කරත්තේ දෙන්ඩ කියලා ඇපලෝලට කියනවා."

"ඔයා නම් පොඩි බබෙක් වගේ."

එයා මට පහර දෙන්න පැන්නා, ඒත් ක්‍රිස් අපි දෙන්නා අතරට ආවා. "හෝව්, ඔය දෙන්නා," එයා කිවුවා. "ක්ලැරිස්, ඔයා දන්නවා නේ, සමහරවිට එයා කියන දේත් ඇත්ත."

Scanned with CamScanner

ක්ලැරිස් එයාව කන්න වගේ බැලුවා. "ඔයත් පටන් ගත්ත ද?"

එයා අඩි හප්පමින් එතැනින් යද්දී ක්‍රිස් එයා පස්සේ දිවුවා. "හේයි, ඔහොම පොඩ්ඩක් ඉන්න! මම කියන්න හැදුවේ- ක්ලැරිස්, නවතින්නකෝ!"

බෙකන්ඩොර්ෆ්ගේ ගිනිමැලයේ අවසන් ගිනි පුපුරු සැඳෑ අහසට ඇදී යනවා මම බලා සිටියා. ඊට පස්සේ මම කඩු හරඹ පිටිය පැත්තට යන්න හැරුණා. මට විරාමයකුත්, ඒ වගේම මගේ පරණ යාළුවෙක්ව බලන්නත් ඕනෑ වෙලයි තිබුණේ.

# 05

## මම මගේ බැල්ලව ගහක් ඇතුළට පැන්නුවා

මම මිසිස් ඕ'ලෙරීව දකින්නත් කලින් ම එයා මාව දකලා තිබුණා, කුණු ලොරියක් විතර ඇඟක් ඇති කෙනෙක් හැටියට ඒක සෑහෙන හපන්කමක්. මම කඩු හරඹ පිටියට ඇතුළු වෙද්දි ම, කළු පාට තාප්පයක් ඇවිත් මගේ ඇඟේ හැප්පුණා.

"වූෆ්!"

ඊළඟට මට තේරුණේ පොළවට සමතලා වුණ මගේ පපුව උඩ සද්දන්ත බලු අතක් ඇති බව සහ අති විශාල වළං මදින බුරුසුවක් වගේ දිවක් මගේ මූණ ලෙව කන බවයි.

"ඌයි!" මම කිවුවා. "හේයි, කෙල්ලේ. ඔයාවත් දකින්න ලැබුණට සතුටුයි. ඌයි!"

මිසිස් ඕ'ලෙරීව සන්සුන් කරලා, මගේ ඇඟ උඩින් ඉවත් කරගන්න මට විනාඩි තුන හතරක් ගියා. ඒ වෙද්දී මම බලු කෙළවලින් හොඳට ම නැහැවිලයි හිටියේ. එයාට අල්ලන සෙල්ලම් කරන්න ඕනෑ වුණ නිසා, මම ලෝකඩ පලිහක් අහුලගෙන එය පිටිය හරහා විසි කළා.

ඇත්ත ම කියනවා නම්, මිසිස් ඕ'ලෙරී තමයි මේ ලෝකෙ හිටපු එක ම මිත්‍රශීලී යම බැල්ල. එයාගේ පරණ අයිතිකාරයා මිය ගියාට පස්සේ එයාගේ අයිතිය මට උරුම වුණා. එයා ජීවත් වුණේ කඳවුරේයි. ඒත් බෙකන්ඩොර්ෆ්... මෙහෙමයි. මම කඳවුරේ නැති වෙලාවට එයාව බලාගත්තේ බෙකන්ඩොර්ෆ්. මිසිස් ඕ'ලෙරීගේ ප්‍රියතම ලෝකඩ හපන

කටුව හදලා දීලා තිබුණේ එයායි. ඒ වගේම එයා මිසිස් ඕ'ලෙරීට පුංචි හිනා මූණු තියෙන කර පටියකුත්, එකිනෙක හරස් කළ ඇටකටු දෙකක හැඩයේ නම්පතකුත් හදලා දීලා තිබුණා. මගෙන් පස්සේ මිසිස් ඕ'ලෙරීගේ හොඳම යාළුවා වෙලා හිටියේ එයායි.

ඒ ගැන හිතද්දි මගේ හිතේ තිබුණු දුක ආයෙමත් අලුත් වුණා, ඒ වුණත් මිසිස් ඕ'ලෙරී බල කරපු නිසා මම තව හතර පස් වතාවක් එයාට අල්ලන්න පලිහ විසි කළා.

නොබෝ වේලාවකින් ම එයා බුරන්න පටන් ගත්තේ හරියට එයාට ඇවිදින්න යන්න ඕනෑ වෙලා වගෙයි- ඒ හඬ කාලතුවක්කුවක හඬට වඩා චුට්ටයි වැඩියි. එයා කඩු හරඹ පිටියේ වැසිකිළි යෑම අනෙක් කඳවුරුකරුවෝ නම් හිනා යන විහිළු වැඩක් කියලා හිතුවේ නැහැ. ඒකෙන් අවාසනාවන්ත ලිස්සා වැටීමේ අනතුරු එකකට වඩා සිද්ධ වෙලා තිබුණා. ඒ නිසා මම කඩු හරඹ පිටියේ ගේට්ටුව විවෘත කළා, ඒත් එක්කම මිසිස් ඕ'ලෙරී එක එල්ලේ කැලෑව තුළට පැන දිවුවා.

මම එයා පසුපස දිවුවත්, එයා මට වඩා වේගයෙන් ඉදිරියට යෑම ගැන මම වැඩිය කරදර වුණේ නැහැ. මිසිස් ඕ'ලෙරීට තර්ජනයක් විය හැකි කිසිම දෙයක් මේ කැලෑවේ තිබුණේ නැහැ. අඩු තරමේ මකරුන් සහ යෝධ ගෝනුස්සන් පවා එයා ළඟට එද්දී පැනලා දිවුවා.

අන්තිමේ දී මට එයාව හොයාගන්න ලැබෙද්දි එයා හිටියේ උවමනාකම් ඉටු කරගනිමින් නෙවෙයි. වතාවක් විදාරිත වැඩිහිටියන්ගේ මණ්ඩලය ග්‍රෝවර්ගේ නඩු විභාගය පැවැත්වූ හුරු පුරුදු එළිමහන් බිමට එයා ගොස් සිටියා. එතැන ඒ හැටි හොඳ පෙනුමක් තිබුණේ නැහැ. තණ පඳුරු කහ පාටට හැරිලා. පඳුරු කපා හැඩ ගන්වා තිබුණු සිංහාසන තුනේ කොළ සියල්ල හැලිලා. ඒත් මාව පුදුමයට පත් කළේ ඒවා නෙවෙයි; එළිමහන් බිම මැද හිටපු, මට මේ තාක් කාලයකට දකින්න ලැබුණු අමුතු ම තුන්කට්ටුවයි: ජුනිපර් නම් රුක් දෙවඟන, නිකෝ ඩි ආන්ජෙලෝ සහ සෑහෙන වයසක, තඩි සැටර් කෙනෙක්.

මිසිස් ඕ'ලෙරීගේ ආගමනයෙන් භීතියට පත්වුණ වගක් නොපෙන්වූ එක ම කෙනා නිකෝයි. එයාගේ පෙනුම මම හීනයෙන් දැක්කා වගේමයි- ගගන යාත්‍රිකයන්ගේ ජැකට්ටුවකින්, කළු කලිසමකින් සහ නටන ඇටසැකිලිවල රූපයක් ඇති ටී-ෂර්ට් එකකින් සැරසිලා. එයාගේ ස්ටයිජියන් යකඩ කඩුව පැත්තකින් එල්ලගෙන. එයාට තවම



අවුරුදු දොළහයි, ඒත් එයාගේ පෙනුම ඊට වඩා සෑහෙන වියපත් සහ දුක්බර වුණා.

මාව දැක්කා ම ඔළුව වැනූ එයා ආපහු මිසිස් ඕ'ලෙරීගේ කන් දෙක අතර අතගාන්න පටන් ගත්තා. මිසිස් ඕ'ලෙරී එයාගේ කකුල් ඉව කර බැලුවේ හරියට මස් කටුවලට පස්සේ දකින්න ලැබුණ වඩාත් ම කුතුහලය දනවන දේ ඒ දෙක වගෙයි. හේඩීස්ගේ පුතා වුණු එයා සමහරවිට හැම ආකාරයක ම යම බලු-හිතකාමී තැන්වලට සංචාරය කරලා තියෙන්න ඇති.

ඒත් නාකි සැටර් නම් ඒ තරම් සතුටු වුණ බවක් පෙනුනේ නැහැ. "කවුරු හරි- මේ පාතාල ලෝකෙ සතා මගේ කැලෑවෙ මොනවද කරන්නේ!" එයා අත් දෙක වනමින් කුර මත එහා මෙහා වුණේ හරියට තණ කොළවලට කකුල් පිච්චෙනවා වගෙයි. "ඔහෙත් මෙතැන ද, පර්සි ජැක්සන්! මේ සතා ඔහේගෙ ද?"

"සමා වෙන්න, ලෙනෙයස්," මම කිවුවා. "ඒක නේද ඔයාගේ නම?"

සැටර් ඇස් කැරකුවා. එයාගේ ලොම් දූවිලි අළු පාටට හැරිලා, එයාගේ අං දෙක අතරේ මකුළු දැල් බැඳිලා තිබුණා. එයාගේ තඩි බඩ ගෙඩිය බම්පර් කාරයකට නම් නියමයි. "හොඳයි, ඇත්ත වශයෙන් ම මම තමයි ලෙනෙයස්. ඔහේට මෙච්චර ඉක්මනට මණ්ඩලේ සාමාජිකයෙක්ව අමතක වුණා කියලා නම් මට කියන්ඩ එපා. දැන්, ඔහේගෙ තිරිසනාව පැත්තකට ගන්නවා!"

"වූෆ්!" මිසිස් ඕ'ලෙරී සන්තෝසෙන් බිරුවා.

නාකි සැටර් කෙළ පිඬක් ගිල්ලා. "ඒකව අහකට යවනවා! ජුනිපර්, මේ වගේ තත්ත්වයක් යටතේ දී නම් මම ඔයාට උදවු කරන්නෑ!"

ජුනිපර් මගේ දිහාවට හැරුණා. එයා හැඳ සිටි දම් පාට සිනිඳු ඇඳුම සහ එයාගේ එල්ෆියානු මුහුණ එයාගේ දේවමය පෙනුම ඉස්මතු කරා වුණත්, එයාගේ ඇස් දෙක නම් ඇඬීම නිසා හරිතප්‍රදවලින් කොළ පාටට හැරිලයි තිබුණේ.

"පර්සි," එයා නහය ඉහළට ඇද්දා. "මම මේ අහ අහා හිටියේ ග්‍රෝවර් ගැන. මං දන්නවා මොනවා හරි සිද්ධ වෙලා ඇති. එයාට කරදරයක් වෙලා නැත්නම් එයා මෙච්චර කාලයක් නැවිදින් ඉන්නෙ නැහැ. මම හිතුවෙ ලෙනෙයස්-"

Scanned with CamScanner

"මම ඔයාට කිව්වා නේ!" සැටර් විරෝධය පෑවා. "ඒ ද්‍රෝහියාගෙන් ඈත් වෙන තරමට ඔයාට හොඳයි."

ජුනිපර් කකුලක් පොළොවේ ගැසුවා. "එයා ද්‍රෝහියෙක් නෙවෙයි! එයා තමයි මෙච්චර කාලෙකට හිටපු නිර්භීත ම සැටර්. එයා කොහෙද කියලා මට දැනගන්න ඕනෑ!"

"වූෆ්!"

ලෙනෙයස්ගේ දණහිස් ගැහෙන්න ගත්තා. "මේ... මේ යම බල්ලා මගේ නැට්ට ඉව කරද්දී මම උත්තර දෙන්නෑ!"

නිකෝ හිටියේ බොහොම අමාරුවෙන් හිනාව හිර කරගෙන වගෙයි. "මම බල්ලව ඇවිදින්න අරන් යන්නම්," එයා කැමැත්තෙන් ඉදිරිපත් වුණා.

එයා සිවුරුහන් බාද්දි, මිසිස් ඕ'ලෙරී එයා පසුපස ගස් ගොන්නේ ඈත කෙළවරට ගියා.

ලෙනෙයස් තරහෙන් හුස්ම පිඹිමින්, කමිසයේ පැටලී තිබුණු රිකිලි කැබලි පිස දැමුවා. "දැන්, මම කලිනුත් පැහැදිලි කරන්න හැදුවා වගේ, පුංචි නෝනේ, අපි ඔයාගේ බෝයිෆ්‍රෙන්ඩ්ව පිටුවහල් කරන්න ඡන්දේ දුන්නට පස්සෙ ම එයා එක වාර්තාවක්වත් එවලා නැහැ."

"ඔයාලා එයාව පිටුවහල් කරන්න ඡන්දේ දෙන්න උත්සාහ කළා විතරයි," මම එයාව නිවැරදි කළා. "කයිරොන් ඩයනයිසියස් දෙන්නා ඔයාලව නැවැත්තුවා."

"බාහ්! එයාලා මණ්ඩලේ ගරු සාමාජිකයෝ විතරයි. ඒක නියමාකාර ඡන්දයක් නෙවෙයි."

"ඔයා එහෙම කිව්වා කියලා මම ඩයනයිසියස්ට කියන්නම්කෝ."

ලෙනෙයස් සුදුමැලි වුණා. "මං කියන්න හැදුවෙ... මේ බලනවා, ජැක්සන්. මේක ඔහේට අදාළ දෙයක් නෙවෙයි."

"ග්‍රෝවර් කියන්නේ මගේ යාළුවා," මම කිව්වා. "පෑන්ගේ මරණය ගැන එයා ඔයාට කිව්වෙ බොරුවක් නෙවෙයි. මමත් ඒක මගේ ඇස් දෙකට ම දැක්කා. ඔයා ඒ ඇත්ත පිළිගන්න බයයි."

ලෙනෙයස්ගේ තොල් සැලුණා. "නෑ! ග්‍රෝවර් කියන්නේ බොරුකාරයෙක්. එයාගෙන් ගැලවිච්ච එකමයි හොඳ. එයා නැති තරමට අපිට හොඳයි."



මම වේළී ගිය සිංහාසන වෙතට ඇඟිල්ල දිගු කළා. "ඔයා කියන තරම් හොඳට හැමදේම වෙනවා නම්, ඔයාගේ යාළුවෝ කොහෙද? පේන හැටියට ඔයාගේ මණ්ඩලේ ළඟදි රැස්වෙලා නෑ වගෙයි."

"මැරොනුයි සිලේනසුයි... මම... මට විශ්වාසයි එයාලා ආපහු එයි කියලා." එයා කිව්වත් එයාගේ කටහඬේ වූ භීතිය මට හොඳින් ම ඇසුණා. "එයාලා කල්පනා කරන්න පොඩි කාලයක් ගන්නවා විතරයි. මේක හරිම කලබලෙන් පිරිච්ච අවුරුද්දක් වෙලා නෙ තිබුණේ."

"ඒ කලබලේ මීටත් වඩා තව ගොඩක් වැඩි වෙන්නයි යන්නේ," මම දිවුරුවා. "ලෙනෙයස්, අපිට ග්‍රෝවර්ව ඕනෑ. ඔයාගේ මායාවලින් එයාව හොයාගන්න මොකක් හරි ක්‍රමයක් ඇති නේ."

නාකි සැටර්ගේ ඇස් තදින් ගැහුණා. "මම ඔහේට කියන්නේ, මට කිසිම දෙයක් අහන්න ලැබුණේ නැහැ. බාගදා එයා මැරිලා ඇති."

ජුනිපර් ඉකියක් ගිලගත්තා.

"එයා මැරිලා නැහැ," මම කිව්වා. "මට ඒක නම් දැනෙනවා."

"සහකම්පන සම්බන්ධ," ලෙනෙයස් කිව්වේ අවඥාවෙන්. "විශ්වාසෙ තියන්න පුළුවන් දේවල් නෙවෙයි."

"එහෙනම් වටපිටාවෙන් ආරංචි කරලා බලන්න," මම බල කරමින් කිව්වා. "එයාව හොයන්න. යුද්ධයක් ළඟ ළඟ ම එනවා. ග්‍රෝවර් හිටියේ ඒකට සොභාවික බලවේග ලෑස්ති කරවමිනුයි."

"මගේ අවසර නැතුව! ඒ වගේම ඒක අපේ යුද්ධයක් නෙවෙයි."

මම එයාගේ කමිසයෙන් අල්ල ගත්තා. ඇත්තටම මම ඒ විදිහේ වැඩ කරන කෙනෙක් නෙවෙයි, ඒ වුණත් මේ මෝඩ එළු තඩියා මගේ තරහා අවුස්සමිනුයි සිටියේ. "මේ අහනවා, ලෙනෙයස්. ක්‍රෝනොස් පහර දෙන්න පටන් ගත්තා ම, එයා එන්නේ යම බලු රංචුවකුත් අරගෙනයි. එයා එයාගේ පාරේ ඉන්න හැමදෙනාව ම වනසලා දායි-මිනිස්සුන්ව, දෙවිවරුන්ව, උප දෙවිවරුන්ව. ඔහේ හිතන්නේ එයා සැටර්ලට විතරක් යන්න අරියි කියල ද? ඔහේ නායකයෙක් කියලා නේද කියාගන්නේ. එහෙනම් ඒ විදිහට වැඩ කරනවා. මෙතැනින් එළියට ගිහිල්ලා සිද්ධ වෙන්නෙ මොනවද කියලා බලනවා. ග්‍රෝවර්ව හොයාගෙන ගිහින්, ජුනිපර්ට මොකක් හරි ආරංචියක් අරන් එනවා. දැන්, යනවා!"

Scanned with CamScanner

මම එයාව ගොඩක් තදින් තල්ලු කරේ නැහැ. ඒ වුණත් හොඳටෝම බර කෙනෙක් වුණ එයා එයාගේ ලොම් පිරුණු තට්ටම උඩට ඇදගෙන වැටුණා. ඊට පස්සේ අමාරුවෙන් කුර මතට නැගිටගත් එයා තඩි බඩ ගෙඩිය වනමින් එතැනින් දිවුවා. "ග්‍රෝවර්ව ආපහු කවදාවත් බාර ගන්නෙ නෑ! ඒකා පිටුවහලෙක් විදිහට ම මැරිලා යයි!"

එයා පඳුරු අතරින් නොපෙනී ගියාට පස්සේ ජුනිපර් දෑස් පිස දමාගත්තා. "මට සමා වෙන්න, පර්සි. මේකට ඔයාවත් පටලවා ගන්න මම හිතුවෙ නැහැ. ලෙනෙයස් කියන්නෙ තවමත් කැලෑවේ අධිපතියෙක්. එයාව හතුරු කරගන්න එක ඔයාට හොඳ නැහැ."

"ඒක ප්‍රශ්නයක් නෙවෙයි," මම කිවුවා. "තඩි සැටර්ලට වඩා නරක හතුරෝ මට ඉන්නවා."

නිකෝ ආපසු අපි වෙතට ආවා. "නියම වැඩේ, පර්සි. මඟ දිගට වැටිලා තියෙන එළුබෙටි දිහා බැලුවා ම කියන්න පුළුවන් ඔයා එයාව කොච්චර බය කරල ද කියලා."

නිකෝ ඇවිත් ඉන්න හේතුව මම අනුමාන කළා වුණත්, මම හිනාවෙන්න උත්සාහ කළා. "කොහොමද ඉතින්. ඔයා ආවෙ ජුනිපර්ව බලලා යන්න විතර ද?"

එයාගේ මූණ රතු වුණා. "ම්, නෑ. ඒක අහම්බෙන් වුණ දෙයක්. මම... එයාලා කතා කරකර හිටපු තැන මැද්දට කඩා පාත්වුණා වගේ වැඩක් වුණේ."

"එයා අපිව මැරෙන්න බය කළා!" ජුනිපර් කිවුවා. "කෙලින් ම හෙවණැලි අස්සෙන් එළියට ආවේ. ඒත්, නිකෝ, ඔයා නේ හේඩීස්ගේ පුතා. ඉතින් ග්‍රෝවර් ගැන කිසිම දෙයක් අහන්න ලැබුණේ නැහැ කියලා ඔයාට විශ්වාස ද?"

නිකෝ කකුලකින් කකුලකට ඇගේ බර මාරු කළා. "ජුනිපර්, මම ඔයාට කියන්න හැදුවත් වගේ... ග්‍රෝවර් මැරුණත්, එයා සොබාදහමේ වෙන මොකක් හරි දෙයක් විදිහට ආපහු ඉපදෙයි. මට මනුෂ්‍ය ආත්ම මිසක්, ඒ වගේ දේවල් දැනෙන්නෙ නැහැ."

"ඒත් ඔයාට මුකුත් ආරංචි වුණොත්?" නිකෝගේ උරහිස මත අතක් තබමින් එයා බැගෑපත් වුණා. "මොනවා හරි දෙයක්?"

නිකෝගේ කම්මුල් තවත් ටිකක් තද රතු පාටට හැරුණා. "අහ්, ඕනෑ ඔට්ටුවක්. මම හෝදිසියෙන් ඉන්නම්කෝ."



"අපි එයාව හොයාගමු, ජුනිපර්," මම පොරොන්දු වුණා. "ග්‍රෝවර් පණ පිටින් ඉන්නවා, ඒක මට විශ්වාසයි. එයා අපිට කතා නොකර ඉන්න මොකක් හරි සරල හේතුවක් ඇති."

ජුනිපර් නොසතුටු මුහුණින් ඔළුව වැනුවා. "මට මේ කැලෑවෙන් පිටට යන්න පුළුවන්කමක් නැති එක මහ එපා කරපු දෙයක්. එයා කොහේ හරි ඇති, ඒත් මට මෙහෙ බලාගෙන ඉන්න සිද්ධ වෙලා. ඔහ්, ඒ මෝඩ එළුවා මොකක් හරි කරදරයක් කරගෙන නම්-"

පිම්මේ අපි වෙත දුව ආව මිසිස් ඕ'ලෙරීට ජුනිපර්ගේ ඇඳුම ගැන කුතුහලයක් ඇති වී තිබුණා.

ජුනිපර් කෑගැසුවා. "ඔහ්, නෑ. ඕක නම් කරන්නෙපා! බල්ලෝ ගස්වලට කරන දේ ගැන මම දන්නවා. මම ගියා!"

එයා පූෆ්! හඬින් කොළ පාට මීදුමකට හැරුණා. බලාපොරොත්තු කඩ වුණ ලෙස බලා සිටිය මිසිස් ඕ'ලෙරී නිකෝව සහ මාව තනි කර දමා, තවත් මොකකටදෝ කුරුමානම් අල්ලමින් හෙමින් හෙමින් ඉවතට ගියා.

නිකෝ එයාගේ කඩුවෙන් පොළොවට තට්ටු කළා. ඒත් එක්ක ම පස් අතරින් පුංචි සතෙකුගේ ඇටකටු ගොඩක් උඩට මතුවුණා. එකිනෙක ගැට ගැසී ඇටසැකිලි මීයෙක් ලෙස සකස් වූ ඒවා බයෙන් පැන දිවුවා. "බෙකන්ඩොර්ෆ් ගැන අහලා මම ගොඩක් දුක් වුණා."

මගේ උගුරේ ගුළියක් හිර වෙනවා වගෙයි මට දැනුණේ. "ඔයා කොහොමද-"

"මම එයාගේ අවතාරයට කතා කළා."

"ඔහ්... හරි." මේ අවුරුදු-දොළහේ-කොල්ලා පණ ඇති මිනිස්සුන්ට වඩා ආශ්‍රය කරන්නේ මළවුන්ව කියන කාරණයට මම තවමත් හුරුවෙලා හිටියේ නැහැ. "එයා මොනවා හරි කිවුව ද?"

"එයා ඔයාට දොස් කියන්නෙ නෑ. ඔයා ඔයාට ම වධ දෙනවා ඇති කියලා එයා තේරුම් අරන් තිබුණා, ඔයාට එහෙම කරන්න එපා කියලා කිවුවා."

"එයා ආයෙම ඉපදෙන්න උත්සාහ කරන්නෙ නැද්ද?"

නිකෝ ඔළුව හෙල්ලුවා. "එයා ස්වර්ගයේ නැවතිලා ඉන්නේ. එයා කවුදෝ එනකල් බලාගෙන ඉන්නවා කිවුවා. ඒ කතාවෙ තේරුම

Scanned with CamScanner

මොකක්ද කියලා නම් දන්නෙ නැහැ, හැබැයි මැරෙන්න වුණ එක එයාට අවුලක් නැහැ වගෙයි."

ඒක ඒ හැටි සැනසීමක් නොවුණත්, ඒ වෙලාවේ හැටියට එය පවා වටිනා දෙයක් වුණා.

"ඔයා ටැම් කන්දෙ ඉන්නවා මම හීනෙන් දැක්කා-, මම නිකෝට කිව්වා. "ඒක-"

"ඇත්තක්," එයා කිව්වා. "මම ටයිටන්ලගෙ ඔත්තු බලන්න හිතුවෙ නැහැ, ඒ වුණාට මම හිටියේ ඒ අහල පහළක."

"මොනවා කර කර ද?"

නිකෝ එයාගේ කඩු පටිය ඇඹරුවා. "හෝඩුවාවක් පස්සෙන් ගියා... ඔයා දන්නවා නේ, මගේ පවුල ගැන."

මම ඔළුව වැනුවා. නිකෝගේ අතීතය කියන්නේ වේදනාකාරී මාතෘකාවක්. පසුගිය අවුරුදු දෙකකට කලින් කාලය වෙන තුරු ම එයයි, එයාගේ අක්කා බියන්කායි 'ලෝටස් හෝටලය සහ කැසිනෝව' ලෙස හඳුන්වන තැන ඇතුළේ කාල නිද්‍රාවකයි ඉඳලා තියෙන්නේ. එයාලා ඒක ඇතුළේ අවුරුදු හැත්තෑවක් විතර ඉඳලා තිබුණා. අන්තිමේ දී කවුදෝ අබිරහස් නීතිඥයෙක් එයාලව එතැනින් ගලවාගෙන, බෝඩිං ඉස්කෝලෙකට ඇතුළු කරලා. ඒ වුණත් කැසිනෝවට යන්න කලින් ජීවිතය ගැන නිකෝට කිසිම මතකයක් තිබුණේ නැහැ. එයා එයාගේ අම්මා ගැනත් කිසිම දෙයක් දැනගෙන හිටියේ නැහැ. එයාලව බේරාගත් නීතිඥයා කවුද කියලවත්, එයාලා කාලය තුළ ගල් ගැසී සිටියේ ඇයි කියන කාරණයවත්, අන්තිමේ දී එයාලට නිදහස්ව යන්න ඉඩ දුන්නේ ඇයි කියලාවත් එයා දැනගෙන හිටියේ නැහැ. නිකෝව තනි කරමින් බියන්කා මිය ගියාට පස්සේ, මේ ප්‍රශ්නවලට පිළිතුරු හොයාගන්න එයා තදින් ම උත්සාහ කළා.

"ඉතින් වැඩේ හරි ගියා ද?" මම ඇහුවා. "මොකක් හරි වාසනාවක් පෑදුණා ද?"

"නැහැ," එයා මිමිණුවා. "ඒ වුණාට මට ඉක්මනට ම වගේ අලුත් හෝඩුවාවක් ලැබෙන්න ඉඩ තියෙනවා."

"මොකක්ද ඒ?"

නිකෝ තොල සැපුවා. "මේ වෙලාවේ ඒක එච්චර වැදගත් නෑ. මම මෙහෙට ආවෙ ඇයි කියලා ඔයා දන්නවා නේ?"



මගේ පපුව ඇතුළේ ත්‍රාසයේ හැඟීමක් ගොඩ නැගෙන්න ගත්තා. පහුගිය ගිම්හානයේ දී නිකෝ ක්‍රෝනොස්ව පැරදවීමට මේ සැලසුම යෝජනා කළ දා ඉඳන් මට ඒ ගැන නරක හීන පෙනුණා. ඉඳහිට වතාවක් පෙනී ඉන්නා එයා මගෙන් උත්තරයක් ඉල්ලමින් බල කෙරුවත්, ඒ හැම වතාවක ම මම ඒක කල් දමමින් සිටියා.

"අනේ මන්දා, නිකෝ," මම කිව්වා. "ඒක සෑහෙන බරපතළයි වගේ නේ."

"ටයිෆූන් එන්න කලින් ඔයාලට තියෙන්නෙ කොච්චර කාලයක් ද... සතියක්? අනිත් ටයිටන්ලාගෙන් වැඩි දෙනෙක් දැනටමත් නිදහස් වෙලා, ක්‍රෝනොස්ගේ පැත්තට එකතුවෙලා ඉවරයි. සමහරවිට මේ බරපතළ දෙයක් ගැන හිතන්න වෙලාව වෙන්නැති."

මම ආපසු හැරිලා කඳවුර දිහා බැලුවා. මේ තරම් ඈතක සිට වුණත් මට ඒරීස් සහ ඇපලෝ කඳවුරුකරුවෝ ආයෙමත් රණ්ඩු කරන හඬ, ශාපයන් මොර දෙන හඬ සහ මෙලෝ රහක් නැති කවි දොඩවන හඬ ඇසුණා.

"එයාලට ටයිටන් හමුදාව එක්ක හැරෙන්නවත් බැහැ," නිකෝ කිව්වා. "ඔයා ඒක දන්නවා. මේක අන්තිමේ දී ඔයාගෙයි ලූක්ගෙයි අතරේ සටනක් විතරක් වෙනවා. එතකොට ලූක්ව පරද්දන්න නම් ඔයාට තියෙන්නෙ එක ම එක ක්‍රමයක් විතරයි."

ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩාවේ දී සිදු වූ සටන මට සිහි වුණා. එදා මම අන්ත අසරණ ලෙස පරාද වුණා. ක්‍රෝනොස් මගේ බාහුවේ ඇති කළ එක ම කැපුම් පහරකින් මාව මැරෙන්න ගියා. ඒත් මට එයාට පොඩි තුවාලයක්වත් කරන්න බැරි වුණා. එයාගේ හමේ වැදුණු රිප්ටයිඩ් නිකං ම ඉවතට ලිස්සා ගියා විතරයි.

"ඔයාටත් එයාට සමාන බලයක් අරන් දෙන්න අපිට පුළුවන්," නිකෝ කරුණු කියමින් මාව උනන්දු කළා. "ඔයාට මහා අනාවැකිය අහන්න ලැබුණා නේ. ශාපලත් තලේකින් ඔයාගේ ආත්මය නෙළාගන්න ඔයාට ඕනෑ නැත්නම්..."

නිකෝට මහා අනාවැකිය අහන්න ලැබුණේ කොහෙන්ද හිතලා මම පුදුම වුණා- මට හිතෙන්නේ ඒකත් අවතාරෙකින් අහගන්න ඇති.

"අනාවැකියක් වළක්වන්න අපිට බැහැ," මම කිව්වා.

Scanned with CamScanner

"ඒත් ඒකට විරුද්ධව සටන් කරන්න ඔයාට පුළුවන්," නිකෝගේ ඇස්වලට අමුතු, කැදර දීප්තියක් එක් වී තිබුණා. "කාටවත් ම පරාද කරන්න බැරි කෙනෙක් වෙන්න ඔයාට පුළුවන්."

"සමහරවිට අපි ටිකක් කල් ගත්තොත් හොඳයි. ඒක නැතුව සටන් කරන්න උත්සාහ-"

"නෑ!" නිකෝ ගෙරෙව්වා. "ඒක මේ දැන් ම කරන්න ඕනෑ!"

මම එයා දිහා බැලුවේ පුදුමයෙන්. එයාගේ තරහව ඒ තරම් තදින් ඇවිලෙනවා මම සෑහෙන කාලෙකින් දැකලා තිබුණේ නැහැ. "අර්ම්ම්, ඔයා හොඳින් ද?"

එයා ගැඹුරු හුස්මක් ගත්තා. "පර්සි, මම කියන්නෙ මෙච්චරයි... සටන පටන් ගත්තට පස්සේ, අපිට මේ ගමන යන්න බැරි වෙනවා. මේක තමයි අපේ අන්තිම අවස්ථාව. මම ඕනෑවටත් වඩා බලපෑම් කරනවා නම් මට සමා වෙන්න, ඒත් මීට අවුරුදු දෙකකට කලින් ඔයාව බේරගන්න මගේ අක්කා ජීවිතේ දුන්නා. මට ඕනෑ ඒකට ගරු කරන්න. නොමැරී ඉන්න කරන්න සිද්ධ වෙන ඕනෑ ම දෙයක් කරලා ක්‍රෝනොස්ව පරද්දන්න."

මම ඒ අදහසට කොහෙත්ම කැමති වුණේ නැහැ. ඒ වෙලාවේ ඇනබෙත් මට බයගුල්ලා කියපු හැටි මට මතක් වුණා, ඊට පස්සේ මගේ තරහාව ඇවිස්සුණා.

නිකෝ පෙන්වූ කාරණයත් හරි. ක්‍රෝනොස් නිව්යෝර්ක් නගරයට පහර දුන්නොත්, කඳවුරුකරුවන්ට එයාගේ හමුදාවලට විරුද්ධව හැරෙන්නවත් බැරි වෙනවා. මම මොකක් හෝ කළ යුතුව තිබුණා. නිකෝ පෙන්වූ ක්‍රමය ගොඩාක් අනතුරුදායකයි- සමහරවිට මාරාන්තික වෙන්නත් ඉඩ තිබුණා. ඒ වුණත් එයින් මගේ සටනට පිටුවහලක් ලැබෙන්න ඉඩ තිබුණා.

"හරි එහෙනම්," මම තීරණය කළා. "අපි මුලින් ම කරන්නේ මොකක්ද?"

එයාගේ ඇඟ හිරිවට්ටනසුලු සීතල හිනාව දැක්කා ම මම එයාට එකඟ වුණේ අපරාදේ කියලා හිතුණා. "මුලින් ම අපි ලූක්ගේ පියවර දිගේ ආපස්සට හොයාගෙන යන්න ඕනෑ. එයාගේ අතීතය ගැන, පුංචි කාලේ ගැන වැඩිදුර විස්තර අපි හොයාගන්න ඕනෑ."



මම වෙවුලා ගියේ සිහිනයෙන් දුටු රේචල්ගේ සිතුවම-සිනාවකින් මූණ සරසාගෙන සිටින වයස-අවුරුදු-නමයේ-ලූක්ව සිහිවෙලයි. "අපිට ඒ ගැන හොයන්න ඕනෑ වෙන්නේ ඇයි?"

"අපි එහෙට ගියාට පස්සේ මම ඔයාට තේරුම් කරලා දෙන්නම් කෝ," නිකෝ කිව්වා. "මම දැනටමත් එයාගේ අම්මා ඉන්න තැන හොයාගෙන තියෙන්නේ. එයා ජීවත් වෙන්නේ කනෙක්ටිකට්වල."

මම එයා දිහා බලා සිටියේ පුදුමයෙන්. ලූක්ගේ මනුෂ්‍ය අම්මා ගැන මීට කලින් කවදාවත් මම වැඩිය හිතලා තිබුණේ නැහැ. මට එයාගේ තාත්තා, හර්මීස්ව නම් මුණ ගැසී තිබුණා, ඒත් එයාගේ අම්මා...

"ලූක් ගෙදරින් පැනලා ඇවිත් තිබුණේ ගොඩක් පොඩි වයසෙදි," මම කිව්වා. "ඉතින් එයාගේ අම්මා ජීවතුන් අතර ඇති කියලා මම හිතුවෙ නැහැ."

"ඔහ්, එයා ජීවතුන් අතර ඉන්නවා." එයා ඒක කියපු තාලෙට මට පුදුම හිතුණේ ලූක්ගේ අම්මට තිබිය හැකි ප්‍රශ්නය මොකක් වෙන්න ඇති ද කියලයි. එයා මොන වගේ බිහිසුණු කෙනෙක් වෙන්න ඇති ද?

"හරි..." මම කිව්වා. "එතකොට අපි කොහොමද කනෙක්ටිකට්වලට යන්නේ? මට පුළුවන් බ්ලැක්ජැක්ට අඬගහන්න-"

"නෑ," නිකෝගේ මූණ තරහෙන් අඳුරු වුණා. "පෙගසිලා මට කැමති නැහැ, ඒ වගේම මමත් එහෙමයි. ඒත් අපිට පියාඹන්න ඕනෑ වෙන්නෑ." එයා උරුවම් බාද්දී, කැලෑව තුළ සිට මිසිස් ඕ'ලෙරී උඩ පනිමින් දුවගෙන ආවා.

"ඔයාගේ මේ යාළුවාට පුළුවන් උදවු කරන්න." නිකෝ එයාගේ ඔළුවට තට්ටු කළා. "ඔයා තවම හෙවණැලි ගමන් යන්න උත්සාහ කරලා නැද්ද?"

"'හෙවණැලි ගමන්?'"

නිකෝ මිසිස් ඕ'ලෙරීගේ කනට කෙඳිරුවා. හදිසියේ ම විපරම්කාරී වෙමින් මිසිස් ඕ'ලෙරී ඔළුව පැත්තකට ඇල කර බැලුවා.

"පිටට නගින්න," නිකෝ මට කිව්වා.

මීට කලින් කවදාවත් බල්ලෙකුගේ පිටේ යන්න මම හිතලාවත් නොතිබුණත්, මිසිස් ඕ'ලෙරී එයාට සෑහෙන තරම් ප්‍රමාණයෙන් විශාල කෙනෙක්. එයාගේ පිටට ගොඩවුණ මම එයාගේ කරපටියෙන් අල්ලා ගත්තා.

Scanned with CamScanner

"මේක එයාව ගොඩක් මහන්සි කරවන වැඩක්," නිකෝ අවවාද කළා, "ඒ නිසා ඔයාට මේක නිතර ම කරන්න බැහැ. ඒ වගේම මේක හොඳට ම වැඩ කරන්නේ රෑට. හැම හෙවණැල්ලක් ම එක ම ධාතුවක කොටස්. ලෝකයේ තියෙන්නේ එක අන්ධකාරයක් විතරයි. පාතාල ලෝකයේ සත්තුන්ට ඒක පාරක් විදිහට, නැත්නම් දොරක් විදිහට පාවිච්චි කරන්න පුළුවන්."

"මට තේරෙන්නේ නැහැ," මම කිවුවා.

"නෑ," නිකෝ කිවුවා. "මටත් ඒක ඉගෙන ගන්න සෑහෙන කාලයක් ගියා. ඒත් මිසිස් ඕ'ලෙරී දන්නවා. යන්න උවමනා තැන එයාට කියන්න. වෙස්ට්පෝර්ට්වල, මේ කාසලන්ගේ ගෙදරට යන්න කියලා එයාට කියන්න."

"ඔයා එන්නැද්ද?"

"බය වෙන්නෙපා," එයා කිවුවා. "මම එහෙදි ඔයාව මුණ ගැහෙන්නම්."

තරමක් බය වෙලා හිටියා වුණත්, මම මිසිස් ඕ'ලෙරීගේ කන වෙතට නැමුණා. "හරි, කෙල්ලේ. අහ්, ඔයාට පුළුවන් ද මාව කනෙක්ටිකට්වල වෙස්ට්පෝර්ට්වලට අරන් යන්න? මේ කාසලන්ගේ තැනට?"

මිසිස් ඕ'ලෙරී සුළඟ ඉව කරලා, වනාන්තරයේ අන්ධකාරය දිහා බැලුවා. ඊට පස්සේ එයා එක එල්ලේ ඕක් ගහක් වෙතට දුවන්න ගත්තා.

අපි එහි හැප්පෙන්න මොහොතකට කලින්, හඳේ ඇඳිරි පැත්ත වගේ සීතල හෙවණැලි තුළට අපිව ඇතුළු වුණා.

# 06

# මගේ කර වුණ විස්කෝතු

ඔයා;

1) කළුවරට

2) කොඳු ඇට පේළිය දිගේ පැතිරෙන හිරියට

3) අසාමාන්‍ය ශබ්දවලට

4) ඔයාගේ මූණ හම ගැහෙයි කියලා හිතෙන තරම් වේගයෙන් ගමන් යන්න

බය කෙනෙක් නම් හෙවණැලි ගමන්වල යෙදෙන්න එපා කියන උපදෙස දෙන්න මම කැමතියි.

ඒ කොහොම වුණත් මට නම් හිතුණේ ඒක සුපිරි අත්දැකීමක් කියලයි. එක විනාඩියකට මට කිසිවක් නොපෙනී ගියා. මට දැනුණු එක ම දේ මිසිස් ඕ'ලෙරීගේ ලොම් සහ මගේ ඇඟිලි තදින් වෙළී තිබුණු එයාගේ බලු කර පටියේ ලෝකඩ පුරුක් විතරයි.

ඊළඟ විනාඩියේ දී දියවී යන හෙවණැලි අතරින් අලුත් දසුනක් මතු වුණා. අපි සිටියේ කනෙක්ටිකට්වල කැලෑවක් මැද කඳු බෑවුමක් මුදුනේ යි. අඩු තරමේ, මීට කලින් මම එහි ගිහින් තිබුණු කීප වතාවේ දී ඇසට හුරු වූ වටපිටාවෙන් ඒ කනෙක්ටිකට් වෙන්න ඇති කියලා මම අනුමාන කළා: ගස් ගොඩක්, ගලින් බැඳ ඇති නූස් තාප්ප, ලොකු නිවාස. බෑවුමේ එක පැත්තක පහළින් ගිරි කඳුරු කපාගෙන යන

අධිවේගී මාර්ගයක් පෙනුණා. අනෙක් පැත්තේ තිබුණේ කාගෙදෝ ගෙදරක පිටුපස මිදුලක්. ඒ ඉඩම අති විශාලයි- එහි එළිමහන් බිම් ප්‍රමාණයට වඩා වන වැදුණු ප්‍රමාණය වැඩි වුණා. එහි වූ සුදු පාට තට්ටු දෙකක නිවස යටත් විජිත සමයේ නිර්මාණය කළ එකක්. අධිවේගී පාරක් ඇති කඳු ගැටයක විරුද්ධ පැත්තේ පිහිටා තිබුණා වුණත්, ඒ නිවසට තිබුණේ අතරමං වුණ පෙනුමක්. එහි මුළුතැන්ගෙයි ජනේලයක් තුළින් එළියක් විහිදෙනවා මට පෙනුණා. ඇපල් ගහක් යට මළ කෑ පරණ ඔංචිල්ලාවක් තිබුණා.

ඇත්ත ම මිදුලක් ඇති මේ වගේ ගෙදරක ගෙවන ජීවිතයක් මට හිතේ මවාගන්නවත් බැරි වුණා. මම මගේ මුළු ජීවිත කාලය ම ගත කළේ පුංචි, ඉඩ ඇහිරුණු තට්ටු නිවාසයක, නැත්නම් ඉස්කෝලේ නේවාසිකාගාරයකයි. ඇත්තටම මේ ලූක්ගේ ගෙදර නම්, එයාට ඒකෙන් පැනලා යන්න ඕනෑ වුණේ ඇයි කියලා මම පුදුමයෙන් කල්පනා කළා.

මිසිස් ඕ'ලෙරී අමාරුවෙන් දෙපැත්තට වැනුණා. හෙවණැලි ගමන් යෑම එයාව ගොඩක් වෙහෙසවන වැඩක් කියලා නිකෝ කළ අනතුරු ඇඟවීම සිහි වෙලා මම එයාගේ පිටෙන් රූටා බිමට පැන්නා. ටී. රෙක්ස් ඩයිනොසෝරයෙක්ව පවා බය ගැන්විය හැකි තරමේ ලොකු ඇනුමක් පිට කළ එයා ඊට පස්සේ එක තැන රවුමක් කැරකී බිම ඉඳගත් වේගයට පොළොව පවා සෙලවුණා.

මගේ ළඟින් ම නිකෝ ප්‍රාදූර්භූත වුණේ හරියට හෙවණැලි වඩාත් අඳුරු වෙලා එයාව එතැන නිර්මාණය කළා වගෙයි. එයා පැකිළී වැටෙන්න ගියත්, මම එයාගේ අතකින් අල්ලා ගත්තා.

"මට අවුලක් නෑ," එයා ඇස් පොඩි කරමින් කිවුවා.

"ඔයා කොහොමද ඒක කළේ?"

"පුහුණුවීම් කරලා තමයි. සෑහෙන වතාවක් බිත්තිවල හැප්පිලා, තුන් හතර වතාවක් ම පාර වැරදිලා චීනෙටත් ගිහිල්ලා තියෙනවා."

මිසිස් ඕ'ලෙරී ගොරවන්න පටන් ගත්තා. අපිට පිටුපසින් පාරේ වාහනවල ඝෝෂාව නොතිබෙන්න, එයාගේ සද්දෙට අහල පහළ හැමෝම ඇහැරෙන්න ඉඩ තිබුණා.

"ඔයත් දැන් නිදාගන්න ද හදන්නේ?" මම නිකෝගෙන් ඇහුවා.

එයා ඔළුව හෙල්லුවා. "හෙවණැලි ගමන් ගිය පළවෙනි වතාවේ මම සතියක් සිහිය නැතුව හිටියා. දැන් නම් මට ඒකෙන් යාන්තමට



නිදිමතක් දැනෙනවා විතරයි. ඒත් මට එක රැකට වතාවකට දෙකකට වඩා ඒක කරන්න බැහැ. මිසිස් ඕ'ලෙරී නම් තව සෑහෙන වෙලාවකට කොහෙවත් යන එකක් නැහැ."

"ඒ කියන්නේ අපිට කනෙක්ටිකට්වල සෑහෙන වෙලාවක් ඉන්න පුළුවන්." මම සුදු පාට ගෙදර දිහාවට බැල්ම යොමු කළා. "දැන් මොකද කරන්නේ?"

"දොරේ බෙල් එක ගහනවා," නිකෝ කිවුවා.

***

මම ලූක්ගේ අම්මා වුණා නම්, රෑ මැද එන නාඳුනන ළමයි දෙන්නෙකුට දොර අරින්නේ නැහැ. ඒත් මම කොහෙත්ම ලූක්ගේ අම්මා වගේ නෙවෙයි.

ඒ බව අපි ඉදිරි දොරට ළං වෙන්නත් කලින් ම මම දැනගත්තා. ඉදිරි දොර වෙත යන පාර දෙපස තැඟි කඩවල දකින්න ලැබෙන පුංචි සත්ත්ව රූප පෙළ ගසා තිබුණා. එතැන චූටි සිංහයෝ, ඌරෝ, මකරු, හයිඩ්‍රාවෝ වගේම පොඩි ඩයපරයකින් සැරසුණු චුට්ටං මිනටෝරයෙක් පවා සිටියා. ඒවාගේ කණගාටුදායක තත්ත්වය දැක්කා ම මට හිතුණේ මේ සත්ත්ව රූප සෑහෙන කාලයක් එළිමහනේ තිබිලා කියලයි- අඩු තරමේ පහුගිය වසන්තයේ හිම දිය වී ගිය කාලයේ ඉඳලාවත් තියෙන්න ඇති. එක හයිඩ්‍රාවෙකුගේ බෙල්ල මැදින් පුංචි පැළයක් උඩට මතු වී තිබුණා.

නිවසේ ඉදිරි දොරකඩ වින්ඩ් චයිම්ස් පිරී තිබුණා. ඒවාගේ දිලිසෙන වීදුරු සහ ලෝහ කැබලි මඳ සුළඟට සෙලවෙමින් හඬ නැගුවා. පිත්තල පටි කිංකිණි නද නගමින් මට වැසිකිළි යාමේ උවමනාවක් ඇති බව සිහිපත් කර දුන්නා. කාසලන් මහත්මිය මේ හඬවල් සියල්ල කොහොම ඉවසාගෙන හිටියා ද, මට තේරුනේ නැහැ.

ඉදිරි දොර නිල් මැණික්වල පාටින් පින්තාරු කර තිබුණා. එහි ඉංග්‍රීසියෙන් සටහන් කර තිබූ 'කාසලන් ' නමට යටින් ග්‍රීක අකුරෙන් තවත් වචන දෙකක් තිබුණා: Διοικητής φρουρίου. (බලකොටු සේනාපති).

නිකෝ මගේ දිහා බැලුවා. "ලෑස්ති ද?"

එයා යාන්තමින් දොරට තට්ටු කරද්දි ම දොර වේගයෙන් ඇරුණා.

Scanned with CamScanner

"ලූක්!" වයසක ගැහැනු කෙනෙක් ප්‍රීතියෙන් කෑගැසුවා.

එයාට තිබුණේ විදුලි කෙවෙනිවලට ඇඟිල්ල ඔබලා විනෝද වෙන කෙනෙකුගේ පෙනුමක්. එයාගේ ඔළුව පුරා ම සුදු පාට කෙස් රොදවල් ඉහළට විහිදී තිබුණා. එයා ඇඳ සිටි රෝස පාට ගවුම තැනින් තැන පිළිස්සුම් ලකුණු වැටී, අළු තැවරී තිබුණා. හිනා වෙද්දි එයාගේ මුහුණ අස්වාභාවික ලෙස ඇදුණා. ඒ වගේම එයාගේ ඇස්වල තිබුණු හයි-වෝල්ටේජ් එළිය දැකලා මම පුදුමයෙන් හිතුවේ එයා අන්ධ කෙනෙක් වෙන්න ඇති ද කියලයි.

"ඔහ්, මගේ රත්තරන් කොල්ලා!" එයා නිකෝව වැලඳ ගත්තා. එයා නිකෝව ලූක් ලෙස වරදවා හිතපු හේතුව තේරුම් ගන්න මම උත්සාහ කරද්දි (ඒ දෙන්නගේ පෙනුම කොහෙත්ම එක සමාන නැහැ), එයා මගේ පැත්තට හැරිලා හිනාවක් පෑවා, "ලූක්!"

නිකෝව මුළුමනින්ම අමතක කළ එයා මාව වැලඳ ගත්තා. එයා ළඟින් හැමුවේ පිළිස්සුණු විස්කෝතු සුවඳක්. එයා පඹයෙක් තරම් කෙසඟ වුණත්, මාව පොඩි වෙන තරම් තදින් වැලඳ ගන්න එයාට බැරි වුණේ නැහැ.

"ඇතුළට එන්න!" එයා බල කරා. "මම ඔයාගේ දවල් කෑම ලෑස්ති කළා!"

එයා අපිව ඇතුළට කැඳවාගෙන ගියා. එයාගේ ආලින්දය ඉදිරි මිදුලටත් වඩා අමුතුයි. එහි සෑම හිස් ඉඩක් ම කණ්ණාඩි සහ ඉටි පන්දම්වලින් පුරවා තිබුණා. මම බලන බලන අත පෙනුණේ මගේ ම ප්‍රතිබිම්භයන් විතරයි. ගිනි උඳුන් කවුළුව මුඳුනේ තැබූ බට්ටා ඔරලෝසුවක තත්පර කටුවට අමුණා තිබුණු පුංචි ලෝකඩ හර්මීස් කෙනෙක් වටේට පියාඹමින් සිටියා. පණිවුඩකරුවන්ගේ දෙවියා මේ වියපත් ගැහැනු කෙනා සමඟ ආදරයෙන් බැඳුණු හැටි හිතේ මවා ගන්න මම උත්සාහ කළා, ඒත් ඒ අදහස පවා අමුතු දෙයක් වුණා.

ඒ වෙලාවේ උඳුන් පඩිය මත තිබූ රාමු කළ ඡායාරූපය දැකලා මම හිටිවන ම ගල් ගැසුණා. ඒක රේචල්ගේ චිත්‍රය වගේමයි- දත් දෙකක් නැති කටින් එකක් හිනාව පුරවාගෙන බලා ඉන්න අවුරුදු නමයක විතර ලූක්ගේ ඡායාරූපයක්. මුහුණේ කැළැල නැති අඩුව නිසා එයාව පෙනුණේ වෙනත් කෙනෙක් වගෙයි- කරදරවලින් නිදහස්, සතුටින් ඉන්න කෙනෙක් වගෙයි. රේචල් කොහොමද මේ ඡායාරූපය දැක්කේ?



"මෙහෙට එන්න, මගෙ දරුවෝ!" කාසලන් මහත්මිය මාව නිවසේ පිටුපස කොටසට ඇදගෙන ගියා. "ඔහ්, මං එයාලට කිවුවා ඔයා ආපහු එයි කියලා. මං ඒක දැනගෙන හිටියා!"

එයා අපිව මුළුතැන්ගෙයි මේසයට වාඩි කරවූවා. මුළුතැන්ගෙයි කවුන්ටරය මත පීනට් බටර් සහ ජෙලි සැන්ඩ්විච් දැමූ ප්ලාස්ටික් පෙට්ටි සිය ගාණක්- ඇත්තට ම සිය ගාණක්- ගොඩ ගසා තිබුණා. ඒවාගේ යටින් ම තිබූ ඒවා කොළ පාටට හැරී පුස් බැඳිලා තිබුණේ හරියට සෑහෙන කාලයක් ඒ පෙට්ටි ඇතුළේ තිබිලා වගෙයි. ඒවාගේ ගඳ මට සිහි කළේ හය වසර පන්තියේ මගේ ලොකරයයි- ඇත්තට ම ඒක කොහෙත්ම හොඳ දෙයක් නෙවෙයි.

පෝරණුව මත විස්කෝතු තහඩු ගොඩක් අඩුක් කර තිබුණා. ඒවා හැමෙකක ම පිළිස්සී ගිය විස්කෝතු දුසිම බැගින් තිබුණා. හිස් ප්ලාස්ටික් කූල්-එයිඩ් බීම බෝතල් කන්දකින් සින්කය පිරිලා. එහි කරාමය ළඟ මෙඩූසාගේ රූපයක් තබා තිබුණේ ඒ කුණු ගොඩවල් මුර කරන්න වගෙයි.

පීනට් බටර් සහ ජෙලි බෝතල් එළියට ගත් කාසලන් මහත්මිය අලුතින් සැන්ඩ්විච් හදන අතරේ තාලෙට මුමුණන්න ගත්තා. පෝරණුව තුළ මොනවදෝ කර වෙමින් තිබුණා. මගේ හිත කිවුවේ තවත් විස්කෝතු ගොඩක් මග එන බවයි.

සින්කයට උඩින් වූ ජනේලය වටා පුවත්පත් හා සඟරාවල පළවෙන දැන්වීම්වලින් කපාගත් පුංචි රූප ගොඩක් අලවා තිබුණා- හර්මීස්ගේ මල් ප්‍රවාහන සේවයේ සහ ක්ෂණික පිරිසිදු කරන්නන්ගේ සේවයේ ලාංඡන, වෛද්‍ය දැන්වීම්වලින් කපාගත් කැඩූසියස් ලකුණේ රූප.

මගේ හදවත කිඳා බහිනවා වගෙයි මට දැනුණේ. මට ඒ කාමරයෙන් පිට වෙලා යන්න ඕනෑ වුණා, ඒත් කාසලන් මහත්මිය සැන්ඩ්විච් පිළියෙල කරන අතරේ ම සැරින් සැරේ මට හිනාවක් පෑවේ හරියට මම පැනලා දුවන්නේ නැති බව තහවුරු කරගන්න වගෙයි.

නිකෝ බොරුවට කැස්සා. "අර්ම්ම්, කාසලන් නෝනා?"

"ම්ම්?"

"අපිට ඔයාගේ පුතා ගැන දැනගන්න ඕනෑ."

"ඔහ්, හරි! එයාලා නම් මට කිවුවෙ එයා ආයේ කවදාවත් ආපහු එන්නෙ නැහැ කියලා. ඒත් මම ඊට වඩා හොඳට දැනගෙන හිටියා." එයා මගේ කම්මුලට ආදරෙන් තට්ටු කළේ මගේ මූණේ පීනට් බටර්වලින් ඉරි අඳිමිනුයි.

"ඔයා අන්තිමට එයාව දැක්කේ කවදද?" නිකෝ ඇහුවා.

එයාගේ ඇස්වලට අතරමං වුණු බැල්මක් ආවා.

"මෙහෙන් යනකොට එයා ගොඩක් පොඩියි," එයා කල්පනාබරව කිවුවා. "තුන වසරේ. ඒ වයස පැනලා යන්න කොච්චර පොඩියි ද! එයා කිවුවා දවල් කෑමට එනවා කියලා. ඉතින් මම බලාගෙන හිටියා. එයා පීනට් බටර් සැන්ඩ්විච්වලටයි, විස්කෝතුවලටයි, කූල්-එයිඩ්වලටයි ආසයි. එයා ඉක්මනට ම දවල් කෑම කන්න එයි..." ඊට පස්සේ මගේ දිහා බැලුව එයා හිනා වුණා. "ඇයි ඉතින්, මේ ඉන්නේ ලූක්! ඔයා ගොඩාක් කඩවසම් වෙලා. ඔයාට තියෙන්නෙ ඔයාගේ තාත්තගේ ඇස් දෙකමයි."

එයා සින්කයට ඉහළින් අලවා තිබූ හර්මීස්ගේ රූප වෙතට හැරුණා. "දැන්, මෙයා නම් හොඳ පිරිමියෙක්. ඔව්, ඇත්තට ම. එයා මාව බලන්න එනවා, ඔයා දන්නව ද?"

අනෙක් කාමරයේ වූ ඔරලෝසුව නොනවත්වා ටික්-ටික් හඬ නැඟුවා. මූණේ ගෑවුණ පීනට් බටර් පිස දමාගත් මම ආයාචනාත්මක බැල්මෙන් නිකෝ දිහා බැලුවේ, 'අපි දැන්වත් මෙතැනින් එළියට යමු ද?' අහන්න වගෙයි.

"මැඩම්," නිකෝ කතා කළා. "මොනවද, අහ්... මොනවද ඔයාගේ ඇස්වලට වුණේ?"

එයාගේ බැල්ම බිඳුණේ හරියට එයා බහුරූපේක්ෂයක් තුළින් නිකෝ දිහා බලන්න උත්සාහ කරනවා වගෙයි. "ඇයි, ලූක්, ඔයා කතාව දන්නවා නේ. ඒක සිද්ධ වුණේ හරියට ම ඔයා ඉපදෙන්න කලින්, එහෙම නේද? මම ඉස්සර ඉඳලම විශේෂ කෙනෙක්, මට... අර මොකක්ද මන්දා එක හරහා දකින්න හැකියාව තිබුණා."

"මීදුම?" මම ඇහුවා.

"ඔව්, රත්තරන්." එයා අනුබල දෙමින් ඔළුව වැනුවා. "ඊට පස්සෙ එයාලා මට වැදගත් රාජකාරියක් දෙන්න කැමති වුණා. මම ඒ තරම් විශේෂ කෙනෙක්!"



මම නිකෝ දිහාවට බැල්මක් හෙළුවා, ඒත් එයා හිටියෙත් මං තරමට ම ව්‍යාකූල වෙලයි.

"මොන වගේ රාජකාරියක් ද?" මම ඇහුවා. "මොනවද සිද්ධ වුණේ?"

කාසලන් මහත්මියගේ නළල රැලි ගැසුණා. එයාගේ පිහිය තිබුණු අත පාන් ගෙඩියට ඉහළින් නැවතුණා. "අනේ දෙයියනේ, ඒක හරි ගියේ නැහැ නේ, එහෙම නේද? ඒකට උත්සාහ කරන්න එපා කියලා ඔයාගේ තාත්තා මට අවවාද කළා. එයා කිවුවා ඒක ගොඩක් අනතුරුදායකයි කියලා. ඒත් මට ඒක කරන්න ම වුණා. ඒක තමයි මගේ දෛවය! ඒත් දැන්... මට තවමත් ඒ රූප මගේ ඔළුව ඇතුළෙන් අයින් කරගන්න බැහැ. ඒවා නිසා හැම දෙයක් ම පේන්නේ බොඳ වෙලා. ඔයාට විස්කෝතු දෙන්න ද?"

පෝරණුව තුළින් තැටියක් එළියට ඇදගත් එයා චොකලට් චිප් අඟුරු කෑලි දුසිමක් මේසය උඩට දැමුවා.

"ලූක් හරිම කරුණාවන්තයි," කාසලන් මහත්මිය මිමිණුවා. "ඔයා දන්නව ද, එයා මෙහෙන් පිටවෙලා ගියේ මාව ආරක්ෂා කරන්න. එයා කිවුවා එයා මෙහෙන් ඈතට ගියොත්, රාක්ෂයෝ මට කරදර කරන්නෙ නැතිවෙයි කියලා. ඒත් රාක්ෂයින්ගෙන් අපිට කිසිම කරදරයක් නෑ කියලා මම එයාට කිවුවා! එයාලා මුළු දවස තිස්සෙ ම අපේ ගෙදරට එන පාර දෙපැත්තෙ ඉඳගෙන හිටියට, කවදාවත් ඇතුළට එන්නෙ නැහැ." එයා ජනෙල් පඩිය මත තිබුණු පුංචි මෙඩූසාගේ රූපය අතට ගත්තා. "එහෙම නේද, මෙඩූසා නෝනා? නෑ, කිසිම කරදරයක් නැහැ." එයා සතුටින් පිරුණු මුහුණින් මගේ දිහා බැලුවා. "ඔයා ගෙදර ආවට මට හරිම සතුටුයි. ඔයා මං ගැන ලැජ්ජා වෙන්නෙ නැහැ කියලා මම දැනගෙන හිටියා!"

මම වාඩි වී සිටි අසුනේ එහා මෙහා වුණා. එයාගේ අම්මා හොඳ සිහියෙන් නැති බව ටිකෙන් ටික තේරුම් ගනිමින්, අවුරුදු අටක්-නමයක් වයසේ ලූක් මේ අසුනේ ම වාඩි වී සිටිනවා මගේ හිතේ මැවුණා.

"කාසලන් නෝනා," මම කතා කළා.

"අම්මා," එයා මාව නිවැරදි කළා.

"ම්ම්, ඔව්. ලූක් ගෙදරින් ගියාට පස්සේ ඔයාට එයාව දකින්න ලැබුණා ද?"

Scanned with CamScanner

"හොඳයි. ඇත්ත වශයෙන් ම ඔව්!"

එයා ඒකත් හිතේ මවා ගත්තක් ද මම දන සිටියේ නැහැ. මට තේරුම් ගිය තරමින් නම්, ලියුම් බෙදන්නා දොරකඩට එන හැම වතාවකමත් ඒ ලූක් කියලා එයා හිතන්න ඇති. ඒ වුණත් නිකෝ බලාපොරොත්තු සහගතව ඉදිරියට නැමුණා.

"කවද ද?" එයා ඇහුවා. "ලූක් අන්තිමට ඔයාව බලන්න ආවෙ කවද ද?"

"හොඳයි, ඒක වුණේ... ඔහ් දෙවියනේ..." එයාගේ මූණ හරහා අඳුරු සෙවණැල්ලක් පාවී ගියා. "අන්තිම වතාවේ, එයාගේ පෙනුම ගොඩක් වෙනස් වෙලා තිබුණා. කැළැලක්. දරුණු කැළැලක් තිබුණා, ඒ වගේම එයාගේ කටහඬ වේදනාවෙන් පිරිලා තිබුණා..."

"එයාගේ ඇස්," මම ඇහුවා. "ඒවා රත්තරන් පාටයි ද?"

"රත්තරන්?" එයා තදින් ඇහි පිය සැලුවා. "නෑ. මොන මෝඩ කතාවක් ද ඒ. ලූක්ට තියෙන්නේ නිල් පාට ඇස්. හරිම ලස්සන නිල් පාට ඇස් දෙකක්!"

ඒ කියන්නේ ලූක් ඇත්තට ම මෙහෙ ඇවිල්ලා, ඒ පහුගිය ශිම්හානයට කලින්- එයා ක්‍රෝනොස් බවට පත්වෙන්න කලින්.

"කාසලන් නෝනා?" නිකෝ වියපත් ගැහැනු කෙනාගේ අත උඩින් අතක් තැබුවා. "මේක ගොඩාක් වැදගත්. එයා ඔයාගෙන් මොනවා හරි දෙයක් ඉල්ලුවා ද?"

එයාගේ ඇහි බැම් ඇකිළුණේ එයා සිහි කැඳවන්න උත්සාහ කරනවා වගෙයි. "මගේ- මගේ ආශිර්වාදය. ඒක හරිම ෂෝක්, නේද?" එයා අපි දිහා අඩමානයෙන් බැලුවා. "එයා ගඟකට යනවා කියලා, ඒකට මගේ ආශිර්වාදය ඕනෑ කිවුවා. මම ඒක එයාට දුන්නා. ඇත්ත වශයෙන් ම මම දුන්නා."

නිකෝ ජයග්‍රාහී බැල්මෙන් මගේ දිහා බැලුවා. "ස්තුතියි, මැඩම්. අපිට ඕනෑ කළේ ඒ ටික විතරයි-"

එක්වර ම කාසලන් මහත්මිය තදින් හුස්මක් ගත්තා. එයා දෙකට නැමෙද්දි විස්කෝතු තැටිය හඬ නගමින් බිම වැටුණා. නිකෝ සහ මම වේගයෙන් නැගිට්ටා.

"කාසලන් නෝනා?" මම කතා කළා.



"ආාහ්හ්හ්," එයා සෘජු වුණා. දඩිබිඩියේ ආපස්සට ගිය මම තව පොඩ්ඩෙන් මුළුතැන්ගෙයි මේසය උඩට ඇද වැටෙනවා. එයාගේ ඇස්- එයාගේ ඇස් තිබුණේ කොළ පාටින් දිලිසෙමිනුයි.

"මගේ දරුවා," එයා වඩාත් ගැඹුරු අමිහිරි හඬකින් කිවුවා. "එයාව ආරක්ෂා කරන්න ඕනෑ! හර්මීස්, උදවු කරන්න! මගේ දරුවා නෙවෙයි! එයාගේ ඉරණම නෙවෙයි- නෑ!"

එක්වර ම නිකෝගේ උරහිස්වලින් අල්ලාගත් එයා නිකෝව සොලවන්න පටන් ගත්තේ හරියට එයාට තේරුම් කරලා දෙන්න වගෙයි. "ඒක එයාගේ ඉරණම නෙවෙයි!"

උගුර යටින් කෑගැසූ නිකෝ එයාව පැත්තකට තල්ලු කරා. ඊට පස්සේ එයා කඩු මිට ඩැහැ ගත්තා. "පර්සි, අපි එළියට යන්න ඕනෑ-"

එක්වර ම කාසලන් මහත්මිය ඇද වැටුණා. එයාව මේස ගැටියේ වදින්න කලින් මම ඉදිරියට පැනලා එයාව අල්ලා ගත්තා. එයාව පුටුවක වාඩි කරවන්න මට හැකි වුණා.

"නෝනා?" මම කතා කළා.

තේරුම් ගන්න බැරි යමක් මිමිණූ එයා ඔළුව සෙලවූවා. "දෙවියනේ. මම... මම විස්කෝතු ටික බිම වට්ටලා. මම කොච්චර මෝඩයි ද?"

එයා තදින් ඇහි පිය ගැසුවා, ඊට පස්සේ එයාගේ ඇස් සාමාන්‍ය තත්ත්වයට- අඩු තරමේ කලින් තිබුණු තත්ත්වයට පත් වුණා. ඒවාගේ තිබුණු කොළ පාට දිස්නය නැති වෙලා.

"ඔයා හොඳින් ද?" මම ඇහුවා.

"හොඳයි, ඇත්ත වශයෙන් ම, රත්තරනේ. මම හොඳින්. ඇයි ඔයා එහෙම අහන්නේ?"

මම නිකෝ දිහා බලද්දි, එයා 'යමු' කියලා තොල් මැතිරුවා.

"නෝනා, ඔයා අපිට කතාවක් කියකියා හිටියේ," මම කිවුවා. "ඔයාගේ පුතා ගැන."

"එහෙමද?" එයා හීනෙන් වගේ ඇහුවා. "ඔව් නේ, එයාගේ නිල් පාට ඇස් දෙක. අපි එයාගේ නිල් පාට ඇස් ගැන කතා කරකර හිටියේ. කොච්චර කඩවසම් කොල්ලෙක් ද!"

Scanned with CamScanner

"අපිට දැන් යන්න වෙනවා," නිකෝ හදිසියෙන් කිව්වා. ''අපි ලූක්ට කියන්නම්... අහ්, අපි එයාට කියන්නම් ඔයා හලෝ කිව්වා කියලා."

"ඒත් ඔයාලට එහෙම යන්න බැහැ!" කාසලන් මහත්මිය වෙවුලමින් සිටගනිද්දී, මම පසු බැස්සා. දුර්වල මහලු ගෑනු කෙනෙකුට බය වීම ගැන මට මහා අමන හැඟීමක් දැනුණා තමයි, ඒ වුණත් එයාගේ කටහඬ වෙනස් වුණ විදිහ, එයා නිකෝව අල්ලා ගත් විදිහ...

"හර්මීස් කොයි වෙලාවෙ හරි මෙහෙට එයි," එයා කිව්වා. ''එයාට එයාගේ පුතාව බලන්න ඕනෑ වෙයි!"

"සමහරවිට ඊළඟ වතාවේ," මම කිව්වා. "ඔයාට ස්තූතියි-" මම බිම විසිරී තිබුණු පිළිස්සුණු විස්කෝතු දිහා බැලුවා. "හැමදේකට ම ස්තූතියි."

එයා අපිට කුල්-එයිඩ් පිළිගන්වන්න උත්සාහ කරමින්, අපිව නවත්වා ගන්න හැදුවත්, මට ඒ ගෙදරින් පිටවෙන්න තදින් ම ඕනෑ වුණා. ඉදිරි දොරකඩ ළඟ දී එයා මගේ අත ඩැහැ ගනිද්දී, මාව උඩ ගිහින් බිම වැටුණා. "ලූක්, අඩු තරමේ පරිස්සම් වෙන්න. ඔයා පරිස්සම් වෙනවා කියලා මට පොරොන්දු වෙන්න."

"මම එහෙම කරන්නම්... අම්මා."

එයින් එයාගේ මූණට හිනාවක් මතු වුණා. එයා මගේ අත අත්හැරියා. එයා ඉදිරි දොර වසා දමන අතරේ ඉටි පන්දම්වලට කතා කරන හඬ මට ඇසුණා: "ඔයාලට ඒක ඇහුණ ද? එයා පරිස්සම් වෙයි. මම ඔයාලට කිව්වෙ නැද්ද එයා එහෙම කරයි කියලා!"

දොර වැසී යද්දි ම නිකෝ සහ මම දුවන්න ගත්තා. අපි පසු කර යද්දි පාර දෙපස තිබුණු පුංචි සත්ත්ව රූප අපිට විරිත්තනවා වගෙයි මට පෙනුණේ.

★★★

කඳු බෑවුම මුදුනේ හිටපු මිසිස් ඕ'ලෙරීට අලුත් යාළුවෙක් මුණ ගැහිලා තිබුණා.

ගල් වළල්ලක් මැද ගිනි මැලයක් සුව පහසු ලෙස ඇවිලෙමින් තිබුණා. අවුරුදු අටක විතර ගෑනු ළමයෙක් මිසිස් ඕ'ලෙරී ළඟ එරමිණිය ගොතාගෙන වාඩි වී, යම බැල්ලගේ කන් අතගාමින් සිටියා.



මී ලොම්වල දුඹුරු පාට කෙස් කළඹක් තිබුණු ගෑනු ළමයා දුඹුරු පාට සරල ගවුමකින් සැරසී සිටියා. එයා ඔළුව වටේට ස්කාර්ෆයක් බැඳගෙන හිටියේ ඉස්සර කාලේ ගෑනු ළමයෙක් වගෙයි. එයා කෝටුවකින් ගිනි මැලය අවුස්සද්දි, එය සාමාන්‍ය ගින්නකට වඩා රතු පාටට හැරී හොඳින් ඇවිලෙන්න ගත්තා.

"හලෝ," එයා කිව්වා.

මට මුලින් ම හිතුණේ එයා රාක්ෂණියක් වෙන්න ඇති කියලයි. උප දෙවියෙක් වෙන ඔයාට කැලයක් මැද තනියම ඉන්න ලස්සන චූටි ගෑනු ළමයෙක්ව දකින්න ලැබෙනවා නම්- ඒක තමයි ඔයාගේ කඩුව ඇදලා අරන් පහර දෙන්න හොඳ ම වෙලාව. ඒ ඇරත්, කාසලන් මහත්මියව මුණ ගැසීමෙන් පස්සේ මම සෑහෙන කලබල වෙලයි හිටියේ.

ඒත් නිකෝ අර පුංචි ගෑනු ළමයාට ඔළුව නමා ආචාර කළා. "කොහොමද, උත්තමාවිය."

එයා ගිනි මැලයක් තරම් රතු පාට ඇස්වලින් මාව අධ්‍යයනය කළා. මමත් එයාට ආචාර කරන එක කෝකටත් හොඳයි කියලා මට හිතුණා.

"වාඩි වෙන්න, පර්සි ජැක්සන්," එයා කිව්වා. "රෑ කෑම ටිකක් කන්න කැමති ද?"

පිළුණු පීනට් බටර් සැන්ඩ්විච් සහ අඟුරු වුණ විස්කෝතු දැකල ම මගේ බඩගින්න නැති වෙලයි තිබුණේ, ඒ වුණත් ගෑනු ළමයා අතක් වැනූ හැටියේ ගිනි මැලය කෙළවරක භෝජන සංග්‍රහයක් මතු වුණා. එතැන බදින ලද මස්, කර කළ අර්තාපල්, බටර් තැවරූ කැරට්, අලුත් පාන් වගේම සෑහෙන කාලෙකින් මට දකින්න නොලැබුණු තව කෑම ජාති ගොඩකුත් තිබුණා. මගේ බඩ කෑගහන්න පටන් ගත්තා. ඒක දිනපතා ආහාර වේලට ගන්න හොඳ බව කියන, ඒත් කවදාවත් එහෙම නොකරන විදිහේ පෝෂණයෙන් පිරුණු ගෙදර-හැදූ කෑම වේලක්. ගෑනු ළමයා මිසිස් ඕ'ලෙරී අසල අඩි-පහක්-දිග බලු විස්කෝතුවක් මැව්වා. මිසිස් ඕ'ලෙරී හරි ම සන්තෝසයෙන් ඒක කෑලිවලට කඩන්න ගත්තා.

මම නිකෝ අසලින් වාඩි වුණා. අපිට උවමනා කෑම බෙදාගත්තට පස්සේ, මම එක්වර ම ඒවා ගිල දමන්න ලෑස්ති වුණත්, ඊට කලින් කළ යුතු යමක් මට සිහි වුණා.

Scanned with CamScanner

අපි කඳවුරේ දී කරන විදිහට මම මගේ කෑම වේලෙන් කොටසක් ගින්නට දැමුවා. "දෙවිවරුන්ට," මම කිවුවා.

පුංචි ගෑනු ළමයා හිනාවුණා. "ඔයාට ස්තුතියි. ඔයා දන්නව ද, ගිවිසුමේ හැටියට හැම පූජාවකින් ම කොටසක් මටත් ලැබෙනවා."

"මට දැන් ඔයාව මතකයි," මම කිවුවා. "මම කඳවුරට ආව පළවෙනි වතාවේ, ඔයා පොදු මිදුල මැද තියෙන ගිනි ගොඩ ළඟ ඉඳගෙන හිටියා."

"මාත් එක්ක කතා කරන්න ඔයා නතර වුණේ නැහැ," ගෑනු ළමයා සිහි කළේ කණගාටුවෙන්. "අනේ! ගොඩක් වෙලාවට කවුරුවත් එහෙම කරන්නෑ. නිකෝ නම් මට කතා කළා. අවුරුදු ගාණකින් එහෙම කරපු පළවෙනි කෙනා එයයි. හැමෝම කලබලෙන් එහෙට මෙහෙට දුවනවා මිසක්, පවුලේ අයව බලන්න එන්න වෙලාවක් නැහැ."

"ඔයා හෙස්ටියා," මම කිවුවා. "උඳුනට අධිපති දෙවඟන."

එයා ඔළුව වැනුවා.

හරි... ඉතින් එයාට තිබුණේ අවුරුදු අටක පෙනුමක්. මම ඒ ගැන අහන්න ගියේ නැහැ. මොකද දෙවිවරුන්ට එයාලා කැමති ඕනෑ ම පෙනුමක් ගන්න පුළුවන් බව මම ඉගෙනගෙන තිබුණා.

"මගේ උත්තමාවිය," නිකෝ කතා කළා, "ඔබතුමිය ඇයි ටයිටන්ට විරුද්ධව සටන් කරන්න අනිත් ඔලිම්පියානුවෝ එක්ක ගියේ නැත්තේ?"

"මම සටන්වලට ඒ හැටි දක්ෂ කෙනෙක් නෙවෙයි." එයාගේ රතු පාට ඇස් සැලෙමින් දිලිසුණා. ඒවා නිකං ම ගිනි දැලුවල එළිය පරාවර්තනය කරනවා නෙවෙයි කියලා මට තේරුම් ගියා. ඒවා ගිනි දැලුවලින් පිරිලයි තිබුණේ- හැබැයි ඒවා ඒරීස්ගේ ඇස් වගේ නෙවෙයි. හෙස්ටියාගේ ඇස් උණුසුම් සහ ප්‍රියජනක වුණා.

"ඒ ඇරත්," එයා කිවුවා. "අනිත් දෙවිවරු නැති අතරේ ගෙදර ගිනි මැලය නිවෙන්න නොදී බලාගන්න කෙනෙකුත් එපැයි."

"ඒ කියන්නේ ඔයා ඔලිම්පස් කන්ද මුර කරනවා?" මම ඇහුවා.

"'මුර කරනවා' කියන වචනේ සමහරවිට බරපතළ වැඩියි. ඒත් ඔයාට කවදාහරි වාඩි වෙන්න උණුසුම් තැනකුයි, ගෙදර උයපු කෑම වේලකුයි ඕනෑ වුණොත් එහෙට එන්න පුළුවන්. දැන් කෑම කන්නකෝ."



මම හිතන්නත් කලින් මගේ පිඟාන හිස් වුණා. නිකෝත් ඒ තරම් ම වේගයකින් එයාගේ පිඟාන හිස් කළා.

"ඒක නම් නියමයි," මම කිවුවා. "ඔයාට ස්තුතියි, හෙස්ටියා."

එයා ඔළුව වැනුවා. "ඉතින්, ඔයාලා මේ කාසලන්ව මුණ ගැහෙන්න ගිය ගමන හොඳට සිද්ධ වුණා ද?"

එක මොහොතකට අර දීප්තිමත් ඇස් දෙකක් සහ උමතු හිනාවක් තිබුණු වයසක ගෑනු කෙනාව මට මුළුමනින්ම වගේ අමතක වෙලයි තිබුණේ.

"ඇත්තට ම එයාට තියෙන ප්‍රශ්නේ මොකක්ද?" මම ඇහුවා.

"එයා සහජ කුසලතාවයක් එක්කමයි ඉපදිලා තිබුණේ," හෙස්ටියා කිවුවා. "එයාට මීදුම හරහා දකින්න හැකියාව තිබුණා."

"හරියට මගේ අම්මට වගේ," මම කිවුවා. හරියට රේචල්ට වගේ. මම හිතින් හිතුවා. "ඒත් එයාගේ ඇස් දිලිසෙන්නේ-"

"සමහරු අනෙක් අයට වඩා හොඳට දෘෂ්ටියේ ශාපය දරාගන්නවා," දෙවඟන දුක්බරව කිවුවා. "කාලයක් මේ කාසලන්ට හැකියාවන් ගොඩක් තිබුණා. එයා හර්මීස්ගේ අවධානය දිනාගත්තා. ඒ දෙන්නට ලස්සන කොලු පැටියෙක් ලැබුණා. බොහොම ටික කාලයකට එයා සතුටින් හිටියා. ඒත් ඊට පස්සේ එයා ඕනෑවටත් වඩා දුරදිග ගියා."

කාසලන් මහත්මිය කියූ දෙයක් ඒ වෙලාවේ මට සිහිපත් වුණාඃ එයාලා මට වැදගත් රාජකාරියක් දෙන්න කැමති වුණා... ඒත් ඒක හරි ගියේ නැහැ නේ. එයාව ඒ තත්ත්වයට පත් කරන්න ඇත්තේ මොන විදිහේ රාජකාරියක් වෙන්න ඇති ද, මම පුදුමයෙන් හිතුවා.

"එක විනාඩියකට එයා සෑහෙන සන්තෝසෙන් හිටියා," මම කිවුවා. "ඒත් ඊට පස්සේ එක පාරට ම එයා එයාගේ පුතාගේ ඉරණම ගැන බයෙන් දොඩවන්න ගත්තා, ඒක හරියට ලූක් ක්‍රෝනොස් බවට හැරුණා කියලා එයා දැනගෙන හිටියා වගෙයි. මොනවද සිද්ධ වුණේ... එයාගේ සිහිය ඒ විදිහට බෙදෙන්න?"

දෙවඟනගේ මුහුණ අඳුරු වුණා. "ඒ කතාව මම කියන්න කැමති එකක් නෙවෙයි. ඒ වුණත් මේ කාසලන් ඕනෑවටත් වඩා දේවල් දැක්කා. ඔයාගේ හතුරා ලූක්ව තේරුම් ගන්න නම්, ඔයා එයාගේ පවුල ගැන තේරුම් ගන්න ඕනෑ."

Scanned with CamScanner

මේ කාසලන්ගේ සින්කයට ඉහළින් අලවා තිබුණු හර්මීස්ගේ පුංචි රූප ගැන මට සිහි වුණා. කාසලන් මහත්මියගේ සිහි විකල් වෙන්න ඇත්තේ ලූක් පුංචි කාලයේ ද් ද හිතලා මම පුදුම වුණා. අර විදිහේ ඇස්-කොළ පාට වෙන ආරූඪයක් දකින්න ලැබුණොත් අවුරුදු නමයක ළමයෙක් දරුණු ලෙස බය වෙන්න පුළුවන්. ඒ වගේම හර්මීස් කවදාවත් එයාලව බලන්න ආවේ නැත්නම්, ඒ මුළු අවුරුදු ගාණ පුරාවට ම එයා ලූක්ට අම්මා සමඟ තනියම ඉන්න ඉඩ ඇරියා නම්...

"ලූක් පැනලා ගියපු එකේ පුදුමයක් නැහැ," මම කිවුවා. "මං කිවුවේ, එයා එයාගේ අම්මව ඒ විදිහට දාලා ගිය එක නම් හොඳ දෙයක් නෙවෙයි, ඒ වුණත්- එයා පොඩි ළමයෙක් විතරයි නේ. එයාලව අත ඇරලා දාලා හර්මීස් කරලා තියෙන්නේ හොඳ දෙයක් නෙවෙයි."

හෙස්ටියා මිසිස් ඕ'ලෙරිගේ කන් පිටුපස අතගෑවා. යම බැල්ල වලිගය වනද්දී, වැරදිමකින් ගහක වැදිලා එය පෙරළුණා.

"අනිත් අයට චෝදනා කරන එක ලේසියි," හෙස්ටියා අවවාද කළා. "ඒ වුණාට ඔයා ලූක්ගේ අඩි පාරේ යනව ද? ඒ විදිහට බලය ලබාගන්න උත්සාහ කරනව ද?"

නිකෝ එයාගේ පිඟාන බිමින් තැබුවා. "අපිට වෙන කරන්න දෙයක් නැහැ, උත්තමාවිය. පර්සිට අවස්ථාවක් ලබා ගන්න තියෙන එකම ක්‍රමය මේක විතරයි."

"ම්ම්ම්." හෙස්ටියා අත දිග හරිද්දී ගින්න බුරබුරා ඉහළ නැඟුණා. ගිනි දලු අඩි තිහක් උසට එසවුණා. තාපය මගේ මූණට අතුල් පහර දුන්නා. ටිකකින් ගින්න නැවතත් සාමාන්‍ය තරමට පහත බැස්සා.

"හැම බලයක් ම විශිෂ්ඨ නැහැ." හෙස්ටියා මගේ දිහා බැලුවා. "සමහර වෙලාවට දිනා ගන්න අමාරු ම බලය තමයි යටත් වෙන හැකියාව. ඔයා මං කියන දේ විශ්වාස කරනව ද?"

"අහ්-හහ්," මම කිවුවේ එයාට ආයෙමත් ගින්නෙන් වැඩ දාන්න ඉඩක් නොතියන්නයි.

දෙවඟන හිනා වුණා. "ඔයා හොඳ වීරයෙක්, පර්සි ජැක්සන්. වැඩිය ආඩම්බර නැහැ. මම ඒකට කැමතියි. ඒත් ඔයාට ඉගෙන ගන්න තව ගොඩක් දේවල් තියෙනවා. ඩයනයිසියස්ව දෙවියෙක් බවට පත් කළාට පස්සේ, මම මගේ සිංහාසනය එයාට දුන්නා. දෙවිවරු අතරේ සිවිල් යුද්ධයක් ඇතිවීම වළක්වන්න තිබුණු එකම ක්‍රමය ඒක විතරයි."



"ඒකෙන් මහා මණ්ඩලයේ සමබරකම නැති වුණා," මම සිහි කළා. "දැන් එතැන පිරිමි අය හත් දෙනයි, ගෑනු අය පස් දෙනයි."

හෙස්ටියා උරහිස් ඇකිළුවා. "ඒක තමයි තිබුණ හොඳ ම විසඳුම, ඒක පරිපූර්ණ එකක් නම් නෙවෙයි. දැන් මම ගින්න නඩත්තු කරනවා. මම හෙමින් හෙමින් වියැකිලා ගිහින් පසුබිමට එකතු වෙනවා. කවුරුවත් කවදාවත් හෙස්ටියා ගැන වීර කාව්‍යයන් ලියන්නෙ නැතිවෙයි. උප දෙවිවරුන්ගෙන් වැඩි දෙනෙක් මාත් එක්ක කතා කරන්න නතර වෙන්නෙවත් නැහැ. ඒත් ඒකට කමක් නැහැ. මම සමගිය ආරක්ෂා කරගෙන ඉන්නවා. මම උවමනා වෙලාවට යටත් වෙනවා. ඔයාට එහෙම කරන්න පුළුවන් ද?"

"ඔයා අදහස් කළේ මොකක්ද කියලා මට තේරෙන්නෙ නෑ."

එයා මගේ දිහා සැලකිල්ලෙන් බලා සිටියා. "බාගදා තවම නැතුව ඇති. ඒත් ඉක්මනට ම. ඔයා ඔයාගේ ගවේෂණය දිගට ම කරගෙන යනව ද?"

"ඔයා මෙතැනට ආවෙ ඒකට ද- මම කරන්න යන දේ ගැන අනතුරු අඟවන්න ද?"

හෙස්ටියා ඔළුව හෙල්ලුවා. "මම මෙතැනට ආවේ, අනිත් හැමෝම අසමත් වෙද්දි, අනිත් බලවත් දෙවිවරු හැමෝම යුද්ධයට පිටත් වුණාට පස්සේ, ඉතුරු වෙලා ඉන්න එකම කෙනා මම විතරක් නිසයි. ගෙදර. ගිනි උඳුන. මම තමයි අන්තිම ඔලිම්පියානුවා. ඔයා ඔයාගේ අන්තිම තීරණයට මුහුණ දෙද්දි ඒක මතක තියාගන්න ඕනෑ."

එයා 'අන්තිම' කියලා කියපු විදිහ නම් මට ඇල්ලුවේ නැහැ.

මම නිකෝ දිහාවත්, ඊට පස්සේ ආපසු හෙස්ටියාගේ උණුසුම් දිලිසෙන ඇස් දිහාවත් බැලුවා. "මට මේක දිගටම කරගෙන යන්න වෙනවා, මගේ උත්තමාවිය. මට ලූක්ව... මං කිවුවේ ක්‍රෝනොස්ව නතර කරන්න වෙනවා."

හෙස්ටියා ඔළුව වැනුවා. "බොහොම හොඳයි. මම දැනටමත් ඔයාට කියලා තියෙන දේවල් ඇරෙන්න, ඊට වඩා උදවුවක් කරන්න නම් මට පුළුවන්කමක් නෑ. ඒ වුණත් ඔයා මට පූජාවක් කළ නිසා, මට ඔයාව ඔයාගේ ගෙදරට ඇරලවන්න පුළුවන්. අපි ආයෙම මුණ ගැහෙයි, පර්සි, ඔලිම්පස්වලදි."

Scanned with CamScanner

එයාගේ හඬේ අනතුරු අඟවනසුලු නාදයක් තිබුණේ හරියට අපේ ඊළඟ හමුව සතුටුදායක එකක් නොවෙන්න යනවා වගෙයි.

දෙවඟන අතක් වැනුවාම සියල්ල බොඳ වී ගියා.

★★★

එක්වර ම මම ගෙදර ගොස් සිටියා. නැගෙනහිර ඉහළ කොටසේ පිහිටි මගේ අම්මාගේ තට්ටු නිවාසයේ කවිච්චිය මත නිකෝ සහ මම වාඩි වී සිටියා. ඒක තමයි හොඳ ආරංචිය. නරක ආරංචිය තමයි සාලයේ ඉතිරි ඉඩ සියල්ල ම මිසිස් ඕ'ලෙරීගෙන් ඇහිරී තිබුණා.

මට නිදන කාමරයෙන් හිරවුණු කෑ මොරදීමක් ඇසුණා. "කවුද දොර හරස් වෙන්න මවිල් ගොඩක් තිබ්බේ?" පෝල්ගේ හඬ ඇහුවා.

"පර්සි?" මගේ අම්මා කතා කළා. "ඔයා ඔතැන ඉන්නව ද? ඔයා හොඳින් ද?"

"මම මෙහේ!" මම ආපසු කෑගැසුවා.

"වූෆ්!" මිසිස් ඕ'ලෙරී මගේ අම්මාව හොයාගෙන රවුමට කැරකෙන්න උත්සාහ කළේ බිත්තියේ එල්ලා තිබුණු පින්තූර සියල්ලම පෙරළමින්. එයා මීට කලින් මගේ අම්මාව මුණ ගැසී තිබුණේ එක වතාවක් වුණත් (ඒක දිග කතාවක්), එයා අම්මාට ආදරේ කළා.

එයට විනාඩි කීපයක් ගත වුණත්, අන්තිමේ දී අපිට හැමදේම බේරුම් කරගන්න හැකි වුණා. සාලයේ තිබුණු බඩු මුට්ටුවලින් බොහෝමයක් විනාශ කරගෙන, අපේ අසල්වාසියන්වත් හොඳටෝම කේන්ති ගැස්සුවාට පස්සේ, මගේ දෙමව්පියන්ව නිදන කාමරයෙන් එළියට ගන්න අපිට හැකි වුණා. අපි මුළුතැන්ගෙයට ගිහින්, මේසය වටේට වාඩි වුණා. මිසිස් ඕ'ලෙරී තවමත් මුළු සාලය ම අරාගෙන හිටියා, ඒ කොහොම වුණත් අපිව දකගන්න හැකි විදිහට මුළුතැන්ගෙයි දොරකඩ ඔළුව රඳවාගත් එයා එයින් සෑහීමකට පත් වුණා. මගේ අම්මා එයාට දමූ, පවුලකට සෑහෙන ප්‍රමාණයේ රාත්තල්-දහයක මස් කුට්ටිය එක කටට අතුරුදහන් වුණා. ඉතිරි අපි හැමෝටම පෝල් ලෙමනේඩ් බෙදන අතරේ මම අපේ කනෙක්ටිකට් ගමන ගැන විස්තර කළා.

"එහෙනම් ඒක ඇත්ත." පෝල් පුදුමයෙන් මගේ දිහා බලා සිටියේ මීට කලින් මාව දකලා නැහැ වගෙයි. එයා ඇඟ දවටාගෙන සිටි සුදු පාට නාන කබාය දන් බලු ලොම්වලින් වැහිලා, එයාගේ ලුණු-ගම්මිරිස් පාට කොණ්ඩය හැම අතටම විහිදිලා තිබුණා. "රාක්ෂයෝ



ගැන කියපු කතා, ඔයා උප දෙවියෙක් කියලා කියපු එක... ඒවා ඔක්කොම ඇත්ත."

මම ඔළුව වැනුවා. පහුගිය සරත් කාලයේ දී පෝල්ට මම ඇත්තට ම කවුද කියලා පැහැදිලි කරලා දුන්නා. මගේ අම්මත් මගේ කතාව සහතික කළා. ඒත් මේ මොහොත වෙනකල් ම, එයා ඇත්තට ම අපිව විශ්වාස කළා කියලා මම හිතන්නෙ නැහැ.

"මිසිස් ඕ'ලෙරී කරපු දේට කණගාටුයි," මම කිවුවා. "එයා මුළු සාලෙ ම වැනසුවා."

පෝල් මහ හඬින් හිනාවුණේ සතුටින් පිනා ගිහින් වගෙයි. "ඔයා විහිළු කරනව ද? මේක මරේ මරු නේ! මං කිවුවෙ, මගේ කාර් එක උඩ කුර පාරවල් වැදිලා තියෙනවා දැක්කා ම මගේ හිතට දෙගිඩියාවක් ආවා. ඒත් මේක!"

එයා මිසිස් ඕ'ලෙරීගේ හොම්බට තට්ටුවක් දැමුවා. ඒත් එක්ක ම සාලය දෙදරන්න ගත්තා- බූම්, බූම්, බූම්- ඒකේ තේරුම එක්කෝ පොලිස් විශේෂ බලකාය ඇවිත් අපේ දොර කඩනවා, නැත්නම් මිසිස් ඕ'ලෙරී වලිගය වනනවා.

මට හිනා නොවී ඉන්න බැරි වුණා. පෝල් කියන්නේ මගේ බාප්පා වගේම මගේ ඉංග්‍රීසි ගුරුවරයාත් වුණාට, එයා හරි ම හොඳ හාදයෙක්.

"බය නොවී හිටියට ස්තුතියි," මම කිවුවා.

"ඔහ්, මම බය වෙලා තමයි ඉන්නේ," එයා ඇස් ලොකු කරගෙන කිවුවා. "ඒත් මට මේක මරේ මරු කියලා හිතෙනවා!"

"ඔව්, හොඳයි," මම කිවුවා, "සිද්ධ වෙන දේ ඇහුවා ම නම් ඔයාට එහෙම හිතෙන එකක් නැති වෙයි."

මම පෝල්ට සහ මගේ අම්මාට ටයිෆූන් සහ දෙවිවරු ගැනත්, ඉස්සරහට අනිවාර්යයෙන් එන්න නියමිත යුද්ධය ගැනත් කිවුවා. ඊට පස්සේ මම එයාලට නිකෝගේ සැලසුම හෙළි කරා.

මගේ අම්මාගේ අතැඟිලි ලෙමනේඩ් වීදුරුව වටේට තදින් වෙළුණා. නිල් පාට ෆ්ලැනල් රෙද්දෙන් මැසූ පරණ නාන කබාය හැඳ සිටි එයා කොණ්ඩය පිටුපසට කර ගැට ගසාගෙන සිටියා. මෑතක දී එයා කාලයක් තිස්සේ කරන්න ආසාවෙන් සිටි නව කතාව ලියන්න පටන්ගෙනයි තිබුණේ. එයා ගොඩක් රෑ බෝ වෙන තුරු එහි වැඩ

කරනවා ඇති කියලා මට හිතුණේ අම්මාගේ ඇස් වටා වෙනදාටත් වඩා තදින් කළු වී තිබුණු නිසයි.

එයාට පිටුපසින්, මුළුතැන්ගෙයි ජනෙල් පඩිය මත මල් පැල පෙට්ටියේ මූන් ලේස් පැළය රිදී පාටින් දිලිසෙමින් තිබුණා. පසුගිය ගිම්හානයේ දී කැලිප්සෝ ගේ දූපතෙන් මම අරන් ආව ඒ පැළයට මගේ අම්මාගෙන් ලැබෙන සාත්තුව නිසා උමතුවෙන් වගේ මල් පිදුණා. ඒවාගේ සුවඳ නිතර ම මාව සන්සුන් කළා වුණත්, එයින් මගේ හිතට දුකකුත් එකතු කළේ එය මට අහිමි වුණ යාළුවන්ව සිහි ගැන්වූ නිසයි.

මගේ අම්මා ගැඹුරු හුස්මක් ගත්තේ මට එපා කියන විදිහක් කල්පනා කරනවා වගෙයි.

"පර්සි, ඒක අනතුරුදායකයි," එයා කිවුවා. "ඔයාට වුණත්."

"අම්මේ, මම දන්නවා. මම මැරෙන්න වුණත් ඉඩ තියෙනවා. නිකෝ ඒක පැහැදිලි කරලා දුන්නා. ඒත් අපි උත්සාහ කරලා බැලුවෙ නැත්නම්-"

"අපි හැමෝටම මැරෙන්න වෙයි," නිකෝ කිවුවා. එයා එයාගේ ලෙමනේඩ් විදුරුවට අතක්වත් තියා තිබුණේ නැහැ. "ජැක්සන් නෝනා, ආක්‍රමණයකට විරුද්ධව අපිට කිසිම අවස්ථාවක් නැහැ. ඒ වගේම 'ආක්‍රමණයක්' ළඟ ළඟ ම එනවා."

"නිව්යෝර්ක්වලට ආක්‍රමණයක්?" පෝල් ඇහුවා. "එහෙම දෙයක් වෙන්නෙවත් කොහොමද? අපිට කොහොමද... මේ 'රාක්ෂයින්ව' පේන්නෙවත් නැත්තේ?"

එයා ඒ වචනය උච්චාරණය කළේ හරියට ඒක ඇත්තක් බව විශ්වාස කරගන්න බැහැ වගෙයි.

"මං දන්නෙ නැහැ," මම ඇත්ත ම කිවුවා. "ක්‍රෝනොස් නිකං ම මෑන්හැටන්වලට ගහන්න එන්නෙ කොහොමද කියලා මට තේරෙන්නෙ නැහැ, ඒත් මීදුම කියන්නේ ගොඩක් බලවත් දෙයක්. මේ දූනුත් ටයිෆූන් රට ම පොඩි පට්ටම් කරගෙන ඉබාගාතේ යනවා, ඒත් මිනිස්සු හිතන්නේ එයා කුණාටු පද්ධතියක් කියලා."

"ජැක්සන් නෝනා," නිකෝ කතා කළා, "පර්සිට ඔයාගේ ආශිර්වාදය ඕනෑ වෙනවා. මේ වැඩ පිළිවෙළ පටන් ගන්න ඕනෑ එහෙමයි. අපි ලූක්ගේ අම්මව මුණ ගැහෙන කල් ම මට ඒ ගැන විශ්වාසයක් තිබුණේ නැහැ. ඒත් දැන් මට ඒක සහතිකයි. මීට කලින්



මේ වැඩේ සාර්ථකව කරලා තියෙන්නේ දෙසැරයයි. ඒ දෙවතාවේ ම, එයාලගේ අම්මලාට ආශිර්වාදය දෙන්න සිද්ධ වුණා. තමන්ගේ පුතාට ඒ අවදානම ගන්න එයා කැමැත්තෙන් ඉඩ දෙන්න ඕනෑ."

"ඔයා කියන්නේ මට මේකට ආශිර්වාද කරන්න කියල ද?" එයා ඔළුව හෙල්ලුවා. "ඒක පිස්සුවක්. පර්සි, අනේ-"

"අම්මේ, ඔයා නැතුව මට ඒක කරන්න බැහැ."

"මේ වැඩ පිළිවෙළ ඉවර වෙද්දි ඔයා... ඔයා පණ පිටින් හිටියොත්?"

"ඊට පස්සේ මම යුද්දෙට යනවා," මම කිවුවා. "ක්‍රෝනොස්ට විරුද්ධව. ඒකෙදි නොමැරී බේරෙන්නේ අපි දෙන්නගෙන් එක්කෙනෙක් විතරයි."

මම එයාට මුළු අනාවැකිය ම කිවුවෙ නැහැ- ඒ කියන්නේ මගේ කාලය අවසන් කරමින්, ආත්මය නෙළා ගන්න කතාව. මම මැරෙන්න නියමිත බව එයා දැනගන්න උවමනා නැහැ. මට තිබුණු එක ම බලාපොරොත්තුව වුණේ මැරෙන්න කලින් ක්‍රෝනොස්ව නතර කරලා, ලෝකය බේරාගන්න එක විතරයි.

"ඔයා මගේ පුතා," එයා කිවුවේ අන්ත දුක්බර හඬින්. "මම කොහොමද නිකං ම..."

එයාව එකඟ කරගන්න නම් මට මීට වඩා තදින් බල කරන්න වෙන බව මම දැන සිටියා, ඒත් මට එහෙම කරන්න ඕනෑ වුණේ නැහැ. තමන්ගේ පුතා ගෙදර එනතුරු මුළුතැන්ගෙයි වාඩිවෙලා බලා සිටින අසරණ කාසලන් මහත්මියව මට මතක් වුණා. ඒ වෙලාවේ මම කොයි තරම් වාසනාවන්ත ද කියලා මට තේරුම් ගියා. මගේ අම්මා හැම වෙලාවෙ ම මං වෙනුවෙන් මගේ ළඟ හිටියා. දෙවිවරු සහ රාක්ෂයෝ වගේ දේවල් මැද වුණත් මගේ ජීවිතය සාමාන්‍ය එකක් බවට පත් කරන්න එයා නිතර ම උත්සාහ කළා. මම වික්‍රමාන්විතවලට යද්දී එයා ඉවසාගෙන සිටියා, ඒත් දැන්, බොහෝ දුරට මාව මැරෙන්න ඉඩ ඇති වැඩක් කරන්න මම එයාගේ ආශිර්වාදය ඉල්ලනවා.

මම පෝල්ගේ ඇස් දිහා බැලුවා, ඒ වෙලාවේ එක්තරා ආකාරයක වැටහීමක් අපි දෙන්නා අතරේ හුවමාරු වුණා.

"සැලී." එයා මගේ අම්මාගේ අත උඩින් අතක් තැබුවා. "පහුගිය අවුරුදු ගාණ පුරාවට ඔයාටයි පර්සිටයි මූණ දෙන්න වුණ

දේවල් දන්නවා කියලා මට කියන්න බැහැ. ඒත් මට නම් හිතෙන්නේ... මට හිතෙන්නේ පර්සි මේ කරන්න යන්නේ ගොඩක් උදාර දෙයක්. ඒ තරම් නිර්භීතකමක් මටත් තිබුණා නම් කියලා මට හිතෙනවා."

මට දැනුණේ මගේ උගුරේ මොනවදෝ පැටලෙනවා වගෙයි. ඒ විදිහේ ප්‍රශංසා මට නිතර ලැබෙන ඒවා නෙවෙයි.

මගේ අම්මා ලෙමනේඩ් වීදුරුව දිහා ඇසි පිය නොහෙළා බලා සිටියා. එයා හිටියේ නාඩා ඉන්න තදින් ම උත්සාහ කරනවා වගෙයි. යටත් වීමේ අමාරුකම ගැන හෙස්ටියා කියූ දේ ඒ වෙලාවේ මට සිහි වුණා, ඒත් එක්ක ම මට හිතුණේ සමහරවිට මගේ අම්මත් ඒ බව තේරුම් ගනිමින් ඉන්නවා ඇති කියලයි.

"පර්සි," එයා කතා කළා, "මම ඔයාට මගේ ආශිර්වාදය දෙනවා."

එයින් කිසිම වෙනසක් වූ බවක් නම් මට දැනුනේ නැහැ. මුළුතැන්ගෙය ම එළිය වෙන මායා දීප්තියක් වගේ කිසිම දෙයක් ඇති වුණෙත් නැහැ.

මම නිකෝ වෙතට බැල්මක් හෙළුවා.

එයා වෙන කවරදාටත් වඩා කලබලෙන් ඉන්නවා වගෙයි පෙනුණේ, ඒ වුණත් එයා ඔළුව වැනුවා. "වෙලාව හරි."

"පර්සි," මගේ අම්මා කතා කළා. "තව එක දෙයක්. ඔයා... ඔයා ක්‍රෝනොස් එක්ක කරන සටනෙන් බේරුනොත්, මට සංඥාවක් එවන්න." පසුම්බිය හාරා ඇවිස්සූ එයා එයාගේ ජංගම දුරකථනය මට දුන්නා.

"අම්මේ," මම කිව්වා, "ඔයා දන්නවා නේ උප දෙවිවරුන්ට ෆෝන් පාවිච්චි කරන්න-"

"මං දන්නවා," එයා කිව්වා. "ඒත් බැරි වෙලාවත් ඕනෑ වුණොත්. ඔයාට කෝල් කරන්න පුළුවන්කමක් නැති වුණොත්... මැන්හැටන්වල ඕනෑම තැනක ඉඳලා මට බලාගන්න පුළුවන් විදිහේ මොකක් හරි සංඥාවක් කරන්න. ඔයා හොඳින් කියලා මට දැනගන්න."

"හරියට තිසියස් වගේ," පෝල් යෝජනා කළා. "එයා ආපහු ඇතින්ස්වල ගෙදරට එද්දි සුදු පාට රුවල් නංවන්න කිව්වා වගේ."

"හැබැයි එයාට ඒක කරන්න අමතක වුණ එකයි වැරැද්ද," නිකෝ කෙඳිරුවා. "ඒ නිසා බලාපොරොත්තු කඩවෙච්චි එයාගේ



තාත්තා මාලිගාවේ වහලෙන් බිමට පැනලා මළා. ඒත් ඒ ඇරුණා ම නම්, ඒක නියම අදහසක්."

"කොඩියක් නැත්නම් ගිනි මැලයක් වගේ දෙයක් කොහොමද?" මගේ අම්මා ඇහුවා. "ඔලිම්පස්වල- එම්පයර් ස්ටේට් බිල්ඩිමේ ඉඳන්."

"මොකක් හරි නිල් පාට දෙයක්," මම කිව්වා.

අපි දෙන්නා අතරේ නිල් පාට කෑම සම්බන්ධයෙන් විහිළුවක් අවුරුදු ගාණක ඉඳන් තිබුණා. ඒක මම කැමති ම පාට වුණු නිසාම මාව හිනස්සවන්න එයා ඒක පාවිච්චි කළා. හැම අවුරුද්දක ම මගේ උපන්දින කේක් ගෙඩිය, මගේ පාස්කු කෑම කූඩය වගේම මගේ නත්තල් රසකැවිලිත් නිල් පාට වුණා.

"ඔව්," මගේ අම්මා එකඟ වුණා. "මම නිල් පාට සංඥාවක් එනකල් බලන් ඉන්නම්. ඒ වගේම මම මාලිගා වහලවල් උඩින් පනින්නේ නැතුව ඉන්නත් බලන්නම්."

එයා අන්තිම වතාවටත් මාව වැලඳ ගත්තා. ඒ වෙලාවේ එයාට සදහට ම සමු දෙන බවක් නොහිතා ඉන්න මම උත්සාහ කළා. මම පෝල්ට අතට-අත දුන්නා. ඊට පස්සේ නිකෝයි මමයි මුළුතැන්ගෙයි දොරකඩට ගිහින් මිසිස් ඕ'ලෙරී දිහා බැලුවා.

"කරන්න දෙයක් නෑ, කෙල්ලේ," මම කිව්වා. "ආයෙමත් හෙවණැලි ගමන් යන වෙලාව ඇවිල්ලා."

කෙඳිරියක් නැගූ එයා හොම්බ මත ඉදිරි ගාත් දෙක හරස් කරගත්තා.

"දැන් කොහෙටද?" මම නිකෝගෙන් ඇහුවා. "ලොස් ඇන්ජලීස්වලට ද?"

"උවමනාවක් නැහැ," එයා කිව්වා. "පාතාල ලෝකෙට යන්න ඊට වඩා ළඟ දොරක් තියෙනවා."

Scanned with CamScanner

# 07

# මගේ ගණිත ගුරුවරිය මාව ඔසවාගෙන ගියා

මධ්‍යම උද්‍යානයේ පොකුණට උතුරු දෙසින් අපිව මතු වුණා. එතැන තිබුණු ගල් ගෙඩි ගොඩක් අසලට නොණ්ඩි ගසමින් ගිය මිසිස් ඕ'ලෙරී හිටියේ හොඳටෝම හෙම්බත් වෙලා වගෙයි. එයා වටපිටාව ඉව කරන්නේ එයාගේ සීමාව ලකුණු කරගන්නවත් ද හිතලා මම බය වුණත්, නිකෝ මාව අස්වැසුවා, "ඒකට කමක් නෑ. එයා ගෙදර යන පාර ඉව කරනවා විතරයි."

මම රවා බැලුවා. "ගල් ගෙඩි මැදින්?"

"පාතාල ලෝකෙට ප්‍රධාන දොරටු දෙකක් තියෙනවා," නිකෝ කිවුවා. "ලොස් ඇන්ජලීස්වල තියෙන එක ඔයා දන්නවා නේ."

"කෙරොන්ගේ තොටුපොළ."

නිකෝ ඔළුව වැනුවා. "හුඟක් ආත්ම යන්නෙ ඒ පාරේ. ඒත් ඊට වඩා පොඩි, හොයාගන්න අමාරු තව පාරක් තියෙනවා. ඕර්ෆියස්ගේ දොරටුව."

"අර හාර්ප් (ප්‍රමාණයෙන් විශාල වීණා විශේෂයක්) එකක් ගහපු හාදයා."

"ලයර් (ප්‍රමාණයෙන් කුඩා, එක අතක රඳවාගෙන වාදනය කළ හැකි වීණා විශේෂයක්) එකක් ගහපු හාදයා," නිකෝ නිවැරදි කළා.



"හැබැයි ඔව්, එයා තමයි. එයා සංගීතයෙන් පොළොව වශී කරලා, පාතාල ලෝකෙට අලුත් පාරක් අරවගත්තා. සිංදුවෙන් හේඩීස්ගේ මාලිගාවට ම පාර කපාගත්ත එයා තව පොඩ්ඩෙන් එයාගේ නෝනගෙ ආත්මෙත් අරන් පැනලා යනවා."

මට ඒ කතාව මතක තිබුණා. ඕර්ෆියස් එයාගේ බිරිඳව ආපහු මේ ලෝකයට අරන් එන අතර මඟදි පස්ස හැරිලා බලන්න එපා කියලයි එයාට උපදෙස් ලැබිලා තිබුණේ. ඒත් ඇත්ත වශයෙන් ම එයා එහෙම කළා. ඒකත් අර අපේ හිත්වල උණුසුම් සහ නොපැහැදිලි හැඟීමක් ඉතුරු කරන 'ඊට-පස්සේ-එයාලා-මැරුණා/කතාව-සමාප්තයි' ජාතියේ කතන්දරයක්.

"එහෙනම් මේක තමයි ඕර්ෆියස්ගේ දොර." මම උද්‍යෝගිමත් වෙන්න උත්සාහ කළා, ඒත් මට නම් තවමත් ඒක පෙනුණේ ගල් ගෙඩි ගොඩක් වගේ විතරයි. "කොහොමද ඒක ඇරෙන්නේ?"

"අපිට සංගීතයක් ඕනෑ වෙනවා," නිකෝ කිවුවා. "ඔයාගේ ගායන හැකියාව කොහොමද?"

"ම්ම්, නෑ. ඔයාට බැරි ද මේ, නිකං ම ඒකට ඇරෙන්න කියන්න? ඔයානේ හේඩීස්ගේ පුතා."

"ඒක එච්චර ලේසි නැහැ. අපිට සංගීතයක් ඕනෑමයි."

මම සිංදු කියන්න උත්සාහ කළොත් මෙතැන ඇති වෙන්නේ භූමිකම්පාවක් විතරයි කියලා මට හොඳටෝම විශ්වාස වුණා.

"මට ආවා ඊට වඩා හොඳ අදහසක්." අනෙක් පැත්තට හැරුණු මම හඬ නගා කතා කළා, "ග්‍රෝවර්!"

★★★

අපි සෑහෙන වෙලාවක් බලා සිටියා. බිම වකුටු වුණ මිසිස් ඕ'ලෙරී නින්දට වැටුණා. කැලෑව තුළ රැහැයියන්ගේ හඬ සහ බස්සන්ගේ හූම් හඬ මට ඇසුණා. මධ්‍යම උද්‍යානයේ බටහිර සීමාව දිගින් රථ වාහනවල ගුමු ගුමුව නැඟුණා. ළඟ පාත පාරකින් අසෙකුගේ කුර ගැටෙන හඬ ඇසුණා, සමහරවිට අශ්වාරෝහක පොලිස් නිලධාරියෙක් මුර සංචාරයේ යනවා වෙන්න ඇති. පාන්දර එකට ළමයි දෙන්නෙක් උද්‍යානයේ කරක් ගහනවා දකින්න ලැබුණොත් එයාලා හරි ම සතුටු වෙයි කියලා මට සහතික වුණා.

"ඒකෙන් වැඩක් වෙන්නෑ," අන්තිමේ දී නිකෝ කිවුවා.

Scanned with CamScanner

ඒත් මට දැනෙමින් තිබුණේ ඊට වඩා වෙනස් හැඟීමක්. මාස ගාණකට පසුව පළවෙනි වතාවට මගේ සහකම්පන සම්බන්ධය සැබෑවට ම පොපියමින් තිබුණා. ඒකේ තේරුම මිනිස්සු ගොඩක් එක පාර ම නේචර් නාලිකාව ක්‍රියාත්මක කරලා, එහෙමත් නැත්නම් ග්‍රෝවර් මේ අහලක ඉන්නවා.

මම ඇස් පියාගෙන හිත ඒකාග්‍ර කළා. ග්‍රෝවර්.

එයා මේ උද්‍යානයේ කොතැනක හෝ ඉන්න බව මම දැනගෙන හිටියා. ඒත් එයාගේ චිත්තවේග මට නොදැනුණේ ඇයි? මට දැනුණු එක ම දේ වුණේ මගේ හිස්කබල පතුලින් මතු වූ සිහින් ගුමු ගුමුව විතරයි.

ග්‍රෝවර්, මම වඩාත් තදින් හිතුවා.

හ්ම්ම්ම්-හ්ම්ම්ම්, යමෙක් කිවුවා.

මගේ හිතට රූපයක් ඇතුළු වුණා. ප්‍රධාන මාර්ගවලින් සෑහෙන දුරින්, කැලෑව මැද්දට වෙන්නට පිහිටි රූස්ස එල්ම් ගහක් මම දැක්කා. එහි ගැට සහිත මුල් පොළොව තුළටත්, ඉන් පිටතටත් ගෙතී ඇඳක් වගේ සැකසී තිබුණා, දෑත් පපුව හරහා බැඳගෙන, දෑස් පියාගෙන එය මත වැතිරී සිටියේ සැටර් කෙනෙක්. මුලදී ඒ ග්‍රෝවර් ම ද කියලා සහතික වෙන්න මට පුළුවන් වුණේ නැහැ. එයාව අතු රිකිලිවලින් සහ කොළරොඩුවලින් වැසී සිටියේ සෑහෙන කාලයක් තිස්සේ එතැන නිදාගෙන ඉඳලා වගෙයි. ගස්වල මුල් එයා වටා එතී, එයාව පොළොව තුළට ඇද ගනිමින් සිටිනවා වගෙයි පෙනුණේ.

ග්‍රෝවර්, මම කතා කළා. නැඟිටින්න.

අන්හ්හ්හ්-ස්ස්ස්!!

ඔයාව පස්වලින් වැහිලා, බං. නැඟිටිනවා!

නිදිමතයි, එයාගේ හිත මිමිණුවා.

කෑම. මම කිවුවා. පෑන්කේක්!

එයාගේ ඇහි පියන් වේගයෙන් ඇරුණා. මගේ හිතට සිතුවිලි ධාරාවක් ගලා ආවේ හරියට හදිසියේ ම එයා ෆාස්ට්-ෆෝවඩ් දාලා වගෙයි. මගේ හිතේ තිබුණු රූපය බිඳී යද්දී, මාව බිමට ඇද වැටෙන්න ගියා.

"මොකද වුණේ?" නිකෝ ඇහුවා.



"එයාව අල්ල ගත්තා. එයා... ඔව්. එයා මඟ එනවා."

විනාඩියකට පස්සේ, අපි අසල ම තිබුණු ගහ සෙලවුණා. ගහේ අතු මතින් බිමට ඇද වැටුණු ග්‍රෝවර් හොම්බ බිම ඇනගත්තා.

"ග්‍රෝවර්!" මම මොර ගැසුවා.

"වූෆ්!" මිසිස් ඕ'ලෙරී ඔළුව ඔසවා බැලුවේ, අපි සැටර් කෙනෙක්ගෙන් අල්ලන සෙල්ලම් කරන්න යනවා ද හිතලා වෙන්නැති.

"බ්ලාහ්-හා-හා!" ග්‍රෝවර් හඬගෑවා.

"ඔයා හොඳින් ද, කොල්ලෝ?"

"ඔහ්, මට අවුලක් නෑ." එයා ඔළුව අතගෑවා. එයාගේ අං දෙක කොයි තරම් වැඩී තිබුණා ද කියනවා නම් දැන් ඒවා එයාගේ කැරලි කොණ්ඩයෙන් අඟලක් විතර ඉහළට මතු වී පෙනුණා. "මම හිටියේ උද්‍යානේ අනිත් කෙළවරේ. මාව ගහෙන් ගහට මාරු කරලා මෙතැනට අරන් එන එක හොඳයි කියලා මේ රුක් දෙවිගොල්ලන්ට අදහසක් පහළ වුණා නේ. හැබැයි එයාලට 'උස' ගැන හරිහමං තේරුමක් නැහැ."

දත් නියවූ එයා දෙපයින්- ඇත්ත ම කියනවා නම්, කුරවලින් නැඟී සිටියා. පහුගිය ගිම්හානයෙන් පස්සේ ග්‍රෝවර් මනුෂ්‍යයෙක් වගේ වෙස් වළා ගැනීමට උත්සාහ කිරීම නතර කරලා තිබුණා. එයා තව දුරටත් හිස්වැසුම් හෝ බොරු කකුල් පැලඳුවේ නැහැ. එයා අඩු තරමේ කලිසම් ඇන්දෙත් නැහැ. මොකද එයාගේ ඉණෙන් පහළ, එළු කකුල් දෙක ලොම්වලින් වැහිලයි තිබුණේ. කාටූන් පොතකින් ගත් කැලෑවක රූපයක් ඉදිරිපස මුද්‍රණය කර තිබුණු එයාගේ ටී-ෂර්ට් එක මඩ සහ ගස්වල ඔීජසින් වැහිලා. සෑහෙන දිගට වැවී තිබුණු එයාගේ එළු රැවුල නිසා එයාට දැන් නියම පිරිමි පෙනුමක් (නැත්නම් නියම එළු පෙනුමක් ද?) ලැබී තිබුණා. ඒ වගේම එයා දැන් මගේ උසට ම වගේ හිටියා.

"ඔයාව දකින්න ලැබුණට සන්තෝසයි, එළු-කොල්ලෝ," මම කිවුවා. "ඔයාට නිකෝව මතකයි නේද."

නිකෝට ඔළුව වනා ආචාර කළ ග්‍රෝවර්, ඊට පස්සේ මාව තදින් වැලඳ ගත්තා. එයා ළඟින් හැමුවේ දැන් කප්පාදු කළ වැටක වගේ ගස් ගඳක්.

"පර්සී!" එයා හඬගෑවා. "මම ඔයා නැතුව පාළුවෙන් හිටියේ! මට කඳවුර නැතුවත් පාළුයි. මේ කැලෑවල ඒ හැටි හොඳ එන්චිලඩා නෑ අප්පා."

"මම බය වෙලා හිටියේ," මම කිවුවා. "පහුගිය මාස දෙකේ ඔයා කොහෙද ගිහින් හිටියේ?"

"පහුගිය මාස දෙ-" ග්‍රෝවර්ගේ හිනාව මැකී ගියා. "පහුගිය මාස දෙකේ? ඔයා මොනවා ගැන ද කියවන්නේ?"

"අපිට ඔයා ගැන කිසිම ආරංචියක් නැති වුණා," මම කිවුවා. "ජුනිපර් හොඳටෝම කලබල වෙලා. අපි අයිරිස්-මැසේජ් එවුවා, ඒත්-"

"පොඩ්ඩක් ඉන්න." එයා අහසේ පායා තිබූ තරු දිහා බැලුවේ එයා ඉන්න තැන ගණනය කරගන්න උත්සාහ කරනවා වගෙයි. "මේ මොන මාසෙ ද?"

"අගෝස්තු."

එයාගේ මූණේ ලේ හිඳුණා. "ඒක වෙන්න බැහැ. මේ ජූනි මාසේ. මම පොඩි නින්දක් දාන්න ඇලවුණා විතරයි..." එයා මගේ අතක් තදින් අල්ල ගත්තා. "දැන් මට මතකයි! එයා මගේ සිහිය නැති කළා. පර්සි, අපි එයාව නවත්තන්න ඕනෑ!"

"හෝව්," මම කිවුවා. "ඔහොම ඉන්න. දැන් සිද්ධ වුණේ මොනවද කියලා මට කියන්න."

එයා ගැඹුරු හුස්මක් ගත්තා. "මම හර්ලෙම් මියර් කිට්ටුව කැලේ ඇවිද ඇවිද හිටියේ. ඒ වෙලාවේ මට පොළොව දෙදරනවා දැනුණා, හරියට මොකක් හරි බලගතු දෙයක් ළඟ පාතක තියෙනවා වගේ."

"ඔයාට ඒ වගේ දේවල් දැනෙනව ද?" නිකෝ ඇහුවා.

ග්‍රෝවර් ඔළුව වැනුවා. "පෑන්ගේ මරණෙන් පස්සේ, සොබාදහමේ මොකක් හරි වැරැද්දක් තියෙනවා නම් මට ඒක දැනෙනවා. ඒක හරියට මම කැලෑවෙ ඉන්නකොට මගේ කන් දෙකයි, ඇස් දෙකයි තිබුණට වඩා තියුණු වෙනවා වගෙයි. කොහොම හරි, මම ඒ ඉව දිගේ යන්න පටන් ගත්තා. කළු පාට දිග කබායක් ඇඳගත්ත පිරිමියෙක් උද්‍යානෙ හරහා ඇවිදගෙන යමින් හිටියා. ඒ මනුස්සයාට හෙවණැල්ලක් නැති බව මට පෙනුණා. හොඳට ඉර පායපු දවල් වරුවක් වෙලත්, එයාට හෙවණැල්ලක් තිබුණේ නැහැ. ඇවිදගෙන යද්දි එයාව නිකං දිලිසෙනවා වගෙයි පෙනුණේ."

"මිරිඟුවක් වගේ ද?" නිකෝ ඇහුවා.



"ඔව්," ග්‍රෝවර් උත්තර දුන්නා. "ඒ වගේම එයා මිනිස්සු ළඟින් යද්දි-"

"මිනිස්සුන්ට සිහිය නැති වෙනවා," නිකෝ කිවුවා. "එයාලා බිම වකුටු වෙලා නිදා ගන්නවා."

"අන්න හරි! ඊට පස්සේ එයා යන්න ගියා ම, එයාලා ආපහු නැගිටලා මුකුත් නොවුණ ගාණට තම තමන්ගේ වැඩවලට යනවා."

මම නිකෝ දිහා බලා සිටියේ පුදුමයෙන්. "මේ කළු ඇඳගත්ත හාදයාව ඔයා දන්නව ද?"

"මටත් බය ඒකමයි," නිකෝ කිවුවා. "ග්‍රෝවර්, ඊට පස්සෙ මොනවද වුණේ?"

"මම ඒ පිරිමියා පස්සෙ ගියා. එයා උද්‍යානේ වටේ තියෙන ගොඩනැගිලි දිහා බලබලා ගියේ හරියට ඇස්තමේන්තු ගන්නවා වගෙයි. ඒ වෙලාවේ ව්‍යායාමෙට දුවන්න ආව ගෑනු කෙනෙක් එයා ළඟින් ගියා. ඒත් එක්ක ම ඒ ගෑනු කෙනා බිම වකුටු වෙලා ගොරවන්න පටන් ගත්තා. කළු ඇඳගෙන හිටපු පිරිමියා උණ බලන්න වගේ එයාගේ නළලට අත තියලා බැලුවා. ඊට පස්සේ එයා ආපහු ඉස්සරහට යන්න ගත්තා. මේ වෙද්දි එයා රාක්ෂයෙක්, එහෙමත් නැත්නම් ඊටත් වඩා දරුණු එකෙක් කියලා මට තේරුම් ගිහිල්ලා තිබුණේ. මම එයා පස්සෙන් මේ ගස් ගොන්න ඇතුළේ ලොකු එල්ම් ගහක් පාමුලට යනකල් ම ගියා. එයාව අල්ලගන්න උදවුවට මම රුක් දෙවිවරුන්ව කැඳවන්න යනකොට ම එයා ආපහු හැරුණා..."

ග්‍රෝවර් කෙළ පිඬක් ගිල්ලා. "පර්සි, එයාගේ මූණ. මට එයාගේ මූණ ඇඳින ගන්න බැරිවුණා, මොකද ඒක දිගින් දිගට ම මාරු වුණා. එයා දිහා බලා හිටපු ටිකට මට නිදිමතක් දැනුණා. 'ඔයා මොනවද කරන්නේ?' කියලා මම එයාගෙන් ඇහුවා. එයා කිවුවා, 'මම මේ වටපිටාව ටිකක් බලනවා. යුද්ධයකට කලින් කෙනෙක් නිතර ම තමන්ගේ යුද භූමිය පරීක්ෂා කරලා බලන්න ඕනෑ.' මං හරිම බුද්ධිමත් විදිහට එයාට උත්තර දුන්නා, 'මේ කැලෑව තියෙන්නේ මගේ ආරක්ෂාව යටතේ. මෙහෙ ඔයාට කිසිම යුද්ධයක් පටන් ගන්න ඉඩක් නෑ!' එයා මහ හයියෙන් හිනාවෙලා මෙහෙම කිවුවා, "මම වැදගත් ම අවස්ථාවට පාවිච්චි කරන්න මගේ ශක්තිය ඉතුරු කර ගනිමින් ඉන්න එක ඔහේගෙ හොඳට ගියා, පුංචි සැටර්. මම ඔහේට කෙටි නින්දක් විතරක් දෙන්නම්. සතුටුදායක හීන එක්ක." මට අන්තිමට මතක තියෙන්නෙ එච්චරයි."

Scanned with CamScanner

නිකෝ සුසුමක් පිටකළා. "ග්‍රෝවර්, ඔයාට මුණ ගැහුණේ මෝර්ෆියස්ව, හීනවලට අධිපති දෙවියව. ඔයාට ආපහු ඇහැරෙන්න ඉඩක් ලැබුණ එක ම වාසනාවක්."

"මාස දෙකක්," ග්‍රෝවර් අඳෝනා නැගුවා. "එයා මාව මාස දෙකක් නිදි කරලා!"

එහි තේරුම අවබෝධ කරගන්න මම හිත වෙහෙසුවා. මේ කාලය පුරාවට ම අපිට ග්‍රෝවර්ව සම්බන්ධ කරගන්න නොහැකි වුණ හේතුව එයින් පැහැදිලි වුණා.

"වන දෙවඟනෝ ඔයාව ඇහැරවන්න බැලුවෙ නැත්තේ ඇයි?" මම ඇහුවා.

ග්‍රෝවර් උරහිස් ඇකිළුවා. "ගොඩක් වන දෙවිවරුන්ට කාලය ගැන හරිහමං තේරුමක් නැහැ. ගහකට මාස දෙකක් කියන්නෙ ඒ හැටි කාලයක් නෙවෙයි. මට හිතෙන්නේ මගේ නින්දේ කිසිම වැරැද්දක් තියෙන බවක් එයාලා හිතන්න නැතුව ඇති."

"මෝර්ෆියස් මේ උද්‍යානේ කරකර හිටියෙ මොනවද කියලා අපිට හොයාගන්න වෙනවා," මම කිවුවා. "එයා කියපු මේ 'වැදගත් ම අවස්ථාව' ගැන කතාව මට නම් ඇල්លුවෙ නැහැ."

"එයා වැඩ කරන්නෙ ක්‍රෝනොස්ට," නිකෝ කිවුවා. "අපි දැනටමත් ඒක දන්නව නේ. සුළු දෙවිවරු ගොඩක් ඒ පැත්තට ගිහින් ඉන්නේ. ආක්‍රමණයක් වෙන්න යන බව මේකෙන් ම ඔප්පු වෙනවා. පර්සි, අපිට අපේ සැලැස්මෙ විදිහට වැඩේ කරගෙන යන්න වෙනවා."

"පොඩ්ඩක් ඉන්න," ග්‍රෝවර් කිවුවා. "මොන සැලැස්ම ද?"

අපි ඒක එයාට කිවුවා. ග්‍රෝවර් එයාගේ කකුලේ ලොම්වලින් අදින්න පටන් ගත්තා.

"ඔයාලා ඇත්තට ම නෙවෙයි නේද කියන්නේ," එයා කිවුවා. "ආයෙත් නම් පාතාල ලෝකෙට යන්න බැහැ."

"මම ඔයාට අපිත් එක්ක එන්න කියන්නේ නැහැ, කොල්ලෝ," මම පොරොන්දු වුණා. "මං දන්නවා ඔයා මේ දූත් නැගිට්ටේ කියලා. ඒ වුණත් අපිට මේ දොර ඇරගන්න සංගීතයක් ඕනෑ. ඔයාට ඒක කරන්න පුළුවන් ද?"

ග්‍රෝවර් එයාගේ බටනළා කුට්ටම එළියට ගත්තා. "මං හිතන්නේ මට උත්සාහ කරලා බලන්න පුළුවන් වෙයි. ගල් ගෙඩි වුණත් දෙකට



පැළෙන විදිහේ තනු ටිකක් මම දන්නවා. ඒත්, පර්සි, ඔයාට මේක කරන්න ම ඕනෑ ද?"

"ඔව්, බං," මම කිවුවා. "ඒක ලොකු උදවුවක් වෙයි. අපේ ඉස්සර කාලේ වෙනුවෙන්වත්?"

එයාට කෙඳිරි ගෑවුණා. "මට මතක විදිහට නම්, ඉස්සර කාලේ අපි සෑහෙන වතාවක් මැරෙන්නැතුව බේරුණේ නූලෙන් වගේ. ඒත් කමක් නෑ, අපි මේක කරලා බලමුකෝ."

බටනළා දෙතොලතර තබාගත් එයා කර්කශ, විනිවිද යනසුලු හඬක් වාදනය කළා. ගල් ගෙඩි දෙදරන්න ගත්තා. තවත් පද දෙක තුනක් වයද්දී ම ඒවා දෙකට පැළුණේ තුන් හුලස් කපොල්ලක් අනාවරණය කරමින්.

මම ඇතුළට එබී බැලුවා. එහි අන්ධකාරය තුළට පඩිපෙළක් ඇදී ගියා. එය තුළ වූ වාතයේ තිබුණේ පුස් ගඳ සහ මරණයේ ගඳයි. එයින් පහුගිය අවුරුද්දේ වංගගිරිය හරහා මම ගිය ගමනේ නපුරු මතකයන් ඇවිස්සුණා. ඒත් මේ උමඟ ඊටත් වඩා බිහිසුණු එකක් වගෙයි දැනුණේ. එය කෙලින් ම ඇදී ගොස් තිබුණේ හේඩීස්ගේ රාජධානියටයි. සාමාන්‍යයෙන් නිතර ම වගේ ඒක එක පැත්තකට විතරක් යන ගමනක්.

මම ග්‍රෝවර් දිහාවට හැරුණා. "ස්තූතියි... මං හිතන්නේ."

"පර්සි, ඇත්තට ම ක්‍රෝනොස් ආක්‍රමණයක් කරන්න ද යන්නේ?"

"ඔයාට මීට වඩා හොඳ උත්තරයක් දෙන්න තිබුණා නම් මම කැමති, ඒත් ඔව්. එයා එහෙම කරයි."

ග්‍රෝවර් කලබල වෙලා එයාගේ බටනළා කුට්ටමත් කාලා දමාවි කියලා මම හිතුවා, ඒ වුණත් එයා කළේ සෘජුව හිටගෙන, එයාගේ ටී-ෂර්ට් එක පිස දමා ගැනීම විතරයි. අර නාකි තඩි ලෙනෙයස්ට වඩා ග්‍රෝවර් කොයි තරම් වෙනස් ද නොහිතා ඉන්න මට බැරිවුණා. "එහෙනම්, මට සොබාවික බලවේග රැස් කරගන්න වෙනවා. සමහරවිට අපිට උදවු කරන්න පුළුවන් වෙයි. අපිට මේ මෝර්ෆියස්ව හොයාගන්න පුළුවන් වෙයි ද කියලා මම බලන්නම්."

"ඔයා හොඳින් කියලා ජුනිපර්ට කියලා හිටියොත් හොඳයි."

එයාගේ ඇස් දෙක ලොකු වුණා. "ජුනිපර්! ඔහ්, එයා මාව මරයි!"

දුවන්න පටන් ගත් එයා ඊට පස්සේ ආපහු හැරිලා ඇවිත් තවත් වතාවක් මාව වැලඳ ගත්තා. "පල්ලෙහා දී ප්‍රවේසම් වෙන්න! පණ පිටින් ආපහු එන්න!"

එයා යන්න ගියාට පස්සේ, නිකෝයි මමයි මිසිස් ඕ'ලෙරිව අවදි කළා.

උමඟ ඉව කළාට පස්සේ උද්‍යෝගිමත් වුණ එයා පෙරමුණ ගෙන පහළට බහින්න පටන් ගත්තා. ඒ උමඟ ඇතුළේ ඉඩ එයාට සෑහුණේ යාන්තමින් වගෙයි. එයාට හිර නොවී යන්න ලැබෙයි කියලා මම බලාපොරොත්තු වුණේ පාතාල ලෝකෙට යන උමඟක් මැද හිරවුණ යම බැල්ලක් ගලවා ගන්න අපිට කොච්චර ලිහිස්සි තෙල් ඕනෑ වෙයි ද කියලා මට නම් හිතාගන්නවත් බැරි වුණ නිසයි.

"ලෑස්ති ද?" නිකෝ මගෙන් ඇහුවා." හැමදේම හරියයි. බය වෙන්න දෙයක් නෑ."

එයා කතා කළේ ඒ බව එයාට ම ඒත්තු ගන්වන්න උත්සාහ කරනවා වගෙයි.

මම ඉහළ අහසේ පායා තිබූ තරු දිහා බැලුවේ ආයේ කවදාවත් ඒවා දකින්න ඉඩ ලැබෙයි ද පුදුම වෙමිනුයි. ඊට පස්සේ අපි අන්ධකාරය තුළට කිමිදුණා.

★★★

පටු, බෑවුම් අධික සහ ලිස්සනසුලු ඒ පඩිපෙළ අනන්තයට ම ඇදී යනවා වගෙයි දැනුණේ. තනි කළුවරින් පිරී තිබුණු ඒ උමඟ තුළ තිබුණු එක ම ආලෝකය වුණේ මගේ කඩුවෙන් නිකුත් වූ එළිය විතරයි. මම හෙමින් යන්න උත්සාහ කළත්, මිසිස් ඕ'ලෙරීට නම් තිබුණේ වෙන අදහසක්. එයා සතුටින් බුරමින් පිම්මේ ඉදිරියට දිවුවා. එයාගේ හඬ කාලතුවක්කු වෙඩි හඬවල් වගේ උමඟ පුරා දෝංකාර දුන්නා, ඉතින් අපි පඩිපෙළ පාමුලට ගියා ම අපේ පැමිණීමෙන් කිසිවෙක් පුදුම වෙන්නේ නැති වෙයි කියලා මම හිතුවා.

නිකෝ සුනංගු වෙමින් පිටුපසින් එද්දී මට අමුත්තක් දැනුණා.

"ඔයා හොඳින් ද?" මම එයාගෙන් ඇහුවා.

"හොඳයි." එයාගේ මුහුණේ තිබුණු ඒ බැල්ම මොකක්ද... දෙගිඩියාවක් ද? "දිගට ම යමුකෝ," එයා කිවුවා.



මටත් වෙන කරන්න දෙයක් තිබුණේ නැහැ. මම මිසිස් ඕ'ලෙරී පසුපස ගැඹුරට ම ගියා. තවත් පැයකට පස්සේ, මට ගඟක ගිගුරුම ඇහෙන්න ගත්තා.

කළු යමහල් වැල්ලෙන් වැසුණු තැනිතලාවක පිහිටි බෑවුමක පතුලින් අපි ඉවතට මතු වුණා. අපිට දකුණින්, ස්ටයික්ස් ගඟ ගල් කුළු මතින් ඇද හැලෙමින් ගලා ගියා. වම් පසින්, ඈත අන්ධකාරය තුළ එරොබස්වල ප්‍රාකාර- හේඩීස්ගේ රාජධානියේ කළු පාට මහා තාප්ප මත ගිනි මැල ඇවිලෙමින් තිබුණා.

මම වෙවුලා ගියා. මට මුලින් ම මෙහෙට එන්න සිද්ධ වුණේ අවුරුදු දොළහේදියි. ඒ වතාවේ මට නොනැවතී ඉදිරියට යන්න ධෛර්යය දුන් එක ම දේ වුණේ ඇනබෙත්ගේ සහ ග්‍රෝවර්ගේ සහයෝගයයි. නිකෝගෙන් නම් මට ඒ විදිහේ 'ධෛර්යයක්' ලැබෙන පාටක් තිබුණේ නැහැ. එයා හිටියෙත් සුදුමැලි වෙලා වගේම බයවෙලා වගෙයි.

සතුටින් හිටිය එක ම කෙනා වුණේ මිසිස් ඕ'ලෙරී. වැල්ල දිගේ එහා මෙහා දිවූ එයා බිම වැටී තිබුණු මිනිස් කකුල් ඇටයක් අහුලාගෙන, ආපසු මගේ ළඟට දුවගෙන ආවා. ඇටකටුව මගේ පාමුල දැමූ එයා මම ඒක එයාට අහුලගෙන එන්න ඈතට විසි කරන තුරු බලා සිටියා.

"ම්, පස්සේ බලමු, කෙල්ලේ." මම මගේ ධෛර්යය වඩවා ගන්න උත්සාහ කරමින් අඳුරු දිය කඳ දිහා බලා සිටියා. "එතකොට, නිකෝ... අපි කොහොමද මේක කරන්නේ?"

"ඉස්සෙල්ල ම අපිට ගේට්ටුවෙන් ඇතුළට යන්න වෙනවා," එයා කිවුවා.

"ඒත් ගඟ තියෙන්නේ මෙතැන නේ."

"මට දෙයක් ගන්න තියෙනවා," එයා කිවුවා. "ඒක තමයි එක ම ක්‍රමය."

මම එන තුරු බලා නො ඉඳ එයා එක එල්ලේ ඉදිරියට ගියා.

මම රවාගත්තා. ගේට්ටුවෙන් ඇතුළට යන බවක් නිකෝ නිකමටවත් කියලා තිබුණේ නැහැ. ඒත් දැන් අපි මෙහෙට ආවට පස්සේ, වෙන මොනවා කරන්න ද මම දැනගෙන හිටියේ නැහැ. අකමැත්තෙන්

Scanned with CamScanner

වුණත්, මම එයා පසුපස වැල්ල දිගේ ලොකු කළු ගේට්ටු දෙසට පිය මැන්නා.

ඇතුළට යාමේ බලාපොරොත්තුවෙන් මළවුන් පෝලිම් ගැඹි පිටත බලා සිටියා. ඒක නම් මළ ගෙවල් වැඩි දවසක් වෙන්න ඇති, මොකද 'පහසු මරණ' පෝලිම පවා පිරිලා තදබද වෙලයි තිබුණේ.

"වූෆ්!" මිසිස් ඕ'ලෙරි හඬගෑවා. එයාව නවත්වන්න මට ඉඩක් ලැබෙන්න කලින් එයා ආරක්ෂක මුර කපොල්ල දිහාවට පිම්මේ දිවුවා. හේඩීස්ගේ මුර බල්ලා, සර්බෙරස් අන්ධකාරය තුළින් මතු වුණා- රොට්වෙයිලර් වර්ගයේ ඔළු තුනක් ඇති බල්ලෙක් වුණ එයා කොච්චර ලොකුයි ද කියනවා නම් එයා ළඟ දි මිසිස් ඕ'ලෙරිව පෙනුණේ පූඩ්ල් සෙල්ලම් බල්ලෙක් වගෙයි. සර්බෙරස් බාගෙට විනිවිද පෙනෙනසුලු නිසා, එයා ඔයාව මරන්න තරම් ළඟට එනකල් ම දකගන්න අමාරුයි. ඒ වුණත් එදා නම් එයා හැසිරුණේ අපිව ගණන් ගන්නේවත් නැති ගාණටයි. එයා මිසිස් ඕ'ලෙරිගේ සුව දුක් විමසන්න කාර්යබහුල වෙලයි හිටියේ.

"මිසිස් ඕ'ලෙරි, එපා!" මම එයාට කෑගැසුවා. "එපා ඉව කරන්න... අයියෝ."

නිකෝ හිනා වුණා. ඊට පස්සේ මගේ දිහා බලද්දී එයාගේ මුහුණේ හැඟීම් ආයෙමත් බරපතළ පෙනුමක් ගත්තේ, හරියට කිසියම් අප්‍රසන්න දෙයක් සිහිවුණා වගෙයි. "එන්න යමු. පෝලිමේ දී එයාලා අපිට කිසිම කරදරයක් කරන එකක් නැහැ. ඔයා යන්නේ මාත් එක්ක නේ."

මම නම් ඒකට කැමති වුණේ නැහැ, ඒ කොහොම වුණත් අපි ආරක්ෂක භූතයෝ අතරින් ඉදිරියට ගිහින් ඇස්ෆොඩෙල් යායට පා තැබුවා. මිසිස් ඕ'ලෙරිව සර්බෙරස්ගෙන් වෙන් කරලා, අපේ පසුපස ගෙන්වා ගන්න මට තුන් වතාවක් ම උරුවම් බාන්න සිද්ධ වුණා.

කළු පොප්ලර් ගස් තැන තැන වැඩුණු කළු පාට තණ යාය දිගේ අපි ගමන් කළා. අනාවැකියේ කියවෙන විදිහට තව දවස් හතර පහකින් ඇත්තට ම මම මැරුණොත්, මට සදහට ම මෙතැන ඉන්න වෙයි. ඒ වුණත් මම ඒ ගැන නොහිතා ඉන්න උත්සාහ කළා.

හෙමින් හෙමින් ඉදිරියට ඇදෙමින් නිකෝ අපිව හේඩීස්ගේ මාලිගාව ළඟට ම ගෙන යමින් සිටියා.



"හේයි," මම කතා කළා, "අපි දැනටමත් ගේට්ටුවෙන් ඇතුළට ඇවිල්ලා නේ ඉන්නේ. කොහෙද අපි-"

මිසිස් ඕ'ලෙරි ගොරවන්න ගත්තා. අපේ හිස්වලට ඉහළින් හෙවණැල්ලක් මතු වුණා- යම්කිසි අඳුරු, සීතල සහ මරණයේ ගඳ ගහන දෙයක්. වේගයෙන් පහළ බැස්ස එය පොප්ලර් ගහක් මුදුනට ගොඩ බෑවා.

අවාසනාවට වගේ, මම එයාව හඳුනා ගත්තා. වෙළී ඇකිළුණු මුහුණක් තිබුණු එයා, හරි ම දරුණු පෙනුමක් ඇති නිල් පාට ගොතපු තොප්පියකින් සහ රැළි ගැසුණු වෙල්වට් ගවුමකින් සැරසී සිටියා. ලෙදර් වගේ වවුල් පියාපත් දෙකක් එයාගේ පිටුපසින් දෙපසට විහිදී තිබුණා. එයාගේ දෙපාවල තියුණු නිය පහුරු ගොඩකුත්, පිත්තල නිය ඇති දෑතේ ගිනි දලු නටන කසයක් සහ අත් බෑගයකුත් තිබුණා.

"මිසිස් ඩොඩ්ස්," මම කිවුවා.

එයා උල් දත් විලිස්සුවා. "සාදරෙන් පිළිගන්නවා, වස්තුවේ."

එයාගේ සහෝදරියෝ දෙන්නා- අනෙක් ෆියුරිලා- පොප්ලර් ගසේ එයා අසල ම අතු මතට ගොඩ බැස්සා.

"ඔයා ඇලෙක්ටෝව දන්නව ද?" නිකෝ මගෙන් ඇහුවා.

"ඔයා අහන්නේ මැද ඉන්න නාකිච්චි ගැන නම්, ඔව්," මම කිවුවා. "එයා තමයි ඉස්සර මගේ ගණිත් ටීචර්."

නිකෝ ඔළුව වැනුවේ ඒකේ කිසිම පුදුමයක් නැහැ වගෙයි. ඉහළ සිටි ෆියුරිලා දිහා බැලූ එයා ගැඹුරු හුස්මක් ගත්තා. "මගේ තාත්තා ඉල්ලපු දේ මම කරා. අපිව මාලිගාවට අරන් යන්න."

මම ගැස්සුණා. "තප්පරයක් ඉන්න, නිකෝ. ඔයා මොනවද-"

"මට බය, මේක තමයි මගේ අලුත් ම හෝඩුවාව, පර්සි. මගේ පවුල ගැන තොරතුරු කියන්න මගේ තාත්තා මට පොරොන්දු වුණා, ඒත් අපි ගඟේ වැඩේ උත්සාහ කරලා බලන්න කලින් එයාට ඔයාව දකින්න ඕනෑ වුණා. මට සමා වෙන්න."

"ඔයා මාව රැවැට්ටුවා?" මට තරහා වැඩිකමට කිසිවක් හිතාගන්න බැරි වුණා. මම එයාගේ ඇඟට පැන්නත්, ෆියුරිලා ඊට වඩා ඉක්මන් වුණා. එයාලා දෙන්නෙක් වේගයෙන් පහළට ඇවිත් මාව දෑතින් ඩැහැගත්තා. මගේ කඩුව අතින් ගිලිහුණා. මුකුත් හිතාගන්න

ඉඩක් ලැබෙන්න කලින්, මම අඩි හැටක් ඉහළ අහසේ එල්ලෙමින් සිටියා.

"ඔහ්, දඟලන්න එපා, වස්තුවේ," මගේ පරණ ගණිත ගුරුවරිය මගේ කනට කෙඳිරුවා. "ඔයාව බිම දාන්න මම කැමති නැහැ."

මිසිස් ඕ'ලෙරී කේන්තියෙන් බුරා හැලෙමින්, උඩ පනිමින් මට ළං වෙන්න හැදුවත්, අපි හිටියේ සෑහෙන උසකිනුයි.

"මිසිස් ඕ'ලෙරීට දඟලන්නැතුව ඉන්න කියන්න," නිකෝ අනතුරු ඇඟෙව්වා. තුන්වෙනි ෆියුරිගේ ග්‍රහණය මැද එයා මගේ ළඟින් ම පාවෙමින් සිටියා. "එයාට තුවාලයක් වෙනවට මම කැමති නැහැ, පර්සි. මගේ තාත්තා බලාගෙන ඉන්නවා. එයාට ඕනෑ කතා කරන්න විතරයි."

මට ඕනෑ වුණේ නිකෝට පහර දෙන්න මිසිස් ඕ'ලෙරීව උසි ගන්වන්නයි, ඒත් ඒකෙන් වෙන හොඳක් නැහැ. ඒ වගේම නිකෝ කියපු එක දෙයක් හරිඃ ෆියුරිලා සමඟ සටනකට පැටලුනොත් මගේ බැල්ලට තුවාල වෙන්න පුළුවන්.

මම දත්මිටි කෑවා. "මිසිස් ඕ'ලෙරී, ඉඳගන්න! ඔක්කොම හරි, කෙල්ලේ."

කෙඳිරියක් පිට කළ එයා හිස ඔසවා මගේ දිහා බලමින් එක තැන රවුමට කැරකුණා.

"හරි එහෙනම්, ද්‍රෝහියා," මම නිකෝට තරහෙන් ගෙරෙව්වා." ඔයාට ඔයාගේ ගාස්තුව ලැබුණා නේ. දැන් මාව අර තකතීරු මාලිගාවට අරන් යනවා."

★★★

ඇලෙක්ටෝ මාව අල ගෝනියක් වගේ මාලිගාවේ උයන මැදට අත ඇරියා.

එතැන තිබුණේ අමුතු ම ආකාරයේ බිහිසුණු සුන්දරත්වයක්. එහි තැන තැන තැබූ කිරි ගරුඬ බේසම් තුළ සුදු පාට ඇටසැකිලි වගේ ගස් වැවී තිබුණා. රන්වන් පැළ සහ මැණික් ගල්වලින් මල් පාත්ති පිරිලා. ඇස්ෆොඩෙල් යාය හොඳින් දර්ශනය වෙන සඳලු තලයක් මත සිංහාසන දෙකක් තිබුණා- ඇටකටුවලින් සෑදූ එකක් සහ රිදියෙන් සෑදූ එකක්. වාතයේ ඇති ගෙත්තදගම් ගඳ සහ ඇතින් ඇසෙන වධයට ලක්



වූ ආත්මවල විලාප හඬ නොතිබුණා නම් එතැන සෙනසුරාදා උදේ වරුව නිවාඩු පාඩුවේ ගත කරන්න කියාපු තැනක් වෙන්න තිබුණා.

එහි තිබූ එක ම පිටවීමේ දොරටුව ඇටසැකිලි මුරකරුවෝ විසින් මුර කළා. එක්සත් ජනපද හමුදාවේ කාන්තාර ප්‍රහාරක බල ඇණියේ කඩමාලු වූ නිල ඇඳුම්වලින් සැරසී සිටි එයාලා එම්16 අවි අත දරාගෙන සිටියා.

තුන්වෙනි ෆියුරි නිකෝව මගේ ළඟින් බැස්සුවා. ඊට පස්සේ එයාලා තුන් දෙනා ම ඇටසැකිලි සිංහාසනය මුදුනේ ලැගුම් ගත්තා. නිකෝගේ බෙල්ල මිරිකන්න හිතට නැගුණු පෙලඹවීම මම මැඩගත්තේ අමාරුවෙන්. මෙතැන දී ඒක කරන්න ගියොත් එයාලා නිකං ම මාව නවත්තයි. මේකට වාඩුව ගන්න මට ඉවසාගෙන ඉන්න වුණා.

මොනවා හෝ දෙයක් සිදුවෙන තුරු මම හිස් සිංහාසන දෙක දිහා බලා සිටියා. ඒ වෙලාවේ දිලිසෙමින් සැලෙන්න ගත් වාතය තුළින් රූපාකායන් තුනක් පාදූර්භූත වුණා- හේඩීස් සහ පර්සෙෆෝන් එයාලගේ සිංහාසන මත සහ ඒ දෙන්නා මැද සිටගෙන සිටි වඩාත් වැඩිමහලු ගැහැනු කෙනෙක්. එයාලා වාදයකට මැදිවෙලා ඉන්නවා වගෙයි පෙනුණේ.

"-එයා කිසි වැඩකට නැති මිනිහෙක් කියලා මම ඔයාට කිවුවා නේද!" වැඩිමහල් ගැහැනු කෙනා කිවුවා.

"අම්මේ!" පර්සෙෆෝන් පිළිතුරු දුන්නා.

"අපිට අමුත්තෝ වගයක් ඉන්නවා!" හේඩීස් කෑගැසුවා. ''කරුණාකරලා!"

මම අකමැති ම දෙවිවරුන්ගෙන් කෙනෙක් වුණ හේඩීස්, නිරයට වැටුණ ආත්මවල භීතියට පත් මුහුණුවලින් වැසුණු එයාගේ කළු ලෝගුවේ රැළි අතින් සුමට කළා. එයාට සුදුමැලි පාට හමක් සහ පිස්සෙකුගේ වගේ තීව්‍ර ඇස් දෙකක් තිබුණා.

"පර්සි ජැක්සන්," එයා කිවුවේ තෘප්තිමත් හඬින්. "අන්තිමේට."

පර්සෙෆෝන් රැජින කුතුහලයෙන් මාව අධ්‍යයනය කළා. පහුගිය ශීත ඍතුවේ දී එක වරක් මට එයාව දකින්න ලැබී තිබුණා, ඒත් දැන් මේ ගිම්හානයේ දී එයාව පෙනුණේ ඊට හාත්පසින් ම වෙනස් දෙවඟනක් වගෙයි. එයාට කාන්තිමත් කළු කෙස් කළඹක් සහ දුඹුරු පාට උණුසුම් දෑසක් තිබුණා. එයාගේ ඇඳුම විවිධ පැහැයන්ගෙන්

බැබළුණා. එය මසා තිබූ රෙද්දේ වූ මල් මෝස්තරය විටින් විට වෙනස් වෙමින් මල් පිබිදුණා- රෝස, ටියුලිප්, හනිසක්ල්.

එයාලා දෙන්නා මැදින් හිටගෙන සිටි ගැහැනු කෙනා පර්සෙෆෝන්ගේ අම්මා බවට සැකයක් නැහැ. එයාටත් පර්සෙෆෝන්ගේ වගේම කොණ්ඩයක් සහ දෑසක් තිබුණා වුණත් එයා වඩාත් වියපත් සහ දරදඬු පෙනුමක් ඉසිලුවා. එයා හැඳ සිටියේ පැසුණු තිරිඟු යායක පාට ගත් රන්වන් ඇඳුමක්. වියළි තණපත් එකට තබා ගොතා තිබුණු එයාගේ කොණ්ඩය දකිද්දී මට මතක් වුණේ වේවැල් කූඩයක්. කවුරු හරි එයා ළඟ ඉඳලා ගිනි කූරක් දල්වුවොත්, එයාව සැහෙන ලොකු කරදරේක වැටෙයි කියලා මට හිතුණා.

"හ්ම්ම්ප්ෆ්," වැඩිමහල් ගැහැනු කෙනා කිවුවා. "උප දෙවිවරු. අපිට අඩු වෙලා තිබුණේ එච්චරයි."

මගේ ළඟ සිටි නිකෝ බිම දණ ගැසුවා. එයාගේ ඔලමොට්ටල ඔළු ගෙඩිය කපලා දාන්න මගේ කඩුව තිබුණා නම් කියලා ඒ වෙලාවේ මට හිතුණා. ඒත් අවාසනාවට වගේ, රිප්ටයිඩ් තවමත් තිබුණේ වැටුණු තැනමයි.

"තාත්තේ," නිකෝ කිවුවා. "ඔයා ඉල්លුව දේ මම කළා."

"සෑහෙන කල් ගත්තා නේ," හේඩීස් අවලාද නැඟුවා. "ඔයාගේ අක්කා හිටියා නම් මීට වඩා හොඳට වැඩේ කරනවා."

නිකෝ ඔළුව පහත් කරගත්තා. ඒ වෙලාවේ මේ පුංචි කපටියා ගැන මම ඒ තරම් කේන්තියෙන් නොහිටියා නම්, මට එයා ගැන කණගාටු හිතෙන්න තිබුණා.

මම මරණයට අධිපති දෙවියා දිහා තරහෙන් රවා බැලුවා. ''ඔයාට මොනවද උවමනා, හේඩීස්?"

"කතා කරන්න, ඇත්ත වශයෙන් ම." දෙවියන්ගේ තොල් දෙක කෲර හිනාවකින් ඇඹරුණා. "ඇයි නිකෝ නුඹට කිවුවෙ නැද්ද?"

"ඒ කියන්නේ මේ මුළු ගවේෂණය ම බොරුවක්. නිකෝ මාව පහළට අරන් ආවේ මරන්න."

"ආපෝ, නෑ," හේඩීස් කිවුවා. "මට බය, නිකෝ නුඹට උදවු කරන්න හැදුවේ අවංකවමයි. මේ කොල්ලා මෝඩයෙක් වුණාට හරිම අවංකයි. මුලින් ම නුඹව මෙහෙට අරන් එන්න කියලා මම එයාට නිකං ම ඒත්තු ගැන්නුව එක විතරයි කළේ."



"තාත්තේ," නිකෝ කතා කළා, "පර්සිට කරදරයක් කරන්නෙ නැහැ කියලා ඔයා පොරොන්දු වුණා. මම එයාව අරගෙන ආවොත් ඔයා මට මගේ අතීතේ ගැන- මගේ අම්මා ගැන කියනවා කිවුවා."

පර්සෙෆෝන් රැජින සෝබනේට වගේ සුසුමක් හෙළුවා. ''කරුණාකරලා, ඒ ගෑනු කෙනා ගැන මම ඉන්න තැන කතා නොකර ඉමු ද?"

"මට සමා වෙන්න, මගේ පරෙවි කිරිල්ලියේ," හේඩීස් කිවුවා. "මේ කොල්ලට මොනවා හරි දෙයක් පොරොන්දු වෙන්න මට සිද්ධ වුණා."

වැඩිමල් ගැහැනු කෙනා ආයෙමත් නෝක්කාඩු කියන්න ගත්තා. "මං ඔයාට කිවුවෙ නැද්ද, දුව. මේ කපටි හේඩීස්ගේ කිසිම හොඳක් නැහැ. අපරාදේ ඔයාට දොස්තරලට අධිපති දෙවියන්ව හරි, නීතිඥයන්ට අධිපති දෙවියන්ව හරි බැඳගෙන යසට ඉන්න තිබුණා. කොහෙද ඉතින්, ඔයාට අර දෙළුම් ඇට ටික කන්න ම ඕනෑ වුණා නේ."

"අම්මේ-"

"ඊට පස්සේ මේ පාතාලේ හිර වුණා!"

"අම්මේ, කරුණාකරලා-"

"දැන් මේ අගෝස්තු මාසෙත් ඇවිල්ලා, ඒත් ඔයා කලින් කියපු විදිහට ගෙදර ආව ද? ඔයා කවදාවත් ඔයාගේ මේ දුප්පත් තනිකඩ අම්මා ගැන හිතනව ද?"

"ඩිමීටර්!" හේඩීස් කෑගැසුවා. "ඔය හොඳටම ඇති. ඔයා මගේ ගෙදර අමුත්තෙක් විදිහටයි ඉන්නේ."

"ඔහ්, මේකත් ගෙදරක් ද?" එයා කිවුවා. "මේ වගේ කුණු ගොඩකට ගෙදරක් කියන්නෙ කවුද? මගේ දුවට මේ වගේ කළුවර, සීතල තැනක ජීවත් වෙන්න-"

"මම ඔයාට කිවුවා නේද," හේඩීස් කිවුවෙ දත්මිටි කමින්, "උඩ ලෝකේ යුද්ධයක් වෙනවා. ඔයයි පර්සෙෆෝනුයි මාත් එක්ක මෙහෙට වෙලා ඉන්න එක පරිස්සමට හොඳයි."

"සමා වෙන්න," මම මැද්දට පැන්නා. "ඒත් ඔයාලා මාව මරන්න යනවා නම්, ඒක ඉවරයක් කරලා ඉන්න බැරි ද?"

Scanned with CamScanner

දෙවිවරු තුන්දෙනා ම මගේ දිහා බැලුවා.

"හොඳයි, මෙයා නම් දඩබ්බරයෙක් වගේ," ඩිමීටර් කිවුවා.

"ඇත්තට ම," හේඩීස් එකඟ වුණා. "එයාව මරලා දාන්න මම හරි ම කැමතියි."

"තාත්තේ!" නිකෝ කිවුවා. "ඔයා පොරොන්දු වුණා!"

"මහත්තයා, අපි මේ ගැන කතා කළා නේද?" පර්සෙෆෝන් චෝදනා කිවුවා. "ඔයාට වටේ ඉන්න හැම වීරයෙක්ව ම අළු කරලා දාන්න බැහැ. ඇරත්, එයා නිර්භීතයි. මං ඒකට කැමතියි."

හේඩීස් ඇස් කැරකුවා. "ඔයා අර ඕර්ෆියස් හාදයාටත් කැමති වුණා නේ. ඊට පස්සේ මොකද වුණේ කියලා දැක්කා නේ. මට මෙයාව මරලා දාන්න ඉඩ දෙන්න. චුට්ටක්වත්."

"තාත්තේ, ඔයා පොරොන්දු වුණා!" නිකෝ කිවුවා. "ඔයා කිවුවේ ඔයාට එයත් එක්ක කතා කරන්න විතරයි උවමනා කියලා. ඔයා කිවුවා මම එයාව අරන් ආවොත්, ඔයා විස්තර කියනවා කියලා."

ලෝගුවේ රැළි සුමට කරමින් හේඩීස් රවා බැලුවා. "කිවුවත් වගේම මම එහෙම කරන්නම්. ඔයාගේ අම්මා- මම මොනවද ඔයාට කියන්නේ? එයා අපූරු කාන්තාවක්." එයා අපහසුවෙන් පර්සෙෆෝන් වෙතට බැල්මක් හෙළුවා. "සමා වෙන්න, මගේ වස්තුවේ. මං අදහස් කළේ මනුෂ්‍ය කාන්තාවක් විදිහට, ඇත්තෙන්ම. එයාගේ නම මරියා ඩි ආන්ජෙලෝ. එයා වැනීසියේ කෙනෙක්, ඒත් එයාගේ තාත්තා වොෂින්ග්ටන් ඩී.සී.වල තානාපති කෙනෙක්. එහෙදි තමයි මට එයාව මුණ ගැහුණේ. ඔයයි ඔයාගේ අක්කයි පුංචි කාලේ, හේඩීස්ගේ දරුවෝ වෙලා ඉපදෙන්න නරක කාලයක් වුණා. දෙවෙනි ලෝක යුද්දෙ පැසවන්න ගත්තේ ඒ කාලේ. පරදින පැත්ත මෙහෙයවමින් හිටියේ මගේ, අහ්, අනිත් ළමයි දෙතුන්දෙනෙක්. ඔය දෙන්නව කරදරවලින් ඈත් කරලා තියන එක වඩාත් හොඳයි කියලා මම හිතුවා."

"ඔයා අපිව ලෝටස් කැසිනෝව අස්සේ හැංගුවේ ඒ නිසා ද?"

හේඩීස් උරහිස් ඇකිළුවා. "ඔයාලා වයසට යන එක නැවතුණා. කාලය ගත වෙන බව ඔයාලට තේරුනේ නැහැ. ඔයාලව එළියට ගන්න හරි වෙලාව එනකල් මම බලාගෙන හිටියා."

"ඒ වුණත් අපේ අම්මට මොකද වුණේ? මට එයා ගැන කිසිම මතකයක් නැත්තේ ඇයි?"



"ඒක වැදගත් නැහැ," හේඩීස් සැර වුණා.

"මොකක්? ඇත්තටම ඒක වැදගත්. ඒ වගේම ඔයාට තව ළමයි හිටියා නේ- ඉතින් ඇයි අපි දෙන්නව විතරක් ඈත් කරලා තිබ්බේ? එතකොට අපිව එළියට ගත්ත නීතිඥයා කවුද?"

හේඩීස් දත්මිටි කෑවා. "ඔයා කතාව අඩු කරලා මං කියන දේ අහන්න පුරුදු වුණොත් හොඳයි, කොල්ලෝ. නීතිඥයා ගැන කියනවා නම්..."

හේඩීස් අසුරක් ගැසුවා. ඒත් එක්ක ම එයාගේ සිංහාසනය මුදුනේ සිටි ෆියුරි ඇලෙක්ටෝගේ පෙනුම වෙනස් වෙමින්, ඉරි මෝස්තරයක් වැටුණු ඇඳුම් කට්ටලයකින් සැරසී, බ්‍රීෆ්කේසයක් අතින් ගත් මැදි වියේ පිරිමියෙකුට හැරුණා. හේඩීස්ගේ උරහිස ළඟ ඈත තියාගෙන සිටි එයාව පෙනුණේ හරි ම අසාමාන්‍ය ලෙසයි.

"ඔහේ!" නිකෝ කිවුවා.

ෆියුරි කෙකර ගෑවා. "මම නීතිඥයෝ විදිහටයි ගුරුවරියෝ විදිහටයි හොඳට වැඩ කරනවා!"

නිකෝ වෙවුලන්න ගත්තා. "ඒත් ඔහේ අපිව කැසිනෝවෙන් නිදහස් කරගත්තෙ ඇයි?"

"ඇයි කියලා ඔයා දන්නවා," හේඩීස් කිවුවා. "මේ පොසෙයිඩන්ගේ බූරු පුතාට මහා අනාවැකියේ කියවෙන ළමයා වෙන්න දෙන්න බැහැ."

ළඟ ම තිබුණු ගසකින් රතු කැටයක් කඩා ගත් මම එයින් හේඩීස්ට දමා ගැසුවා. ඒක කිසිම හානියක් නොකර එයාගේ ලෝගුව තුළට කිඳා බැස්සා. "හරි නම් ඔයා ඔලිම්පස්වලට උදවු කරන්නයි ඕනෑ!" මම කිවුවා. "අනිත් දෙවිගොල්ලෝ හැමෝම ටයිෆූන් එක්ක සටන් කරනවා, ඒත් ඔයා නිකං ම මෙතැන ඉඳගෙන-"

"බලන් ඉන්නවා," හේඩීස් මගේ වැකිය සම්පූර්ණ කළා. "ඔව්, ඒක ඇත්ත. ඔලිම්පස් අන්තිමේට මට උදවු කළේ කවද ද කියනවා, අර්ධ-ලෝහිතයෝ? මගේ දරුවෙක්ව වීරයෙක් විදිහට පිළිගත්තේ කවද ද කියනවා? බාහ්! ඉතින් මං මොකටද එයාලගේ උදවුවට දුවන්නේ? මම මගේ හමුදාවල් තියාගෙන මෙහෙට වෙලා ඉන්නවා."

"ඊට පස්සේ ක්‍රෝනොස් ඔයාගේ පස්සෙන් එනකොට?"

Scanned with CamScanner

"එයාට උත්සාහ කරලා බලන්න පුළුවන්. එයා දුර්වල වෙලා ඉදියි. ඒ වගේම මගේ පුතා, නිකෝ-" හේඩීස් එයා දිහා බැලුවේ ප්‍රිය උපදවන බැල්මකින් නෙවෙයි. "මෙහෙමයි, දූනට නම් එයාගෙන් ඒ හැටි වැඩක් නැහැ, මං ඔහේට ඒක කියන්නම්. බියන්කා පණ පිටින් හිටියා නම් මීට වඩා හොඳයි. ඒත් මේ කොල්ලට තව අවුරුදු හතරක පුහුණුවීම් දුන්නා ම. අනිවාර්යයෙන්ම, අපිට ඒ තරම් කාලයක් අල්ලගෙන ඉන්න පුළුවන්. නිකෝට අවුරුදු දහසය ලැබුවා ම, අනාවැකියේ කියවෙන විදිහට, ලෝකය බේරා ගැනීමේ තීරණය ගන්න කෙනා එයා වෙනවා. ඊට පස්සේ මම දෙවිවරුන්ගේ රජා වෙනවා."

"ඔයාට නම් පිස්සු," මම කිවුවා. "ඔලිම්පස් කුඩු කරලා දැම්මට පස්සේ ක්‍රෝනොස් ඔහේවත් චප්ප කරලා දායි."

හේඩීස් දෑත් දෙපසට විහිදුවා. "හොඳයි, ඒක නුඹට ම හොයාගන්න ලැබෙයි, අර්ධ-ලෝහිතයෝ. මොකද මේ යුද්දෙ ඉවර වෙනකල් නුඹට මගේ හිර ගෙදරට වෙලා ඉන්න වෙනවා."

"නෑ!" නිකෝ කිවුවා. "තාත්තේ, අපි එකඟ වුණේ එහෙම කරන්න නෙවෙයි. ඒ වගේම ඔයා මට හැමදේම කිවුවෙත් නැහැ!"

"ඔයා දැනගන්න ඕනෑ දේවල් ඔක්කොම මම කියලයි තියෙන්නේ," හේඩීස් කිවුවා. "අපේ එකඟතාවය ගැන කියනවා නම්, මම ජැක්සන් එක්ක කතා කළා. මම එයාට හිරිහැරයක් කළේ නැහැ. ඔයාට ඔයාගේ තොරතුරු ලැබුණා. මීට වඩා හොඳ ගනුදෙනුවක් ඕනෑ වුණා නම්, ඔයාට තිබුණේ මාව ස්ටයික්ස් ගඟ මත දිවුරවා ගන්න. දැන්, ඔයාගේ කාමරේට යනවා!" එයා අතක් වැනුවා ම නිකෝ අතුරුදහන් වුණා.

"ඒ කොල්ලා කනවා මදි," ඩිමීටර් අවලාද කිවුවා. "එයා ඉරට්ටක් වගේ කෙට්ටුයි. එයා තව සීරියල් (ධාන්‍යවලින් සාදන කෑමක්) කන්න ඕනෑ."

පර්සෙෆෝන් ඇස් කැරකුවා. "අම්මේ, සීරියල් ගැන කතාව ඇති. මගේ හේඩීස් උතුමාණෙනි, අපිට මේ පුංචි වීරයාට යන්න ඉඩ දෙන්න බැහැ කියලා ඔයාට විශ්වාස ද? එයා හරිම නිර්භීතයි නේ."

"නෑ, මගේ වස්තුවේ. මම එයාගේ ජීවිතේට කරදරයක් නොකර අත ඇරලයි තියෙන්නේ. ඒ හොඳටම ඇති."



පර්සෙෆෝන් මං වෙනුවෙන් නැගී සිටීවි කියලා මට හොඳටෝම විශ්වාස වුණා. නිර්භීත, සුන්දර පර්සෙෆෝන් මාව මේකෙන් ගලවා ගනීවි.

ඒත් එයා කළේ උදාසීන ලෙස උරහිස් ඇකිළීම විතරයි. "හරි එහෙනම්. උදේ කෑමට මොනවද? මට හොඳටම බඩගිනියි."

"සිරියල්," ඩිමීටර් කිවුවා.

"අම්මේ!" ගැහැනු දෙදෙනා මල් සහ ධාන්‍ය සුළියක් මැද අතුරුදහන් වුණා.

"වැඩිය හිත නරක් කරගන්න ඕනෑ නෑ, පර්සි ජැක්සන්," හේඩීස් කිවුවා. "ක්‍රෝනොස්ගේ සැලසුම් ගැන මගේ අවතාර මාව හොඳින් දැනුවත් කරනවා. හරි වෙලාවට එයාව නතර කරන්න නුඹට කොහෙත්ම ඉඩක් නැති බව මට සහතික වෙන්න පුළුවන්. අද රෑ වෙද්දී, නුඹගෙ වටිනා කියන ඔලිම්පස් බේරගන්න පරක්කු වැඩියි. ඒ වෙද්දී උගුල ගැස්සිලා ඉවරයි."

"මොන උගුල ද?" මම ප්‍රශ්න කළා. "ඔයා ඒ ගැන දන්නවා නම්, මොනවා හරි කරන්න! අඩු තරමේ මට අනිත් දෙවිවරුන්ට කියන්නවත් ඉඩ දෙන්න!"

හේඩීස් හිනා වුණා. "නුඹගෙ ධීර ගුණය තියෙනවා. මට ඒකට ලකුණු දෙන්න පුළුවන්. මගේ ඇඳිරි හිර ගේ ඇතුළේ සන්තෝසෙන් ඉන්නවා. අපි නුඹ ගැන බලන්න තව- ඔහ්, අවුරුදු පනහකින්, හැටකින් විතර එන්නම්."

Scanned with CamScanner

# 08

# මගේ නරක ම නාගැනිල්ල

මගේ කඩුව සාක්කුව තුළින් නැවත මතු වුණා.

ඔව්, නියම වෙලාවට ම වගේ. දන් මට හිතේ හැටියට මගේ වටේ තියන බිත්තිවලට කොටන්න පුළුවන්. මගේ හිර කුටියට යකඩ පොලු, ජනේල තියා දොරක්වත් තිබුණේ නැහැ. ඇටසැකිලි මුරකාරයෝ කෙලින් ම මාව බිත්තියක් තුළින් ඇතුළට තල්ලු කරා. ඊට පස්සේ මට පිටුපසින් ඒක ආයෙමත් ඝන වුණා. මේ කාමරේ වායුරෝධක එකක් ද, මට විශ්වාසයක් තිබුණේ නැහැ. මට හිතෙන්නේ එහෙම වෙන්නැති. හේඩීස්ගේ හිර කුටි හදලා තියෙන්නේ මැරුණ අයටයි, ඉතින් එයාලා හුස්ම ගන්න එකක්යෑ. ඉතින් අවුරුදු පනහක්-හැටක් කෙසේ වෙතත්, තව විනාඩි පනහකින්-හැටකින් මම මැරිලා ඉඳියි. ඒ අතර වාරයේ, හේඩීස් කිවුවේ බොරුවක් නෙවෙයි නම්, අද දවස අවසාන වෙනකොට නිව්යෝර්ක්වල මොකක් හරි ලොකු උගුලක් ගැස්සෙන්නයි යන්නේ. ඒත් ඒ වෙනුවෙන් මට කරන්න කිසිම දෙයක් නැති වුණා.

හිතට දැනුණු මහා කාලකණ්ණි හැඟීම සමඟ මම සීතල ගල් පොළොව මත ඉඳගත්තා.

මම අඩ නින්දට වැටුණු හැටි මතකයක් නම් නැහැ. ඒත් ඉතින්, ඒ වෙලාව මනුෂ්‍ය වෙලාවෙන් උදේ හතට විතර ඇති. ඒ වගේම මම හිටියේ මහන්සියෙන් හෙම්බත් වෙලයි.



ශාන්ත තෝමස්වල වෙරළක් අද්දර තිබුණු රේචල්ගේ ගෙදර පියස්ස මත මම ඉන්නවා හීනෙන් දැක්කා. බටහිර ඉන්දිය කොදෙව්වලට ඉහළින් ඉර පායා එමින් තිබුණා. වනයෙන් ගැවසිගත් දූපත් දූසිම් ගාණක් මුහුදේ තැන තැන විසිරී තිබුණා. මුහුදු දිය කඳ දෙබෑ කරගෙන සුදු පාට රුවල් බෝට්ටු ඇදී ගියා. සුළඟේ මුසු වී ආ කරදිය සුවඳ දැනෙද්දී, මට ආයේ කවදාවත් මුහුද දකින්න ඉඩක් ලැබෙයි ද හිතලා මම පුදුම වුණා.

රේචල්ගේ දෙමව්පියෝ මේසයකට වාඩි වී සිටින අතරේ, පෞද්ගලික කෝකියෙක් එයාලට ඔම්ලට් පිළියෙළ කරමින් සිටියා. ඩෙයාර් මහත්තයා සුදු පාට ලිනන් ඇඳුම් කට්ටලයකින් සැරසී සිටියා. එයා වෝල් ස්ට්‍රීට් ජර්නලය කියවමිනුයි සිටියේ. එයා ඉදිරියේ වාඩි වී සිටි ගැහැනු කෙනා ඩෙයාර් මහත්මිය වෙන්න ඇති. ඒ වුණත් මට එයාගෙන් දැකගන්න හැකි වුණේ තද රෝස පාට නැවරු අතේ නිය සහ විනෝද චාරිකා ගැන සඳහන් සඟරාවක පිට කවරය විතරයි. නිවාඩුවක් ගත කරන්න ඇවිත් ඉන්න අතරේ එයා තවත් නිවාඩු ගත කරන තැන් ගැන කියවන්නේ මොකටද, මට හිතාගන්න බැරි වුණා.

පියස්ස ළඟ සිටගෙන සිටි රේචල් සුසුමක් හෙළුවා. එයා බර්මියුඩා කොට කලිසමක් සහ වැන් ගොග් ටී-ෂර්ට් එකකින් සැරසී සිටියා. (ඔව්, ඇත්තට ම රේචල් මට චිත්‍ර කලාව උගන්වන්න උත්සාහ කරමිනුයි හිටියේ, ඒත් වැඩිය පුදුම වෙන්න එපා. මට ඒ හාදයාගේ නම මතක තිබුණේ එයා තමන්ගේ ම කන කපාගත්ත නිසා විතරයි.)

එයා කල්පනා කරමින් ඉන්නේ මං ගැන ද කියලත්, එයාලා සමඟ මම නිවාඩුව ගත කරන්න නොයෑම කොයි තරම් නරක ද කියලත් මම පුදුම වුණා. මම නම් කල්පනා කරමින් සිටියේ ඒ ගැනයි කියලා මම දැන සිටියා.

ඒ වෙලාවේ දර්ශනය වෙනස් වුණා. මම ශාන්ත ලුයිස්වල ආරුක්කුවක් යට සිටගෙන සිටියා. මම මීට කලිනුත් එහෙට ගිහින් තිබුණා. හරියට ම කියනවා නම්, මීට කලින් වතාවේ මට එතැන දී මාරක පිම්මක් පනින්න සිද්ධ වුණා.

නගරයට ඉහළින් අකුණු කුණාටුවක් කැකෑරෙමින් තිබුණා-ඒක අහසේ තැනින් තැන අකුණු පුපුරන, තනි කළු පාට බිත්තියක් වගෙයි පෙනුණේ. කඩ වීදි කීපයකට එපිටින්, රැස් වී තිබුණු හදිසි ආපදා රථ පොකුරක විදුලි එළි දැල්වෙමින් තිබුණා. සුන්බුන් ගොඩක්

මතින් දූවිලි කඳක් ඉහළ නැගුණා. ඒ කඩා වැටුණු උස් ගොඩනැගිල්ලක් බව මට ටිකකින් තේරුම් ගියා.

ඒ අසල වාර්තාකාරිණියක් එයාගේ මයික්‍රොෆෝනයට මොර දෙමින් සිටියා: "මෙය අසාර්ථක ගොඩනැගිලි සැලසුමක් නිසා සිදු වූ අනතුරක් බව නිලධාරීන් ප්‍රකාශ කරනවා, ඩෑන්, එසේ වූවත් මෙයට කුණාටු තත්ත්වයේ සම්බන්ධයක් ඇති බව කිසිවෙක් දන්නා බවක් පෙනෙන්නට නැහැ."

එයාගේ කොණ්ඩය අවුස්සා දමමින් සුළඟ ඇදී ගියා. එහි උෂ්ණත්වය සීඝ්‍රයෙන් පහත බසිමින් තිබුණා. මම එතැන සිටගෙන සිටි කෙටි වෙලාවට එය අංශක දහයකින් විතර පහත බැස්සා.

"වාසනාවට, මේ ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සඳහා අත් හැර දමා තිබූවක්," එයා කිවුවා. "කෙසේ වුවත් පොලීසිය විසින් අවට පිහිටා ඇති සියලු ම ගොඩනැගිලි හිස් කිරීමට පියවර ගෙන ඇත්තේ මෙම කඩා වැටීමෙන් තවත්-"

අහස පුරා පැතිරී ගිය මහා ගෙරවුම් හඬකින් නිවේදිකාවගේ කතාව ඇන හිටියා. අන්ධකාරය මැද පුපුරා ගිය අකුණු සැරයකින් මුළු නගරය ම දෙදුරුම් කෑවා. වාතය උණුසුම් වෙද්දී මගේ ඇගේ සෑම රෝම කූපයක් ම කෙලින් වුණා. ඒ තරම් බලගතු පහරක් එල්ල කිරීමට හැකියාව ඇත්තේ එක ම එක දේකට විතරක් බව මම දැන සිටියා: සියුස්ගේ ප්‍රධාන අකුණ. ඒ පහරට ඉලක්ක වූ දෙය වාෂ්ප වී යා යුතු වුණත්, කළු වලාව ආපස්සට විසි වුණා විතරයි. වලාකුළු අතරින් දුමින් සෑදුණු අතක් එළියට ආවා. එය තවත් කුලුනක් පොඩි කර දමද්දී, පුංචි ළමයින්ගේ සෙල්ලම් ගෙයක් වගේ මුළු ගොඩනැගිල්ල ම කඩා වැටුණා.

වාර්තාකාරිණිය බෙරිහන් දුන්නා. මිනිස්සු වීදි පුරා දුවන්න ගත්තා. හදිසි ආපදා එළි දැල්වුණා. අහස හරහා රිදී එළියක් ඇදී යනවා මට දකින්න ලැබුණා- පිනි මුවන් විසින් ඇදගෙන යන කරත්තයක්. හැබැයි එය පදවමින් හිටියේ නත්තල් සීයා නම් නෙවෙයි. කුණාටුව මැදින් කරත්තය පදවාගෙන යමින්, අන්ධකාරය තුළට සඳ එළි ධාරාවන් විදිමින් ගියේ ආර්ටෙමිස්. රන්වන් පාටින් දිලෙන වල්ගා තරුවක් එයාගේ මඟ හරහා ඇදී ගියා. සමහරවිට ඒ එයාගේ සහෝදරයා ඇපලෝ වෙන්න ඇති.



මට එක දෙයක් නම් පැහැදිලි වුණා: මේ වෙද්දී ටයිෆූන් මිසිසිපි ගඟ දක්වා ම ඇවිල්ලා. මඟ දිගට ඇති සියල්ල වනසා දමමින් එයා එක්සත් ජනපදය හරහා දුරෙන් බාගයක් ම ඇවිල්ලා, ඒත් දෙවිවරුන්ට කරන්න හැකි වී තිබුණේ යාන්තමින් එයාගේ වේගය අඩු කිරීම විතරයි.

කළු පාට කන්දක් මට ඉහළින් පහත් වුණා. ක්‍රීඩාගංනයක් විතර ලොකු කකුලක් මාව චප්ප කරන්න යද්දී ම කවුදෝ රහසින් කතා කළා, "පර්සි!"

මම දෑස් පියාගෙන ම පහර දෙන්න පැන්නා. මුළුමනින් ම ඇහැරෙන්නත් කලින් ම මම නිකෝගේ බෙල්ලට කඩුව තබා, එයාව හිර කුටියේ පොළොවට තෙරපාගෙන සිටියා.

"ගලව...ගන්න...ආවේ," එයා හුස්ම හිරවුණු හඬින් කිවුවා.

හිතේ නැඟුණු කේන්තිය මාව ඉක්මනින් අවදි කළා. "අනේ, ඇත්තට? ඒත් මං මොකටද ඔයාව විශ්වාස කරන්නේ?"

"වෙන... කරන්න...දෙයක්...නෑනේ?" එයා හුස්ම අල්ලමින් කිවුවා.

එයා ඒ වගේ තර්කානුකූල දෙයක් නොකියා හිටියා නම් හොඳයි කියලා මට හිතුණා. මම එයාව අත් හැරියා.

බෝලයක් වගේ බිම වකුටු වුණ නිකෝ එයාගේ උගුර යථා තත්ත්වයට පත් වෙන තුරු ඔක්කාර කරන හඬවල් නැගුවා. අන්තිමේ දී එයා මගේ කඩුව දිහා පරිස්සමෙන් බලමින් දෙපයින් සිටගත්තා. එයාගේ කඩුව තවමත් තිබුණේ කොපුව තුළමයි. එයාට මාව මරන්න ඕනෑ වුණා නම්, මම නිදා ඉන්න අතරේ ම ඒක කරන්න තිබුණු බව මට හිතුණා. ඒ වුණාට තවමත්, මම එයාව විශ්වාස කළේ නැහැ.

"අපි මෙතැනින් එළියට යන්න ඕනෑ," එයා කිවුවා.

"ඇයි ඒ?" මම ඇහුවා. "ඔයාගෙ තාත්තට මාත් එක්ක ආයෙමත් කතා කරන්න ඕනලු ද?"

එයාගේ මුහුණ වේදනාවෙන් ඇකිළුණා. "පර්සි, මම ස්ටයික්ස් ගඟ මත දිවුරනවා, එයා සැලසුම් කරපු දේවල් මම දැනගෙන හිටියෙ නැහැ."

"ඔයාගේ තාත්තා මොන වගේ කෙනෙක් ද කියලා ඔයා දන්නවා නේ!"

Scanned with CamScanner

"එයා මාව රැවැට්ටුවා. එයා පොරොන්දු වුණා-" නිකෝ අත් එසෙව්වා. "බලන්න... මේ වෙලාවේ, අපි මෙතැනින් පැන ගන්න ඕනෑ. මම මුරකාරයින්ව නිදි කළා, ඒත් ඒක වැඩි වෙලාවක් තියෙන එකක් නැහැ."

මට ඕනෑ වුණේ ආයෙමත් එයාගේ බෙල්ල මිරිකන්නයි. අවාසනාවට, එයා කියපු කතාව ඇත්ත. අපිට වාද කර කර ඉන්න වෙලාවක් තිබුණේ නැහැ, ඒ වගේම මට මෙතැනින් තනියම පැනලා යන්න හැකියාවක් තිබුණෙත් නැහැ. එයා බිත්තියට අත දිගු කළා ම ඒ කොටස ම අතුරුදහන් වී, කොරිඩෝවක් නිරාවරණය වුණා.

"ඉක්මනට එන්න." නිකෝ පෙරමුණ ගත්තා.

ඒ වෙලාවේ මගේ ළඟ ඇනබෙත්ගේ අදෘශ්‍යමාන වෙන තොප්පිය තිබුණා නම්, කියලා මට හිතුණා. ඒත් ටිකකින් මට හොයාගන්න ලැබුණු විදිහට, මට එහෙම එකක් ඕනෑ වුණේ නැහැ. අපි ඇටසැකිලි මුර භටයෙක් වෙතට ළඟා වුණු හැම වතාවකදි ම නිකෝ කළේ එයාට අත දිගු කළ එක විතරයි. ඒත් එක්ක ම මුර භටයාගේ දිලිසෙන ඇස් අඳුරු වුණා. අවාසනාවට වගේ, නිකෝට එය කරන්න සිදු වුණ වාර ගණන වැඩි වෙද්දී, එයා වැඩි වැඩියෙන් වෙහෙසට පත් වෙනවා වගෙයි පෙනුණේ. මුර භටයින්ගෙන් පිරුණු කොරිඩෝ ජාලයක් හරහා අපි ගමන් කළා. අපි ඇටසැකිලි කෝකියෝ සහ සේවකයින්ගෙන් පිරුණු මුළුතැන්ගෙයට ළඟා වෙද්දී, මම නිකෝව වාරු කරගෙන වගෙයි ගියේ. මළවුන් සියලු දෙනාව ම නින්දට යවන්න එයාට හැකි වුණත්, එයා හිටියෙත් සිහිසුන් වෙන්න වගෙයි. මම සේවක දොරටුව හරහා එයාව ඇස්ෆොඩෙල් යායට ඇදගෙන ගියා.

මගේ හිතට යාන්තමින් සහනයක් දැනෙද්දි ම වගේ මාලිගාවේ ඉහළින් ලෝකඩ සාන්ධාර නද දෙන හඬ මට ඇසුණා.

"අනතුරු අඟවන සංඥා," නිකෝ නිදිබරව මිමිණුවා.

"අපි දැන් මොකද කරන්නේ?"

ලොකු ඇනුමක් පිට කළ එයා ඊට පස්සේ ඇහි බැම් අකුළා ගත්තේ මතක් කරන්න උත්සාහ කරනවා වගෙයි. "අපි... දුවමු?"

★★★

නිදිමතේ ඉන්න හේඩීස්ගේ ළමයෙක් එක්ක දුවනවා කියන්නේ, ලොකු රෙදි බෝනික්කෙක් එක්ක තුන්-කකුලින් තරගෙකට



දුවනවා වගේ වැඩක්. මම මගේ කඩුව ඉදිරියට දිගු කරගෙන, නිකෝව අමාරුවෙන් ඇදගෙන ඉදිරියට ගියා. දිව්‍යමය ලෝකඩ තලය දකිද්දී මළවුන් දෙපසට වී පාරේ ඉඩ දුන්නේ දැවෙන ගිනි ගොඩකින් ඈත් වෙනවා වගෙයි.

සාන්ධාර හඬ යාය පුරා පැතිරී ගියා. ඈත ඉදිරියෙන් එරබොස්වල තාප්ප නොපැහැදිලිව පෙනුණා, ඒත් අපි කොයි තරම් ඉදිරියට ඇවිදගෙන ගියත්, ඒක තව තවත් ඈතට යනවා වගෙයි පෙනුණේ. මහන්සියෙන් හෙම්බත් වුණු මම ඇදගෙන වැටෙන්න යනකොට ම වගේ මට හුරු පුරුදු "වූෆ්!" හඬක් ඇසුණා.

කොහෙදෝ ඉඳන් දුවගෙන ආව මිසිස් ඕ'ලෙරී අපි වටේ රවුමට දුවන්න ගත්තේ සෙල්ලම් කරන්න සූදානමෙන්.

"හොඳ කෙල්ල." මම කිවුවා. "ඔයාට පුළුවන් ද අපිව ස්ටයික්ස් ගඟ ළඟට අරන් යන්න?"

ස්ටයික්ස් කියන වචනයෙන් එයා උද්දාමයට පත්වුණා. සමහරවිට ඒකෙ තේරුම 'කෝටු' කියලා එයා හිතුව ද දන්නේ නැහැ. තුන් හතර වතාවක් උඩ පැන්න එයා, මෙතැන ලොක්කා කවුද කියලා උගන්වන්න වලිගය පස්සෙන් පැන්නුවාට පස්සේ, මට එයාගේ පිට මතට නිකෝව තල්ලු කරන්න හැකි තරමට සන්සුන් වුණා. මමත් එයාගේ පිට උඩට ගොඩ වුණා ම, එයා ගේට්ටු දිහාවට පිම්මේ දිවුවා. එයා 'පහසු මරණ' පෝළිමට උඩින් පැන්නේ මුරකාරයින්වත් පෙරළාගෙනයි. සර්බෙරස් බුරන්න ගත්තත් ඒක ඇසුණේ තරහෙන් කළ බිරුමකට වඩා උද්‍යෝගයෙන් 'මාත් සෙල්ලමට එන්න ද?' අහනවා වගෙයි.

වාසනාවකට වගේ, එයා අපි පසුපස ආවෙ නැහැ. මිසිස් ඕ'ලෙරී නොනැවතී දිවුවා. අපි ගං ඉවුරේ සෑහෙන ඉහළට ගොස්, එරබොස්වල ගිනි එළි නොපෙනී යන තුරුම එයා නතර වුණේ නැහැ.

★★★

මිසිස් ඕ'ලෙරීගේ පිට මතින් රූටා ගිය නිකෝ කළු වැල්ල මත පොදියක් වගේ ඇද වැටුණා.

මම ඇම්බ්‍රෝසියා- හදිසි අවස්ථාවලට පාවිච්චියට ගන්න මම නිතර ම ළඟ තබාගෙන සිටි දිව්‍යමය ආහාර- කෑල්ලක් එළියට ගත්තා. ඒක තරමක් තැළී තිබුණා වුණත් නිකෝ එය සපා කෑවා.

"අහ්," එයා කෙඳිරුවා. "දැන් හොඳයි."

"ඔයාගේ බලයත් ඔයාගේ ශක්තිය ගොඩක් ඇදලා ගන්නවා," මම කිවුවා.

එයා නිදිබරව ඔළුව වැනුවා. "ලොකු බලයක් එක්ක... නිදා ගන්න ලොකු උවමනාවකුත් එනවා. මාව පස්සෙ ඇහැරවන්න."

"හෝව්, නිදිකුම්බරයා." එයා ආයෙමත් සිහිසුන් වෙලා වැටෙන්න කලින් මම එයාව අල්ලා ගත්තා. "අපි දැන් ගඟ ළඟ ඉන්නේ. දැන් කරන්න ඕනෑ දේ ඔයා මට කියන්න ඕනෑ."

මගේ ළඟ තිබුණු අන්තිම ඇම්බ්‍රෝසියා කෑල්ලත් මම එයාට කැව්වා. ඒක නම් ටිකක් අවදානම් වැඩක්. මේ කෑමට උප දෙවිවරුන්ව සුව කරන්න හැකියාව තිබුණා, ඒත් ඕනෑවට වඩා කෑවොත් අපිව පුච්චලා අළු කර දමන්න හැකියාව ඒවාට තිබුණා. වාසනාවට, ඒක වැඩ කරන බව පෙනුණා. දෙතුන් වතාවක් ඔළුව හෙල්ලූ නිකෝ අමාරුවෙන් සිටගත්තා.

"දැන් කොයි වෙලාවෙ හරි මගේ තාත්තා එයි," එයා කිවුවා. "අපි ඉක්මන් කරන්න ඕනෑ."

ස්ටයික්ස් ගං දිය අසාමාන්‍ය බඩු භාණ්ඩ සමඟ කැලඹෙමින් ගලා ගියා- කැඩුණු සෙල්ලම් බඩු, ඉරී ගිය විශ්වවිද්‍යාල ඩිප්ලෝමා, පරවී ගිය මංගල මල් පොකුරු- ජීවිතයෙන් මරණයට ගමන් කරද්දී මිනිසුන් විසි කර දැමූ සෑම සිහිනයක් ම. කළු පාට ගං දිය දකිද්දී, ඒ වෙනුවට මම පිහිනන්න කැමති වෙනත් තැන් මිලියන තුනක් විතර මගේ මතකයට ආවා.

"එතකොට... නිකං ම පනින්න ද තියෙන්නේ?"

"මුලින් ම ඔයා ඔයාව සූදානම් කරගන්න ඕනෑ," නිකෝ කිවුවා, "එහෙම නැති වුණොත් ගඟ ඔයාව විනාශ කරලා දායි. ඒක ඔයාගේ ඇඟයි, ආත්මයයි දෙකම පුච්චලා දායි."

"අහන්නත් ආසයි," මම කෙඳිරුවා.

"මේක විහිළුවක් නෙවෙයි," නිකෝ අනතුරු ඇඟෙව්වා. "ඔයාගේ මනුෂ්‍ය ජීවිතයට ඇමිණිලා ඉන්න එකම ක්‍රමයයි තියෙන්නේ. ඔයාට කරන්න තියෙන්නේ..."



මගේ පිටුපසට යොමු වුණු එයාගේ ඇස් දෙක එක්වර ම ලොකු වුණා. ආපසු හැරී බැලූ මට මුහුණට-මුහුණ හමු වුණේ ග්‍රීක රණශූරයෙක්.

එක තත්පරයකට මට හිතුණේ ඒ ඒරීස් කියලයි, මොකද මේ හාදයත් හරියට ම යුද දෙවියා වගේමයි- කොටට ම කැපූ කළු කොණ්ඩයක් සහ, කැළැල් වැටුණු කෲර මුහුණක් තිබුණු එයා උස, හැඩිදැඩි කෙනෙක්. එයා සුදු පාට කබායක් සහ ලෝකඩ සන්නාහයක් හැඳ සිටියා. පෙන්දක් ගැසූ යුද හිස්වැසුමක් එයාගේ කිහිල්ලක් යට තිබුණා. ඒ වුණත් එයාට තිබුණේ මිනිස් ඇස් දෙකක්- නොගැඹුරු මුහුද වගේ ලා කොළ පාට ඇස් දෙකක්. එයාගේ වම් කකුලේ වළලු කරට ඉහළින් කෙණ්ඩයට ලේ වැකුණු ඊතලයක් කිඳා බැස තිබුණා.

ග්‍රීක නම්-ගම් සම්බන්ධයෙන් මම පල් මෝඩයෙක් වුණත්, මෙච්චර කාලෙකට හිටපු ශ්‍රේෂ්ඨ ම රණ ශූරයා ගැන, විලුඹේ තුවාලයක් නිසා මියගිය වීරයා ගැන මම වුණත් දැනගෙන හිටියා.

"අකිලිස්," මම කිවුවා.

අවතාරය ඔළුව වැනුවා. "මම අනිකාටත් මගේ පාරෙ යන්න එපා කියලා අනතුරු ඇඟෙව්වා. දැන් මම නුඹටත් අනතුරු අඟවනවා."

"ලූක්ට? ඔයා ලූක් එක්ක කතා කළා ද?"

"මේක කරන්න එපා," එයා කිවුවා. "ඒක නුඹව බලගතු කරයි. ඒත් ඒක ම නුඹව දුර්වල කරයි. සටනේ දි නුඹේ බලය කිසිම මනුෂ්‍යයෙකුට වඩා අසීමිත වෙයි, ඒත් නුඹේ දුර්වලකම්, නුඹේ දෝෂයනුත් ඒ තරමට ම වර්ධනය වෙයි."

"ඔයා කියන්නේ මගේ විලුඹත් තුවාල වෙයි කියල ද?" මම ඇහුවා. "ඉතින් මම සෙරෙප්පු දෙකක් නැතුව, වෙන මොකක් හරි දාගෙන ගියොත්? මේ දන්නැති නිසයි ඇහුවේ."

එයා එයාගේ තුවාල වුණ කකුල දිහා බැලුවා. "මේ විලුඹ මගේ ශාරීරික දුර්වලකම විතරයි, උප දෙවියෝ. මගේ අම්මා, තෙටිස් මාව ස්ටයික්ස් ගඟට ඔබද්දී අල්ලගෙන හිටියේ එතැනින්. මගේ මරණයට ඇත්තට ම හේතුව වුණේ මගේ අධිමාන්නයයි. ප්‍රවේසමෙන්! ආපහු හැරෙන්න!"

එයා ඇත්තටම ඒක අදහස් කළා. එයාගේ කටහඬේ වූ පසුතැවීම සහ දොම්නස මම හඳුනා ගත්තා. එයා අවංකව ම උත්සාහ කරමින් සිටියේ මාව බිහිසුණු ඉරණමකින් බේරගන්නයි.

Scanned with CamScanner

ඒත් ඉතින්, මට කලින් ලූක් මෙතැනට ඇවිල්ලා තිබුණා. ඒ වගේම එයා ආපහු හැරිලා ගිහිල්ලත් නැහැ.

ලූක්ට එයාගේ සිරුර දූවි අළු කරගන්නේ නැතිව ක්‍රෝනොස්ගේ ආත්මය දරාගන්න පුළුවන්කම ලැබුණේ ඒ නිසයි. එයා එයාව සූදානම් කරගෙන තියෙන්නේ මේ විදිහටයි, ඒ වගේම දැන් එයාව මරන්න කොහෙත්ම බැහැ වගේ පෙනුණෙත් ඒ නිසයි. එයා ස්ටයික්ස් ගඟෙන් නාලා, ශ්‍රේෂ්ඨ ම මනුෂ්‍ය වීරයා අකිලිස්ගේ බලය ලබාගෙන තිබුණා. දැන් කිසිවෙකුටත් එයාව පරාජය කරන්න බැරි වුණා.

"මට ඒක කරන්න ම වෙනවා," මම කිවුවා. "එහෙම නැති වුණොත් මට කිසිම අවස්ථාවක් නැහැ."

අකිලිස් ඔළුව පහත් කරගත්තා. "මම උත්සාහ කරපු බවට දෙවියෝ සාක්කි. වීරයෝ, නුඹ මේක කරන්න ම ඕනෑ නම්, නුඹේ මනුෂ්‍ය ලක්ෂයට හිත ඒකාග්‍ර කරගන්න. නුඹේ ඇඟේ එක තැනක් දුර්වල තත්ත්වයෙන් ම තියෙන හැටි හිතේ මවාගන්න. මෙන්න මේ තැන තමයි නුඹේ ආත්මය නුඹේ ඇඟට අමුණලා තියාගන්නේ. ඒක නුඹේ ලොකු ම දුර්වලතාවය වගේම නුඹේ එක ම බලාපොරොත්තුවත් වෙයි. කිසිම මනුෂ්‍යයෙකුට මුළුමනින් ම පරාජයට පත් කළ නොහැකි කෙනෙක් වෙන්න බැහැ. නුඹගේ මනුෂ්‍යත්වය රඳා පවතින දේ ගැන දර්ශනය නැති කර ගත්තොත්, ස්ටයික්ස් ගඟ නුඹව පුච්චලා අළු කරලා දමයි. නුඹ ඉවරෙට ම ඉවර වෙයි."

"මං හිතන්නේ, ලූක්ගේ මනුෂ්‍ය ලක්ෂය කොතැන ද කියලා මට කියන්න ඔයාට බැරි වෙයි නේ?"

එයා රවා බැලුවා. "නුඹව සූදානම් කරගන්නවා, මෝඩ කොල්ලා. මේකෙන් පණ බේරගත්තත් නැතත්, නුඹ නුඹේ විනාශය තහවුරු කරගෙන ඉවරයි!"

ඒ සතුටුදායක ආරංචියත් එක්ක එයා අතුරුදහන් වුණා.

"පර්සි," නිකෝ කතා කළා, "සමහරවිට එයා හරි ඇති."

"මේ අදහස ගෙනාවේ ඔයාමයි නේ."

"මං දන්නවා, ඒත් දැන් අපි මෙතැනට ආවට පස්සේ-"

"ඔහොම වැල්ලට වෙලා ඉන්න. මට මොනවා හරි වුණොත්... හොඳයි, එතකොට සමහරවිට හේඩීස්ගේ ප්‍රාර්ථනාව ඉෂ්ට වෙයි. ඊට පස්සේ කොහොම හරි අනාවැකියේ කියවෙන ළමයා ඔයා වෙයි."



ඒ ආරංචියෙන් එයා සතුටු වුණ බවක් පෙනුනේ නැහැ, ඒත් මම එය ගණන් ගත්තේ නැහැ.

මගේ හිත වෙනස් වෙන්න ඉස්සර, මම මගේ පිට කොන්දේ මැද ඇති තැනට- මගේ පෙකණියට විරුද්ධ පැත්තේ පිහිටි චූටි තැනට මගේ හිත එකාග්‍ර කළා. මම සන්නාහයෙන් සැරසුණා ම එතැන හොඳින් ම ආවරණය වෙනවා. අහම්බයෙන් එතැනට පහරක් වදින්නත් ඉඩක් ඇත්තේ ම නැති තරම්. ඒ වගේම කිසිම හතුරෙක් ඒ වගේ තැනකට හිතාමතා පහර දෙන්න ඉලක්ක කරන්නෙත් නැහැ. ඇඟේ කිසිම තැනක් මේ වැඩේට සර්ව සම්පූර්ණ නැති වුණත්, මෙතැන ඒකට ගැළපෙනවා කියලා මට හිතුණා. කොහොම වුණත් මගේ කිහිල්ල වගේ තැනකට වඩා එතැන ගෞරවාන්විතයි නේ.

මගේ පිට කොන්ද මැදට ඇමිණුනු කඹයකින් මාව ලෝකයට සම්බන්ධ වෙලා තියෙන හැටි මම හිතේ මවා ගත්තා. ඊට පස්සේ මම ගං දියට පා තැබුවා.

★★★

බුබුළු දමමින් කැකෑරෙන ඇසිඩ් වළකට පතින හැටි හිතේ මවා ගන්න. දැන් ඒ වේදනාව පනස් ගුණයකින් වැඩි කරන්න. එහෙම කළත් ඔයාට ස්ටයිකිස් ගඟේ පිහිනද්දී මට දැනුණු දේ තේරුම් ගන්න බැරි වෙයි. මම සැලසුම් කරගෙන හිටියේ නම් නියම වීරයෙක් වගේ හෙමිහිට, එඩිතරව වතුර මැදට ඇවිදගෙන යන්නයි. ඒත් වතුර මගේ කකුල්වල ගෑවුණු හැටියේ මගේ මාංශ පේශි පෙළිවලට හැරිලා මාව මුණින් අතට වතුරට ඇදගෙන වැටුණා.

මාව මුළුමනින් ම වතුරේ ගිලුණා. මගේ ජීවිතේ පළවෙනි වතාවට මට වතුර යට දී හුස්ම ගන්න බැරි වුණා. වතුරේ ගිලෙද්දී ඇතිවන භීතිය අන්තිමේ දී මට තේරුම් ගන්න හැකි වුණා. මගේ ඇඟේ සෑම ස්නායුවක් ම දැවුණා. මම වතුරේ දිය වී යමින් සිටියා. මට එක එක මුහුණු පෙනුණා- රේචල්ගේ, ග්‍රෝවර්ගේ, ටයිසන්ගේ, මගේ අම්මාගේ- ඒත් ඒවා මතු වූ සැණින් ම ආපසු මැකී ගියා.

"පර්සි," මගේ අම්මා කිවුවා. "මම ඔයාට මගේ ආශිර්වාදය දෙනවා."

"පරිස්සමෙන්, අයියා!" ටයිසන් ආයාචනා කළා.

Scanned with CamScanner

"එන්චිලඩා!" ග්‍රෝවර් කිවුවා. ඒක ආවේ කොහෙන්ද, මට විශ්වාසයක් තිබුණේ නැහැ, ඒත් එයින් වැඩි උදවුවක් ලැබෙන පාටක් පෙනුනේ නැහැ.

මම සටනින් පැරදෙමින් සිටියා. ඒ වේදනාව දරාගන්න බැරි තරම්. මගේ දෑත් සහ දෙපා වතුරේ දිය වී යමින් තිබුණා, මගේ ආත්මය මගෙන් ඉදිරී යමින් තිබුණා. මම කවුද කියලා මට සිහි කරගන්න බැරි වුණා. මේ වේදනාව සමඟ බලද්දී ක්‍රෝනොස්ගේ දෑකැත්තට කැපුණු වේදනාව සුළු දෙයක් වගෙයි.

කඹය, හුරු පුරුදු කටහඬක් කිවුවා. ඔයාගේ ජීවිතාරක්ෂක කඹය මතක තියාගන්න, මෝඩයෝ!

එක්වර ම මගේ පිට කොන්දෙන් ගස්සා අදින බවක් දැනුණා. දියවැල් මාව ඇදගෙන යන්න උත්සාහ කළත්, තව දුරටත් මාව ගසාගෙන ගියේ නැහැ. මගේ පිට කොන්දට ඇමිණී තිබුනු කඹය මාව වෙරළට ගැට ගසාගෙන තබා ගන්න බව මම හිතේ මවා ගත්තා.

"අල්ලගෙන ඉන්න, පාසි මොළේ." ඒ ඇනබෙත්ගේ කටහඬ දැන් වඩාත් පැහැදිලිව ඇසුණා. "ඔයාට එච්චර ලේසියෙන් මගෙන් ගැලවිලා යන්න ලැබෙන්නෙ නැහැ."

රැහැන වඩාත් ශක්තිමත් වුණා.

දැන් මට ඇනබෙත්ව දැකගත හැකි වුණා- එයා මට ඉහළින් ඔරු පදින විලේ ජැටිය මත පාවහන් නොදැමූ දෙපයින් සිටගෙන සිටියා. මම මගේ ඔරුවෙන් වතුරට වැටිලා. සිද්ධ වෙලා තියෙන්නේ ඒකයි. මාව ගොඩට ඇද ගන්න එයා අත දිගු කරමින් සිටියා. ඒ අතරේ ම එයා සිටියේ හිනා නොවී ඉන්න උත්සාහ කරමිනුයි. එයා තැඹිලි පාට කඳවුරු ටී-ෂර්ට් එකෙන් සහ කලිසමකින් සැරසී සිටියා. එයාගේ කොණ්ඩය නමා එයාගේ යැන්කීස් කැප් එක තුළට දමා තිබුණා. ඒක අරුමයක් වුණේ හරි නම් එයින් එයාව අදෘශ්‍යමාන වෙන්න ඕනෑ නිසයි.

"සමහර වෙලාවට ඔයා නම් මහ මෝඩයෙක්." එයා හිනා වුණා. "ඉතින් එන්න. මගේ අත අල්ල ගන්න."

මගේ හිතට මතකයන් ගොඩක් නැවත ගලා ආවා- ඒවා පෙරට වඩා තියුණු සහ වඩාත් වර්ණවත් වුණා. මාව දිය වී යාම නැවතුණා. මගේ නම පර්සි ජැක්සන්. මම ඉහළට එසවී ඇනබෙත්ගේ අත අල්ල ගත්තා.



එක්වර ම මම වතුරෙන් ගොඩට මතු වුණා. මම වැල්ල මත ඇද වැටෙද්දී නිකෝ පුදුමයෙන් ආපස්සට පැන්නා.

"ඔයා හොඳින් ද?" එයා ගොත ගැසුවා. "ඔයාගේ හම. අනේ, දෙයියනේ. ඔයාට තුවාල වෙලා!"

මගේ අත් දෙක තද රතු පාට වී තිබුණා. මට දැනුණේ මගේ ඇඟේ සෑම අඟලක් ම මද ගින්නේ තම්බලා අරන් වගෙයි.

ඇනබෙත් මෙතැන නැති බව දැන දැනත්, මම එයාව සොයා වටපිට බැලුවා. ඒක දැනුණේ ඇත්තක් වගේමයි.

"මම හොඳින්... මං හිතන්නේ." මගේ හමේ පාට ආපහු සාමාන්‍ය තත්ත්වයට හැරුණා. වේදනාව බැස ගියා. මගේ ළඟට ආව මිසිස් ඕ'ලෙරී සැලකිල්ලෙන් මාව ඉව කර බැලුවා. පෙනුණු හැටියට මගේ ළඟින් හරි ම කුතුහලය දනවන සුවඳක් හැමුවා වගෙයි.

"ඔයාට ශක්තිමත් ගතියක් දැනෙනව ද?" නිකෝ ඇහුවා.

මට දැනෙමින් තිබුණේ මොකක්ද කියලා තීරණය කරන්න ඉඩක් ලැබෙන්න කලින්, කටහඬක් දෙදුරුවා, "අන්න ඉන්නවා!"

මළවුන් හමුදාවක් අපි දිහාවට ගමනේ ආවා. රෝමානු හමුදාවේ ඇටකටු සෙබළු සිය ගාණක් පලිහ සහ හෙලි දරාගෙන පෙරමුණේ ආවා. ඊට පිටුපසින් ඒ තරම් ම බ්‍රිතාන්‍ය රතු කබා හමුදා සෙබළු ගණනක් බයිනෙත්තු මානාගෙන ආවා. මේ සේනාව මැද, ගිනිගෙන දැවෙන දෑස් සහ කේශර ඇති අශ්වයින් විසින් ඇදගෙන ගිය කළු-සහ-රන්වන් කරත්තයක නැගී සිටියේ හේඩීස්.

"මේ වතාවේ නුඹට පැනලා යන්න ලැබෙන්නෙ නැහැ, පර්සි ජැක්සන්!" හේඩීස් ගර්ජනා කළා. "ඒකාව විනාශ කරපල්ලා!"

"තාත්තේ, එපා!" නිකෝ කෑගැසුවත්, එතකොට පරක්කු වැඩියි. රෝමානු පිල්ලි හමුදාවේ ඉදිරි පේළිය හෙලි අමෝරාගෙන පහර දෙන්න දුවගෙන ආවා.

මිසිස් ඕ'ලෙරී ගොරවමින් කඩා පනින්න සූදානම් වුණා. සමහරවිට මාව උත්තේජනය කරන්න ඇත්තේ ඒක වෙන්න ඇති. එයාලා මගේ බැල්ලට හිරිහැර කරනවා දකින්න මට ඕනෑ වුණේ නැහැ. ඒ ඇරත්, හේඩීස්ගේ දාමරිකකම් බලාගෙන ඉඳලා මට ඇති වෙලයි තිබුණේ. මම මැරෙන්න යනවා නම්, සටන් කරලා මැරෙන එක හොඳයි කියලා මම හිතුවා.

මම මොර ගසද්දී, ස්ටයික්ස් ගඟ පුපුරා හැලුණා. කළු පාට උදම් රළක් රෝමානු සේනාව මතට කඩා වැදුණා. හෙලි සහ පලිහා හතර අත විසි වුණා. රෝමානු පිල්ලි දිය වී යද්දී, එයාලගේ ලෝකඩ හිස්වැසුම් තුළින් දුම් පිටවුණා.

රතු කබාකරුවෝ බයිනෙත්තු පහත් කරා, ඒත් මම එයාලා එන තුරු බලා සිටියේ නැහැ. මම පහර දෙන්න පැන්නා.

මම මෙච්චර කාලෙකට කරපු මෝඩ ම වැඩේ ඒකයි. මගේ දිහාවට එල්ල වුණ තුවක්කු සිය ගාණකින් උණ්ඩ පිට වුණත්, එකක්වත් මගේ වැදුනේ නැහැ. එයාලගේ පේළි අතරට කඩා වැදුණු මම රිප්ටයිඩ්ගෙන් පෙති ගහන්න පටන් ගත්තා. සෙබළු බයිනෙත්තුවලින් අනිමින්, කඩුවලින් කොටමින්, තුවක්කුවලට නැවත නැවතත් උණ්ඩ පුරවා වෙඩි තැබුවත්, ඒ කිසිවක් මගේ ඇඟේ ගෑවුණේවත් නැහැ.

මම හට පේළි අතරේ කැරකෙමින්, එකා පසුපස එකා බැගින් රතු කබාකාරයින්ව කපා දූවිලිවලට හැරෙව්වා. මගේ හිත ස්වයංක්‍රියව වැඩ කරන්න ගත්තාඃ අනිනවා, පහත් වෙනවා, මඟ අරිනවා, පෙරළෙනවා. රිප්ටයිඩ් තව දුරටත් කඩුවක් වුණේ නැහැ. ඒක තනිකර ම විනාශය ගෙන එන චාපයක් වුණා.

සතුරු සේනා බිඳගෙන ගිය මම කළු කරත්තය මතට පැන්නා. හේඩීස් එයාගේ යෂ්ටිය එසෙව්වා. එයින් අඳුරු ශක්ති කදම්භයක් මගේ දිහාවට නිකුත් වුණා, ඒත් මගේ කඩුවෙන් එය ඉවතට හැරවූ මම එයාගේ ඇඟට කඩා පැන්නා. දෙවියයි මමයි දෙන්න ම කරත්තයෙන් ඉවතට පෙරළුණා.

ඊළඟට මට තේරුම් ගියේ, මගේ දණහිස හේඩීස්ගේ පපුව මත ඇති බවයි. මම එයාගේ රාජකීය කබා කොලරය එක මිටකින් අල්ලගෙන, මගේ කඩුවේ තුඩ එයාගේ මුහුණට එල්ල කරගෙන සිටියා.

සියල්ල නිහඬ වුණා. තමන්ගේ ස්වාමියාගේ ආරක්ෂාව වෙනුවෙන් හමුදාව කිසිම දෙයක් කළේ නැහැ. ආපස්සට බැල්මක් හෙළූ මට එයට හේතුව තේරුම් ගියා. ආයුද සහ වැල්ල මත දුම් දමන හිස් නිල ඇඳුම් ඇරෙන්න එතැන වෙන කිසිවක් ඉතිරිව තිබුණේ නැහැ. මම ඒ සියලු දෙනාව ම විනාශ කර තිබුණා.

හේඩීස් කෙළ පිඬක් ගිල්ලා. "දැන්, ජැක්සන්, මේක අහන්න..."

එයා අමරණීය කෙනෙක් නිසා මට එයාව මරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ වුණත් දෙවිවරුන්ට තුවාල වෙන්න පුළුවන්. මම



එය හරියට ම දැන සිටියා, ඒ නිසා ම කඩුවක් මුහුණට එල්ල වී තියෙද්දී ඒ හැටි හොඳක් දැනෙන්න නැතුව ඇති කියලා මම තේරුම් ගත්තා.

"මම හොඳ කෙනෙක් නිසා," මම ගෙරෙව්වා, "ඔහේට යන්න දෙනවා. ඒත් මුලින් ම, මට අර උගුල ගැන කියනවා!"

මගේ අතේ හිස් කළු ලෝගුව විතරක් ඉතිරි කරමින් හේඩීස් දිය වී ගියා.

ශාපයක් පිට කළ මම තදින් හුස්ම ගනිමින් සිටගත්තා. මට කොයි තරම් මහන්සියි ද කියලා තේරුම් ගියේ දැන් අනතුර පහව ගියාට පසුවයි. මගේ ඇඟේ හැම පේශියක් ම ඇදුම් කෑවා. මම මගේ ඇඳුම් දිහා බැලුවා. ඒවා තීරුවලට කැපී, උණ්ඩවලින් සිදුරු වී තිබුණා. ඒ වුණත් මම හිටියේ කිසිම ආපදාවක් නැතුවයි. මගේ ඇඟේ එක ම සලකුණක්වත් තිබුණේ නැහැ.

නිකෝ කටත් ඇරගෙන බලා සිටියා. "ඔයා දැන්... කඩුවෙන්... ඔයා-"

"මං හිතන්නෙ ගඟේ වැඩේ වැඩ කරනවා," මම කිවුවා.

"ඔහ්, ඇත්තට," එයා කිවුවේ උපහාසයෙන්. "ඔයා හිතනවා ද?"

මිසිස් ඕ'ලෙරී සතුටින් බුරමින් වලිගය වැනුවා. එයා හිස් නිල ඇඳුම් ඉව කරමින්, ඇටකටුවක් සොයා වටේ කැරකුණා. මම හේඩීස්ගේ ලෝගුව එසෙව්වා. එහි රෙද්ද තුළ වධයට ලක් වූ මුහුණු තවමත් සැලෙමින් දිලිසෙනවා මට පෙනුණා.

මම ගං ඉවුරට ඇවිද ගියා. "නිදහස් වෙන්න."

ලෝගුව වතුරට දැමූ මම එය සුළි නංවමින් පහළට ඇදී ගොස්, දිය පහර තුළට දිය වී යනවා බලා සිටියා.

"ආපහු ඔයාගේ තාත්තා ළඟට යන්න," මම නිකෝට කිවුවා. "එයාට කියන්න මම එයාට යන්න දුන්න නිසා එයා මට ණයයි කියලා. ඔලිම්පස් කන්දට වෙන්න යන්නෙ මොකක්ද කියලා හොයාගෙන, එයාව උදවු කරන්න නම්ම ගන්න."

නිකෝ ඇස් ලොකු කරගෙන මගේ දිහා බලා සිටියා. "මට... මට බැහැ. එයා දැන් මට වෛර කරනවා ඇති. මං කිවුවෙ... ඉස්සරටත් වඩා."

"ඔයාට ඒක කරන්න ම වෙනවා," මම කිවුවා. "ඔයත් මට ණයයි."

එයාගේ කන් දෙක රතු වුණා. "පර්සි, මම ඔයාගෙන් සමාව ඉල්ලුවා නේ. අනේ... මට ඔයා එක්ක එන්න ඉඩ දෙන්න. මටත් සටන් කරන්න ඕනෑ."

"මේ පහළ ඉඳලා ඔයාට ඊට වඩා උදව්වක් කරන්න පුළුවන්."

"ඔයා කියන්නේ, ඔයා තවත් මාව විශ්වාස කරන්නෙ නැහැ කියන එක," එයා මූසල ලෙස කිවුවා.

මම උත්තර දුන්නේ නැහැ. මම අදහස් කළේ මොකක්ද, මට තේරුනේ නැහැ. පැහැදිලිව හිතන්න බැරි තරමට මම මේ දූන් සටනේ දී කළ දෙයින් තිගැස්සිලයි හිටියේ.

"කියන දේ අහලා ඔයාගේ තාත්තා ළඟට යන්න," මම කිවුවේ ඕනෑවටත් වඩා රළු නොවෙන්න උත්සාහ කරමින්. "එයා එක්ක ඉන්න. එයාව නම්ම ගන්න පුළුවන්කමක් තියෙන එක ම කෙනා ඔයා විතරයි."

"ඒක නම් හිතන්නත් අමාරුයි." නිකෝ සුසුමක් හෙළුවා. "හරි එහෙනම්. මම මට පුළුවන් උපරිමෙන් කරන්නම්කෝ. ඇරත්, එයා මගේ අම්මා ගැන තව මොනවා හරි දෙයක් හංගනවා. සමහරවිට මට ඒක හොයාගන්න පුළුවන් වෙයි."

"සුබ පැතුම්. දූන් මටයි මිසිස් ඕ'ලෙරීටයි යන්න තියෙනවා."

"කොහෙද?" නිකෝ ඇහුවා.

ගුහා කට දිහා බැලූ මම පණ ඇති ලෝකයට ආපහු නැග යන්න ඇති දිගු දුර ගැන හිතුවා. "මේ යුද්දෙ පටන් ගන්න. මට ලූක්ව හොයාගෙන යන්න වෙලාව ඇවිල්ලා."

# 09

# සර්පයෝ දෙන්නෙක් මගේ ජීවිතේ බේරුවා

මම නිව්යෝක් නගරයට හරි ම ආසයි. ඇයි දන්නව ද? එහෙ දී ඔයා පාතාල ලෝකයේ ඉඳලා මධ්‍යම උද්‍යානයේ මැදින් එළියට මතු වෙලා, කුලී වාහනයක් අල්ලගෙන, තඩි යම බල්ලෙක් පස්සෙන් දුවගෙන එද්දි පස්වෙනි මාවත දිගේ ගියත්, කවුරුත් ඔයා දිහාවට අමුතු බැල්මක්වත් හෙළන්නේ නැති නිසා.

ඇත්තට ම, ඒකට මීදුම උදවු වුණා තමයි. මට හිතෙන්නේ මිනිස්සුන්ට මිසිස් ඕ'ලෙරීව පේන්න නැතුව ඇති, එහෙමත් නැත්නම් සමහරවිට එයාලා හිතන්න ඇති මිසිස් ඕ'ලෙරී කියන්නෙ තඩි, ඝෝෂාකාරී, හරිම මිත්‍රශීලී ට්‍රක් රථයක් කියලා.

මම දෙවෙනි වතාවටත් අම්මාගේ ජංගම දුරකථනයෙන් ඇනබෙත්ට කතා කරන්න අවදානම ගත්තා. මම උමගේ සිටිද්දී එයාට පළවෙනි ඇමතුම ගත්තත්, ඒක යොමු වුණේ වොයිස් මේල්වලටයි. මිත්‍යා ලෝකයේ මැද හිටපු කෙනෙක් විදිහට බලද්දි මගේ ඇමතුමට පුදුම හිතෙනසුලු සම්බන්ධතාවයක් ලැබුණා වුණත්, මම බය වුණේ මගේ අම්මාගේ දුරකථන බිල්පත කොයි තරම් දිග වෙයි ද කියලයි.

මේ වතාවේ ඇනබෙත් ඇමතුම ගත්තා.

"හේයි," මම කිවුවා. "ඔයාට මගේ මැසේජ් එක ආව ද?"

"පර්සි, ඔයා කොහෙද ගිහින් හිටියේ? ඔයාගේ මැසේජ් එකේ මෙලෝ විස්තරයක් නැහැ නේ! අපි කොච්චර බයවෙලා ද හිටියේ!"

"මම ඔයාට පස්සෙ කියන්නම්කෝ," මම කිවුවත්, ඒක කොහොම කරන්න ද මට තේරුනේ නැහැ. "ඔයා කොහෙද ඉන්නේ?"

"ඔයා කියලා තිබුණ විදිහට ම අපි මඟ එන ගමන්. දැන් ක්වීන්ස්-මිඩ්ටවුන් උමඟටත් කිට්ටු කරලා ඉන්නේ. ඒත්, පර්සි, ඔයා මොනවද මේ කරන්න හදන්නේ? අපි කඳවුර සම්පූර්ණයෙන් ම වගේ ආරක්ෂාවක් නැතුව අත ඇරලයි ආවේ, ඒ මදිවට දෙවිවරු කොහෙද-"

"මාව විශ්වාස කරන්න," මම කිවුවා. "මම එතන දි ඔයාව මුණ ගැහෙන්නම්."

මම ඇමතුම විසන්ධි කළා. මගේ අත් වෙවුලමින් තිබුණේ. ඒක ස්ටයික්ස් ගඟේ නෑමෙන් පස්සෙ ඉතිරි වුණ බලපෑමක් ද, නැත්නම් මම කරන්න යන දේ ගැන අපේක්ෂාව නිසා ඇති වුණ එකක් ද මට හිතාගන්න බැරි වුණා. මේක වැඩ නොකළොත්, මාව චූටි චූටි කෑලිවලට පුපුරලා යන එක නතර කරන්න මට අලුතින් ලැබුණු ශක්තියටවත් හැකියාවක් ලැබෙන්නෙ නැහැ.

★★★

කුලී රිය මාව එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල ළඟින් බස්සද්දි දහවල ගෙවී යමින් තිබුණා. මිසිස් ඕ'ලෙරී කුලී වාහනය ලෙවකමින්, හොට් ඩෝග් කරත්තවලට ඉව අල්ලමින් පස්වෙනි මාවතේ ඉහළ පහළ දිවුවා. එයාව කිසිවෙකුගේ අවධානයට හසු වූ බවක් පෙනෙන්න නැති වුණත්, එයා ළඟට එද්දි මිනිස්සු පාරෙන් ඉවතට පනිමින්, අන්දබූත වෙලා වගේ බැලුවා.

සුදු පාට වෑන් රථ තුනක් ගැටි බැම්ම අසල නතර කරද්දි, මම උරුවම් බාලා මිසිස් ඕ'ලෙරීව ළඟට කැඳවා ගත්තා. වෑන් රථවල පිටත 'ඩෙල්ෆී ස්ට්‍රෝබෙරි සේවාව' කියලා සටහන් කර තිබුණා. ඒක තමයි අර්ධ-ලෝහිත කඳවුර ලෝකයාට පෙන්වන නම. මේ වෑන් රථ තුන ම එකවර එක තැන තියෙනවා මම කවදාවත් දකලා තිබුණේ නැහැ, ඒ වුණත් අපේ කඳවුරේ නැවුම් නිෂ්පාදන නගරයට ප්‍රවාහනය කරන්නේ ඒවාගෙන් කියලා මම දනගෙන හිටියා.

පළමු වෑනයේ රියැදුරා වුණේ අපේ ඇස් ගොඩක් ඇති ආරක්ෂක ප්‍රධානියා ආර්ගස්. අනෙක් රථ දෙක පදවාගෙන ආවේ හාර්පිලා දෙන්නෙක්- ඒ කියන්නේ කිසිම හැදියාවක් නැති, බිහිසුණු මිනිස්/කුකුල් දෙමුහුම් සත්තු විශේෂයක්. අපි කඳවුරේ පිරිසිදු



කිරීම්වලට වැඩි වශයෙන් හාර්පිලාව පාවිච්චි කළත්, එයාලට වාහන එළවන වැඩෙත් හොඳට කරන්න පුළුවන්.

පැත්තකට ඇරුණු දොරවල් තුළින් කඳවුරුකරුවෝ පොකුරක් බිමට බැස්සා. එයාලගෙන් සමහරුන්ගේ මුහුණු නම් දිග ගමනින් කොළ පාටට හැරිලයි තිබුණේ. වැඩි දෙනෙක් ඇවිත් ඉන්නවා දකලා මම සතුටු වුණා: පොලක්ස්, සිලේනා බියුරිගාඩ්, ස්ටොල් සහෝදරයෝ, මයිකල් යෙව්, ජේක් මේසන්, කේටී ගාඩ්නර් සහ ඇනබෙත් සමඟ එයාලගේ සහෝදර සහෝදරියෝ බොහෝමයක් එතැන සිටියා. වාහනයෙන් අන්තිමට එළියට බැස්සේ කයිරොන්. එයාගේ ඇගේ අශ්ව අර්ධය මායා රෝද පුටුව තුළ සඟවාගෙන සිටි නිසා එයාට ආබාධිතයින් සඳහා ඇති විශේෂ ආරෝහකය පාවිච්චි කරන්න සිදු වුණා. ඒරීස් කැබිනයේ අය ඇවිත් හිටියේ නැහැ. ඒ වුණත් ඒකට වැඩිය තරහා නොගෙන ඉන්න මම උත්සාහ කළා. ක්ලැරිස් කියන්නේ හිතුවක්කාර මෝඩියෙක්. කතාව ඉවරයි.

මම ඔළු ගෙඩි ගාණ ගණන් කළා: කඳවුරුකරුවෝ හතළිහක් එතැන සිටියා.

ඒක යුද්ධයකට ප්‍රමාණවත් ගණනක් නම් නෙවෙයි, ඒ වුණත් ඒ තරම් අර්ධ-ලෝහිතයෝ ගොඩක් කඳවුරෙන් පිටත තැනකට රැස්වෙලා ඉන්නවා මම දැක්කේ පළවෙනි වතාවටයි. හැමෝම හිටියේ බයෙන් වගෙයි. ඒ ඇයි කියලා මට තේරුණා. ඒ වෙලාවේ අපෙන් කොයි තරම් උපදෙවි රශ්මියක් පිට වෙන්න ඇති ද කියනවා නම්, රටේ ඊසාන දිග කොටසේ හිටපු හැම රාක්ෂයෙක් ම අපි එතැන ඉන්න බව දනගන්න ඇති.

මම එයාලගේ මුහුණු දිහා බලද්දි- ගිම්හාන වාර ගණනාවක් පුරාවට මම දන හඳුනාගෙන සිටි මේ සියලූ ම කඳවුරුකරුවන් දකිද්දි මගේ හිත කොණකින් නැඟුණු එක හඬක් මට වධ දුන්නා: එයාලගෙන් එක්කෙනෙක් ඔත්තුකාරයෙක්.

ඒ වුණත් මට ඒ ගැන හිත හිතා ඉන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. මේ ඉන්නේ මගේ යාළුවෝ. මට එයාලව ඕනෑ වුණා.

ඒ වෙලාවේ මට ක්‍රෝනොස්ගේ යක්ෂ හිනාව මතක් වුණා: තුඹට යාළුවෝ විශ්වාස කරන්න බැහැ. එයාලා හැම වෙලාවෙම තුඹව පහතට ඇදලා දානවා.

Scanned with CamScanner

ඇනබෙත් මගේ ළඟට ආවා. කළු පාට හමුදා මෝස්තරයේ ඇඳුම් කට්ටලයකින් සැරසී සිටි එයා, එයාගේ දිව්‍යමය ලෝකඩ කිණිස්ස එක අතක බැඳගෙන, උරහිසේ ලැප්ටොප් පරිගණකය එල්ලාගෙන සිටියේ අවශ්‍යතාවය මතුවෙන විදිහට ඕනෑ ම වෙලාවක කාටහරි අනින්න, නැත්නම් අන්තර්ජාලයේ සැරිසරන්න සූදානමෙන්.

එයා රවා බැලුවා. "මොකද?"

"මොකද අහන්නෙ මොකද?" මම ඇහුවා.

"ඔයා මගේ දිහා අමුතු විදියට බලන් ඉන්නේ."

මම හිතමින් හිටියේ ඇනබෙත් මාව ස්ටයික්ස් ගඟෙන් ගොඩට ඇදගන්නවා පෙනුණු ඒ පුදුමාකාර දසුන ගැන කියලා මට තේරුම් ගියා. "ඒක, අහ්, මුකුත් නැහැ." මම කණ්ඩායමේ ඉතිරි අය වෙතට හැරුණා. "හැමෝම ආවට ස්තූතියි. කයිරොන්, ඔයා ඉස්සර වෙන්න."

මගේ පරණ උපදේශකයා ඔළුව හෙල්ලුවා. "මං ආවේ ඔයාට සුබ පතලා යන්න, මගෙ කොල්ලෝ. ඒත් මට කැඳවීමක් කරලා නැත්නම් මම කිසිම දවසක ඔලිම්පස්වලට යන්නෙ නැහැ."

"ඒත් ඔයා නේ අපේ නායකයා."

එයා හිනා වුණා. "මම ඔයාලගේ පුහුණුකරුවා. ගුරුවරයා. ඔයාලගේ නායකයා වෙනවා කියන්නෙ ඒක නෙවෙයි. මම ගිහිල්ලා අපේ පැත්තට තව කට්ටිය එකතු කරගන්න බලන්නම්. මගේ සහෝදර නරාශ්වයින්ව අපේ උදව්වට නම්ම ගන්න තවමත් පරක්කු නැති වෙන්න පුළුවන්. ඒ අතර වාරේ, කඳවුරුකාරයින්ව මෙතැනට කැඳෙව්වෙ ඔයයි, පර්සි. ඔයා තමයි නායකයා."

එයට විරෝධය දක්වන්න මට ඕනෑ වුණා, ඒත් හැමදෙනා ම, අඩු තරමේ ඇනබෙත් පවා බලාපොරොත්තු සහගතව බලා සිටියේ මගේ දිහාවයි.

මම ගැඹුරු හුස්මක් ගත්තා. "හොඳයි, මම ෆෝන් එකෙන් ඇනබෙත්ට කිවුවත් වගේ, අද රෑ වෙනකොට මොකක් හරි නරක දෙයක් සිද්ධ වෙන්නයි යන්නේ. මොකක් හරි උගුලක්. අපිට සිද්ධ වෙනවා සියුස්ව බැහැ දකලා, මේ නගරේ ආරක්ෂා කරගන්න කියලා එයාට ඒත්තු ගන්වන්න. මතක තියාගන්න, අපිට 'බැහැ' කියන එක උත්තරයක් විදිහට ගන්න බැහැ."



මම මිසිස් ඕ'ලෙරීව බලා ගන්න ආර්ගස්ට පැවරුවා. ඒකෙන් ඒ දෙන්න ම සතුටු වුණු බවක් පෙනුනේ නැහැ.

කයිරොන් මට අතට-අත දුන්නා. "ඔයා මේ වැඩේ හොඳට කරයි, පර්සි. ඔයාගේ ශක්තීන් මතක තියාගන්න, ඒ වගේම ඔයාගේ දුර්වලකම් ගැන පරිස්සම් වෙන්න."

ඒ කතාව අකිලිස් මට කියූ දේට ගොඩක් සමානවයි ඇසුණේ. ඒ වෙලාවේ, අකිලිස්ට උගන්වා තිබුණෙත් කයිරොන් ම බව මට සිහිවුණා. ඒ ගැන හිතද්දි මගේ හිතට සහනයක් නම් දැනුනේ නැහැ, ඒ කොහොම වුණත් ඔළුව වනපු මම එයාට විශ්වාසනීය හිනාවක් දෙන්න උත්සාහ කළා.

"අපි යමු," මම කඳවුරුකරුවන්ට කිවුවා.

★★★

ප්‍රවේශ ශාලාවේ ලියන මේසයට පිටුපසින් වාඩි වී සිටි ආරක්ෂක නිලධාරියා කවරයේ මලක රූපයක් ඇති, ලොකු කළු පාට පොතක් කියවමින් සිටියා. ආයුද සහ සන්නාහවලින් හඬ නංවමින් අපි සියලු දෙනා එතැනට පිරෙද්දි එයා ඔළුව ඔසවා බැලුවා. "ඉස්කෝලෙකින් ද? අපි දූන් වහන්නයි හදන්නේ."

"නෑ," මම කිවුවා. "හයසිය වෙනි තට්ටුවට."

එයා අපි දිහා සෝදිසියෙන් බැලුවා. ලා නිල් පාට ඇස් දෙකක් තිබූ එයා හිස සම්පූර්ණයෙන් ම මුඩු කරලයි සිටියේ. එයා මනුෂ්‍යයෙක් ද නැද්ද කියන්න මට පුළුවන්කමක් තිබුණේ නැහැ, ඒ කොහොම වුණත් එයා අපේ ආයුද දැකපු බව පෙනෙන්න තිබුණා. ඒ නිසා මං හිතන්නේ මීදුමෙන් එයා රැවටෙන්න නැතුව ඇති.

"මෙහෙ හයසිය වෙනි තට්ටුවක් නැහැ, ළමයෝ." එයා ඒක කිවුවේ එයා විශ්වාස නොකරන, ඒත් අනිවාර්යයෙන් කියන්න වෙලා තියෙන දෙයක් වගෙයි. "යනවල්ලා යන්ඩ."

මම එයාගේ මේසයට බර වුණා. "උප දෙවිවරු හතළිහකට රාක්ෂයෝ මහ ගොඩක් ඇදගන්න පුළුවන්. අපි ඔයාගේ ලොබියට වෙලා ඉන්නවා දකින්න ඔයාට ඇත්තට ම ඕනෑ ද?"

ඒ ගැන හිතලා බැලුව එයා ඊට පස්සේ බසරයක් ඔබා ආරක්ෂක ගේට්ටු විවර කළා. "ඉක්මන් කරනවලා."

Scanned with CamScanner

"අපිව ලෝහ පරීක්ෂක උපකරණේ හරහා යවන්නත් ඔයාට ඕනෑ වෙන්නෙ නැතිවෙයි," මම එකතු කළා.

"මම්, නෑ," එයා එකඟ වුණා. "දකුණු පැත්තෙ තියන සෝපානෙන් ගන්න. මං හිතන්නේ ඔයා පාර දන්නවා ඇති නේ."

එයාට රන් ඩ්‍රැච්මාවක් දීමූ මම අපේ කට්ටියව අරන් ඉස්සරහට ගියා.

සෝපානයෙන් දෙවාරයකට හැම දෙනාව ම ඉහළට අරන් යන්න අපි තීරණය කළා. මම පළවෙනි කණ්ඩායම සමඟ ගියා. මේ වතාවේ වාදනය වුණේ මම අන්තිම වතාවේ යනකොට වාදනය වුණාට වඩා වෙනස් සංගීතයක්- පරණ ඩිස්කෝ සිංදුවක් වුණ ඒක ඇහෙද්දි බෙල්-බොටම් කලිසමක් සහ සිල්ක් කමිසයක් ඇඳගෙන නටන ඇපලෝගේ බිහිසුණු රූපයක් මගේ හිතේ මැවුණා.

අන්තිමේ දි 'ඩිංග් ' හඬ නගමින් සෝපානයේ දොරවල් විවර වෙද්දී මට දැනුණේ සහනයක්. අපිට ඉදිරියෙන්, පාවෙන ගල්වලින් සෑදුණු අඩි පාර මැන්හැටන් නගරයට අඩි හය දහසක් ඉහළින් පාවෙමින් ඇති ඔලිම්පස් කන්ද දක්වා වලාකුළු මැදින් විහිදී තිබුණා.

මීට කලිනුත් කීප වතාවක් ම මම ඔලිම්පස් දැක තිබුණා වුණත්, තවමත් ඒක දකිද්දි මට හුස්ම ගන්න අමතක වුණා. කන්ද දෙපස බෑවුම් මත මන්දිර රන් පාටින් සහ සුදු පාටින් දිස්න දෙමින් තිබුණා. මළු සිය ගාණක් මල් පිපුණු උයන්වලින් පිරී තිබුණා. වංගු මතින් කැරකෙමින් ඇදි යන වීදි දෙපස සුවඳවත් දුම නගින ගිනි අඟුරු බඳුන් පෙළ ගස්වා තිබුණා. කඳු ගැටයේ හිමෙන් වැසුණු මුදුන මත දෙවිවරුන්ගේ මාලිගාව නැගී සිටියා. හැමදාමත් වගේම එය මහේශාක්‍ය ලෙස තිබුණත්, එහි මොකක්දෝ වරදක් ඇති බව පෙනුණා. මුළු කන්ද ම ඇත්තේ නිහැඬියාවක ගිලී බව මට තේරුම් ගියේ ඒ වෙලාවෙයි- කිසිම සංගීතයක්, කටහඬක් හෝ හිනා හඬක් ඇසෙන්නට තිබුණේ නැහැ.

ඇනබෙත් සැලකිල්ලෙන් මගේ දිහා බලා සිටියා. "ඔයාගේ පෙනුම... වෙනස් වෙලා," එයා තීරණය කළා. "ඇත්තට ම ඔයා කොහෙද ගියේ?"

නැවත වරක් විවර වූ සෝපාන දොර තුළින් පැමිණි දෙවෙනි අර්ධ-ලෝහිත කණ්ඩායම අපිට එක්කාසු වුණා.

"පස්සෙ කියන්නම්," මම කිවුවා. "එන්න යමු."



අපි අහස් පාලම හරහා ගොස් ඔලිම්පස්වල වීදියකට පා තැබුවා. එහි කඩ සාප්පු වසා දමලා. උද්‍යාන හිස් වෙලා. බංකුවක් මත වාඩි වී සිටි කලා දෙවි දූවරු දෙන්නෙක් දීප්තිමත් වීණා දෙකක් නිරස ලෙස වාදනය කරමින් සිටියා, ඒත් එයාලා ඒක ආසාවකින් කරන බවක් නම් පෙනුනේ නැහැ. හුදෙකලා සයික්ලොප්ස් කෙනෙක් උගුල්ලා ගත් ඕක් ගසකින් පාර අතු ගෑවා. සඳලු තලයක සිටි සුළු දෙවියෙක් අපිව දැකලා, ඇතුළට රිංගාගෙන ජනේලය වසා ගත්තා.

සියුස්ගේ සහ හේරාගේ ප්‍රතිමා දෙකක් දෙපස ඇති විශාල කිරිගරුඬ ආරුක්කුව යටින් අපි ගමන් කළා. ඇනබෙත් දෙවිවරුන්ගේ රැජිනට මූණ ඇද කරලා විරිත්තුවා.

"මට එයාව පෙන්නන්න බැහැ," එයා කෙඳිරුවා.

"එයා ඔයාට ශාපයක්වත් කළා ද?" මම ඇහුවා. ගිය අවුරුද්දේ ඇනබෙත් හේරා සමඟ පටලැවිල්ලක් ඇති කරගත්තා. ඒත් එදායින් පස්සේ ඇනබෙත් ඒ ගැන මුකුත් ම කිවුවෙ නැහැ.

"මෙච්චර කාලෙකට නම් පොඩි පොඩි දේවල් විතරයි," එයා කිවුවා. "එයාගේ පූජනීය සතා එළදෙන, නේද?"

"ඔව්."

"ඉතින් එයා මගේ පස්සෙන් එළදෙන්නු එවනවා."

මම හිනා නොවී ඉන්න බැලුවා. "එළදෙන්නු? සැන් ෆ්‍රැන්සිස්කෝවල?"

"ඔව් අප්පා. හුඟක් වෙලාවට මට උන්ව දකින්න ලැබෙන්නෑ, ඒත් උන් හැම තැන ම මට පොඩි පොඩි තෑගි තියලා යනවා- අපේ ගෙදර පිටිපස්සේ, පාරේ, ඉස්කෝලේ කොරිඩෝවල. මට දූන් අඩිය තියන තැන ගැන පරිස්සම් වෙන්න වෙලා තියෙන්නේ."

"බලන්න!" පෝලක්ස් කෑගැසුවේ, ක්ෂිතිජය දිහාවට ඇඟිල්ල දිගු කරමින්. "අර මොකක්ද?"

අපි හැමෝම ගල් ගැසුණා. හැන්දෑ අහස හරහා ඔලිම්පස් දිහාවට නිල් පාට එළි ධාරා ඇදී එමින් තිබුණේ චූටි වල්ගා තරු වගෙයි. ඒවා නගරයේ හැම තැනක ම සිට එක එල්ලේ කන්ද වෙතට එනවා වගෙයි පෙනුණේ. කිට්ටුවට එද්දි ඒවා දැවී ගියා. අපි විනාඩි කීපයක් පුරාවට ඒ දිහා බලා සිටියත්, ඒවාගෙන් කිසිම හානියක් වෙන

Scanned with CamScanner

බවක් පෙනුනේ නැහැ. ඒ කොහොම වුණත් ඒක හරිම අමුතු දෙයක් වුණා.

"ඒවා නිකං අධෝරක්ත පුල්ලි වගෙයි," මයිකල් යෙව් කෙඳිරුවා. "කවුරුහරි අපිව ඉලක්ක කරනවා."

"අපි මාලිගාවට යමු," මම කිවුවා.

දෙවිවරුන්ගේ ශාලාව මුර කරන්න කවුරුවත් හිටියේ නැහැ. රන්-සහ-රිදී දොර පළු මුළුමනින් ම හැර දමා තිබුණා. අපි සිංහාසන කාමරය තුළට ඇවිද යද්දී අපේ අඩි හඬ දෝංකාර දුන්නා.

ඇත්ත වශයෙන් ම 'කාමරය' කියන වචනේ එතැනට ගැළපෙන්නෙ නැහැ. ඒ තැන මැඩිසන් චතුරස්‍ර උද්‍යානය තරම් ඇති. ඈත ඉහළින් වූ නිල් පාට සිවිලිම තරු රටාවලින් බැබළුණා. හිස්, යෝධ සිංහාසන දොළහක් උඳුනක් වටා 'යු' අකුරේ හැඩයට පිහිටා තිබුණා. එක් කෙළවරක, ගුවනේ පාවෙමින් තිබුණු නිවසක් තරමේ වතුර ගෝලයක් තුළ මගේ පරණ අර්ධ-හරක්, අර්ධ-සර්ප යාළුවා ඔෆියොටෝරස් පිහිනමින් සිටියා.

"උම්බෑෑ!" එයා රවුමට කැරකෙමින් සතුටින් හඬගෑවා.

එයාව දකිද්දි, සිදු වෙමින් තිබුණු බරපතළ දේවල් සියල්ල පැත්තකට දමා මම හිනාවුණා. අවුරුදු දෙකකට කලින් ඔෆියොටෝරස්ව ටයිටන්ලාගෙන් බේරගන්න අපිට සෑහෙන කාලයක් මිඩංගු කරන්න සිද්ධ වුණා. ඒ කාලයේ දී මම එයාට ගොඩක් හිතවත් වුණා. එයා ගෑනු සතෙක් කියලා මුලින් ම හිතපු මම එයාට බෙසී කියලා නමක් දැම්මා වුණත් එයත් මට කැමතියි වගෙයි පෙනුණේ.

"හේයි, කොල්ලෝ," මම කතා කළා. "මෙයාලා ඔයාට හොඳට සලකනව ද?"

"උම්බෑ," බෙසී උත්තර දුන්නා.

අපි සිංහාසන දෙසට ඇවිද යද්දි, ගැහැනු කටහඬක් ඇසුණා, "ආයෙමත් හලෝ, පර්සි ජැක්සන්. ඔයාවයි ඔයාගේ යාළුවන්වයි සාදරෙන් පිළිගන්නවා."

උඳුන ළඟ වාඩි වී කෝටුවකින් ගිනි දලුවලට අනිමින් සිටියේ හෙස්ටියා. එයා කලින් වතාවේ හැඳ සිටි ආකාරයේ ම දුඹුරු පාට සරල ගවුමකින් සැරසී සිටියත්, දැන් එයා වැඩුණු කාන්තාවක් වගෙයි සිටියේ.

මම හිස නමා ආචාර කළා. "හෙස්ටියා උත්තමාවිය."



මගේ යාළුවෝ ටිකත් මගේ ආදර්ශය අනුගමනය කළා.

හෙස්ටියා එයාගේ දිලිසෙන රතු ඇස්වලින් මගේ දිහා බලා සිටියා. "මට පේන්නේ ඔයා ඔයාගේ සැලසුම අනුව ගිහිල්ලා. ඔයා අකිලිස්ගේ ශාපය දරාගෙනයි ඉන්නේ."

අනෙක් කඳවුරුකරුවෝ තම තමන් අතරේ රහසින් කතා වෙන්න ගත්තා: මොකක්ද එයා කිවුවේ? අකිලිස්ගේ මොකක්ද?

"ඔයා පරිස්සම් වෙන්න ඕනෑ," හෙස්ටියා මට අනතුරු ඇඟෙව්වා. "ඔයාගේ ගමනෙන් ඔයා ගොඩක් දේවල් ලබා ගත්තා. ඒ වුණාට ඔයා තවමත් වඩාත් ම වැදගත් සත්‍යය දැකලා නැහැ. බාගදා එයින් අංශු මාත්‍රයක් පෙන්නුවොත් වඩාත් හොඳ වෙයි."

ඇනබෙත් මට වැළමිටෙන් ඇන්නා. "මේ... එයා මොනවා ගැන ද කියන්නේ?"

හෙස්ටියාගේ ඇස් දිහා එක එල්ලේ බලා සිටිද්දි මගේ හිතට චිත්ත රූපයක් වේගයෙන් ගලා ආවා: රතු ගඩොලින් බැඳි ගබඩා දෙකක් අතර තිබූ අඳුරු පටු මඟක් මට පෙනුණා. 'රිච්මන්ඩ් යකඩ බඩු සාදන්නෝ.' එක් දොරකට උඩින් ගසා තිබුණා.

හෙවණැලි අතරේ ඇන තියාගෙන අර්ධ-ලෝහිතයෝ දෙන්නෙක් සිටියා- අවුරුදු දහ හතරක විතර කොල්ලෙක් සහ අවුරුදු දොළහක විතර කෙල්ලෙක්. තිගැස්සුමක් සමඟ මට තේරුම් ගියේ ඒ කොල්ලා ලූක් කියලයි. ගැහැනු ළමයා සියුස්ගේ දුව, තාලියායි. මම දකිමින් සිටියේ ග්‍රෝවර් එයාලව හොයාගන්න කලින්, එයාලා පලා යමින් සිටි කාලයේ දසුනක්.

ලූක්ගේ අතේ ලෝකඩ කිණිස්සක් තිබුණා. තාලියා ළඟ එයාගේ හෙල්ලය සහ භීතියේ පලිහ, ඒගිස් තිබුණා. කේඩෑරි වී සිටි ඒ දෙන්නාට තිබුණේ හාමත් වුණ පෙනුමක්. ඒ දෙන්නාගේ වියරු වැටුණු වන සතුන්ගේ වගේ ඇස් කියාපෑවේ එයාලට පහර දීම්වලට ලක්වෙලා පුරුදු බවයි.

"ඔයාට විශ්වාස ද?" තාලියා ඇහුවා.

ලූක් ඔළුව වැනුවා. "මේ හරියේ මොකක් හරි තියෙනවා. මට ඒක දැනෙනවා."

Scanned with CamScanner

පවු මඟ පුරා ගිගුරුම් හඬක් පැතිරී ගියේ කවුරුහරි ලෝහ තහඩුවකට ගහනවා වගෙයි- අර්ධ-ලෝහිතයෝ දෙන්නා හොර රහසින් ඉදිරියට ඇදුණා.

බඩු පටවන තට්ටුවක් මත පරණ ලෑලි පෙට්ටි ගොඩ ගහා තිබුණා. තාලියා සහ ලූක් ආයුද සූදානමින් තබාගෙන එතැනට ළඟා වුණා. රැලි ගැසුණු ටින් තිරයක් සෙලවෙමින් තිබුණේ එයට පිටුපසින් මොකෙක් හෝ ඉන්නවා වගෙයි.

තාලියා ලූක් වෙතට බැල්මක් හෙළුවා. එයා හඬ නොනගා ගණන් කළා: එකායි, දෙකායි, තුනායි! එයා ටින් තිරය ඉරා දමද්දි ම, මිටියක් අතින් ගත් චූටි ගෑනු ළමයෙක් එයාගේ ඇඟට පැන්නා.

"හෝව්!" ලූක් කිවුවා.

ෆ්ලැනල් රෙද්දෙන් මැසූ පිජාමාවක් හැඳ සිටි ගෑනු ළමයාට අවුල් වී ගිය තඹ කොණ්ඩයක් තිබුණා. එයාගේ වයස අවුරුදු හතකට වැඩි වෙන්න බැහැ, ඒ වුණත් ලූක් වේගවත් නොවුණා නම් එයා ලූක්ගේ මොළේ පොඩි කරන්න වුණත් ඉඩ තිබුණා.

ලූක් ගෑනු ළමයාගේ මැණික් කටුව ඩැහැ ගත්තා ම, මිටිය සිමෙන්ති පොළොව හරහා විසි වුණා.

චූටි ගෑනු ළමයා පොර බදමින් පයින් ගැසුවා. "තවත් නම් රාක්ෂයෝ එපා! යනවල්ලා යන්න!"

"ඔක්කොම හරි!" ලූක් එයාව අත නෑර ඉන්න දඟලුවා. "තාලියා, ඔයාගෙ පලිහ අකුළා ගන්න. ඔයා එයාව බය කරනවා."

තාලියා ඒගිස්ට තට්ටුවක් දැමුවා ම ඒක හැකිළී රිදී බ්‍රේස්ලටයකට හැරුණා. "හේයි, බය වෙන්නෙපා," එයා කිවුවා. "අපි ඔයාට කරදර කරන්නෙ නැහැ. මම තාලියා. මේ ඉන්නේ ලූක්."

"රාක්ෂයෝ!"

"නෑ," ලූක් කෙඳිරුවා. "හැබැයි අපි රාක්ෂයෝ ගැන හැමදේම දන්නවා. අපිත් උන් එක්ක සටන් කරනවා."

හෙමිහිට, ගෑනු ළමයා පයින් ගැසීම නතර කළා. එයා අළු පාට, ලොකු බුද්ධිමත් දෑසින් ලූක්ව සහ තාලියාව අධ්‍යයනය කළා.

"ඔයාලත් මං වගේ ද?" එයා ඇසුවේ සැකයෙන්.



"ඔව්," ලූක් කිවුවා. "අපි... හොඳයි, ඒක විස්තර කරන්න අමාරුයි, ඒ වුණත් අපි රාක්ෂ සටන්කාරයෝ. ඔයාගේ පවුලේ අය කොහෙද?"

"මගේ පවුලේ අය මට වෛර කරනවා," ගෑනු ළමයා කිවුවා. "එයාලට මාව ඕනෑ නැහැ. මම පැනලා ආවා."

තාලියා ලූක්ගේ ඇස් දිහා බැලුවා. පුංචි ගැහැනු ළමයා කියමින් සිටි දේ ඒ දෙන්නටත් අදාළ දෙයක් බව මම දැන සිටියා.

"ඔයාගේ නම මොකක්ද, පොඩ්ඩෝ?" තාලියා ඇහුවා.

"ඇනබෙත්."

ලූක් හිනාවුණා. "ලස්සන නමක්. මං ඔයාට බඩ්ඩක් කියන්න ද, ඇනබෙත්- ඔයා නම් සෑහෙන දරුණුයි. ඔයා වගේ සටන්කාරියක් අපිට සෑහෙන ප්‍රයෝජනවත් වෙයි."

ඇනබෙත්ගේ ඇස් දෙක ලොකු වුණා. "ඇත්තම ද?"

"ඇත්තමයි." කිණිස්ස අනෙක් පැත්තට හැරවූ ලූක් එහි මිට එයාට දිගු කළා. "නියම රාක්ෂයෝ-වනසන ආයුදයකට ඔයා කැමති ද? මේක දිව්‍යමය ලෝකඩවලින් හදපු එකක්. මිටියකට වඩා සෑහෙන හොඳට වැඩ කරනවා."

සමහරවිට වෙනස් වාතාවරණයක් යටතේ දී නම්, අවුරුදු හතක ළමයෙකුට කිණිස්සක් දෙන එක හොඳ අදහසක් නොවෙන්න පුළුවන්, ඒත් ඔයා අර්ධ-ලෝහිතයෙක් වුණා ම, සාමාන්‍ය නීති ජනේලයෙන් පැනලා යනවා.

ඇනබෙත් එහි මිට අල්ලා ගත්තා.

"කිණිසි ගැළපෙන්නේ නිර්භීත ම, වේගවත් ම සටන්කාරයින්ට විතරයි," ලූක් විස්තර කළා. "ඒවාට කඩුවක තියෙන බලයවත් දිගවත් නැහැ, ඒත් ඒවා හංගගෙන යන්න ලේසියි. ඒ වගේම ඒකට ඔයාගේ හතුරාගේ සන්නාහයේ තියෙන දුර්වල තැන් හොයාගන්න පුළුවන්. කිණිස්සක් පාවිච්චි කරන්න නම් ඒ සටන්කාරයා ශූරයෙක් වෙන්න ඕනෑ. ඔයා සෑහෙන ශූරියක් කියලා මට නිකමට වගේ හිතෙනවා."

පුදුමයෙන් එයා දිහා බලා සිටි ඇනබෙත්ගේ ඇස්වල තිබුණේ භක්තියක්. "මම එහෙම තමයි!"

Scanned with CamScanner

තාලියා දත් නියෙව්වා. "අපි දැන් ගියොත් හොඳයි, ඇනබෙත්. ජේම්ස් ගඟ ළඟ අපේ තිප්පොලක් තියෙනවා. අපි ඔයාට ඇඳුමකුයි කෑම ටිකකුයි ගමු."

"ඔයාලා... ඔයාලා මාව ආපහු මගේ පවුලේ අයට දෙන්න එක්ක යන්නෙ නැහැ නේද?" එයා ඇහුවා. "පොරොන්දු වෙන්න?"

ලූක් එයාගේ උරහිස මත අතක් තැබුවා. "දැන් ඔයා අපේ පවුලෙ කෙනෙක්. ඒ නිසා ඔයාට කිසිම කරදරයක් වෙන්න මම ඉඩ තියන්නෑ කියලා පොරොන්දු වෙනවා. අපේ පවුල්වල අය අපිව නැති කරගත්තා වගේ ඔයාව නැති කරගන්න මම ඉඩ තියන්නෑ. හරි ද?"

"හරි!" ඇනබෙත් කිවුවේ සතුටින්.

"දැන්, එන්න යමු," තාලියා කිවුවා. "අපිට වැඩි වෙලාවක් මෙතැන ඉන්න බැහැ!"

ඒ දසුන වෙනස් වුණා. දැන් උප දෙවිවරු තුන්දෙනෙක් කැලයක් මැදින් දුවමින් සිටියා. ඒ දවස් ගාණකට පස්සේ, සමහරවිට සති ගාණකට පස්සේ වෙන්නත් පුළුවන්. එයාලා හැමෝම හෙම්බත් වෙලා හිටියේ හරියට එයාලට සටන් ගණනාවකට මූණ දෙන්න වුණා වගෙයි. ඇනබෙත් අලුත් ඇඳුමකින්- ජීන්ස් එකකින් සහ පමණට වඩා විශාල හමුදා ජැකට්ටුවකින් සැරසී සිටියා.

"තව ටික දුරයි!" ලූක් පොරොන්දු වුණා. ඇනබෙත්ගේ කකුල් පැකිළෙද්දී, ලූක් එයාගේ අතින් අල්ලා ගත්තා. ලුහුබැඳ එන මොකාව වුණත් ආපසු එළවන්න වගේ පලිහ ලෙළවමින් තාලියා පිටුපසින් ආවා. එයා ආවේ වම් කකුල කොර ගසමිනුයි.

කඳු ගැටයක් මුඳුනට අමාරුවෙන් නැඟගත් එයාලා අනෙක් පැත්තේ පහළ තිබුණු සුදු පාට යටත් විජිත සමයේ නිවස දිහා- මේ කාසලන්ගේ ගෙදර දිහා බැලුවා.

"හරි එහෙනම්," ලූක් කිවුවේ හති දමමින්. "මම හොරෙන් අස්සට රිංගලා කෑම ටිකකුයි, බෙහෙත් මොනවා හරියි අරන් එන්නම්. මෙතැනට ම වෙලා ඉන්න."

"ලූක්, ඔයාට විශ්වාස ද?" තාලියා ඇහුවා. "ආයේ කවදාවත් මෙහෙට එන්නෙ නැහැ කියලා ඔයා දිවුරුවා නේ. එයා ඔයාව අල්ල ගත්තොත්-"



"අපිට වෙන කරන්න දෙයක් නැහැ!" ලූක් ගෙරෙව්වා. "අපේ ළඟ ම තිබුණු තිප්පොල උන් පුච්චලා දැම්මා. ඔයාගේ ඔය කකුලේ තුවාලෙට බෙහෙත් කරන්න ම ඕනෑ."

"මේක ඔයාගේ ගෙදර ද?" ඇනබෙත් ඇසුවේ පුදුමයෙන්.

"මේක තමයි ඉස්සර මගේ ගෙදර," ලූක් කෙඳිරුවා. "මාව විශ්වාස කරන්න, මේක හදිස්සියක් නොවුණා නම්-"

"ඔයාගේ අම්මා ඇත්තට ම දරුණු කෙනෙක් ද?" ඇනබෙත් ඇහුවා. "අපිට එයාව බලන්න පුළුවන් ද?"

"බැහැ!" ලූක් සැර වුණා.

ඇනබෙත් බයේ ඇකිළුණේ හරියට ලූක්ගේ කේන්තිය එයාව පුදුම කළා වගෙයි.

"මට... මට සමා වෙන්න," ලූක් කිවුවා. "කොහෙවත් යන්නෙ නැතුව මෙතැනට වෙලා ඉන්න. මම පොරොන්දු වෙනවා මේ හැම දෙයක් ම හරි යයි. ඔයාට කිසිම කරදරයක් වෙන්නෙ නැහැ. මම ආපහු-"

අති දීප්තිමත් රන් පාට බැබළීමකින් කැලෑව ම එළිය වුණා. උප දෙවිවරු බයෙන් ඇකිළෙද්දී, පිරිමියෙකුගේ කටහඬක් දෝංකාර දුන්නාඃ "ඔයාට ගෙදර නැවිත් ඉන්නයි තිබුණේ."

★★★

දසුන නැවතුණා.

මගේ දණහිස් බකල ගැහෙද්දී, ඇනබෙත් මාව අල්ලා ගත්තා. "පර්සි! මොකද වුණේ?"

"ඔයා... ඔයා ඒක දැක්ක ද?" මම ඇහුවා.

"මොකක්ද?"

මම හෙස්ටියා දිහාවට බැල්මක් හෙළුවා, ඒත් දෙවඟනගේ මුහුණේ තිබුණේ හැඟීම් විරහිත බැල්මක්. මීට කලින් වතාවේ කැලෑවේ දී එයා කිය්පු කතාවක් ඒ වෙලාවේ මට සිහි වුණාඃ ඔයාගේ හතුරා ලූක්ව තේරුම් ගන්න නම්, ඔයා එයාගේ පවුල ගැන තේරුම් ගන්න ඕනෑ. ඒ වුණත් එයා මට අර විදිහේ දර්ශන පෙන්නුවේ ඇයි?

"මම කොච්චර වෙලා සිහිය නැතුව හිටිය ද?" මම කොඳුරා ඇහුවා.

Scanned with CamScanner

ඇනබෙත්ගේ ඇහි බැම් එකට ගැට ගැසුණා. "පර්සි, ඔයා සිහි නැතුව හිටියෙ නැහැ. ඔයා තප්පරයක් විතර හෙස්ටියා දිහා බලාගෙන ඉඳලා, ඇදගෙන වැටුණා."

හැමෝම මගේ දිහා බලා ඉන්න බව මට දැනුණා. ඉතින් දුර්වල බවක් පෙන්වන්න මට පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ දර්ශනවල තේරුම මොකක් වුණත්, අපේ මෙහෙයුමෙන් හිත ඉවතට නොයවා තියාගෙන ඉන්න මට සිද්ධ වෙලා තිබුණා.

"ම්..ම්, හෙස්ටියා උත්තමාවිය," මම කතා කළා, "අපි ආවෙ හදිස්සි වැඩකට. අපිට බැහැදකින්න ඕනෑ-"

"ඔයාලට ඕනෑ මොනවද කියලා අපි දන්නවා," පිරිමි හඬක් කිව්වා. මම වෙවුලා ගියේ, ඒක මට පෙනුණු දර්ශනයේ දි ඇසුණු කටහඬ ම නිසයි.

හෙස්ටියා ළඟින් තවත් දෙවියෙක් ප්‍රාදූර්භූත වුණා. ලුණු-ගම්මිරිස් පාට කැරලි කොණ්ඩයක් සහ එල්ෆියානු මුහුණුවරක් තිබුණු එයා අවුරුදු විසි පහක විතර පෙනුමක් ඉසිලුවා. ගුවන් හමුදා නියමුවෙකුගේ පියාසැරි ඇඳුම් කට්ටලයකින් සැරසී සිටි එයා චූටි පියාපත් දෙකක් සැලෙන හෙල්මටයක් සහ කළු ලෙදර් බූට් ජෝඩුවක් පැලඳගෙන සිටියා. එයාගේ වැළමිට නැම්මේ පණ ඇති සර්පයෝ දෙන්නෙක් වෙළුණු දිග යෂ්ටියක් සිරවී තිබුණා.

"මම දැන් යන්නම්," හෙස්ටියා කිව්වා. ගුවන් නැවියාට නැමී ආචාර කළ එයා දුමාරයක් තුළට නොපෙනී ගියා. එයා එච්චර හදිස්සියෙන් එතැනින් මාරු වුණ හේතුව මට තේරුණා. පණිවුඩකරුවන්ගේ දෙවියාට තිබුණේ හිත හොඳින් ඉන්න පෙනුමක් නෙවෙයි.

"හලෝ, පර්සි," එයාගේ ඇහිබැම් රැළි ගැසී තිබුණේ හරියට එයා මාත් එක්ක තරහෙන් ඉන්නවා වගෙයි. ඒක දකිද්දී මම පුදුම වුණේ ඔම් දැන් මට දකින්න ලැබුණු දර්ශනය ගැන කොහොමින් කොහොම හරි එයා දන්නවා ද කියලයි. එදා රෑ එයා මේ කාසලන්ගේ ගෙදරට ගියේ ඇයි කියලත්, එයා ලූක්ව අල්ලා ගත්තට පස්සේ සිද්ධ වුණේ මොනවද කියලත් එයාගෙන් අහන්න මට ඕනෑ වුණා. අර්ධ-ලෝහිත කඳවුරේ දී මුල් ම වතාවට ලූක්ව මුණ ගැසුණු දවස මට සිහි වුණා. එයාට කවදාහරි එයාගේ තාත්තව මුණ ගැහිලා තියෙනවා ද කියලා එදා මම ලූක්ගෙන් ඇහුවා. ඒ වෙලාවේ මගේ දිහා තදින් බලපු එයා



'එක පාරක්' කියලා කිව්වා. ඒ කොහොම වුණත් මේක ඒ වගේ දෙයක් අහන්න හොඳ වෙලාවක් නෙවෙයි කියලා හර්මීස්ගේ මූණ බලද්දි මට තේරුණා.

මම නුහුරට නැමී ආචාර කළා. "හර්මීස් උතුමාණෙනි."

අනේ ඇත්තට, සර්පයෝ දෙන්නගෙන් කෙනෙක් මගේ හිත ඇතුළේ කතා කළා. අපිට හායි කියන්න එපා. අපි නිකං ම නිකං සර්පයෝ විතරයි නේ.

ජෝර්ජ්. අනෙක් සර්පයා දොස් කිව්වා. ආචාරශීලී වෙන්න.

"හලෝ, ජෝර්ජ්," මම කිව්වා. "හේයි, මාර්තා."

ඔයා අපිට මීයෙක් ගෙනාව ද? ජෝර්ජ් ඇහුවා.

ජෝර්ජ්, ඕක නවත්ත ගන්න, මාර්තා කිව්වා. එයාට වැඩ!

මීයෙක් ගේන්න බැරි තරම් වැඩ ද? ජෝර්ජ් ඇහුවා. ඒ මොන අපරාදයක් ද.

ජෝර්ජ් එක්ක කතාවට පැටලෙන්නෙ නැතිව ඉන්න එක කෝකටත් හොඳයි කියලා මම තීරණය කළා. "ම්..ම්, හර්මීස්," මම කතා කළා. "අපිට සියුස්ට කතා කරන්න ඕනෑ. ඒක ගොඩක් වැදගත්."

හර්මීස්ගේ දෑස්වල තිබුණේ තියුණු සීතල බැල්මක්. "එයාගේ පණිවුඩකාරයා මමයි. එයාට කියන්න තියෙන දෙයක් මට කියන්න?"

මට පිටුපසින් සිටි අනිත් උප දෙවිවරු ටික නොසන්සුන්ව එහා මෙහා වුණා. මේක අපි සැලසුම් කරගෙන හිටපු විදිහට යන පාටක් නැහැ වගෙයි. මම හර්මීස් එක්ක තනියම කතා කරලා බැලුවොත්...

"ඔයාලා කට්ටිය," මම කිව්වා. "ගිහිල්ලා වටපිටාව හෝදිසි කරලා බැලුවොත් නරක ද? ආරක්ෂාව කොහොමද කියලා බලන්න. ඔලිම්පස්වල තව කවුද ඉතුරු වෙලා ඉන්නෙ බලලා, තව පැය බාගෙකින් මෙතැන දී ඇනබෙත්වයි මාවයි හම්බ වෙන්න."

සිලේනා රවා බැලුවා. "ඒත්-"

"ඒක නම් හොඳ අදහසක්," ඇනබෙත් කිව්වා. "කොනර්, ට්‍රැවිස්- ඔයාලා දෙන්නා මෙයාලව එක්ක යන්න."

ස්ටෝල් සහෝදරයෝ දෙන්නා ඒකට එක පයින් කැමති වුණා- තාත්තා ඉස්සරහ පිට දී වැදගත් වගකීමක් තමන්ට පැවරෙනවට කවුද අකමැති. මීට ඉස්සර ඒ දෙන්නට ටොයිලට් පේපර් වැටලීම් ඇරෙන්න

Scanned with CamScanner

වෙන කිසිම දෙයක් මෙහෙයවන්න ලැබිලා නැහැ නේ. "අපි ඒක කරන්නම්!" ට්‍රැවිස් කිවුවා. ඇනබෙත්ව සහ මාව හර්මීස් සමඟ තනි කරලා ඒ දෙන්නා අනෙක් අයව සිංහාසන ශාලාවෙන් පිටතට අරන් ගියා.

"මගේ උතුමාණෙනි," ඇනබෙත් කතා කළා. "ක්‍රෝනොස් නිව්යෝර්ක්වලට පහර දෙන්නයි යන්නේ. ඔයාලා දැනටමත් ඒක අනුමාන කරලා තියෙන්න ඕනෑ. මගේ අම්මා කල්තියා ඒක දැකලා තියෙන්න ඕනෑ."

"ඔයාගේ අම්මා," හර්මීස් ගෙරෙව්වා. ඌයි, ඌයි, ඌයි. එයා කැඩුසියස් එකෙන් පිට කසා ගනිද්දි ජෝර්ජ් සහ මාර්තා කෙඳිරුවා. ''ඔයාගේ අම්මා ගැන මට මෙතැන කියන්න පටන් ගන්න තියන්නෙපා, පුංචි නෝනා. මට මෙතැනට එන්ඩ සිද්ධ කළේ එයා තමයි. අපි කවුරුවත් පෙරටු බළ ඇණියෙන් අහකට යනවට සියුස් කැමති වුණේ නැහැ. ඒත් ඔයාගේ අම්මා එයාට වධ දෙනවා ඉවරයක් නැහැ, 'ඒක උගුලක්, එයාලා හදන්නේ අපේ අවධානේ වෙන පැත්තකට හරවන්න, බ්ලාහ්, බ්ලාහ්, බ්ලාහ්.' ආපහු මෙහෙට එන්න එයාට උවමනාව තිබුණා, ඒත් අපි ටයිෆූන් එක්ක සටන් කරන අස්සේ අපේ අංක එකේ උපාය දක්ෂයාව එතැනින් යවන්න සියුස් කැමති වුණේ නැහැ. ඉතින් හැමදාමත් වෙනවා වගේ, එයා ඔයාලට කතා කරන්න මාව එව්වා."

"ඒත් ඒක උගුලක් තමයි!" ඇනබෙත් තරයේ කියා සිටියා. ''සියුස්ගේ ඇස් පේන්නෙ නැද්ද?"

අහස දෙදුරුම් කවමින් අකුණක් පෙරළී ගියා.

"කට පරිස්සමෙන්, කෙල්ලේ." හර්මීස් අනතුරු ඇඟෙව්වා. "සියුස් අන්ධ වෙලත් නැහැ, බීරි වෙලත් නැහැ. එයා ඔලිම්පස් සම්පූර්ණයෙන් ම අනාරක්ෂිත කරලා ගිහිල්ලා නැහැ නේ."

"ඒත් අර නිල් පාට එළි වගයක්-"

"ඔව්, ඔව්. මම ඒවා දැක්කා. ඕනෑ ඔට්ටුවක්, ඒක අර කමකට නැති මායා දෙවඟන, හෙකේට්ගේ නොසන්ඩාල වැඩක්. ඒ වුණාට ඒවගෙන් කිසිම හානියක් වෙන්නෙ නැහැ කියලා ඔයාට පේනවා ඇති නේ. ඔලිම්පස් වටේට ශක්තිමත් මැජික් රැකවලක් තියෙනවා. ඒ ඇරත්, එයෝලස්, සුළඟේ රජා, එයාගේ බලගතු ම දාසයෝ ටික බලකොටුව ආරක්ෂා කරන්න එවලා තියෙන්නේ. දෙවිවරුන්ට ඇර වෙන කිසිම



කෙනෙක්ට අහසින් ඔලිම්පස්වලට එන්න බැහැ. එහෙම එන්න දඟලන උන්ව අහසින් බිමට ඇදලා දායි."

මම අතක් ඉස්සුවා. "මේ... ඔයාලා අර කරනවා වගේ එයාලත් ප්‍රාදූර්භූත වුණොත්?"

"ඒකත් ගුවන් ගමන් ක්‍රමයක්, ජැක්සන්. බොහෝම වේගවත්. හැබැයි සුළං දෙවිවරු ඊට වඩා වේගවත්. නැහැ, ක්‍රෝනොස්ට ඔලිම්පස් අල්ල ගන්න ඕනෑ නම්, එයාට කරන්න වෙන්නෙ එයාගේ හමුදාවත් අරගෙන මුළු නගරෙ ම පහු කරන් ඇවිල්ලා, සෝපානේ දිගේ එන එක තමයි! එයා එහෙම කරයි කියලා ඔයා හිතනව ද?"

හර්මීස් ඒක කියපු විදිහට ඒ අදහස ම විහිළුවක් වුණා-රාක්ෂයෝ රංචුවක් වරකට විස්ස ගාණේ සෝපානේ නැගලා, ඩිස්කෝ සිංදු අහමින් උඩට එද්දි කොහොම තියෙයි ද. ඒත් තවමත්, මම ඒකට කැමති වුණේ නැහැ.

"ඔයාලගෙන් දෙතුන් දෙනෙක්ටවත් ආපහු එන්න පුළුවන් නේ," මම යෝජනාවක් දැම්මා.

හර්මීස් ඔළුව හෙල්ලුවේ නොයිවසිල්ලෙන්. "පර්සි ජැක්සන්, ඔයාට තේරෙන්නෙ නැහැ. ටයිෆූන් තමයි අපේ ලොකු ම හතුරා."

"මං හිතන් හිටියේ ඒ ක්‍රෝනොස් කියලා."

දෙවියාගේ ඇස් දිලිසෙන්න ගත්තා. "නෑ, පර්සි, ඉස්සර කාලේ ඔලිම්පස් ටයිෆූන් අතින් පරාද නොවී බේරුණේ අනූ නමයෙන්. එයා තමයි එචිඩ්නාගේ මිනිහා-"

"ආරුක්කුවේ දී එයාව නම් මුණ ගැහුණා," මම කෙඳිරුවා. "හොඳ කෙනෙක් නෙවෙයි."

"-ඒ වගේම එයා තමයි රාක්ෂයෝ ඔක්කොගේම තාත්තා. එයා අපි හැමෝවම විනාශ කරලා දාන්න කොච්චර ළං වුණා ද කියන එක අපිට කවදාවත් අමතක කරන්න බැහැ; එයා අපිට කොච්චර නින්දාවක් ද කළේ! ඒ කාලේ අපි මීටත් වඩා බල සම්පන්නයි. දැන් පොසෙයිඩන් එයාගෙ ම යුද්දෙකට මැදිවෙලා නිසා අපිට එයාගෙන් උදවු බලාපොරොත්තු වෙන්න බැහැ. හේඩීස් එයාගේ රාජ්ජෙට වෙලා ඉඳගෙන ඉන්නවා ඇරෙන්න වෙන කිසි දෙයක් කරන්නෙ නැහැ, ඒ මදිවට ඩිමීටරුයි පර්සෙෆෝනුයිත් එයා පස්සෙ ගිහිල්ලා. මේ කැලඹිලා ඉන්න යෝධයාට විරුද්ධව සටන් කරන්න අපිට අපේ ඉතුරු වෙලා

තියෙන මුළු ශක්තිය ම ඕනෑ. අපිට අපේ බලයත් බෙදන්න බැහැ, ඒ වගේම එයා නිව්යෝක්වලට එනකල් නිකං බලාගෙන ඉන්නත් බැහැ. අපිට දැන් එයත් එක්ක සටන් කරන්න වෙලයි තියෙන්නෙ. ඒ වගේම අපේ සටනේ දියුණුවක් ඇති වේගෙනයි එන්නේ."

"දියුණුවක්?" මම ඇසුවා. "එයා සෙන්ට් ලුයිස් සම්පූර්ණයෙන් ම වගේ විනාශ කළා නේ."

"ඔව්," හර්මීස් පිළිගත්තා. "ඒ වුණාට එයාට කෙන්ටකිවලින් බාගයක් විතරයි විනාශ කරන්න ලැබුණේ. එයාගේ වේගය අඩු වෙනවා. බලේ නැති වෙනවා."

මට එයා එක්ක වාද කරන්න ඕනෑ වුණේ නැහැ, ඒ වුණාට හර්මීස් ඒ කතාව කිව්වේ ඒක එයාට ම ඒත්තු ගන්වන්න උත්සාහ කරනවා වගෙයි.

මුල්ලක සිටි ඔෆියොටෝරස් දුක්බරව හඬගෑවා.

"අනේ, හර්මීස්," ඇනබෙත් කිව්වා. "ඔයා කිව්වා නේද මගේ අම්මට එන්න ඕනෑ වුණා කියලා. එයා අපිට මුකුත් පණිවුඩයක් එව්වෙ නැද්ද?"

"පණිවුඩ?" එයා කටුකුටු ගෑවා. "එයාලා මට කිව්වෙ නම් කොහොමද, 'ඒක නියම රස්සාවක් වෙයි', 'වැඩිය වැඩත් නැහැ. ඔයාට වැඳුම් පිදුම් කරන්න ගොඩක් අය ඉඳියි.' හ්ම්ම්ප්. මට කියන්න තියෙන දේ ගැන කාටවත් ගාණක් නැහැ. හැමෝම අහන්නේ අනිත් අය එවපු පණිවුඩ ගැන විතරයි."

''මීයෝ,'' ජෝර්ජ් කල්පනාබරව කිව්වා. මීයෝ වෙනුවෙන් මම එනවා.

''ෂ්ෂ්,'' මාර්තා සැර කළා. හර්මීස්ට කියන්න තියෙන දේවල් ගැන අපි නම් ගණන් ගන්නවා. ''එහෙම නේද, ජෝර්ජ්?''

''ඔහ්, ආයෙත් අහලා. අපි දැන් යුද්දෙට යමු ද? මට ආයෙමත් ලේසර් මෝඩ් එක කරන්න ඕනෑ. ඒක මාර ජොලි.''

"දෙන්න ම කට වහගන්නවා," හර්මීස් ගෙරෙව්වා.

ලොකු-ආයාචනාත්මක-අළු-පාට-බැල්ම හෙලාගෙන හිටපු ඇනබෙත් දිහා දෙවියා බැලුවා.



"බාහ්," හර්මීස් කිව්වා. "ඔයාගේ අම්මා, ඔයාලට කරන දෙයක් කරන්න වෙන්නෙ තනියම කියලා අනතුරු අඟවන්න කිව්වා. දෙවිවරුන්ගේ උදවු නැතුව ඔයාලට මැන්හැටන් අල්ලගෙන ඉන්න වෙනවා කිව්වා. හරියට මම ඒක නොදන්නවා වගේ. අර කට්ටිය එයාට 'ප්‍රඥාවේ' දෙවඟන වෙන්න මොකට පඩි ගෙවනව ද මන්දා."

"වෙන මුකුත් නැද්ද?" ඇනබෙත් ඇහුවා.

"එයා කිව්වා ඔයා විසි තුන්වෙනි සැලසුම කෙරුවොත් හොඳයි කියලා. ඒකෙ තේරුම ඔයා දන්නවා කියලත් කිව්වා."

ඇනබෙත්ගේ මූණ සුදුමැලි වුණා. ඒකේ තේරුම මොකක් ද කියලා එයා දන්න බවත්, එයා ඒකට කැමති නැති බවත් පැහැදිලිව ම පෙනුණා. "තව?"

"අන්තිම දේ." හර්මීස් මගේ දිහා බැලුවා. "එයා පර්සිට කියන්න කිව්වේ: 'ගඟවල් මතක තියාගන්න.' කියලයි, තව, මේ, එයාගේ දුවගෙන් ඈත්වෙලා ඉන්න කියලත් කිව්වා."

ඒ වෙලාවේ වැඩියෙන් ම රතු වුණේ කාගේ මූණ ද මට විශ්වාස නැහැ: ඇනබෙත්ගේ ද, මගේ ද.

"ස්තුතියි, හර්මීස්," ඇනබෙත් කිව්වා. "ඒ වගේම මට... මට කියන්න ඕනෑ වුණේ... මට ලූක් ගැන කණගාටුයි."

දෙවියාගේ මුහුණ දැඩි වුණේ හරියට එයාව කිරිගරුඬවලට හැරුණා වගෙයි. "ඒ මාතෘකාව ඇදලා ගන්නෙ නැතුව ඉන්නයි ඔයාට තිබුණේ."

ඇනබෙත් ආපස්සට අඩියක් තැබුවේ කලබලෙන්. "සමා වෙන්න?"

"දැන් සමා වෙන්න කියලා වැඩක් නැහැ!"

ජෝර්ජ් සහ මාර්තා කැඩුසියස් එක වටා දඟර ගැහෙද්දී, සැලෙමින් දිලිසුණ ඒක අධි ධාරිතාවක් ඇති කෙවිටක් වගේ දේකට හැරුණා.

"ඉඩ තිබුණ වෙලාවේ ඔයාට එයාව බේරගන්න තිබුණා," හර්මීස් ඇනබෙත්ට තරහෙන් ගෙරෙව්වා. "ඒක කරන්න පුළුවන්කමක් තිබුණ එක ම කෙනා ඔයයි."

මම ඒ දෙන්නා මැද්දට පනින්න උත්සාහ කළා. "ඔයා මොනවා ගැන ද කියන්නේ? ඇනබෙත් නෙවෙයි-"

"එයාව බේරන්න හදන්නෙපා, ජැක්සන්!" හර්මීස් කෙවිට මගේ පැත්තට හැරෙව්වා. "මං මොනවා ගැන ද කියන්නෙ කියලා මේ කෙල්ල හරියට ම දන්නවා."

"හරි නම් ඔයා දොස් කියාගන්න ඕනෑ ඔයාටමයි!" මට තිබුණේ කට පියාගෙන පාඩුවේ ඉන්නයි, ඒත් ඒ වෙලාවේ මම හිතපු එකම දේ වුණේ එයාගේ අවධානය ඇනබෙත්ගෙන් ඉවත් කරගන්න එක විතරයි. මේ මුළු කාලය පුරාවට ම එයා කේන්තියෙන් ඉඳලා තියෙන්නෙ මාත් එක්ක නෙවෙයි. ඇනබෙත් එක්කයි. "ඔයා ලූක්වයි එයාගේ අම්මවයි අත ඇරලා දාන්නෙ නැතුව හිටියා නම්!"

හර්මීස් එයාගේ කෙවිට එසෙව්වා. එයා අඩි දහයක් උස් වෙනතුරු වැඩෙන්න පටන් ගත්තා. හොඳයි, එහෙනම් ඔක්කොම ඉවරයි, මම හිතුවා.

ඒත් එයා මට පහර දෙන්න සූදානම් වෙන අතරේ, ඉදිරියට නැමුණ ජෝර්ජ් සහ මාර්තා එයාගේ කනට මොනවදෝ රහසින් කිවුවා.

හර්මීස් දත් මිටි කෑවා. එයා කෙවිට පහළට දැමුවා ම, ඒක ආයෙමත් යෂ්ටියකට හැරුණා.

"පර්සි ජැක්සන්," එයා කිවුවා, "ඔහේ අකිලිස්ගේ ශාපය දරාගෙන ඉන්න හින්දා, මට ඔහේව අත අරින්න වෙනවා. දැන් ඔහේ ඉන්නේ ඉරණම අතේ. ඒත් ඔහේ ආයේ කවදා හරි මට එහෙම කතා කරලා තිබුණොත් බලාගෙනයි. ඔහේට කිසිම අදහසක් නැහැ මම කොච්චර කැප කිරීමක් කරලා තියෙනව ද, කොච්චර-"

එයාගේ කටහඬ බිඳුණා, ඊට පස්සේ එයා ආපහු මනුස්ස ප්‍රමාණෙට හැකිළුණා. "මගේ පුතා, මගේ ලොකු ම ආඩම්බරය... මගේ අසරණ මේ..."

එයාගේ කටහඬේ පිරිලා ඉතිරිලා ගිය වේදනාව ඇහෙද්දී මොනවා කියන්න ද මට තේරුනේ නැහැ. විනාඩියකට කලින් අපිව වාෂ්ප කරන්න ලෑස්ති වුණ එයා දැන් හිටියේ කාවහරි බදාගෙන අඬන්න වගෙයි.

"බලන්න, හර්මීස් උතුමාණෙනි," මම කිවුවා. "මට කණගාටුයි. ඒ වුණත් මේට සිද්ධ වුණේ මොනවද කියලා මට දැනගන්න ඕනෑ?



එයා ලූක්ගේ ඉරණම ගැන මොනවදෝ කිවුවා, ඒ වෙලාවෙ එයාගේ ඇස්-"

හර්මීස් මගේ දිහාවට තරහෙන් රවා බලද්දී මට ගොත ගැහුණා. එහෙම වුණත් එයාගේ මූණේ තිබුණේ නම් ඇත්තටම තරහක් නෙවෙයි. වේදනාවක්. ගැඹුරු, විශ්වාස කළ නොහැකි තරමේ වේදනාවක්.

"මම දැන් යනවා," එයා තදින් කිවුවා. "මට සටන් කරන්න යුද්ධයක් තියෙනවා."

එයා දිලිසෙන්න පටන් ගනිද්දී අනෙක් පැත්තට හැරුණු මම, ඇනබෙතුත් ඒක ම කරන බවට සහතික කරගත්තේ, එයා තවමත් කම්පනයෙන් ගල් ගැසී හිටපු නිසයි.

සුබ පැතුම්, පර්සි, මාර්තා හීන් හඬින් කෙඳිරුවා.

සුපර්නෝවාවක එළිය විහිදුවමින් හර්මීස් දිලිසී චුත වුණා.

★★★

ඇනබෙත්, එයාගේ අම්මාගේ සිංහාසනය පාමුල වාඩිවෙලා අඬන්න ගත්තා. මට එයාව සනසන්න ඕනෑ වුණත්, ඒක කරන විදිහ මම දැනගෙන හිටියේ නැහැ.

"ඇනබෙත්," මම කතා කළා, "ඒක ඔයාගේ වැරැද්දක් නෙවෙයි. හර්මීස් ඔය විදිහට හැසිරෙනවා මම කවදාවත් දැකලා නැහැ. මං හිතන්නේ... අනේ මන්දා... ලූක් ගැන එයාට වරදකාරී හැඟීමක් දැනෙනවා ඇති. ඒකයි එයා සිද්ධ වෙච්චි දේවල් වලට වැරැද්ද පටවන්න කෙනෙක්ව හොයන්නේ. එයා ඒකට ඔයාව අල්ල ගත්තේ ඇයි කියලා මං දන්නෙ නැහැ. ඒ වගේ දොසක් අහන්න තරම් දෙයක් ඔයා කරලා නැහැ නේ."

ඇනබෙත් දෑස් පිස දමාගත්තා. එයා ගිනි උඳුන දිහා ඔහේ බලා සිටියේ හරියට ඒක එයාගෙ ම ආදාහන චිතකය වගෙයි.

මම නොසන්සුන්ව ඉරියව් මාරු කළා. "මේ, ඔයා කරලා නෑ නේද?"

එයා උත්තර දුන්නෙ නැහැ. එයාගේ එක අතක දිව්‍යමය ලෝකඩ කිණිස්ස ගැට ගසා තිබුණා- ඒ කිණිස්ස හෙස්ටියා පෙන්වූ දර්ශනවල මට දකින්න ලැබුණු එකමයි. ඒක එයාට ලූක්ගෙන් ලැබුණු තෑග්ගක් කියලා මෙච්චර කාලෙකට මට තේරුම් ගිහින් තිබුණේ නැහැ. ඇනබෙත් කඩුවකින් සටන් කරනවාට වඩා කිණිස්සකින් සටන්

කරන්න කැමති ඇයි කියලා මම සෑහෙන වතාවක් එයාගෙන් අහලා තිබුණත් එයා කවදාවත් මට උත්තර දීලා නැහැ. දැන් ඒකට හේතුව මට තේරුණා.

"පර්සි," එයා කතා කළා. "ඔයා ලූක්ගේ අම්මා ගැන කිවුව කතාවේ තේරුම මොකක්ද? ඔයාට එයාව හම්බ වුණා ද?"

මම අකමැත්තෙන් ඔළුව වැනුවා. "නිකෝයි මමයි එයාගේ ගෙදර ගියා. එයා ටිකක් විතර... වෙනස්." මම මේ කාසලන් ගැනත්, එයාගේ ඇස් දෙක දිලිසෙන්න පටන් ගෙන, පුතාගේ ඉරණම ගැන එයා දොඩවන්න ගත් අද්භූත මොහොත ගැනත් එයාට විස්තර කළා.

ඇනබෙත්ගේ නළල රැළි ගැසුණා. "ඒකෙ කිසිම තේරුමක් නැහැ නේ. ඒත් ඇයි ඔයාලා එහෙට ගියේ-" එයාගේ ඇස් දෙක ලොකු වුණා. "හර්මීස් කිවුවා ඔයා අකිලිස්ගේ ශාපය දරාගෙන ඉන්නවා කියලා. හෙස්ටියාත් ඒ කතාව ම කිවුවා. ඔයා... ඔයා ස්ටයික්ස් ගඟෙන් නෑව ද?"

"මාතෘකාව වෙනස් කරන්න හදන්නෙපා."

"පර්සි! ඔයා එහෙම කරා ද නැද්ද?"

"ම්...ම්... චුට්ටක් විතර වගේ."

මම හේඩීස් සහ නිකෝ ගැන කතාවත්, මම මළවුන් හමුදාවක් පරාජය කළ විදිහ ගැනත් එයාට කිවුවා. හැබැයි එයා මාව ගඟෙන් ගොඩට ඇදලා ගන්නවා දැකපු දර්ශනය ගැන මම නොකියා හිටියා. මට තවමත් ඒ කොටස හරියට ම තේරුනේ නැහැ, ඒ වගේම ඒ ගැන හිතද්දීත් මට නිකං ලැජ්ජාවක් වගේ එකක් දැනුණා.

එයා ඔළුව දෙපැත්තට හෙල්ලුවේ අදහගන්න බැරුව වගෙයි. "ඒක කොච්චර අනතුරුදායක වැඩක් ද කියලා ඔයාට පුංචි අදහසක්වත් තියෙනව ද?"

"මට වෙන කරන්න දෙයක් තිබුණේ නැහැ," මම කිවුවා. "ලූක්ට විරුද්ධව මට අවස්ථාවක් ගන්න පුළුවන් එක ම ක්‍රමේ ඒක විතරයි."

"ඔයා කියන්නේ... දෙයියන්ට ම ඔප්පු වෙච්චාවේ, ඇත්ත තේන්නම්! ඒ හින්දා තමයි එහෙනම් ලූක් මැරිලා නැත්තේ. එයා ස්ටයික්ස් ගඟට ගිහිල්ලා... ඔහ් නැහැ, ලූක්. ඔයා මොනවා හිතල ද එහෙම කළේ?"



"එතකොට දැන් ඔයා ආයෙමත් කරදර වෙන්නෙ ලූක් ගැන," මම ගෙරෙව්වා.

එයා ඇස් ලොකු කරගෙන මගේ දිහා බලන් හිටියේ මම මේ දැන් අහසින් වැටුණා වගෙයි. "මොකක්ද?"

"අතෑරලා දාන්ඩ," මම කෙඳිරුවා. ඇනබෙත් ඉඩ තිබුණු වෙලාවේ ලූක්ව බේරගත්තෙ නැහැ කියලා හර්මීස් කියපු කතාවේ තේරුම මොකක්ද, මම පුදුමයෙන් කල්පනා කළා. පැහැදිලිව ම, එයා මට නොකියන දෙයක් තිබුණා. ඒත් ඒ වෙලාවේ මම හිටියේ ඒ ගැන අහන්න තරම් මානසිකත්වයක නෙවෙයි. එයා ලූක් එක්ක ගත කරපු ඉතිහාසය ගැන තවත් කිසිම දෙයක් දැනගන්න මට කොහෙත්ම ඕනෑ වුණේ නැහැ.

"වැදගත්ම කාරණේ තමයි, එයා ස්ටයික්ස් ගඟේ දී මළේ නැහැ," මම කිවුවා. "මම මැරුණෙත් නැහැ. දැන් මට එයාට මූණ දෙන්න සිද්ධ වෙලා තියෙන්නෙ. අපිට ඔලිම්පස් ආරක්ෂා කරන්න තියෙනවා."

ඇනබෙත් තවමත් මගේ මූණ දිහා බලාගෙන හිටියේ හරියට ස්ටයික්ස් ගඟේ පීනලා ආවට පස්සෙ මගේ ඇති වුණ වෙනස්කම් හොයනවා වගෙයි. "මං හිතන්නෙ ඔයා හරි. මගේ අම්මා කියලා තිබුණේ-"

"විසි තුන්වෙනි සැලසුම ගැන."

ගමන් මල්ල ඇවිස්සූ එයා ඩෙඩලස්ගේ ලැප්ටොප් පරිගණකය එළියට ඇදලා ගත්තා. එයා ඒක ක්‍රියාත්මක කළා ම, මතුපිට තිබුණු නිල් පාට ඩෙල්ටා ලකුණ දිලිසෙන්න ගත්තා. ලිපිගොනු කීපයක් විවර කළ එයා කියවන්න පටන් ගත්තා.

"මේ තියෙන්නෙ ඒක," එයා කිවුවා. "දෙයියනේ, අපිට කරන්න සෑහෙන වැඩ කන්දරාවක් තියෙනවා."

"ඩෙඩලස්ගේ සොයාගැනීම්වලින් එකක් ද?"

"සොයාගැනීම් ගොඩක්... බොහොම භයානක ඒවා. මම මේ සැලසුම පාවිච්චි කරනවා දකින්න මගේ අම්මට ඕනෑ වුණා කියන්නේ, තත්ත්වය ගොඩක් නරකයි කියලා එයා හිතනවා ඇති." එයා මගේ දිහා බැලුවා. "එතකොට එයා ඔයාට එවපු පණිවුඩේ: 'ගඟවල් මතක තියාගන්න?' මොකක්ද ඒකෙ තේරුම?"

Scanned with CamScanner

මම ඔළුව හෙල්ලුවා. හැමදාමත් වගේම මේ වතාවේදීත් දෙවිවරු මට කියන්නෙ මොකක්ද කියලා මට කිසිම හෝඩුවාවක් තිබුණේ නැහැ. මට මතක තියාගන්න කියන්නෙ කොයි ගඟ ද? ස්ටයික්ස් ද? මිසිසිපි ද?

එතකොටම ස්ටොල් සහෝදරයෝ දෙන්නා සිංහාසන ශාලාවට දුවගෙන ආවා.

"ඔයාලා මේක බැලුවොත් හොඳයි," කොනර් කිව්වා. "දැන් ම."

★★★

ඒ වෙද්දි නිල් පාට එළි අහසේ එහා මෙහා යෑම නතර වෙලයි තිබුණේ, ඒ නිසා ප්‍රශ්නය මොකක්ද කියලා මුලින් ම මට හිතාගන්න බැරිවුණා.

කඳු ගැටය අද්දර තිබුණු පුංචි උද්‍යානයකට අනෙක් කඳවුරුකරුවෝ එකතු වී සිටියා. එයාලා මුර වැට ළඟට රැස්වෙලා, පහළ වූ මැන්හැටන් දිහා බලමින් සිටියා. රන් ඩුච්මාවක් දමා නගරය නරඹන්න පාවිච්චි කළ හැකි සංචාරක දුරදර්ශක මුර වැට දිගට සවි කර තිබුණා. කඳවුරුකරුවෝ සිටියේ ඒවා එකක් නැර පාවිච්චි කරමිනුයි.

මම පහළ නගරය දිහා බැලුවා. එතැන සිට මට හැමදෙයක් ම වගේ දකගන්න හැකියාව තිබුණා- නැගෙනහිර ගඟ සහ හඩ්සන් ගඟ මැන්හැටන් නගරයේ හැඩය කැටයම් කරමින් ගලා යන හැටි, මාර්ග ජාලය, අහසට උස ගොඩනැගිලිවල එළි, උතුරු දිග අඳුරු පැල්ලමක් ලෙස පෙනෙන මධ්‍යම උද්‍යානය. හැම දෙයක්ම සාමාන්‍ය ලෙස පෙනුණත්, එහි මොකක්දෝ වැරැද්දක් තිබුණා. ඒ මොකක්ද කියලා මට තේරුම් යන්නත් කලින් මගේ ඇටකටුවලට ඒක දැනුණා.

"මට කිසිම... සද්දයක් ඇහෙන්නෙ නැහැ නේ," ඇනබෙත් කිව්වා.

ප්‍රශ්නය වුණේ ඒකයි.

මේ තරම් උසක සිටියදී වුණත් මට නගරයේ ඝෝෂාව ඇසිය යුතුව තිබුණා- කලබලෙන් එහෙ මෙහෙ දුවන මිලියන ගාණක ජනතාවගේ, වාහන දහස් ගණනක සහ යන්ත්‍රවල හඬ- දැවැන්ත පුරවරයේ ගුමුගුමුව. නිව්යෝක් නගරයේ ජීවත් වෙද්දී ඔයා ඒ ගැන නොහිතුවත්, ඒක හැම වෙලාවෙ ම තියෙන දෙයක්. අඩු තරමේ රෑ



මැද යක්කු ගස් නගින වෙලාවට පවා නිව්යෝක් නගරය මුලුමනින් ම නිහඬ වෙන්නේ නැහැ.

ඒත් දැන් ඒක එහෙම වෙලා තිබුණා.

මට දැනුණේ හරියට මගේ හොඳම යාළුවා හදිසියේ ම මැරිලා වැටිලා වගෙයි.

"එයාලා මොනවද කරලා තියෙන්නේ?" මගේ කටහඬ ඇසුණේ තදින් සහ කේන්තියෙන් බරවෙලයි. "එයාලා මගේ නගරෙට මොනවද කළේ?"

මයිකල් යෙව්ව දුරදර්ශකයකින් අහකට තල්ලු කළ මම එය තුළින් එබී බැලුවා. ඈත පහළ වීදිවල, රථ වාහන නැවතී තිබුණා. පයින් ගමන් කරමින් සිටි අය පදික වේදිකාව මත හෝ දොරපඩි මත වකුටු වී සිටියා. එහි කිසිම ප්‍රචණ්ඩතාවයක හෝ විනාශයක ලකුණක් තිබුණේ නැහැ. ඒක පෙනුණේ හරියට නිව්යෝර්ක් නගරයේ සියලු දෙනා හිටි හැටියේ ම තමන් කරමින් සිටි දේවල් නතර කරන්න තීරණය කරලා, නින්දට වැටිලා වගෙයි.

"එයාලා මැරිලා ද?" සිලේනා ඇසුවේ විස්මයෙන්.

මගේ බඩ ඇතුළේ අයිස් මිදෙන්න ගත්තා. අනාවැකියේ පේළියක් මගේ කන් ඇතුළේ රැව් දුන්නා: ලෝකය අනන්ත නින්දක ගිලෙනවා දකිමින්. මධ්‍යම උද්‍යානයේ දී මෝර්ෆියස් දෙවියව මුණගැහුණ විදිහ ගැන ග්‍රෝවර් කියූ කතාව මට සිහි වුණා: මම වැදගත් ම අවස්ථාවට පාවිච්චි කරන්න මගේ ශක්තිය ඉතුරු කර ගනිමින් ඉන්න එක ඔහේගෙ හොඳට ගියා.

"මැරිලා නැහැ," මම කිව්වා. "මෝර්ෆියස් මුළු මැන්හැටන් දූපත ම නිදි කරවලා. ආක්‍රමණය පටන් ගෙන."

Scanned with CamScanner

# 10

# මම අලුත් යාළුවෝ ටිකක් මිල දී ගත්තා

නිදන නගරය ගැන සතුටින් සිටි එක ම කෙනා වුණේ මිසිස් ඕ'ලෙරීයි.

එයා පෙරළුණු හොට් ඩෝග් කරත්තයක් කොල්ල කමින් සිටිද්දී අපිට එයාව හොයාගන්න ලැබුණා. කරත්තයේ අයිතිකාරයා පදික වේදිකාව මත වකුටු වී, මහපටැඟිල්ල උරමින් සිටියා.

ඇස් සියය ම හොඳින් ඇරගෙන ආර්ගස් අපි එනතුරු බලා සිටියා. එයා මුකුත් කිවුවේ නැහැ. එයා කවදත් එහෙමයි නේ. මං හිතන්නේ ඒකට හේතුව හැමෝම කියන විදිහට එයාගේ දිවෙත් ඇහැක් තිබුණ නිසා වෙන්න ඇති. ඒ වුණත් එයා බයවෙලා ඉන්න බව එයාගේ මුහුණෙන් පැහැදිලිව ම පෙනුණා.

අපිට ඔලිම්පස්වල දී ඉගෙන ගන්න ලැබුණු දේවල් ගැනත්, අපිව බේරගන්න දෙවිවරු නොඑන බවත් මම එයාට කිවුවා. ආර්ගස් අප්පිරියාවෙන් ඇස් කැරකුවා. ඒක නම් මොළේ කොලොප්පන් කරන දෙයක් වුණේ එහෙම කරද්දී එයාගේ මුළු ඇඟ ම කැරකුණ නිසයි.

"ඔයා ආපහු කඳවුරට ගියොත් හොඳයි," මම එයාට කිවුවා. "ඔයාට පුළුවන් උපරිමෙන් ඒක මුර කරන්න."

මගේ දිහාවට ඇඟිල්ලක් දිගු කළ එයා ප්‍රශ්නාර්ථකාරීව ඇහි බැමක් එසෙව්වා.



"මම නවතිනවා," මම කිවුවා.

ආර්ගස් ඔළුව වැනුවේ ඒ උත්තරේ එයාව තෘප්තිමත් කළා වගෙයි. ඇනබෙත් දිහා බැලුව එයා ඇඟිල්ලකින් අවකාශයේ රවුමක් ඇන්දා.

"ඔව්," ඇනබෙත් එකඟ වුණා. "මං හිතන්නෙ මේක තමයි වෙලාව."

"මොකටද?" මම ඇහුවා.

ආර්ගස් එයාගේ වෑනය පිටුපස අවුස්සමින් මොකක්දෝ හෙවුවා. ලෝකඩ පලිහක් එළියට ගත් එයා ඒක ඇනබෙත් අතට දුන්නා. ඒකට තිබුණේ අපි කොඩිය ඇල්ලීමේ තරගවලදී නිතර ම පාවිච්චි කළ සාමාන්‍ය රවුම් පලිහක පෙනුමක්. ඒ වුණත් ඇනබෙත් ඒක බිමින් තැබුවා ම, පලිහේ ඔප දැමූ මතුපිට තිබුණු අහසේ සහ ගොඩනැගිලිවල පිළබිඹුව අපි අහලකවත් නොතිබුණු ලිබර්ටි ප්‍රතිමාවේ පිළිබිඹුවකට මාරු වුණා.

"වාව්," මම කිවුවා. "වීඩියෝ පලිහක්."

"ඩෙඩලස්ගෙ අදහසක්," ඇනබෙත් කිවුවා. "මම මේක බෙකන්ඩොර්ෆ්ට කියලා හදව ගත්තෙ-" එයා සිලේනා දිහාවට බැල්මක් හෙළුවා. "ම්, කොහොම හරි, මේ පලිහ ලෝකයේ ඕනෑ ම තැනකින් ඉර එළිය නැත්නම් හඳ එළිය නමලා අරගෙන ප්‍රතිබිම්බ හදනවා. හරියට ම කියනවා නම් මේ පලිහට සොබාවික එළිය වැටෙන තාක්, මේ ඉර-හඳ යට තියෙන ඕනෑ ම ඉලක්කයක් ඔයාට බලාගන්න පුළුවන්. ඔන්න බලන්න."

ඇනබෙත් එයට සිත යොමු කරද්දී අපි එයා වටේට රොක් වුණා. මුල දි ඒ රූපය වේගයෙන් ළං වෙමින් කැරකෙද්දී ඒ දිහා බලා හිටපු මගේ ඔළුවත් කැරකෙන්න ගත්තා. මධ්‍යම උද්‍යානයේ සත්තු වත්තට ගියපු අපි, ඊට පස්සේ නැගෙනහිර හැටවෙනි කොටසට වේගයෙන් පහත් වී, බ්ලූමින්ග්ඩේල් පසු කර ගොස්, තුන්වෙනි වීදියට හැරුණා.

"හෝව්," කොනර් ස්ටොල් කිවුවා. "පස්සට යන්න. අන්න අතනට ළං කරලා පෙන්නන්න."

"මොකක්ද?" ඇනබෙත් ඇසුවේ කලබලෙන්. "ඔයා ආක්‍රමණකාරයෝ දැක්කා ද?"

Scanned with CamScanner

"නෑ. අර තියෙන්නේ- ඩිලන්ගේ රසකැවිලි කඩේ." කොනර් එයාගේ සහෝදරයාට දත් නියෙව්වා. "මචෝ, ඒක ඇරලා තියෙන්නේ. ඒ මදිවට හැමෝම නිදි. ඔයා හිතන්නෙත් මං හිතන දේම ද?"

"කොනර්!" කේටී ගාඩ්නර් සැර කළා. එයා කතා කළෙත් එයාගේ අම්මා ඩිමීටර් වගේමයි. "මේක බරපතළ දෙයක්. මේ යුද්ධයක් මැද්දෙ ඔයාලා ගිහින් රසකැවිලි කඩයක් මංකොල්ල කන්නෙ එහෙම නෑ!"

"සමා වෙන්න," කොනර් කෙඳිරුවත්, එයා ලැජ්ජාවෙන් ඒක කියපු වගක් නම් තේරුනේ නැහැ.

ඇනබෙත් පලිහ ඉදිරියෙන් අතක් ගෙන ගියා ම තවත් දසුනක් මතු වුණා: ගඟට එපිටින් ලයිට් හවුස් උයන පෙනෙන එෆ්.ඩී.ආර්. මාවත.

"මේකෙන් අපිට නගරෙන් එහා පැත්තෙ සිද්ධ වෙන දේවල් බලාගන්න පුළුවන්," එයා කිවුවා. "ස්තූතියි, ආර්ගස්. ආයෙමත් අපිට කඳවුරේ දී මුණ ගැහෙන්න ලැබෙයි කියලා හිතනවා... කවදා හරි."

ආර්ගස් උගුරෙන් ගෙරෙව්වා. එයා මට දුන් බැල්මෙන් පැහැදිලිව ම කියවුණේ: 'සුබ පැතුම්; ඔයාට ඒක ඕනෑ වෙයි.' කියලයි. ඊට පස්සේ එයා වෑන් රථයට ගොඩ වුණා. එයයි හාර්පිලා දෙන්නයි පාර පුරා අක්‍රියව තිබූ වාහන පොකුරු අතරින් වෑන් රථ පදවාගෙන යන්න ගියා.

මම මිසිස් ඕ'ලෙරීට උරුවම් බෑවා ම, එයා උඩ පැන පැන දුවගෙන ආවා.

"හේයි, කෙල්ලේ," මම කතා කළා. "ඔයාට ග්‍රෝවර්ව මතකයි නේද? අපිට උයනේ දි හම්බ වුණ සැටර්?"

"වූෆ්!"

එයා අදහස් කළේ 'ඇත්තට ම මට මතකයි!' කියන එක මිසක් 'ඔයා ළඟ තව හොට් ඩෝග් තියෙනව ද?' කියන එක නෙවෙයි වෙන්නැති කියලා මම බලාපොරොත්තු වුණා.

"ඔයා එයාව හොයාගෙන එනව ද." මම කිවුවා. "එයා තවමත් ඇහැරලා ඉන්නව ද බලන්න. අපිට එයාගේ උදවු ඕනෑ වෙනවා. ඔයාට තේරුණා ද? ග්‍රෝවර්ව හොයාගෙන එන්න!"



මට තෙත ගොහොදු හාද්දක් දුන්න මිසිස් ඕ'ලෙරී ඊට පස්සේ උතුරු පැත්තට දිවුවා.

පෝලක්ස් නිදා සිටි පොලිස් නිලධාරියෙක් ළඟ ඇන තියාගත්තා. "මට නම් මේක තේරෙන්නෑ. ඇයි අපිවත් නින්දට වැටුනේ නැත්තේ? ඇයි මනුෂ්‍යයින්ට විතරක් ඒක වුණේ?"

"මේක ගොඩාක් ලොකු වශියක්," සිලේනා බියුරිගාඩ් කිවුවා. "වශීකරණය ලොකු වෙන තරමට, ඒකට ප්‍රතිරෝධය දක්වන්න ලේසි වෙනවා. මිනිස්සු මිලියන ගාණක් නිදි කරවන්න නම්, ඔයාට මායා පටලය බොහෝම තුනීවට අතුරන්න වෙනවා. උප දෙවිවරුන්ව නිදි කරවන එක ඊට වඩා අමාරුයි."

මම එයා දිහා බලා හිටියේ පුදුමයෙන්. "ඔයා මැජික් ගැන ඔච්චර දේවල් ඉගෙන ගත්තෙ කවද ද?"

සිලේනාගේ කම්මුල් රතු වුණා. "මම මුළු දවස ම ගෙවන්නේ මගේ ඇඳුම් අල්මාරිය එක්ක නෙවෙයි අනේ."

"පර්සි," ඇනබෙත් කතා කළා. එයා තවමත් පලිහ මත ඇස් රඳවාගෙනයි හිටියේ. "ඔයා මේක බැලුවොත් හොඳයි."

ලෝකඩ රූපයෙන් දැක්වුණේ ලා ගාර්ඩියා අසල ලෝන්ග් අයිලන්ඩ් වෙරළ තීරයයි. අධි වේග බෝට්ටු දුසිමක බල ඇණියක් අඳුරු වතුර දෙබෑ කරගෙන මෑන්හැටන් දෙසට යාත්‍රා කළා. ඒ සෑම බෝට්ටුවක් ම සම්පූර්ණ ග්‍රීක සන්නාහයෙන් සැරසුණු උප දෙවිවරුන්ගෙන් පිරී තිබුණා. පෙරමුණේ පැමිණි බෝට්ටුව පිටුපස කළු පාට දෑකැත්තක ලාංඡනයකින් සැරසුණු දම් පාට කොඩියක් රාත්‍රී සුළඟ වැදී සැලුණා. මීට කලින් ඒ සලකුණ දැක නොතිබුණත්, ඒක මොකක්ද කියලා තේරුම් ගන්න අපහසු වුණේ නැහැ: ඒක තමයි ක්‍රෝනොස්ගේ යුද කොඩිය.

"දූපත වටේට ස්කෑන් කරලා බලන්න," මම කිවුවා. "ඉක්මනට."

ඇනබෙත් පලිහේ දර්ශනය දකුණේ වරායට හැරෙව්වා. ස්ටේටන් දූපතේ පාලම් පාරුවක් එලිස් දූපත අසල රළ දෙබෑ කරගෙන එමින් තිබුණා. නැව් තට්ටුව ඩ්‍රැකනෙයිලාගෙන් සහ යම බලු රැනකින් ඇහිරිලා. නැවට ඉදිරියෙන් පිහිනමින් සිටියේ මුහුදු ක්ෂීරපායීන් රංචුවක්. මුල දී මම හිතුවේ ඒ ඩොල්ෆින්ලා කියලයි. ඒත් ටිකකින් උන්ගේ බලු මුහුණු සහ ඉණේ බැඳි කඩු දකින්න ලැබුණා ම උන් ටෙලිකීන් නම් මුහුදු රකුසෝ බව මම තේරුම් ගත්තා.

Scanned with CamScanner

දර්ශනය නැවතත් මාරු වුණාː ජර්සි වෙරළේ, ලින්කන් උමඟට ඇතුළු වෙන තැනට. එක එක ජාතියේ රාක්ෂයින් සිය ගාණක් නැවතුණු රථ වාහන පිරුණු වීදි දිගේ එමින් සිටියාː මුගුරු අතින් ගත් යෝධයෝ, මැර සයික්ලොප්ස්ලා, ගිනි පිඹින මකරු කීප දෙනෙක් එක්ක මදි පාඩුව පුරවන්න වගේ දෙවෙනි ලෝක යුද සමයේ යුද ටැංකියකුත් පාරේ ඇති වාහන පෙරළමින් උමඟට ඇතුළු වුණා.

"මෑන්හැටන්වලට පිටින් ඉන්න මිනිස්සුන්ට මොකද වෙන්නෙ?" මම ඇසුවා. "මුළු ප්‍රාන්තෙ ම නිදි ද?"

ඇනබෙත්ගේ නළල රැළි ගැහුණා. "මං හිතන්නෑ, ඒත් ඒක නම් අමුතුයි. මෑන්හැටන් සම්පූර්ණයෙන් ම නින්දට වැටිලා කියලා මේ පින්තූරවලින් මට කියන්න පුළුවන්. ඒ ඇරෙන්න දූපත වටේට හැතැප්ම-පනහක අරය ඇතුළේ කාලය හොඳටෝම මන්දගාමී වෙලයි තියෙන්නේ. මෑන්හැටන්වලට ළං වෙන තරමට, මන්දගාමීකම වැඩි වෙනවා."

එයා මට තවත් දර්ශනයක් පෙන්නුවා- නිව් ජර්සිවල අධිවේගී මාර්ගයක්. එදා සෙනසුරාදා හවස් වරුවක් වූ නිසා, සතියේ දවස්වලට තියෙන තරම් රථ වාහන තදබදයක් තිබුණේ නැහැ. වාහනවල රියැදුරෝ අවදියෙන් ඉන්න බව පෙනුණත්, කාර් ඉදිරියට ඇදුණේ පැයට සැතපුමක විතර වේගයෙනුයි. ඒවාට ඉහළින් කුරුල්ලෝ මන්දගාමීව පියඹා ගියා.

"ක්‍රෝනොස්," මම කිවුවා. "එයා කාලය මන්දගාමී කරනවා."

"හෙකේටුත් උදවු කරනවා ඇති," කේටී ගාඩ්නර් කිවුවා. "බලන්නකෝ, කාර් ඔක්කොම මෑන්හැටන් පිටවීමේ ගේට්ටුවෙන් අහකට හැරිලා යන්නේ හරියට ආපහු හැරෙන්න කියලා එයාලගේ යටි හිතට පණිවුඩ ලැබෙනවා වගේ."

"අනේ මන්දා." ඇනබෙත් කතා කළේ එපා වෙලා වගෙයි. මොනවා හරි දෙයක් එයාගේ දැනීමෙන් පිට තියෙන එක එයාට ජේන්න බැරි වැඩක්. "හැබැයි කොහොම හරි එයාලා මෑන්හැටන් මායා තට්ටු ගාණකින් වට කරලයි තියෙන්නේ. මෙහෙ මොකක් හරි වැරැද්දක් වෙලා කියලා පිටත ලෝකේ අය දන්නෙවත් නැතුව ඇති. මෑන්හැටන් පැත්තට මනුස්සයෙක් ආවත්, මෙහෙ මොනවා වෙනව ද කියලා දැනෙන්න ඉඩක් නොලැබෙන තරමට එයාව මන්දගාමී වෙයි."



"හරියට ලාටුවල ඇලුණ මැස්සො වගේ," ජේක් මේසන් මිමිණුවා.

ඇනබෙත් ඔළුව වැනුවා. "එළියෙන් අපිට කිසිම උදවුවක් ලැබෙයි කියලා බලාපොරොත්තු වෙන්න බැහැ."

මම මගේ යාළුවෝ වෙතට හැරුණා. එයාලා හිටියේ තිගැස්සිලා වගේම බයවෙලා වගෙයි. ඒත් එයාලට දොස් කියන්න මට බැහැ. පලිහ අපිට පෙන්වා තිබුණු විදිහට අඩු ම තරමේ හතුරන් තුන්සිය දෙනෙක්වත් මඟ එමින් සිටියා. මෙතැන හිටියේ අපි හතළිස් දෙනයි. ඒ වගේම අපි හිටියේ තනි වෙලයි.

"හරි එහෙනම්," මම කිවුවා. "අපි කොහොම හරි මෑන්හැටන් අල්ලගෙන ඉන්නවා."

සිලේනා එයාගේ සන්නාහයෙන් ඇද්දා. "ඉතින්, පර්සි, මෑන්හැටන් ගොඩාක් ලොකුයි නේ."

"අපි කොහොම හරි ඒක කරනවා," මම කිවුවා. "අපිට එහෙම කරන්න වෙනවා."

"එයා හරි," ඇනබෙත් කිවුවා. "හුළඟට අධිපති දෙවිවරු අහසෙන් එන ක්‍රෝනොස්ගේ බලවේග ඔලිම්පස්වලින් ඈත් කරලා තියාගනී. ඒ නිසා එයා ගොඩබිමින් පහර දෙන්න උත්සාහ කරයි. අපිට දූපතට ඇතුළු වෙන්න තියෙන පාරවල් අහුරන්න වෙනවා."

"උන් ළඟ බෝට්ටු තියෙනවා නේ," මයිකල් යෙව් පෙන්නා දුන්නා.

මගේ කොඳු නාරටිය පහළට විදුලියක් ගලා ගියා. එක්වරම මට ඇතීනාගේ උපදේශයේ අරුත තේරුම් ගියාː ගඟවල් මතක තියාගන්න.

"මම බෝට්ටු ගැන බලා ගන්නම්," මම කිවුවා.

මයිකල් රවා බැලුවා. "කොහොමද?"

"ඒ වැඩේ මට ඉතුරු කරන්නකෝ," මම කිවුවා. "අපි පාලම් ටිකයි උමං පාරවලුයි මුර කරන්න ඕනෑ. එයාලා අඩු තරමේ පළවෙනි උත්සාහයේදිවත් මිඩ්ටවුන්වලට නැත්නම් ඩවුන්ටවුන්වලට පහර දෙන්න බලයි කියලා අපි හිතමු. එම්පයර් ස්ටේට් බිල්ඩිමට එක එල්ලේ ම එන්න තියෙන පාර තමයි ඒක. මයිකල්, ඇපලෝ කැබින් එක අරගෙන විලියම්ස්බර්ග් පාලමට යන්න. කේටී, ඩිමීටර් කැබින් එක බෲක්ලින් උමඟ ගන්න ඕනෑ. කටු පඳුරුයි, විෂ අයිවි වැලුයි

Scanned with CamScanner

උමඟ පිරෙන්න වවන්න. ඔයාලට කරන්න වෙන ඕනෑ ම දෙයක් කරලා, උන්ට එතැනින් ඇතුළට එන්න ඉඩ නොදී ඉන්න! කොනර්, හර්මීස් කැබින් එකෙන් බාගයක් අරගෙන මැන්හැටන් පාලම ආරක්ෂා කරන්න යන්න. හැබැයි කඩවල් මංකොල්ල කන්නයි, සුද්ද කරන්නයි මඟ නවතින්න බැහැ!"

"අයියෝ!" මුළු හර්මීස් කැබිනය ම අවලාද නැගුවා.

"සිලේනා, ඇෆ්‍රොඩයිට්ලව ක්වීන්ස්-මිඩ්වටුන් උමඟට අරන් යන්න."

"ඔහ්, මගෙ දෙවියනේ," එයාගේ සහෝදරියක් කිවුවා. "පස්වෙනි වීදිය තියෙන්නෙත් අපේ පාරෙ ම නේ! අපිට ලස්සනට හැඩ වෙලා යන්න පුළුවන් වෙයි, ඒ වගේම රාක්ෂයින්ට ගිවන්චි (සුවඳ විලවුන් වර්ගයක්) සුවඳ පෙන්නන්න බැහැ නේ."

"පරක්කු වෙන්න බැහැ," මම කිවුවා. "හොඳයි... ඔයාලා හිතනවා නම්, ඒ සුවඳ විලවුන් වැඩේ හරි යයි කියලා."

උද්‍යෝගිමත් ඇෆ්‍රොඩයිට් කෙල්ලො හය දෙනෙක් මගේ කම්මුලට හාදු දුන්නා.

"හරි හරි, ඇති!" මම ඇස් වසාගෙන මට මඟ ඇරුණේ මොකෙද කියලා මතක් කරන්න උත්සාහ කළා. "හෝලන්ඩ් උමඟ. ජේක්, හෙෆාස්ටස් කැබින් එක එතැනට අරන් යන්න. ග්‍රීක ගින්දර පාවිච්චි කරන්න, උගුල් අටවන්න. ඔයාලා ළඟ තියෙන ඕනෑම දෙයක් පාවිච්චි කරන්න."

එයා දත් නියෙව්වා. "බොහෝම සන්තෝසෙන් කරනවා. අපිට වාඩුවක් පිරිමහන්න තියෙනවා. බෙකන්ඩොර්ෆ් වෙනුවෙන්!"

මුළු කැබිනය ම එය අනුමත කරමින් ඝෝෂා කළා.

"පනස් නමවෙනි වීදියේ පාලම," මම කිවුවා. "ක්ලැරිස්-"

මගේ කතාව ඇන හිටියා. ක්ලැරිස් මෙතැන නැහැ නේ. මුළු ඒරිස් කැබිනය ම කඳවුරට වෙලා බකන් නිලාගෙන ඇති.

"අපි ඒක ගැන බලාගන්නම්," ඇනබෙත් ඉදිරිපත් වුණේ, අපහසුකාරී නිහැඬියාවෙන් මාව ගලවා ගනිමින්. එයා එයාගේ සහෝදර සහෝදරියෝ වෙතට හැරුණා. "මැල්කම්, ඇතීනා කැබින් එක අරගෙන ගිහින්, මම ඔයාට පේනනලා දුන්න විදිහට මඟ දිගට සැලසුම් අංක විසි තුන ක්‍රියාත්මක කරන්න. ඒ තැන අල්ලගෙන ඉන්න."



"අපි කරන්නම්."

"මම පර්සි එක්ක යනවා," එයා කිවුවා. "ඊට පස්සේ අපි ඔයාලට එකතු වෙන්නම්, නැත්නම් අපිව උවමනා කරන තැනකට යන්නම්."

"ඔය දෙන්නා වෙන වෙන ගමන් එහෙම යන්නෑ," කණ්ඩායම පිටුපස සිටි කවුදෝ කිවුවා.

ඒක අහලා සමහරු හිනා වෙන්න ගත්තත්, ඒක ගණන් නොගෙන ඉන්න මම තීරණය කළා.

"හරි එහෙනම්," මම කිවුවා. "සෙල් ෆෝන්වලින් විස්තර බෙදාගමු."

"අපිට සෙල් ෆෝන් නැහැ නේ," සිලේනා විරෝධය පෑවා.

පහළට නැමුණු මම ගොරවමින් සිටි ගැහැනු කෙනෙකුගේ බ්ලැක්බෙරි දුරකථනය අහුලාගෙන සිලේනාට දැමුවා. "දැන් තියෙනවා නේ. ඔයාලා හැමෝම ඇනබෙත්ගේ නොම්බරේ දන්නවා නේ? ඔයාලට අපිව ඕනෑ වුණොත් මොකක් හරි ෆෝන් එකක් අහුලගෙන අපිට කතා කරන්න. ඒක එක පාරක් පාවිච්චි කරලා, ආපහු දාන්න, ඊට පස්සේ ආයෙමත් කෝල් කරන්න ඕනෑ වුණොත් තව කෙනෙක්ගේ එකක් ගන්න. එහෙම කරොත් රාක්ෂයින්ට ඔයාලා ඉන්න තැන හොයාගන්න අමාරු වෙයි."

හැමෝම දත් නියවන්න ගත්තේ ඒ අදහසට කැමැත්තෙන් වගෙයි.

ට්‍රැවිස් උගුර පෑදුවා. "අහ්, අපිට හොඳ ම ජාතියේ ලස්සන ෆෝන් එකක් හොයාගන්න ලැබුණොත්-"

"නෑ නෑ, ඔයාට ඒක තියාගන්න බැහැ," මම කිවුවා.

"මොනවද, මචං."

"පොඩ්ඩක් ඉන්න, පර්සි," ජේක් මේසන් කිවුවා. "ඔයාට ලින්කන් උමඟ අමතක වුණා නේ."

මම කියවෙන්න ගිය ශාපයක් ගිල ගත්තා. එයා කිවුවා හරි. යුද්ධ ටැංකියක් සහ රාක්ෂයෝ සිය ගාණක් මේ වෙද්දිත් ඒ උමඟ හරහා ඉදිරියට ඇදෙමිනුයි හිටියේ, ඒ තියෙද්දී මම අපේ සේනාව අනිත් හැම තැනක ම ස්ථාන ගත කරලා.

ඒ වෙලාවේ පාරේ එහා පැත්තෙන් ගෑනු ළමයෙකුගේ කටහඬක් ඇසුණා: "ඒක අපිට ඉතුරු කළොත් කොහොමද?"

මගේ ජීවිතේට වෙන කාගෙවත් කටහඬක් ඇහිලා මම එච්චර සතුටු වෙලා නැහැ. තරුණ ගෑනු ළමයි තිස්දෙනෙකුගේ කණ්ඩායමක් පස්වෙනි වීදිය හරහා ආවා. සුදු කමිස, රිදී පාටට හුරු හමුදා මෝස්තරයේ කලිසම් සහ සටනට පලඳින බූට්වලින් එයාලා සැරසී සිටියා. එයාලා හැමෝගෙම ඉණේ කඩුවකුත්, උරහිසේ එල්ලා ගත් හී කොපුව බැගිනුත්, සූදානමින් තබා ගත් දුන්නකුත් තිබුණා. සුදු පාට වෘක රැළක් එයාලගේ දෙපා වටා ගැවසෙමින් සිටියා. ගෑනු ළමයින්ගෙන් වැඩි දෙනෙකුගේ අතේ දඩයක්කාර උකුස්සා බැගින් සිටියා.

කණ්ඩායමේ පෙරමුණ ගෙන සිටියේ කළු පාට ලෙදර් ජැකට්ටුවකින් සැරසුණු, කළු කුරු කොණ්ඩයක් ඇති කෙල්ලෙක්. කුමාරිකාවකගේ ඔටුන්නක් වගේ රිදී වළල්ලක් එයාගේ හිස මත තිබුණා. හැබැයි ඒක එයා පැලඳගෙන හිටපු හිස්කබලක හැඩයේ කරාබු දෙකටවත්, ඊතලයකින් හිස සිදුරු වූ පුංචි බාර්බි බෝනික්කෙකුගේ රූපයක් සමඟ ඩෙත් ටු බාර්බි කියා සටහන් කළ ටී-ෂර්ට් එකටවත් ගැළපුනේ නැහැ.

"තාලියා!" ඇනබෙත් කෑගැසුවා.

සියුස්ගේ දුව දත් නියෙව්වා. "ආර්ටෙමිස්ගේ දඩයක්කාරියන් රාජකාරියට වාර්තා කරනවා."

***

අපි එකිනෙකාව වැලඳගෙන සුබ පතා ගත්තා. දඩයක්කාරියන්ගෙන් අඩු තරමේ තාලියා විතරක්වත් මිත්‍රශීලියි. අනෙක් දඩයක්කාරියෝ නම් කඳවුරුකාරයෝ- විශේෂයෙන් ම කොල්ලෝ ඉන්න අහලකවත් ඉන්න කැමති අය නෙවෙයි. ඒ කොහොම වුණත් එයාලා අපි කාටවත් විද්දේ නැහැ. එයාලගෙන් බලාපොරොත්තු වෙන්න පුළුවන් උණුසුම් ම පිළිගැනීම ඒකයි.

"ගිය අවුරුද්ද තිස්සෙ කොහෙද ගිහින් හිටියේ?" මම තාලියාගෙන් ඇසුවා. "ඉස්සරට වඩා දෙගුණයක් විතර දඩයක්කාරියෝ දැන් ඔයා ළඟ ඉන්නවා නේ!"



එයා මහ හඬින් හිනා වුණා. "ඒක දිග ම දිග කතාවක්. ඕනෑ ඔට්ටුවක්, මම කරපු දේවල් ඔයාගේ වැඩවලට වඩා ගොඩාක් භයානකයි, ජැක්සන්."

"අමූලික බොරුවක්," මම කිවුවා.

"අපි බලමුකෝ," එයා පොරොන්දු වුණා. "මේක ඉවර වුණාට පස්සේ ඔයයි, ඇනබෙතුයි මමයි බටහිර පනස් හයේ හෝටලේ දී චීස්බර්ගර් කන්න සෙට් වෙමු."

"ලෙ පාකර් මෙරිඩියන්," මම කිවුවා. "ඔට්ටුයි. ඒ වගේම තාලියා, ස්තූතියි."

එයා උරහිස් ඇකිළුවා. "අර රාක්ෂයින්ට කවුද ගැහුවෙ කියලා තේරෙන එකක්වත් නැහැ. දඩයක්කාරිනි, අපි යමු!"

එයා එයාගේ රිදී බ්‍රේස්ලටයට තට්ටුවක් දැමුවා ම ඒගිස් පලිහ එහි නියම ප්‍රමාණයට විස්තාරණය වුණා. එහි මැද අඹා තිබුණු රන්වන් පාට මෙඩූසාගේ හිස කොච්චර භයංකාර පෙනුමක් ගත්තා ද කියනවා නම් කඳවුරුකරුවෝ හැමෝම පසු බැස්සා. මාවත පහළට යන්න ගිය දඩයක්කාරියෝ පසුපස එයාලගේ වෘකයෝ සහ උකුස්සන් යනවා දකිද්දී, ලින්කන් උමඟ දැනට ආරක්ෂිතව තියෙයි කියලා මට හැඟුණා.

"දෙවිවරුන්ට ස්තුති වේවා." ඇනබෙත් කිවුවා. "ඒ වුණාට අපි අර බෝට්ටුවලට එන්න බැරි වෙන්න ගඟවල් ඇහිරුවේ නැත්නම්, පාලම් උමං මුර කරන එකේ තේරුමක් නැතුව යනවා."

"ඔයා හරි," මම කිවුවා.

දරුණු සහ අධිෂ්ඨානශීලී ලෙස බලා සිටිනා කඳවුරුකරුවෝ දිහා මම බැලුවා. එයාලා හැමෝම මෙහෙම එකට ඉන්නවා දකින්න ලැබෙන අන්තිම වතාව මේක වෙයි ද නොහිතා ඉන්න මම උත්සාහ කළා.

"මේ සහස්‍රයේ ශ්‍රේෂ්ඨ ම වීරයෝ තමයි ඔයාලා," මම එයාලට කිවුවා. "ඔයාලට විරුද්ධව රාක්ෂයෝ කොච්චර ආවත් කමක් නැහැ. නිර්භීතව සටන් කරන්න. ඒ වගේම අපි දිනනවා." රිජ්ටයිඩ් ඉහළට එසවූ මම කෑගැසුවා, "ඔලිම්පස් වෙනුවේ..න්!"

ඊට ප්‍රතිචාර දෙමින් කෑගැසූ හතළිස් දෙනෙකුගේ හඬ මිඩ්ටවුන් ගොඩනැගිලිවල හැපී දෝංකාර දුන්නා. එක මොහොතකට

Scanned with CamScanner

ඒ හඬ වික්‍රමාන්විතව ඇසුණත්, නින්දට වැටුණු නිව්යෝර්ක් වැසියන් මිලියන දහයක් මැද එය ඉක්මනින් ම වියැකී ගියා.

★★★

ඇනබෙත්ටයි මටයි කාර් දෙකක් තෝරාගන්න තිබුණා, ඒත් ඒවා හැමෙකක් ම බම්පරයට-බම්පරය වදින තරමේ වාහන තදබදය මැද ඇහිරිලයි තිබුණේ. ඊටත් වඩා අමුතු දේ වුණේ ඒවා එකකවත් එන්ජින් ක්‍රියාත්මක වෙමින් නොතිබීමයි. ඒක හරියට රියැදුරෝ නින්දට වැටෙන්න කලින් එයාලට වාහනය ක්‍රියා විරහිත කරන්න ඉඩක් ලැබිලා වගෙයි. එහෙමත් නැත්නම් සමහරවිට එන්ජින් පවා නිදි කරවන්න බලයක් මෝර්ෆියස්ට තියෙන්න ඇති. රියැදුරන්ගෙන් වැඩි දෙනෙක් තමන්ට නිදිමත දැනෙද්දී වාහනය පාරෙන් ඉවතට ගෙන නවත්වන්න උත්සාහ කර ඇති බව පෙනෙන්න තිබුණා. ඒ වුණත් පාරවල් තවමත් තිබුණේ වාහනයක් පදවාගෙන යන්න බැරි තරමට ඇහිරිලායි.

අන්තිමේ දී අපිට ගඩොල් තාප්පයකට හේත්තු වී සිටි සිහිසුන් පණිවුඩ ගෙනයන්නෙක්ව හොයාගන්න ලැබුණා. අපි එයාව ස්කූටරයෙන් බිමට අරගෙන පදික වේදිකාව මත හාන්සි කෙරෙව්වා.

"සමා වෙයන්, මචං," මම කිවුවා. මොකක් හෝ වාසනාවක් තිබුණොත්, එයාගේ ස්කූටරය ආපහු ගෙනැත් දෙන්න මට පුළුවන් වෙයි. මට එහෙම කරන්න බැරි වුණොත්, ඒක ප්‍රශ්නයක් නොවෙන්නේ ඒ වෙද්දී මුළු නගරය ම විනාශ වෙලා ඉවර නිසයි.

මට පිටුපසින් වාඩිවෙලා මගේ ඉණෙන් අල්ලගෙන සිටි ඇනබෙත් සමඟ මම ස්කූටරය පදවාගෙන ගියා. බිය උපදවන නිශ්චලතාවය මැද අපේ එන්ජිම විතරක් හඬ නගද්දී අපි මහ පාර දිගේ පහළට ඇදුණා. නිහඬබව බිඳිමින් ඇසුණු එක ම හඬ වුණේ විටින් විට තැන් තැන්වලින් නද දුන් ජංගම දුරකථනවල ශබ්දය විතරයි- හරියට ඒවා එකිනෙකාට කතා කරගන්නවා වගෙයි, හරියට මුළු නිව්යෝර්ක් නගරය ම යෝධ කුරුලු ගෙයකට හැරිලා වගෙයි.

අපේ ඉදිරියට යාමේ වේගය සෑහෙන අඩු වුණා. ඒකට හේතුව වුණේ නිතර නිතර ම වගේ අපිට පාර මැද නින්දට වැටුණු පදිකයින්ව ආරක්ෂිත තැන්වලට ඉවත් කරන්න සිදු වූ නිසයි. වතාවක් අපිට ගිනි ඇවිළුණු විස්කෝතු කරත්තයක ගින්න නිවන්න නවතින්න වුණා. විනාඩි කීපයකට පස්සේ අපිට පාර පහළට නිදැල්ලේ පෙරළී යන ළදරු කරත්තයක් බේරගන්න සිද්ධ වුණා. පස්සෙ බලනකොට ඒක ඇතුළේ බබෙක් හිටියේ නැහැ- හිටියේ නින්දට වැටුණු කාගෙදෝ පූඩ්ල් බල්ලෙක් විතරයි. අනේ මන්දා. ඒක පරිස්සමෙන් දොරකඩක තැබූ අපි ඉදිරියට ම ඇදුණා.



"පොඩ්ඩක් නතර කරන්න," අපි මැඩිසන් චතුරස්‍ර උද්‍යානය පසු කරගෙන යද්දී ඇනබෙත් කිවුවා.

මම නැගෙනහිර විසි තුන්වෙනි පාර මැද නැවතුණා. ස්කූටරයෙන් බිමට පැන්න ඇනබෙත් උද්‍යානය දිහාවට දිවුවා. මට එයාව අල්ලගන්න ලැබෙද්දී එයා හිටියේ රතු ගලින් සැදූ පාදස්ථලයක් මත තිබුණු ලෝකඩ ප්‍රතිමාවක් දිහා බලාගෙනයි. මං හිතන්නේ මම ඒක පහුකරගෙන මිලියන වතාවක් විතර එහා මෙහා ගිහින් ඇති, ඒත් කවදාවත් මම ඒ ප්‍රතිමාව දිහා හරියට බලලා නැහැ.

එහි සිටියේ කකුලක් පිට කකුලක් දමාගෙන පුටුවක වාඩි වුණ හාදයෙක්. එයා බෝ ටයි එකක් සහ දිග වලිග කබායක් ඇති පරණ පන්නයේ ඇඳුම් කට්ටලයකින්- ඒබ්‍රහම් ලින්කන්ගේ මෝස්තරයේ එකකින්- සැරසී සිටියා. එයාගේ පුටුව යට ලෝකඩ පොත් මිටියක් ගොඩ ගසා තිබුණා. එක් අතකින් පිහාටු පෑනක් අල්ලගෙන සිටි එයා අනෙක් අතේ ලොකු ලෝකඩ කඩදාසියක් තබාගෙන සිටියා.

"අපි මොකටද..." මම ඇස් හීනි කරගෙන පාදස්ථලයේ කොටා තිබුණු නම කියවන්න උත්සාහ කළා, "විලියම් එච්. ස්ටෙවාර්ඩ් ගැන කරදර වෙන්නෙ?"

"සෙවාර්ඩ්," ඇනබෙත් නිවැරදි කළා. "එයා නිව්යෝක්වල ආණ්ඩුකාරයෙක් වෙලා හිටපු කෙනෙක්. සුළු උප දෙවියෙක්- හීබ්ගේ පුතෙක්, මං හිතන්නේ. ඒත් ඒවගෙන් වැඩක් නැහැ. මට වැඩක් තියෙන්නෙ මේ පිළිමෙන් විතරයි."

උද්‍යාන බංකුවක් මතට නැගුණු එයා ප්‍රතිමාවේ පාදම පිරික්සා බැලුවා.

"ඕකත් රොබෝ කෙනෙක් කියලා නම් මට කියන්නෙපා," මම කිවුවා.

ඇනබෙත් හිනා වුණා. "ඇත්ත ම කියනවා නම් මේ නගරෙ තියෙන පිළිමවලින් වැඩි හරියක් ස්වයංක්‍රීය යන්ත්‍ර තමයි. ඩෙඩලස් මේවා තැනින් තැන පිහිටුවලා තියෙන්නෙ එයාට හමුදාවක් ඕනෑ වුණොත් පාවිච්චි කරන්න."

"ඔලිම්පස්වලට ගහන්න ද, නැත්නම් ඒක ආරක්ෂා කරන්න ද?"

ඇනබෙත් උරහිස් ඇකිළුවා. "දෙකෙන් ඕනෑ එකකට. ඒක තමයි සැලසුම් අංක විසි තුන. එයා එක පිළිමයක් සක්‍රිය කළා ම, ඒක ගිහිල්ලා මුළු නගරෙ පුරා ම ඉන්න තමන්ගේ සහෝදරයින්ව සක්‍රිය කරලා, හමුදාවක් හදාගන්නවා. හැබැයි, ඒක අනතුරුදායකයි. ස්වයංක්‍රීය යන්ත්‍ර මොනවා කරයි ද කියලා කලින් කියන්න බැරි වග ඔයා දන්නව නේ."

"අහ්-හහ්," මම කිවුවා. ස්වයංක්‍රීය යන්ත්‍ර නිසා අපි මීට කලින් ඕනෑ තරම් නරක අත්දැකීම් විඳලයි හිටියේ. "ඔයා ඇත්තට ම හිතන්නෙ මේක පණ ගන්වන්න ද?"

"මගේ ළඟ ඩේඩලස්ගේ සටහන් වගයක් තිබුණා," එයා කිවුවා. "මං හිතන්නෙ මට පුළුවන්... අහ්, මෙන්න තියෙනවා."

එයා ප්‍රතිමාවේ බූට් සපත්තුවක තුඩ තද කරද්දී, ප්‍රතිමාව නැගී සිටියේ පිහාටු පෑන සහ කඩදාසිය සූදානමින් තබාගෙනයි.

"එයා මොනවද කරන්න හදන්නෙ?" මම ඇහුවා. "දූන්වීමක් ලියන්න ද?"

"ෂ්ෂ්," ඇනබෙත් කිවුවා. "හලෝ, විලියම්."

"බිල්." මම යෝජනා කළා.

"බිල්- ඔහ්, කට වහගන්නකෝ," ඇනබෙත් මට කිවුවා. ප්‍රතිමාව බෙල්ල ඇල කර හිස්, ලෝහමය ඇස්වලින් අපි දිහා බැලුවා.

ඇනබෙත් උගුර පෑදුවා. "හලෝ, එර්ර්, සෙවාර්ඩ් ආණ්ඩුකාරතුමනි. විධාන අංකයඃ ඩේඩලස් විසි තුන. මැන්හැටන් ආරක්ෂා කරන්න. සක්‍රීයනය ආරම්භ කරන්න."

සෙවාර්ඩ් එයාගේ පාදස්ථලයෙන් බිමට පැන්නා. එයා කොයි තරම් තදින් පොළොවේ වැදුණා ද කියනවා නම්, එයාගේ සපත්තු වැදිලා පදික වේදිකාව ඉරි තැළුවා. ඊට පස්සේ එයා ටාංංං-ටිංං හඬ නගමින් නැගෙනහිර පැත්තට යන්න ගියා.

"මං හිතන්නෙ එයා කන්ෆියුසියස්ව ඇහැරවන්න යනවා ඇති," ඇනබෙත් අනුමාන කළා.

"මොකක්?" මම ඇහුවා.



"තවත් පිළිමයක්. මේකයි වැඩේ, හැමෝම සක්‍රිය කරලා ඉවර වෙනකල් එයාලා එකින් එකාට පණ දිදී යයි."

"ඊට පස්සේ?"

"එයාලා මැන්හැටන් ආරක්ෂා කරයි කියලා හිතමු."

"හතුරු පාර්ශවේ අපි නෙවෙයි කියලා එයාලා දන්නව ද?"

"මං එහෙම හිතනවා."

"හරි ෂෝක්." නිව්යෝක් නගරයේ උද්‍යානවල, වෙළඳ සංකීර්ණවල සහ ගොඩනැගිලිවල ඇති සියලූ ම ලෝකඩ ප්‍රතිමා ගැන මම හිතලා බැලුවා. ඒවා සිය ගාණක්, සමහරවිට දහස් ගාණක් තියෙන්න ඕනෑ.

ඒ වෙලාවේ හැන්දෑ අහසේ කොළ පාට ආලෝක ගුළියක් පුපුරා ගියා. ග්‍රීක ගින්දර. ඒක පිපුරුවේ කොහේ හෝ නැගෙනහිර ගඟට ඉහළ තැනකයි.

"අපිට ඉක්මන් කරන්න වෙනවා," මම කිවුවා. අපි ස්කූටරයට දිවුවා.

★★★

මැන්හැටන් නගරයේ පහත තුඩුවක් වගේ කොටස අසබඩ දී හඩ්සන් ගඟ සහ නැගෙනහිර ගඟ එකට එකතු වෙලා, බොක්කට ගලා යන තැන පිහිටි බැටරි උද්‍යානය ළඟ අපි ස්කූටරය නැවැත්තුවා.

"මෙතැනට වෙලා ඉන්න," මම කිවුවා.

"පර්සි, ඔයා තනියම ගිහිල්ලා හරියන්නෑ."

"හොඳයි, ඔයාටත් වතුර යට දී හුස්ම ගන්න පුළුවන් නම් ආවට කමක් නෑ..."

එයා සුසුමක් හෙළුවා. "සමහර වෙලාවට නම් ඔයා මහ ඇණයක්."

"හරියට, මම ඇත්ත කියන වෙලාවට වගේ ද? බය වෙන්නෙපා, මට මුකුත් වෙන්නෙ නැහැ. දැන් මගේ ළඟ අකිලිස්ගේ ශාපේ තියෙනවා නේ. ඒ හින්දා මට කරදරයක් කරන්න කාටවත් බැහැ."

ඇනබෙත් එය තේරුම් ගත් වගක් පෙනුනේ නැහැ. "කෝකටත් පරිස්සම් වෙන්නකෝ. ඔයාට මුකුත් වෙනවා දකින්න මං කැමති නැහැ. මං කිවුවේ- අපිට මේ යුද්දෙට ඔයාව ඕනෑ නිසා."

මම දත් නියෙව්වා. "තප්පරෙන් එන්නම්."

ඉවුර පහළට ගිය මම වතුරට බැස්සා.

සමුදුරු-දෙවි-නොවන අයටයි මේක කියන්නේ, නිව්යෝර්ක් වරායේ පීනන්න නම් කවදාවත් යන්න එපා. ඒක අපේ අම්මලාගේ කාලේ තිබුණු තරම් අපිරිසිදු නැති වෙන්න පුළුවන්, ඒත් මේ වතුරෙන් නෑවොත් ඔයාගේ මූණ මැදින් තුන්වෙනි ඇහැක් මතු වෙන්න, එහෙමත් නැත්නම් පස්සෙ කාලෙක ඔයාට විකෘති දරුවෝ ලැබෙන්න පවා තවමත් ඉඩ තියෙනවා.

අඳුරු වතුර තුළට කිමිදුණු මම පතුලට කිඳා බැස්සා. ගංගා දෙකේ ම වතුර පහරවල් එක සමාන වෙන තැන- ඒවා එකට මුණ ගැසී බොක්ක නිර්මාණය කරන තැන සොයා ගන්න මම උත්සාහ කළා. එයාලගේ අවධානය දිනාගන්න හොඳම තැන ඒක කියලා මම හිතුවා.

"හේයි!" මම මගේ හොඳ ම වතුර-යට හඬින් කෑගැසුවා. ඒ හඬ අන්ධකාරය තුළ දෝංකාර දුන්නා. "ඔයාලා අපිරිසිදු වැඩිකමට කාටවත් මූණ පෙන්නන්ඩත් ලැජ්ජයි කියලා මං අහලා තියෙනවා. ඒ කතාව ඇත්තදෝ...?"

අපද්‍රව්‍ය සහ රොන් මඩ කැදලි කලතමින් සීතල දිය වැලක් බොක්ක හරහා රැළිති නැංවූවා.

"මං අහලා තියෙනවා නැගෙනහිර ගඟේ විෂ වැඩියි ලු," මම කියාගෙන ගියා, "ඒත් වැඩියෙන් ම ගඳ ගහන්නේ හඩ්සන් ගඟ ලු. නැත්නම් ඒකෙ අනිත් පැත්ත ද?"

වතුර දිලිසෙමින් සැලුණා. යම්කිසි බලගතු හා කේන්තියෙන් පිරුණු දෙයක් දූන් මගේ දිහා බලා සිටියා. එයා එතැන ඉන්න බව මට දැනුණා... නැත්නම් සමහරවිට දෙන්නෙක් ද.

මම කරපු අපහාසය දුරදිග ගියාවත් ද හිතලා මම බය වුණා. එයාලා මගේ ඉස්සරහ පෙනී හිටින්නවත් කරදර නොවී මාව කුඩු කරලා දම්මොත්? ඒත් මෙයාලා නිව්යෝර්ක් ගංගා දෙවිවරු නේ. ඒ නිසා එයාලා මාව මූණට මුලිච්චි වෙන්න එයි කියලා මම හිතුවා.

හිතුවා වගේම යෝධ රූපාකායන් දෙකක් මගේ ඉදිරියෙන් මතු වුණා. මුල දී ඒවා පෙනුණේ වටේට ඇති වතුරට වඩා උකු, තද



දුඹුරු පාට රොන් මඩවලින් සැදුණු කුලුනු දෙකක් වගෙයි. ඊට පස්සෙ ඒවට කකුල්, අත් සහ රවාගත් මුහුණු මතු වුණා.

වම් පැත්තේ සිටි කෙනාව නම් පෙනුණේ ටෙලිකිනයෙක් වගෙයි. එයාගේ මුහුණුවර වෘකයෙකුට සමාන වුණා. එයාගේ අවල්පත්වලින් සැදුණු අත් සහ කකුල් සහිත සිනිඳු කළු පාට සිරුර යාන්තමින් සීල් මසෙකුගේ හැඩය ගත්තා. එයාගේ ඇස් විකිරණ කොළ පාටින් දිලිසුණා.

දකුණු පැත්තේ හිටපු කෙනා ඊට වඩා මනුස්ස පෙනුමක් ඉසිලුවා. එයා රෙදි කඩමාලු සහ මුහුදු පැළෑටිවලිනුත්, බෝතල් මූඩි සහ පරණ ප්ලාස්ටික් බෝතල් රඳවනවලින් සැදූ සන්නාහයකිනුත් සැරසී සිටියා. එයාගේ මූණ ඇල්ගීවලින් පැල්ලම් වැටිලා, එයාගේ රැවුලත් ඕනෑවට වඩා දිගට වැවිලා. එයාගේ තද නිල් පාට ඇස් දෙක කේන්තියෙන් දූවෙමින් තිබුණා.

නැගෙනහිර ගඟට අධිපති දෙවියා විය යුතු සීල් මාළුවා කතා කළා, "ඔය ළමයා පණ නහගන්න දඟලනව ද? නැත්නම් අමු තකතීරුවෙක් ද?"

හඩ්සන් ගඟේ රැවුල්කාර ආත්මය සමච්චල් කරා. "ඔහේ ඉතින් තකතීරුකම් ගැන විශේෂඥයා නේ, නැගෙනහිර."

"කට පරිස්සම් කරගන්නවා, හඩ්සන්," නැගෙනහිර ගෙරෙව්වා. "දූපතේ තමන්ගෙ පැත්තට වෙලා, තමන්ගේ වැඩක් බලාගෙන පාඩුවේ ඉන්නවා."

"ඇයි නැත්නම් ඔහේ මට මොනවා කරන්ඩ ද? තවත් කුණු පාරුවක් මගේ පැත්තට තල්ලු කරනව ද?"

ඒ දෙන්නා සටන් කරන්න සූදානමින් එකිනෙකා දිහාවට පාවී ගියා.

"ඔහොම ඉන්න!" මම මොර දුන්නා. "අපිට ඊට වඩා ලොකු ප්‍රශ්නයක් තියෙනවා."

"පොඩි එකා හරි," නැගෙනහිර දත් නියවා ගෙරෙව්වා. "අපි දෙන්න ම එකතු වෙලා ඒකව මරමු, ඊට පස්සේ අපි දෙන්නා සටන් කරමු."

"ඒ අදහස නම් හොඳයි," හඩ්සන් කිව්වා.

Scanned with CamScanner

ඒකට විරෝධය පාන්න මට ඉඩක් ලැබෙන්න කලින්, ගං පතුලෙන් ඉහළ නැගුණු කුණු ගොඩවල් දහස් ගාණක් දෙපැත්තෙන් ම එක එල්ලේ මගේ දිහාවට පාවී ආවා: කැඩුණු වීදුරු, ගල්, කෑන්, ටයර්.

කොහොම වුණත් මම ඒක බලාපොරොත්තුවෙනුයි හිටියේ. මට ඉදිරියෙන් වූ වතුර පලිහක් බවට ගන වුණා. එහි වැදුණු කුණු කන්දල් කිසිම හානියක් නොකර ඉවතට විසි වුණා. එය හරහා ආවේ එක වීදුරු කෑල්ලක් විතරයි- මාව මරන්න වුණත් සෑහෙන තරම් ඒ වීදුරු කෑල්ල ලොකු වුණත්, ඒක මගේ හමේ වැදී නිකං ම කුඩු වී ගියා විතරයි.

ගංගා දෙවිවරු දෙන්නා මගේ දිහා ඇස් ලොකු කරගෙන බලා හිටියා.

"පොසෙයිඩන්ගේ පුතෙක්?" නැගෙනහිර ඇහුවා.

මම ඔළුව වැනුවා.

"ස්ටයික්ස් ගඟෙන් නාල ද ආවේ?" හඩ්සන් ඇසුවා.

"ඔව්."

ඒ දෙන්න ම අප්පිරියාවට පත් වුණු හඬවල් නැගුවා.

"හොඳයි, ඒක නම් නියමයි," නැගෙනහිර කිවුවා. "දැන් අපි කොහොමද එයාව මරන්නේ?"

"අපිට එයාට කරන්ට් වද්දලා මරන්න පුළුවන්," හඩ්සන් කල්පනාකාරීව කිවුවා. "මට ජම්පර් කේබල් එකක් හොයාගන්න පුළුවන් වුණොත්-"

"මං කියන දේ අහන්න!" මම කිවුවා. "ක්‍රෝනොස්ගේ හමුදාව මැන්හැටන් ආක්‍රමණය කරනවා."

"ඔහේ හිතන්නෙ අපි ඒක දන්නෑ කියල ද?" නැගෙනහිර ඇහුවා. "මට මේ දැනුත් එයාගේ බෝට්ටු දැනෙනවා. එයාලා දැන් එගොඩට කිට්ටු කරලයි ඉන්නේ."

"ඔව්," හඩ්සන් එකඟ වුණා. "මගේ වතුර මැදිනුත් ජරා රාක්ෂයෝ වගයක් යනවා."

"එහෙනම් එයාලව නවත්තන්න," මම කිවුවා. "උන්ව ගිල්ලලා දාන්න. උන්ගේ බෝට්ටු පෙරළන්න."



"අපි මොකටද එහෙම කරන්නේ?" හඩ්සන් ගෙරෙව්වා. "එයාලා ඔලිම්පස් අල්ලා ගත්තදෙන්. අපිට මොකද?"

"මොකද, මට පුළුවන් ඔයාලට ගෙවන්න." මගේ උපන් දිනේට තාත්තා දීලා තිබුණ සෑන්ඩ් ඩොලරය මම එළියට ගත්තා.

ගංගා දෙවිවරුන්ගේ ඇස් ලොකු වුණා.

"ඒක මට!" නැගෙනහිර කිවුවා. "ඕක මෙහෙට දෙන්න, දරුවෝ, මං පොරොන්දු වෙනවා ක්‍රෝනොස්ගේ හැතිකරෙන් එකෙක්ටවත් නැගෙනහිර ගඟ හරහා යන්න ලැබෙන්නෙ නැහැ."

"ඒක අමතක කරන්න," හඩ්සන් කිවුවා. "අර නැව් ඔක්කෝටම හඩ්සන් ගඟ හරහා යන්න මම ඉඩ දෙනවට අකමැති නම්, ඔය සෑන්ඩ් ඩොලරේ මට දෙන්න."

"අපි මේක සමාදානෙන් බේරගමු." මම සෑන්ඩ් ඩොලරය දෙකට කැඩුවා. එය කැඩුණු තැනින් පිරිසිදු නැවුම් වතුර දහරාවක් විසිරී පැතිරුණේ මුළු බොක්ක පුරා වූ දූෂණය නැති කර දමන්න වගෙයි.

"ඔයාලා දෙන්නට ම බාගේ බාගේ ලැබෙනවා," මම කිවුවා. "හිලවුවට, ඔයාලා ක්‍රෝනොස්ගේ බල ඇණි ඔක්කොම මැන්හැටන්වලින් ඈත් කරලා තියාගන්න ඕනෑ."

"ඔහ්, කොල්ලෝ," සෑන්ඩ් ඩොලරයට අත දිගු කරමින් හඩ්සන් නාහෙන් ඇඬුවා. "මම අන්තිමට පිරිසිදුව හිටියේ කොච්චර කාලෙකට කලින් ද."

"පොසෙයිඩන්ගේ බලය," නැගෙනහිර ගඟ මිමිණුවා. "එයා නරුමයෙක් වුණාට අපිරිසිදුකම සුද්ධ කරලා දාන හැටි ටක්කෙට ම දන්නවා."

එකිනෙකා දිහා බැලූ එයාලා, එකවිට ම කතා කළා: "අපි කැමතියි."

මම දුන් සෑන්ඩ් ඩොලර් බාග එයාලා භක්තිමත්ව අතට ගත්තා.

"මේ, ආක්‍රමණකාරයෝ?" මම සිහි කළා.

නැගෙනහිර එයාගේ අතක් වැනුවා. "ඔන්න උන් ගිලුණා."

හඩ්සන් අසුරක් ගැසුවා. "යම බල්ලෝ රෑනක් මේ දැන් දියබත් වුණා."

Scanned with CamScanner

"ස්තූතියි," මම කිවුවා. "පිරිසිදුව ඉන්න."

මම වතුර මතුපිටට නැගෙද්දී, නැගෙනහිර අඬ ගැසුවා, ''හේයි, ළමයා, ඔයාට වියදම් කරන්න සැන්ඩ් ඩොලරයක් ලැබිච්ච ඕනෑ වෙලාවක ආපහු මේ පැත්තෙ ඇවිල්ලා යන්න. පණ පිටින් හිටියොත්."

"අකිලිස්ගේ ශාපය," හඩ්සන් නහයෙන් පිම්බා. "එයාලා හැම වෙලාවෙ ම හිතන්නේ ඒක එයාලව බේරයි කියලා, හා නැද්ද?"

"එයාලා ඇත්ත දන්නවා නම්," නැගෙනහිර එකඟ වුණා. ඒ දෙන්නා මහ හඬින් හිනා වෙමින් වතුරේ දිය වී ගියා.

★★★

මම වැල්ලට ගොඩ වෙද්දී, ඇනබෙත් එයාගේ ජංගම දුරකථනයෙන් කතා කරමින් සිටියා. ඒත් මාව දැකපු හැටියේ එයා ඇමතුම විසන්ධි කළා. එයා හිටියේ සෑහෙන කම්පනයකින් වගෙයි.

"ඒක වැඩ කළා," මම කිවුවා. "ගඟවල් දෙක පරිස්සම්."

"ඒක හොඳයි," එයා කිවුවා. "මොකද, දැන් අපිට තවත් ප්‍රශ්නයක් ඇවිල්ලා. දැන් මයිකල් යෙව් කතා කරා. විලියම්ස්බර්ග් පාලමෙන් තවත් හමුදාවක් එනවලු. ඇපලෝ කැබින් එකට උදවු ඕනෑ. තව.. පර්සි, හතුරන්ව මෙහෙයවන්නේ... මිනටෝර්ලු."

# 11

# අපි පාලමක් විනාශ කළා

වාසනාවට, බ්ලැක්ජැක් හිටියේ 'ඔන් ඩියුටි.'

මම මගේ හොඳ ම කුලී රිය-කැඳවන උරුවම් බෑම කළා. විනාඩි කීපයක් යන්න කලින් ම අඳුරු රූප දෙකක් රවුමට කැරකෙමින් අහසින් පහළට බහින්න ගත්තා. මුල දී උකුස්සෝ වගේ පෙනුණත්, එයාලා පහළට එද්දී පෙගසිලාගේ දිගු, පිමි පතින කකුල් දැකගන්න මට හැකි වුණා.

යෝ, බොස්. ගොඩබෑව හැටියේ ම හැල්මේ දුව ආ බ්ලැක්ජැක් එක්ක ම එයාගේ යාළුවා පෝක්පීත් ආවා. කොල්ලෝ, මං හිතුවෙ අර හුළං දෙයියෝ අපිව පෙනිසිල්වේනියාවට ම තල්ලු කරලා දායි කියලා. අපි ඔයාලගෙ පැත්තෙ කිවුවට පස්සෙයි අපිට යන්න දුන්නේ!

"ආවට ස්තූතියි," මම එයාට කිවුවා. "මේ, ඒක නෙවෙයි, පෙගසිලා පියාඹද්දී, පිමි පනින්නෙ ඇයි?"

බ්ලැක්ජැක් හේෂාරාවය කළා. මිනිස්සු ඇවිදිනකොට අත් දෙක වනන්නෙ ඇයි? මං දන්නෑ, බොස්. ඒක ඉබේ ම වෙනවා. කොහෙටද යන්නෙ?

"අපිට විලියම්ස්බර්ග් පාලම ළඟට යන්න ඕනෑ," මම කිවුවා.

බ්ලැක්ජැක් බෙල්ල පහත් කළා. ඔයා වක්කෙට ම හරි, බොස්. අපි ආවේ එතැන පහු කරගෙන. ඇත්තටම එතැන පෙනුම ඒ හැටි හොඳ නෑ. පිටට පනින්ඩ!

Scanned with CamScanner

★★★

පාලම වෙතට යන මඟ දී, මගේ බඩ ඇතුළේ ගැටයක් ගැහෙනවා වගේ මට දැනෙන්න ගත්තා. මිනටෝර් කියන්නේ මම මුලින් ම පරාජය කරපු රාක්ෂයින්ගෙන් එකෙක්. අවුරුදු හතරකට කලින් අර්ධ-ලෝහිත කන්ද මුඳුනේ දී ඒකා මගේ අම්මව මරන්න ගියා. මට තවමත් ඒ ගැන නරක හීන පෙනුණා.

ඒකා තව අවුරුදු තුන් හාරසීයක්වත් මැරිච්ච විදිහට ම ඉඳීවි කියලයි මම හිතාගෙන හිටියේ. ඒ වුණත් මට ඒ තරම් වාසනාවක් නැති බව මම කලින් ම තේරුම් ගන්නයි තිබුණේ.

සටන්කරුවන් වෙන්කර හඳුනා ගන්න තරම් ළං වෙන්නත් කලින් ම අපිට සටන දැකගන්න ලැබුණා. දැන් රෑ මැදියමත් පසු වී බොහෝ වේලාවක් වුණත්, පාලම එළිවලින් බැබළෙමින් තිබුණා. තැන තැන කාර් ගිනි ගත්තා. ගුවන හරහා පියඹා යන ගිනි දැල්වූ ඊතල සහ හෙලිවලින් දෙපස ම ගිනි චාප ඇඳුණා.

අපි ගොඩ බැසීමට පහළට එද්දි ඇපලෝ කඳවුරුකරුවන් පහු බහිනවා මට පෙනුණා. මහ මඟ ඇති කාර් පිටුපස සැඟවෙන එයාලා ළං වෙන සතුරු හමුදාවට විදිමින්, පුපුරා යන ඊතල සහ කැල්ට්‍රොප් (යුද්ධයට ගමන් කරන සතුන්ගේ පාදවල ඇනී වේගය අඩාළ කිරීම සඳහා පොළොව මත විසුරුවන කුඩා උල් විශේෂයක්.) පාර පුරා විසුරුවමින්, ඉඩ ලැබෙන සෑම තැනක ම ගිනිගෙන දැවෙන බාධක ඉදි කරමින් සහ වාහන තුළ නිදා සිටින රියැදුරන්ට උපද්‍රවයක් නොවෙන්න ඉවතට ඇදගෙන යමින් සිටියා. ඒත් හතුරන් නොනැවතී ඉදිරියට ආවා. මුළුමනින් ම ඩ්‍රැකනෙයිලාගෙන් සැදුණු සෙබළ මුලක් පෙරමුණේ ආවේ එකිනෙකාගේ පලිහා එකට හිර කරගෙන, ඒවාට ඉහළින් හෙලි මානාගෙනයි. විටින් විට උන්ගේ සර්ප කඳන්වලට, බෙල්ලට හෝ සන්නාහයක ඇති සිදුරක් තුළට ඊතලයක් වැදී, සර්ප ...ැහැනුන්ගෙන් එකෙක් දෙන්නෙක් කුඩු වී ගියත්, ඇපලෝලාගේ ...තලවලින් වැඩි ප්‍රමාණයක් කිසිම හානියක් නොකර උන්ගේ පලිහවල වැදී ඉටතට විසි වුණා. උන්ට පිටුපසින් තවත් රාක්ෂයෝ සියයක් විතර පෙළපාළියේ ආවා.

විටින් විට යම බල්ලෝ පේළියෙන් බිඳී ඉදිරියට දුව ආවා. උන්ගෙන් වැඩි දෙනෙක්ව ඊතලවලින් විනාශ කළත්, එකෙක් ඇපලෝ කඳවුරුකාරයෙක්ව ඩැහැගෙන, ඉවතට ඇදගෙන ගියා. ඊට පස්සේ



එයාට මොනවා වුණා ද කියලා මම දැක්කේ නැහැ. මට දැනගන්න ඕනෑ වුණෙත් නැහැ.

"අන්න!" ඇනබෙත් එයාගේ පෙගසිගේ පිට මත සිට පෙන්නුවා.

එයා කිවුවත් වගේ ම ආක්‍රමණ හමුදාව මැද සිටියේ නාකි ගොන්-ඔළුවායි.

මම කලින් වතාවේ දකිනකොට එයා ඇඳගෙන හිටියේ සුදු පාට හිර යට කලිසමක් විතරයි. ඒ ඇයි කියලා නම් මම දන්නෑ. සමහරවිට එදා එයා නිදාගෙන ඉන්නකොට කුද්දලා මගේ පස්සෙන් පන්නන්න එවන්න ඇති. මේ වතාවේ නම් එයා හිටියේ සටනකට සූදානමින්.

එයාගේ ඉණෙන් පහළ කොටස වැසී තිබුණේ නියම ග්‍රීක යුද ඇඳුමකින්- ඒක ලෝකඩ පෙති සහ ලෙදර්වලින් සැදූ කිල්ට් සායක් වගේ ඒප්‍රනයකින්, ලෝකඩ දෙපා ආවරණ සහ තදින් එතූ ලෙදර් සෙරෙප්පු දෙකකින් සමන්විතයි. එයාගේ උඩු කය නම් තනිකර ම ගොනෙක් වගෙයි- ලෝමවලින් සහ හමෙන් වැසුණු පේශි එයාගේ ඔළුව දක්වා ම පැතිරී තිබුණා. ඒ ඔළු ගෙඩිය කොච්චර ලොකුයි ද කියනවා නම්, එයාගෙ ම අං දෙකේ බරට එයාව බිමට ඇදගෙන නොවැටුණු එක ම පුදුමයක්. මට එයාව අන්තිමට දකින්න ලැබෙනකොට හිටියට වඩා එයා තවත් ලොකු වෙලා වගෙයි පෙනුණේ- දැන් එයා අඩු තරමේ අඩි දහයක්වත් උස ඇති. දෙපැත්ත කැපෙන පොරොවක් එයාගේ පිටේ ගැටගසා තිබුණත්, එයා හිටියේ ඒක පාවිච්චි කරන්න බැරි තරම් නොයිවසිල්ලෙනුයි. මම එයාගේ ඔළුවට ඉහළින් කැරකෙන බව දැකපු හැටියේ (නැත්නම් මගේ ඉව දැනුණු හැටියේ වෙන්න ඇති, මොකද එයාගේ ඇස් පෙනීම ඒ හැටි හොඳ නැහැ), ගර්ජනා කළ එයා සුදු පාට ලිමොසීනයක් ඔසවා ගත්තා.

"බ්ලැක්ජැක්, පාත් වෙන්න!" මම මොර දුන්නා.

"මොකක්?" පෙගසස් ඇසුවා. "ඒකාට බැහැ එහෙම... අස්ස කෑමවලට ම ඔප්පු වෙච්චාවේ!"

අපි හිටියේ අඩු තරමින් අඩි සියයක විතර උසකින් වුණත්, ටොන්-දෙකේ බූමරංගයක් වගේ කැරකෙමින් ලිමොසීනය අපි දිහාවට ඇදී ආවා.

ඇනබෙත් සහ පෝක්පි වියරුවෙන් වම් පැත්තට හැරෙද්දී, මාව පියාපත් අකුළාගත් බ්ලැක්ජැක් වේගයෙන් පහළට කිමිදුණා. මාව

★★★

පාලම වෙතට යන මඟ දී, මගේ බඩ ඇතුළේ ගැටයක් ගැහෙනවා වගේ මට දැනෙන්න ගත්තා. මිනටෝර් කියන්නේ මම මුලින් ම පරාජය කරපු රාක්ෂයින්ගෙන් එකෙක්. අවුරුදු හතරකට කලින් අර්ධ-ලෝහිත කන්ද මුදුනේ දී ඒකා මගේ අම්මව මරන්න ගියා. මට තවමත් ඒ ගැන තරක හීන පෙනුණා.

ඒකා තව අවුරුදු තුන් හාරසීයක්වත් මැරිච්ච විදිහට ම ඉදීවි කියලයි මම හිතාගෙන හිටියේ. ඒ වුණත් මට ඒ තරම් වාසනාවක් නැති බව මම කලින් ම තේරුම් ගන්නයි තිබුණේ.

සටන්කරුවන් වෙන්කර හඳුනා ගන්න තරම් ළං වෙන්නත් කලින් ම අපිට සටන දැකගන්න ලැබුණා. දැන් රෑ මැදියමත් පසු වී බොහෝ වේලාවක් වුණත්, පාලම එළිවලින් බැබළෙමින් තිබුණා. තැන තැන කාර් ගිනි ගත්තා. ගුවන හරහා පියඹා යන ගිනි දැල්වූ ඊතල සහ හෙලිවලින් දෙපස ම ගිනි චාප ඇඳුණා.

අපි ගොඩ බැසීමට පහළට එද්දි ඇපලෝ කඳවුරුකරුවන් පහු බහිනවා මට පෙනුණා. මහ මඟ ඇති කාර් පිටුපස සැඟවෙන එයාලා ළං වෙන සතුරු හමුදාවට විදිමින්, පුපුරා යන ඊතල සහ කැල්ට්‍රොප් (යුද්ධයට ගමන් කරන සතුන්ගේ පාදවල ඇනී වේගය අඩාළ කිරීම සඳහා පොළොව මත විසුරුවන කුඩා උල් විශේෂයක්.) පාර පුරා විසුරුවමින්, ඉඩ ලැබෙන සෑම තැනක ම ගිනිගෙන දැවෙන බාධක ඉදි කරමින් සහ වාහන තුළ නිදා සිටින රියැදුරන්ට උපද්‍රවයක් නොවෙන්න ඉවතට ඇදගෙන යමින් සිටියා. ඒත් හතුරන් නොනැවතී ඉදිරියට ආවා. මුළුමනින් ම ඩ්‍රැකනෙයිලාගෙන් සෑදුණු සෙබළ මුලක් පෙරමුණේ ආවේ එකිනෙකාගේ පලිහා එකට හිර කරගෙන, ඒවාට ඉහළින් හෙලි මානාගෙනයි. විටින් විට උන්ගේ සර්ප කඳන්වලට, බෙල්ලට හෝ සන්නාහයක ඇති සිදුරක් තුළට ඊතලයක් වැදී, සර්ප ගැහැනුන්ගෙන් එකෙක් දෙන්නෙක් කුඩු වී ගියත්, ඇපලෝලාගේ ඊතලවලින් වැඩි ප්‍රමාණයක් කිසිම හානියක් නොකර උන්ගේ පලිහවල වැදී ඉවතට විසි වුණා. උන්ට පිටුපසින් තවත් රාක්ෂයෝ සියයක් විතර පෙළපාළියේ ආවා.

විටින් විට යම බල්ලෝ පේළියෙන් බිඳී ඉදිරියට දුව ආවා. උන්ගෙන් වැඩි දෙනෙක්ව ඊතලවලින් විනාශ කළත්, එකෙක් ඇපලෝ කඳවුරුකාරයෙක්ව ඩැහැගෙන, ඉවතට ඇදගෙන ගියා. ඊට පස්සේ



එයාට මොනවා වුණා ද කියලා මම දැක්කේ නැහැ. මට දැනගන්න ඕනෑ වුණෙත් නැහැ.

"අන්න!" ඇනබෙත් එයාගේ පෙගසිගේ පිට මත සිට පෙන්නුවා.

එයා කිවුවත් වගේ ම ආක්‍රමණ හමුදාව මැද සිටියේ නාකි ගොන්-ඔළුවායි.

මම කලින් වතාවේ දකිනකොට එයා ඇඳගෙන හිටියේ සුදු පාට හිර යට කලිසමක් විතරයි. ඒ ඇයි කියලා නම් මම දන්නෑ. සමහරවිට එදා එයා නිදාගෙන ඉන්නකොට කුද්දලා මගේ පස්සෙන් පන්නන්න එවන්න ඇති. මේ වතාවේ නම් එයා හිටියේ සටනකට සූදානමින්.

එයාගේ ඉණෙන් පහළ කොටස වැසී තිබුණේ නියම ග්‍රීක යුද ඇඳුමකින්- ඒක ලෝකඩ පෙති සහ ලෙදර්වලින් සෑදූ කිල්ට් සායක් වගේ ඒප්‍රනයකින්, ලෝකඩ දෙපා ආවරණ සහ තදින් එතූ ලෙදර් සෙරෙප්පු දෙකකින් සමන්විතයි. එයාගේ උඩු කය නම් තනිකර ම ගොනෙක් වගෙයි- ලෝමවලින් සහ හමෙන් වැසුණු පේශි එයාගේ ඔළුව දක්වා ම පැතිරී තිබුණා. ඒ ඔළු ගෙඩිය කොච්චර ලොකුයි ද කියනවා නම්, එයාගෙ ම අං දෙකේ බරට එයාව බිමට ඇදගෙන නොවැටුණු එක ම පුදුමයක්. මට එයාව අන්තිමට දකින්න ලැබෙනකොට හිටියට වඩා එයා තවත් ලොකු වෙලා වගෙයි පෙනුණේ- දැන් එයා අඩු තරමේ අඩි දහයක්වත් උස ඇති. දෙපැත්ත කැපෙන පොරොවක් එයාගේ පිටේ ගැටගසා තිබුණත්, එයා හිටියේ ඒක පාවිච්චි කරන්න බැරි තරම් නොයිවසිල්ලෙනුයි. මම එයාගේ ඔළුවට ඉහළින් කැරකෙන බව දැකපු හැටියේ (නැත්නම් මගේ ඉව දැනුණු හැටියේ වෙන්න ඇති, මොකද එයාගේ ඇස් පෙනීම ඒ හැටි හොඳ නැහැ), ගර්ජනා කළ එයා සුදු පාට ලිමොසීනයක් ඔසවා ගත්තා.

"බ්ලැක්ජැක්, පාත් වෙන්න!" මම මොර දුන්නා.

''මොකක්?'' පෙගසස් ඇසුවා. ''ඒකාට බැහැ එහෙම... අස්ස කෑමවලට ම ඔප්පු වෙච්චාවේ!''

අපි හිටියේ අඩු තරමින් අඩි සියයක විතර උසකින් වුණත්, ටොන්-දෙකේ බූමරංගයක් වගේ කැරකෙමින් ලිමොසීනය අපි දිහාවට ඇදී ආවා.

ඇනබෙත් සහ පෝක්පී වියරුවෙන් වම් පැත්තට හැරෙද්දී, පියාපත් අකුළාගත් බ්ලැක්ජැක් වේගයෙන් පහළට කිමිදුණා. මාව

අඟල් දෙකකින් විතර මඟ අරිමින් ලිමෝසීනය මගේ ඔළුවට උඩින් පියඹා ගියා. පාලමේ අවලම්බිතයන් පසු කර ගිය එය නැගෙනහිර ගඟ දිහාවට වැටුණා.

රාක්ෂයින් ඔච්චම් කරමින් කෑගසද්දි මිනටෝර් තවත් කාරයක් ඔසවා ගත්තා.

"අපිව ඇපලෝ කැබින් එකේ අය ඉන්න තැනට දාන්න," මම කිවුවා. "මේ අනතුරු තියෙන හරියෙන් ඈත් වෙලා, හැබැයි ඇහෙන මානෙක ඉන්න!"

ඔයා කියන විදිහක්, බොස්!

කඳවුරුකරුවෝ දෙන්නෙක් සැඟවී සිටි, අනෙක් පැත්තට පෙරළුණු බසයක් පිටුපසට බ්ලැක්ජැක් වේගයෙන් ගොඩබෑවා. අපේ පෙගසිලාගේ කුර බිම වදිනවාත් සමඟ ම ඇනබෙත් සහ මම බිමට පැන්නා. ඊට පස්සේ බ්ලැක්ජැක් සහ පෝක්පී රෑ අහසට ඉගිලී ගියා.

මයිකල් යෙව් අපි ළඟට දුවගෙන ආවා. එකත් එකට ම මම මෙච්චර කාලෙකට දැකලා තියෙන කොට ම කොමාන්ඩෝ හටයා තමයි එයා. එයාගේ අතක වෙළුම් යෙදූ කැපුමක් තිබුණා. එයාගේ මුගටි මූණේ දූලි දුඹුටු වැකිලා, එයාගේ හී කොපුවත් මුළුමනින් ම වගේ හිස් වෙලා තිබුණා වුණත්, එයා හිනා වෙමින් හිටියේ කාලෙකට පස්සේ විනෝද වෙන්න ලැබිලා වගෙයි.

"ඔයාලා අපිට එකතු වෙන්න ආව එක කොච්චර හොඳ ද," එයා කිවුවා. "කෝ අනිත් උදවුකාරයෝ?"

"දැනට, අපි විතරයි," මම කිවුවා.

"එහෙනම් ඉතින් අපි මළා තමයි," එයා කිවුවා.

"ඔයා ළඟ තාමත් අර පියාඹන කරත්තෙ තියෙනව ද?" ඇනබෙත් ඇහුවා.

"නැහ්," මයිකල් කිවුවා. "ඒක කඳවුරේ දාලා ආවා. ඒක ගන්න කියලා මම ක්ලැරිස්ට කිවුවා. ඕනෑ එකක්, ඔයා දන්නව නේ? තවත් රණ්ඩු කරන්න තරම් ඒක වටින්නෙ නෑ. ඒත් එයා කිවුවා දැන් පරක්කු වැඩියිලු. අපි එයාගේ ගෞරවේට අපහාස කරා ද, මොකක්ද මන්දා කතාවක් කිවුවේ."

"අඩු ගාණේ ඔයා උත්සාහ කරා නේ," මම කිවුවා.



මයිකල් උරහිස් ඇකිළුවා. "ඔව්, මෙහෙමයි, ඊට පස්සෙත් එයා සටන් කරන්න එන්න බෑ කියද්දි මම එයාට ඕනෑ නැති නම් ටිකක් කිවුවා. ඒකෙන් උදවුවක් වුණා ද කියලා මට සැකයි. අන්න එනවා කැතයෝ!"

ඊතලයක් ඇද ගත් එයා ඒක හතුරා දෙසට දියත් කළා. ඊතලය වාතය කපාගෙන යද්දි බෙරිහන් දෙන හඬක් නැගුණා. බිම වැටුණු එය ලෝකේ ලොකු ම ස්පීකරයට සම්බන්ධ කරපු ඉලෙක්ට්‍රික් ගිටාරයක් වාදනය කරනවා වගේ මහා ශබ්දයක් මුදා හැරියා. ඒ ආසන්නයේ ම තිබුණු කාර් පුපුරා ගියා. අවි ආයුද බිම දැමූ රාක්ෂයෝ වේදනාවෙන් කන් වසා ගත්තා. සමහරු පැනලා දිවුවා. තවත් එවුන් හිටි තැන්වල ම කුඩු වුණා.

"ඒක තමයි මගේ ළඟ තිබුණ අන්තිම සොනික් ඊතලේ," මයිකල් කිවුවා.

"ඔයාගේ තාත්තගෙන් ලැබුණ තෑග්ගක් ද?" මම ඇහුවා. "සංගීතෙට අධිපතිගෙන්?"

මයිකල් අසත්පුරුෂ හිනාවක් පෑවා. "ඕනෑවට වඩා සද්දෙන් සංගීතෙ අහන එක අගුණ වෙන්න පුළුවන්. අවාසනාවකට, ඒකෙන් හැම වෙලාවෙ ම මැරෙන්නෙ නැහැ."

කිවුවත් වගේ ම, රාක්ෂයින්ගෙන් වැඩි දෙනෙක් කලබැගෑනිය පහ කරගෙන නැවත කල්ලි ගැහෙමින් සිටියා.

"අපිට පස්සට යන්න වෙනවා," මයිකල් කිවුවා. "මම පාලමේ පහළ කයිලාවයි ඔස්ටින්වයි උගුල් අටවන්න තියලා ආවෙ."

"නෑ," මම කිවුවා. "ඔයාගේ කඳවුරුකාරයින්ව මෙතැනට අරන් ඇවිල්ලා මගෙන් සංඥාවක් ලැබෙනකල් ඉන්න. අපි හතුරන්ව ආපහු බෲක්ලින්වලට ම පන්නලා දාන්නයි යන්නේ."

මයිකල් මහ හඬින් හිනා වුණා. "ඔයා කොහොමද ඒක කරන්න හදන්නේ?"

මම මගේ කඩුව ඇදලා ගත්තා.

"පර්සි," ඇනබෙත් කතා කළා, "මටත් ඔයා එක්ක එන්න ඉඩ දෙන්න."

"ඒක අනතුරුදායක වැඩියි," මම කිවුවා. "ඒ ඇරත්, ආරක්ෂක පේළි එකලස් කරන්න ඔයා මයිකල්ට උදවු කරන්න ඕනෑ. මම

රාක්ෂයින්ගේ අවධානේ ගන්නම්. ඔයාලා මෙතැන කණ්ඩායම් ගැහෙන්න. නිදාගෙන ඉන්න මිනිස්සුන්ව පාරෙන් අයින් කරන්න. ඊට පස්සේ ඔයාලට පුළුවන් මම රාක්ෂයින්ව මගේ දිහාවට හරවගෙන ඉන්න අතරේ, උන් එක එකාව බාවන්න. ඒ හැම දෙයක් ම කරන්න පුළුවන් කෙනෙක් ඉන්නවා නම්, ඒ තමයි ඔයා."

මයිකල් මහ හඬින් නහයෙන් පිම්බා. "බොහෝම ස්තුතියි."

මම ඇනබෙත්ගෙන් ඇස් ඉවතට ගත්තේ නැහැ.

එයා අකමැත්තෙන් වුණත් ඔළුව වැනුවා. "හරි එහෙනම්. දූත් යන්න."

මගේ ධෛර්යය නැති වෙන්න කලින් මම කතා කළා, "මට සුබ පතලා කිස් එකක්වත් දෙන්නැද්ද? ඒක නේද සිරිත?"

එයා මට ගහයි කියලයි මම හිතුවේ. ඒත් ඒ වෙනුවට, කිණිස්ස ඇදලා ගත්ත එයා අපි දිහාවට ගමනේ එන හතුරෝ දිහා බලා සිටියා. "පණ පිටින් ආපහු එන්නකෝ, පාසි මොළේ. ඊට පස්සේ අපි බලමු."

ඊට වඩා හොඳ යෝජනාවක් මට නොලැබෙන බව දන්න නිසා මම පාසැල් බසය පිටුපසින් ඉවතට අඩිය තැබුවා. හතුරන්ට මාව හොඳින් පෙනෙන විදිහට මම එක එල්ලේ ඉදිරියට ගියා.

★★★

මාව දැක්කා ම මිනටෝර්ගේ ඇස් වෛරයෙන් දැවෙන්න ගත්තා. එයා නැගූ ගර්ජනාවේ තිබුණේ මොර දීමක්, උම්බෑ ගෑමක් සහ මහ හඬින් රාමතෙල් පිට කිරීමක් අතර හඬක්.

"හේයි, බිං හරකා," මමත් කෑගැහුවා. "මම එක සැරේකුත් ඔහේව මැරුවා නේද?"

එයා ලෙක්සස් කාරයක වහලයට මිටි කරගත් අතින් ගැසුවා ම, ඒක ඇලුමිනියම් දවටනයක් වගේ පොඩි වුණා.

ඩ්‍රැකනෙයිලා කීප දෙනෙක් දැවෙන හෙලිවලින් මට දමා ගැහුවා. මම ඒවාට ගසා පැත්තකට දැමුවා. යම බල්ලෙක් මාව හපා කන්න පනිද්දී මම ඌව මඟ අරිමින් පැත්තකට වුණා. ඌට අනින්න හොඳට ම ඉඩ තිබුණා වුණත් මම පැකිළුණා.

මේ මිසිස් ඕ'ලෙරී නෙවෙයි, මම මට ම මතක් කරලා දුන්නා. මේ ඉන්නේ හීලෑ නැති රාක්ෂයෙක්. ඌ මාවයි මගේ යාළුවෝ ඔක්කෝමයි මරලා දායි.



ඌ ආයෙමත් මගේ ඇඟට පැන්නා. මේ වතාවේ මම රිප්ටයිඩ් ඉහළට ඔසවා මාරාන්තික පහරක් ගැසුවා. යම බල්ලාව දූවිලි සහ ලොම් ගොඩකට කුඩු වුණා.

තව තවත් රාක්ෂයෝ රැල්ලක් වගේ ඉදිරියට ආවා- සර්පයෝ, යෝධයෝ සහ ටෙලිකීන්ලා- ඒත් මිනටෝර් උන්ට ගර්ජනා කළා ම, උන් පසු බැස්සා.

"එකාට එකා ද?" මම ඇහුවා. "හරියට ඉස්සර වගේ?"

මිනටෝර්ගේ නාස් පුඩු පොපියන්න ගත්තා. එයා සන්නාහයේ සාක්කුවක ලේන්සුවක් තියාගන්න පුරුදු වුණොත් හොඳයි කියලා මට හිතුණේ එයාගේ අර නහය රතු වෙලා, තෙත් වෙලා, බලන්න අප්පිරියා හිතෙන විදිහට තිබුණ නිසයි. පොරොව ගලවා ගත් එයා ඒක වටේට කරකවන්න ගත්තා.

එයා ඒක කළේ මම-උඹව-මාළුවෙක්-වගේ-හම-ගහනවා කියන්න වගේ බිහිසුණු ලෙස සුන්දර විදියකටයි. පොරොවේ දෙබිඩි තල දෙක ග්‍රීක හෝඩියේ අන්තිම අකුරː (ඔමේගා) හැඩයට හැඩ කර තිබුණා. සමහරවිට ඒ එයාට ගොදුරු වෙන අයට දකින්න ලැබෙන අන්තිම දේ ඒ පොරොව නිසා වෙන්න ඇති. ලෝකඩින් සාදා වටේට ලෙදර් ඔතා තිබුණු එහි මිට මිනටෝර් තරමට ම උසයි. පොරෝ තල දෙක පාමුල පබළු මාල ගොඩක් ඔතා තිබුණා. ඒවා පරාද වුණ උප දෙවිවරුන්ගෙන් ගලවා ගත් අර්ධ-ලෝහිත කඳවුරු මාල බව මට තේරුම් ගියා.

මම කොයි තරම් කේන්තියෙන් වියරු වැටුණා ද කියනවා නම් මගේ ඇස් දෙකත් මිනටෝර්ගේ වගේ දිලිසෙනවා ඇති කියලා මට හිතුණා. මම මගේ කඩුව එසෙව්වා. රාක්ෂ හමුදාව මිනටෝර්ට ජයඝෝෂා කරන්න ගත්තා, ඒත් එයාගේ පළවෙනි පහර මඟ ඇරපු මම, එයා පොරොව අල්ලගෙන හිටපු තැනින් දෙකට කපා දැමුවා ම උන්ගේ ඝෝෂාව නැවතුණා.

"උම්බෑෑ?" එයා ගෙරෙව්වා.

"හා...!!!" වේගයෙන් කැරකුණු මම එයාගේ හොම්බ මැදට පයින් ගැහුවා. කකුල් පැකිළෙමින් ආපස්සට විසි වුණ එයා, නොවැටී ඉන්න උත්සාහ කළා. ඊට පස්සේ එයා හිස පහත් කරගත්තේ පහර දෙන්න සූදානමෙනුයි.

ඒත් එයාට ඒකට ඉඩක් ලැබුණේ නැහැ. විදුලි වේගයෙන් ඇදී ගිය මගේ කඩුව එයාගේ එක අඟකුත්, ඉන්පසු අනෙකත් කපා දැමුවා. එයා මාව ඩැහැ ගන්න උත්සාහ කරද්දී මම ඉවතට පෙරළුණේ එයාගේ කැඩුණු පොරෝ කෙටියත් අහුලාගෙනමයි. පුදුමයෙන් නිහඬ වූ අනෙක් රාක්ෂයෝ අපි වටා රවුමක් සාදමින් පසු බැස්සා. මිනටෝර් වියරුවෙන් ගර්ජනා කළා. කොහොමටත් වැඩිය මොළේ ඇති කෙනෙක් නොවුණ එයාව දැන් කේන්තිය විසින් ඔලමොට්ටලයෙක් බවට පත් කර තිබුණා. එයා මට පහර දෙන්න දුවගෙන එද්දී, මම ඩ්‍රැකනෙයි ජේළියක් බිඳගෙන පාලම අද්දරට දිවුවා.

එයා දිනුවා කියලා මිනටෝර් හිතන්න ඇති. එයා හිතුවේ මම පැනලා දුවන්න හදනවා කියලයි. එයාගේ ගෝල බාලයෝ ප්‍රීති ඝෝෂා කළා. පාලමේ ගැටිය ළඟ දී ආපසු හැරුණ මම පොරොව අත් වැටට තෙරපාගෙන එයාගේ පහර දරාගන්න සූදානම් වුණා. මිනටෝර් අඩු තරමේ වේගය අඩු කර ගත්තේවත් නැහැ.

ක්‍රන්ච්!!!

තමන්ගේ උර තහඩුවෙන් එළියට පැන ඇති පොරෝ මිට දිහා එයා පුදුමයෙන් බැලුවා.

"සෙල්ලම් කරන්න ආවට ස්තූතියි," මම එයාට කිවුවා.

එයාව කකුල් දෙකෙන් එසවූ මම පාලමෙන් එහා පැත්තට විසි කළා. පහළට වැටෙන අතරේ ම එයාව කුඩු වෙලා දූවිලිවලට හැරුණේ, එයාගේ සාරය ආපසු ටාටරස්වලට පිටුවහල් කරමින්.

මම එයාගේ හමුදාව වෙතට හැරුණා. දැන් මට විරුද්ධව එතැන හිටියේ දළ වශයෙන් එකසිය අනූ නමදෙනෙක් විතර වගෙයි. ඒ වගේ වෙලාවකට ඉබේ ම සිද්ධ වෙන දේ මම කළා. මම උන්ට පහර දෙන්න පැන්නා.

***

දැන් ඔයා අහයි මගේ 'පරාජය කරන්න බැරි ශක්තිය' වැඩ කරේ කොහොමද කියලා: මම මැජික් බලේකින් වගේ මට එල්ල වුණ හැම ආයුදයක් ම මඟ ඇරියා ද, එහෙමත් නැත්නම් ආයුද මගේ වැදුණත් මට කිසිම තුවාලයක් වුණේ නැද්ද. අවංකව ම කියනවා නම්, මට මතක නැහැ. මම දැන සිටි එක ම දේ වුණේ මේ රාක්ෂ සේනාවට මගේ නගරයට පය තියන්න මම ඉඩ දෙන්න සූදානම් නැති බව විතරයි.



මම ලෝකඩ සන්නාහ කඩදාසිවලින් සෑදූ ඒවා වගේ කපා දැමුවා. සර්ප ගැහැනු පුපුරා ගියා. යම බල්ලෝ හෙවණැලිවලට දිය වුණා. මම පෙති ගහමින්, අනිමින්, සුළියක වේගයෙන් කැරකුණා. මං හිතන්නේ මම සැරයක් දෙකක් විතර මහ හඬින් හිනා වුණා- ඒක මගේ හතුරන්ව වගේම මාවත් බය ගන්වන විදිහේ පිස්සු හිනාවක්. මට පිටුපසින් සිටි ඇපලෝ කඳවුරුකරුවෝ හතුරන් නැවත එක්රැස් වීමට ගත් සෑම වෑයමක් ම කඩාකප්පල් කරමින් ඊතල විදින බව මම දැන සිටියා. අන්තිමේ දී, රාක්ෂයෝ දෙසිය දෙනෙකුගෙන් ඉතිරි වූ විසි දෙනෙක් විතර ආපසු හැරී පලා ගියා.

මම උන්ව ලුහුබැඳ යද්දී ඇපලෝ කඳවුරුකරුවෝත් මගේ පස්සෙන් දුවගෙන ආවා.

"නියමයි!" මයිකල් යෙව් මොර දුන්නා. "අන්න ඒක තමයි මම කිවුවේ!"

අපි උන්ව පාලමේ බෲක්ලින් පැත්තටම පන්නා දැමුවා. ඒ වෙද්දී පෙරදිග අහස යාන්තමින් එළිය වැටෙන්න පටන්ගෙනයි තිබුණේ.

"පර්සී!" ඇනබෙත් මොර ගැසුවා. "ඔයා දැනටමත් උන්ව පන්නලා ඉවරයි. ආපහු එන්න! අපි ඕනෑවට වඩා ඈතට යනවා!"

එයා කියන කතාව හරි කියලා මගේ හිතේ පැත්තක් දැන සිටියා, ඒ වුණත් මම කොයි තරම් හොඳින් මෙය කරමින් සිටියා ද කියනවා නම්, මට ඕනෑ වුණේ රාක්ෂයෝ එකෙක් නෑර විනාශ කරන්නයි.

ඒ වෙලාවේ පාලම පාමුල රැස්ව සිටි සෙනඟක් මම දැක්කා. පහු බහින රාක්ෂයෝ කෙලින් ම දුවගෙන ගියේ උන්ගේ උපකාරක සේවාව වෙතටයි. එතැන හිටියේ ඇටසැකිලි අශ්වයෝ මත නැඟි, යුද සන්නාහයෙන් සැරසුණු උප දෙවිවරු තිහක හෝ හතළිහක විතර පොඩි කණ්ඩායමක්. එයින් එක්කෙනෙක් කළු දෑකැත්තක සලකුණ ඇති දම් පාට කොඩිය ඔසවාගෙන සිටියා.

පෙරමුණේ සිටි අශ්වාරෝහකයා ඉදිරියට ඇවිත් යුද හිස්වැසුම ගැලෙව්වා. එතැන හිටියේ උණු කළ රත්තරන්වල පාට ඇස් දෙකක් ඇති ක්‍රෝනොස්.

ඇනබෙත් සහ ඇපලෝ කඳවුරුකරුවෝ හිටිවන ම නැවතුණා. අපි ලුහුබැඳගෙන ආව රාක්ෂයෝ අලුත් ටයිටන් බලකායට එකතු වුණා. ක්‍රෝනොස් අපි දිහා ඕනෑකමින් බලා සිටියා. එයා හිටියේ හැතැප්ම

Scanned with CamScanner

කාලක් විතර ඇතින් වුණත්, එයාගේ හිනාව මට පෙනුණු බව දිවුරන්න වුණත් පුළුවන්.

"දැන්," මම කිවුවා, "අපි ආපහු හැරෙමු."

කඩු ඇදගත් ටයිටන් රජාගේ මිනිස්සු පහර දෙන්න ආවා. එයාලගේ ඇටසැකිලි අශ්වයින්ගේ කුර පදික වේදිකාවේ ගැටී හෙණ හඬ නැගුවා. අපේ දුනුවායෝ ඊතල මුරයක් විදලා, සතුරන් කීප දෙනෙක්ව ම බිම දැමුවත්, ඉතිරි අය නොනැවතී ඉදිරියට ආවා.

"පහු බහින්න!" මම මගේ යාළුවන්ට කිවුවා. "මම එයාලව නවත්ත ගන්නම්."

තත්පර ගාණක් යන්න කලින් උන් මගේ උඩට පාත් වුණා.

මයිකල් සහ එයාගේ දුනුවායෝ පහු බහින්න උත්සාහ කළත්, ඇනබෙත් එයාගේ කිණිස්සෙන් සහ ඔප දැමූ පලිහෙන් සටන් කරමින් මගේ ළඟින් ම රැඳුණා.

ක්‍රෝනොස්ගේ අශ්වාරෝහක සේනාව කඩුවලින් පහර දෙමින් සහ නොසරුප් වචන මොර ගසමින් අපි වටා කැරකුණා. ටයිටන් රජා කලබලයක් නැතිව නිවාඩු පාඩුවේ ඉදිරියට ආවේ හරියට එයාට ඇති තරම් වෙලාව තියෙනවා වගෙයි. කාලයට අධිපති වුණා ම, මං හිතන්නේ ඇත්තට ම එයාට එහෙම ඇති.

මම උත්සාහ කළේ එයාගේ මිනිසුන්ව නොමරා, තුවාල විතරක් කරන්නයි. එයින් මගේ වේගය ගොඩාක් අඩු වුණා. ඒත් මේ ඉන්නේ රාක්ෂයෝ නෙවෙයි. එයාලා ක්‍රෝනොස්ගේ වශියට හසු වුණ උප දෙවිවරු විතරයි. යුද හිස්වැසුම්වලට යටින් තිබුණු එයාලගේ මුහුණු දැකගන්න මට හැකියාවක් නැති වුණත්, එයාලගෙන් සමහරු මගේ යාළුවෝ වෙලා ඉන්න ඇති කියලා මම හිතුවා. එයාලගේ අශ්වයින්ගේ කකුල් කපා දැමූ මම ඇටසැකිලි සතුන්ව කුඩු වී යන්න සැලැස්වූවා. මුල් ම උප දෙවිවරු ටික බිම වැටුණට පස්සේ, තමනුත් අශ්වයින් පිටින් බිමට බැහැලා, මාත් එක්ක සටන් කරන එක වඩාත් හොඳයි කියලා ඉතිරි අය තේරුම් ගත්තා.

ඇනබෙත් සහ මම පිටට-පිට දී ප්‍රතිවිරුද්ධ පැති දෙකට මුහුණලා සිටියා. එක්වර ම අඳුරු රූපයක් මට ඉහළින් යද්දී, මම ඒ දිහාවට බැල්මක් හෙලන්න අවදානම ගත්තා. බ්ලැක්ජැක් සහ පෝක්පී වේගයෙන් පහළ බසිමින්, අපේ හතුරන්ගේ හෙල්මට්වලට පයින් ගසා,



නැවත ඉවතට පියාඹා යමින් සිටියේ හරියට අති විශාල අන්තරායකාරී පරෙවියෝ වගෙයි.

අපි හෙමින් හෙමින් පසු බසිමින් පාලම මැදට ම වගේ ගියාට පස්සේ මොකක්දෝ අමුතු දෙයක් සිද්ධ වුණා. මගේ කොඳු ඇට පේළිය පහළට හිරියක් පැතිරුණා. මට පිටුපසින් සිටි ඇනබෙත් වේදනාවෙන් කෑගැසුවා.

"ඇනබෙත්!" හැරී බැලූ මට දකින්න ලැබුණේ එයා අතක් තදින් අල්ලගෙන ඇද වැටෙනවායි. ලේ වැකුණු කිණිස්සක් අත දරාගෙන උප දෙවියෙක් එයාට උඩින් සිටගෙන සිටියා.

සිදු වී ඇති දේ ඇසිල්ලකින් මට තේරුණා. එයා උත්සාහ කර ඇත්තේ මට අනින්නයි. එයාගේ කිණිසි තලය තිබුණු තැන හා ඉරියව්ව සමඟ බලද්දී, අහම්බයකින් හෝ එයා උත්සාහ කර ඇත්තේ මගේ කොන්ද මැදට- මගේ එකම දුර්වල තැනට අනින්නයි.

ඇනබෙත් කිණිසි පහර මට වැදීම වළකන්න පාවිච්චි කරලා තිබුණේ එයාගේ ම ඇඟයි.

ඒත් ඇයි? මගේ දුර්වල තැන ගැන එයා දැන සිටියේ නැහැ. කිසිම කෙනෙක් දැන සිටියේ නැහැ.

මම සතුරු උප දෙවියාගේ ඇස් දිහා බැලුවා. එයා යුද හිස්වැසුමට යටින් එක ඇසක් රෙදි කඩකින් වසාගෙනයි සිටියේ: ඊතන් නකමුරා, නෙමෙසිස්ගේ පුතා. ඒ කියන්නේ එයා කොහොම හරි ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩාවේ පිපුරුමෙන් පණ බේරගෙන. මම මගේ කඩු මිටෙන් එයාගේ මූණට ගැසූ පහරට එයාගේ හිස්වැසුම ඇඹුණා.

"පස්සට යනවා!" මම කඩුව වටේට කරකවමින්, ඉතිරි උප දෙවිවරුන්ව ඇනබෙත්ගෙන් ඉවතට පළවා හැරියා. "එයාට අත තිබ්බොත් බලාගෙනයි!"

"මාරයි නේ," ක්‍රෝනොස් කිවුවා.

එක අතකින් දෑකැත්ත ගෙන, ඇටසැකිලි අසු පිට නැගී සිටි එයා මට ඉහළින් පාත් වුණා. එයා ඇස් හීනි කරගෙන අපි දිහා බලා සිටියේ හරියට වෘකයින්ට ගීතියේ ඉව දැනෙනවා වගේ එයාටත් මම මේ දැන් මරණයට ළං වූ බව දැනෙනවා වගෙයි.

"නිර්භීත සටනක්, පර්සි ජැක්සන්," එයා කිවුවා. "ඒත් දැන් යටත් වෙන්න වෙලාව ඇවිල්ලා... නැත්නම් කෙල්ලට මැරෙන්න වෙයි."

"පර්සි, එපා." ඇනබෙත් කෙඳිරි ගෑවා. එයාගේ කමිසය ලෙයින් පෙඟිලා. එයාව ඉක්මනින් මෙතැනින් පිටමං කළ යුතුව තිබුණා.

"බ්ලැක්ජැක්!" මම මොර ගැසුවා.

ආලෝකයේ වේගයෙන් පහත බැස්ස පෙගසස් ඇනබෙත්ගේ සන්නාහයේ පටි දත්වලින් ඩැහැගත්තා. හතුරන්ට ප්‍රතික්‍රියා දක්වන්න ඉඩක් ලැබෙන්නත් කලින් ඒ දෙන්නා ගඟට උඩින් පියඹා ගියා.

ක්‍රෝනොස් දත් විලිස්සා ගෙරෙව්වා. "ළඟදි ම දවසක මම පෙගසස් සුප් එකක් හදනවා. ඒත් එතකල්..." එයා අසු පිටින් බසිද්දි එයාගේ දෑකැත්තට අරුණෝදය වැදී දිස්න දුන්නා. "මම තව උප දෙවියෙක්ගේ මරණෙකින් සෑහෙන්නම්."

මම එයාගේ මුල් ම පහර රිප්ටයිඩ්ගෙන් හරස් කළා. තල දෙකේ ගැටුමෙන් මුළු පාලම ම කම්පා වුණත් මම නොසැලී ඉන්නවා දකිද්දි ක්‍රෝනොස්ගේ හිනාව දෙගිඩියාවෙන් වැනුණා.

මොර දීමක් සමඟ, එයාගේ දෙපයට මම ගැසූ පයින් පාරට එයාව බිමට ඇද වැටුණා. එයාගේ දෑකැත්ත පදික වේදිකාවේ ඈතට විසි වුණා. මම කඩුවෙන් පහළට කෙටුවත් එය මඟ අරිමින් පැත්තකට පෙරළුණු එයා නැවත සිටගත්තා. දෑකැත්ත ආපසු එයාගේ අතට පියඹා ආවා.

"එහෙනම්..." එයා මගේ දිහා බලා සිටියේ යාන්තමින් තරහා ගිහිල්ලා වගෙයි. "ස්ටයික්ස් ගඟට යන්න තරම් ධෛර්යයක් නුඹට තිබුණා. ලූක්ව ඒකට නම්මා ගන්න මට කොයි තරම් දේවල් කියලා බල කරන්න සිද්ධ වුණා ද. මගේ ධාරක සිරුර සපයන කෙනා එයා නොවී නුඹ වුණා නම්... ඒත් ඒකෙන් කමක් නෑ. මම තවමත් ගොඩක් බලවත්. මම ටයිටන් කෙනෙක්."

එයා දෑකැත්තේ මිට අගින් පාලමට පහරක් ගැසුවා ම, පැතිරී ගිය තනි ශක්ති තරංගයෙන් මාව ආපස්සට විසිවුණා. වාහන පැත්තකට ඇල වුණා. උප දෙවිවරු- ලූක්ගේ ම මිනිස්සු පවා- පාලම අද්දරට විසි වුණා. පාලමේ අවලම්බිත රැහැන් ඉහළ පහළ වැනෙද්දි, මාව මෑන්හැටන්වලට අඩ දුරක් විසි වුණා.

මම සැලෙමින් දෙපයින් හිටගත්තා. මයිකල් යෙව් හැර ඉතිරි ඇපලෝ කඳවුරුකරුවෝ දූන් පාලම කෙළවරට ම වගේ ගිහින් හිටියා. මට යාර කීපයක් ඈතින් අවලම්බිත කම්බියක් මතට නැග සිටි මයිකල් එයාගේ දුන්නට අන්තිම ඊතලය අමුණාගෙන සිටියා.



"මයිකල්, යනවා!" මම බෙරිහන් දුන්නා.

"පර්සී, පාලම!" එයා කිවුවා. "ඒක දැනටමත් අබලන්!"

මුල දී මට එයා කී දේ තේරුනේ නැහැ. ඊට පස්සේ බිම බැලූ මට පදික වේදිකාව මත ඇති වී තිබුණු පැළුම් දකින්න ලැබුණා. පාරේ පදාස පිටින් ග්‍රීක ගින්දරට උණු වෙලා. ක්‍රෝනොස් ඇති කළ පිපුරුමෙන් සහ පුපුරන ඊතලවල පහරින් පාලමට හානි වෙලයි තිබුණේ.

"ඒක කඩලා දාන්න!" මයිකල් මොර දුන්නා. "ඔයාගේ බලේ පාවිච්චි කරන්න!"

ඒක නම් බලාපොරොත්තු තියන්න බැරි දෙයක්- ඒක හරියන්න කොහෙත්ම ඉඩක් නැහැ- ඒ වුණත් මම රිප්ටයිඩ් පාලම තුළට ඇන්නා. මායා කඩු තලය මිට දක්වා ම ගල් තාර තුළට කිඳා බැස්සා. එයින් ඇති වූ පැළුම තුළින් කරදිය ඉහළට විදින්න ගත්තේ මම දිය උල්පතකට පහර දුන්නා වගෙයි. මම මගේ කඩු තලය ඉවතට ඇද ගනිද්දී පැළුම වර්ධනය වුණා. කම්පනය වූ පාලම කැලිවලට කැඩෙන්න පටන් ගත්තා. නිවාස තරම් ලොකු කැබලි නැගෙනහිර ගඟට කඩා වැටුණා. තැති ගෙන කෑගැසූ ක්‍රෝනොස්ගේ උප දෙවිවරු ආපස්සට බඩගෑවා. සමහරුන්ව ඇදගෙන වැටුණා. තත්පර ගාණක් තුළ දී විලියම්ස්බර්ග් පාලමේ ක්‍රෝනොස් සහ මම අතර අඩි පනහක් පළල විවරයක් ඇති වුණා.

කම්පනය නැවතුණා ම, කෙළවරට බඩගා ආව ක්‍රෝනොස්ගේ මිනිස්සු අඩි එකසිය තිහක් පහළින් වූ ගඟට එබිලා බැලුවා.

ඒ වුණත් මට ආරක්ෂිත බවක් නම් දැනුනේ නැහැ. පාලමේ අවලම්බිත කම්බි තවමත් තිබුණේ ඈමිණිලායි. නිර්භීතකමක් තියෙනවා නම් ක්‍රෝනොස්ගේ හෙංචයියන්ට ඒවා දිගේ එන්න පුළුවන්කම තිබුණා. එහෙමත් නැත්නම් හිඩැස උඩින් පනින්න ක්‍රෝනොස් ළඟ මැජික් ක්‍රමයක් තියෙන්නත් පුළුවන්.

ටයිටන් රජා මේ ගැටළුව අධ්‍යයනය කළා. පිටුපසින් පායා එමින් තිබුණු ඉර දිහා බැලූ එයා ඊට පස්සේ ආගාධය හරහා මට හිනා වුණා. එයා දෑකැත්ත ඔසවා සමච්චලේට ආචාර කළා. "අද හවස් වෙනකල්, ජැක්සන්."

අසු පිට නැගුණු එයා වේගයෙන් අනෙක් පැත්තට හැරී බෑංක්ලින් පැත්තට හැල්මේ යද්දී, එයාගේ යුද හටයෝ එයා පසුපස ගියා.

මයිකල් යෙව්ට ස්තුති කරන්න හිතාගෙන මම හැරුණත්, ස්තුතිය මගේ උගුරේ දී ම මියැදුණා. අඩි විස්සක් දුරින් පාර මත දුන්නක් වැටී තිබුණා. ඒත් එහි අයිතිකාරයා පෙනෙන මානයක හිටියේ නැහැ.

"නෑ!" මම පාලමේ මගේ පැත්තේ තිබුණු සුන්බුන් අතර පිස්සුවෙන් වගේ එයාව හෙව්වා. මම පහළ ගඟ දිහා බලා සිටියා. ඒත් එයාගේ හෝඩුවාවක්වත් නැහැ.

මම කේන්තියෙන් මොර දුන්නා. ඒ හඬ උදෑසන නිසලතාවය මැද ඈතින් ඈතට ම ඇදී ගියා. මගේ සෝදිසියට උදවු ගන්න මම බ්ලැක්ජැක්ට උරුවම් බාන්න යද්දී ම මගේ අම්මාගේ ජංගම දුරකථනය නාද වුණා. මට ෆින්ක්ලෙස්ටෙයින් සහ සමාගමෙන් ඇමතුමක් එන බව දුරකථන තිරය පෙන්නුම් කළා- පෙනුණු හැටියට උප දෙවියෙක් ණයට ගත්ත දුරකථනයකින් කතා කරනවා වගෙයි.

සුබ ආරංචියක් බලාපොරොත්තුවෙන් මම ඇමතුම ගත්තා. ඇත්ත වශයෙන් ම මම හිතලා තිබුණා වැරදියි.

"පර්සි?" සිලේනා බියුරිගාඩ් කතා කළේ අඬ අඬා ඉඳලා වගෙයි. "ප්ලාසා හෝටලේට. ඔයා ඇපලෝ කැබින් එකේ වෙදෙක්ව අරගෙන පුළුවන් තරම් ඉක්මනට ආවොත් හොඳයි. මේ... මේ ඇනබෙත්ට."

# 12

# රේචල්ගේ නරක ගනුදෙනුව

ඇපලෝ කැබිනයේ විල් සොලේස්ව අල්ලා ගත් මම එයාගේ ඉතුරු සහෝදර සහෝදරියන්ට දිගට ම මයිකල් යෙව්ව හොයන්න කිවුවා. නිදා සිටි මෝටර් සයිකල්කරුවෙකුගෙන් යමහා එෆ්.ඉසෙඩ්.1 බයිසිකලයක් ණයට ගත් අපි ප්ලාසා හෝටලයට පදවාගෙන ගිය වේගය දක්කා නම් මගේ අම්මට හෘදයාබාධයක් හැදෙනවා. මීට කලින් කවදාවත් මම මෝටර් සයිකලයක් පැදලා තිබුණේ නැති වුණත්, ඒක පෙගසස් කෙනෙක්ව පදවනවාට වඩා අමාරු දෙයක් වුණේ නැහැ.

පාර දිගේ යද්දී මීට කලින් ප්‍රතිමා රඳවා තිබූ පාදස්ථල ගොඩක් හිස්ව තියෙනවා මට දකින්න ලැබුණා. සැලසුම් අංක විසි තුන වැඩ කරනවා වගෙයි. ඒක හොඳ දෙයක් ද, නරක දෙයක් ද කියන්න මම දනගෙන හිටියේ නැහැ.

අපිට ප්ලාසා හෝටලේට ළඟා වෙන්න ගියේ විනාඩි පහයි- ඒක මධ්‍යම උද්‍යානයේ ගිනිකොණ කෙළවරේ පිහිටි, නිල් පාට දෙපල වහලයක් ඇති, පරණ මෝස්තරයේ සුදු පාට ගලින් සෑදූ හෝටලයක්.

උපායාත්මකව කතා කරනවා නම්, ප්ලාසා හෝටලය මූලස්ථානයක් පිහිටුවන්න ඒ තරම් ගැළපෙන තැනක් නෙවෙයි. ඒක නගරයේ තිබුණ උස ම ගොඩනැගිල්ලවත්, වඩාත්ම නගර මධ්‍යයට වෙන්නට පිහිටි ගොඩනැගිල්ලවත් නෙවෙයි. ඒ වුණත් එහි තිබුණු පරණ මෝස්තරය නිසා දෝ බීට්ල්ස්ලා සහ ඇල්ෆ්‍රඩ් හිච්කොක් වගේ

ප්‍රසිද්ධ උප දෙවිවරු අවුරුද්ද පුරාවට එතැනට ආකර්ෂණය වුණා. ඉතින් එතැන අපිට හොඳ තැනක් වෙයි කියලා අපි හිතුවා.

ගැටි බැම්ම උඩින් යමහා බයිසිකලය වේගයෙන් දූමූ මම හෝටලයට පිටතින් තිබුණු වතුර මල ළඟ නතර කළා.

විල් සහ මම බිමට පැන්නා. වතුර මල මුදුනේ හිටපු ප්‍රතිමාව අපිට කතා කළා, "ඔහ්, නියමයි. මං හිතන්නේ ඔයාගේ බයික් එකත් මට බලාගන්න වෙයි!"

කළු ගල් පාත්‍රයක් මැද සිටගෙන සිටි එයා ජීව ප්‍රමාණයේ ලෝකඩ ප්‍රතිමාවක්. ඉණ වටේට දවටු ලෝකඩ ඇතිරියක් විතරක් හැඳගෙන සිටි එයාගේ අතේ ලෝකඩ පලතුරු පිරවූ කූඩයක් තිබුණා. මීට කලින් කවදාවත් මම එයාට වැඩි අවධානයක් දක්වලා තිබුණේ නැහැ. ඒත් ඉතින්, මීට කලින් කවදාවත් එයා මාත් එක්ක කතා කරලා තිබුණෙත් නැහැ නේ.

"ඔයාගෙන් පෙන්නුම් කරන්නේ ඩිමීටර්ව ද?" මම ඇහුවා.

මගේ ඔළුවට උඩින් ලෝකඩ ඇපල් ගෙඩියක් ඉගිලුණා.

"හැමෝම හිතන්නේ මම ඩිමීටර් කියලා." එයා අවලාද නැඟුවා. "මම තමයි පොම්පොනා, සෞභාග්‍යයට අධිපති රෝමානු දෙවඟන. ඒත් ඉතින් ඒකෙන් ඔයාට මොකද? කිසිම කෙනෙක් සුළු දෙවිවරුන්ව ගණන් ගන්නෙ නැහැ. ඔයාලා සුළු දෙවිවරුන්ටත් සැලකිල්ලක් පෙන්නුවා නම්, මේ යුද්ධයෙන් ඔයාලට පරදින්න වෙන්නෙ නෑ! මම නම් කියන්නෙ, මෝර්ෆියස්ටයි හෙකේට්ටයි ජය වේවා!"

"සයිකලේ බලා ගන්න," මම එයාට කිවුවා.

විල් සහ මම හෝටලය දිහාවට දුවද්දී පොම්පොනා ලතින් බසින් ශාප කරමින් තවත් පලතුරුවලින් අපිට දමා ගැහුවා.

***

ඇත්තට ම මම මීට කලින් ප්ලාසා හෝටලය ඇතුළට ගිහින් තිබුණේ නැහැ. පළිඟු පොකුරු පහන් සහ සිහිසුන් පෝසත් මිනිස්සුන්ගෙන් පිරී තිබුණ ප්‍රවේශ ශාලාව හිත් ඇදගන්නාසුලු වුණත්, මම එයට වැඩි සැලකිල්ලක් දක්වූයේ නැහැ. දඩයක්කාරියෝ දෙන්නෙක් අපිට සෝපානයට පාර පෙන්වූවා ම, අපි ඉහළ මහල් බලා ගියා.



හෝටලයේ ඉහළ මහල් සියල්ල ම උප දෙවිවරු අත්පත් කරගෙන සිටියා. කඳවුරුකරුවෝ සහ දඩයක්කාරියන් සෝපා මත නින්දට වැටී, නාන කාමරවලට වැදී පිරිසිදු වෙමින්, තුවාල වෙළීමට සේද තිර රෙදි ඉරමින් සහ මිනිබාර් මත තිබූ කෙටි කෑම සහ සෝඩා ගිල දමමින් සිටියා. වෘකයෝ දෙන්නෙක් වැසිකිළිවලින් වතුර බොමින් සිටියා. මගේ යාළුවන්ගෙන් වැඩි දෙනෙක් තවමත් පණ පිටින් ඉන්නවා දකිද්දී මට දැනුණේ ලොකු සහනයක්. ඒ වුණත් හැමදෙනා ම සිටියේ හෙම්බත් වෙලා වගෙයි.

"පර්සි!" ජේක් මේසන් මගේ උරහිසට තට්ටු කළා. "අපිට වාර්තා ලැබෙනවා-"

"පස්සේ," මම කිවුවා. "ඇනබෙත් කොහෙද?"

"ටෙරස් එකේ. එයා පණ පිටින් ඉන්නවා, කොල්ලෝ, ඒත්..."

මම එයාව තල්ලු කරගෙන ඉදිරියට ගියා.

මීට වඩා වෙනස් වාතාවරණයක දී නම්, ටෙරසය මතට පෙනුණ දර්ශනයට මම ගොඩාක් කැමති වෙන්න ඉඩ තිබුණා. එතැනට කෙලින් ම පෙනුණේ පහළින් වූ මධ්‍යම උද්‍යානයයි. පැහැදිලි සහ දීප්තිමත් වූ ඒ උදෑසන පික්නික් එකකට හෝ කඳු නැගීමකට, එහෙමත් නැත්නම් රාක්ෂයෝ සමඟ සටන් කරනවා ඇරෙන්න වෙන ඕනෑ ම දේකට කියාපු දවසක්.

ඇනබෙත් හාන්සි පුටුවක වැතිරී සිටියා. සුදුමැලි වී තිබුණු එයාගේ මූණ දාඩියෙන් තෙත් වැටිලා. එයාව බ්ලැන්කට්ටුවලින් වසා තිබුණා වුණත් එයා සිටියේ වෙවුලමින්. සිලේනා බියුරිගාඩ් තෙත රෙදි කෑල්ලකින් එයාගේ නළල පිස දමමින් සිටියා.

විල් සහ මම රැස්ව සිටි ඇතීනා ළමයින්ව තල්ලු කරගෙන ඉදිරියට ගියා. තුවාලය පිරික්සා බැලීමට විල් ඇනබෙත්ගේ වෙළුම් ගැලෙව්වා ම මට කලන්තේ දාලා එතැන ම වැටෙන්න ඕනෑ වුණා. ලේ ගැලීම නැවතී තිබුණත් තුවාලය ගොඩක් ගැඹුරුයි වගෙයි පෙනුණේ. කැපුම වටා වූ හම බය උපදවන විදිහේ කොළ පාටකට හැරී තිබුණා.

"ඇනබෙත්..." මගේ දිව පැටලුණා. එයා ඒ පිහි පාර කෑවේ මං වෙනුවෙනුයි. එහෙම දෙයක් වෙන්න මම කොහොමද ඉඩ දුන්නේ?

"කිණිස්සේ විෂ තිබිලා," එයා කෙඳිරුවා. "මං කොච්චර මෝඩියෙක් ද, නේ?"

විල් සොලේස් සැනසුම් සුසුමක් පිට කළා. "ඒක ඒ හැටි දරුණු නෑ, ඇනබෙත්. තව විනාඩි දෙක තුනක් පරක්කු වුණා නම් අපි කරදරේක වැටෙන්න තිබුණා, ඒත් මේ විෂ තාම උරහිසෙන් උඩට ගිහිල්ලා නැහැ. හෙලවෙන්නෙ නැතුව හාන්සි වෙලා ඉන්න. කවුරුහරි මට නෙක්ටාර් ටිකක් දෙන්නකෝ."

මම කෑනයක් ඩැහැ ගත්තා. විල් දේවමය පානයෙන් තුවාලය පිරිසිදු කරන අතරේ මම ඇනබෙත්ගේ අතින් අල්ලගෙන සිටියා.

"ඌයි," එයා කෑගැසුවා. "ආයි, අම්මෝ!" එයා මගේ ඇඟිලි කොයි තරම් තදින් මිරිකා ගත්තා ද කියනවා නම් ඒවා දම් පාටට හැරුණා. ඒ වුණත් විල් කියපු විදිහට ම එයා නොසෙල්වී සිටියා. සිලේනා එයාව දිරි ගන්වමින් මොනවදෝ කෙඳිරුවා. මොකක්දෝ රිදී පාට ආලේපයක් තුවාලය මත තැවරූ විල් පෞරාණික ග්‍රීක වචන වගයක් මිමිණුවා- ඇපලෝ වෙනුවෙන් දේවස්තෝත්‍රයක්. ඊට පස්සේ අලුත් වෙළුම් යෙදූ එයා වෙවුලමින් නැඟී සිටියා.

ප්‍රතිකාරයට එයාගේ ශක්තිය ගොඩක් වැය වෙන්න ඇති. එයා හිටියෙත් ඇනබෙත් තරමට ම වගේ සුදුමැලි වෙලයි.

"ඒකෙන් එයාව සනීප වෙයි," එයා කිවුවා. "ඒත් අපිට මනුෂ්‍ය සැපයුම් ටිකක් ඕනෑ වෙනවා."

හෝටල් කඩදාසියක් ඩැහැගෙන මොන මොනවදෝ සටහන් කළ එයා ඒක ඇතීනා ළමයෙක් අතට දුන්නා. "පස්වෙනි වීදියේ ෆාමසියක් තියෙනවා. සාමාන්‍යයෙන් මම කවදාවත් හොරකම් කරන්නෙ නම් නැහැ-"

"මම නම් කරනවා," ට්‍රැවිස් ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වුණා.

විල් එයාට රැවුවා. "සල්ලි හරි ඩ්‍රච්මා හරි, ඔයා ළඟ තියෙන ඕනෑ දෙයක් ගාස්තුව ගෙවන්න තියලා එන්න. හැබැයි මේක හදිසි තත්ත්වයක්. අපිට තව සෑහෙන ගොඩකට සාත්තු කරන්න වෙයි කියලා මට නිකමට වගේ හිතෙනවා."

කිසිවෙක් එයට විරුද්ධ වුණේ නැහැ. දැනටමත් එක තුවාලයක්වත් නොවුණ උප දෙවියෙක් සිටියේ ම නැති තරම්... මම ඇරෙන්න.

"වරෙල්ලා, කොල්ලනේ," ට්‍රැවිස් ස්ටොල් කිවුවා. "අපි ඇනබෙත්ට ටිකක් නිදහසේ ඉන්න දෙමු. අපිට ෆාමසියකට සුද්ධයක් දෙන්න..: මං කිවුවේ, බඩු ගන්න යන්න තියෙනවා."



උප දෙවිවරු කකුල් අද්දවමින් ආපසු ඇතුළට ගියා. ජේක් මේසන් පිට වී යන අතරේ මගේ උරහිසින් අල්ලා ගත්තා. "අපි පස්සේ කතා කරමු, දැනට ඒක පාලනය කරගෙනයි ඉන්නේ. මම ඇනබෙත්ගේ පලිහ පාවිච්චි කරලා වටපිටාව ගැන ඇහැ ගහගෙන ඉන්නේ. ඉර පායගෙන එද්දි හතුරෝ පහු බැස්සා, ඇයි කියලා නම් දන්නෙ නැහැ. අපි පාලම්, උමං හැම එකකට ම රැකවල් දාලයි තියෙන්නේ."

"ස්තුතියි, මචං," මං කිවුවා.

එයා ඔළුව වැනුවා. "කලබල වෙන්නැතුව ඉන්න."

එයා ටෙරසයේ දොර වසාගෙන පිට වී ගියේ සිලේනාව, ඇනබෙත්ව සහ මාව තනි කරමින්.

සිලේනා සීතල රෙදි කැල්ලකින් ඇනබෙත්ගේ නළල තැව්වා "මේ ඔක්කොම වුණේ මගේ වැරැද්දෙන්."

"නෑ," ඇනබෙත් දුබල හඬින් කිවුවා. "සිලේනා, ඒක ඔයාගේ වැරැද්ද වෙන්නෙ කොහොමද?"

"කඳවුරේ දී මම කවදාවත් වැඩි වැඩකට ඇති කෙනෙක් වුණේ නැහැ," එයා මිමිණුවා. "ඔයා වගේවත් පර්සි වගේවත් නැහැ. මම මීට වඩා දක්ෂ සටන්කාරියක් වුණා නම්...."

එයාගේ දෙතොල් සැලුණා. බෙකන්ඩොර්ෆ් මැරුණ දා ඉඳන් එයාගේ තත්ත්වය එන්න එන්න ම නරක් වුණා. ඒ නිසා ම එයා දිහා බලන වාරයක් ගාණේ බෙකන්ඩොර්ෆ්ගේ මරණය ගැන මම ආයේ ආයෙමත් කේන්ති ගත්තා. එයාගේ මූණෙන් පළවූ හැඟීම් මට සිහි කළේ වීදුරුවක්- හරියට ඕනෑ ම විනාඩියක කැඩිලා බිඳිලා යයි වගෙයි. එයාගේ පෙම්වතාට ජීවිතෙන් වන්දි ගෙවන්න සිද්ධ කරපු ඔත්තුකාරයාව කවදාහරි මට හොයාගන්න ලැබුණොත්, එයාව හපන සෙල්ලම් බඩුවක් විදිහට පාවිච්චි කරන්න මිසිස් ඕ'ලෙරීට දෙනවා කියලා මම මට ම දිවුරාගෙනයි තිබුණේ.

"ඔයා හොඳ කඳවුරුකාරියක්," මම සිලේනාට කිවුවා. "අපිට ඉන්න දක්ෂ ම පෙගසස් පදවන්නා ඔයයි. ඒ වගේම ඔයා හැමෝම එක්ක එකතුයි. මං කියනවට විශ්වාස කරන්න, ක්ලැරිස්ව යාළුවෙක් කරගන්න පුළුවන් කෙනෙක් ඉන්නවා නම්, එයා හැබෑ ම දක්ෂයෙක්."

එයා ඇස් ලොකු කරගෙන මගේ දිහා බලා සිටියේ හරියට මම මේ දැන් එයාට අලුත් අදහසක් දුන්නා වගෙයි. "අන්න හරි! අපිට ඒරීස්

Scanned with CamScanner

කැබින් එක ඕනෑ. මට පුළුවන් ක්ලැරිස්ට කතා කරන්න. මං දන්නවා අපිට උදවු කරන්න එයාව නම්මා ගන්න මට පුළුවන්."

"හෝවි, සිලේනා. ඔයාට මේ දූපතෙන් පිටවෙලා යන්න පුළුවන් වුණත්, ක්ලැරිස් කියන්නෙ මහ මුරණ්ඩු කෙනෙක්. එයා එක සැරයක් කේන්ති ගත්තා ම-"

"අනේ," සිලේනා කිවුවා. "මම පෙගසස් කෙනෙක් අරන් යන්නම්. මං දන්නවා මට ආපහු කඳවුරට යාගන්න පුළුවන්. මට උත්සාහ කරලා බලන්න ඉඩ දෙන්න."

මම ඇනබෙත් සමඟ බැල්මක් හුවමාරු කරගත්තා. එයා යාන්තමින් ඔළුව වැනුවා.

මම නම් ඒ අදහසට කැමති වුණේ නැහැ. ක්ලැරිස්ව සටනට එන්න කැමති කරවාගන්න සිලේනට පුළුවන් වෙයි කියලා මම හිතුවේ නැහැ. අනෙක් අතට, සිලේනා මේ වෙලාවේ හිටියේ කොච්චර හිතේ වියවුලකින් ද කියනවා නම්, සටනේ දී එයා එයාට ම තුවාල කරගන්න ඉඩ තිබුණා. එයාව ආපහු කඳවුරට යවන එකෙන් එයාට හිත යොදවන්න වෙන කාරණයක් ලැබේවි.

"හරි එහෙනම්," මම එයාට කිවුවා. "ඒකට උත්සාහ කරලා බලන්න මීට වඩා හොඳ කවුද කියලා මට හිතාගන්නවත් බැහැ."

සිලේනා මාව බදාගත්තා. ඊට පස්සේ එයා ලැජ්ජාවෙන් වගේ ආපස්සට වුණේ ඇනබෙත් දිහාවට බැල්මක් හෙළමිනුයි. "මී, සමා වෙන්න. ස්තුතියි, පර්සි! මම ඔයාලට වැටෙන්න තියන්නෙ නැහැ!"

එයා යන්න ගියාට පස්සේ මම ඇනබෙත් ළඟින් දණ ගසාගෙන එයාගේ නළලට අත තබා බැලුවා. එයාගේ උණ තවමත් බැහැලා තිබුණේ නැහැ.

"හිත් කරදරෙන් ඉන්න වෙලාවට ඔයා හරිම හුරතල් පාටයි," එයා කෙදිරුවා. "එතකොට ඔයාගේ ඇහි බැමි ඇදවෙලා එකට පැටලෙනවා."

"මාව ඔයාගේ ණයකාරයෙක් කරලා ඔයාට මැරෙන්න මම ඉඩ දෙන්නේ නෑ," මම කිවුවා. "ඇයි ඔයා අර කිණිසි පාර ගත්තේ?"

"මං වෙනුවෙන් ඔයත් ඒ දේ ම කරනවා නේ."



ඒ කතාව ඇත්ත. මං හිතන්නේ අපි දෙන්න ම ඒක දැනගෙන හිටියා. ඒ වුණාට මට තවමත් දැනුණේ කවුරුහරි සීතල යකඩ කූරකින් මගේ හදවතට ඇනිනවා වගෙයි. "ඔයා කොහොමද දැනගත්තේ?"

"මොකක්ද?"

අපි දෙන්නා තනියම ඉන්න බව සැක හැර දැනගන්න මම වටේට ම ඇස් යවා බැලුවා. ඊට පස්සේ එයා ළඟට ම ළං වෙලා මම රහසින් කතා කළා: "මගේ අකිලිස් ස්පොට් එක. ඔයා ඒ කිණිසි පාර නොගත්තා නම්, මම මැරෙන්න තිබුණා."

එයාගේ දෑසට දුර ඈතකට ගිය බැල්මක් ආවා. එයාගේ හුස්ම මිදි සුවඳ ගත්තා, සමහරවිට නෙක්ටාර් නිසා වෙන්න ඇති. "මන්දා, පර්සි. ඔයා ඉන්නේ අනතුරක කියලා ඒ වෙලාවේ මට නිකං ම දැනුණා. කොහෙද... කොහෙද ඒ තැන?"

ඒක කිසිවෙකුටත් හෙළි කරන්න මට තහනම් වුණා. ඒත් මේ ඇනබෙත් නේ. මට එයාව විශ්වාස කරන්න බැරි නම්, වෙන කාවවත් ම විශ්වාස කරන්න බැහැ.

"මගේ පිට කොන්ද මැද."

එයා අතක් එසෙව්වා. "කොහෙද? මෙතැන ද?"

එයා මගේ පිට කොන්ද මත අත තැබුවා ම මගේ හම පොපියන්න ගත්තා. මාව මනුෂ්‍ය ජීවිතයට බැඳ තබා ගන්නා එක ම පුංචි තැනට මම එයාගේ ඇඟිලි ගෙන ගොස් තැබුවා. මට දැනුණේ මගේ ඇඟ පුරා වෝල්ට් දහස් ගාණක විදුලියක් යනවා වගෙයි.

"ඔයා මාව බේරගත්තා," මම කිවුවා. "ස්තුතියි."

එයා අත ඉවත් කරගත්තත්, මම එය අත නොහැර සිටියා.

"ඒ කියන්නේ දැන් ඔයා මට ණයයි," එයා දුබලව ඇසුවා. "ඒක ඉතින් අලුත් දෙයක් යෑ?"

අපි නගරයට ඉහළින් ඉර පායා එන දිහා බලා සිටියා. මේ වෙද්දි වාහන ගමනාගමනය ගොඩක් වැඩි වී තිබිය යුතු වුණත්, අපිට එකම වාහන නළා හඬක්වත් ඇසුනේ නැහැ. පැති මං දිගේ කලබලෙන් දුවන කිසිවෙක් සිටියේ නැහැ.

දුර ඈතින්, කාරයක අනතුරු ඇඟවීමේ නළා හඬ දෝංකාර දෙනවා මට ඇසුණා. හර්ලෙම්වලට එපිට කොහෙදෝ තැනකින් කළු

පාට දුම් රොටුවක් අහසට නැඟුණා. මෝර්ෆියස්ගේ වශිය වදින වෙලාවේ පෝරණු තියස් ක්‍රියාත්මක කරලා තියෙන්න ඇති ද, ඒ හැම පිළිවෙල නගර අපරේ ම මිනිස්සු කී දෙනෙක් නින්දට වැටෙන්න ඇති ද හිතලා මම පුදුම වුණා. ඉක්මනින් ම නව නැත්වල ගිනි ගැනීම් ඇතිවෙන්න ඉඩ තිබුණා. නිව්යෝක්වල සෑම්දෙනා ම හිටියේ අන්තරායකට මැදි වෙලයි- ඒ හැම ජීවිතයක් ම රැඳී තිබුණේ අපේ අත්වලයි.

"හර්මීස් මාත් එක්ක තරහෙන් හිටියේ ඇයි කියලා ඔයා ඇහුවා නේද," ඇනබෙත් කිවුවා.

"හේයි, ඔයා දත් විවේක ගත්ත ඕනෑ-"

"නෑ, මට ඒක ඔයාට කියන්න ඕනෑ. ඒක සෑහෙන කාලයක් තිස්සේ මට වධ දි දී තිබුණ දෙයක්." උරහිස සෙලවූ එයාගේ මූණ වේදනාවෙන් ඇඹිළුණා. "හිය අවුරුද්දේ, ලූක් මාව බලන්න සැන් ෆ්‍රැන්සිස්කෝවලට ආවා."

"එයා ආවා?" මට දනුණේ ඇනබෙත් මේ දත් මට මිටියකින් ගැහුවා වගෙයි. "එයා ඔයාගේ ගෙදරට ආවා?"

"මේක වුණේ අපි වංගෙඩිරියට යන්න කලින්. එයාව..." එයාගේ වාක්‍ය මඟින් ඇන හිටියත්, එයා අදහස් කළ දේ මම දන සිටියා: එයා ක්‍රෝනොස් වෙන්න කලින්. "එයා ආවේ තාවකාලික සටන් විරාමයක් ඉල්ලගෙන. එයාට කතා කරන්න විනාඩි පහක් විතරයි ඕනෑ කියලා එයා කිවුවා. එයා හිටියේ බයවෙලා වගේ, පර්සි. එයා මට කිවුවා ක්‍රෝනොස් ලෝකෙ අල්ලගන්න එයාව පාවිච්චි කරන්න යනවා කියලා. එයා කිවුවා ඉස්සර වගේ එයාට පැනලා යන්න ඕනෑ කියලා. එයාට ඕනෑ වුණේ මාවත් එයා එක්ක අරන් යන්න."

"ඒත් ඔයා එයාව විශ්වාස කරේ නැහැ."

"කොහෙත්ම නැහැ. ඒක මොකක් හරි උගුලක් කියලා මං හිතුවේ. ඇරත්... මෙහෙමයි, ගොඩක් දේවල් ඉස්සර තිබුණට වඩා වෙනස් වෙලයි තිබුණේ. මට ඒක කොහෙත්ම කරන්න බැහැ කියලා මම ලූක්ට කිවුවා. එයාට තරහා ගියා. එයා කිවුවා... එයා කිවුවා මම ඒ වෙලාවේ, එතැනදී ම එයත් එක්ක සටන් කරන එක ඊට වඩා හොඳයි. මොකද මට ලැබෙන අන්තිම අවස්ථාව ඒක විතරයි කියලා."

එයාගේ නළලට ආයෙමත් දාඩිය දමා තිබුණා. කතාවට එයාගේ ශක්තිය ඕනෑවට වඩා වැය වෙන බව මට පෙනුණා.



"ඒකට කමක් නෑ," මම කිවුවා. "ටිකක් විවේක ගන්න බලන්නකෝ."

"ඔයාට තේරෙන්නෙ නෑ, පර්සි. හර්මීස් කිවුවා හරි. සමහරවිට මම එයා එක්ක ගියා නම්, මට එයාගේ හිත වෙනස් කරන්න තිබුණා. එහෙම නැත්නම්-නැත්නම් මගේ ළඟ කිණිස්සක් තිබුණා. ලූක් අතේ කිසිම ආයුදයක් තිබුණෙ නැහැ. මට තිබුණා-"

"එයාව මරන්න?" මම ඇහුවා. "ඒක හරි දෙයක් නෙවෙයි කියලා ඔයා ම දන්නවා නේ."

එයා තදින් ඇස් පියාගත්තා. "ලූක් කිවුවා ක්‍රෝනොස් එයාව 'අත්තිවාරමක් ' වගේ පාවිච්චි කරයි කියලා. ඒක තමයි එයා පාවිච්චි කරපු වචනේ. ක්‍රෝනොස් ලූක්ව පාවිච්චි කරලා, තවත් බලගතු වෙයි."

"එයා එහෙම කරා නේ," මම කිවුවා. "එයා ලූක්ගේ ඇඟට ආවේශ වුණා."

"ඒත් ලූක්ගේ ඇඟ තැන් මාරුවක් විතරයි නම්? ක්‍රෝනොස් හදන්නේ මීටත් වඩා බලගතු වෙන්න නම්? මට එයාව නවත්තන්න තිබුණා. මේ යුද්ධෙ ඇති වුණේ තනිකර ම මගේ වැරැද්දෙන්."

එයාගේ කතාව අහලා මට දනුණේ මාව ආයෙමත් ස්ටයික්ස් ගඟේ ගිලෙනවා වගෙයි, මාව හෙමින් හෙමින් දියවෙලා යනවා වගෙයි. පහුගිය ශිම්හානයේ දී ඔළු-දෙකේ දෙවියා ජානුස් ඇනබෙත්ට ලොකු තෝරාගැනීමක් කරන්න වෙනවා කියලා අනතුරු අඟවපු හැටි මට මතක් වුණා- හැබැයි ඒක සිද්ධ වුණේ එයා දත් මේ කියපු ලූක්ව මුණ ගැසීමෙන් පස්සෙයි. පැනුත් ඒ වගේම කතාවක් එයාට කියලා තිබුණා: ඔයා වැදගත් භූමිකාවක් රඟ දක්වාවි, හැබැයි ඒ ඔයා හිතාගෙන හිටපු භූමිකාව නොවෙන්න පුළුවන්.

හෙස්ටියා මට පෙන්වා තිබූ දර්ශන ගැන- ලූක් සහ තාලියා සමඟ එයා ගෙවූ මුල් ම කාලය ගැන මට එයාගෙන් අහන්න ඕනෑ වුණා. මගේ අනාවැකිය සමඟ එහි මොකක් හෝ සම්බන්ධයක් තියෙන බව මම දනගෙන හිටියත්. ඒ මොකක්ද කියලා නම් මට තේරුනේ නැහැ.

ඒ ගැන අහන්න මම හිතේ ධෛර්යය උපදවා ගන්න කලින්, ටෙරසයේ දොර ඇරුණා. කොනර් ස්ටොල් එය තුළින් ආවා.

"පර්සි," එයා ඇනබෙත් දිහාවට බැල්මක් හෙළුවේ හරියට එයා ඉන්න තැන නරක ආරංචියක් කියන්න අකමැත්තෙන් වගෙයි. ඒ වුණත් එයා අරන් ආවේ හොඳ ආරංචියක් නම් නෙවෙයි කියලා මට තේරුණා. "මිසිස් ඕ'ලෙරී දැන් ග්‍රෝවර්ව එක්කගෙන ආවා. මං හිතන්නෙ ඔයා එයත් එක්ක කතා කරොත් හොඳයි."

★★★

ග්‍රෝවර් විසිත්ත කාමරයේ කෑම කමින් සිටියා. ගස් පොතු සහ රිකිලිවලින් සෑදූ සන්නාහයක් හැඳ සිටි එයා ඉණ පටියේ ලී මුගුරක් සහ එයාගේ බට නළා එල්ලාගෙන යුද්ධයට සැරසී සිටියා.

ඩීමීටර් කැබිනයේ අය හෝටල් මුළුතැන්ගෙයි පීසාවල සිට අන්නාසි අයිස්ක්‍රීම් දක්වා සියලු කෑම ජාති සහිත සම්පූර්ණ කෑම මේසයක් ම පිළියෙළ කරලයි තිබුණේ. ඒත් අවාසනාවට, ග්‍රෝවර් කමින් සිටියේ ගෘහ භාණ්ඩයි. අරුමෝසම් පුටුවක පුරවා තිබූ පුළුන් සියල්ල දැනටමත් කා හමාර කර තිබූ එයා දැන් අත් ඇන්ද ලෑලි ගාමින් සිටියා.

"කොල්ලෝ," මම කතා කළා, "අපි මේ තැන ණයට අරන් ඉන්නවා විතරයි."

"බ්ලාහා-හා-හා!" එයාගේ මූණ පුරා පුළුන් විසිරී තිබුණා. "සමා වෙන්න, පර්සි. ඒක මේ... දසවෙනි ලුයිස් කාලේ පුටුවක්. මාර රහයි. ඒ ඇරත්, මම බඩු මුට්ටු කන්නේ-"

"කලබල වෙලා ඉන්න වෙලාවට," මම කිව්වා. "ඔව්, මං දන්නවා. ඉතින්, මොනවද විස්තර?"

එයා කුර බිම ගැසුවා. "මට ඇනබෙත් ගැන අහන්න ලැබුණා. එයාට...?"

"එයාට සනීප වෙයි. දැන් එයා විවේක ගන්නවා."

ග්‍රෝවර් ගැඹුරු හුස්මක් ගත්තා. "ඒක හොඳයි. මම ටවුමේ ඉන්න සොභාවික බලවේගවලින් වැඩි හරියක් එකතු කරගත්තා-මෙහෙමයි, මං කියන දේ අහන අයව විතරයි, කොහොම හරි." එයා නළල අතුල්ලා ගත්තා. "ඕක් ගෙඩි වැදුණා ම මෙච්චර රිදෙනවා ඇති කියලා මම තිකමටවත් හිතලා තිබුණෙ නෑ. කොහොම හරි, අපි අපිට පුළුවන් තරමට උදවු දෙනවා."



එයාලට දකින්න ලැබුණු සුළු සුළු සටන් ගැන එයා මට කිව්වා. එයාලා වැඩි වශයෙන් ආවරණය කරමින් සිටියේ අපිට උවමනා තරම් උපදෙව්වරු නොසිටි අප්ටවුන් කොටසයි. සෙවණැලි-ගමන් උපයෝගී කරගෙන අපේ සීමා ඇතුළේ එක එක තැන්වලින් මතු වෙමින් සිටි යම බල්ලන්ව රුක් දෙව්වරු සහ සැටර්ලා විසින් පන්නා දමමින් සිටියා. හාර්ලෙම්වලින් මකර පැටියෙක් මතු වී තිබුණා. ඒ රාක්ෂයාව අන්තිමේ දී පරාද කරන්න හැකි වෙලා තිබුණේ රුක් දෙවඟනෝ දුසිමක් විතර මැරුණට පස්සෙයි.

ග්‍රෝවර් කතාව කියාගෙන යන අතරේ, තාලියා එයාගේ ලෙෆ්ටිනන්ට්ලා දෙන්නෙක් සමඟ කාමරයට ඇතුළු වුණා. බැරෑරුම් මුහුණින් මට ඔළුව වැනූ එයා, එළියට ගිහින් ඇනබෙත්ව පරීක්ෂා කර බලලා, ආයෙමත් ඇතුළට ආවා. ග්‍රෝවර් එයාගේ වාර්තාව සම්පූර්ණ කරන තුරු එයා ඇහුම්කන් දුන්නා- ඒ තොරතුරු වඩ වඩාත් නරක අතට හැරෙමිනුයි තිබුණේ.

"වොෂින්ග්ටන් බලකොටුවේ දී යෝධයෝ වගයක් එක්ක සටනකින් අපිට සැටර්ලා විසිදෙනෙක් නැති වුණා," එයා කිව්වේ වෙවුලන හඬින්. "මගේ නෑදෑයින්ගෙන් බාගයක් විතර ම. අන්තිමේ දී ගඟට අධිපති බලවේග යෝධයින්ව ගිල්ලලා දැම්මා, ඒත්..."

තාලියා එයාගේ දුන්න උරහිසේ එල්ලා ගත්තා. "පර්සි, ක්‍රෝනොස්ගේ හමුදාවල් තවමත් හැම පාලමක් ළඟටමයි, හැම උමඟක් ළඟටමයි එකතු වෙනවා. ඒ වගේම ඒ පැත්තට ඉන්න එක ම ටයිටන් ක්‍රෝනොස් විතරක් නෙවෙයි. මගේ දඩයක්කාරියන්ගෙන් කෙනෙක් දැකලා තිබුණා රත්තරන් පාට සන්නාහයක් ඇඳගත්ත යෝධ මිනිහෙක් ජර්සි වෙරළේ හමුදාවක් රැස් කරනවා. ඒ කවුද කියලා මට හරියට ම විශ්වාසයක් නෑ, ඒත් ටයිටන් කෙනෙක්ගෙන් හරි දෙවියෙක්ගෙන් හරි විතරක් විහිදෙන විදිහේ බලයක් එයාගෙන් පැතිරෙනවා."

හීනෙන් මට දකින්න ලැබුණු රන්වන් ටයිටන්ව මට සිහිවුණා- ඔත්‍රිස් කඳු මුදුනේ ඉඳලා ගිනි දලු කඳකට හැරුණ කෙනාව.

"නියමයි," මම කිව්වා. "සුබ ආරංචි මුකුත් නැද්ද?"

තාලියා උරහිස් ඇකිළුවා. "අපි මැන්හැටන්වලට එන උමං කෝච්චි පාර සීල් තිබ්බා. මගේ හොඳ ම උගුල් අටවන්නෝ ඒ ගැන වගබලා ගත්තා. තව, පෙනෙන හැටියට හතුරෝ පහර දෙන්න අඳුර වෙනකල් බලන් ඉන්නවා වගෙයි. මං හිතන්නෙ ලූක්ට" - එයා

එයාව ම නවතා ගත්තා- "මං කිවුවේ ක්‍රෝනොස්ට හැම සටනකට ම පස්සේ ප්‍රකෘතිමත් වෙන්න වෙලාව ඕනෑ. එයාගේ අලුත් ඇඟ තව ම එයාට හරියට පුරුදු නැහැ වගෙයි. නගරේ වටේ කාලය මන්දගාමී කරන්න එයාගේ බලය සෑහෙන්න වැය වෙනවා."

ග්‍රෝවර් ඔළුව වැනුවා. "එයාගේ සේනාවල වැඩි දෙනෙක් ගොඩක් බලගතු වෙන්නෙත් රෑට. ඒත් එයාලා ඉර බැස්සට පස්සේ ආපහු එයි."

මම නිරවුල්ව හිතන්න උත්සාහ කළා. "හරි. දෙවිවරුන්ගෙන් ආරංචියක් නැද්ද?"

තාලියා ඔළුව හෙල්ලුවා. "මං දන්නවා ආර්ටෙමිස් උත්තමාවියට පුළුවන්කමක් තිබුණා නම් මෙහෙට එනවා. ඇතීනාත් එහෙමයි. ඒත් සියුස් එයාලට එයා එක්ක ම ඉන්න අණ කරලා. අන්තිමට මට අහන්න ලැබුණ විදිහට, ටයිපූන් හිටියේ ඔහියෝ ගං මිටියාවත විනාශ කරකර. දවල් වෙද්දි එයා ඇපලචියන් කඳුවලට කිට්ටු කරලා ඉඳියි."

"ඒ කියන්නේ උපරිමයෙන්," මම කිවුවා, "එයා එන්න කලින් අපිට දවස් දෙකක් තියෙයි."

ජේක් මේසන් උගුර පෑදුවා. එයා එතැන හිටගෙන හිටියේ කොයි තරම් නිහඬව ද කියනවා නම්, එයා ඉන්න වග මට සහමුලින් ම වගේ අමතක වෙලයි තිබුණේ.

"පර්සි, තව දෙයක්," එයා කිවුවා. "ක්‍රෝනොස් විලියම්ස්බර්ග් පාලම ළඟ පෙනී හිටපු විදිහ, ඒක හරියට ඔයා එතැනට යන බව එයා දැනගෙන හිටියා වගේ. ඒ වගේම එයා අපේ දුර්වල ම තැන්වලට එයාගේ සේනාවන් මාරු කළා. අපි ස්ථානගත වුණ හැටියේ ම එයා එයාගේ යුද්ධෝපාය වෙනස් කළා. දඩයක්කාරියන්ගෙන් ශක්තිමත් වෙලා තිබුණ ලින්කන් උමඟට එයා අතක්වත් තිබ්බෙ නැති තරම්. එයා අපේ දුර්වල ම තැන්වලට ගියේ හරියට දැනගෙන හිටියා වගෙයි."

"හරියට එයාට ඇතුළෙන් විස්තර ලැබුණා වගෙයි," මම කිවුවා. "අර ඔත්තුකාරයා."

"මොන ඔත්තුකාරයා ද?" තාලියා ප්‍රශ්න කළා.

ක්‍රෝනොස් මට පෙන්වා තිබූ රිදී යන්තරය- සන්නිවේදන උපකරණය ගැන මම එයාට කිවුවා.

"ඒක නම් නරකයි," එයා කිවුවා. "හොඳටෝම නරකයි."



"එයා ඕනෑම කෙනෙක් වෙන්න පුළුවන්," ජේක් කිවුවා. "පර්සි නියෝග දුන්න වෙලාවේ අපි හැමෝම එතැන හිටියා නේ."

"ඒත් අපිට කරන්න පුළුවන් මොනවද?" ග්‍රෝවර් ඇහුවා. "අපිට දැකැති යන්තරයක් හම්බ වෙනකල් හැම උප දෙවියෙක්ව ම ගසලා බලන්න යෑ?"

හැමෝම බලා සිටියේ මම තීරණයක් ගන්නා තුරුයි. මේ කිසිම දෙයක් ගැන කිසිම බලාපොරොත්තුවක් තියන්න බැහැ වගේ පෙනුණත්, මට දැනුණු භීතිය පිටට පෙනෙන්න සලස්වන්න මට පුළුවන්කමක් තිබුණේ නැහැ.

"අපි දිගටම සටන් කරනවා," මම කිවුවා. "අපිට ඔත්තුකාරයා ගැන හිතහිතා ළතවෙන්න බැහැ. අපි එක එකාව සැක කරන්න පටන් ගත්තොත්, ඒකෙන් වෙන්නේ අපි අපිව ම භේද කරගන්න එකයි. ඊයේ රෑ ඔයාලා හැමෝම සුපිරියට වැඩේ කළා. මීටත් වඩා නිර්භීත හමුදාවක් මං කොහෙන් හොයන්න ද. අපි දැන් රැකවල් වටරවුම හදමු. ඔයාලට පුළුවන් වෙලාවේ විවේක ගන්න. ඉස්සරහට අපිට ගෙවන්න දිග රැයක් තියෙනවා."

උප දෙවිවරු එකඟතාවය පළ කරමින් මිමිණුවා. එයාලා නිදාගන්න, කෑම කන්න හෝ එයාලගේ ආයුද අලුත්වැඩියා කරගන්න තම තමන්ට අවශ්‍ය පැතිවලට බෙදිලා ගියා.

"පර්සි, ඔයත් යන්න," තාලියා කිවුවා. "අපි වටපිටාව ගැන ඇහැ ගහගෙන ඉන්නම්. ගිහිල්ලා ටිකක් හාන්සි වෙන්න. අද රෑට ඔයා හොඳ තත්ත්වෙක ඉන්න ඕනෑ."

මම එයා එක්ක වැඩිය තර්ක කරන්න ගියේ නැහැ. ළඟ ම තිබුණු නිදන කාමරය හොයාගත්ත මම වියන් ඇඳ මතට කඩා වැටුණා. නිදාගන්න බැරි තරමට මගේ හිත වියවුල් කියලා මම හිතුවත්, වැඩි වෙලාවක් යන්න කලින් ම මගේ ඇස් පියවුණා.

★★★

සිහිනයෙන්, හේඩීස්ගේ උද්‍යානයේ තනියම ඉන්නා නිකෝ ඩී ආන්ජෙලෝව මම දැක්කා. එයා මේ දැන් පර්සෙෆෝන්ගේ මල් පාත්තියක් මැද වළක් හාරලා තිබුණා. ඒක දැකලා රැජින ඒ හැටි සතුටු වෙයි කියලා මම නම් හිතුවෙ නැහැ.

වයින් බඳුනක් වළට හැලුව එයා මතුරන්න පටන් ගත්තා. "මළවුන්ට නැවතත් රස බලන්න ලැබේවා. ඔවුන්ට පිබිදී, මේ පූජාව පිළිගැනීමට ලැබේවා. මරියා ඩි ආන්ජෙලෝ, පෙනී සිටිනු!"

සුදු පාට දුමක් එක්රැස් වුණා. එයින් මිනිස් රූපාකායක් මැවුණත්, ඒ නිකෝගේ අම්මා නෙවෙයි. එයා කළු කොණ්ඩයක් සහ ඔලිව් පාට හමක් ඇති, දඩයක්කාරියන්ගේ රිදී පාට ඇඳුම්වලින් සැරසුණු කෙනෙක්.

"බියන්කා," නිකෝ කිවුවා. "ඒත්-"

අපේ අම්මව කැඳවන්න එපා, නිකෝ. එයා අනතුරු ඇඟෙව්වා. එයා තමයි අපිට දකින්න තහනම් කරලා තියෙන ආත්මය.

"ඇයි ඒ?" නිකෝ ප්‍රශ්න කළා. "අපේ තාත්තා මොනවද හංගන්නේ?"

වේදනාව, බියන්කා කිවුවා. වෛරය. මහා අනාවැකිය දක්වා ම ඇදිලා යන ශාපයක්.

"ඒ කතාවේ තේරුම මොකක්ද?" නිකෝ ඇහුවා. "මට දනගන්න ඕනෑ!"

ඒ දැනුමෙන් ඔයාට ලැබෙන්නේ වේදනාවක් විතරයි. මම කියපු දේ මතක ද: හිතේ කෝන්තරයක් තියාගෙන ඉන්න එක හේඩීස්ගේ දරුවෙක්ට අනතුරුදායකයි. ඒක තමයි අපේ මාරක වැරැද්ද.

"මං ඒක දන්නවා," නිකෝ කිවුවා. "ඒත් මම දැන් ඉස්සර හිටියා වගේ නෙවෙයි, බියන්කා. මාව ආරක්ෂා කරන්න හදන එක නවත්තන්න!"

මල්ලියෝ, ඔයාට තේරෙන්නෙ නැහැ-

නිකෝ මීදුම හරහා අතක් යැවූවා ම බියන්කාගේ රූපය විසිරී ගියා.

"මරියා ඩි ආන්ජෙලෝ," එයා ආයෙමත් කතා කළා. "මට කතා කරනු!"

මේ වතාවේ වෙනස් රූපයක් මතු වුණා. ඒක තනි අවතාරයකට වඩා දර්ශනයක් වගෙයි පෙනුණේ. මීදුම අතරින් පෙනුණු දර්ශනීය හෝටලයක ප්‍රවේශ ශාලාවේ වයසින් පොඩි නිකෝ සහ බියන්කා කිරි ගරුඬ කුලුනු වටා ඔට්ටු සෙල්ලම් කරමින් සිටියා.



ඒ අසල ම වූ සෝපාවක් මත ගැහැනු කෙනෙක් වාඩි වී සිටියා. කළු ගවුමක් හැඳ සිටි එයා අත්වැසුම් ජෝඩුවක් සහ 1940 දශකයේ පරණ චිත්‍රපටි තාරකාවන් පැලඳි මෝස්තරයේ වේල් පොටක් සහිත කළු තොප්පියක් පැලඳගෙන සිටියා. එයාට බියන්කාගේ සිනහව සහ නිකෝගේ දෑස තිබුණා.

එයා ළඟින් ම පුටුවක වාඩි වී සිටියේ කළු පාට ඉරි මෝස්තරයක් සහිත ඇඳුම් කට්ටලයකින් සැරසුණු අමාරුකාරයෙක් වගේ පෙනුණු ලොකු පිරිමියෙක්. තිගැස්මක් එක්ක මට තේරුම් ගියේ ඒ හේඩීස් කියලයි. එයා ගැහැනු කෙනා වෙතට නැමීගෙන අත්වලින් අංග චලන දක්වමින් කතා කළේ කැලඹීමෙන් වගෙයි.

"අනේ, මගෙ වස්තුවේ," එයා කිවුවා. "ඔයා පාතාල ලෝකෙට එන්න ම ඕනෑ. පර්සෙෆෝන් මොනවා හිතුවත් මට කමක් නෑ! ඔයාව එහෙ පරිස්සමෙන් තියාගන්න මට පුළුවන්."

"නෑ, මගෙ රත්තරනේ." එයා කතා කළේ ඉතාලි උරුවකින්. "අපේ දරුවන්ව මළවුන්ගේ රටේ තියාගෙන උස් මහත් කරන්න? මම නම් ඒක කරන්නෙ නැහැ."

"මරියා, මං කියන දේ අහන්න. යුරෝපේ පැතිරිලා යන යුද්දෙත් එක්ක අනිත් දෙවිවරු මට විරුද්ධව අනිත් පැත්තට හැරෙනවා. අනාවැකියක් පළවෙලයි තියෙන්නෙ. තව දුරටත් මගේ දරුවන්ට ආරක්ෂාවක් නැහැ. පොසෙයිඩනුයි, සියුසුයි දෙන්නා මාව ගිවිසුමකට බලෙන් නම්මවා ගත්තා. අපෙන් කවුරුවත් ආයේ කවදාවත් උප දෙවි දරුවන්ව හදන්නෙ නැහැ."

"ඒත් ඔයාට දැනටමත් නිකෝයි බියන්කයි ඉන්නවා නේ. අනිවාර්යයෙන්-"

"නෑ! අනාවැකියෙන් අනතුරු අඟවන්නෙ අවුරුදු දාසය ලබන දරුවෙක් ගැන. මට දැනට ඉන්න දරුවන්ට නියම පුහුණුවක් දෙන්න අර්ධ-ලෝහිත කඳවුරට යවන්න කියලා සියුස් නියෝග කරලා තියෙන්නේ, ඒත් එයා අදහස් කරන්නෙ මොකක්ද කියලා මම දන්නවා. සමහරවිට, එයාලා ගැන පරීක්ෂාවෙන් ඉඳියි, හිරේ දායි, එයාලගේ තාත්තට විරුද්ධව එයාලව හරවයි. සමහරවිට එයා ඒ වගේ අවදානමක්වත් ගන්නෙ නැති වෙයි. එයා මගේ උප දෙවි දරුවන්ට අවුරුදු දාසය ලබනකල් ජීවත් වෙන්න දෙන්නෙ නැති වෙයි. එයා

එයාලව විනාශ කරන්න පොටක් පාදා ගනියි. ඒ අවදානම ගන්න මට කොහෙත්ම බැහැ!"

"ඇත්ත වශයෙන් ම," මරියා කතා කළා. "අපි වෙන් වෙන්නෙ නැහැ. සියුස් කියන්නෙ මහ මන්ද බුද්ධිකයෙක්."

ඒ ගැහැනු කෙනාගේ නිර්භීතකම අගය නොකර ඉන්න මට බැරි වුණා. ඒ වුණත් හේඩීස් සිවිලිම දිහාවට බැල්මක් හෙළුවේ බයෙන් වගෙයි. "මරියා, කරුණාකරලා. මං ඔයාට කිව්වා නේ, සියුස් මට කියලා තිබුණේ ගිය සතිය වෙද්දි දරුවන්ව බාර දෙන්න කියලා. එයාට කේන්ති ගියොත් දරුණු වෙයි, ඒ වගේම හැමදාට ම මෙහෙම ඔයාලව හංගගෙන ඉන්න මට බැහැ නේ. දරුවෝ එක්ක ඉන්න තාක්, ඔයත් ඉන්නේ අනතුරේ."

මරියා හිනාවක් පෑවා, එයාගේ පෙනුම එයාගේ දුවගේ පෙනුමට කොයි තරම් සමාන ද කියලා ඒ වෙලාවේ ආයෙමත් මට හිතුණේ ඇඟ ම හිරිවට්ටමින්. "ඔයා දෙවියෙක්, මගේ රත්තරනේ. ඔයා අපිව ආරක්ෂා කරයි. ඒ වුණත් මම නිකෝව්වයි බියන්කාවයි පාතාල ලෝකෙට අරගෙන යන්නෙ නම් නැහැ."

හේඩීස් දෑත් ඇඹරුවා. "එහෙනම්, කරන්න තව එක දෙයක් තියෙනවා. කාන්තාරේ මම දන්න තැනක් තියෙනවා කාලය ගත වෙන්නෙ නැති. මට පුළුවන් දරුවන්ව එතැනට යවන්න, ටික කාලෙකට විතරක්, එයාලගේ ම ආරක්ෂාවට. ඒ වගේම අපිට එකට ඉන්න පුළුවන්. මම ඔයාට ස්ටයික්ස් ගං ඉවුරේ රත්තරන් මාලිගාවක් හදලා දෙන්නම්."

මරියා ඩි ආන්ජෙලෝ කාරුණිකව හිනා වුණා. "ඔයා කරුණාවන්තයි, මගේ රත්තරනේ. ගොඩාක් ත්‍යාගශීලියි. අනිත් දෙවිවරුත් මං දකින විදිහට ඔයාව දැක්කා නම්, එයාලා ඔය තරම් ඔයාට බය වෙන්නෙ නැති වෙයි. ඒත් නිකෝටයි බියන්කාටයි එයාලගේ අම්මව ඕනෑ. ඇරත්, එයාලා තාම පොඩි දරුවෝ නේ. දෙවිවරු ඇත්තට ම එයාලට කරදරයක් කරන එකක් නැහැ."

"ඔයා මගේ පවුලේ අය ගැන දන්නෙ නැහැ," හේඩීස් අඳුරු ලෙස කිව්වා. "කරුණාකරලා, මරියා, මට ඔයාව නැති කරගන්න බැහැ."

මරියා ඇඟිලි තුඩුවලින් හේඩීස්ගේ තොල් ස්පර්ශ කළා. "ඔයාට මාව නැති වෙන්නෙ නැහැ. මම මගේ පර්ස් එක අරන් එනකල් දරුවෝ දිහා ඇහැ ගහගෙන ඔහොම ඉන්න."



මරණයට අධිපතිට හාදුවක් දුන් එයා සෝෆාවෙන් නැඟිට්ටා. එයා පඩිපෙළ නැගගෙන යන දිහාව හේඩීස් බලා සිටියේ හරියට එයා ඈතට යන හැම අඩියක් ම වේදනා ගෙන දෙනවා වගෙයි.

මොහොතකින්, එයා තිගැස්සුණා. ළමයි දෙන්නත් සෙල්ලම නතර කළේ එයාලටත් මොනවා හරි දැනිලා වගෙයි.

"නෑ!" හේඩීස් කිව්වා. ඒත් එයාගේ දේව බලයන් පවා වේගවත් මදි වුණා. හෝටලය පුපුරා යන්න කලින් එයාට වෙලාව ලැබුණේ දරුවෝ දෙන්නා වටේට අඳුරු ශක්තියෙන් සෑදුණු ප්‍රාකාරයක් ගොඩ නගන්න විතරයි.

පිපුරුමේ ප්‍රචණ්ඩකමට, මීදුමෙන් සෑදුණු මුළු රූපය ම විසිරී ගියා. එය නැවතත් නාභිගත වෙද්දී මට දකින්න ලැබුණේ සුන්බුන් මැද දණ ගසාගෙන, මරියා ඩි ආන්ජෙලෝගේ බිඳුණු සිරුර දෑතින් ගෙන සිටින හේඩීස්වයි. එයා වටේට තවමත් ගිනි ඇවිළුණා. විදුලි එළිවලින් අහස එළිය කරමින් අකුණු පිපුරුවා.

පුංචි නිකෝ සහ බියන්කා ඇස් ලොකු කරගෙන එයාලගේ අම්මා දිහා බලා සිටියේ කිසිවක් තේරුම් ගන්න බැරුවයි. ඇලෙක්ටෝ නම් ෆියුරි එයාගේ හමින් සෑදුණු පියාපත් සලමින් එයාලා පිටුපසින් මතු වුණා. ළමයි දෙන්නා එයාව දුටු බවක් පෙනුනේ නැහැ.

"සියුස්!" හේඩීස් මිට මෙළවූ අත අහසට ලෙළවූවා. "මේ කරපු දේට මං නුඹව චප්ප කරලා දානවා! මම එයාව ආපහු අරන් එනවාමයි!"

"මගේ උතුමාණෙනි, ඔබතුමාට බැහැ," ඇලෙක්ටෝ අනතුරු ඇඟෙව්වා. "අමරණීයයන්ගෙන් කවුරු නැතත් ඔබතුමා මරණයේ නීතිවලට ගරු කරන්න ඕනෑ."

හේඩීස් කෝපයෙන් දිලිසුණා. එයා එයාගේ සැබෑ ස්වරූපය පෙන්වා එයාගෙ ම දරුවන්ව අළු දූවිලි කරයි කියලා මට හිතුණත්, අන්තිම මොහොතේ දී එයා තමන්ව හික්මවා ගත්තා.

"එයාලව අරන් යන්න," එයා ඉකියක් ගිල ගනිමින් ඇලෙක්ටෝට කිව්වා. "ලිතී ගඟෙන් එයාලගේ මතකයන් හෝදලා ඇරලා, එයාලව ලෝටස් හෝටලේට අරන් යන්න. එතැන දී සියුස් එයාලට කරදරයක් කරන්නෙ නැති වෙයි."

"ඔබතුමාගේ කැමැත්තක්, උතුමාණෙනි," ඇලෙක්ටෝ කිව්වා. "එතකොට මේ ගෑනු කෙනාගේ සිරුර?"

"එයාවත් අරගෙන යන්න," හේඩීස් සෝකබරිතව කිවුවා. "එයාට පෞරාණික වතාවත් කරන්න."

සුන්බුන් ගොඩ මැද හේඩීස්ව තනි කරමින් ඇලෙක්ටෝ, ළමයි සහ මරියාගේ සිරුර සෙවණැලි තුළට දිය වී ගියා.

"මම ඔයාට අනතුරු ඇඟෙව්වා," අලුත් කටහඬක් කියනවා ඇසුණා.

හේඩීස් හැරී බැලුවා. සෝපාවේ දුම් දමන සුන්බුන් අසල වෛවර්ණ ඇඳුමකින් සැරසුණු ගැහැනු ළමයෙක් සිටගෙන සිටියා. එයාට තිබුණේ කළු පාට කෙටි කොණ්ඩයක් සහ දුක්බර දෑසක්. එයාගේ වයස අවුරුදු දොළහට වැඩි වෙන්න බැහැ. මම එයාව හැඳිනුවේ නැති වුණත්, එයාගේ පෙනුමේ මොකක්දෝ අසාමාන්‍ය හුරු පුරුදු බවක් දැනුණා.

"මෙතැනට එන්න තරම් හයියක් නුඹට ආව ද?" හේඩීස් ගෙරෙව්වා. "නුඹව දූවිලිවලට කුඩු කරලා දාන්නයි වටින්නේ!"

"ඔයාට එහෙම කරන්න බැහැ," ගෑනු ළමයා කිවුවා. "ඩෙල්ෆිගේ බලය මාව ආරක්ෂා කරනවා."

ඇඟ පුරා පැතිරී ගිය හිරියක් සමඟ මට තේරුම් ගියේ මම මේ බලා සිටින්නේ ඩෙල්ෆිහි ඔරකල් ජීවමානව සහ තරුණව සිටි කාලය දිහා බවයි. කොහොම හරි, එයාව මේ විදිහට දකින එක මමියක් විදිහට දකිනවාටත් වඩා ලොමු දැහැගන්වන සුලු වුණා.

"මම ආදරේ කරපු ගෑනිව නුඹ මරලා දැම්මා!" හේඩීස් ගර්ජනා කළා. "අපිට මෙහෙම දෙයක් සිද්ධ කළේ නුඹේ අනාවැකියයි."

එයා ගෑනු ළමයාට ඉහළින් නැඟී සිටියත් ගෑනු ළමයා බයේ ඇකිළුනේ නැහැ.

"පිපුරුම ඇති කරලා ළමයි දෙන්නව විනාශ කරන්න නියම කළේ සියුස්," එයා කිවුවා, "මොකද ඔයා එයාගේ නියෝගයට අකීකරු වුණා. ඒකට මට කරන්න දෙයක් නැහැ. ඒ වගේම එයාලව ඉක්මනට හංගන්න කියලා මම ඔයාට අනතුරු අඟවලයි තිබුණේ."

"මට එහෙම කරන්න පුළුවන්කමක් තිබුණෙ නැහැ! මරියා ඒකට මට ඉඩ දුන්නෙ නැහැ! ඒ ඇරත්, එයාලා අහිංසකයි."

"ඒ කොහොම වුණත්, එයාලා ඔයාගේ දරුවෝ නේ. ඒකෙන් එයාලව අනතුරුදායක අය වෙනවා. ඔයා එයාලව ලෝටස් හෝටලය



අස්සෙ හංගලා තිබ්බත්, ඒකෙන් වෙන්නේ ප්‍රශ්නේ කල් යන එක විතරයි. නිකෝටයි බියන්කාටයි අවුරුදු දාසය ලබන්නෙ නැති වෙන්න, ආපහු ලෝකයට එකතු වෙන්න කොහෙත්ම හැකියාවක් නැහැ."

"නුඹේ අර මහා ලොකුයි කියන අනාවැකිය තමයි මේ ඔක්කොටම මුල. ඒ මදිවට දූන් නුඹ තවත් දරුවෝ හදන්නෙ නැතුව ඉන්න ප්‍රතිඥාවකුත් මගෙන් බලෙන් ම ගත්තා. නුඹ මගේ හැමදෙයක් ම නැති කළා!"

"මම අනාගතය දකිනවා විතරයි," ගෑනු ළමයා කිවුවා. "මට ඒක වෙනස් කරන්න බැහැ."

දෙවියාගේ ඇස්වල කළු පාට ගින්නක් ඇවිළෙද්දි, මොකක් හරි නරක දෙයක් වෙන්න යන බව මම දැනගත්තා. එතැනින් දුවන්න නැත්නම් හැංගෙන්න කියලා ගෑනු ළමයට මොර දෙන්න මට ඕනෑ වුණා.

"එහෙනම්, ඔරකල්, හේඩීස්ගේ වචන හොඳට අහගන්නවා," එයා ගෙරෙව්වා. "බාගදා මරියාව ආපහු ගේන්න මට බැරුව ඇති. ඒ වගේම නුඹේ මරණය වෙලාසනින් ගෙනත් දෙන්නත් මට බැරුව ඇති. ඒත් නුඹට තවමත් තියෙන්නේ මනුෂ්‍ය ආත්මයක්. ඒ නිසා නුඹට ශාප කරන්න මට තවමත් පුළුවන්."

ගෑනු ළමයාගේ ඇස් දෙක ලොකු වුණා. "ඔයාට බැහැ එහෙම-"

"මම දිවුරනවා," හේඩීස් කිවුවා, "මගේ දරුවෝ පිටුවහල්ලු විදිහට ඉන්න තාක් කල්, නුඹේ මහා අනාවැකියේ ශාපය යට මම දුක් විඳින තාක් කල්, ඩෙල්ෆි හී ඔරකල්ට වෙනත් මනුෂ්‍ය ධාරකයෙක් අත් කරගන්න බැරි වේවි. නුඹට කිසිම දවසක සාමදානයේ සැතපෙන්න නොලැබේවි. වෙන කවුරුවත් ම නුඹේ තැන ගන්නේ නැති වේවි. නුඹේ කය වේළිලා මැරිලා ගියාට පස්සෙත් ඔරකල්ගේ ආත්මය නුඹ තුළ සිර වී තියේවි. නුඹ දිරාපත් වෙලා ශූන්‍යයක් වෙන තුරු ම නුඹ නුඹේ කටුක අනාවැකි කියමින් ඉඳීවි. නුඹත් එක්ක ම ඔරකලුත් මැරිලා යාවි!"

ගෑනු ළමයා යටිගිරියෙන් කෑගසද්දී, මීදුම් රූපය පුපුරා සුනුවිසුණු වුණා. පර්සෙෆෝන්ගේ උද්‍යානයේ දණින් වැටුණු නිකෝගේ මුහුණ කම්පනයෙන් සුදුමැලි වී තිබුණා. එයා ඉදිරියේ සිටගෙන සිටියේ

කළු ලෝගුවෙන් සැරසී තමන්ගේ පුතාට රවාගෙන ඉන්නා ඇත්ත ම හේඩීස්.

"ඇත්තටම මොනවද," එයා නිකෝගෙන් ඇහුවා, "ඔයා මේ කරනවා කියලා හිතන්නේ?"

කළු පාට පිපුරුමකින් මගේ හීනය පිරුණා. ඊට පස්සේ දර්ශනය මාරු වුණා.

සුදු වැල්ලෙන් වැසුණු වෙරළක් දිගේ රේචල් එලිසබෙත් ඩෙයාර් ඇවිද යමින් සිටියා. පිහිනුම් ඇඳුම් කට්ටලයක් හැඳ සිටි එයා ඉණ වටේ ටී-ෂර්ට් එකක් ගැට ගසාගෙන සිටියා. එයාගේ උරහිස් සහ මුහුණ අව්වට පිළිස්සී තිබුණා.

දණ ගසාගත් එයා රළ වදින සීමාවේ ඇඟිල්ලෙන් ලියන්න පටන් ගත්තා. එයා ලියූ අකුරු ඇඳින ගන්න මම උත්සාහ කළා. මගේ වචන අන්ධතාවය වැඩ කරනවා කියලා මම මුලින් හිතුවත්, එයා ලියමින් සිටියේ පෞරාණික ග්‍රීක බසින් කියලා මට තේරුණේ පසුවයි.

ඒක වෙන්නෙ කොහොමද. මේ හීනය නම් බොරු එකක් වෙන්න ඕනෑ.

වචන කීපයක් ලියා නිම කළ රේචල් කෙඳිරුවා, "මොන මඟුලක් ද?"

මට ග්‍රීක කියවන්න පුළුවන් වුණත්, රළ වැදී සේදී යන්න කලින් මට කියවාගන්න හැකි වුණේ එක වචනයක් විතරයි: Περσεύς. ඒ මගේ නම: පර්සියස්.

දඩිබිඩියේ නැගිටගත් එයා රළ වදින සීමාවෙන් පසු බැස්සා.

"ඔහ්, දෙයියනේ," එයා කිවුවා. "ඒක තමයි තේරුම."

ආපසු හැරුණු එයා දුවන්න ගත්තා. එයාලගේ පවුලේ නිවාඩු නිකේතනය බලා වේගයෙන් දුවන එයාගේ කකුල් වැදී වැලි හතර අත විසිරුණා.

එයා හති දමමින් ඉදිරි දොරකඩ පඩි නැංගා. එයාගේ තාත්තා කියවමින් සිටි වෝල් ස්ට්‍රීට් ජර්නලයෙන් හිස ඔසවා බැලුවා.

"තාත්තේ" රේචල් අඩි හප්පමින් එයා ළඟට ගියා. "අපිට ආපහු යන්න වෙනවා."



එයාගේ තාත්තාගේ තොල් නළියන්න ගත්තේ හරියට හිනාවෙන්නෙ කොහොමද කියලා මතක් කරන්න උත්සාහ කරනවා වගෙයි. "ආපහු? අපි මෙහෙට ආවා විතරයි නේ."

"නිව්යෝර්ක්වල කරදරයක් වෙනවා. පර්සි ඉන්නේ අනතුරක."

"එයා ඔයාට කෝල් කරා ද?"

"නෑ... එහෙමමත් නෙවෙයි. ඒත් මම දන්නවා. ඒක මට දැනෙනවා."

මිස්ටර් ඩෙයාර් පත්තරය නැමුවා. "ඔයාගේ අම්මයි මමයි සෑහෙන කාලයක් තිස්සේ මේ නිවාඩුවට එන්න බලන් හිටියේ."

"නෑ, එහෙම නෑ! ඔයාලා දෙන්නට ම මේ වැල්ල පෙනෙන්න බැහැ! ඔයාලගේ තියෙන මුරණ්ඩුකමට ඒක පිළිගන්නේ නැහැ."

"දූන්, රේචල්-"

"මං ඔයාට කියන්නේ නිව්යෝක්වල මොකක් හරි නරක දෙයක් වෙනවා! මුළු නගරෙ ම... මම හරියට ම මොකක්ද කියලා දන්නෙ නැහැ, ඒත් ඒක ප්‍රහාරෙකට මැදිවෙලා තියෙන්නේ."

එයාගේ තාත්තා සුසුමක් හෙළුවා. "මං හිතන්නේ ඒ වගේ දෙයක් වුණා නම් අපිට ප්‍රවෘත්තිවලට අහන්න ලැබෙයි."

"නෑ," රේචල් තරයේ කියා සිටියා. "ඒ විදිහේ ප්‍රහාරයක් නෙවෙයි. අපි මෙහෙට ආවට පස්සේ ඔයාට එක ම එක කෝල් එකක්වත් ලැබුණ ද?"

එයාගේ තාත්තා රවා බැලුවා. "නෑ... ඒත් මේ ගිම්හානේ මැද සති අන්තයක් නේ."

"ඒ වුණාට ඔයාට හැම වෙලාවෙ ම කෝල් එනවා නේ," රේචල් කිවුවා. "මේක අමුතු දෙයක් කියලා ඔයාට පිළිගන්න වෙනවා."

එයාගේ තාත්තා පැකිළුණා. "අපිට නිකං ම පිටත් වෙන්න බැහැ. අපි මේකට සල්ලි ගොඩක් වියදම් කරලා තියෙන්නේ."

"බලන්න," රේචල් කිවුවා. "තාත්තේ... පර්සිට මාව ඕනෑ. මට එයාට පණිවුඩයක් දෙන්න තියෙනවා. ඒක ජීවිතයත් මරණයත් අතර දෙයක්."

"මොන පණිවුඩයක් ද? ඔයා මොනවා ගැන ද කියවන්නේ?"

"මට ඔයාට කියන්න බැහැ."

"එහෙනම් ඔයාට යන්නත් බැහැ."

රේචල් දෑස් වසා ගත්තේ එයාගේ ධෛර්යය වඩවා ගන්න වගෙයි. "තාත්තේ... මට යන්න දෙන්න. ඒකට හිලවු වෙන්න මම ඔයා එක්ක ගනුදෙනුවක් කරන්නම්."

මිස්ටර් ඩෙයාර් පුටුවේ ඉදිරියට වී වාඩි වුණා. ගනුදෙනු කියන්නේ එයාට තේරුම් ගන්න පුළුවන් දේවල්වලින් එකක්. "මං අහගෙන ඉන්නේ."

"ක්ලැරියන් බාලිකාව. මම- මම ලබන වාරේ ඉඳන් ඒකට යන්නම්. මම අඩු ගාණේ කණුකුණු ගාන්නෙවත් නැතුව ඉන්නම්. හැබැයි ඔයා මේ දැන් ම මාව ආපහු නිව්යෝර්ක්වලට යවන්න ඕනෑ."

සෑහෙන වෙලාවක් යන තුරු මිස්ටර් ඩෙයාර් නිහඬව සිටියා. ඊට පස්සේ ජංගම දුරකථනය අතට ගත් එයා ඇමතුමක් ගත්තා.

"ඩග්ලස්? ප්ලේන් එක ලෑස්ති කරන්න. අපි නිව්යෝර්ක්වලට යනවා. ඔව්... මේ දැන් ම."

රේචල් දෑත් විහිදා එයාව වැලඳ ගනිද්දී එයාගේ තාත්තා පුදුම වූ බවක් පෙනුණේ හරියට මීට කලින් කවදාවත් රේචල් එයාව වැලඳගෙන නැහැ වගෙයි.

"මම ඔයා කියන විදිහට ඉන්නම්, තාත්තේ!"

රේචල්ගේ තාත්තා හිනා වුණත්, එයාගේ මුහුණෙන් පළවුණේ මලානික ස්වභාවයක්. එයා රේචල් දිහා බලා සිටියේ හරියට එයාගේ දුව වෙනුවට අනාගතයේ ක්ලැරියන් බාලිකාවෙන් පිටතට එන එයාට උවමනා විදිහේ තරුණියව දකිනවා වගෙයි.

"ඔව්, රේචල්," එයා එකඟ වුණා. "ඔයා අනිවාර්යයෙන් ම එහෙම කරයි."

දර්ශනය වියැකී ගියා. මම හීනෙන් දෙඩවූවා: "රේචල්, එපා!"

තාලියා මාව සොලවා ඇහැරවන තුරු ම මම ඇඳේ පෙරළෙමින් දඟලමින් සිටියා.

"පර්සි," එයා කතා කළා. "එන්න යමු. දැන් හවස් වේගෙන එන්නේ. අපිට අමුත්තෝ වගයක් ඇවිත්."



මම නැගිටලා ඉඳගත්තේ අන්දමන්ද වෙලයි. ඒ ඇඳ ඕනෑවටත් වඩා සුව පහසුයි. ඒත් දවල්ට නිදාගන්න එක මට පෙනෙන්න බැරි වැඩක්.

"අමුත්තෝ?" මම ඇහුවා.

තාලියා බැරෑරුම් මුහුණින් ඔළුව වැනුවා. "ටයිටන් කෙනෙක්ට ඔයාව මුණ ගැහෙන්න ඕනෑලු, සටන් විරාම කොඩියක් යටතේ. එයා ඇවිත් ඉන්නේ ක්‍රෝනොස්ගෙන් පණිවුඩයක් අරගෙන."

## 13

# ටයිටන් කෙනෙක් මට ගෙනා තෑග්ග

හැතැප්ම බාගයක් දුර තියා ම අපිට සුදු කොඩිය දකගන්න හැකි වුණා. පාපන්දු පිටියක් තරම් ලොකු ඒ කොඩිය ඔසවාගෙන එමින් සිටියේ නිල් පාට හමක් සහ අයිස් වගේ අළු පාට කොණ්ඩයක් ඇති අඩි තිහක් උස යෝධයෙක්.

"හයිපර්බෝරියන් කෙනෙක්," තාලියා කිව්වා. "උතුරේ ඉන්න යෝධයෙක්. එයාලා ක්‍රෝනෝස්ගේ පැත්ත ගත්ත එක නම් හොඳ ලකුණක් නෙවෙයි. සාමාන්‍යයෙන් එයාලා සාමකාමී අය."

"ඔයාට එයාලව මුණගැහිලා තියෙනව ද?" මම ඇහුවා.

"ම්ම්ම්. ඇල්බර්ටාවල එයාලගේ ලොකු ජනාවාසයක් තියෙනවා. ඒ කට්ටිය හිම බෝල්වලින් ගහගන්න සෙල්ලම කරන්න නම් හොඳ අය නෙවෙයි."

යෝධයා කිට්ටුවට එද්දි, එයා සමග මනුෂ්‍ය-ප්‍රමාණයේ පුද්ගලයින් තුන් දෙනෙකුත් එන බව මට දකින්න ලැබුණා: සන්නාහයකින් සැරසුණු අර්ධ-ලෝහිතයෙක්, කළු ගවුමකින් සැරසුණු, ගිනි දලු නගින කෙස් කළඹක් ඇති එම්පොසා කෙනෙක් සහ ටක්සෙඩෝ කබායකින් සැරසුණු උස පිරිමියෙක්. එම්පොසා කබායකින් සැරසුණු හාදයාගේ අත අල්ලාගෙන හිටි නිසා ඒ දෙන්නව පෙනුණේ ප්‍රදර්ශනයකට යන පෙම්වතුන් වගෙයි. හැබැයි ඒකට එම්පොසාගේ ගිනි ගත්තා කොණ්ඩය සහ රත් ඇස් විතර නම් ගැළපුනේ නැහැ.



ඒ කණ්ඩායම නිවාඩු පාඩුවේ හෙක්ෂර් ක්‍රීඩා පිටිය දෙසට ඇවිද ආවා. එහි ඔංචිල්ලා සහ ක්‍රීඩාංගන හිස් වී තිබුණා. ඇහෙන්නට තිබුණ එක ම හඬ වුණේ අම්පයර් රොක් වතුර මලේ හඬ විතරයි.

මම ග්‍රෝවර් දිහා බැලුවා. "අර කබාකාරයා ටයිටන් කෙනෙක් ද?"

එයා ඔළුව වැනුවේ බයෙන් වගෙයි. "එයාට තියෙන්නේ මැජික්කාරයෙක්ගේ පෙනුමක්. මට මැජික්කාරයන්ව පෙනෙන්න බෑ. හුඟක් වෙලාවට එයාලා ළඟ හාවෝ ඉන්නවා නේ."

මම එයා දිහා බැලුවේ පුදුමයෙන්. "ඔයා හාවන්ට බයයි?"

"බ්ලාහා-හා-හා! උන් මහා දාමරිකයෝ. හැම වෙලාවෙ ම අසරණ සැටර්ලගෙ සැල්දිරි කොළ හොරකම් කරනවා!"

තාලියා බොරුවට කැස්සා.

"මොකද?" ග්‍රෝවර් ප්‍රශ්න කළා.

"ඔයාගේ ඔය හා හීතිකාවට අපිට පස්සෙ වෙලාවක මොනවා හරි කරන්න වෙනවා," මම කිව්වා. "මෙන්න එයාලා එනවා."

කබාකාරයා ඉදිරියට පියවර තැබුවා. එයා සාමාන්‍ය මනුෂ්‍යයෙකුට වඩා උසයි- අඩි හතක් විතර ඇති. එයාගේ කළු කොණ්ඩය පෝනිටේලයකට ගැට ගසා තිබුණා. අඳුරු, රවුම් ඇස් කණ්ණාඩි යුවළකින් එයාගේ දෑස් වැසී තිබුණා, ඒ වුණත් ඇත්තෙන්ම මගේ අවධානය ඩැහැගත්තේ එයාගේ මුහුණේ හමයි. ඒක සීරුම් කැළැල්වලින් වැහිලා තිබුණේ හරියට මොකෙක් හරි චූටි සතෙක්ගෙන් එයාට ප්‍රහාරයක් එල්ල වෙලා වගෙයි- සමහරවිට, හොඳටෝම තරහා ගිය හැම්ස්ටර් මීයෙක්ගෙන් වෙන්න ඇති.

"පර්සි ජැක්සන්," එයා මෘදුව කතා කළා. "මේක ලොකු ගෞරවයක්."

එයාගේ ගෑනු යාළුවා එම්පොසා මට පිම්බා. මට හිතෙන්නේ ගිය ගිම්හානයේ දී මම එයාගේ සහෝදරියෝ දෙන්නෙක් විනාශ කරපු හැටි එයාට අහන්න ලැබිලා තියෙන්න ඇති.

"මගෙ කෙල්ලේ," කබාකාරයා එයාට කිව්වා. "ඔයා අර හරියට ගිහිල්ලා සැප පහසුවට වාඩි වෙලා හිටියොත් මොකද, එහ්?"

Scanned with CamScanner

එයාගේ අත නිදහස් කළ එම්පොසා උද්‍යාන බංකුවක් දෙසට හෙමි හෙමින් ගියා.

මම කබාකාරයාගේ පිටුපස සිටි උප දෙවියා දිහාවට බැල්මක් හෙළුවා. එයා පැලඳ සිටි අලුත් හෙල්මටය නිසා මුල දී මට එයාව හඳුනා ගන්න බැරි වුණත්, එතැන හිටියේ අගේ ඉඳන් කන කාපු මගේ පරණ යාළුවා ඊතන් නකමුරා. විලියම්ස්බර්ග් පාලම උඩ දී අපි කළ සටනින් පස්සේ එයාගේ නහය තැලිච්ච තක්කාලි ගෙඩියක් වගේ වෙලා තිබුණා. ඒක දැකලා මගේ හිත ටිකක් හැඳුණා.

"හේයි, ඊතන්," මම කතා කළා. "ඔයා හිටියට වඩා ලස්සන වෙලා." ඊතන් මට තරහින් රැවුවා.

"අපි ආව රාජකාරියට බහිමු." කබාකාරයා අතක් දිගු කළා. "මම ප්‍රොමීතියස්."

එයාට අතට අත දෙන්නත් බැරි තරමට මම පුදුම වුණා. "ගින්දර හොරකම් කරපු කෙනා? අර ගලක-බැඳලා-ගිජුලිහිණියන්ට-කන්න-දාපු කෙනා?"

ප්‍රොමීතියස්ගේ මූණ වේදනාවෙන් ඇකිළුණා. එයා එයාගේ මුහුණේ වූ සීරුම් අතගෑවා. "කරුණාකරලා, ගිජු ලිහිණියන්ව නම් මතක් කරන්න එපා. ඒත් ඔව්, මම තමයි දෙවිවරුන්ගෙන් ගින්දර හොරකම් කරලා, ඔයාලගෙ මුතුන් මිත්තන්ට දුන්නේ. ඒ වෙනුවට, මහා කාරුණික සියුස් මාව දම්වැල්වලින් ගලක ගැට ගහලා සදාකාලයට ම වධ දුන්නා."

"ඒත්-"

"මං නිදහස් වුණේ කොහොමද කියලා ද අහන්නේ? ඒක කළේ හර්කියුලිස්, යුග ගාණකට කලින්. ඉතින් ඔයාට පේනවා නේ, වීරයෝ ගැන මගේ හිතේ තෙතමනයක් තියෙනවා. ඔයාලගෙන් සමහරුන්ව ශිෂ්ට සම්පන්න කරන්න පුළුවන්කම තියෙනවා."

"ඔයාගේ වටේට ඉන්න සමහරු ඇරෙන්න," මම කිවුවේ ඊතන් දිහා බලාගෙන වුණත්, පෙනුණු හැටියට ප්‍රොමීතියස් හිතුවේ මම අදහස් කළේ එම්පොසා ගැන කියලයි.

"ඔහ්, රාක්ෂයෝ ඒ තරම් ම නරක නෑ," එයා කිවුවා. "ඔයාට කරන්න තියෙන්නේ එයාලගෙ බඩ කට හොඳට පුරවලා තියාගන්න එක විතරයි. දැන්, පර්සි ජැක්සන්, අපි සාකච්ඡාවට බහිමු."



අපි පික්නික් මේසයකට වාඩි වුණා. තාලියා සහ ග්‍රෝවර් මට පිටුපසින් සිටගත්තා.

සුදු කොඩිය ගහකට හේත්තු කළ නිල් පාට යෝධයා සිහි කල්පනාව අඩු කෙනෙක් වගේ ක්‍රීඩා පිටියේ සෙල්ලම් කරන්න පටන් ගත්තා. මන්කි බාර් මත පය තැබූ එයා ඒවා කඩා දැමුවත්, එයා කේන්තියෙන් ඉන්න බවක් නම් පෙනුනේ නැහැ. එයා කළේ ඇහි බැම අකුළා ඒ දිහා බලලා "අහ්-ඔහ්." කියපු එක විතරයි. ඊට පස්සේ වතුර මල උඩින් පය තැබූ එයා කොන්ක්‍රීට් පාත්‍රය දෙකට කැඩුවා. "අහ්-ඔහ්." එයාගේ පය වැදුණු තැන වතුර මිදුණා. පුළුන් පිරවූ සත්තු-සැණකෙළියක දී තෑගි විදිහට ලැබෙන අති විශාල ප්‍රමාණයේ ඒවා ගොඩක් එයාගේ ඉණ පටියේ එල්ලෙමින් තිබුණා. එයාව දකිද්දි මට ටයිසන්ව මතක් වුණ නිසා ම, එයාට විරුද්ධව සටන් කරන්න වෙනවා කියලා හිතනකොට මගේ හිතට ලොකු දුකක් දැනුණා.

වාඩි වී සිටි පුටුවෙන් ඉදිරියට බර වූ ප්‍රොමීතියස් ඇඟිලි බැඳගත්තා. එයාට තිබුණේ අව්‍යාජ, කාරුණික සහ බුද්ධිමත් පෙනුමක්. "පර්සි, ඔයාලගේ තත්ත්වය දුර්වලයි. තවත් ප්‍රහාරයක් නතර කරන්න ඔයාලට බැරි බව ඔයා දන්නවා."

"අපි බලමුකෝ."

ප්‍රොමීතියස්ගේ මූණ වේදනාවෙන් බර වුණේ හරියට මට වෙන්න යන දේ ගැන එයා ඇත්තට ම කනස්සලු වෙනවා වගෙයි. "පර්සි, මම තමයි දූරදර්ශීභාවයේ ටයිටන්. ඉස්සරහට වෙන්න යන්නේ මොනවද කියලා මම දන්නවා."

"ඒ වගේම කෛරාටික උපදෙස්වලට අධිපති ටයිටන්," ග්‍රෝවර් මැදට පැන්නා. "ඒකෙදි 'කෛරාටික ' කියන වචනේ බර කරලා කියන්න ඕනෑ."

ප්‍රොමීතියස් උරහිස් ඇකිළුවා. "ඒකත් ඇත්ත, සැටර්. ඒත් මම අන්තිම සටනෙ දි උදවු කරේ දෙවිවරුන්ට. මම ක්‍රෝනොස්ට කිවුවා: 'ඔයාට ඒ තරම් ශක්තියක් නැහැ. ඔයා පරදියි.' කියලා. ඇත්තට ම මම කියපු දේ හරි ගියා. ඉතින් ඔයාට පේනවා නේ, දිනන පැත්ත තෝරගන්න විදිහ මම දන්නවා. මේ වතාවේ, මම උදවු කරන්නෙ ක්‍රෝනොස්ට."

"ඒ සියුස් ඔයාව ගලක ගැට ගහලා තියපු නිසා," මම අනුමාන කළා.

"එක පැත්තකින්, ඔව්. මට පළිගන්න උවමනා නැහැ කියලා කියන්නෙ නැහැ. ඒත් මම ක්‍රෝනොස්ට උදවු කරන්නෙ ඒ හේතුව නිසා විතරක් නෙවෙයි. ඒක තමයි බුද්ධිමත් ම තෝරාගැනීම. මම මෙහෙට ආවේ ඔයා හේතු දැක්වීමට කන් දෙයි කියලා හිතපු නිසයි."

එයා මේසය මත ඇඟිල්ලෙන් සිතියමක් ඇන්දා. එයාගේ ඇඟිල්ල වදින සෑම තැනක ම රන්වන් රේඛා මතු වී, කොන්ක්‍රීට් මත දිලිසෙන්න ගත්තා. "මේ තියෙන්නෙ මැන්හැටන්. අපේ හමුදා මෙතැන, මෙතැන, මෙතැන, වගේම මෙන්න මෙතැනත් ඉන්නවා. ඔයාලට ඉන්නේ කී දෙනා ද කියලා අපි දන්නවා. ඔයාලගේ එකාට අපේ පැත්තෙන් විසිදෙනා ගාණේ ඉන්නවා."

"ඔයාලගෙ ඔත්තුකාරයා ගාණට තොරතුරු දෙනවා වගේ," මම අනුමාන කළා.

ප්‍රොමීතියස් සමාව අයදින විදිහට හිනා වුණා. "කොයි හැටි වුණත්, අපේ බලකායන් දවසින් දවස වර්ධනය වෙනවා. අද රෑට, ක්‍රෝනොස් පහර දෙයි. ඔයාලව සම්පූර්ණයෙන් ම විනාශ කරලා දායි. ඔයා නිර්භීතව සටන් කරලා තියෙනවා, ඒත් මුළු මැන්හැටන් නගරේ ම අල්ලගෙන ඉන්න ඔයාට කොහෙත්ම පුළුවන්කමක් නැහැ. ඔයාලට එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලට පහුබහින්න සිද්ධ කරයි. එතැන දි ඔයාලව විනාශ වෙලා යයි. මම කල්තියා ම මේක දැකලයි තියෙන්නේ. ඒක අනිවාර්යයෙන් ම සිද්ධ වෙනවා."

මගේ හීනයේ දී රේචල් අඳිනවා දැකපු චිත්‍රය ගැන- එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල පාමුලට රැස් වූ හමුදාව ගැන මම හිතුවා. මට සිහිනයෙන් පෙනුණු තරුණ ඔරකල් ගැනු ළමයාගේ වචන මට සිහි වුණා: මම අනාගතය දකිනවා විතරයි. මට ඒක වෙනස් කරන්න පුළුවන්කමක් නැහැ. ප්‍රොමීතියස් කොයි තරම් නියත විදිහට කතා කළා ද කියනවා නම්, එයාව විශ්වාස නොකර ඉන්න අමාරු වුණා.

"ඒක සිද්ධ වෙන්න මම ඉඩ තියන්නෙ නැහැ," මම කිවුවා.

ප්‍රොමීතියස් එයාගේ කබා පටියේ වූ දූවිලි අංශුවක් පිස දැමුවා. "තේරුම් ගන්න, පර්සි. ඔයාලා මෙතැන ආයෙමත් ට්‍රෝජන් යුද්ධයක් කරන්නේ. ඉතිහාසය නැවත නැවතත් සිද්ධ වෙනවා. රාක්ෂයෝ වගේම ඒවත් නැවත හට ගන්නවා. මහා වැටලීමක්. හමුදා දෙකක්. එක ම වෙනස තමයි, මේ වතාවේ ඔයාගේ පැත්ත තමයි ප්‍රහාරෙ



වළක්වන්න ඉන්නේ. ඔයාලා තමයි ට්‍රෝයි නගරය. ට්‍රෝජන් වැසියන්ට සිද්ධ වුණේ මොකක්ද කියලා ඔයා දන්නවා නේ, නේද?"

"එතකොට දැන් ඔයාලා හදන්නෙ එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලේ සෝපානෙට ලී අශ්වයෙක්ව පටවන්න?" මම ඇහුවා. "සුබ පැතුම්."

ප්‍රොමීතියස් හිනා වුණා. "ට්‍රෝයි නගරය සහමුලින් ම විනාශ වුණා, පර්සි. මෙහෙටත් ඒක ම වෙනවා දකින්න ඔයාට ඕනෑ නෑ. යටත් වෙන්න, එතකොට නිව්යෝර්ක් නගරය ගලවගන්න පුළුවන්. ඔයාගේ හමුදාවට පොදු සමාවක් ලැබේවි. ඔයාගේ ආරක්ෂාව ගැන මම පෞද්ගලිකව ම සහතික වෙන්නම්. ක්‍රෝනොස්ට ඔලිම්පස් ගන්න ඉඩ දෙන්න. ඉතින් මොකද? කොහොමත් ටයිපූන් දෙවිවරුන්ව විනාශ කරලා දාන්නයි යන්නේ."

"හරි," මම කිවුවා. "එතකොට මට කියන්නේ ක්‍රෝනොස් නගරෙට කරදරයක් නොකර අත අරියි කියලා විශ්වාස කරන්න ද?"

"එයාට ඕනෑ ඔලිම්පස් විතරයි," ප්‍රොමීතියස් පොරොන්දු වුණා. "දෙවිවරුන්ගේ බල පරාක්‍රමය එයාලගේ බල ආසනවලට බැඳිලා තියෙන්නේ. පොසෙයිඩන්ගේ මුහුද යට මාලිගාවට ප්‍රහාරයක් වැදුණා ම සිද්ධ වුණ දේ ඔයා දැක්කා නේ."

මගේ තාත්තා වියපත් වෙලා, ජරා ජීර්ණ වෙලා හිටපු හැටි මතක් වෙද්දි මම වේදනාවෙන් ඇකිළුණා.

"ඔව්," ප්‍රොමීතියස් දුක්බරව කිවුවා. "ඒක ඔයාට අමාරු දෙයක් වුණා කියලා මම දන්නවා. ක්‍රෝනොස් ඔලිම්පස් විනාශ කරා ම, දෙවිවරු වියැකිලා යයි. එයාලා ඒ තරම් දුර්වල වුණා ම විනාශ කරන එක ලේසි වෙයි. බටහිර පැත්තේ ටයිපූන් ඔලිම්පියානුවන්ගේ අවධානේ තියාගෙන ඉන්න අතර වාරේ මේක ඉවර කරන්නයි ක්‍රෝනොස් වඩාත් කැමති. එතකොට වැඩෙත් පහසුයි. නැතිවෙන ජීවිත ගාණත් අඩුයි. හැබැයි වරද්ද ගන්න එපා, ඔයාලට කරන්න පුළුවන් ලොකු ම දේ අපේ වේගය අඩු කරන එක විතරයි. අනිද්දා වෙනකොට, ටයිපූන් නිව්යෝර්ක්වලට එනවා. ඊට පස්සේ ඔයාලට කිසිම අවස්ථාවක් නැති වෙයි. දෙවිවරුන්වයි, ඔලිම්පස් කන්දයි විනාශ වෙලා යයි, හැබැයි ඒ වැඩේ ගොඩක් අප්‍රසන්න දෙයක් වෙයි. ඔයාටයි ඔයාගේ නගරෙටයි ගොඩක්, ගොඩාක් නරක දෙයක් වෙයි. කොයි විදිහෙන් හරි, ටයිටන්ලා පාලනය අතට ගනියි."

Scanned with CamScanner

තාලියා මීට මොළවා ගත් අතින් මේසයට ගැහුවා. "මම සේවය කරන්නේ ආර්ටෙමිස්ට. දඩයක්කාරියෝ අපේ අන්තිම හුස්ම වැටෙනකල් ම සටන් කරනවා. පර්සි, ඔයා ඇත්තට ම මේ සෙවලයා කියන කතා අහන්න යන්නෙ නැහැ නේද?"

ප්‍රොමීතියස් එයාව කුඩු කරලා දායි කියලා මම හිතුවත්, එයා හිනා වුණා විතරයි.

"ඔයාගේ නිර්භීතකම වටිනා දෙයක්, තාලියා ග්‍රේස්."

තාලියා ගැස්සුණා. "ඒක මගේ අම්මගෙ වාසගම. මම ඒක පාවිච්චි කරන්නෙ නෑ."

"ඔයාගෙ කැමැත්තක්," ප්‍රොමීතියස් සාමාන්‍ය විදිහට කිව්වා, ඒ වුණත් එයා තාලියාව ඇතුළාන්තයෙන් ම සෙලවූ බව මට තේරුණා. තාලියාගේ වාසගම මීට කලින් කවදාවත් මට අහන්න ලැබිලා තිබුණේ නැහැ. කොහොම හරි ඒක නිසා එයාගේ ගුප්ත බව සහ බලගතු බව අඩු වෙලා, වඩාත් සාමාන්‍ය කෙනෙක් වගේ පේන්න ගත්තා.

"කොයි හැටි වුණත්," ටයිටන් කිව්වා, "ඔයා මගේ හතුරෙක් වෙන්න උවමනා නැහැ. මම හැමදාමත් මනුෂ්‍ය වර්ගයාගේ උදවුකාරයෙක් වෙලයි හිටියේ."

"තට්ට ගෙඩිය," තාලියා කිව්වා. "මිනිස් වර්ගයා දෙවිවරුන්ට මුල් ම පූජාව දෙනකොට, ඔයා එයාලව රවට්ටලා ඒකෙන් හොඳම කොටස ඔයාට ගත්තා. ඔයා අපිට ගින්දර දුන්නේ දෙවිවරුන්ව අවුස්සන්න මිසක් අපි ගැන හිතපු නිසා නෙවෙයි."

ප්‍රොමීතියස් ඔළුව හෙල්លුවා. "ඔයාට තේරෙන්නෙ නෑ. ඔයාලගේ රූප ස්වභාවය හැඩගස්වන්න උදවු කරේ මමයි."

නළියන මැටි ගුළියක් එයාගේ අතේ මතු වුණා. එයා ඒක අත් පා ඇති චූටි බෝනික්කෙක් වගේ හැඩ කළා. මැටි මිනිහට ඇස් තිබුණේ නැහැ, ඒත් ඒක ප්‍රොමීතියස්ගේ ඇඟිලි අතරින් ලිස්සා ගිහින් මේසය පුරා දඟලන්න ගත්තා. "ඔයාලගේ පැවැත්ම ආරම්භයේ ඉඳල ම මම මිනිස්සුන්ගේ කනට රහස් කෙඳිරුවා. ඔයාලගේ කුතුහලය, ගවේෂණයට තියෙන කැමැත්ත, අලුත් දේවල් නිපදවන්න ඇති හැකියාව වගේ දේවල් නියෝජනය කරන්නේ මමයි. ඔයාලව බේරගන්න මට උදවු කරන්න, පර්සි. මේ දේ කරන්න, ඊට පස්සේ මම මිනිස් වර්ගයාට තෑග්ගක් දෙන්නම්- ඔයාලව මේ තරම් දුර අරන් එන්න පුළුවන් වුණ ගින්දර වගේ තව අලුත් රහසක්. දෙවිවරු යටතේ



ඉඳලා ඒ විදිහේ දියුණුවක් ලබාගන්න ඔයාලට බැහැ. එයාලා කවදාවත් ඒකට ඉඩ දෙන්නෙ නැහැ. හැබැයි මේක ඔයාලගේ අලුත් ස්වර්ණමය යුගය වෙන්න පුළුවන්. එහෙමත් නැත්නම්..." එයා මිටි කරගත් අතින් ගසා මැටි මිනිහව රොටියක් කළා.

"අහ්-ඔහ්." නිල් පාට යෝධයා ගෙරෙව්වා. උද්‍යාන බංකුවේ වාඩිවෙලා හිටපු එම්පොසා උල් දත් විලිස්සමින් හිනා වුණා.

"පර්සි, ටයිටන්ලයි, එයාලගේ දූ දරුවො හැමදෙනාමයි නරක නැති බව ඔයා දන්නවා," ප්‍රොමීතියස් කිව්වා. "ඔයාට කැලිප්සෝව මුණ ගැහිලා තියෙනවා නේ."

මගේ කම්මුල් රත් වෙනවා මට දැනුණා. "ඒක මීට වඩා වෙනස්."

"කොහොමද? මං වගේම එයත් කිසිම වැරදි දෙයක් කළ කෙනෙක් නෙවෙයි, ඒ වුණත් එයා ඇට්ලස්ගේ දුවෙක් නිසා එයාව සදහට ම පිටුවහල් කරලා දැම්මා. අපි ඔයාලගෙ හතුරෝ නෙවෙයි. මේ දේවල් නරක ම අතට හැරෙන්න දෙන්න එපා," එයා අයැදුවා. "අපි ඔයාට පිළිගන්වන්නේ සාමය."

මම ඊතන් නකමුරා දිහා බැලුවා. "ඔයාට නම් මේක පේන්න බැරුව ඇති."

"ඔයා මොනවා කියනව ද මං දන්නෙ නැහැ."

"අපි මේ ගනුදෙනුවට කැමති වුණොත්, ඔයාට පළිගන්න ලැබෙන්නෙ නැතුව යනවා. ඔයාට අපි හැමෝවම මරන්න බැරි වෙනවා. ඔයාට ඕනෑ වෙලා තියෙන්නෙ ඒක නෙවෙයි ද?"

එයාගේ හොඳ ඇහැ තරහෙන් දිලිසුණා. "මට ඕනෑ එක ම දේ ගෞරවය, ජැක්සන්. දෙවිවරු කවමදාකවත් මට ඒක දුන්නෙ නැහැ. මම ඔහේලගෙ අර මෝඩ කඳවුරට ගිහිල්ලා, හර්මීස් කැබින් එක අස්සේ හිරවෙලා මගේ කාලේ ගෙවනවා දකින්න ඔහේලට ඕනෑ වුණේ මම වැදගත් නැති නිසා ද? අඩු තරමේ මාව පිළිගන්නවත් බැරි නිසා ද?"

එයා කතා කළේ මීට අවුරුදු හතරකට කලින් කැලෑවේ දී මාවූ මරන්න උත්සාහ කරපු වෙලාවේ ලූක් කතා කරපු විදිහටමයි. ඒ මතකය ඇවිස්සෙද්දී වළ ගෝනුස්සා මගේ අතට දෂ්ට කළ තැන ඇදුම් කන්න ගත්තා.

"ඔයාගේ අම්මා පළිගැනීමේ දෙවඟන නේ," මම ඊතන්ට කිව්වා. "අපි ඒකට ගෞරව කරන්න ඕනෑ ද?"

"නෙමෙසිස් පෙනී ඉන්නෙ සමබරතාවය වෙනුවෙන්! මිනිස්සුන්ට ඕනෑවටත් වඩා වාසනාව ලැබෙද්දි, එයා උන්ව ඉරලා දානවා."

"ඒ නිසා වෙන්නැති එයා ඔයාගේ ඇහැක් ගත්තේ?"

"ඒක ගාස්තුවක්," එයා ගෙරෙව්වා. "ඒකට හිලවුවට, දවසක මට බලය සමබර කරන්න දෙන්න එයා දිවුරුවා. මම සුළු දෙවිවරුන්ට ගෞරවය අරන් දෙනවා. ඇහැක් කියන්නේ ඒක වෙනුවෙන් සුළු ගාස්තුවක් විතරයි."

"නියම අම්මා කෙනෙක්."

"අඩු තරමේ එයා එයාගේ වචනේ රකිනවා, ඔලිම්පියානුවෝ වගේ නෙවෙයි. එයා හැම වෙලාවෙ ම එයාගේ ණය ගෙවනවා - හොඳ වුණත් නරක වුණත්."

"ඔව්," මම කිවුවා. "ඉතින් මම ඔයාගේ ජීවිතේ බේරුවා, මගේ ණය ගෙවන්න ඔයා ක්‍රෝනොස්ව නැගිට්ටුවා. කොච්චර සාධාරණ ද."

ඊතන් එයාගේ කඩු මිට ඩැහැ ගත්තත්, ප්‍රොමිතියස් එයාව නැවැත්තුවා.

"දූන්, දූන්," ටයිටන් කිවුවා. "අපි මේ ඇවිල්ලා ඉන්නේ දූත මෙහෙයුමකට."

ප්‍රොමිතියස් සැලකිල්ලෙන් මගේ දිහා බලා සිටියේ හරියට මගේ කේන්තිය තේරුම් ගන්න උත්සාහ කරනවා වගෙයි. ඊට පස්සේ මගේ මොළෙන් සිතුවිල්ලක් අහුල ගත්ත ගාණට එයා ඔළුව වැනුවා.

"ලූක්ට සිද්ධ වුණේ මොකක්ද කියලා ඔයා වධ වෙනවා," එයා තීරණය කළා. "හෙස්ටියා ඔයාට සම්පූර්ණ කතාව ම පෙන්නලා නැහැ. බාගදා ඔයා ඒක තේරුම් ගත්තොත්..."

ටයිටන් අතක් ඉදිරියට දිගු කළා.

තාලියා අනතුරු අඟවමින් කෑගැසුවා, ඒත් මට ප්‍රතික්‍රියා දක්වන්න ඉඩක් ලැබෙන්න කලින් ප්‍රොමිතියස්ගේ දබරැඟිල්ල මගේ නළල ස්පර්ශ කළා.

★★★

එක්වර ම මම ආයෙමත් මේ කාසලන්ගේ ගෙදර සාලයට ගිහින් හිටියා.



ගිනි උඳුන් පඩිය මත දල්වා තිබූ ඉටි පන්දම්වල එළි, බිත්ති දිගට ඇති කණ්ණාඩිවල වැදී පරාවර්තනය වුණා. මුළුතැන්ගෙයි දොරකඩ තුළින් මට පෙනුණේ මේසය අසල වාඩි වී සිටි තාලියාගේ තුවාල වූ කකුලට කාසලන් මහත්මිය වෙළුම් දමන හැටියි. අවුරුදු හතේ ඇනබෙත් ඒ ළඟින් ම වාඩි වෙලා මෙඩූසා සෙල්ලම් බෝනික්කා සමඟ සෙල්ලම් කරමින් සිටියා.

හර්මීස් සහ ලූක් එකිනෙකාට ඈතින් සාලයේ සිටගෙන සිටියා.

ඉටි පන්දම් එළියෙන් දෙවියාගේ මුහුණ දියාරු වෙලා වගේ පෙනුණේ හරියට මොන හැඩය තෝරා ගන්න ද තීරණය කරගන්න බැරුව වගෙයි. එයා තද නිල් පාට ව්‍යායාම ඇඳුම් කට්ටලයක් සහ පියාපත් ඇති රීබොක් සපත්තු ජෝඩුවක් හැඳ පැළඳගෙන සිටියා.

"මොකද අන්තිමේට දැන් ආවේ?" ලූක් ප්‍රශ්න කළා. එයාගේ උරහිස් තදින් ඇදී තිබුණේ සටනක් අපේක්ෂාවෙන් වගෙයි. "පහුගිය අවුරුදු ගාණක් තිස්සේ මං ඔයාට කතා කරා, මගේ ඉස්සරහ පෙනී හිටින්න කියලා යාඥා කළා, ඒත් කිසිම දෙයක් නැහැ. ඔයා මාව අරයා ළඟ තනි කරලා ගියා." එයා මුළුතැන්ගෙය දිහාවට අත දිගු කළේ හරියට එයාගේ අම්මගෙ නම කියනවා කෙසේ වෙතත්, එයා දිහා බලන්නවත් අකමැත්තෙන් වගෙයි.

"ලූක්, එයාට අගෞරව කරන්න එපා," හර්මීස් අවවාද කළා. "ඔයාගේ අම්මා එයාට පුළුවන් උපරිමයෙන් කළා. මං ගැන කියනවා නම්, ඔයාගේ ජීවිතේට ඇඟිලි ගහන්න මට බැහැ. දෙවිවරුන්ගේ දරුවෝ තමන්ගේ පාර තනියම හොයාගන්න ඕනෑ."

"එතකොට ඒ ඔක්කොම කළේ මගේම හොඳටයි. මගේ ආරක්ෂාව මම ම හොයාගෙන, රාක්ෂයෝ එක්ක සටන් කර කර පාරවල් ගානේ හැදෙන්න ඇරපු එක."

"ඔයා මගේ පුතා," හර්මීස් කිවුවා. "ඒ හැකියාව ඔයාට තියෙනවා කියලා මම දැනගෙන හිටියා. අත දරුවෙක් කාලේ, මමත් මගේ තොටිල්ලෙන් දණ ගාගෙන එළියට ගිහිල්ලා-"

"මම දෙවියෙක් නෙවෙයි! එක ම එක පාරක්වත් ඔයාට මොනවා හරි කියන්න තිබුණා. ඔයාට උදවු කරන්න තිබුණා-" සැලෙන හුස්මක් ගත් එයා, මුළුතැන්ගෙයි සිටින අයට නෑසෙන්න එයාගේ කටහඬ පහත දැමුවා "-අරයට අර ෆිට් එක හැදිලා, මාව අල්ලගෙන හොලව හොලවා මගේ ඉරණම ගැන විකාර කියවන්න ගන්න වෙලාවකවත් ඔයාට

උදවු කරන්න තිබුණා. එයාගේ අර... අර දිලිසෙන ඇස්වලින් මාව හොයාගන්න බැරි වෙන්න මම අල්මාරි අස්සෙ හැංගුණු වෙලාවකවත්, මගේ බය ගැන ඔයා ගණන් ගත්ත ද? අන්තිමේ දී මම ගෙදරින් පැනලා ගියා කියලවත් අඩු තරමේ ඔයා දැනගෙන හිටිය ද?"

මුළුතැන්ගෙය තුළ, කාසලන් මහත්මිය තාලියාට සහ ඇනබෙත්ට කුල්-එයිඩ් වත්කර දෙමින්, ලූක්ගේ පොඩි කාලේ ගැන ඔහේ කියවමින් සිටියා. තාලියා එයාගේ වෙළුම් දැමූ කකුල කලබලෙන් අත ගෑවා. සාලය දෙසට බැල්මක් හෙළූ ඇනබෙත් පිළිස්සුණු විස්කෝතුවක් ලූක්ට පෙනෙන්න ඔසවා, 'දැන් අපි යමු ද?' කියලා තොල් මතුරා ඇහුවා.

"ලූක්, මම ගොඩක් සැලකිල්ලෙන් හිටියේ," හර්මීස් හෙමිහිට කිවුවා, "ඒත් දෙවිවරුන්ට මිනිස්සුන්ගේ වැඩපලවලට කෙලින් ම මැදිහත් වෙන්න බැහැ. ඒක පෞරාණික නීතිවලින් එකක්. විශේෂයෙන් ම ඔයාගේ ඉරණම..." එයාගේ හඬ ඇන හිටියා. එයා ඉටි පන්දම් දිහා ඇසි පිය නොහෙළා බලා සිටියේ හරියට මොකක් හෝ අප්‍රසන්න දෙයක් සිහි කරනවා වගෙයි.

"මොකක්ද?" ලූක් ඇහුවා. "මොකක්ද මගේ ඉරණම?"

"ඔයාට තිබුණේ ආපහු නැවිත් ඉන්න," හර්මීස් කෙඳිරුවා. "ඒකෙන් වෙන්නේ ඔය දෙන්න ම අවුල් වෙන එක විතරයි. කොහොම වුණත්, දැන් ඔයා උදවුවක් නැතුව යන්න බැරි තරම් ලොකු වෙනවා කියලා මට පේනවා. මම අර්ධ-ලෝහිත කඳවුරේ කයිරොන්ට කතා කරලා, ඔයාව එකතු කරගෙන යන්න සැටර් කෙනෙක් එවන්න කියන්නම්."

"ඔයාගේ උදවු නැතුවට කමක් නෑ," ලූක් ගෙරෙව්වා. "දැන්, මගේ ඉරණම ගැන ඔයා කිවුවෙ මොකක්ද?"

හර්මීස්ගේ සපත්තු ජෝඩුවේ පියාපත් කලබලෙන් සැලුණා. හර්මීස් තමන්ගේ පුතාගේ මුහුණ මතකයේ තැන්පත් කරගන්න උත්සාහ කරනවා වගේ එයා දිහා බලා සිටියා, ඒ වෙලාවේ එක්වර ම මගේ ඇඟ පුරා හිරියක් පැතිරුණා. මේ කාසලන් දොඩවන දේවල්වල තේරුම හර්මීස් දැන සිටි බව මට තේරුම් ගියා. ඒ කොහොමද කියලා මට විශ්වාසයක් නොවුණත්, එයාගේ මුහුණ දිහා බලද්දි මට ඒ බව මුළුමනින්ම සහතික වුණා. කවදා හරි දවසක ලූක්ට වෙන්න යන දේ ගැන, එයා දුෂ්ටයෙක් වෙන විදිහ ගැන හර්මීස් දැන සිටියා.



"මගෙ පුතේ," එයා කිවුවා, "මම තමයි සංචාරකයින්ගේ වගේම තව ගොඩක් දේවල්වලත් දෙවියා. මම දන්න දෙයක් තියෙනවා නම්, ඒ ඔයා ඔයාගෙ ම පාරක යන්න ඕනෑ කියන එකයි. ඒක මගේ හිත කඩලා දානවා වුණත්."

"ඔයා මට ආදරේ නැහැ."

"මම දිවුරනවා මම... මම ඔයාට ආදරෙයි. කඳවුරට යන්න. ඔයාට ඉක්මනට ගවේෂණයක් ලැබෙන්න මම සලස්වන්නම්. බාගදා ඔයාට හයිඩ්‍රාව පරද්දවන්න, නැත්නම් හෙස්පෙරිඩීස්ලගෙන් ඇපල් හොරකම් කරන්න පුළුවන් වෙයි. අරකට කලින් ඔයාට ශ්‍රේෂ්ඨ වීරයෙක් වෙන්න අවස්ථාවක් ලැබෙයි..."

"මොකට කලින් ද?" දැන් ලූක්ගේ කටහඬ තිබුණේ වෙවුලමින්. "මගේ අම්මා මේ වගේ තත්ත්වෙකට වැටෙන්න මොනවද එයා දැක්කේ? මට මොනවද වෙන්න යන්නේ? ඔයා මට ආදරෙයි නම්, ඒක කියන්න."

හර්මීස්ගේ මුහුණේ ස්වභාවය දරදඬු වුණා. "මට බැහැ."

"ඒ කියන්නෙ ඔයා මාව ගණන් ගන්නෙ නෑ!" ලූක් මොර දුන්නා.

මුළුතැන්ගෙය තුළ වූ කතාබහ හිටි අඩියේ ම නැවතුණා.

"ලූක්?" මේ කාසලන් කතා කළා. "ඒ ඔයා ද? මගේ කොල්ලා හොඳින් ද?"

ලූක් මුහුණ සඟවා ගන්න අනෙක් පැත්තට හැරුණත්, එයාගේ ඇස්වල වූ කඳුළු මට දැකගන්න හැකි වුණා. "මම හොඳින්. මට දැන් අලුත් පවුලක් තියෙනවා. මට ඔය දෙන්නගෙන් කාවවත් ඕනෑ නැහැ."

"මම ඔයාගේ තාත්තා," හර්මීස් කියා සිටියා.

"තාත්තා කෙනෙක් නම් ළඟ ඉන්න එපැයි. මට මීට කලින් අඩු ගාණේ ඔයාව මුණ ගැහිලාවත් නැහැ. තාලියා, ඇනබෙත්, මෙහෙ එන්න! අපි දැන් යනවා!"

"මගේ පුතේ, යන්න එපා!" මේ කාසලන් එයාට අඬගැසුවා. "මම ඔයාගේ දවල් කෑම ලෑස්ති කරා!"

ලූක් කේන්තියෙන් එළියට බහිද්දී තාලියා සහ ඇනබෙත් එයා පස්සෙන් ගැටුවා. මේ කාසලන් එයා පසුපස යන්න උත්සාහ කළත්, හර්මීස් එයාව නවත්වා ගත්තා.

Scanned with CamScanner

ඉදිරි දොර මහ හඬින් වැසී යද්දී, හර්මීස්ගේ දෑත් අතරට කඩා වැටුණු මේ ගැහෙන්න පටන් ගත්තා. එයාගේ ඇරුණු ඇස් කොළ පාටින් දිලිසුණා. එයා හර්මීස්ගේ උරහිස් තදින් ඩැහැ ගත්තා.

"මගේ පුතා," එයා වියළි හඬකින් පිම්බා. "අනතුරක්. භයානක ඉරණමක්!"

"මං දන්නවා, මගේ වස්තුවේ," හර්මීස් දුක්බරව කිවුවා. "මාව විශ්වාස කරන්න, මං දන්නවා."

★★★

ඒ රූපය වියැකී ගියා. ප්‍රොමීතියස් මගේ නළලින් අත ඉවතට ගත්තා.

"පර්සි?" තාලියා කතා කළා. "මොකක්ද... මොකක්ද ඒ?"

මම දහඩියෙන් තෙතබරිත වෙලා කියලා මට තේරුණා.

ප්‍රොමීතියස් අනුකම්පාවෙන් ඔළුව වැනුවා. "හරිම දරුණුයි, නේද? සිද්ධ වෙන්න යන දේ දෙවිවරු දැනගෙන ඉඳලත්, එයාලා කිසිම දෙයක් කරේ නැහැ. අඩු තරමේ එයාලගෙ ම දරුවන්ටවත්. ඔයාට ඔයාගේ අනාවැකිය එළි කරන්න එයාලා කොච්චර කාලයක් ගත්ත ද, පර්සි ජැක්සන්? ඔයාට වෙන්න යන දේ ගැන ඔයාගේ තාත්තා දැනගෙන හිටියා කියලා ඔයාට හිතෙන්නෙ නැද්ද?"

මම හිටියේ එයට උත්තර දෙන්න බැරි තරම් තුෂ්ණීම්භූත වෙලයි.

"පර්ර්සී," ග්‍රෝවර් අනතුරු ඇඟෙව්වා. "එයා ඔයාගේ හිත එක්ක සෙල්ලම් කරනවා. ඔයාව තරහා ගස්සන්නයි හදන්නේ."

ග්‍රෝවර්ට චිත්තවේග කියවන්න හැකියාව තිබුණු නිසා, ප්‍රොමීතියස්ගේ බලාපොරොත්තුව ඉෂ්ට වේගෙන එන බව එයාට තේරෙන්න ඇති.

"ඔයා ඇත්තට ම ඔයාගේ යාළුවා ලූක්ට වැරැද්ද පටවනව ද?" ටයිටන් මගෙන් ඇහුවා. "එතකොට ඔයා ගැන මොකද, පර්සි? ඔයාව ඔයාගේ ඉරණමෙන් පාලනය වෙන්න අරිනව ද? ක්‍රෝනොස් ඔයාට යෝජනා කරන්නේ ඊට වඩා ගොඩාක් හොඳ ගනුදෙනුවක්."

මම මගේ අත් මිටි කරගත්තා. ප්‍රොමීතියස් මට පෙන්වා තිබූ දේවල්වලට මම කොයි තරම් වෛර කළත්, මම ක්‍රෝනොස්ට ඊටත් වඩා ගොඩාක් වෛර කළා. "මමත් ඔයාට යෝජනාවක් කරන්නම්.



ක්‍රෝනොස්ට කියන්න එයාගේ ප්‍රහාරය අස් කරගෙන, ලූක් කාසලන්ගේ ඇඟ අත ඇරලා, ආපහු ටාටරස්වලට මකබෑවෙන්ඩ කියලා. එතකොට සමහරවිට මට එයාව විනාශ කරන්න වෙන්නෙ නැති වෙයි."

එම්පොසා දත් විලිස්සා ගෙරෙව්වා. එයාගේ කොණ්ඩයෙන් අලුත් ගිනි කඳක් පිට පැන්නා, ඒත් ප්‍රොමීතියස් සුසුමක් හෙළුවා විතරයි.

"ඔයා හිත වෙනස් කරගත්තොත්," එයා කිවුවා, "මගේ ළඟ ඔයාට තෑග්ගක් තියෙනවා."

ග්‍රීක බඳුනක් මේසය උඩින් මතු වුණා. අඩි තුනක් විතර උස සහ අඩියක් පළල එය කළු-සුදු ජ්‍යාමිතික හැඩතලවලින් ඔප දමා තිබුණා. එහි පියන් මැටි පියන ලෙදර් බැම්මකින් බැඳ තිබුණා.

ඒක දැකපු හැටියේ ග්‍රෝවර්ට කෙඳිරි ගැවුණා.

තාලියා මහ හඬින් හීල්ලුවා. "ඒක නෙවෙයි නේද-"

"ඔව්," ප්‍රොමීතියස් කිවුවා. "ඔයා ඒක අඳුන ගත්තා නේ."

බරණිය දිහා බලද්දි මට අමුතු බයක හැඟීමක් දැනුණත්, ඒ ඇයි කියලා නම් හිතාගන්න බැරි වුණා.

"මේක අයිති වෙලා තිබුණේ මගේ නැනාට," ප්‍රොමීතියස් පැහැදිලි කරා. "පැන්ඩෝරාට."

මගේ උගුරේ මොකක්දෝ හිර වෙනවා වගෙයි මට දැනුණේ. "අර, පැන්ඩෝරාගේ පෙට්ටගමේ කතාවේ වගේ?"

ප්‍රොමීතියස් ඔළුව හෙල්ලුවා. "මේ පෙට්ටගමක කතාව කොහෙන් පටන් ගත්ත ද මට තේරෙන්නෙ නැහැ. ඒක කොහෙත්ම පෙට්ටියක් නෙවෙයි. ඒක පයිතොස් එකක්, බඩු ගබඩා කරන බරණියක්. මං හිතන්නේ පැන්ඩෝරාගේ බරණිය කිවුවා ම අර තරම් ගතියක් නැහැ තමයි, ඒත් ඒකෙන් වැඩක් නෑ. ඇත්තටම ඔව්, එයා මේ බරණිය ඇරියා, මේක ඇතුළේ තමයි දැන් මනුෂ්‍ය වර්ගයා අතරේ ගැවසෙන රාක්ෂයෝ ගොඩක් හිර කරලා තිබුණේ- බය, මරණය, බඩගින්න, ලෙඩ රෝග."

"මාව අමතක කරන්න එපා," එම්පොසා පුරුපුරු ගෑවා.

"ඇත්තටම," ප්‍රොමීතියස් පිළිගත්තා. "මේ බරණිය ඇතුළේ හිරවෙලා හිටපු පළවෙනි එම්පොසාව නිදහස් කළෙත් පැන්ඩෝරා. ඒ වුණාට මේ කතන්දරෙන් මම වැඩිපුර ම පුදුම වෙන දේ මොකක්ද දන්නව ද- හැමෝම පැන්ඩෝරාට දොස් කියන එක. එයාට දඬුවම් ලැබුණේ එයාගේ කුතුහලය නිසායි. දෙවිවරු ඔයාලට මේ කතාවෙන්

ඉගෙන ගන්න තියෙන පාඩම ඒකයි කියලා විශ්වාස කරන්න සැලැස්සුවා: මිනිස් වර්ගයා ගවේෂණාත්මක නොවිය යුතුයි. ඔවුන් ප්‍රශ්න නොකළ යුතුයි. ඔවුන්ට නියෝග ලැබෙන දේ පමණක් කළ යුතුයි. ඇත්ත ම කියනවා නම්, පර්සි, මේ බරණිය සියුස් අනිත් දෙවිවරු එක්ක එකතු වෙලා හදපු උගුලක්. ඒක මගෙනුයි මගේ මුළු පවුලේ ම අයගෙනුයි- ඒ කියන්නේ මගේ අසරණ අවංක සහෝදරයා එපොමිතියස්ගෙනුයි, එයාගේ බිරිඳ පැන්ඩෝරාගෙනුයි පළිගන්න කරපු දෙයක්. පැන්ඩෝරා මේ බරණිය ඇරලා බලනවා කියලා දෙවිවරු දැනගෙන හිටියා. එයාලා අපිටත් එක්ක ම මුළු මිනිස් සංහතියට ම දඬුවම් කරන්න කැමැත්තෙන් හිටියේ."

හේඩීස් සහ මරියා ඩි ආන්ජෙලෝ සිටි මගේ හීනය ගැන මම කල්පනා කළා. උප දෙවි දරුවෝ දෙන්නෙක්ව මරන්න සියුස් සම්පූර්ණ හෝටලයක් ම විනාශ කරලා තිබුණා- ඒකත් එයා කළේ අනාවැකියකට බයේ, එයාගේම ඇඟ බේරගන්න විතරයි. එයා අහිංසක ගෑනු කෙනෙක්ව මරා දැමුවත්, ඒ ගැන එක මොහොතකටවත් කණගාටු වෙන්න නැතුව ඇති. හේඩීස් කියන්නෙත් ඊට වඩා හොඳ කෙනෙක් නෙවෙයි. සියුස්ගෙන් පළිගන්න තරම් බලවත් නොවුණ නිසා, එයා කළේ ඔරකල්ට ශාප කරලා, තරුණ ගෑනු ළමයෙකුට බිහිසුණු ඉරණමක් අත් කර දුන් එකයි. එතකොට හර්මීස්... ඇයි එයා ලූක්ව අත ඇරලා දැම්මේ? ඇයි එයා අඩු තරමේ ලූක්ට අනතුරු ඇඟෙව්වේවත් නැත්තේ? නැත්නම් ඇයි එයා දුෂ්ට පැත්තට නොහැරෙන්න ඇතිදැඩි කරන්න උත්සාහ කරේ නැත්තේ?

සමහරවිට ප්‍රොමීතියස් මගේ හිත එක්ක සෙල්ලම් කරමින් ඉන්න ඇති.

බැරි වෙලාවත් එයා හරි නම්? මගේ හිතේ පැත්තක් පුදුම වුණා. දෙවිවරු ටයිටන්ලට වඩා හොඳ වෙන්නෙ කොහොමද?

ප්‍රොමීතියස් පැන්ඩෝරාගේ බරණියේ පියනට තට්ටු කළා. "පැන්ඩෝරා මේක ඇරියට පස්සේ එක ම එක බලවේගයක් විතරක් ඇතුළේ ඉතුරු වුණා."

"බලාපොරොත්තුව," මම කිව්වා.

ප්‍රොමීතියස් එයින් සතුටු වුණා වගෙයි පෙනුණේ. "බොහොම හොඳයි, පර්සි. එල්පිස්, බලාපොරොත්තුවේ බලවේගය, මනුෂ්‍ය සංහතිය දාලා යන්නෙ නැහැ. බලාපොරොත්තුව අවසර නැතුව පිටවෙලා යන්නෙ නැහැ. එයාව නිදහස් කරන්න පුළුවන් මිනිස් දරුවෙකුට විතරයි."



ටයිටන් බරණිය මේසය හරහා තල්ලු කළා.

"දෙවිවරු මොන වගේ ද කියලා සිහිපත් කරවීමක් විදිහට මේක මම ඔයාට දෙනවා," එයා කිව්වා. "ඔයා කැමති නම්, එල්පිස්ව තියාගන්න. හැබැයි ඔයා විනාශයන් දැක්කා ඇති, වැඩකට නැති දුක් වේදනා දැක්කා ඇති කියලා තීරණය කළොත්, මේ බරණිය අරින්න. එල්පිස්ට යන්න දෙන්න. බලාපොරොත්තුව අත අරින්න, එතකොට ඔයා යටත් වෙන බව මට දැනගන්න ලැබෙයි. ක්‍රෝනොස් අනුකම්පාසහගත වෙයි කියලා මම පොරොන්දු වෙනවා. නොමැරී ඉතුරු වෙලා ඉන්න අයට එයා යන්න අරියි."

බරණිය දිහා බලාගෙන ඉන්නකොට මට දැනුණේ හරිම නරක හැඟීමක්. පැන්ඩෝරාත් මං වගේ එහෙම පිටින් ම ඒ.ඩී.එච්.ඩී. තිබුණ කෙනෙක් වෙන්න ඇති කියලා මම හිතුවා. මේ වගේ දේකට තියෙන්න ඇරලා පාඩුවේ ඉන්න මට කොහෙත්ම බැහැ. ඒ වගේ පෙලඹවීම්වලට මම කැමති වුණේ නැහැ. බැරි වෙලාවත් මගේ තෝරාගැනීම මේක නම්? සමහරවිට අනාවැකියේ කියවෙන්නේ මම මේ බරණිය වහල ම තියාගන්නව ද, නැත්නම් ඒක අරිනව ද කියන තීරණය ගැන නම්.

"මට මේක ඕනෑ නෑ," මම ගෙරෙව්වා.

"පරක්කු වැඩියි," ප්‍රොමීතියස් කිව්වා. "තෑග්ග දීලා ඉවරයි. ඒක ආපහු ගන්න බැහැ."

එයා නැගී සිටියා. එම්පොසා ඉදිරියට ඇවිත් එයාගේ අත ගත්තා.

"මොරේන්!" ප්‍රොමීතියස් නිල් පාට යෝධයාට කතා කළා. "අපි යන්නයි හදන්නේ. ඔයාගේ කොඩිය ගන්න."

"අහ්-ඔහ්," යෝධයා කිව්වා.

"අපි ඉක්මනට ම ඔයාව බලන්න එනවා, පර්සි ජැක්සන්," ප්‍රොමීතියස් පොරොන්දු වුණා. "එක විදිහකින් නැත්නම් අනිත් විදිහෙන්."

ඊතන් නකමුරා අන්තිම වතාවටත් මට වෛරයෙන් පිරුණු බැල්මක් හෙළුවා. ඊට පස්සේ සාම දූත කණ්ඩායම ආපසු හැරී මධ්‍යම උද්‍යානය හරහා ඇති පටු පාර දිගේ යන්න ගියේ හරියට මේක හරි ම සාමාන්‍ය ඉරිදාවක හවස් වරුවක් වගෙයි.

# 14

# උරුරු පියාසැරිය

ආපනු ප්ලාසා හෝටලයට ගියාට පස්සේ තාලියා. මාව පැත්තකට ඇදගෙන ගියා. "ප්‍රොමීතියස් මොනවද ඔයාට පෙන්නුවේ?"

අකමැත්තෙන් වුණත්, මම මේ කාසලන්ගේ ගෙදර දසුන ගැන එයාට කිවුවා. තාලියා එයාගේ කලවය අත ගෑවේ පරණ තුවාලය සිහිවෙලා වගෙයි.

"ඒක නම් හරිම නරක රැයක්," එයා පිළිගත්තා. "එතකොට ඇනබෙත් ගොඩක් පොඩියි, එයා දැකපු දේවල් ඇත්තට ම තේරුම් ගන්න ඇති කියලා මම හිතන්නෙ නෑ. එයා දැනගෙන හිටියේ ලූක් ඉන්නේ අවුලකින් කියලා විතරයි."

මම හෝටලේ ජනේල හරහා මධ්‍යම උද්‍යානය දිහා බැලුවා. උතුරු දෙස පොඩි පොඩි ගිනි ගැනීම් තවමත් තිබුණත්, ඒවා ඇරෙන්න මුළු නගරය ම අස්වාභාවික ලෙස සාමකාමී වෙලා වගෙයි පෙනුණේ. "මේ කාසලන්ට සිද්ධ වුණේ මොකක්ද කියලා ඔයා දන්නව ද? මං ඇහුවේ-"

"ඔයා අහන දේ මම දන්නවා," තාලියා කිවුවා. "එයාට, මේ, එහෙම වෙනවා මම කවදාවත් දැකලා නැහැ, ඒත් එයාගේ ඇස් දිලිසෙන විදිහ ගැන, එයා දොඩවන අමුතු දේවල් ගැන ලූක් මට කියලා තියෙනවා. මේ ගැන කාටවත් කියන්නෙ නැහැ කියලා එයා මාව පොරොන්දු කරවා ගත්තා. එහෙම වෙන්න හේතුව මොකක්ද,



මට කිසිම අදහසක් නැහැ. ලූක් ඒක දැනගෙන හිටියත්, මට කවදාවත් කියලා නැහැ."

"හර්මීස් නම් දැනගෙන හිටියා," මම කිවුවා. "මොකක් හරි හේතුවකට මේ කාසලන්ට ලූක්ගේ අනාගතෙන් ටිකක් දකින්න ලැබුණා, ඒ වගේම ඉස්සරහට සිද්ධ වෙන දේ ගැන- ලූක් ක්‍රෝනොස්ට හැරෙන බව හර්මීස් තේරුම් ගත්තා."

තාලියා නළල රැළි කර බැලුවා. "ඔයාට ඒ ගැන හරියට ම සහතික වෙන්න බැහැ. මතකයි නේ, ඔයා දැකපු ඒවා මෙහෙයුවේ ප්‍රොමීතියස්, පර්සි, එයා සිද්ධ වුණ දේ පුළුවන් තරම් නරක ම විදිහටයි පෙන්නුවේ. හර්මීස් ලූක්ට ආදරේ කළා. ඒක එයාගේ මූණ බැලුවා ම මට තේරුණා. ඒ වගේම එදා රෑ හර්මීස් එතැන හිටියේ එයා මේ ගේ සුව දුක් හොයලා බලන්න ආව නිසයි. එයා සම්පූර්ණයෙන් ම නරක කෙනෙක් නෙවෙයි."

"ඒ වුණත් එයා කරපු දේවල් හරි කියන්න බැහැ නේ," මම තරයේ කියා සිටියා. "ලූක් එතකොට පොඩි එකෙක් විතරයි. ඒත් හර්මීස් කවදාවත් එයාට උදවු කළේ නැහැ, ලූක් ගෙදරින් පැනලා යද්දි එයාව නතර කළේවත් නැහැ."

තාලියා එයාගේ දුන්න උරහිසට දමා ගත්තා. ඒ වෙලාවේ ආයෙමත් වතාවක් මගේ හිතට වැදුණේ වයස් ගතවීම නැවතුණාට පස්සේ එයාට කොයි තරම් ශක්තිමත් පෙනුමක් ලැබිලා ද කියලයි. දැන් එයා වටේට රිදී දීප්තියක්- ආර්ටෙමිස්ගේ ආශිංසනය- පෙනෙන නොපෙනෙන තරමට තිබුණා.

"පර්සි," එයා කතා කළා, "ලූක්ට අනුකම්පා කරන්න පටන් ගන්න ඔයාට බැහැ. අපි හැමෝටම දුෂ්කර දේවල් එක්ක ගනුදෙනු කරන්න වෙනවා. හැම උප දෙවියෙකුට ම එහෙමයි. අපේ දෙමව්පියෝ අපි ළඟ ඉන්නෙ ම නැති තරම්. ඒත් ලූක් ගත්තේ නරක තීරණ. එහෙම කරන්න කියලා කවුරුවත් එයාට බල කරේ නැහැ නේ. ඇත්ත ම කියනවා නම්-"

එයා ශාලාව පහළට බැල්මක් හෙළුවේ අපි තනියම ඉන්න බව සැක හැරගන්නයි. "මම ඇනබෙත් ගැන කරදරෙන් ඉන්නේ. එයාට යුද්දෙ දී ලූක්ට මූණ දෙන්න වුණොත්, එයාට ඒක කරන්න පුළුවන් වෙයි ද මං දන්නෙ නෑ. එයාගේ හිතේ හැම වෙලාවෙ ම ලූක් ගැන තෙතමනයක් තිබුණා."

Scanned with CamScanner

එයාගේ මූණට ලේ පිරෙනවා මට දැනුණා. "එයාට අවුලක් වෙන එකක් නැහැ."

"ලූක් මන්දා. එදා රෑට පස්සේ, අර අපි එයාගේ අම්මගේ ගෙදරින් පිටවෙලා ආවට පස්සේ? ලූක් හිටියට වඩා ගොඩක් වෙනස් වුණා. එයා නපුරු, ඉක්මනට කේන්ති යන කෙනෙක් වුණේ හරියට එයාට මොකක් හරි ඔප්පු කරලා පෙන්වන්න දෙයක් තිබුණා වගෙයි. ලූක්ව අපිව හොයාගෙන, කඳවුරට අරන් යන්න උත්සාහ කරන කොට පවා... හොඳයි, අපිට ඒ තරම් කරදර ගොඩක් ඇති වෙන්න එක හේතුවක් වුණේ ලූක්ගේ නොසැලකිලිවන්තකම. අපි ඉස්සරහට යන්න වෙන හැම රාක්ෂයා එක්ක ම සටන් කරන්න එයාට ඕනෑ වුණා. ඇනබෙත්ට නම් ඒක ප්‍රශ්නයක් විදිහට පෙනුනේ නැහැ. ලූක් එයාගේ වීරයා වෙලා හිටියේ. එයා තේරුම් ගත්ත එක ම දේ ලූක්ගේ දෙමව්පියෝ නිසා එයා ගොඩක් දුක් වෙනවා කියන එක විතරයි. ඒ නිසා ද කොහෙදෝ ඇනබෙත් හැම වෙලාවෙ ම එයාව ආරක්ෂා කරන්න බැලුවා. එයා තවමත් එහෙමයි. මම මේ කියන්නේ... ඔයත් ඒ උගුලෙ ම පැටලෙන්න හදන්න එපා. ලූක් දැන් එයාව ක්‍රෝනොස්ට දීලා ඉවරයි. අපිට එයාට අනුකම්පා කරන්න බැහැ."

ඈත එපිට හාර්ලෙම්වල පැතිරෙන ගින්න දිහා බලාගෙන මම පුදුම වුණේ ලූක්ගේ නරක තෝරාගැනීම් නිසා මේ මොහොතේ විපතට පැටලුණු මිනිස්සු කී දෙනෙකුගේ ජීවිත අනතුරේ වැටිලා ද කියලයි.

"ඔයා හරි," මම කිවුවා.

තාලියා මගේ උරහිසට තට්ටුවක් දැම්මා. "මම දඩයක්කාරියන්ව බලන්න යනවා, ඊට පස්සේ කළුවර වැටෙන්න කලින් තව ටිකක් පිරික්සන්න ඕනෑ. ඔයත් කොහෙන් හරි ඇල වුණොත් හොඳයි."

"මේ වෙලාවේ මට ඕනෑ කරන අන්තිම දේ තමයි තව හීන."

"මං දන්නවා, මං කියනවට විශ්වාස කරන්න." එයාගේ අඳුරු නිලුණුවර දකලා මට පුදුම හිතුණේ එයා හීනෙන් දකිනවා ඇත්තේ මොනවද කියලයි. ඒක උප දෙවිවරුන්ගේ පොදු ප්‍රශ්නයක්: අපි ඉන්න තත්ත්වය අනතුරුදායක වැඩි වෙන තරමට, අපිට පෙනෙන සිහින වඩාත් නරක අතට හැරිලා, ඒවා පෙනෙන වාර ගණනත් වැඩි වෙනවා. "ඒත් පර්සි, විවේක ගන්න ඔයාට ආයේ ඉඩක් ලැබෙයි ද කියන්න



බැහැ නේ. අද රෑ දිග ම දිග රැයක් වෙන්නයි යන්නේ- සමහරවිට අපේ අන්තිම රැය වෙන්නත් පුළුවන්."

ඒ කතාවට මම කැමති වුණේ නැතත්, එයා හරි කියලා මම දැනගෙන හිටියා. වෙහෙසබරව ඔළුව වැනූ මම පැන්ඩෝරාගේ බරණිය එයාට දුන්නා. "මට උදව්වක් කරන්න. මේක හෝටලේ වෝල්ට් එකකට දාලා අගුළු දානව ද? මං හිතන්නෙ මට පයිතොස් ඇලර්ජික්."

තාලියා හිනා වුණා. "මං ඒ ගැන බලාගන්නම්."

ළඟම තිබුණු ඇඳ හොයාගෙන ගිය මම නින්දට වැටුණා. ඒ වුණත් ඇත්ත වශයෙන් ම නින්ද මට අරගෙන ආවේ තවත් නරක හීන විතරයි.

★★★

මගේ තාත්තාගේ වතුර යට මාලිගාව මට දකින්න ලැබුණා. දැන් වඩාත් කිට්ටුවට ඇවිත් හිටපු හතුරු හමුදාව මාලිගාවට යාර සිය ගාණක් එපිටින් ආරක්ෂක වළල්ලක් සාදාගෙන සිටියා. බලකොටු බිත්ති මුළුමනින් ම විනාශ වෙලා. මගේ තාත්තා මූලස්ථානය විදිහට පාවිච්චි කළ දේවස්ථානය ග්‍රීක ගින්දරින් දැවෙමින් තිබුණා.

මම අවි ගබඩාවට ළං වී බලද්දී, මගේ සහෝදරයා සහ තවත් සයික්ලොප්ස්ලා ටිකක් දවල් කෑම ගනිමින් ඉන්නවා මට පෙනුණා. එයාලා අති විශාල බරණිවල දැමූ පීනට් බටර් කමින් සිටියා (මුහුද යට දී ඒවාගේ රස කොහොමද කියලා නම් මගෙන් අහන්න එපා, මොකද මටත් ඒක දැනගන්න ඕනෑ නැහැ). මම බලා සිටිය දී ම, අවි ගබඩාවේ පිටත බිත්තිය පුපුරා ගියා. සයික්ලොප්ස් යුද භටයෙක් පය පැකිළෙමින් ඇතුළට විසි වී, කෑම මේසය උඩට ඇදගෙන වැටුණා. ටයිසන් දණ ගසාගෙන එයාට උදවු කරන්න බැලුවත්, ඒ වෙද්දි පරක්කු වැඩියි. සයික්ලොප්ස් මුහුදු රොන් මඩ ගොඩකට විසිරී ගියා.

සතුරු යෝධයෝ විවරය දිහාවට එද්දී, ටයිසන් මරණයට පත් වූ යුද භටයාගේ මුගුර අහුලා ගත්තා. එයා මිතුරු කම්මල්කරුවන්ට 'පොසෙයිඩන් වෙනුවෙන්!' වගේ මොකක්දෝ එකක් මොර ගැසුවා, ඒත් එයා කටේ පුරවාගෙන හිටපු පීනට් බටර් නිසා ඒක ඇහුණේ "පන් ජ්ටෙහ් බන්!" වගෙයි. මිටි සහ තියන් ඩැහැ ගත් එයාගේ නෑදෑ පිරිවර "පීනට් බටර්!" කියා මොර දෙමින් ටයිසන් පසුපස සටනට දිවුවා.

ඊට පස්සේ දර්ශනය මාරු වුණා. මම ඊතන් නකමුරා සමඟ සතුරු කඳවුරට ගොස් සිටියා. දකින්න ලැබුණු දෙයින් මම වෙවුලා

Scanned with CamScanner

ගියා, ඒකට එක හේතුවක් වුණේ එයාලගේ හමුදාව අති විශාල වීමයි. අනෙක් හේතුව මම ඒ තැන හඳුනා ගත් නිසයි.

අපි සිටියේ නිව් ජර්සිවල පිටිසරබද කොටසේ, බංකොලොත් වෙමින් පැවතුණ ව්‍යාපාර සහ කඩමාලු වූ වෙළඳ දැන්වීම් පුවරු දෙපස ඇති, ගරා වැටෙමින් යන පාරකයි. කැඩුණු වැටකින් වට වූ විශාල මිදුලක සිමෙන්ති ප්‍රතිමා පිරී තිබුණා. වෙළඳ සැලට ඉහළින් වූ නාම පුවරුව රතු පාට වැල් අකුරුවලින් ලියා තිබුණු නිසා කියවන්න අපහසු වුණත්, එයින් කියවෙන දේ මම දැනගෙන හිටියා: එම් නැන්දාගේ මහා බහිරව වෙළඳපොළ.

මේ තැන ගැන මම අවුරුදු ගාණකින් හිතලාවත් තිබුණේ නැහැ. එතැන ජරාවාස වී ඇති බව පැහැදිලිව ම පෙනුණා. එහි තිබූ ප්‍රතිමා කැඩිලා බිඳිලා, විසිරි-පින්තාරු බලි කුරුටුවලින් වැහිලයි තිබුණේ. සිමෙන්ති සැටර් කෙනෙකුගේ- ග්‍රෝවර්ගේ ෆර්ඩිනැන්ඩ් මාමාගේ- අතක් නැතිවෙලා. ගබඩාවේ වහලයෙන් කොටසක් කඩා වැටිලා. දොරේ අලවා තිබූ කහ පාට ලොකු දැන්වීමේ 'පරිහරණයට නුසුදුසු ය' කියා සටහන් කර තිබුණා.

කූඩාරම් සහ ගිනි මැල සිය ගාණකින් ඉඩම වට වී තිබුණා. මට වැඩිපුර ම දකින්න ලැබුණේ රාක්ෂයෝ වුණත්, අතරින් පතර යුද ඇඳුමින් සැරසුණු මිනිස් කුලී හේවායෝ සහ සන්නාහයෙන් සැරසුණු උප දෙවිවරුත් හිටියා. ගබඩාවට පිටතින් එල්ලා තිබුණු දම්-සහ-කළු කොඩිය නිල් පාට යෝධ හයිපර්බෝරියානුවෝ දෙන්නෙක් මුර කරමින් සිටියා.

ළඟින් ම වූ කඳවුරු ගිනි මැලය අසල ඊතන් ඇන තියාගෙන සිටියා. තවත් උප දෙවිවරු දෙන්නෙක් එයා සමඟ වාඩි වී කඩු මුවහත් කරමින් සිටියා.

විවර වූ ගබඩාවේ දොර තුළින් ප්‍රොමීතියස් එළියට ආවා.

"නකමුරා," එයා කතා කළා. "උතුමාණන්ට ඔයා එක්ක කතා කරන්න ඕනෑලු."

ඊතන් පරීක්ෂාකාරීව නැගී සිටියා. "මොකක් හරි ප්‍රශ්නයක් ද?"

ප්‍රොමීතියස් හිනා වුණා. "ඒක ඔයා ම එයාගෙන් අහගත්තොත් හොඳයි."



අනිත් උප දෙවිවරු දෙන්නගෙන් කෙනෙක් හිනාව තද කරගත්තා. "කාලා වරෙන්කෝ."

කඩු පටිය නැවත සකසා ගත් ඊතන් ගබඩාව තුළට ගියා.

වහලයේ තිබූ විවරය ඇරුණා ම, එතැන මට මතක තිබුණා වගේමයි. භීතියට පත් මිනිසුන් බෙරිහන් දෙන අතර මඟ දී ම ගල් ගැසුණු ප්‍රතිමා. කෙටි කෑම වර්ග තැබීම සඳහා වූ කවුන්ටරය අසල කොටසේ තිබූ පික්නික් මේස සියල්ල පැත්තකට ගොඩ කරලා තිබුණා. සෝඩා යන්ත්‍රය සහ විස්කෝතු උඳුන හරි මැද රන්වන් සිංහාසනයක් තිබුණා. ක්‍රෝනොස් එය මත හාන්සි වී, එයාගේ දෑකැත්ත උකුල මත තබාගෙන සිටියා. ජීන්ස් එකකින් සහ ටී-ෂර්ට් එකකින් සැරසී සිටි එයාගේ මුහුණේ වූ කල්පනාබර බැල්ම නිසා එයාට මුළුමනින් ම වගේ මනුෂ්‍ය පෙනුමක් ලැබී තිබුණා- හරියට මට දකින්න ලැබුණු දර්ශනවල එයාගේ ඉරණම හෙළි කරන්න කියලා හර්මීස්ට බැගෑපත් වෙමින් සිටි පොඩි ලූක් වගෙයි. ඒ වෙලාවේ ඊතන්ව දැකලා ලූක්ගේ මූණට හරිම අමනුෂ්‍ය හිනාවක් නැඟුණා. එයාගේ රන් පාට ඇස් දිලිසුණා.

"හොඳයි, නකමුරා. සාමදූත මෙහෙයුම ගැන නුඹ මොනවද හිතුවේ?"

ඊතන් පැකිළුණා. "මං හිතන්නේ ප්‍රොමීතියස් උතුමා තමයි මේ ගැන කතා කරන්න වඩාත් ගැළපෙන-"

"ඒත් මම ඇහුවේ නුඹෙන්."

ඉදිරියටත් පසුපසටත් වේගයෙන් දිව ගිය ඊතන්ගේ හොඳ ඇහැ, ක්‍රෝනොස් වටා සිටගෙන සිටි මුරකරුවන්ව සටහන් කරගත්තා. "මං... මම නම් හිතන්නේ නැහැ ජැක්සන් යටත් වෙයි කියලා. කිසිම දවසක."

ක්‍රෝනොස් ඔළුව වැනුවා. "මට කියන්න තව මොනවා හරි නුඹ ළඟ තියෙනව ද?"

"න්-නෑ, සර්."

"නුඹ ඉන්නේ කලබලෙන් වගෙයි, ඊතන්."

"නෑ, සර්. ඒක මේ... මට අහන්න ලැබුණා මේ තැන-"

"මෙඩූසාගෙ කියල ද? ඔව්, හරියට ම හරි. ලස්සන තැනක්, නෙහ්? අවාසනාවට, ජැක්සන් අතින් මැරුම් කෑවට පස්සේ මෙඩූසා තවමත් ප්‍රතිසංස්කරණය වෙලා නැහැ. ඒ නිසා එයාගේ පිළිම ගොඩට

එකතු වෙන්න වෙයි කියලා බය වෙන්න කාරි නැහැ. ඒ ඇරත්, ඊට වඩා ගොඩාක් භයානක බලවේග මේ කාමරේ තියෙනවා."

ක්‍රෝනොස් බැඳපු අල පෙති හඬ නගා කමින් සිටි ලයිස්ට්‍රිගෝනියානු යෝධයෙක් දිහා බැලුවා. ක්‍රෝනොස් අතක් වැනුවා ම යෝධයා ගල් ගැසුණා. බැඳපු අල පෙත්තක් යෝධයාගේ අත සහ කට අතර මැද අවකාශයේ එල්ලෙමින් තිබුණා.

"උන්ව මොකට ගල් කරනව ද," ක්‍රෝනොස් ඇසුවා, "කාලය ම නතර කරන්න පුළුවන්කම තියෙද්දි?"

එයාගේ රන්වන් ඇස් ඊතන්ගේ මුහුණ පසාරු කරගෙන ගියා. "දැන්, මට තව එක දෙයක් කියනවා. ඊයේ ඊ විලියම්ස්බර්ග් පාලම උඩ දී මොනවද සිද්ධ වුණේ?"

ඊතන් වෙවුලුවා. එයාගේ නළලේ දාඩිය බිංදු මතු වුණා. "මං... මං දන්නෙ නෑ, සර්."

"ඔව්, නුඹ දන්නවා." ක්‍රෝනොස් එයාගේ අසුනෙන් නැගිට්ටා. "නුඹ ජැක්සන්ට පහර දුන්නා ම, මොනව හරි දෙයක් සිද්ධ වුණා. එතැන මොකක්දෝ වැරැද්දක් තිබුණා. අර කෙල්ල, ඇනබෙත්, නුඹේ පාර හරස් කරගෙන පැන්නා."

"එයාට ඕනෑ වුණේ කොල්ලව බේරගන්න."

"ඒත් එයාට තුවාල කරන්න කාටවත් බැහැ," ක්‍රෝනොස් හෙමිහිට කිව්වා. "නුඹ ම ඒක දැක්කා නේ."

"මට ඒක විස්තර කරන්න බැහැ. සමහරවිට කෙල්ලට ඒ බව අමතක වෙන්න ඇති."

"එයාට අමතක වුණා," ක්‍රෝනොස් කිව්වා. "ඔව්, ඒක තමයි වෙන්න ඇත්තේ. අනේ ඉතින්, මගේ යාළුවට තුවාල කරන්න කාටවත් බැහැ කියලා මට අමතක වුණ නිසා මම එයා වෙනුවෙන් පිහි පාරක් කෑවා. ඌප්ස්. මට කියනවා, ඊතන්, ජැක්සන්ට අනින්න ගියපු වෙලාවේ නුඹ ඉලක්ක කරේ කොතැනට ද?"

ඊතන්ගේ ඇහි බැම් එකට හා වුණා. පිහි තලයක් අල්ලගෙන සිටින විදිහට අත මිට් කරගත් එයා, වේගයෙන් අනිනවා වගේ අභිරූපණය කළා. "මට හරියට ම විශ්වාස නැහැ, සර්. ඒ ඔක්කොම සිද්ධ වුණේ හරිම ඉක්මනට. මම එහෙම විශේෂ තැනක් ඉලක්ක කරේ නැහැ."



ක්‍රෝනොස් එයාගේ දැකැත්තේ මිටට ඇඟිලිවලින් තට්ටු කළා.

"ඒකත් එහෙමද," එයා නොසතුටු හඬින් කිව්වා. "නුඹේ මතකය වැඩි දියුණු වුණොත්, මං බලාපොරොත්තු වෙනවා-"

හදිසියේ ම ටයිටන් රජාගේ මුහුණ වේදනාවෙන් ඇකිළුණා. කෙළවරක ගල් ගැසී සිටි යෝධයා එයින් මිදෙද්දී, බැදපු අල පෙත්ත එයාගේ කටට වැටුණා. කකුල් පැකිළෙමින් ආපස්සට ගිය ක්‍රෝනොස් සිංහාසනයට ඇද වැටුණා.

"මගේ උතුමාණෙනි?" ඊතන් ඉස්සරහට යන්න හැදුවා.

"මම-" ඒ කටහඬ දුබල වුණත්, එක මොහොතකට ඒ ඇසුණේ ලූක්ගේ හඬයි. ඊට පස්සේ ක්‍රෝනොස්ගේ මුහුණේ ස්වභාවය දැඩි වුණා. අතක් එසවූ එයා හෙමින් සීරුවේ ඇඟිලි නවමින් දිග ඇරියේ ඒවාට කීකරු වෙන්න බල කරනවා වගෙයි.

"මේක ඒ හැටි දෙයක් නෙවෙයි," එයා කියද්දී, එයාගේ කටහඬ ආයෙමත් දැඩි වෙලා තිබුණා. "පොඩි අපහසුවක් විතරයි."

ඊතන් දෙතොල් තෙත් කරගත්තා. "එයා තවමත් ඔබතුමාට විරුද්ධව සටන් කරනවා, නේද? ලූක්-"

"මනස්ගාත," ක්‍රෝනොස් කඩා පැන්නා. "ඔය බොරුව ආයෙමත් කියලා තිබුණොත්, මම නුඹේ දිව කපලා දානවා. ඒ කොල්ලගෙ ආත්මේ විනාශ කරලා දාලා ඉවරයි. මම තාම මේ ඇඟට හැඩ ගැහෙනවා විතරයි. ඒකට විවේකය අවශ්‍යයි. ඒක කරදරයක් වුණත්, තාවකාලික අපහසුවකට වැඩි දෙයක් නෙවෙයි."

"එහ්... එහෙමයි, උතුමාණෙනි."

"නුඹ!" කොළ පාට සන්නාහයකින් සහ කොළ පාට ඔටුන්නකින් සැරසී සිටි ඩ්‍රැකනෙයි කෙනෙකුට ක්‍රෝනොස් දැකැත්ත දිගු කළා. ''සෙස් රැජින, නේ?"

"එහෙමයි, උතුමාණෙනි."

"අපේ පුංචි පුදුමය නිදහස් කරන්න ලෑස්ති ද?"

ඩ්‍රැකනෙයි රැජින උල් දළ විලිස්සුවා. "අපොයි, ඔව්, මගේ උතුමාණෙනි. ඒක හරිම ආසා හිතෙන පුදුම කිරීමක් වෙයි."

"විශිෂ්ටයි," ක්‍රෝනොස් කිව්වා. "මගේ සහෝදරයා හයිපරියන්ට කියනවා අපේ ප්‍රධාන බලකාය මධ්‍යම උද්‍යානේ දකුණට ගෙනියන්න

Scanned with CamScanner

කියලා. අර්ධ-ලෝහිතයෝ අවුල් වෙලා ඉන්න විදිහට, උන්ට උන්ගේ ආරක්ෂාව සලසා ගන්න බැරි වෙයි. දැන් යනවා, ඊතන්, නුඹේ මතකය වැඩි දියුණු කරගන්න බලනවා. අපි මැන්හැටන් අල්ල ගත්තට පස්සේ ආයේ මේ ගැන කතා කරමු."

ඊතන් නැමී ආචාර කළා, ඒත් එක්ක ම මගේ හීනය අන්තිම වතාවටත් මාරු වුණා. මට කඳවුරේ මහ ගෙදර දකින්න ලැබුණා, හැබැයි ඒ වෙනත් කාලයක්. මහ ගෙදර පින්තාරු කර තිබුණේ නිල් පාට වෙනුවට රතු පාටින්. අත් පන්දු පිටියේ සිටි කඳවුරුකරුවෝ අනූව දශකයේ මුල් භාගයේ කොණ්ඩා මෝස්තර දමාගෙන සිටියා. ඒවා නම් රාක්ෂයෝ බය කරන්න හොඳ ඇති කියලා මට හිතුණා.

මහ ගෙදර පියස්ස යට කයිරොන්, හර්මීස් සහ බබෙක් වඩාගෙන හිටපු ගෑනු කෙනෙක් සමඟ කතා කරමින් සිටියා. කයිරොන්ගේ කොණ්ඩය දැනට වඩා කෙටි සහ තද පාට වුණා. හර්මීස් සුපුරුදු ව්‍යායාම ඇඳුම් කට්ටලයෙන් සහ පියාපත් සහිත සපත්තු කුට්ටමෙන් සැරසී සිටියා. එයා සමඟ සිටි ගැහැනු කෙනා උස, සුන්දර කෙනෙක්. එයාට තඹ පාට කොණ්ඩයක්, දිලිසෙන දෑසක් සහ මිත්‍රශීලී සිනහවක් තිබුණා. එයාගේ අතේ හිටපු බබා නිල් පාට බ්ලැන්කෙට්ටුව තුළ දඟලමින් ඇඹරුණේ අර්ධ-ලෝහිත කඳවුරේ ඉන්න චුට්ටක්වත් කැමති නැහැ වගෙයි.

"ඔයා මෙහෙට ආව එක අපිට ගෞරවයක්," කයිරොන් ගැහැනු කෙනාට කිවුවත්, එයාගේ කටහඬේ තිබුණේ කලබලයක්. "කඳවුරට මනුෂ්‍යයෙකුට ඇතුළු වෙන්න ඉඩ දුන්නේ සෑහෙන කාලෙකට පස්සේ."

"එයාට උල්පන්දම් දෙන්න එපා," හර්මීස් ගෙරෙව්වා. "මේ, ඔයාට මේක කරන්න බැහැ."

ඒ වෙලාවේ තිගැස්මක් සමඟ මට තේරුම් ගියේ මම දකින්නේ මේ කාසලන්ව බවයි. එයාව මට මුණ ගැහිලා තිබුණු වයසක ගැහැනු කෙනා ළඟින්වත් තියන්න බැහැ. එයාව පෙනුණේ ජීවය උතුරා යන කෙනෙක් වගෙයි- හරියට එක හිනාවකින් තමන් වටේ ඉන්න හැමෝවම සනසන්න පුළුවන් කෙනෙක් වගෙයි.

"ඔහ්, ඔච්චර කරදර වෙන්න එපා," මේ කිවුවේ බබාව නලවමින්. "ඔයාලට ඔරැකල් කෙනෙක් ඕනෑ, නේද? කලින් හිටපු එක්කෙනා මැරිලා දැන්, අවුරුදු විස්සක් විතර වෙනවා නේ?"

"ඊටත් වැඩියි," කයිරොන් බරපතළ හඬින් කිවුවා.



හර්මීස් දෑත් ඉහළට එසෙව්වේ කෝපයෙන්. "මං ඒ කතාව ඔයාට කිවුවේ, ඔයාට මේකට ඉල්ලුම් කරන්න නෙවෙයි. ඒක අනතුරුදායකයි. කයිරොන්, එයාට කියන්නකෝ."

"ඇත්තටම ඔව්," කයිරොන් අනතුරු ඇඟෙව්වා. "අවුරුදු ගාණක් තිස්සේ මම කාටවත් ඒකට උත්සාහ කරන එක පවා තහනම් කරලා තියෙන්නේ. සිද්ධ වුණේ මොකක්ද කියලා අපි හරියට ම දන්නෙ නැහැ. ඔරැකල්ගේ ධාරකයා වෙන්න මනුෂ්‍ය වර්ගයාට තිබුණ හැකියාව නැතිවෙලා වගේ."

"අපි මේ ගැන කතා කළා නේ," මේ කිවුවා. "ඒ වගේම මම දන්නවා මට මේක කරන්න පුළුවන්. හර්මීස්, මේක තමයි මොකක් හරි හොඳ දෙයක් කරන්න මට ලැබෙන අවස්ථාව. මට මේ දෘෂ්ටිය තෑග්ගක් විදිහට ලැබිලා තියෙන්නේ විශේෂ හේතුවකට."

ඔය කරන්න යන දේ නවත්තන්න කියලා මේ කාසලන්ට මොර දෙන්න මට ඕනෑ වුණා. ඊළඟට වෙන්න යන දේ මම දැනගෙන හිටියා. එයාගේ ජීවිතය විනාශ වෙලා තියෙන්නේ කොහොමද කියලා අන්තිමේ දී මට තේරුණා. 'ඒත් මට හෙලවෙන්නවත්, කතා කරගන්නවත් බැරි වුණා.

හර්මීස් හිටියේ කනස්සලු වෙනවාට වඩා වේදනාවෙන් වගෙයි. "ඔයා ඔරැකල් වුණොත්, ඔයාට කසාද බඳින්න බැහැ," එයා මැසිවිලි නැඟුවා. "ඊට පස්සේ තව දුරටත් ඔයාට මාව දකින්න බැහැ."

මේ එයාගේ බාහුව උඩින් අතක් තැබුවා. "කොහොමත් මට හැමදාට ම ඔයාව තියාගන්න බැහැ නේ, නේද? ඔයා ඉක්මනින් ම යන්න යයි. ඔයා අමරණීය කෙනෙක් නේ."

එයා ඒකට විරෝධය පාන්න හැදුවත්, මේ එයාගේ පපුව උඩින් අතක් තැබුවා. "ඒක ඇත්ත කියලා ඔයා ම දන්නවා! බොරුවට මගේ හිත හදන්න මහන්සි වෙන්න එපා. ඇරත්, අපිට දැන් ලස්සන දරු පැටියෙක් ඉන්නවා. මම ඔරැකල් වුණාට පස්සෙත් මට ලූක්ව හදාගන්න බැරිකමක් නැහැ නේ?"

කයිරොන් බොරුවට කැස්සා. "ඔව්, හැබැයි ඇත්ත ම කියනවා නම්, ඒක ඔරැකල්ගේ ආත්මයට කොහොම බලපායි ද කියලා මම දන්නෙ නැහැ. දැනටමත් දරු ගැබක් දරාගෙන හිටපු ගැහැනු කෙනෙක්- මං දන්න තරමින් නම්, මීට කලින් කවදාවත් මෙහෙම දෙයක් කරලා නැහැ. ආත්මය ඔයාව බාර ගත්තෙ නැත්නම්-"

Scanned with CamScanner

"ඒක බාරගනී," මේ ස්ථිර හඬින් කිව්වා.

නෑ, මට කෑගහන්න ඕනෑ වුණා. ඒක බාර ගන්නෙ නැහැ.

බබාට හාදුවක් දුන් මේ කාසලන් එයාව හර්මීස් අතට දුන්නා. "මම ඉක්මනට එන්නම්."

අන්තිම වතාවටත් ආත්ම විශ්වාසයෙන් පිරුණු හිනාවක් පෑව එයා පඩිපෙළ නැග්ගා.

කයිරොන් සහ හර්මීස් නිහඬව එහා මෙහා ඇවිද්දා. බබා දඟලමින් සිටියා.

මහ ගෙදර ජනේල කොළ පාට එළියකින් එකාලෝක වුණා. අත් පන්දු ක්‍රීඩා කරමින් සිටි කඳවුරුකරුවෝ එය නවත්වා පුදුමයෙන් ඇස් ලොකු කරගෙන අට්ටාලය දිහා බලා සිටියා. සීතල සුළඟක් ස්ට්‍රෝබෙරි යාය පුරා හමා ගියා.

හර්මීස්ටත් එය දැනෙන්න ඇති. "නෑ! නෑ!" එයා කෑගැහුවා.

බබාව කයිරොන් අතට තල්ලු කළ එයා දොර පියස්ස දෙසට දිව්වා. එයා දොරකඩට ළඟා වෙන්න කලින්, මේ කාසලන් භීතියෙන් කළ කෑගැසීමෙන් දීප්තිමත් හවස් වරුව වැනසී ගියා.

***

මම නැගිටපු වේගයට කාගෙදෝ පලිහක මගේ ඔළුව හැප්පුණා.

"උෟයි!"

"සමා වෙන්න, පර්සි," මට ඉහළින් සිටගෙන සිටියේ ඇනබෙත්. "මම මේ ඔයාව ඇහැරවන්න ලෑස්ති වුණේ."

දකින්න ලැබුණු හිත කලඹවන දසුන් ඉවත් කරන්න උත්සාහ කරමින් මම මගේ ඔළුව අතුල්ලා ගත්තා. එක්වර ම ගොඩක් දේවල් මට පැහැදිලි වෙන්න ගත්තා: මේ කාසන් ඔරකල් බවට පත්වෙන්න උත්සාහ කරලා. ඩෙල්ෆිගේ ආත්මය වෙනත් ධාරකයෙක් ලබා ගැනීම වළක්වමින් හේඩීස් පැනවූ ශාපය ගැන එයා දැනගෙන ඉඳලා නැහැ. ඒ වගේම කයිරොන් හෝ හර්මීස් දැනගෙන ඉඳලත් නැහැ. ඒ රාජකාරිය බාරගන්න උත්සාහ කිරීමෙන් මේ කාසලන්ව උමතු වෙලා. එයාගේ ඇස් කොළ පාටින් දිලිසෙමින් ඇති වෙන ගැස්ම වැළඳිලා. එයාගේ දරුවාගේ අනාගතයේ අංශු මාත්‍රයන් දැකීමෙන් එයාව විනාශ වෙලා යාවි කියලා එයාලා තේරුම් අරගෙන තිබිලා නැහැ.



"පර්සි?" ඇනබෙත් කතා කළා. "මොකක්ද ප්‍රශ්නේ?"

"මුකුත් නැහැ." මම බොරුවක් කිව්වා. "මොනවද... මොනවද ඔයා මේ සන්නාහයක් ඇඳගෙන කරන්නේ? ඔයා විවේක ගන්නයි ඕනෑ."

"ඔහ්, මට දැන් හොඳයි." කිව්වත්, එයා තවමත් හිටියේ සුදුමැලි වෙලයි. එයාට දකුණු අත යන්තමින් හොලවන්නවත් අමාරු වුණා. "අර නෙක්ටාර්වලටයි, ඇම්බ්‍රෝසියාවලටයි මාව සනීප වුණා."

"අහ්-ඔහ්. එළියට ගිහිල්ලා සටන් කරන්න ඔයාට කොහෙත්ම බැහැ."

හොඳින් තිබූ අත දිගු කළ එයා මට නැගිටින්න උදව් කළා. මගේ ඔළුව ඇතුළේ පිටි කොටනවා වගෙයි මට දැනුණේ. එළියේ, අහස දම් සහ රතු පාටට හැරී තිබුණා.

"ඔයා ළඟ ඉන්න හැම කෙනෙක්ව ම ඔයාට ඕනෑ වෙන්නයි යන්නේ." එයා කිව්වා. "මම දැන් මගේ පලිහෙන් බැලුවා. අරෙත් හමුදාවක්-"

"මධ්‍යම උද්‍යානේ දකුණු පැත්තට යනවා," මම කිව්වා. "ඔව්, මං දන්නවා."

මම එයාට මගේ හීනවලින් කොටසක් විස්තර කළා. මම මේ කාසලන් ගැන දැකපු දසුන නොකියා හිටියේ ඒ ගැන කතා කරන්න බැරි තරම් හිත කලඹවනසුලු නිසයි. ඒ වගේම ලූක් එයාගේ ඇඟ ඇතුළේ ක්‍රෝනොස්ට විරුද්ධව සටන් කරනවා කියලා ඊතන් කළ අනුමානයත් මම අත් හැරියා. එහෙම කළේ ඇනබෙත්ගේ බලාපොරොත්තු වැඩි කරන්න මට ඕනෑ වුණේ නැති නිසයි.

"ඔයා හිතන්නෙ ඔයාගේ දුර්වල තැන ගැන ඊතන් සැක කරනවා කියල ද?" එයා ඇහුවා.

"මං දන්නෙ නෑ." මම ඇත්ත ම කිව්වා. "එයා ක්‍රෝනොස්ට කිසි දෙයක් කිව්වෙ නැහැ. ඒ වුණාට එයා ඒක තේරුම් ගත්තොත්-"

"එයාට ඒකට ඉඩ තියන්න අපිට බැහැ."

"ඊළඟ වතාවේ මම එයාගේ ඔළු ගෙඩියට තව හයියෙන් ගහන්නම්," මම යෝජනා කළා. "ක්‍රෝනොස් කියපු පුදුම කිරීම මොකක් වෙන්න ඇති ද?"

එයා ඔළුව හෙල්ලුවා. "මට පලිහෙන් නම් කිසිම දෙයක් පෙනුනෙ නැහැ, ඒ වුණාට මම නම් පුදුම කිරීම්වලට චුට්ටක්වත් කැමති නැහැ."

"මාත් එහෙමයි."

"ඉතින්," එයා කිවුවා, "මමත් එන එක ගැන මාත් එක්ක තර්ක කරන්න ද දැන් ඔයා හදන්නේ?"

"නැහ්. ඔයා දැනටමත් මාව පරද්දලා ඉවරයි නේ."

එයා හිනා වෙනවා අහන්න ලැබුණු එක සතුටක් වුණා. මම මගේ කඩුව ඩැහැ ගත්තා, ඊට පස්සේ අපි සේනා රැස් කරන්න පිටත් වුණා.

★★★

තාලියා සහ ජ්‍යෙෂ්ඨ උපදේශකයෝ අපි එන තුරු ජලාශය ළඟ බලා සිටියා. ගොම්මන් අඳුර තුළ නගරයේ එළි දැල්වෙන්න ගත්තා. ඒවායින් බොහෝමයක ස්වයංක්‍රීය කාලමාපක ඇති කියලා මම අනුමාන කළා. තටාකය වටා වෙරළ දිගට වීදි ලාම්පු දැල්වුණේ ජල තලයට සහ තුරු ගොමුවලට තවත් බිය උපදවන පෙනුමක් ලබා දෙමින්.

"එයාලා එනවා," තාලියා රිදී ඊතලයක් උතුරු දෙසට දිගු කරමින් තහවුරු කළා. "එයාලා හාර්ලෙම් ගඟෙන් මෙගොඩ වුණා කියලා මගේ ඔත්තුකාරියක් මේ දැන් වාර්තා කළා. එයාලව පහු බස්සන්න කොහෙත්ම ක්‍රමයක් නැහැ. ඒ හමුදාව..." එයා උරහිස් ඇකිළුවා. "ගොඩක් ලොකුයි."

"අපි උද්‍යානයේ එයාලව රඳවා ගමු," මම කිවුවා. "ග්‍රෝවර්, ඔයා ලෑස්තියි ද?"

එයා ඔළුව වැනුවා. "අපි වෙන කවරදාටත් වඩා ලෑස්තියි. මගේ සොභාවික බලවේගවලට උන්ව නතර කරන්න පුළුවන්කමක් තියෙනවා නම්, මේ තමයි ඒකට හොඳ ම තැන."

"ඔව්, අපි එහෙම කරනවා!" තවත් හඬක් කියනවා ඇහුණා. නාකි, තඩි සැටර් කෙනෙක් සෙනඟ පීරාගෙන ආවේ එයාගෙ ම හෙල්ලයේ කකුල් පටලා ගනිමින්. එයා හැඳ සිටි ගස් පොතු සන්නාහයෙන් වැසී තිබුණේ එයාගේ බඩ ගෙඩියෙන් බාගයක් විතරයි.

"ලෙනෙයස්?" මම කිවුවා.



"බොරුවට පුදුම වුණා වගේ රඟපාන්ඩ එපා," එයා පිම්බා. "මම මණ්ඩලේ නායකයෙක්, ඒ වගේම ග්‍රෝවර්ව හොයන්ඩ කියලා මට කිවුවේ ඔහේමයි. හොඳයි, මම එයාව හොයා ගත්තා, ඒ වගේම මගේ උදවු නැතුව මේ වගේ වැදගැම්මකට නැති පිටුවහලෙක්ට සැටර්ලව මෙහෙයවන්න මම ඉඩ තියන්නෑ!"

ලෙනෙයස්ට පිටුපසින් සිටි ග්‍රෝවර් වමනය කරනවා වගේ අංග චලන පෙන්වමින් එයාට ඇද කරකර හිටියත්, නාකි සැටර් දත් නියෙව්වේ හරියට එයා දවස බේරගන්න ආව වීරයා වගෙයි. "බය වෙන්න එපා! අපි අර ටයිටන්ලට හොඳ පාඩමක් උගන්නමු!"

හිනා වෙන්න ද, නැත්නම් කේන්ති ගන්න ද කියලා මට තේරුනේ නැහැ, ඒ වුණත් මම කොහොම හරි වෙනසක් නොපෙන්වා මූණ කෙලින් තියාගත්තා. "ම්... ඔව්. හොඳයි, ග්‍රෝවර්, එහෙනම් ඔයා තනි වෙන එකක් නැහැ. ඇතීනා කැබින් එකත් එක්ක ඇනබෙත් මෙතැන එයාලගේ නැවතුම්පොල පිහිටුවා ගනී. එතකොට මමයි, තව, තාලියා?"

එයා මගේ උරහිසට තට්ටුවක් දැම්මා. "ආයේ අහන්න දෙයක් නෑ. දඩයක්කාරියෝ ලෑස්තියි."

මම අනෙක් උපදේශකයෝ දිහා බැලුවා. "එතකොට දැන් ඔයාලට තමයි අනිත් වැදගත් ම වැඩේ පැවරෙන්නේ. මැන්හැටන්වලට ඇතුළු වෙන්න තියෙන අනිත් පාරවල් ඔයාලට මුර කරන්න වෙනවා. ක්‍රෝනොස් කියන්නේ මොන වගේ කපටියෙක් ද කියලා ඔයාලා දන්නවා නේ. ලොකු හමුදාවක් මෙතැනට එවලා, අපේ අවධානේ ඒ පැත්තට හරවගෙන ඉන්න අතරේ වෙන කොහෙන් හරි තවත් බලකායක් හොරෙන් ඇතුළට එවන්න එයා බලාපොරොත්තු වෙයි. එහෙම දෙයක් සිද්ධ නොවෙන තැනට වගබලා ගන්න එක තියෙන්නේ ඔයාලගේ අතේ. තම තමන්ගේ කැබින්වලින් මුර කරන පාලම හරි උමඟ හරි තෝරගත්ත ද?"

උපදේශකයෝ බැරෑරුම් මුහුණින් ඔළුව වැනුවා.

"එහෙනම් අපි මේක කරමු," මම කිවුවා. "හැමෝටම, හොඳ දඩයමක් කරන්න ලැබෙයි කියලා හිතනවා!"

★★★

අපිට හමුදාව දකින්න ලැබෙන්නත් කලින් උන්ගේ හඬ ඇහුණා.

Scanned with CamScanner

ඒක හරියට එක දිගට පත්තුවෙන කාලතුවක්කු හඬවල් සහ පාපන්දු ක්‍රීඩාංගනයක නරඹන්නන්ගේ ඝෝෂාව එකට මිශ්‍ර වෙලා වගේ සද්දයක්- හරියට නිව් ඉංග්ලන්ඩ්වල ඉන්න පැට්‍රියට් පිලේ ලෝලියෝ හැමෝම යුද ටැංකි අරගෙන අපිට පහර දෙන්න එනවා වගෙයි.

ජලාශයේ උතුරු ඉවුරේ දී සතුරු පෙරටු බල ඇණිය කැලේ කඩාගෙන එන්න ගත්තා- දැවැන්ත ලෝකඩ පොරෝවලින් සන්නද්ධ වූ ලයිස්ට්‍රිගෝනියානු පාබල සේනාංකයක් මෙහෙයවමින්, රන්වන් සන්නාහයකින් සැරසුණු රණ ශූරයෙක් පෙරටුව ආවා. ඊට පිටුපසින් තවත් රාක්ෂයෝ සිය ගාණක් වැල නොකැඩී එමින් සිටියා.

"ස්ථාන ගත වෙනු!" ඇනබෙත් මොර දුන්නා.

එයාගේ කැබින් සහයකයින් හතර අත විසිරුණා. අපේ අදහස වී තිබුණේ සතුරු හමුදාව ජලාශය වටේට විසුරුවන්නයි. අපිට කිට්ටු වෙන්න නම්, එයාලට අඩි පාරවල් දිගේ එන්න වෙනවා. ඒ කියන්නේ එයාලට ජලාශය දෙපැත්තෙන් පටු පේළිවලට එන්න සිද්ධ වෙනවා.

මුල දී, අපේ සැලැස්ම වැඩ කරනවා වගෙයි පෙනුණේ. සතුරු පිළ කොටස්වලට බෙදී, වෙරළ දිගේ අපි දිහාවට ඇදී එන්න ගත්තා. එයාලා දුරෙන් අඩක් එද්දී, අපේ ආරක්ෂක උගුල් ගැස්සුණා. අඩි පාර ග්‍රීක ගින්දරවලින් පුපුරා ගියේ, රාක්ෂයින්ගෙන් වැඩි ප්‍රමාණයක් එසැණින් ම දවා අළු කරමින්. කොළ පාට ගිනි දළුවලින් වැසුණු අනිත් එවුන් ඔළුව හැරුණු අතේ දිවුවා. සද්දන්ත ම යෝධයින්ට ඇවුළුම් කොකුවලින් විදපු ඇතීනා කඳවුරුකාරයෝ උන්ව බිමට ඇදලා දැමුවා.

දකුණු පස කැලෑව තුළින් දඩයක්කාරියන්ගේ රිදී ඊතල මුරයක් ඇදී ඇවිත්, ඩ්‍රැකනෙයිලා විස්සක් හෝ තිහක් වනසා දැමුවත්, ඊට පිටුපසින් තව තවත් එවුන් ඉදිරියට ආවා. අහසින් බිමට පැන්න අකුණු සැරයක් ලයිස්ට්‍රිගෝනියානු යෝධයෙක්ව අළු කර දමනවා දකිද්දී, තාලියා 'සියුස්ගේ දුව'ගේ වැඩ පෙන්වනවා කියලා මම දැනගත්තා.

බටනළා අතට ගත් ග්‍රෝවර් කඩිනම් තාලයක් වාදනය කළා. ඒත් එක්ක ම කැලෑව දෙපස වූ සෑම ගහක්, ගලක් සහ පඳුරක් තුළින් ම බලවේගයක් පැන නැංගේ ගිගුරුම් හඬ පතුරුවමින්. රුක් දේවතාවෝ සහ සැටර්ලා මුගුරු ඔසවාගෙන පහර දෙන්න පැන්නා. රාක්ෂයෝ වටා ගස් එතෙමින්, උන්ගේ හුස්ම හිර කළා. සතුරු දුනුවායින්ගේ දෙපා වටා තණ පඳුරු වැඩුණා. ගල් ගෙඩි පියඹා ගොස් ඩ්‍රැකනෙයිලාගේ මුහුණුවල වැදුණා.



ඒ වුණත් හතුරන් ඉදිරියට ම ආවා. යෝධයෝ ගස් කඩා බිඳ දමද්දී, ජීව ප්‍රභවය විනාශ වූ රුක් දෙවිවරු වියැකී ගියා. වෘකයින්ට කඩා පැන්න යම බල්ලෝ උන්ව පෙරළා දැමුවා. සතුරු දුනුවායෝ ප්‍රති ප්‍රහාර එල්ල කරද්දී, ගහක උස් අත්තක් මත සිටි දඩයක්කාරියක් බිමට ඇද වැටුණා.

"පර්සී!" මගේ අත ඩැහැගත් ඇනබෙත් ජලාශය දෙසට ඇඟිල්ල දිගු කර පෙන්නුවා. රන්වන් සන්නාහයෙන් සැරසී සිටි ටයිටන් එයාගේ සේනාවන් ජලාශය දෙපසින් ඉදිරියට යන තුරු නැවතී බලා සිටියේ නැහැ. එයා එක එල්ලේ වතුර මතින් පා තබමින් අපි දිහාවට එමින් සිටියා.

හරියට ම එයාගේ ඔළුවට උඩින් ග්‍රීක ගිනි බෝම්බයක් පුපුරා ගියා, ඒත් අත්ල ඉහළට එසවූ එයා ගිනි දළු සියල්ල ගුවනින් උරා ගත්තා.

"හයිපරියන්," ඇනබෙත් කිවුවේ බයෙන් වගෙයි. "ආලෝකයට අධිපති. නැගෙනහිර ටයිටන්."

"නරකයි ද?" මම අනුමාන කළා.

"ඇට්ලස්ට පස්සේ, එයා තමයි බලවත් ම ටයිටන් රණ ශූරයා. ඉස්සර කාලේ, ටයිටන්ලා හතර දෙනෙක් ලෝකේ හතර කොණ පාලනය කරා. හයිපරියන්ට තමයි නැගෙනහිර- වඩාත් ම බලවත් දිසාව අයිති වෙලා තිබුණේ. එයා තමයි පළවෙනි ඉර දෙවියා, හෙලියෝස්ගේ තාත්තා."

"මම එයා ගැන බලාගන්නම්," මම පොරොන්දු වුණා.

"පර්සි, අඩු තරමේ ඔයාටවත් බැහැ-"

"අපේ සේනා එකට තියාගෙන ඉන්නකෝ."

අපි ජලාශය ළඟ බළ මුළුව පිහිටුවා ගත්තේ විශේෂ හේතුවකටයි. මම වතුරට මගේ සිත ඒකාග්‍ර කරද්දී එහි බලය මගේ ඇඟ පුරා ගලා යනවා මට දැනුණා.

මම හයිපරියන් එන පෙරමඟට ගියේ වතුර මතින් දුවමින්. ඔව්, යාළුවා. ඒ සෙල්ලම අපි දෙන්නට ම කරන්න පුළුවන්.

අඩි විස්සක් දුර තියා, හයිපරියන් කඩුව එසෙව්වා. එයාගේ ඇස් මට හීනෙන් දකින්න ලැබුණා වගේමයි- ඒවා ක්‍රෝනොස්ගේ

[illegible] රන් පාට වුණත්, ඊට වඩා දීප්තිමත් වුණේ හරියට චූටි ඉරවල් ඇසක් වගෙයි.

"මුහුදු දෙයියන්ගේ පොඩි එකා," එයා කල්පනාබරව කිව්වා. "නුඹ නේද ඇට්ලස්ව ආයෙමත් අහස යටට කොටු කළේ?"

"ඒක ඒ හැටි අමාරු වුණේ නැහැ," මම කිව්වා. "ඔහේලා වගේ ටයිටන්ලා මගේ කුණු මේස් දෙකක් තරම් බ්‍රයිට් අය නේ."

හයිපරියන් දත් විලිස්සා ගෙරෙව්වා. "එහෙනම් බලා ගන්නවා."

එයාගේ ඇඟ ආලෝකය හා තාප කඳකට දැල්වුණා. මම අහක බලා ගත්තත්, මගේ ඇස් ගිනිකණ වැටුණා.

මම ඉබේට ම වගේ රිප්ටයිඩ් එසෙව්වා- නියම වෙලාවට. හයිපරියන්ගේ කඩු තලය මගේ කඩුවේ ගැටුණා. ඒ කම්පනයෙන් හටගත් අඩි දහයක් උස දිය රැල්ලක් ජලාශය මතුපිටින් පෙරළී ගියා.

මගේ ඇස් තවමත් පිළිස්සුණා. මට කොහොම හරි එයාගේ ආලෝකය නිවා දමන්න සිදුව තිබුණා.

ඉවතට ඇදී යමින් තිබුණු උදම් රළට සිත යොමු කළ මම එයට ආපස්සට පෙරළී එන්න බල කරා. සට්ටනයට තත්පරයකට කලින්, මම වේගයෙන් ඉහළ විදින වතුර කඳක් මතින් උඩට පැන්නා.

"ආාාහ්හ්හ්!" හයිපරියන් මතට රළ කඩා වැදී එයාව යට කර දමද්දි, එයාගේ ආලෝකය නිවී ගියා.

හයිපරියන් දඟලමින් දෙපයින් සිටගනිද්දී ම, මම ආපසු ජලාශය මතුපිටට පය ගැසුවා. එයාගේ රන්වන් සන්නාහයෙන් දිය බේරුණා. තව දුරටත් එයාගේ ඇස් දැල්වුණේ නැතත් ඒවාගේ මිනීමරු බැල්ම නම් තවමත් තිබුණා.

"නුඹව පුච්චලා දානවා, ජැක්සන්!" එයා ගිගුරුවා.

අපේ කඩු නැවත වරක් එකිනෙක ගැටුණේ වාතය [illegible]වලින් පුරවමිනුයි.

අපි වටා තවමත් යුද්ධය ඇවිළුණා. දකුණු පැත්තේ ඇනබෙත් [illegible] සහෝදර සහෝදරියන් සමඟ ප්‍රහාරයක් දියත් කරමින් සිටියා. වම් පැත්තේ, ග්‍රෝවර් සහ එයාගේ සොභාවික බලවේග නැවත [illegible] සැදෙමින්, සතුරන්ව පඳුරු සහ වල් පැළෑටිවල පටලවමින් හිටියා.



"සෙල්ලම් කරා ඇති," හයිපරියන් මට කිව්වා. "අපි දැන් ගොඩබිම සටන් කරන්නේ."

මම 'එහෙම නෑ' වගේ හරි ම බුද්ධිමත් උත්තරයක් දෙන්න ලෑස්ති වෙනකොට ම, ටයිටන් මහ හඬින් මොර ගැසුවා. ඒත් එක්ක ම වාතය හරහා ඇදී ආව බල තරංගයක් තාප්පයක් වගේ මගේ ඇඟේ හැප්පුණා- ඒකත් හරියට පාලම උඩ දී ක්‍රෝනොස් කළ උප්පරවැට්ටිය වගේමයි. යාර තුන්සීයක් විතර ආපස්සට උඩින් විසි වුණ මම පොළොවට ඇද වැටුණා. මට අලුතින් ලැබී තිබුණු කිසිම තුවාලයක් නොවෙන බලය නොතිබෙන්න, ඒ වැටුණ වැටිලල්ලට මගේ ඇඟේ හැම ඇටයක් ම කැඩෙන්න තිබුණා.

මම කෙඳිරිගාමින් සිටගත්තා. "ඔය ටයිටන්ලා කරන ඒ වැඩේ නම් මට පෙන්නන්න බැහැ."

ඇස් අදහා ගන්න බැරි වේගයකින් හයිපරියන් මගේ උඩට පාත් වුණා.

මම වතුරට හිත ඒකාග්‍ර කරමින්, එයින් ශක්තිය ඇදගත්තා.

හයිපරියන් පහර දෙන්න පැන්නා. එයා බලවත් සහ වේගවත් වුණත්, පහරක් ගහගන්න බැරුව ළතවෙනවා වගෙයි පෙනුණේ. එයාගේ දෙපා වටා පොළොවෙන් නොනවත්වා ම ගිනි දළු හටගත්තත්, මම ඒවා මතුවෙන වේගයෙන්ම වතුරෙන් තෙමා නිවා දැමුවා.

"ඕක නවත්තනවා!" ටයිටන් ගර්ජනා කළා. "ඔය හුළඟ නවත්තනවා!"

එයා මොනවා කියනව ද, මට හරියට ම තේරුනේ නැහැ. මොකද මම හිටියේ සටනත් එක්ක කාර්යබහුල වෙලා නේ.

හයිපරියන් දෙපා පැකිළෙමින් ආපස්සට විසි වුණේ හරියට කවුරු හරි එයාව තල්ලු කරනවා වගෙයි. එයාගේ ඇස්වල දැවිල්ල ඇති කරමින් එයාගේ මුහුණට වතුර විදුණා. සුළඟේ වේගය වැඩි වෙද්දී, හයිපරියන් ආපස්සට විසිවුණා.

"පර්සි!" ග්‍රෝවර් කතා කළේ විස්මයෙන්. "ඔයා කොහොමද ඒක කරන්නේ?"

මොකක් කරන්නෙ ද? මම හිතුවා.

ඒ වෙලාවේ පහළ බැලුවාමයි මම මගේම පෞද්ගලික සුළි කුණාටුවක් මැද හිටගෙන ඉන්න බව තේරුම් ගියේ. හුමාලයෙන්

Scanned with CamScanner

හැඳිණු වලාකුළු මගේ වටා සුළි නංවමින් ඇති කළ සුළඟ කොයි තරම් බලවත් වුණා ද කියනවා නම් ඒවා හයිපරියන්ව ආපස්සට තල්ලු කරමින්, යාර විස්සක වපසරිය තුළ වූ තණ ගස් පවා පොළොවට ම සමතලා කරා. සතුරු යුද භටයෝ මට හෙලිවලින් දමා ගැහුවත්, සුළි කුණාටුව ඒවා පසෙකට විසි කර දැමුවා.

"මරුනේ," මම කෙඳිරුවා. "හැබැයි තව වුට්ටක් වැඩි වුණොත් මරේ මරු!"

මට ඉහළින් විදුලි කෙටුවා. වලාකුළු අඳුරු වී, වැස්ස වඩාත් වේගයෙන් ඇද හැලුණා. හයිපරියන්ව කොටු කරගත් මම එයාව ගුවනට එසෙව්වා.

"පර්සි!" ග්‍රෝවර් ආයෙමත් කතා කළා. "එයාව මෙහෙට අරන් එන්න!"

මම මගේ ප්‍රතීක ක්‍රියාවන්ට ඉඩදෙමින් කඩුවෙන් කපමින්, කොටද්දී, හයිපරියන්ට එයාගේ ම ආරක්ෂාව සලසා ගන්නවත් බැරි වුණ තරම්. එයා ආයෙමත් ගිනි අවුලගන්න උත්සාහ කළත්, සුළි කුණාටුව එයාගේ ගිනි දැලු නිවා දැමුවා.

ඒ කොහොම වුණත්, මේ කුණාටුව දිගටම පවත්වාගෙන යන්න මට හැකියාවක් තිබුණේ නැහැ. මගේ බලයත් දුර්වල වෙනවා මට දැනුණා. අන්තිම වෑයමත් ගනිමින් මම හයිපරියන්ව පිටිය හරහා ග්‍රෝවර් සිටි දෙසට වේගයෙන් තල්ලු කර දැමුවා.

"මාත් එක්ක සෙල්ලං කරන්න හදන්නෙපා!" හයිපරියන් ගිගුරුවා.

එයා ආයෙමත් දෙපයින් නැගී සිටින්න සමත් වුණත්, බටනළා දෙතොලතරට තබා ගත් ග්‍රෝවර් වාදනය කරන්න පටන් ගත්තා. ලෙනෙයසුත් ඊට හවුල් වුණා. අරඹ පුරා සිටි සෑම සැටර් කෙනෙක් ම ඒ වාදනයට එකතු වුණා- ඒක ගල් කුළු මතින් දිය පහරක් ගලා යනවා වගේ අමුතු තාලයක්. හයිපරියන්ගේ දෙපා මුල පොළොව පලාගෙන මතු වූ ගස්වල මුල් එයාගේ කකුල් වටා එතුණා.

"මේ මොකක්ද?" එයා විරෝධය පෑවා. එයා ගස්වල මුල් ගසා දමන්න උත්සාහ කළත්, එයා තවමත් සිටියේ දුබලවයි. එයාගේ දෙපා වටා මුල් ගන වෙද්දී පෙනුණේ එයා ලී බූට් සපත්තු දෙකක් දමාගෙන ඉන්නවා වගෙයි.



"ඕක නවත්තනවා!" එයා කෑගැහුවා. "උඹලට වන ලැහැබේ මායාවලින් ටයිටන් කෙනෙක් එක්ක ඔට්ටු වෙන්න බෑ!"

ඒත් එයාගේ දඟලිල්ල වැඩි වෙන තරමට, මුල් වැවෙන වේගයත් වැඩි වුණා. ඒවා එයාගේ ඇඟ වටා එති, ගස් පොත්තක් බවට ඝන වෙමින් දැඩි වුණා. එයාගේ රත්වන් සන්නාහය ලිය තුළට දිය වී ගොස්, රුස්ස කඳේ කොටසක් බවට පත් වුණා.

සංගීතය නොනැවතී වාදනය වුණා. තමන්ගේ සේනාධිපතිව හිර වුණු බව දුටු සේනා පුදුමයෙන් පසු බැස්සා. ටයිටන් අත් පිටතට දිගු කළා ම ඒවා ගසේ අතු බවට පත් වී, ඒවායින් කුඩා අතු රිකිලි පැන නගිමින් අලුලෑවා. වඩාත් උස්ව සහ ඝනව වැඩුණු ගසේ කඳ මැද අවසානයට පෙනෙන්න ඉතිරි වුණේ ටයිටන්ගේ මුහුණ විතරයි.

"උඹලට මාව හිර කරන්ඩ බෑ!" එයා ගර්ජනා කළා. "මම තමයි හයිපරියන්! මම-"

ගසේ පොත්ත එයාගේ මුහුණත් වසාගෙන පැතිරුණා.

ග්‍රෝවර් බට නළා කට්ටම තොල් අතරින් ඉවත් කළා. "ඕයා හරි ම ලස්සන මේපල් ගහක්."

අනෙක් සැටර්ලාගෙන් කීප දෙනෙක් ම විඩාවෙන් හෙම්බත් වී ඇද වැටුණා, ඒත් එයාලා එයාලගේ රාජකාරිය හොඳින් ම ඉටු කරලයි තිබුණේ. දැන් ටයිටන් අධිපතියා රුස්ස මේපල් ගහක් තුළ සම්පූර්ණයෙන් ම හිර වෙලා. අඩි විස්සක විතර විෂ්කම්භයක් ඇති ඒ ගහේ කඳට, උද්‍යානයේ ඇති අනෙක් සෑම ගසකට ම වඩා උස අතු තිබුණා. ඒක තවත් සියවස් ගාණක් යනකල් ම එතැන තියේවි.

ටයිටන්ගේ හමුදාව පසු බහින්න පටන් ගත්තා. ඇතීනා කැබිනයේ අය ජයඝෝෂා නැගුවා, ඒත් අපේ ජයග්‍රහණයට තිබුණේ හරිම කෙටි ආයුෂක් විතරයි.

මොකද ඒ වෙලාවේ ක්‍රෝනොස් එයාගේ පුදුම කිරීම මුදා හැරියා.

"ඊඊඊ..ටට!"

මැන්හැටන් ඉහළ කොටස පුරා ඒ මොරගෑම දෝංකාර දුන්නා. උප දෙවිවරු වගේම රාක්ෂයිනුත් එක පමණට ම භීතියෙන් ගල් ගැහුණා.

ග්‍රෝවර් මගේ දිහා බැලුවේ දවල් තරු පෙනිලා වගෙයි. "ඇයි ඒ සද්දේ නිකං... එහෙම වෙන්න බෑ!"

එයා හිතන දේ මම දැනගෙන හිටියා. අවුරුදු දෙකකට කලින් පැන් අපිට තෑග්ගක් එවලා තිබුණා- අපිව නිරිත දිගට ගෙන ගියපු සද්දන්ත වල් ඌරෙක් (ඌ අපිව මරන්න හැදුවට පස්සේ). ඒ වල් ඌරා කෑගැසුවෙත් මේ විදිහටමයි. හැබැයි දැන් අපිට ඇහෙමින් තිබුණු හඬේ ඊට වඩා කර්කශ, උච්ච ස්වරයක් තිබුණේ හරියට... හරියට අර වල් ඌරාට යකා නැගපු පෙම්වතියක් හිටියා වගෙයි.

"රීරී...ට්!" රෝස පාට සද්දන්ත සතෙක් ජලාශයට ඉහළින් වේගයෙන් පියඹා ආවා- ඌ හරියට මෙසීගේ තුති පිදීමේ පෙළපාළියේ යෙතියන බිහිසුණු පෙනුම ඇති අහස් නැවක් වගෙයි.

"ඊරියෙක්!" ඇනබෙත් කෑගැසුවා. "මුවා වෙන්න!"

තටු ඇති ඌරු නෝනා වේගයෙන් පහළ බහිද්දී උප දෙවිවරු සිසිකඩ පලා ගියා. ඌගේ පියාපත් ෆ්ලෙමින්ගෝ කුරුල්ලෙකුගේ වගේ රෝස පාටයි. ඒවා ඌගේ හමේ පාටට හරිම ලස්සනට ගැළපුණා, ඒ කොහොම වුණත් ඇනබෙත්ගේ සහෝදර සහෝදරියන්ව නූලෙන් මඟ අරිමින් ඌගේ කුර පොළොවේ තදින් වදිද්දී, ඌ ලස්සනයි කියලා හිතන්න නම් අමාරු වුණා. උයන පුරා යකා නටපු ඊරිය විෂ වායුවෙන් පිරුණු රාම තෙල් පිට කරමින්, අක්කර බාගයක විතර ගස් උගුල්ලා දැමුවා. ඊට පස්සේ ඌ ආයෙමත් ඉහළ නැගලා රවුමට පියාඹන්න ගත්තේ තවත් ප්‍රහාරයකට සූදානමෙන්.

"මේකත් පරණ ග්‍රීක කතන්දරවල ඉන්න එකෙක් කියලා නම් මට කියන්නෙපා," මම මැසිවිලි නැගුවා.

"ඒකමයි මටත් බය," ඇනබෙත් කිවුවා. "ක්ලැස්මෝනියන් ඊරිය. ඉස්සර කාලේ ඌ ග්‍රීක නගර වනසපු එකෙක්."

"මං කියන්නම්," මම කිවුවා. "හර්කියුලිස් ඌව පරාද කළා."

"නැහැ," ඇනබෙත් කිවුවා. "මම දන්න තරමින් නම්, කිසිම වීරයෙක්ට ඌව පරාද කරන්න පුළුවන් වෙලා නැහැ."

"නියමයි," මම කෙඳිරුවා.

මේ වෙද්දී ටයිටන්ගේ හමුදාව කම්පනයෙන් මිදෙමින් සිටියා. මං හිතන්නේ ඊරිය එන්නේ එයාලා පස්සෙ නෙවෙයි කියලා එයාලා තේරුම් ගන්න ඇති.



එයාලා නැවත සටනට සූදානම් වෙන්න කලින් අපිට තිබුණේ තත්පර ගාණක් විතරයි, ඒ මදිවට අපේ සේනාව තවමත් සිටියේ භීතියෙන් කුලප්පු වෙලයි. ඊරිය රාම තෙල් පිට කරන සෑම වතාවක දී ම, ග්‍රෝවර්ගේ සොභාවික බලවේග වේදනාවෙන් මොර ගසමින්, ආපසු එයාලගේ ගස් තුළට වැදුණා.

"අර ඊරි ඉවරයක් කරලා දාන්න ඕනෑ!" මම ඇනබෙත්ගේ සහෝදරයෙක් අත තිබූ ඇවුළුම් කොක්කක් ඩැහැගත්තා. "මම ඌ ගැන බලාගන්නම්. ඔයාලා ඉතුරු එවුන් ගැන බලාගන්න. උන්ව ආපස්සට තල්ලු කරන්න!"

"ඒත්, පර්සි," ග්‍රෝවර් කිවුවා, "අපිට ඒක කරගන්න බැරි වුණොත්?"

එයා හිටියේ කොයි තරම් විඩාපත්ව ද කියලා මට පෙනුණා. එයා පාවිච්චි කළ මායාවන්වලට එයාගේ ශක්තිය සිඳී ගොස් තිබුණා. උරහිසේ තුවාලයකුත් ඇතිව සටන් කරමින් සිටි ඇනබෙත්ටත් ඊට වඩා හොඳ පෙනුමක් තිබුණේ නැහැ. දඩයක්කාරියන්ගේ තත්ත්වය මම දැනගෙන හිටියේ නැහැ, ඒ වුණත් සතුරු හමුදාවේ දකුණු පස සේනාව දැන් එයාලා සහ අපි අතරට වැදී සිටියා.

මේ තරම් දරුණු තත්ත්වයක දී මගේ යාළුවන්ව දාලා යන්න මට ඕනෑ වුණේ නැහැ, ඒත් ඒ වෙලාවේ අපිට තිබුණු ලොකු ම තර්ජනය වුණේ අර ඊරියයි. ඌ හැම දෙයක් ම විනාශ කරලා දමාවි: ගොඩනැගිලි, ගස්, නිදා සිටින මිනිසුන්ව. ඌව කොහොම හරි නැවැත්විය යුතු වුණා.

"ඕනෑ වුණොත් පහු බහින්න," මම කිවුවා. "එයාලගේ වේගය අඩු කරන්න විතරක් බලන්නකෝ. මම පුළුවන් තරම් ඉක්මනට ආපහු එනවා."

මගේ හිත වෙනස් වෙන්න කලින්, මම ඇවුළුම් කොක්ක මළ පුඩුවක් වගේ වැනුවා. ඊරිය ඊළඟ ප්‍රහාරයට පහළට එද්දී, මම මගේ මුළු ශක්තිය ම යොදා එය විසි කළා. ඇවුළුම් කොක්ක ඊරියගේ පියාපතක මුල වටා එතුණා. ඌ වියරුවෙන් මොර ගසමින් ඉහළට පියෑඹුවේ කඹය සමඟ මාවත් අහසට ඇදගෙන යමිනුයි.

★★★

ඔයා මධ්‍යම උද්‍යානයේ සිට ඩවුන්ටවුන් දිහාවට යනවා නම්, උමං මාර්ගය පාවිච්චි කරන එක ඇඟට ගුණයි. පියාඹන ඌරෝ වඩාත් වේගවත් තමයි, ඒ වුණාට උන් අනතුරුදායක වැඩියි.

ප්ලාසා හෝටලයට ඉහළින් පියාසර කළ ඊරිය පස්වෙනි මාවතේ දොරුව තුළට එක එල්ලේ වැදුණා. මගේ සුපිරි සැලසුම වෙලා තිබුණේ කඹය දිගේ ඉහළට නැගලා, ඊරිය ගේ පිටට ගොඩ වෙන්නයි. ඒත් අවාසනාවකට වගේ, මම හිටියේ වීදි ලාම්පුවල සහ ගොඩනැගිලි බිත්තිවල නොවැදී ඉන්න දඟලමින්, වටේට පැද්දෙන වැඩේ එක්ක කාර්යබහුල වෙලයි.

මම තවත් දෙයක් ඉගෙන ගත්තා: ඒ තමයි, ව්‍යායාම පන්තියේ දි කඹය දිගේ නගින එක වෙන ම දෙයක්. හැබැයි පැයට සැතපුම් සීයක වේගයෙන් පියාඹන අතරේ, ගමනේ යෙදෙන ඌරෙකුගේ පියාපතක ඇමිණුන කඹයක් දිගේ නගිනවා කියන එක හාත්පසින් ම වෙනස් දෙයක්.

ගොඩනැගිලි කාණ්ඩ ගණනාවක් දිගේ දඟර ගැසෙමින් අපි උද්‍යාන මාවතේ දකුණු දෙසට නොනැවතී ගියා.

බොස්! හේයි, බොස්! ඊරියගේ පියාපත් මඟ අරින්න ඉදිරියටත් පසුපසටත් පනිමින්, බ්ලැක්ජැක් අපිට එහා පැත්තෙන් වේගයෙන් පියඹා එනවා මට ඇස් කොණකින් පෙනුණා.

"ඔන්න බලාගෙන!" මම එයාට කිවුවා.

පනින්ඩෝ! බ්ලැක්ජැක් හේෂාරාවය කළා. මට ඔයාව අල්ල ගන්න පුළුවන්... මං හිතන්නේ.

ඒක නම් ඒ හැටි හිත දිරිමත් කරන දෙයක් වුණේ නැහැ. ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් පර්යන්තය හරියට ම ඉදිරියෙන් පිහිටා තිබුණා. එහි ප්‍රධාන පිවිසුමට ඉහළින් හර්මීස්ගේ යෝධ ප්‍රතිමාවක් නැගී සිටියා. මං හිතන්නේ ඒක තවමත් සක්‍රීය කරලා නොතිබුණේ ඒක ගොඩක් ඉහළින් පිහිටා තිබුණු නිසා වෙන්න ඇති. මම එක එල්ලේ එය වෙතට පියාඹමින් සිටියේ උප දෙවියෙක් වජ්ප වෙලා යන වේගයෙන්.

"සෝදිසියෙන් ඉන්න!" මම බ්ලැක්ජැක්ට කිවුවා. "මට අදහසක් ආවා."

ඔහ්, මට ඔයාගේ අදහස් පෙනෙන්ඩ බැහැ.



මම මගේ මුළු වෙර යොදා පිටතට පැද්දුණා. හර්මීස් ප්‍රතිමාවේ හැප්පෙනවා වෙනුවට, මම එය වටේ වේගයෙන් කැරකුණේ ප්‍රතිමාවේ දෑත්වලට යටින් කඹය ඔතමින්. එයින් ඊරියව දිගේලි වෙයි කියලා මම හිතුවත්, ටොන් තිහක් බර පියාඹන ඊරියගේ ගම්‍යතාවය මම අඩු තක්සේරු කර තිබුණා. ඊරිය ප්‍රතිමාව පාදස්ථලයෙන් උගුලුවා ගනිද්දි ම මම කඹය අත ඇරියා. ඊරියගේ මඟියා විදිහට මම හිටපු තැනට හර්මීස් පත් වී යන්න යද්දී, මාව පහළ වීදිය දෙසට වේගයෙන් ඇද වැටුණා.

ඒ තත්පරයෙන් පංගුව තුළ දී මට මගේ අම්මා ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් රසකැවිලි සාප්පුවේ සේවය කළ දවස් ගැන කල්පනා වුණා. එතැන පදික වේදිකාව උඩ ග්‍රීස් පැල්ලමක් වෙලා මැරෙන්න සිද්ධ වුණොත් මොන තරම් සවුත්තුවක් ද කියලා මම හිතුවා.

ඒ වෙලාවේ මට පහළින් සෙවණැල්ලක් වේගයෙන් ඇදී ආවා, ඊට පස්සේ තම්ප්! - මම බ්ලැක්ජැක්ගේ පිට මත සිටියා. ඒක කොහෙත්ම සුව පහසු ගොඩබෑමක් වුණේ නම් නැහැ. ඇත්ත ම කියනවා නම්, මම "ඌයි!" කියලා මොර දුන්නේ වෙනදාට වඩා උච්ච ස්වරයෙන්.

සමා වෙන්න, බොස්, බ්ලැක්ජැක් මිමිණුවා.

"අවුලක් නෑ," මම උගුර යටින් කෙඳිරි ගෑවා. "අර ඌරා පස්සෙ යමු!"

නැගෙනහිර හතළිස් දෙවෙනි වීදිය හරහා ගිය ඌරු තඩියා ආපසු පස්වෙනි මාවතට පියාඹමින් සිටියා. ඌ වහලවලට ඉහළින් පියඹා ගියා ම, නගරයේ තැන තැන ගිනි ඇවිලෙනවා මට දැකගන්න ලැබුණා. මට පෙනුණේ මගේ යාළුවන්ව සෑහෙන ලොකු අමාරුවක වැටිලා වගෙයි. ක්‍රෝනොස් පැති කීපයකින් ම එකවර ප්‍රහාර එල්ල කරමින් සිටියා. ඒත් මේ මොහොතේ දී මම හිටියේ මගේම ප්‍රශ්නයකට මැදිවෙලායි.

හර්මීස් ප්‍රතිමාව තවමත් රැහැනේ එල්ලෙමින් තිබුණා. එය දිගින් දිගට ම ගොඩනැගිලිවල හැප්පෙමින්, වටේට කැරකෙමින් තිබුණා. ඌරා කාර්යාල ගොඩනැගිල්ලකට ඉහළින් වේගයෙන් ඇදී යද්දී, හර්මීස් එහි වහලය මත තිබුණු ජල කුලුනක ගැටුනේ වතුර සහ දැව හතර අත ඉහිරවමින්.

ඒ වෙලාවේ මට යමක් සිහි වුණා.

"කිට්ටුවට යන්න," මම බ්ලැක්ජැක්ට කිවුවා.

එයා විරෝධය පාමින් හේෂාරාවය කළා.

Scanned with CamScanner

"කතා කරන දේවල් ඇහෙන තරම් කිට්ටුවට විතරක්," මම කිවුවා. "මට අර පිළිමෙට කතා කරන්න ඕනෑ."

දැන් නම් ඔයාගේ මොළේ කවල් වෙලා ද කියලත් මට සැකයි, බොස්. බ්ලැක්ජැක් කිවුවත්, එයා මම කියපු දේ කළා. ප්‍රතිමාවේ මුහුණ පැහැදිලිව පෙනෙන තරමට ළං වුණාට පස්සේ, මම මොර ගැසුවා, "හලෝ, හර්මීස්! විධාන අංකයඃ ඩෙඩලස් විසි තුන. පියාඹන ඌරෝ මරන්න! සක්‍රියනය ආරම්භ කරන්න!"

එසැණින් ම ප්‍රතිමාව එහි කකුල් සෙලවූවා. තව දුරටත් ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් පර්යන්තය මුදුනේ නොසිටින බව දකලා එයා අන්දමන්ත වුණා වගෙයි පෙනුණේ. ඒ වෙනුවට එයා සිටියේ කඹයක කෙළවරක එල්ලිලා, තඩි පියාඹන ඊරියක් සමඟ ගුවන් ගමනක යෙදෙමිනුයි. එයා ගඩොලින් සෑදූ ගොඩනැගිල්ලක වැදී, බිත්තියක් බිඳගෙන ඉදිරියට ගියා. මං හිතන්නේ ඒකෙන් එයාගේ තරහා ඇවිස්සුණා වගෙයි. ඔළුව හෙල්ලූ එයා කඹය දිගේ නගින්න පටන් ගත්තා.

මම පහළ වීදිය දිහාවට බැල්මක් හෙළුවා. අපි ප්‍රධාන මහජන පුස්තකාලයට ළං වෙමිනුයි හිටියේ. එහි පඩිපෙළ දෙපස කිරි ගරුඬවලින් සෑදූ ලොකු සිංහයෝ සිටියා. ඒවා දකලා එක්වර ම මට අමුතු සිතුවිල්ලක් පහළ වුණාඃ ගලින් සෑදූ ප්‍රතිමාත් ස්වයංක්‍රීය යන්ත්‍ර වෙන්න බැරි ද? ඒක කණා බල්ලන් ගැහිල්ලක් වුණත්...

"තව හයියෙන්!" මම බ්ලැක්ජැක්ට කිවුවා. "ඌරාගේ ඉස්සරහට ගිහිල්ලා, ඌව කුලප්පු කරමු!"

මේ, බොස්-

"මාව විශ්වාස කරන්න," මම කිවුවා. "මට මේක කරන්න පුළුවන්... මං හිතන්නේ."

ඔහ්, දැන් ඉතින් මේ අස්සයාට කොලොප්පං කරන්ඩ.

බ්ලැක්ජැක් සුළඟ කපාගෙන ඉදිරියට ඇදුණා. උවමනාවක් තියෙනවා නම් සෑහෙන වේගයකින් පියාඹන්න බ්ලැක්ජැක්ට පුළුවන්කම තිබුණා. දැන් ලෝහමය හර්මීස් කෙනෙක් පිටේ සිටි ඊරියගේ ඉදිරියට එයා ගියා.

ඔහේ ළඟ හැම් ගඳයි! හේෂාරාවය කළ බ්ලැක්ජැක්, එයාගේ පසුපස කුරවලින් ඌගේ හොම්බට ගහලා, වේගයෙන් පල්ලම් බැස්සා. වියරුවෙන් බෙරිහන් දුන් ඊරිය අපිවලුහුබැන්දා.



අපි පුස්තකාලයේ ඉදිරි පඩිපෙළ වෙතට එක එල්ලේ ඇදී ගියා. යාන්තමින් මට බිමට පැන ගන්න ඉඩ ලැබෙන තරමට වේගය අඩු කළ බ්ලැක්ජැක්, ඊට පස්සේ නොනැවතී ඉදිරි දොරටුව දෙසට පියඹා ගියා.

මම මොර ගැසුවා, "සිංහයිනේ! විධාන අංකයඃ ඩෙඩලස් විසිතුන. පියාඹන ඌරෝ මරන්න! සක්‍රියනය ආරම්භ කරන්න!"

සිංහයෝ නැඟිටලා මගේ දිහා බැලුවා. උන් හිතන්න ඇත්තේ මම උන්ට කොලොප්පම් කරනවා කියලයි. ඒත් එතකොටමඃ "රිරිරි...ට්!"

සද්දන්ත රෝස ඌරු මොටා තඩ්!! හඬක් නගමින් ගොඩබෑව වේගයට පැති මඟ ඉරිතැළුවා. තමන්ගේ වාසනාව අදහා ගන්න බැරුව ඌ දිහා පුදුමයෙන් බලා සිටි සිංහයෝ, ඊට පස්සේ ඌගේ ඇඟට කඩා පැන්නා. ඒ වෙලාවේ ම, හොඳටෝම පහර කාලා හිටපු හර්මීස් ප්‍රතිමාවකුත් ඊරියගේ ඔළුව උඩට පැනලා, කැඩූසියස් එකකින් නිර්දය විදිහට තඩිබාන්න ගත්තා. අර සිංහයින්ටත් හරිම නපුරු පෙනුම ඇති නිය පහුරු තිබුණා.

මම රිප්ටයිඩ් ඇදලා ගත්තා, ඒත් මට කරන්න තරම් දෙයක් ඉතුරු වෙලා තිබුණේ නැහැ. මගේ ඇස් ඉදිරිපිට දී ම ඊරිය කුඩු වෙලා ගියා. මට ඌ ගැන පොඩි දුකක් වගේ දෙයක් නොදැනුණාමත් නෙවෙයි. ඒ ඊරියට ටාටරස්වලදිවත් ඌගේ සිහින වල් ඌරු කුමාරයා මුණ ගැහේවා කියලා මම පැතුවා.

රාක්ෂයාව මුළුමනින් ම දූවිලි බවට පත් වුණාට පස්සේ, සිංහයෝ සහ හර්මීස් ප්‍රතිමාව අන්දමන්ද වෙලා වටපිට බැලුවා.

"දැන් ඔයාලට පුළුවන් මෑන්හැටන් ආරක්ෂා කරන්න," මම කිවුවත්, එයාට ඒක ඇහුනේ නැහැ වගෙයි. එයාලා උද්‍යාන මාවත දිගේ දුවද්දී, මගේ හිතේ මැවුණේ කවුරු හරි එයාලව අක්‍රිය කරනකල් ම එයාලා තව පියාඹන ඌරෝ හොය හොයා යන හැටියි.

හේයි, බොස්, බ්ලැක්ජැක් කතා කළා. අපි දැන් ඩෝනට් විරාමයක් ගමු ද?

මම ඇහි බැම මතට ගලා ආ දාඩිය පිස දැමුවා. "මාත් කැමතියි, යාළුවා. ඒත් යුද්දෙ තාම ඉවර නැනේ."

ඇත්ත ම කියනවා නම්, එය වඩ වඩාත් ළං වෙන හඬ මට ඇහුණා. මගේ යාළුවන්ට උදවු උවමනා වුණා. මම බ්ලැක්ජැක්ගේ පිට උඩට පැන්නා, ඊට පස්සේ අපි පිපුරුම් හඬවල් ඇසුණු උතුරු දෙසට පියඹා ගියා.

Scanned with CamScanner

15

# කයිරොන් සාදයක් දැමුවා

මිඩ්ටවුන් එක ම යුද පිටියක් වෙලා තිබුණා. හැම තැනක ම වගේ ඇවිලෙමින් තිබුණු පොඩි පොඩි සටන්වලට ඉහළින් අපි පියඹා ගියා. එක යෝධයෙක් බ්‍රයන්ට් උද්‍යානයේ ගස් උගුල්ලා දමද්දී, රුක් දේවතාවෝ එයාට ගඩා ගෙඩිවලින් ගැහුවා. වොල්ඩොර්ෆ් ඇස්ටෝරියාවට පිටත, බෙන්ජමින් ෆ්‍රෑන්ක්ලින්ගේ ලෝකඩ ප්‍රතිමාවක් අකුළාගත් පත්තරයකින් යම බල්ලෙකුට තළමින් හිටියා. හෙෆාස්ටස් කඳවුරුකරුවෝ තුන්දෙනෙක් රොක්ෆෙලර් මධ්‍යස්ථානය මැද ඩ්‍රැකනෙයි හට රංචුවක් සමඟ සටන් කළා.

එතැන නැවතිලා උදවු කරන්න මට හිතුණත්, නැගෙමින් තිබුණු දුමාරය සහ ගාලගෝට්ටිය අනුව නියම සටන දකුණු පැත්තේ තවත් ඔබ්බට ගොස් ඇති බව මට තේරුම් ගියා. අපේ ආරක්ෂක බලමුළු බිඳ වැටෙමින් තිබුණා. සතුරා එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලට ළං වෙමින් සිටියා.

අපි වටපිටාව පුරා වේගවත් නිරීක්ෂණ පියාසැරියක යෙදුණා. ඔලිම්පස්වල සිට ගොඩනැගිලි කාණ්ඩ තුනකට මෙපිටින්, තිස්හත් වෙනි වීදියේ දඩයක්කාරියෝ ආරක්ෂක පෙළක් පිහිටුවා තිබුණා. උද්‍යාන මාවතේ නැගෙනහිර පැත්තේ ජේක් මේසන් සහ තවත් හෙෆාස්ටස් කඳවුරුකරුවන් පිරිසක් සතුරාට එදිරිව ප්‍රතිමා හමුදාවක් මෙහෙයවමින් සිටියා. බටහිරින් එන ක්‍රෝනොස්ගේ උප දෙවි හට කණ්ඩායමේ මඟ හරස් කරමින් ඩිමීටර් කැබිනයේ අය සහ ග්‍රෝවර්ගේ



සොභාවික බලවේග විසින් භයවෙනි මාවත කැලයකට හරවා තිබුණා. දකුණු දිසාව දනට බේරිලා තිබුණත්, හතුරු හමුදා කාණ්ඩ ඒ වටා කැරකෙමින් හිටියා. තව විනාඩි කීපයකින් අපිව මුළුමනින් ම වටලාවි.

"එයාලට අපේ උදවු වැඩියෙන් ම ඕනෑ කරන තැනට අපිට ගොඩ බාන්න වෙනවා," මම කෙඳිරුවා.

ඒ කියන්නේ හැමතැනට ම, බොස්.

සටන් බිමේ ගිනිකොණ දෙසට වෙන්නට, උද්‍යාන මාවතේ උමං ප්‍රවේශ පථය අසල, හුරු පුරුදු රිදී පාට බකමූණු කොඩියක් මගේ ඇහැ ගැටුණා. ඇනබෙත් සහ එයාගේ සහෝදරයින් දෙන්නෙක් හයිපර්බෝරියානු යෝධයෙක් සමඟ ඔට්ටු වෙමින් සිටියා.

"අතනට!" මම බ්ලැක්ජැක්ට කිවුවා. එයා යුද පිටිය දෙසට වේගයෙන් පහත බැස්සා.

එයාගේ පිට මතින් පැන්න මම යෝධයාගේ ඔළුව උඩට ගොඩබෑවා. යෝධයා උඩ බලද්දී, මම ඌගේ මුහුණ දිගේ ලිස්සා පහළට ගියේ, ඌගේ නහය චප්ප වෙන්න පලිහෙන් පාරක් දීගෙනමයි.

"රාව්ව්ව්ර්ර්ර්!" නාස් පුඩුවලින් නිල් පාට ලේ පෙරාගෙන යෝධයා පස්සට විසි වුණා.

මම දුවන ගමනින් ම පදික වේදිකාවට පය ගැසුවා. හයිපර්බෝරියානුවා සුදු පාට මීදුම් වලාවක් ප්‍රාශ්වාස කළේ පරිසර උෂ්ණත්වය එක ක්ෂණයෙන් පහළ වට්ටමින්. මම පොළොවට පය ගැසූ තැන දූන් අයිස් තට්ටුවකින් වැහිලා, ඒ වගේම මාව සීනි දාපු ඩෝනට් එකක් වගේ තුහිනවලින් වැහුණා.

"හේයි, කැතයා!" ඇනබෙත් මොර ගැසුවා. එයා කතා කරන්නේ යෝධයාට මිසක් මට නෙවෙයි වෙන්න ඇති හිතලා මම හිත හදාගත්තා.

නිල් කොල්ලා ගර්ජනා කරමින් ඇනබෙත් දිහාවට හැරුණේ, එයාගේ අනාරක්ෂිත දෙපා පිටුපස නිරාවරණය කරමිනුයි. මම වේගයෙන් දුවගොස් එයාගේ දණහිසක් පිටුපසට ඇන්නා.

"වාාාාහ්හ්!" හයිපර්බෝරියානුවාගේ කකුල බකල ගැහුණා. එයා මගේ පැත්තට හැරෙනකල් මම බලාගෙන හිටියත්, එයා ගල් ගැහුණා. මං අදහස් කළේ, එයා ඇත්තටම අයිස් කඳකට මිදුණා. මගේ කඩු පහර වැදුණු තැන ඉඳන් එයාගේ මුළු සිරුර පුරා ම ඉරි තැළීම්

Scanned with CamScanner

මතු වුණා. ඒවා වඩ වඩාත් විශාල සහ පළල් වෙමින් කඩා වැටුණේ අන්තිමේ දී යෝධයාව නිල් පාට අයිස් පතුරු ගොඩක් බවට පත් කරමිනුයි.

"ස්තුතියි," ඇනබෙත් වේදනාවෙන් මූණ අකුළගෙන හුස්ම අල්ලන්න දඟලුවා. "ඌරා?"

"ඌට ඇඩ්‍රසුත් නැති කරා," මම කිව්වා.

"ඒක හොඳයි." එයා උරහිස සෙලෙව්වා. තුවාලය තවමත් එයාට වධ දෙන බව පැහැදිලිව ම පෙනෙන්න තිබුණා, ඒත් මගේ මුහුණෙන් පළ වූ හැඟීම් දැකලා එයා ඇස් කැරකුවා. "මට අවුලක් නෑ, පර්සි. එන්න යමු! අපිට තව හතුරෝ මදි නොකියන්න ඉතුරු වෙලා ඉන්නවා."

★★★

ඇත්තට ම එයා කිව්වා හරි. ඊළඟ පැය ගෙවී ගියේ අධි වේගයෙන්. මීට කලින් කිසිදාක සටන් කර නැති විදිහට මම සටන් කළා- ඩ්‍රැකනෙයි සේනා අතරට කඩා වදිමින්, සෑම පහරකින් ම ටෙලිකීන්ලා දුසිමක් විතර වනසමින්, එම්පොසායිලාව විනාශ කරමින් සහ සතුරු උප දෙවිවරුන්ව බිම හෙළමින් මම සටන් වැදුණා. ඒත් මම කොයි තරම් ගාණක් පරාද කළත්, උන්ගේ තැන ගන්න තව එවුන් වැඩි වැඩියෙන් ආවා.

ඇනබෙත් සහ මම කාණ්ඩයෙන් කාණ්ඩයට දුවමින්, අපේ ආරක්ෂක බළ මුළුවලට රුකුල් දෙන්න උත්සාහ කළා. අපේ යාළුවන්ගෙන් වැඩි දෙනෙක් තුවාල ලබා වීදිවල වැටී සිටියා. ඊටත් වැඩි දෙනෙක් අතුරුදහන් වී තිබුණා.

රාත්‍රිය උදා වී සඳ මුදුන් වෙද්දී අඩියෙන් අඩිය පසු බසිමින් ගිය අපි සහ එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල අතර සෑම දිසාවකින් ම ඉතිරිව තිබුණේ එක ගොඩනැගිලි කාණ්ඩයක පරතරය බැගින් පමණයි. එක මොහොතක දී මගේ ළඟ ග්‍රෝවර් සර්ප ගැහැනියකගේ ඔළුවට මුගුරෙන් තඩිබාමින් හිටියා. ඊළඟ මොහොතේ එයා සෙනඟ අතරේ නොපෙනී යද්දී, මගේ ළඟින් මතු වූ තාලියා, එයාගේ මායා පලිහෙන් රාක්ෂයින්ව බිය වද්දා එළවමින් සිටියා. හිටිවන ම කොහෙන්දෝ මතු වුණ මිසිස් ඕ'ලෙරී ලයිස්ට්‍රිගෝනියානු යෝධයෙක්ව මුවින් ඩැහැගෙන, ප්ලාස්ටික් කව පෙත්තක් වගේ ඈතට විසි කළා. ඇනබෙත් සතුරු හට පේළි පිටුපසට රහසින් ළඟා වෙන්න එයාගේ අදෘශ්‍යමාන කැප් එක



පාවිච්චි කළා. කොතැනක හෝ රාක්ෂයෙක් කිසිම හේතුවක් නැතිව, පුදුමයට පත් බැල්මක් සමඟ කුඩු වී යනවා දකිද්දී, ඇනබෙත් එතැන ඉඳලා තියෙන බව මම දැනගත්තා.

ඒත් මේ එකක්වත් ප්‍රමාණවත් වුණේ නැහැ.

"ඔහොම අල්ලගෙන ම ඉමු!" මගේ වම් පැත්තේ කොතැනකදෝ ඉඳන් කේටී ගාඩ්නර් කෑගහනවා ඇහුණා.

ඒත් ප්‍රශ්නෙකට තිබුණේ කිසිම දෙයක් අල්ලගෙන ඉන්න අපේ පිරිස ප්‍රමාණවත් නොවුණ එකයි. ඔලිම්පස් කන්දේ ප්‍රවේශ දොරටුව තිබුණේ මට අඩි විස්සක් පිටුපසිනුයි. නිර්භීත උප දෙවිවරු, දඩයක්කාරියෝ සහ සොභාවික බලවේගයන්ගෙන් සැදුණු වළල්ලක් විසින් එය මුර කළා. මම කපමින්, කොටමින් මගේ ඉස්සරහට එන සෑම දෙයක් ම වැනසුවා. ඒත් මම පවා හිටියේ වෙහෙසට පත් වෙමිනුයි. ඒ වගේම එක ම මොහොතක දී සෑම තැනක ම පෙනී හිටින්නත් මට පුළුවන්කමක් තිබුණේ නැහැ.

සතුරු හට සේනාවන්ට පිටුපසින්, ගොඩනැගිලි කාණ්ඩ කීපයක් නැගෙනහිර දෙසට වෙන්නට, දීප්තිමත් ආලෝකයක් දිලිසෙන්න පටන් ගත්තා. මුලින් ම මම හිතුවේ ඒ ඉර පායනවා කියලයි. ඒත් ඒ රන්වන් කරත්තයක් පදවාගෙන අපි දිහාවට එන ක්‍රෝනොස් කියලා ටිකකින් මට තේරුම් ගියා. ලයිස්ට්‍රිගෝනියානු යෝධයෝ දුසිමක් එයාට ඉදිරියෙන් විලක්කු ඔසවාගෙන ආවා. එයාගේ කළු-සහ-දම් කොඩි අරන් ආවේ හයිපර්බෝරියානුවෝ දෙන්නෙක්. ටයිටන් රජාට තිබුණේ හොඳින් විවේක ගෙන ප්‍රාණවත් වූ පෙනුමක්; එයාගේ බලයන් උපරිම ප්‍රබලත්වයෙන් ඇති බවක්. එයා වෙලාව ගනිමින් හෙමින් සීරුවේ ඉදිරියට ආවේ මට තවත් වෙහෙසින් හෙම්බත් වෙන්න සලසමිනුයි.

ඇනබෙත් මගේ ළඟින් මතු වුණා. "අපිට දොරකඩට පසු බහින්න වෙනවා. තියෙන උපරිම ශක්තියෙන් ඒක රැකගමු!"

එයා කිව්වා හරි. ඒත් මම පසු බහින්න නියෝග දෙන්න යනකොට ම වගේ දඩයම් නළාවක හඬ ඇසුණා.

ඒක යුද්ධයේ ඝෝෂාව කපාගෙන ආවේ හරියට ගිනි අනතුරු අඟවන නළා හඬක් වගෙයි. එයට පිළිතුරු ලෙස අපි වටෙන් ම නැඟුණු නළා හඬවල් සමූහය මෑන්හැටන් ගොඩනැගිලිවල වැදී දෝංකාර දුන්නා.

මම තාලියා දිහාවට බැල්මක් හෙළුවා, ඒත් එයා කළේ රවා බැලීම විතරයි.

"දඩයක්කාරියෝ නම් නෙවෙයි," එයා මට සහතික වුණා. "අපි හැමෝම මෙතැන."

"එහෙනම් කවුද?"

නළා හඬවල් වඩ වඩාත් තීව්‍ර වුණා. දෝංකාරය නිසා ඒ හඬ එන දිසාව හඳුනා ගන්න මට අපහසු වුණත්, එය ඇසුණේ සම්පූර්ණ හමුදාවක් ම එනවා වගෙයි.

තවත් හතුරෝ එනවා ද හිතලා මම බය වුණා. ඒ වුණත් ක්‍රෝනොස්ගේ සේනාවත් හිටියෙත් අපි තරමට ම ව්‍යාකූල වෙලා වගෙයි. යෝධයින්, එයාලගේ මුගුරු පහත හෙළුවා. ඩ්‍රැකනෙයිලා දත් අතරින් පිම්බා. අඩු තරමේ ක්‍රෝනොස්ගේ ගරු ආරක්ෂකයා පවා හිටියේ නොසන්සුන් වෙලා වගෙයි.

ඒ වෙලාවේ, අපේ වම් පැත්තේ සිටි රාක්ෂයෝ සිය ගාණක් එකවිට ම මර හඬ නැඟුවා. ක්‍රෝනොස්ගේ උතුරු බලකාය ම ඉදිරියට තල්ලු වුණා. අපි ඉවරෙට ම ඉවරයි කියලා මම හිතුවත්, උන් අපිට පහර දුන්නෙ නැහැ. අපිව පහු කරගෙන එක එල්ලේ ම දිව ගිය උන් දකුණු පස සිටි මිත්‍ර පාක්ෂිකයින් අතරට කඩා වැදුණා.

අලුත් නළා හඬක් රාත්‍රිය බිඳගෙන පැතිරුණා. වාතය නළියමින් දිලිසුණා, බොඳ වූ චලනයන් ගොඩක් මැදින් තුරඟ සේනාවක් මතු වුණේ හරියට ආලෝකයේ වේගයෙන් පාත් වුණා වගෙයි.

"නියමයි, බබෝ!" කටහඬක් හූ කිව්වා. "පාර්ටි!!"

අපේ හිස්වලට ඉහළින් ඇදී ගිය ඊතල වැස්සක් සතුරන් මතට කඩා හැළුණේ රාක්ෂයින් සිය ගාණක් එකවිට වාෂ්ප කර දමමින්. ඒත් මේවා සාමාන්‍ය ඊතල නෙවෙයි. සිස් ගාගෙන පියඹා ගිය ඒවාගෙන් සමහරකට සුළං බඹර අමුණා තිබුණා. අනෙක් ඒවා කෙළවර තිබුණේ තියුණු තුඩු වෙනුවට බොක්සිං අත්වැසුම්.

"නරාශ්වයෝ!" ඇනබෙත් මොර දුන්නා.

වෛවර්ණ කමිස, දේදුනු පාට බොරු කොණ්ඩා, පමණට වඩා විශාල අව් කණ්ණාඩි සහ යුද්ධයට පින්තාරු කළ මුහුණු සමග පාටි පෝනි හමුදාව අපි අතරට කඩා වැදුණේ වර්ණවත් කැරල්ලක් වගෙයි.



එයාලා සිය ගාණකින් මුළු කාණ්ඩය ම පිරුණා. දකින්න ලැබුණු සෑම දෙයක් ම තේරුම් ගන්න මගේ මොළයට බැරි වුණත්, මමත් හතුරු පිළේ හිටියා නම් මෙලහකටත් පණ කඩාගෙන දුවනවා කියලා නම් මට විශ්වාස වුණා.

"පර්සි!" වනචාරි නරාශ්ව රැල්ලට එපිට සිට කයිරොන් කෑගැසුවා. ඉණෙන් ඉහළ කොටස සන්නාහයකින් ආවරණය කරගෙන සිටි එයා, දුන්න අත දරාගෙන, තෘප්තිමත් ලෙසින් දත් නියවමින් හිටියා. "අපි පරක්කු වුණාට කණගාටුයි!"

"මචෝ!" තවත් නරාශ්වයෙක් මොර දුන්නා. "කතාව පස්සට. දැන් රාක්ෂයෝ සුද්ද කරමු!"

කාණු දෙකේ තීන්ත තුවක්කුවක් පිරවූ එයා සතුරු යම බල්ලෙක්ව තද රෝස පාටින් නැව්වා. ඒ තීන්තවලට දිව්‍යමය ලෝකඩ කුඩු වගේ දෙයක් මිශ්‍ර කරලයි තියෙන්න ඇත්තේ, මොකද ඒවා යම බල්ලාගේ වැදුණු සැණින් වේදනාවෙන් උඩු බිරුව ඌ රෝස-සහ-කළු පාට මඩ කඩිත්තකට දිය වී ගියා.

"පාටි පෝනියෝ," නරාශ්වයෙක් මොර දුන්නා. "දකුණු ෆ්ලොරිඩාවෙන්!"

යුද පිටියේ කොතැනින්දෝ මුක්කන් හඬකින් එයට පිළිතුරු මොරගෑවා, "ටෙක්සාස්වල අපි කොල්ලො වසයි!"

"හවායිවල අපි දෙනවා බැටේ!" තවත් එකෙක් කෑගැසුවා.

ඒක තමයි මගේ මුළු ජීවිතේට ම දැකපු ලස්සන ම දසුන. තීන්ත බෝල, ඊතල, කඩු සහ බේස්බෝල පිතිවලින් පහර පිට පහර වදිද්දී මුළු ටයිටන් හමුදාව ම ආපහු හැරී පලා ගියා. නරාශ්වයෝ එයාලගේ මඟ හරස් කරන ඕනෑ ම දෙයක් කුරවලින් පාගා පොඩි කර දැමුවා.

"දුවන්න එපා, මෝඩයිනේ!" ක්‍රෝනොස් මොර ගැසුවා. "නැවතිලා සටන්!"

එයාට වාක්‍ය සම්පූර්ණ කරගන්න නොලැබුණේ කුලප්පු වුණ හයිපර්බෝරියානු යෝධයෙක් පය පැකිළෙමින් ආපස්සට වැටී එයා උඩ ම ඉඳගත්ත නිසයි. යෝධයාගේ නිල් පාට තට්ටම යට කාලයට අධිපති නොපෙනී ගියා.

එයාලව ගොඩනැගිලි කාණ්ඩ ගණනාවක් දුරට පන්නගෙන ගිය අපිට කයිරොන් මොර ගැසුවා, "නවතිනවා! කිවුව ම අහලා නවතිනවා!"

එය පහසු දෙයක් නොවුණත්, අන්තිමේ දී ඒ නියෝගයට අවනත වුණ නරාශ්වයෝ සතුරන්ට පලා යන්න ඉඩ දීලා ආපසු එන්න ගත්තා.

"කයිරොන්ට මොළේ තියෙනවා," ඇනබෙත් කිවුවේ මුහුණේ දාඩිය පිස දමමින්. "අපි දිගට ම උන්ගේ පස්සෙන් එළවගෙන ගියොත්, අපේ කට්ටිය ඕනෑවටත් වඩා දුරට විසිරෙනවා. අපි ආපහු රැස්වෙන්න ඕනෑ."

"ඒත් හතුරෝ-"

"උන් පැරදුනේ නැහැ," එයා එකඟ වුණා. "ඒත් දැන් එළි වෙන්න ළඟයි. අඩු තරමේ අපි අපේ පැත්තට තව කාලයක් ලබාගත්තා නේ."

මේ විදිහට පහු බහින්න මම කැමති වුණේ නැහැ, ඒත් එයා කියන දේ හරි කියලා මම දැනගෙන හිටියා. අන්තිම ටෙලිකීනයෝ ටිකත් නැගෙනහිර ගඟ පැත්තට දඩිබිඩියේ දුවන දිහා මම බලා සිටියා. ඊට පස්සේ අකමැත්තෙන් වුණත් ආපසු හැරුණු මම එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල දිහාවට ගියා.

★★★

අපි එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල ළඟ සේනාපති කූඩාරම අටවා, ගොඩනැගිලි කාණ්ඩ දෙකක පරිමිතිය වටා සීමා සලකුණු කරා. පාටි පෝනියන්ගේ සංගමය විසින් රටේ හැම ප්‍රාන්තෙකින් ම වගේ කණ්ඩායම් එවා ඇති බව කයිරොන් අපිට දැනුම් දුන්නාඃ කැලිෆෝනියාවෙන් හතළිස් දෙනෙක්, රෝඩ් දූපතෙන් දෙන්නෙක්, ඉලිනොයිස්වලින් තිස් දෙනෙක්... දළ වශයෙන් පන්සිය දෙනෙක් විතර එයාගේ කැඳවුමට පිළිතුරු දී තිබුණා, ඒත් මේ තරම් පිරිසක් ඉඳලත් අපිට ගොඩනැගිලි කාණ්ඩ කීපයකට වඩා ආරක්ෂා කරන්න පුළුවන් වුණේ නැහැ.

"මචෝ," ලැරී නම් නරාශ්වයෙක් කතා කළා. එයාගේ ටී-ෂර්ට් එකේ සඳහන් වී තිබුණු හැටියට එයා නිව් මෙක්සිකෝවලින් ආව කණ්ඩායමේ කෙනෙක්. "මේක නම් වේගාස්වල තිබ්බ අපේ අන්තිම රැස්වීමටත් වඩා ජොලි නේ!"



"ආයෙත් අහලා," දකුණු ඩැකෝටාවෙන් ඇවිත් හිටපු ඔවන් කිවුවා. එයා හිටියේ කළු පාට ලෙදර් ජැකට්ටුවක් සහ දෙවෙනි ලෝක යුද සමයේ පරණ හමුදා හෙල්මටයක් පැලඳගෙනයි. "අපි උන්ව සම්පූර්ණයෙන් ම සුද්ද කරා!"

කයිරොන් ඔවන්ගේ පිටට තට්ටු කළා. "ඔයාලා නියමෙට වැඩේ දුන්නා, මගෙ යාළුවනේ, හැබැයි නොසැලකිලිමත් වෙන්නෙපා. ක්‍රෝනොස්ව කිසිම වෙලාවක අඩු තක්සේරු කරන්න හොඳ නැහැ. දැන් ඔයාලා බටහිර අංක තිස්තුනේ තියෙන කෑම ගන්න තැනට ගිහිල්ලා උදේට මොනවාහරි කාලා හිටියොත් නරක ද? ඩෙලවෙයාර් කට්ටිය රූට් බියර් තොගයක් හොයාගෙන කියලා මට ආරංචියි."

"රූට් බියර්!" එතැනින් හැල්මේ දුවන්න ගිහිල්ලා තව පොඩ්ඩෙන් එයාලා එකාට එකා පාගගන්නවා.

කයිරොන් හිනා වුණා. ඇනබෙත් එයා තදින් වැලඳගත්තා, මිසිස් ඕ'ලෙරී එයාගේ මූණ ලෙව කෑවා.

"ඈඈඈක්," එයා අවලාද නැඟුවා. "ඔය ඇති, බල්ලෝ. ඔව්, මටත් ඔයාව දකින්න ලැබුණට සන්තෝසයි."

"ස්තූතියි, කයිරොන්," මම කිවුවා. "ඔයා හින්දා තමයි අපිට යන්තම් පණ බේරගන්න ලැබුණේ."

එයා උරහිස් ඇකිළුවා. "මම ඒකට ගොඩක් වෙලාව ගත්තට කණගාටුයි. නරාශ්වයින්ට වේගයෙන් ගමන් කරන්න පුළුවන් කියලා ඔයාලා දන්නවා නේ. අපිට ගමන් යද්දී දුර ප්‍රමාණය අපිට ඕනෑ හැටියට නමාගන්න පුළුවන්කම තියෙනවා. එහෙම වුණත්, නරාශ්වයෝ ඔක්කොම එකට එකතු කරගන්න එක ලේසි පහසු වැඩක් නෙවෙයි. පාටි පෝනියෝ කියලා කියන්නේ සංවිධානය වෙන්න දන්න අය නෙවෙයි නේ."

"නගරේ වටේට තියෙන මැජික් බැම්ම හරහා ඔයාලා ආවෙ කොහොමද?" ඇනබෙත් ඇහුවා.

"ඒකෙන් අපේ වේගය ටිකක් විතර අඩු වුණා තමයි," කයිරොන් පිළිගත්තා. "ඒත් මං හිතන්නෙ එයාලා වැඩිමනත් ම ඒකෙන් බලාපොරොත්තු වෙලා තියෙන්නෙ මනුෂ්‍යයින්ව පිටමං කරලා තියාගන්නයි. වැඩකට නැති මිනිස්සු තමන්ගේ මහා ජයග්‍රහණයට යන පාර හරස් කරනවා දකින්න ක්‍රෝනොස් කැමති නැතුව ඇති."

Scanned with CamScanner

"එහෙනම් සමහරවිට අනිත් ආධාරවලටත් ඇතුළට එන්න පුළුවන් වෙයි," මම බලාපොරොත්තු සහගතව කිවුවා.

කයිරොන් එයාගේ රැවුල අතගෑවා. "සමහරවිට, ඒත් අපිට ඒ හැටි කාලයක් නැහැ. ක්‍රෝනොස් ආයෙමත් කණ්ඩායම් හදාගත්ත හැටියෙ ම පහර දෙයි. එයාලව පුදුම කරවලා පහර දෙන්න අපිට ක්‍රමයක් නැතුව නම්..."

එයා අදහස් කළ දේ මට තේරුණා. ක්‍රෝනොස් පරාද වුණේ නැහැ. කණාවටවත් නැහැ. අර හයිපර්බෝරියානු යෝධයාගේ හට්ටමවලට යට වෙලා ක්‍රෝනොස් චප්ප වුණා නම් කියලා මම ප්‍රාර්ථනා කළත්, එහෙම නොවෙන බව මම ම දැනගෙන හිටියා. එයා ආපහු එයි, බොහෝ දුරට අද රෑට ම.

"එතකොට ටයිෆූන්?" මම ඇහුවා.

කයිරොන්ගේ මූණ අඳුරු වුණා. "දෙවිවරුත් හෙම්බත් වෙලා ඉන්නේ. ඊයේ ඩයනයිසියස්ගේ බල බිඳිලා. ටයිෆූන් එයාගේ කරත්තෙ කුඩුපට්ටම් කරලා දාලා. ඊට පස්සේ වයින් දෙවියව ඇපලේචියන් පැත්තෙ කොහෙටදෝ වැටිලා. එයින් පස්සේ කාටවත් ම එයාව දකින්න ලැබිලා නැහැ. හෙෆාස්ටස්සුත් දැන් සටනේ නැහැ. එයාව සටන තිබ්බ තැන ඉඳලා කොච්චර වේගයෙන් විසි වෙලා ද කියනවා නම්, බටහිර වර්ජිනියාවල එයා වැටිච්ච තැන අලුතින් විලකුත් හැදිලලු. එයා සනීප වෙයි. හැබැයි උදවු කරන්න පුළුවන් තරම් ඉක්මනට නෙවෙයි. අනිත් අය තාම සටන් කරනවා. ටයිෆූන්ගේ වේගේ අඩු කරන්න එයාලට පුළුවන් වෙලා තියෙනවා. ඒත් රාක්ෂයාව නවත්තන්න නම් බැහැ. හෙට මේ වෙලාව වෙද්දි එයා නිව්යෝක්වලට ඇවිල්ලා ඉඳියි. එයයි ක්‍රෝනොස්ගේ හමුදාවයි එකට එකතු වුණා ම-"

"ඊට පස්සෙ අපිට මොනවා වෙයි ද?" මම ඇහුවා. "අපිට තවත් දවසක් අල්ලගෙන ඉන්න පුළුවන්කමක් නෑ."

"අපිට කොහොම හරි ඒක කරන්න ම වෙනවා," තාලියා කිවුවා. "සීමාව වටේට අලුතින් තව උගුල් ටිකක් අටවන්න මම බලන්නම්."

එයාට තිබුණේ හෙම්බත් වුණ පෙනුමක්. එයාගේ ජැකට්ටුව කුණු සහ රාක්ෂ දූවිලිවලින් වැහිලා, ඒ කොහොම වුණත් අමාරුවෙන් දෙපයින් සිටගෙන එයා හාටමින් යන්න ගියා.



"මමත් ගිහින් එයාට උදවු කරන්නම්," කයිරොන් තීරණය කළා. "මගේ නෑදෑයෝ රූට් බියර්වලින් පදම වැඩි කරගන්න කලින් මම එතැනට යන්න ඕනෑ."

ඇනබෙත් එක්ක මාව තනි කරමින් කයිරොන් හැල්මේ දුවගියා.

ඇනබෙත් හිටියේ කිණිස්සේ තැවරුණු රාක්ෂ සෙවෙල පිරිසිදු කරමින්. එයා ඒ වැඩේ කරනවා මම සිය පාරක් විතර දකලා තිබුණත්, ඒ ආයුදය ගැන එයා ඒ තරම් සැලකිල්ලක් දක්වන්නෙ ඇයි කියලා මීට කලින් කවදාවත් මම හිතලා තිබුණේ නැහැ.

"අඩු තරමෙ ඔයාගේ අම්මා අවුලක් නැතුව ඉන්නවා නේ," මම කිවුවා.

"ඔව් ඉතින්, ඒ ටයිෆූන් එක්ක සටන් කරන එක අවුලක් නෙවෙයි කියලා ඔයා හිතනවා නම්." එයා මගේ දෑස් දිහා බලා හිටියා. "පර්සි, නරාශ්වයින්ගේ උදවු එක්ක වුණත්, මට හිතෙන්නේ-"

"මම දන්නවා." අපි දෙන්නට කතා කරන්න ලැබෙන අන්තිම අවස්ථාව මේක වෙන්නත් පුළුවන් කියලා මගේ හිත කිවුවා, ඒ වෙලාවේ මට දැනුණේ මම එයාට නොකියපු දේවල් මිලියන ගාණක් විතර තියෙනවා වගෙයි. "අහන්න, හෙස්ටියා මට... සමහර දේවල් පෙන්නුවා."

"ලූක් ගැන ද?"

සමහරවිට ඒක නිකං අනුමානයක් විතරයි වෙන්න ඇති, ඒ වුණත් මට දැනුණේ මම නොකියා සිටි දේවල් ගැන ඇනබෙත් දැනගෙන හිටියා වගෙයි. සමහරවිට එයාටත් හීන මොනවා හරි පෙනුණා ද දන්නෙ නැහැ නේ.

"ඔව්," මම කිවුවා. "ඔයයි, තාලියායි ලූක්යි. ඔයාලා ඉස්සෙල්ලම මුණ ගැහුණ දවස. තව, ඔයාලට හර්මීස්ව මුණ ගැහිච්ච දවස."

ඇනබෙත් එයාගේ කිණිස්ස ආපහු කොපුව තුළට දැමුවා. "මට කවදාවත් කරදරයක් වෙන්න ඉඩ තියන්නෑ කියලා ලූක් පොරොන්දු වුණා. එයා කිවුවා... එයා කිවුවා අපි අලුත් පවුලක් වෙනවා කියලා, ඒ වගේම ඒක එයාගේ පවුලට වඩා හොඳ එකක් වෙයි කියලා."

එයාගේ දෑස් මට මුඩුක්කු වීදියේ සැඟවී සිටි අවුරුදු-හතක්-වයස ගෑනු ළමයව සිහිපත් කළා- තරහෙන් කිපුණු, බියපත් වුණු සහ මිතුරෙකුගේ උවමනාව තදින් තිබුණු දැරියව.

Scanned with CamScanner

"ඉස්සෙල්ලා තාලියා මාත් එක්ක කතා කළා," මම කිවුවා, "එයා බයේ ඉන්නේ-"

"ලූක්ට මූණ දෙන්න මට බැරි වෙයි කියලා," එයා මූසල හඬින් කිවුවා.

මම ඔළුව වැනුවා. "ඒත් ඔයා දැනගන්න ඕනෑ තව දෙයක් තියෙනවා. මට පේන්නෙ ලූක් තවමත් එයාගේ ඇඟ ඇතුළේ ඉන්නවා කියලා, සමහරවිට පාලනය ආපහු ගන්න ක්‍රෝනොස් එක්ක සටන් කරනවා කියලා ඊතන් නකමුරා හිතනවා වගෙයි."

ඇනබෙත් එය සඟවා ගන්න උත්සාහ කළත්, එයාගේ හිත ඒ වගේ දෙයක් වෙන්න ඇති හැකියාව ගැන සලකා බලන හැටි වගේ ම, අලුතින් බලාපොරොත්තු ඇති කරගන්නවාත් මට පෙනුණා.

"මේක ඔයාට කියන්න මට ඕනෑ වුණේ නැහැ," මම ඇත්ත ම කිවුවා.

එයා හිස ඔසවා එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල දිහා බැලුවා. "පර්සි, මගේ ජීවිතෙන් වැඩි හරියක් ම මට දැනුණේ, හැම වෙලාවෙ ම, හැම දෙයක් ම වෙනස් වෙනවා වගෙයි. මට විශ්වාස තියන්න පුළුවන් කිසිම කෙනෙක් හිටියෙ නැහැ."

මම ඔළුව වැනුවා. ඒක නම් ගොඩක් උප දෙවිවරුන්ට තේරුම් ගන්න පුළුවන් දෙයක්.

"අවුරුදු හතේ දී මම පැනලා ගියා," එයා කිවුවා. "ඊට පස්සේ ලූක්වයි තාලියාවයි මුණ ගැහුණා ම, මට පවුලක් ලැබුණා කියලා මම හිතුවා, ඒත් ඒක ඒ ඉක්මනින් ම වගේ නැති වෙලා ගියා. මම මේ කියන්න හැදුවේ... අනිත් අය මාව වට්ටන එක, හැම දෙයක් ම ඉක්මනට නැතිවෙලා යන එක මට පෙන්නන්න බැරි වැඩක්. මං හිතන්නේ, මට ගෘහ නිර්මාණ ශිල්පියෙක් වෙන්න ඕනෑ වෙලා තියෙන්නෙ ඒ නිසයි."

"හැමදාට ම පවතින දෙයක් හදන්න," මම කිවුවා. "අවුරුදු දාස් ගාණක් පවතින ස්මාරකයක් හදන්න."

එයා මගේ ඇස් දිහා බලාගෙන ම හිටියා. "ඒකත් ආයෙ ම මගේ මාරක වැරැද්ද වගෙයි නේ."

අවුරුදු ගාණකට කලින් රාක්ෂ සයුරේ දී ඇනබෙත්, එයාගේ ලොකු ම දුර්වලකම උඩඟුකම- ඒ කියන්නේ එයාට ඕනෑම දෙයක් කරන්න පුළුවන් කියලා හිතන එකයි කියලා මට කිවුවා. කිඳුරියන්ගේ



මායා බලයෙන් එයාට පෙන්වූ එයාගේ හිතේ ගැඹුරින් ම ඇති ආශාව ගැන දසුන් මටත් දකින්න ලැබී තිබුණා. ඇනබෙත් ගේ සැලසුම්වලට අනුව අලුතින් ඉදිකළ මැන්හැටන් නගරය ඉදිරිපිට එයාගේ අම්මා සහ තාත්තා එකට ඉන්න හැටි එයා හිතේ මවාගෙන තිබුණා. ඒ වගේ ම එතැන ලූක්ත් හිටියා- ආයෙමත් හොඳ කෙනෙක් බවට පත්වෙලා, එයාව සාදරයෙන් පිළිගනිමින් හිටියා.

"මං හිතන්නෙ, ඔයාට දැනෙන විදිහ මට තේරෙනවා." මම කිවුවා. "ඒ වුණාට තාලියා කියපු කතාව හරි. ලූක් දැනටමත් සෑහෙන වතාවක් ඔයාට ද්‍රෝහි වෙලයි තියෙන්නේ. එයා දුෂ්ටයෙක් වුණේ ක්‍රෝනොස් එන්නත් කලින් ඉඳලමයි. එයා ඔයාට තවත් රිද්දනවා දකින්න මට ඕනෑ නැහැ."

ඇනබෙත් දෙතොල් තදින් පියවා ගත්තා. එයා උත්සාහ කරන්නේ කේන්ති නොගෙන ඉන්නයි කියලා මට තේරුණා.

"එහෙනම් ඔයා කියන දේ වරදින්නත් ඉඩක් තියෙනවා කියලා මම දිගට ම බලාපොරොත්තු වෙන එක ගැනත් ඔයාට තේරුම් ගන්න පුළුවන් ඇති නේ."

මම අහක බලාගත්තා. මම මට පුළුවන් උපරිමයෙන් උත්සාහ කළා කියලා මට දැනුණත්, එයින් මට වුණු හොඳක් නම් නැහැ.

පාරෙන් එහා පැත්තේ, ඇපලෝ කැබිනයේ අය තුවාලකරුවන්ට- කඳවුරුකරුවන් දුසිම් ගාණකට සහ දඩයක්කාරියෝ හැමදෙනාට ම වගේ- ප්‍රතිකාර කරන්න තාවකාලික රෝහලක් පිහිටුවා තිබුණා. වෛද්‍යවරු වැඩ කරන දිහා බලාගෙන, මම කල්පනා කරමින් සිටියේ ඔලිම්පස් කන්ද අල්ලගෙන ඉන්න අපිට ඇත්තේ කොයි තරම් පොඩි ඉඩක් ද කියලයි...

ඊට පස්සෙ එක පාරට ම: මම තවදුරටත් එතැන හිටියෙ නැහැ.

වැඩිහිටි පිරිසක් විනෝද වෙමින් සිටි, නියෝන් විදුලි පුවරු සහ කළු පාට බිත්ති සහිත දිගු අඳුරු බීමහලක් තුළ මම සිටගෙන සිටියා. බීමහල හරහා එල්ලා තිබූ බැනරයක 'බොබී අර්ල්ට සුබ උපන් දිනයක්!' කියා සටහන් කර තිබුණා. ශබ්ද විකාශනයෙන් ගැමි සංගීතය වාදනය වුණා. බීමහල තුළ පිරී සිටියේ ජීන්ස්වලින් සහ වැඩට අඳින කමිසවලින් සැරසුණු හැඩිදැඩි පිරිසක්. බීම තැබූ බන්දේසි රැගෙන එහා මෙහා ගිය බීමහලේ සේවිකාවන් එකිනෙකාට මහ හඬින් කෑගසා

Scanned with CamScanner

ගත්තා. ඒක නම් මගේ අම්මා කිසිම දවසක මට අඩියක්වත් තියන්න නොදෙන විදිහේ තැනක්.

මම හිටියේ කුටියේ පිටුපස ම කෙළවර නාන කාමර (ඒවාගේ ගඳ ගැන කියලා වැඩක් නැහැ) සහ සෑහෙන පරණ, කාසි දමා සෙල්ලම් කළ හැකි ක්‍රීඩා යන්ත්‍ර දෙකක් මැද හිරවෙලා.

"අහ් හොඳයි, ඔයා ඇවිල්ලා," පැක්-මෑන් යන්ත්‍රය අසල සිටි පිරිමියෙක් කිවුවා. "මට ඩයට් කෝක් එකක් තිබුණොත් හොඳයි."

තරබාරු හාදයෙක් වුණ එයා හැඳ පැලඳගෙන සිටි කොටි පුල්ලි මෝස්තරයක් සහිත හවායි කමිසය, දම් පාට කොට කලිසම, දිවිමට පලඳින රතු පාට සපත්තු ජෝඩුව සහ කළු මේස් දෙක නිසා එතැන සිටි අනිත් පිරිසෙන් එයාව කැපිලා පෙනුණා. එයාගේ නහය රතු වෙලා. එයාගේ කළු පාට කැරලි කොණ්ඩය වටා වෙළුම් පටියක් ඔතා තිබුණේ හරියට එයා හිසට වැදුණු පහරකින් සුවපත් වෙමින් ඉන්නවා වගෙයි.

මම තදින් ඇහිපිල්ලම් ගැහුවා. "මිස්ටර් ඩී?"

එයා සෙල්ලමෙන් දෑස් ඉවතට නොගෙන ම සුසුමක් හෙළුවා. "අනේ ඇත්තට, පීටර් ජොන්සන්, මාව දැකපු ගමන් අඳුනා ගන්න ඔයාට තව කොච්චර කාලයක් යයි ද?"

"ඔයාට මගේ නම මතක තියාගන්න යන තරම් කාලයක්," මම කෙඳිරුවා. "අපි මේ කොහෙද ඉන්නේ?"

"ඇයි, මේ බොබී අර්ල්ගේ උපන්දින පාටිය නේ," ඩයනයිසියස් කිවුවා. "ඇමරිකාවේ සුන්දර ගම්බද පලාතක."

"මං හිතුවේ ටයිෆූන් ඔයාව මැස්සෙකුට වගේ ගහලා බිම දැම්මා කියලා. ඔයාව පොළොවට ඇදගෙන වැටුණා කියලයි ආරංචි වුණේ."

"ඔයා මං ගැන හිතපු එක ම කොච්චර දෙයක් ද. මාව පොළොවට ඇදගෙන වැටුණා තමයි. ඒකත් ලේසි පහසු වැටිල්ලක් නෙවෙයි. ඇත්ත ම කියනවා නම්, මගේ කොටසක් තාමත් අත ඇරලා දාපු අඟුරු පතලක සක්ක කැලි අස්සේ අඩි සිය ගාණක් යට වැළලිලා තියෙන්නේ. මට හොඳට ම සනීප වෙන්න තරම් ශක්තිය එකතු වෙන්න තව පැය ගාණක් යයි. එතකල්, මගේ විඥානයෙන් කොටසක් මෙතැනට ආවා."

"බාර් එකක, පැක්-මෑන් ගහනවා."



"පාටි වෙලාව," ඩයනයිසියස් කිවුවා. "ඇත්තට ම ඔයාට ඒක අහන්න ලැබිලා ඇති නේ. පාටියක් තියෙන්නෙ කොතැන ද, එතැන මමත් ඉන්නවා. මේ නිසා මට එක ම වෙලාවේ තැන් ගොඩක ඉන්න පුළුවන්. එක ම ප්‍රශ්නෙකට තියෙන්නේ පාටියක් හොයාගන්න එකයි. නිව්යෝක්වල ඔයාගේ චූට්ටි ආරක්ෂක බුබුළට පිටින් සිද්ධ වෙන දේවල් ගැන ඔයා දන්නව ද මන්දා-"

"චූට්ටි ආරක්ෂක බුබුළ?"

"-ඒත් මං කියනවට විශ්වාස කරන්න, මෙහෙ හාට්ලන්ඩ්වල ඉන්න මිනිස්සු හොඳටම බයවෙලා ඉන්නේ. ටයිෆූන් එයාලව නොසැහෙන්න බය ගන්නලා. ඒ හින්දා පාටි දාන්නෙ බොහොම ටිකදෙනයි. පෙනෙන හැටියට, බොබී අර්ලුයි, එයාගේ යාළුවෝ ටිකයි නම්, අනේ වාසනාවන්, මන්දබුද්ධිකයෝ වගේ. ලෝක විනාශේ අත ළඟ එනවා කියලා එයාලට තාම තේරිලා නැහැ."

"ඒ කියන්නේ... මම ඇත්තට ම මෙතැන නැ?"

"නෑ. තව ටිකකින් මම ඔයාව ආපහු ඔයාගේ වැදගැම්මකට නැති පුරුදු ජීවිතේට යවනවා, ඊට පස්සේ මෙහෙම දෙයක් සිද්ධ වුණේ නැති ගාණට තියෙයි."

"එතකොට ඇයි ඔයා මාව මෙහෙට ගෙනාවේ?"

ඩයනයිසියස් මහ හඬින් නහයෙන් පිම්බා. "ඔහ්, මට විශේෂයෙන් ඔයාව ම ඕනෑ වුණේ නැහැ. ඔහේලගේ අර තකතීරු වීරයින්ගෙන් කවුරු ආවත් එකයි. අර ඇනී කෙල්ල-"

"ඇනබෙත්."

"කාරණේ මේකයි," එයා කිවුවා, "මම ඔයාව පාටියකට ඇදලා ගත්තෙ අනතුරු ඇඟවීමක් කරන්න. අපි ඉන්නෙ ලොකු අනතුරක."

"අනේ ඇත්ත ද," මම කිවුවා. "ඔයා කියනකල් ම මට ඒක තේරුනේ නැහැ නේ. බොහෝම ස්තුතියි."

තරහෙන් මට රවාගෙන හිටපු එයාට එක මොහොතකට එයාගේ සෙල්ලමත් අමතක වුණා. පැක්-මෑන්ව අර රතු පාට අවතාරේ කාලා දැම්මා.

"ඊර් එස් කොරකාස්, බ්ලින්කි!" ඩයනයිසියස් ශාප කළා. "මං උඹව විනාශ කරනවා!"

Scanned with CamScanner

"ම්, ඒක මේ වීඩියෝ ගේම් එකේ චරිතයක් විතරයි නේ," මං කිව්වා.

"ඒක සමාවට කාරණයක් නෙවෙයි! ඒ මදිවට ඔහේ මගේ ගේම් එක කඩාකප්පල් කරනවා, ජොහෙන්සන්!"

"ජැක්සන්."

"ඕනෑ එකක් මේ අහනවා. දැන් තත්ත්වේ ඔහේ කියනවටත් වඩා ගොඩක් බරපතලයි. ඔලිම්පස් වැටුණොත්, විනාශ වෙන්නෙ දෙවිගොල්ලෝ විතරක් නෙවෙයි. අපේ උරුමයට සම්බන්ධ වෙලා තියෙන හැම දෙයක්මත් නැතිවෙලා යන්න පටන් ගනී. ඔහේලගේ කුරු පුංචි ශිෂ්ටාචාරේ සැකිල්ල පවා."

ක්‍රීඩාවෙන් ගීතයක් වාදනය වෙද්දී, මිස්ටර් ඩී 254වෙනි ලෙවල් එකට ගියා.

"හා!" එයා කෑගැහුවා. "කාලා වරෙල්ලකෝ!"

"මේ, ශිෂ්ටාචාරේ සැකිල්ල." මම එයාව උනන්දු කළා.

"ඔව්, ඔව්. ඔහේලගෙ සමාජය ම නැති නාස්ති වෙලා යයි බාගදා, මේ දැන් ම නෙවෙයි, ඒත් මම කිව්වයි කියලා මතක තියාගන්න. ටයිටන්ලගේ අවුල බටහිර ශිෂ්ටාචාරේ අවසානය ඇති කරයි. කලාව, නීතිය, වයින් රහ බැලීම, සංගීතය, වීඩියෝ ගේම්, සිල්ක් කමිස, කළු වෙල්වට් චිත්‍ර- ජීවත් වෙනවා කියන එකට වටිනාකමක් එකතු කරන හැම දෙයක් ම නැතිවෙලා යයි!"

"එහෙනම් දෙවිගොල්ලෝ අපේ උදව්වට ඉක්මන් කරලා එන්නෙ නැත්තෙ ඇයි?" මම ඇහුවා. "අපි ඔලිම්පස්වල දී අපේ බලකායන් එක්කාසු කරන්න ඕනෑ. ටයිෆූන්ව අමතක කරලා දාන්න."

එයා නොඉවසිල්ලෙන් අසුරක් ගැහුවා. "ඔයාට මගේ ඩයට් කෝක් එක අමතක වුණා."

"දෙයියනේ, ඔයා නම් මහ ඇණයක්." සේවිකාවකට කතා කළ මම තකතීරු සෝඩා එකක් ඇණවුම් කළා. මම ඒකත් බොබී අර්ල්ගේ බිලට ම එකතු කළා.

මිස්ටර් ඩී එයින් ලොකු උගුරක් බිව්වා. හැබැයි එයාගේ ඇස් දෙක නම් කොයි ම වෙලාවකවත් වීඩියෝ ගේම් එකෙන් පිටට ගියේ නැහැ.



"ඇත්තම කියනවා නම්, පියරේ."

"පර්සි."

"අනිත් දෙවිවරු කවදාවත් මේක පිළිගන්නෙ නැති වෙයි. ඒත් අපිට ඔලිම්පස් බේරගන්න ඇත්තට ම ඉලාස ඔයාලගේ උදව් ඕනෑ. ඔයාට පේනවා නේ, අපි තමයි ඔයාලගේ සංස්කෘතියේ සාරය. ඔයාලා ඔලිම්පස් ඒකගන්න උනන්දු නොවුණොත්."

"හරියට පැන් වගේ," මම කිව්වා. "එයා වනාන්තර බේරගන්න ඇවිල්ලා මහ ලෙඩුණා වගේ."

"ඔව්, හරියට ම තමයි. ඇත්ත වශයෙන් ම මෙහෙම කතාවක් මම කිව්වා කියලා මම කිසිම දවසක පිළිගන්නෙ නැහැ තමයි. ඒත් දෙවිවරුන්ට වීරයින්ව ඕනෑ. එයාලට හැමදාමත් ඕනෑ කළා. එහෙම නැත්නම් අපි මොකටද ඔයාලා වගේ නොසන්ඩාලයෝ තියාගන්නේ."

"මාව කොච්චර වටිනවද කියලා මට දැන් තේරෙනවා. බොහෝම ස්තූතියි."

"කඳවුරේ දී මම ඔයාට දුන්න පුහුණුව පාවිච්චි කරන්න."

"මොන පුහුණුව ද?"

"ඔයා දන්නවා නේ. අර වීරයින්ගේ ශිල්ප ක්‍රමයි... හා!" මිස්ටර් ඩී ක්‍රීඩා හැසිරවුම් පුවරුවට ගැහුවා. "තා පරී ට එව්! අන්තිම ලෙවල් එක!"

මගේ දිහා බැලුව එයාගේ ඇස්වල දම් පාට ගිනි දැල්ලක් නැටුවා. "මට මතක හැටියට, ඔයත් අනිත් මනුෂ්‍ය වීරයෝ වගේම ආත්මාර්ථකාමී එකෙක් වෙයි කියලා වතාවක් මම අනාවැකි කිව්වා. හොඳයි, මේක තමයි මම වැරදියි කියලා ඔප්පු කරන්න ඔයාට ලැබෙන අවස්ථාව."

"අනේ ඔව්, ඔයාට ආඩම්බර හිතෙන්න සලස්වන එක මගේ වැඩ ලැයිස්තුවේ උඩින් ම තියෙන දෙයක් නේ."

"ඔයා ඔලිම්පස් ආරක්ෂා කරගන්න ම ඕනෑ. පෙඩරෝ ටයිෆූන්ව ඔලිම්පියානුවන්ට ඉතුරු කරලා, අපේ බල ආසන ආරක්ෂා කරන්න. ඒක කරන්න ම ඕනෑ!"

"නියමයි. කතා කරකර හිටියා මදියි. දැන්. ඔයා මුකුත් හිතන්නෙ නැත්නම්, මගේ යාළුවෝ බලනවා ඇති-"

Scanned with CamScanner

"තව දෙයක් තියෙනවා," මිස්ටර් ඩී අනතුරු ඇඟෙව්වා. "ක්‍රෝනොස් තව ම එයාගේ සම්පූර්ණ බලය ම ලබාගෙන නැහැ. මනුෂ්‍ය ඇඟකට ආරූඪ වෙච්ච එක එයාගේ තාවකාලික උපායක් විතරයි."

"අපිත් එහෙම හිතුවා."

"එතකොට, වැඩි ම වුණොත් තව දවසක් ඇතුළත ක්‍රෝනොස් අර මනුෂ්‍ය සරීරේ පුච්චලා දාලා, ටයිටන් රජෙක්ගේ සැබෑ ස්වරූපෙට පත් වෙයි කියලත් ඔයාලා හිතුව ද?"

"ඒ කියන්නේ එතකොට..."

ඩයනයිසියස් තවත් කාලේ කාසියක් යන්ත්‍රයට දැමුවා. "දෙවිවරුන්ගේ සැබෑ ස්වරූපේ ගැන ඔයා දන්නවා නේ."

"ඔව්. පිච්චිලා යන්නෙ නැතිව එයාලා දිහා බලන්නවත් අපිට බැහැ."

"ක්‍රෝනොස් ඒ වගේ දහ ගුණයක් බලවත් වෙයි. එයා ළඟපාතක හිටියත් ඔයාලව අළු වෙලා යයි. ඒ වගේම එයා මේක ඉෂ්ට කරගත්තට පස්සේ, එයා අනිත් ටයිටන්ලටත් බලය දෙයි. ඔයාලට එයාලව නවත්තන්න බැරි වුණොත්, එයාලට ලැබෙන ඒ බලය එක්ක බලද්දී දැන් එයාලා ඉන්න තත්ත්වෙ නිකං දුර්වල එකක් වගේ. මුළු ලෝකෙ ම පිරිහිලා යයි, දෙවිවරු මැරිලා යයි, ඒ මදිවට මට කිසිම දවසක මේ තකතීරු මැෂිමෙන් හොඳ ම ලකුණු ගාණ ගන්නත් බැරිවෙයි."

සමහරවිට ඒ කතාව අහලා මම බය විය යුතු වුණත්, අවංකව ම කියනවා නම්, ඒ වෙද්දී මම හිටියේ මට පුළුවන් උපරිමේට ම බය වෙලයි.

"මට දැන් යන්න පුළුවන් ද?" මම ඇහුවා.

"තව එක දෙයක්. මගේ පුතා පොලක්ස්. එයා පණ පිටින් ඉන්නව ද?"

මම තදින් ඇහි පිය ගැහුවා. "ඔව්. මම අන්තිමට දකිද්දී නම් පණ පිටින් හිටියා."

"ඔයාට එයාව ඒ විදිහට ම තියාගන්න පුළුවන් නම් මට හරිම වටිනවා. ගිය අවුරුද්දේ මට එයාගේ සහෝදරයා කාස්ටර්ව නැති වුණා-"



"මට මතකයි." මම එයා දිහා පුදුමයෙන් බලා සිටියේ, ඩයනයිසියස්ට දරුවෝ ගැන හොයා බලන තාත්තෙක් වෙන්නත් පුළුවන් කියන අදහස දිරවාගන්න උත්සාහ කරමින්. මේ වෙලාවේ තව ඔලිම්පියානුවෝ කීදෙනෙක් තමන්ගේ උප දෙවි දරුවෝ ගැන හිතනවා ඇති ද කියලා මම පුදුමයෙන් කල්පනා කළා. "මම මට පුළුවන් උපරිමෙන් උත්සාහ කරන්නම්."

"ඔයාගේ උපරිමෙන්," ඩයනයිසියස් කෙඳිරුවා. "හොඳයි, ඒක කොච්චර සහනයක් ද. දැන් යන්න. ඔයාට ආන්බාං කරන්න මහ නපුරු පුදුම කිරීම් ටිකක් තියෙනවා. ඒ අස්සෙ මම මේ බ්ලින්කියාව මට්ටු කරන්න එපැයි!"

"නපුරු පුදුම කිරීම්?"

එයා අතක් වැනුවා ම බීමහල අතුරුදහන් වුණා.

★★★

මම ආයෙමත් පස්වෙනි වීදියට ඇවිත් හිටියා. ඇනබෙත් හිටපු තැනින් අඟලක්වත් හෙලවිලා නැහැ. මම එතැනින් අතුරුදහන් වෙලා හිටියා කියලා ඇනබෙත්ගෙන් කිසිම ඉඟියක්වත් පෙනුනෙ නැහැ.

මම පුදුමයෙන් බලා ඉන්නවා දැකලා එයා රැව්වා. "මොකද?"

"ම්ම්... මුකුත් නෑ, මං හිතන්නේ."

මම වීදිය දිගේ සැලකිල්ලෙන් ඇස් දිවෙව්වේ, නපුරු පුදුම කිරීම් කියලා මිස්ටර් ඩී අදහස් කරන්න ඇත්තේ මොනවාද, හිතමිනුයි. මේ තියෙන තත්ත්වය මීටත් වඩා නරක අතට හැරෙන්න ඉඩක් තියෙනව ද?

මගේ දෑස තැළුම් කාපු නිල් පාට කාරයක් ළඟ නැවතුණා. එහි වහලය දරුණු ලෙස කඩතොලු වී තිබුණේ හරියට කවුරුහරි එහි වූ අති විශාල පලුදු සකස් කරන්න උත්සාහ කරලා වගෙයි. මගේ හම පොපියන්න ගත්තා. ඒ කාරයට එච්චර හුරුපුරුදු පෙනුමක් තියෙන්නෙ ඇයි? ඒ වෙලාවේ මට තේරුම් ගියේ ඒක ප්‍රියස් කාරයක් කියලයි.

පෝල්ගේ ප්‍රියස් කාරය.

මම වීදිය පහළට දුවන්න ගත්තා.

"පර්සි!" ඇනබෙත් කතා කළා. "ඔයා කොහෙද යන්නේ?"

Scanned with CamScanner

කාරයේ රියැදුරු අසුන මත පෝල් නින්දට වැටී සිටියා. එයා අසල අනිත් අසුනේ ගොරවමින් හිටියේ මගේ අම්මා. මට දැනුණේ මගේ ඔළුව ම අවුල් වෙලා වගෙයි. මීට කලින් මම එයාලව නොදැක්කේ කොහොමද? එයාලා වටේට ම යුද්ධය ඇවිළෙද්දී ඒ දෙන්නා දවසකටත් වැඩි කාලයක් පුරාවට මේ වාහන ගොඩ මැද්දේ ඉඳගෙන ඉඳලා, ඒත් මම අඩු තරමේ එයාලව දැක්කෙවත් නැහැ.

"එයාලා... එයාලත් අර අහසේ තිබුණ නිල් පාට එළි දකින්න ඇති." මම දොරවල් සොලවා බැලුවා, ඒත් ඒවා අගුළු දමලා. "මම එයාලව එළියට ගන්න ඕනෑ."

"පර්සි," ඇනබෙත් මෘදු හඬින් කතා කළා.

"එයාලව මෙතැන දාලා යන්න මට බෑ!" මම කියෙවුවේ පිස්සුවෙන් වගෙයි. මම කාරයේ සුළං මුවාවට මිටි කරගත් දැතින් ගැහුවා. "මම එයාලව වෙන තැනකට ගෙනියන්න ඕනෑ. මම එහෙම කරන්න ම ඕනෑ-"

"පර්සි, ටිකක්... ඔහොම ටිකක් ඉන්නකෝ." පාර පහළ තවත් නරාශ්වයින් කීප දෙනෙක් සමඟ කතා කරමින් සිටි කයිරොන්ට ඇනබෙත් අත වැනුවා. "අපි කාර් එක තල්ලු කරගෙන පැති පාරකට අරන් යමු, හොඳ ද? එයාලට මුකුත් වෙන්නෙ නැහැ."

මගේ අත් වෙවුලුවා. පහුගිය දවස් ටිකේ දී මම මුහුණ දුන් දේවල්වලට පස්සේ මට මහා අමන ගතියක් සහ බෙලහීන ගතියක් දැනුණා, ඒත් දැන් මගේ දෙමව්පියන්ව මේ විදිහට දකිද්දී මට ඕනෑ වුණේ එතැන ම කඩා වැටෙන්නයි.

කයිරොන් එතැනට පිම්මේ දුව ආවා. "මොකද... ඔහ් දරුවෝ. මට තේරුණා."

"එයාලා මාව හොයාගෙන ඇවිල්ලා," මම කිවුවා. "මොකක් හරි නරක දෙයක් වෙනවා කියලා මගේ අම්මට දැනෙන්න ඇති."

"ඒ වගේ තමයි," කයිරොන් කිවුවා. "ඒත්, පර්සි, එයාලට කරදරයක් වෙන එකක් නැහැ. එයාලා වෙනුවෙන් අපිට කරන්න පුළුවන් හොඳ ම දේ තමයි අපේ රාජකාරියට පුළුවන් තරම් තදින් හිත යොදන එක."

ඒ වෙලාවේ ප්‍රියස් කාරයේ පිටුපස අසුන මත තිබූ දේ දැකලා මගේ පපුවට ගැහෙන්නත් අමතක වුණා. මගේ අම්මට පිටුපසින් ආසන පටියකට මැදි වී තිබුණේ අඩි තුනක් විතර උස, කළු-සුදු ග්‍රීක බරණියක්. එහි පියන ලෙදර් බැම්මකින් බැඳ තිබුණා.



"වෙන්න බැහැ," මම කෙඳිරුවා.

ඇනබෙත් එයාගේ අත් ජනේලය මත තබා තෙරපුවා. "එහෙම වෙන්නෙ කොහොමද! මං හිතුවෙ ඔයා ඒක ප්ලාසා හෝටලේ දාලා ආවා කියලා."

"වෝල්ට් එකක් ඇතුළේ අගුළු දාලා," මම එකඟ වුණා.

බරණිය දැකලා කයිරොන්ගේ ඇස් ලොකු වුණා. "ඒක නෙවෙයි නේද-"

"පැන්ඩෝරාගේ බරණිය." මගේ ප්‍රොමීතියස් හමුව ගැන විස්තර මම එයාට කිවුවා.

"එහෙනම් දැන් මේ බරණිය ඔයාගේ," කයිරොන් බැරෑරුම් ලෙස කිවුවා. "ඔයා ඒක කොහේ දාලා ගියත්, ඒක ඔයා පස්සෙන් ඇවිල්ලා පියන අරින්න ඔයාව පොලඹවයි. ඔයා ගොඩක් ම දුර්වල වෙලා ඉන්න වෙලාවට ඒක මතුවෙයි."

හරියට මේ වෙලාවේ වගේ, මම හිතුවා. මගේ අසරණ දෙමව්පියෝ දිහා බලාගෙන ඉන්නකොට වගේ.

ප්‍රොමීතියස් හිනා වෙනවා මට මැවිලා පෙනුණා. දුප්පත්, අසරණ මිනිස්සුන්ට උදවු කරන්න එයා පෙන්නපු උනන්දුව නම් කොහොමද? බලාපොරොත්තුව අත අරින්න, එතකොට ඔයා යටත් වෙන බව මට දැනගන්න ලැබෙයි. ක්‍රෝනොස් අනුකම්පාසහගත වෙයි කියලා මම පොරොන්දු වෙනවා.

මගේ ඇඟ පුරා කේන්තිය ගලා ගියා. රිප්ටයිඩ් ඇදලා ගත්ත මම රියැදුරු අසුන ළඟ ජනේලය කපා දැමුවේ ඒක ප්ලාස්ටික් දවටනයකින් හදපු එකක් වගෙයි.

"අපි කාර් එක නියුට්‍රල් දාමු," මම කිවුවා. "එයාලව පාරෙන් අහකට තල්ලු කරමු. ඊට පස්සේ අර ඔලමොට්ටල බරණිය ඔලිම්පස්වලට අරන් යන්න ඕනෑ."

කයිරොන් ඔළුව වැනුවා. "හොඳ සැලසුමක්. ඒත්, පර්සි..."

එයා කියන්න ගියේ මොකක් වුණත්, එයාගේ කතාව මගින් ඇන හිටියා. දුර ඈතින් යාන්ත්‍රික බෙර හඬක් ඇහෙන්න ගත්තා- හෙලිකොප්ටරයක චොප්-චොප්-චොප් හඬක්.

Scanned with CamScanner

සාමාන්‍ය සඳුදා උදෑසනක නම් නිව්යෝක් නගරයට ඒක අරුමයක් නොවුණත්, දවස් දෙකක නිහඬතාවයට පස්සේ මට අහන්න ලැබුණු පුදුමාකාර ම දේ වුණේ මනුෂ්‍ය හෙලිකොප්ටරයක හඬයි. හෙලිකොප්ටරය දර්ශන පථයට ඇතුළු වෙද්දී ගොඩනැගිලි කාණ්ඩ කීපයක් නැගෙනහිරට වෙන්නට සිටි රාක්ෂ හමුදාව කෑගසමින් ඔච්චම් කරන්න ගත්තා. තද රතු පාට සිවිල් මාදිලියේ යානයක් වූ එහි පැත්තක දීප්තිමත් කොළ පාට 'ඩී.ඊ.' ලාංඡනය ගසා තිබුණා. ලාංඡනයට යටින් වූ වචන කියවන්න බැරි තරම් කුඩා වුණත්, එයින් කියවෙන දේ මම දැන සිටියා: ඩෙයාර් එන්ටර්ප්‍රයිසස්.

මගේ උගුර හිරවුණා. ඇනබෙත් දිහා බලද්දී එයත් ඒ ලාංඡනය හඳුනාගෙන ඇති බව මට තේරුණා. එයාගේ මූණත් හෙලිකොප්ටරය තරමට ම වගේ රතු වුණා.

"එයා මොනවද මෙහෙ කරන්නේ?" ඇනබෙත් ප්‍රශ්න කළා. "එයා කොහොමද සීමා බාධකය හරහා ආවේ?"

"කවුද?" කයිරොන් හිටියේ අන්දබූත වෙලා වගෙයි. "මොන මනුස්සයට ද මේ තරම් පිස්සුවක් තියෙන්නේ-"

එක්වර ම හෙලිකොප්ටරය ඉදිරියට ඇලවුණා.

"මෝර්ෆියස්ගේ වශිය!" කයිරොන් කිවුවා. "අර මොට්ට පයිලට්ට නින්ද ගිහිල්ලා."

හෙලිකොප්ටරය පැත්තකට ඇල වී, කාර්යාල ගොඩනැගිලි පේළියක් දෙසට වැටෙන දිහා මම බයෙන් ගල් ගැසී බලා සිටියා. පෙනුණු හැටියට ඒක බිමට කඩා වැටුනේ නැතත්, එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල අසලට ම ආව නිසා සුළං දෙවිවරු ඒක අහසින් බිමට ඇදලා දාන්න ඉඩ තිබුණා.

හෙලවෙන්නවත් බැරි තරමට මම ගල් ගැසී සිටියත් ඇනබෙත් කළ උරුවම් බෑමට පෙගසස් ගයිඩෝ කොහෙන්දෝ එතැනට පාත්වුණා.

''ඔයා හැඩකාර අස්සයෙක්ට අඬගැහුව ද?'' එයා ඇහුවා.

"ඉක්මන් කරන්න, පර්සි," ඇනබෙත් ගෙ‍රෙව්වා. "අපිට ඔයාගේ යාළුවා ව බේරගන්න තියෙනවා."

# 16

# අපිට හෙරකගෙන් උදවු ලැබුණා

ජොලි වැඩක් විදියට මම කොහෙත්ම නොහිතන දෙයක් කියන්න දඃ පාලනයක් නැති හෙලිකොප්ටරයක් දිහාවට පෙගසස් කෙනෙක් පිටේ පියාඹන එක. ගයිඩෝ මේ තරම් සිහි කල්පනාවක් ඇති පෙගසස් කෙනෙක් නොවුණා නම් අපිව පෙති ගැහිලා යන්න තිබුණා.

හෙලිකොප්ටරය ඇතුළෙන් රේචල්ගේ මොරගෑම මට ඇහුණා. මොකක්දෝ හේතුවකට එයාව නින්දට වැටී තිබුණේ නැහැ, ඒ වුණත් ගුවන් නියමුවා නම් පාලක උපකරණ මත ඇද වැටිලා, හෙලිකොප්ටරය දෙපැත්තට වැනෙන ගාණේ ඉදිරියටත් පසුපසටත් විසිවෙනවා මට පෙනුණා.

"දැන් මොකද?" මම ඇනබෙත්ගෙන් ඇහුවා.

"ඔයාට ගයිඩෝවත් අරගෙන මෙතැනින් යන්න වෙනවා," එයා කිවුවා.

"ඔයා මොනවද කරන්න හදන්නේ?"

එයා ඒකට ප්‍රතිචාරයක් විදිහට "හයියාහ්!" කියා කෑගසද්දී, ගයිඩෝ ලම්භාකාරව පහත බහින්න ගත්තා.

"පාත් වෙන්න!" ඇනබෙත් මොර දුන්නා.

අපි හෙලිකොප්ටරයේ රොටර තලවලට කොයි තරම් ළඟින් ගියා ද කියනවා නම්, ඒවාගේ බලය මගේ කොණ්ඩය ඉරාගෙන යනවා

මට දැනුණා. අපි හෙලිකොප්ටර බඳේ පැත්තක් දිගේ ඉදිරියට යද්දි, ඇනබෙත් දොරේ එල්ලුණා.

හැමදෙයක් ම වරදින්න ගත්තේ ඒ වෙලාවෙයි.

ගයිඩෝගේ පියාපතක් හෙලිකොප්ටරයේ තදින් වැදුණා. ඇනබෙත් ගුවන් යානයේ පැත්තක එල්ලී ඉඳිද්දී, පිට උඩ හිටපු මාත් එක්ක ම ගයිඩෝ පහළට වැටෙන්න පටන් ගත්තා.

ඇති වුණු බයට ම මට කිසි දෙයක් කල්පනා කරගන්නවත් බැරි වුණා, ඒත් ගයිඩෝ කැරකෙමින් පහළට වැටෙන අතරේ රේචල් ඇනබෙත්ව හෙලිකොප්ටරය තුළට ඇදලා ගන්නවා මට යාන්තමින් දකින්න ලැබුණා.

"අල්ලගෙන යමු!" මම ගයිඩෝට මොර ගැහුවා.

''මගේ තට්ට,'' එයා විලාප දුන්නා. ''ඒක ඉවරයි.''

"ඔයාට ඒක කරන්න පුළුවන්!" පෙගසස්-පැදීමේ පාඩම්වල දී සිලේනා අපිට කියලා දුන්න දේවල් මතක් කරගන්න මම දඟලුවා. "තටුව සැහැල්ලු කරන්න. ඒක විහිදවලා හෙමීට පියාඹන්න."

අඩි තුන්සීයක් පහළින් වූ පදික වේදිකාව දිහාවට අපි එක එල්ලේ ඇද වැටුණා. අන්තිම මොහොතේ දී ගයිඩෝ එයාගේ පියාපත් විහිදුවා. කටවල් ඇරගෙන අපි දිහා බලා ඉන්නා නරාශ්වයින්ගේ මුහුණු මට පෙනුණා. ඒත් එක්ක ම අපේ ඇද වැටීමෙන් ගැලවුණු අපි, අඩි පනහක් පියාපත් නොගසා ඉගිලී ගොස්, පදික වේදිකාව උඩට කරණම් ගැහුවා- උප දෙවියෙක් උඩ පෙගසස් කෙනෙක්.

''ඌයි!'' ගයිඩෝ කෙඳිරි ගෑවා. ''මගේ කකුල්. මගේ ඔළුව. මගේ තටු.''

බෙහෙත් මල්ලත් අරගෙන අපි දිහාවට හැල්මේ දුවගෙන ආව කයිරොන් පෙගසස්ට ප්‍රතිකාර කරන්න පටන් ගත්තා.

මම දෙපයින් නැගී සිටියා. උඩ බැලුවා ම මට පෙනුණේ මගේ හදවත උගුරට ආවා වගෙයි. දැන් හෙලිකොප්ටරය තිබුණේ ගොඩනැගිල්ලක හැප්පෙන්න තත්පර කීපයක දුරින් විතරයි.

ඒ වෙලාවේ හාස්කමකින් වගේ හෙලිකොප්ටරය නියම අතට හැරුණා. එක තැන රවුමක් කැරකුණු එය ගුවනේ නැවතුණා. ඊට පස්සේ බොහොම හෙමින් එය පහත බහින්න පටන් ගත්තා.



ඒකට කල්පයක් විතර ගියා වගේ දැනුණත්, අන්තිමේ දී හෙලිකොප්ටරය පස්වෙනි මාවත මැදට ගොඩබැහැවා. එහි පුළං ආවරණය හරහා බැලුව මට ඇස් අදහා ගන්න බැරි වුණා. එහි නියමු අසුනේ හිටියේ ඇනබෙත්.

***

හෙලිකොප්ටරයේ රොටර තල කැරකී නතර වෙද්දී මම ඉදිරියට දිවුවා. එහි පැති දොරක් විවර කළ රේචල් ගුවන් නියමුවාව එළියට ඇදලා ගත්තා. රේචල් තවමත් වෙරළට අඳින කොට කලිසමකින්, ටී-ෂර්ට් එකකින් සහ සෙරෙප්පු දෙකකින් සැරසිලා හිටියා. එයාගේ කොණ්ඩය අවුල් වෙලා, හෙලිකොප්ටර ගමන නිසා මූණ කොළ පාට වෙලයි තිබුණේ.

අන්තිමේට එළියට බැස්සේ ඇනබෙත්.

මම එයා දිහා විස්මයෙන් බලන් හිටියා. "ඔයාට හෙලිකොප්ටර් පදවන්න පුළුවන් කියලා මම දැනගෙන හිටියෙ නැහැ නේ."

"මම දැනගෙන හිටියෙත් නැ," එයා කිව්වා. "මගේ තාත්තා ගුවන් යානාවලට පිස්සු වැටුණු කෙනෙක් නේ. ඒ වගේම ඩෙඩලස්ගෙත් පියාඹන යන්ත්‍ර ගැන සටහන් වගයක් තියලා තිබුණා. ඉතින් මම කරේ ඒක පාලනය කරන විදිහ ගැන අනුමාන කරපු එක විතරයි."

"ඔයා මගේ ජීවිතේ බේරුවා," රේචල් කිව්වා.

ඇනබෙත් උරහිස සොලවා බැලුවා. "ඔව්, හොඳයි... ඒක පුරුද්දක් කරගන්න නම් එපා. ඔයා මොනවද මෙහෙ කරන්නේ, ඩෙයාර්? යුද්ධ කලාපෙකට පියාඹන්න තරම් ඔයාගේ මොළේ නරක් වෙලා ද?"

"මම-" රේචල් මගේ දිහාවට බැල්මක් හෙළුවා. "මට මෙහෙට එන්න වුණා. පර්සි කරදරේක වැටිලා කියලා මම දැනගෙන හිටියා."

"තේරුණා," ඇනබෙත් ගෙරෙව්වා. "හොඳයි, මට තුවාල වුණු යාළුවෝ වගයක් බලන්න යන්න තියෙනවා. ඔයා ආවට සන්තෝසයි, රේචල්!"

"ඇනබෙත්-" මම කතා කළා.

එයා කඩාගෙන බිඳගෙන යන්න ගියා.

Scanned with CamScanner

ගැටි බැම්ම උඩට ඇදගෙන වැටුණ රේචල් ඔළුව අත් දෙකෙන් ගහගත්තා. "මට සමා වෙන්න, පර්සි. මම හිතලා නෙවෙයි... මම හැමවෙලාවෙ ම ඔක්කොම අවුල් කරනවා."

ඒ කාරණයේ දී නම් එයා එක්ක වාද කරන්න අමාරු වුණා. ඒ කොහොම වුණත් එයාට කරදරයක් නොවුණු එක ගැන මම හිටියේ සතුටින්. මම ඇනබෙත් යන්න ගිය දිහාව බැලුවා, ඒත් ඒ වෙද්දිත් එයා සෙනඟ අතරේ නොපෙනී ගිහින්. එයා මේ දැන් කළ දේ ගැන මට තවමත් අදහන්න බැරි වුණා- රේචල්ගේ ජීවිතේ බේරලා, හෙලිකොප්ටරයක් ගොඩ බෑව එයා ඒකෙන් බැහැලා යන්න ගියේ හරියට ඒක මහ දෙයක් නෙවෙයි වගෙයි.

"ඒකට කමක් නෑ," මම රේචල්ට කිවුවත් මගේ වචනවල තිබුණේ හිස් ගතියක්. "ඉතින්, ඔයාට අරන් එන්න ඕනෑ වුණ පණිවුඩේ මොකක්ද?"

එයා රවලා බැලුවා. "ඔයා කොහොමද ඒක ගැන දන්නේ?"

"හීනෙකින්."

රේචල් පුදුම වුණ බවක් පෙනුනේ නැහැ. එයා හැඳ සිටි කොට කලිසමේ කොණකින් අදින්න ගත්තා. ඒක චිත්‍රවලින් වැහිලයි තිබුණේ, ඒක එයාට නුපුරුදු දෙයක් නොවුණත්, මේ සංකේත මම හඳුනා ගත්තා: ග්‍රීක අකුරු, කඳවුරු මාලයේ පබළුවල ඇති රූප, රාක්ෂයින්ගේ දළ රූප සටහන් සහ දෙවිවරුන්ගේ මුහුණු. ඒවායින් සමහරක් රේචල් දැන සිටියේ කොහොමද කියලා මට තේරුනේ නැහැ. මොකද එයා කවදාවත් ඔලිම්පස්වලටවත්, අර්ධ-ලෝහිත කඳවුරටවත් ගිහිල්ලා නැහැ නේ.

"මටත් සමහර දේවල් දකින්න ලැබුණා," එයා කෙඳිරුවා. "මං කිවුවේ, මීදුම හරහා විතරක් නෙවෙයි. මේක ඊට වඩා වෙනස්. මම මේ දවස් ටිකේ ම රූප අඳිනවා, වාක්‍ය ලියනවා-"

"පෞරාණික ග්‍රීක භාෂාවෙන්," මම කිවුවා. "ඒවගෙ තේරුම ඔයා දන්නව ද?"

"ඔයා එක්ක මට කතා කරන්න ඕනෑ වුණේ ඒ ගැන තමයි. මම හිතුවේ... මෙහෙමයි, ඔයා අපිත් එක්ක නිවාඩුවට යන්න ආවා නම්, මට සිද්ධ වේගෙන එන දේ මොකක්ද කියලා තේරුම් ගන්න ඔයා උදවු කරයි කියලයි මම හිතුවේ."



එයා බැගෑපත් බැල්මෙන් මගේ දිහා බැලුවා. වෙරළේ ගත කළ කාලයෙන් එයාගේ මූණ අව්වට පිළිස්සිලා. එයාගේ නහයේ හම ගැලවෙමින් තිබුණා. එයා ඇත්තට ම මෙතැන මගේ ළඟ ඉන්නවා කියලා තවමත් මට විශ්වාස කරන්න අපහසු වුණා. එයා එයාගේ පවුලේ අයට එයාලගේ නිවාඩුව හදිසියේ අතරමඟ නවතා දමන්න බල කරලා, ඒ වෙනුවට බිහිසුණු ඉස්කෝලෙකට යන්න එකඟ වෙලා, රාක්ෂ යුද්ධයක් මැද්දට හෙලිකොප්ටරයකින් පියාඹලා ආවේ මාව බලන්නමයි. එක අතකින් බලද්දී එයත් ඇනබෙත් තරමට ම නිර්භීත කෙනෙක් වුණා.

ඒත් මේ අමුතු දසුන්වලින් එයාට සිද්ධ වෙන්නේ මොකක්ද කියලා හිතද්දී මගේ මොළේ කොලොප්පං වුණා. සමහරවිට ඒක මීදුම හරහා දැකීමේ හැකියාව ඇති හැම මනුෂ්‍යයෙකුට ම වෙන දෙයක් වෙන්න ඇති. ඒත් මගේ අම්මා කවදාවත් එහෙම දෙයක් ගැන කියලා තිබුණේ නැහැ නේ. ඒ වගේම ලූක්ගේ අම්මා ගැන හෙස්ටියා කියපු දේවල් දිගින් දිගටම මගේ හිතට එන්න ගත්තා: මේ කාසලන් ඕනෑවටත් වඩා දුර ගියා. එයා ඕනෑවටත් වඩා දේවල් දකින්න උත්සාහ කළා.

"රේචල්," මම කතා කළා, "මටත් තේරෙන්නෙ නැහැ. මට හිතෙන්නෙ අපි කයිරොන්ගෙන් ඇහුවොත් හොඳයි-"

එයා එකපාරට ම ඇකිළුණේ විදුලි සැර වැදුණා වගෙයි. "පර්සි, මොකක් හරි සිද්ධ වෙන්නයි යන්නේ. මරණයෙන් ඉවර වෙන උප්පරවැට්ටියක්."

"ඒ කිවුවේ? කාගේ මරණයෙන් ද?"

"මං දන්නෙ නැහැ." එයා වටපිට බැලුවේ බයෙන් වගෙයි. "ඔයාට ඒක දැනෙන්නෙ නැද්ද?"

"ඔයාට මට කියන්න ඕනෑ වුණ පණිවුඩේ ඒක ද?"

"නෑ." එයා පස්ස ගැහුවා. "මට සමා වෙන්න. මං දන්නවා මම කියන දේවල්වල කිසිම තේරුමක් නැහැ කියලා, ඒත් මේ සිතුවිල්ල මගේ හිතට එක පාරට ම වගේ ආවේ. මම වැල්ලෙ ලියපු පණිවුඩේ මීට වඩා වෙනස්. ඒකෙ ඔයාගේ නමත් තිබුණා."

"පර්සියස්," මම සිහි කළා. "පෞරාණික ග්‍රීකවලින්."

Scanned with CamScanner

රේචල් ඔළුව වැනුවා. "ඒකේ තේරුම මම දන්නෙ නැහැ. ඒත් ඒක වැදගත් කියලා මම දන්නවා. ඔයා ඒක අහන්න ඕනෑ. ඒකේ කියවුණේ, 'පර්සියස්, වීරයා නුඹ නෙවෙයි' කියලා."

මම එයා දිහා බලන් හිටියේ එයා මේ දැන් මගේ කම්මුලට ගැහුවා වගෙයි. "ඔයා හැතැප්ම දාස් ගාණක් ගෙවාගෙන ආවෙ වීරයා මම නෙවෙයි කියලා යන්න ද?"

"ඒක ගොඩක් වැදගත්," එයා තරයේ කියා සිටියා. "ඒක ඔයා කරන දේවල්වලට බලපායි."

"අනාවැකියේ කියවෙන වීරයා නෙවෙයි ද?" මම ඇහුවා. "ක්‍රෝනොස්ව පරද්දන වීරයා නෙවෙයි ද? ඔයා මොකක්ද අදහස් කළේ?"

"මට... මට සමා වෙන්න, පර්සි. මම දන්නෙ එච්චරයි. මට ඔයාට ඒක කියන්න ම ඕනෑ වුණා, මොකද-"

"හොඳයි!" කයිරොන් එතැනට හැල්මේ ආවා. "ඔයා වෙන්න ඕනෑ මිස් ඩෙයාර්."

මෙතැනින් අහකට යන්න කියලා එයාට මොර ගහන්න මට හිතුණා, ඒත් ඇත්තට ම ඉතින් මං කොහොමද එහෙම කරන්නේ. මම මගේ හැඟීම් පාලනය කරගන්න උත්සාහ කළා. මට දැනුණේ නිකං තවත් පෞද්ගලික සුළි කුණාටුවක් මගේ වටේට කැරකෙනවා වගෙයි.

"කයිරොන්, මේ රේචල් ඩෙයාර්," මම කිවුවා. "රේචල්, මේ ඉන්නෙ මගේ ගුරුතුමා කයිරොන්."

"හලෝ," රේචල් නොසතුටු මුහුණින් කිවුවා. කයිරොන් නරාශ්වයෙක් වීම ගැන එයා කොහෙත්ම පුදුම වුණ බවක් පෙනුනේ නැහැ.

"ඔයාට තින්ද ගියේ නැහැ නේද, මිස් ඩෙයාර්," කයිරොන් කිවුවා. "ඒ වුණත් ඔයා මනුෂ්‍යයෙක්."

"මම මනුස්සයෙක් තමයි," එයා එකඟ වුණේ හරියට ඒක හිතට පීඩා දෙන සිතුවිල්ලක් වගෙයි. "අපි ගඟ පහු කරපු හැටියෙ ම වගේ පයිලට්ට තින්ද ගියා. මට එහෙම නොවුණේ ඇයි කියලා ම දන්නෑ. මම දැනගෙන හිටියේ මම මෙහෙට ඇවිල්ලා, පර්සිට අනතුරු අඟවන්න ඕනෑ කියලා විතරයි."

"පර්සිට අනතුරු අඟවන්න?"



"එයාට එක එක දේවල් පේනවලු," මම කිවුවා. "එයා අමුතු අමුතු දේවල් ලියනවා, අඳිනවා."

කයිරොන්ගේ ඇහි බැමක් උඩ ගියා. "ඇත්තටම? මට කියන්න."

රේචල් මට කියපු විස්තරය ම එයාටත් කිවුවා.

කයිරොන් රැවුල අතගෑවා. "මිස් ඩෙයාර්... බාගදා අපි මේ ගැන ටිකක් කතා කරොත් හොඳයි."

"කයිරොන්." මට ඉබේට ම කියවුණා. 1990 ගණන්වල අර්ධ-ලෝහිත කඳවුරේ අර අට්ටාලයෙන් මේ කාසලන්ගේ බෙරිහන් දීම නැගුණු ඒ බිහිසුණු රූපය හදිසියේ ම මගේ හිතේ ඇඳුණා. "ඔයා... ඔයා රේචල්ට උදවු කරනවා, නේද? මං කිවුවේ, මේ දේවල් එක්ක පරිස්සම් වෙන්න ඕනෑ කියලා, ඕනෑවට වඩා දුර යන්න එපා කියලා ඔයා එයාට අනතුරු අඟවනවා නේ."

එයා කලබලෙන් ඉන්න වෙලාවට වෙනවා වගේ එයාගේ වලිගය දෙපැත්තට වැනුණා. "ඔව්, පර්සි. මිස් ඩෙයාර්ට සිද්ධ වෙන්නේ මොනවද කියලා තේරුම් අරගෙන, එයාට අවවාද කරන්න මම පුළුවන් උපරිමෙන් උත්සාහ කරන්නම්. හැබැයි ඒකට ටික වෙලාවක් යන්න පුළුවන්. ඒ අතරවාරේ, ඔයා විවේක ගත්තොත් හොඳයි. අපි ඔයාගේ අම්මලා ඉන්න කාර් එක පරිස්සම් තැනකට ගෙනිච්චා. හතුරු පිළේ එවුන් දැනට නම් හිටපු තැන්වල ම ඉන්නවා වගෙයි. අපි එම්පයර් ස්ටේට් බිල්ඩිමට ඇඳන් ටිකක් ගිහින් දැම්මා. ගිහිල්ලා ටිකක් නිදාගන්න."

"හැමෝම මට කියන්නෙ නිදාගන්න කියලා." මම අවලාද නැඟුවා. "මට නිදාගන්න ඕනෑ නෑ."

කයිරොන් යාන්තමින් හිනා වුණා. "ඔයා ළඟ දී දවසක කණ්ණාඩියෙන් ඔයාගේ පෙනුම එහෙම දැක්ක ද, පර්සි?"

මම මගේ ඇඳුම් දිහා බැලුවා. නොනවතින සටන්වලින් ගෙවුණු රැයට පස්සේ ඒවා පිච්චිලා, කැපිලා, කඩමාලු වෙලයි තිබුණේ. "මම නිකං මළමිනියක් වගේ," මම පිළිගත්තා. "ඒත් මේ දැන් වෙච්ච දේවල්වලට පස්සෙ මට නිදාගන්න පුළුවන් වෙයි කියලා ඔයා හිතනව ද?"

"ඔයා සටන්වල දී තුවාල කරන්න බැරි කෙනෙක් වෙන්න පුළුවන්," කයිරොන් තරවටු කළා. "ඒත් ඒකෙන් වෙන්නෙ ඔයාගේ ඇඟ වෙනදටත් වඩා වේගෙන් මහන්සි වෙන එකයි. අකිලිස්ට මතකයි

නේ. ඒ කොල්ලා සටන් නොකරන හැම වෙලාවක ම කරේ නිදාගත්ත එක. එයා දවසකට විසි වතාවක් විතර ටික ටික නිදාගන්න ඇති. ඔයාටත්, පර්සි, විවේකය ඕනෑ. අපේ එක ම බලාපොරොත්තුව ඔයා වෙන්න පුළුවන්."

එයාලගේ එක ම බලාපොරොත්තුව මම නෙවෙයි කියලා පැමිණිලි කරන්න මට හිතුණා. රේචල් කියපු විදිහට නම්, වීරයාවත් මම නෙවෙයි. ඒත් බැහැ කියන එක උත්තරයක් විදිහට බාරගන්න ලැස්ති නැති බව කයිරොන්ගේ දෑස්වල බැල්ම මට පැහැදිලිව ම කිවුවා.

"හරි," මම අවලාද නැගුවා. "එහෙනම් ඔයාලා කතා කරගන්නකෝ."

මම එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල දිහාවට ගැටුවා. මම ආපහු හැරිලා බලද්දි රේචල් සහ කයිරොන් බර කතාවකට වැටිලා ගියේ හරියට එයාලා අවමංගල උත්සවයක් සංවිධානය කරනවා වගෙයි.

ප්‍රවේශ ශාලාව ඇතුළේ හිස් ඇඳක් හොයාගත් මම එයට ඇද වැටුණේ, මට කොහෙත් ම නින්ද නොයන බව විශ්වාසයෙනුයි. තත්පරේකට පස්සේ මගේ ඇස් පියවුණා.

★★★

සිහිනයෙන්, මම ආයෙමත් හේඩීස්ගේ උයනට ගිහින් හිටියා. මරණයට අධිපති කන් දෙකේ ඇඟිලි ගහගෙන ඉහළ-පහළ ඇවිදිද්දි, නිකෝ අත් වනමින් එයා පස්සේ ගියා.

"ඔයාට ඒක කරන්න ම වෙනවා!" නිකෝ බල කරා.

ඩිමීටර් සහ පර්සෙෆෝන් එයාලට පිටුපස උදේ කෑම මේසයට වාඩි වී සිටියා. දෙවඟනෝ දෙන්න ම හිටියේ එපා වෙලා වගෙයි. ඩිමීටර් ලොකු භාජන හතරකට තිරිඟු සිරියල් හැලුවා. පර්සෙෆෝන් මේසය මත තිබූ මල් සැරසිල්ල මායා බලයෙන් වෙනස් කරමින් මල් කැකුළු රතු පාටේ සිට කහ පාටටත්, පාට පාට තිත් වැටුණු මෝස්තරයකටත් හැරෙව්වා.

"මං මොකටද එහෙම කරන්නේ!" හේඩීස්ගේ ඇස් කෝපයෙන් ඇවිළුණා. "මම දෙවියෙක්!"

"තාත්තේ," නිකෝ කිවුවා, "ඔලිම්පස් පැරදුනොත්, ඔයාගේ මාලිගාව විතරක් පරිස්සම් වුණා කියලා වැඩක් වෙන්නෙ නෑ. ඔයාවත් විනාශ වෙලා යයි."



"මම ඔලිම්පියානුවෙක් නෙවෙයි!" එයා ගෙරෙව්වා. "මගේ පවුලේ අය ඒක බොහොම පැහැදිලිව පෙන්නලා දීලයි තියෙන්නේ."

"ඔයා ඔලිම්පියානුවෙක් තමයි," නිකෝ කිවුවා. "ඔයා ඒකට කැමති වුණත්, නැතත්."

"එයාලා ඔයාගේ අම්මට කරපු දේ ඔයා දැක්කා නේ," හේඩීස් කිවුවා. "සියුස් එයාව මැරුවා. ඒ තියෙද්දිත් ඔයා මට කියන්නෙ උන්ට උදවු කරන්න කියල ද? උන්ට ඔහොම වෙච්චි එකමයි හොඳ!"

පර්සෙෆෝන් සුසුමක් හෙළුවා. එයා මේසය හරහා අත දිවෙව්වේ, නොහිතා ම හැඳි ගෑරුප්පු රෝස මල්වලට හරවමින්. "කරුණාකරලා, ඒ ගෑනු කෙනා ගැන අපි කතා නොකර ඉමු ද?"

"මේ කොල්ලට හරියන්නෙ මොකක්ද දන්නව ද?" ඩිමීටර් කල්පනාබරව කිවුවා. "ගොවිතැන."

පර්සෙෆෝන් ඇස් කැරකුවා. "අම්මේ-"

"හය මාසයක් නගුල පස්සෙ දිවුවා නම්, එයාගේ කල්කිරියාව ගාණට හැදෙනවා."

නිකෝ එයාගේ තාත්තා ඉදිරියට අඩිය තැබුවේ, හේඩීස්ට එයාට මුහුණ දෙන්න බල කරමින්. "මගේ අම්මා පවුල ගැන හරියට ම තේරුම් ගත්ත කෙනෙක්. අන්න ඒ නිසයි එයා අපිව දාලා යන්න අකමැති වුණේ. ඔයාගේ පවුලේ අය නපුරු දෙයක් කරපු පළියට ඔයාට එයාලව නිකං ම අතෑරලා දාන්න බෑ. ඔයත් එයාලට මහ නපුරු දේවල් කරලා තියෙනවා නේ."

"මරියා මැරුණා!" හේඩීස් එයාට සිහිපත් කළා.

"ඔයාට ඔහොම නිකං ම ඔයාව අනිත් දෙවිවරුන්ගෙන් වෙන් කරලා දාන්න බැහැ!"

"මම දැන් අවුරුදු දාස් ගාණක් තිස්සේ ඒක යස අගේට කරලයි තියෙන්නේ."

"ඉතින් එහෙම කරා කියලා ඔයාට වුණ හොඳේ මොකක්ද?" නිකෝ ප්‍රශ්න කළා. "ඔයා අර ඔරැකල්ට කරපු ශාපයෙන් ඔයාට කිසිම හොඳක් වුණා ද? කෝන්තර තියාගෙන ඉන්න එක මාරක වැරැද්දක්. මට ඒ ගැන අවවාද කළේ බියන්කා, ඇත්තට ම එයා කිවුවා හරි."

"ඒ උප දෙවිවරුන්ට! මම අමරණීය කෙනෙක්, මහා බලගතු කෙනෙක් අනිත් දෙවිගොල්ලෝ මගෙන් ඉල්ලුවත් මම එයාලට උදවු කරන්නෙ නැහැ, පර්සි ජැක්සන් ම මෙතැනට ඇවිල්ලා බැගෑපත් වුණත්-"

"ඔයත් මං වගේ ම කොන් වෙච්ච කෙනෙක් විතරයි!" නිකෝ මොර ගැහුවා. "ඔය තරහ මරහවල් අතෑරලා දාලා, එක පාරක්වත් ප්‍රයෝජනවත් දෙයක් කරන්න. ඔයාට එයාලගේ ගෞරවේ ගන්න පුළුවන් ඒ විදිහෙන් විතරයි!"

හේඩීස්ගේ අත්ල කළු පාට ගිනි දළුවලින් පිරුණා.

"ඇයි බලන් ඉන්නේ," නිකෝ කිවුවා. "මාව පුපුරවලා දාන්න. අනිත් දෙවිගොල්ලොත් ඔයාගෙන් බලාපොරොත්තු වෙන්නෙ ඒක ම තමයි. එයාලා හරි කියලා ඔප්පු කරන්න."

"අනේ ඔව්, ඇත්තට ම," ඩිමීටර් මැසිවිලි නැගුවා. "එයාගේ කට වහලා දාන්නකෝ."

පර්සෙෆෝනී සුසුමක් හෙළුවා. "ඔන්, අනේ මන්දා. තවත් සිරියල් පිගානක් කනවට වඩා යුද්දෙට ගිහින් සටන් කරන එක සැපයි. මේක වස කම්මැලි වැඩක් නේ."

හේඩීස් වියරුවෙන් ගර්ජනා කළා. එයාගේ ගිනි බෝලය නිකෝ අසල ම තිබුණු රිදී ගහක වැදී, එය ද්‍රව ලෝහ කඩිත්තකට හැරෙව්වා.

ඊත් එක්ක ම මගේ හීනය මාරු වුණා.

එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලට සැතපුමක් විතර ඊසාන දෙසට වෙන්නට පිහිටි එක්සත් ජාතීන්ගේ ගොඩනැගිල්ල ඉදිරිපිට මම හිටගෙන හිටියා. ඒ ගොඩනැගිලි සංකීර්ණය වටේට ම ටයිටන් හමුදාව කඳවුරු බැඳගෙන හිටියා. එහි කොඩි කණුවල බිහිසුණු ජය සලකුණු එල්ලා තිබුණා- පැරදුණ කඳවුරුකරුවන්ගේ හිස්වැසුම් සහ සන්නාහ කැබලි. පස්වෙනි මාවත දිගට යෝධයෝ පොරෝ මුවහත් කරමින් හිටියා. තාවකාලික කම්මල්වල ටෙලිකීනයෝ ආයුධ අලුත්වැඩියා කරා.

ගොඩනැගිල්ල මුදුනේ ක්‍රෝනොස් එයාගේ දෑකැත්ත වනමින් සක්මන් කරමින් සිටියේ එයාගේ ඩ්‍රැකනෙයි අංගාරක්ෂකයින්ට එයාගෙන් ඈත් වී ඉන්න සලස්වමිනුයි. දෑකැත්ත වැදී පෙති ගැහෙන සීමාවෙන් එපිටට වෙන්න, එයාගේ අසලින් ම ඊතන් නකමුරා සහ



ප්‍රොමිතියස් හිටගෙන හිටියා. ඊතන් එයාගේ පලිහේ පටි අමරමින් හිටියත්, ප්‍රොමිතියස් නම් හිටියේ හැමදාමත් වගේ ම සන්සුන් සහ තෘප්තත් ලෙසයි.

"මට මේ තැන පෙන්නන්න බෑ," ක්‍රෝනොස් ගෙරෙව්වා. "'එක්සත් ජාතීන්.' හරියට මිනිස් වර්ගයාට කිසිම දවසක එක්සත් වෙලා ඉන්න පුළුවන් වගේ. අපි ඔලිම්පස් විනාශ කරාට පස්සේ මේ බිල්ඩිමත් සමතලා කරලා දාන්න මට මතක් කරනවා."

"එහෙමයි, උතුමාණෙනි." ප්‍රොමිතියස් හිනා වුණේ එයාගේ ස්වාමියාගේ කේන්තියෙන් විනෝද වෙනවා වගෙයි. "අපි මධ්‍යම උද්‍යානයේ තියෙන ඉස්තාල ටිකත් කඩලා දාමු ද? ඔයාට අශ්වයින්වත් පෙන්නන්න බැහැ කියලා මං දන්නවා."

"මට සමච්චල් කරන්න එන්නෙපා, ප්‍රොමිතියස්! මේකට ඇඟිලි ගහන්න ආපු එක ගැන අර කාලකණ්ණි තරාස්වයින්ට පසුතැවෙන්න වෙයි. අර මගේ පූතා- කයිරොන් කියන නිවටයගෙන් පටන්ගෙන, උන් ඔක්කොම මම යම බල්ලන්ට කන්න දානවා."

ප්‍රොමිතියස් උරහිස් ඇකිළුවා. "ඒ නිවටයා එයාගේ ඊතලවලින් සම්පූර්ණ ටෙලිකීන් හමුදාවක් ම වැනසුවා."

දෑකැත්ත වැනූ ක්‍රෝනොස් කොඩි කණුවක් දෙකට කපලා දැමුවා. ඩ්‍රැකනෙයි කෙනෙක්ව චප්ප කරමින් බ්‍රසීල ජාතික ධජය හමුදාව උඩට ඇද වැටුණා.

"අපි උන්ව විනාශ කරනවා!" ක්‍රෝනොස් ගිගුරුවා. "දැන් ඩ්‍රැකන්ව නිදහස් කරන්න වෙලාව ඇවිල්ලා. නකමුරා, මේක නුඹ කරන්න ඕනෑ."

"එහ්-එහෙමයි, උතුමාණෙනි. ඉර බහින වෙලාවට?"

"නෑ," ක්‍රෝනොස් කිවුවා. "මේ දැන් ම. ඔලිම්පස් ආරක්ෂා කරන එවුන් දැන් හොඳටෝම තුවාල වෙලා ඉන්නේ. උන් මෙච්චර ඉක්මනට තව ප්‍රහාරයක් බලාපොරොත්තු වෙන එකක් නෑ. ඇරත්, උන්ට මේ ඩ්‍රැකන්ව පරාද කරන්න බැහැ කියලා අපි දන්නවා නේ."

ඊතන් බලා හිටියේ අන්දමූත වෙලා වගෙයි. "මගේ උතුමාණෙනි?"

"ඒකෙන් කමක් නෑ, නකමුරා. මම කියපු දේ කරනවා. වයිපුත් නිව්යෝක්වලට එද්දී ඔලිම්පස් විනාශ වෙලා තියෙන්න ඕනෑ. අපි දෙවිවරුන්ව සම්පූර්ණයෙන් ම වනසලා දානවා!"

"ඒත්, මගේ උතුමාණෙනි," ඊතන් කිවුවා. "ඔබතුමාගේ ප්‍රතිජනනය."

ක්‍රෝනොස් ඊතන් දිහාවට අතක් දිගු කළා ම උප දෙවියා ගල් ගැහුණා.

"නුඹට පේන්නේ," ක්‍රෝනොස් සැර වුණා, "මට ප්‍රතිජනනය වෙන්න ඕනෑ වගේ ද?"

ඊතන් උත්තර දුන්නෙ නැහැ. කාලය තුළ අකීය වෙලා ඉන්නකොට කොහොම උත්තර දෙන්න ද?

ක්‍රෝනොස් අසුරක් ගැහුවා ම ඊතන්ව බිමට ඇදගෙන වැටුණා.

"ඉක්මනට ම," ටයිටන් ගෙරෙව්වා, "මේ රූපාකාය අනවශ්‍ය දෙයක් වෙයි. ජයග්‍රහණය පෙනි පෙනී තියෙද්දී මම කීයටවත් විවේක ගන්නෑ. දැන්, යනවා!"

ඊතන් හතර ගාතෙන් බඩගාගෙන ඉවතට ගියා.

"මේක නම් අනතුරුදායකයි, මගේ උතුමාණෙනි," ප්‍රොමීතියස් අනතුරු ඇඟෙව්වා. "ඉක්මන් වෙන්නෙපා."

"ඉක්මන් වෙනවා? ටාටරස් වළ අස්සේ අවුරුදු තුන්දාහක් කුණු වෙවී හිටියට පස්සෙත් නුඹ මට කියන්නෙ මං ඉක්මන් වෙනවා කියල ද? මම අර පර්සි ජැක්සන්ව කෑලි දාහකට පෙති ගහනවා."

"ඔබතුමා තුන් වතාවක් එයා එක්ක සටන් කරා," ප්‍රොමීතියස් පෙන්වා දුන්නා. "ඒත් ඉස්සර නම් ඔබතුමා නිතර ම කිවුවෙ නිකං ම මනුෂ්‍යයෙක් එක්ක සටන් කරන එක ටයිටන් කෙනෙක්ගේ තත්ත්වයට තරම් දෙයක් නෙවෙයි කියලා. මට පුදුම ඔබතුමාගේ මනුෂ්‍ය ධාරකයා ඔබතුමාට බලපෑම් කරලා, ඔබතුමාගේ තීරණ දුර්වල කරනව ද කියලයි."

ක්‍රෝනොස්ගේ රන්වන් ඇස් අනෙක් ටයිටන් වෙතට හැරුණා. "නුඹ කියන්නෙ මම දුර්වලයි කියල ද?"

"නෑ, මගේ උතුමාණෙනි. මම කිවුවේ-"



"නුඹේ පක්ෂපාතීකම වෙදිලා ගිහිල්ල ද?" ක්‍රෝනොස් ඇහුවා. "බාගදා නුඹට නුඹේ පරණ යාළුවෝ, දෙවිගොල්ලෝ නැතුව පාළු ඇති. නුඹ එයාලට එකතු වෙන්න කැමති ද?"

ප්‍රොමීතියස් සුදුමැලි වුණා. "මට වැරදි දෙයක් කියවුණේ, මගේ උතුමාණෙනි. ඔබතුමාගේ නියෝග ඒ විදිහට ම ක්‍රියාත්මක වෙයි." හමුදාවන් වෙතට හැරුණු එයා කෑගැහුවා. "සටනට සැරසේන්!"

යුද හටයෝ කැලඹෙන්න පටන් ගත්තා.

එක්සත් ජාතීන්ගේ ගොඩනැගිලි අංගනයට පිටුපස කොතැනින්දෝ නැගුණු කෝපාන්විත ගර්ජනාවකින් නගරය ම සැලුණා- ඩ්‍රැකනයෙක් අවදි වෙන හඬ. ඒ සද්දේ කොයි තරම් බිහිසුණු ද කියනවා නම් ඒකට මාවත් ඇහැරුණා. ඒත් එක්ක ම මට තේරුම් ගියේ ඒ හඬ සැතපුමක් ඈතින් හිටියත් මට ඇත්තට ම ඇහෙන බවයි.

ග්‍රෝවර් මගේ ළඟ හිටගෙන හිටියේ බය වෙලා වගෙයි. "ඒ මොකක්ද ඒ?"

"උන් එනවා," මම එයාට කිවුවා. "අපි අමාරුවක වැටෙන්නයි යන්නේ."

***

හෙෆාස්ටස් කැබිනයේ අයගේ ග්‍රීක ගින්දර අවසන් වී තිබුණා. ඇපලෝ කැබිනයට සහ දඩයක්කාරියන්ට ඊතල හිඟයක් මතු ව තිබුණා. අපේ අයගෙන් වැඩි දෙනෙක් දැනටමත් කොයි තරම් ඇම්බ්‍රෝසියා සහ නෙක්ටාර් ප්‍රමාණයක් ගිල දමා හිටියා ද කියනවා නම්, ඒවා තව වුට්ටක්වත් ගන්න අපි එඩිතර වුණේ නැහැ.

අපිට සටන් කළ හැකි තත්ත්වයේ ඉන්නා කැඩුරුකරුවෝ දාසයක්, දඩයක්කාරියෝ පහළොවක් සහ සැටර්ලා දුසිම බාගයක් ඉතිරිව සිටියා. ඉතිරි අය හිටියේ ඔලිම්පස්වල රැකවරණය ලබමින්. පාටි පෝනියෝ පෙළ ගැහෙන්න උත්සාහ කළා, ඒත් කැකිරි පළමින්, කෙලින් කටින් හිටගෙන ඉන්න බැරුව හිටපු එයාලා ළඟින් රූට් බියර් ගඳ තදින් හැමුවා. ටෙක්සාස්වලින් ආව අය කොලරාඩෝ පිළේ අයට ඔළුවෙන් අනිමින් හිටියා. මිසූරි කණ්ඩායම ඉලිනොයිස් අය සමඟ වාදයක පැටලිලා. ඒ මුළු හමුදාව ම සතුරන්ට විරුද්ධව සටන් කරනවා කෙසේ වෙතත්, එකාට එකා ගහ මරාගන්න තිබුණ ඉඩ වැඩියි කියලයි මට තේරුණේ.

කයිරොන් රේචල්ව පිට උඩ තියාගෙන පිම්මේ දුව ආවා. ඒක දැකලා මගේ හිත චුට්ටක් විතර පෑරුණේ කයිරොන් එයාගේ පිට උඩ කෙනෙක්ව තියාගෙන යන්නේ හරිම කලාතුරකින් නිසයි. ඒකත් මනුෂ්‍යයෙක්ව නම් නෙවෙයි.

"ඔයාගේ මේ යාළුවාට ප්‍රයෝජනවත් දෘෂ්ටියක් තියෙනවා, පර්සි," එයා කිව්වා.

රේචල් රතු වුණා. 'ඒවා මේ මගේ ඔළුව ඇතුලේ මැවුණ රූප ටිකක් විතරයි."

"ඩ්‍රැකනයෙක්," කයිරොන් කිව්වා. "හරියට ම කියනවා නම්, ලයිඩියානු ඩ්‍රැකනයෙක්. පරණ ම, භයානක ම වර්ගය."

මම රේචල් දිහා බැලුවේ පුදුමයෙන්. "ඔයා කොහොමද ඒක දැනගත්තේ?"

"මට හරියට ම විශ්වාස නැහැ," රේචල් පිළිගත්තා. "ඒත් මේ ඩ්‍රැකනයාට විශේෂ ඉරණමක් තියෙනවා. ඌ මැරෙන්නේ ඒරිස්ගේ දරුවෙක් අතින්."

ඇනබෙත් දෑත් බැඳගත්තා. "ඔයා කොහොමද ඒක දැනගත්තේ?"

"මම ඒක නිකං ම දැක්කා. මට ඒ ගැන පැහැදිලි කරන්න බැහැ."

"හොඳයි, ඔයා වැරදි වෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරමු," මම කිව්වා. "මොකද අපිට ඒරිස්ගේ දරුවන්ගේ පොඩි මදිපාඩුවක් තියෙනවා..." එක්වර ම මගේ හිතට දරුණු සිතුවිල්ලක් ආවා. මම පෞරාණික ග්‍රීකවලින් ශාපයක් කළා.

"මොකද?" ඇනබෙත් ඇහුවා.

"අර ඔත්තුකාරයා," මම එයාට කිව්වා. "ක්‍රෝනොස් කිව්වා, 'උන්ට මේ ඩ්‍රැකන්ව පරාද කරන්න බැහැ කියලා අපි දන්නවා' කියලා. අර ඔත්තුකාරයා දිගින් දිගට ම එයාට තොරතුරු දෙනවා. ඒරිස් කැබින් එක අපිත් එක්ක මෙතැන නැහැ කියලා ක්‍රෝනොස් දන්නවා. එයා අපිට මරන්න බැරි රාක්ෂයෙක්ව තෝරගෙන තියෙන්නෙ හිතලමයි."

තාලියාගේ මූණ තරහෙන් පැඟිරි වුණා. "ඔය ඔත්තුකාරයා කවදාහරි මගේ අතට අහු වුණොත්, ඒකාට සෑහෙන්න දුක් වෙන්න වෙයි. අපි තව පණිවුඩකාරයෙක් කඳවුරට යැවුවොත්-"



"මම දැනටමත් ඒක කරලයි තියෙන්නේ," කයිරොන් කිව්වා. "බ්ලැක්ජැක් මඟ යන ගමන්. ඒත් ක්ලැරිස්ව නම්ම ගන්න සිලේනට බැරි වුණොත්, මට සැක බ්ලැක්ජැක්ට පුළුවන් වෙයි ද-"

ගර්ජනාවකින් පොළොව දෙදුරුම් කෑවා. ඒක ඇහුණේ ගොඩක් ම කිට්ටුවෙනුයි.

"රේචල්," මම කතා කළා, "බිල්ඩිම ඇතුළට යන්න."

"මටත් නවතින්න ඕනෑ."

හෙවණැල්ලකින් ඉර වැසී ගියා. වීදියේ අනෙක් පැත්තේ වූ අහසට උස ගොඩනැගිල්ලක් දිගේ ඩ්‍රැකනයා පහළට බඩගෑවා. ඌ ගර්ජනා කරද්දී ජනේල දාස් ගාණක් එකවර කුඩු වුණා.

"එක්කො කමක් නෑ," රේචල් ඇහෙන නෑහෙන හඬින් කිව්වා. "මම ඇතුළට යන්නම්."

★★★

මං ඔයාට පැහැදිලි කරලා දෙන්නම්: ඩ්‍රැගන්ලා- ඒ කියන්නේ මකරු කියලා ජාතියක් ඉන්නවා, ඒ වගේම ඩ්‍රැකන්ලා කියලා ජාතියකුත් ඉන්නවා.

ඩ්‍රැකන්ලා මකරුන්ට වඩා අවුරුදු තුන් හාරදාහක් විතර වැඩිමල්, ඒ වගේම උන් මකරුන්ට වඩා ගොඩක් ලොකුයි. උන්ගේ පෙනුම සද්දන්ත සර්පයෝ වගෙයි. උන්ගෙන් වැඩි දෙනෙකුට පියාපත් නැහැ. වැඩි දෙනෙකුට ගිනි පිඹින්නත් බැහැ (හැබැයි සමහර එවුන්ට පුළුවන්). උන් හැමෝම විසකුරුයි. ටයිටේනියම්වලටත් වඩා තද කොරපොතු ඇති උන් අතිශයින් ම ශක්තිමත්. උන්ගේ ඇස්වලට ඔයාගේ මුළු ඇඟ ම අප්‍රාණික කරන්න පුළුවන්; ඒක මෙඩූසා ඔයාව ගල්-ගස්සවන විදිහේ අප්‍රාණික වීමක් නෙවෙයි, මගේ-දෙයියනේ-අර-තඩි-සර්පයා-මාව-ගිලින්නයි-යන්නේ කියලා හිතෙද්දී ඇතිවෙන විදිහේ අප්‍රාණික වීමක්. ඒකත් කොහෙත්ම හොඳ දෙයක් නම් නෙවෙයි.

කඳවුරේ දී අපිට ඩ්‍රැකනයෙකුට විරුද්ධව සටන් කරන්න පුහුණුවීම් ලැබී තිබුණා, ඒත් අඩි දෙසීයක් දිග, පාසැල් බසයක් තරම් මහත කඳක්, පිරික්සුම් පහන් වගේ කහ පාට ඇස් දෙකක් සහ අලියෙක්ව පවා හප කරන්න හැකි තරමේ උල් දත් පිරුණු කටක් ඇති සර්පයෙකුට විරුද්ධව සටන් කරන්න කොහොම පෙර සූදානම් වෙන්න ද?

ඌව දකිද්දි අර පියාඹන ඊරි දාහෙන් සම්පතක් කියලා මට හිතුණා.

ඒ අතරවාරේ, සතුරු හමුදාව පස්වෙනි මාවත දිගේ ඉදිරියට ආවා. උන් එන පාරෙන් මෝටර් රථ ඉවතට තල්ලු කරලා, මනුෂ්‍යයින්ව ආරක්ෂා කරන්න අපි අපේ උපරිමයෙන් උත්සාහ කළා, ඒත් ඒකෙන් වුණේ හතුරන්ගේ ගමන වඩාත් පහසු වුණ එකයි. පාට් පෝතියෝ කලබලෙන් වලිග වැනුවා. කයිරොන් එයාලගේ පේළි අතර ඉහළ-පහළ දුවමින්, යටත් නොවී නැගී සිටින්නත්, ජයග්‍රහණය ගැන සහ රූට් බියර් ගැන හිතේ තියාගන්නත් කියමින් එයාලට ධෛර්යය දෙන්න උත්සාහ කළා, ඒත් මට නම් හිතුණේ එයාලා ඕනෑ ම තත්පරයක කුලප්පු වෙලා දුවන්න ගනීවි කියලයි.

"මම ඩ්‍රැකන් ගැන බලාගන්නම්." මගේ කටහඬ එළියට ආවේ මීයෙක් කෑගහනවා වගේ බයාදු විදිහටයි. ඊට පස්සේ මම නව හයියෙන් මොර ගැහුවා: "මම ඩ්‍රැකන් ගැන බලාගන්නම්! අනිත් හැමෝම, හමුදාවට විරුද්ධව පෙළ ගැහෙන්න!"

ඇනබෙත් මගේ ළඟින් හිටගත්තා. එයා එයාගේ බකමූණු යුද හිස්වැසුම මුහුණ වැහෙන්න දමාගෙන හිටියත්, එයාගේ ඇස් දෙක රතු වෙලා කියලා මට පෙනුණා.

"ඔයා මට උදවු කරනවා නේද?" මම ඇහුවා.

"ඒකට තමයි මම ඉන්නේ," එයා මූසල විදිහට කිවුවා. "මගේ යාළුවන්ට උදවු කරන්න."

මට දැනුණේ මම මහා නරුමයෙක් වගෙයි. එයාව පැත්තකට ඇදගෙන ගිහිල්ලා, රේචල් මෙතැනට ආවේ මගේ උවමනාවට නෙවෙයි කියලත්, ඒක මගේ අදහසක් නෙවෙයි කියලත් එයාට පැහැදිලි කරලා දෙන්න මට ඕනෑ වුණා, ඒත් අපිට ඒකට වෙලාවක් තිබුණේ නැහැ.

"නොපෙනී යන්න," මම කිවුවා. "මම ඌව කලබල කරලා තියාගෙන ඉන්න අතරේ, ඌගේ ආරක්ෂක වැස්මේ දුර්වල තැන් තියෙනව ද බලන්න. හැබැයි පරිස්සමෙන්."

මම උරුවම් බෑවා. "මිසිස් ඕ'ලෙරී, මෙහෙ එන්න!"

"රෑෑෆ්ෆ්!" නරාශ්ව පේළි මැදින් උඩ පැන පැන දුවගෙන ආව මගේ යම බැල්ල මට දුන් හාදුවේ තිබුණේ පෙපරෝනි පීසා ගඳක්.



මම කඩුව ඇදලා ගත්තා, ඊට පස්සේ අපි දෙන්න ම ඉදිරියට දිවුවා.

★★★

ඩ්‍රැකනයා අපිට තට්ටු තුනක් ඉහළ සිට අපේ සේනාවේ තරම මැන ගනිමින්, ගොඩනැගිල්ලේ පහළට ලිස්සා එමින් සිටියා. ඌ කොයි පැත්තට හැරිලා බැලුවත්, එතැන නරාශ්වයෙක් බයෙන් ගල් ගැහුණා.

උතුරු දෙසින් හතුරු හමුදාව පාට් පෝතියෝ අතරට කඩා වැදුණා ම, අපේ පේළි බිඳී ගියා. මට කිට්ටු වෙන්න ඉඩක් ලැබෙන්නත් කලින් පහළට පැන්න ඩ්‍රැකනයා කැලිෆෝනියානු නරාශ්වයෝ තුන් දෙනෙක්ව එක කටට ගිල දැමුවා.

මිසිස් ඕ'ලෙරී ගුවනට පිම්මක් පැන්නේ හරියට දත් සහ නිය ඇති කළු පාට මාරක හෙවණැල්ලක් වගෙයි. සාමාන්‍යයෙන්, කඩා පතින යම බල්ලෙකුගේ දසුන බිහිසුණු එකක් වුණත්, ඩ්‍රැකන් එක්ක බලද්දි නම් මිසිස් ඕ'ලෙරී පෙනුණේ පොඩි ළමයෙකුගේ සෙල්ලම් බඩුවක් වගෙයි.

එයාගේ නිය කිසිම හානියක් නොකර ඩ්‍රැකන්ගේ කොරපොතු මතින් ලිස්සා ගියා. එයා රාක්ෂයාගේ උගුරු දණ්ඩ හපා කෑවත්, එයින් එක කඩතොලුවක්වත් ඇති වුණේ නැහැ. ඒ කොහොම වුණත්, එයාගේ බර ඩ්‍රැකන්ව ගොඩනැගිල්ලෙන් බිමට ඇදලා ගන්න ප්‍රමාණවත් වුණා. නුහුරු ලෙස ඇඹරෙමින් පැති මඟ උඩට කඩා වැටුණු ඌ යම බැල්ල සමඟ පෙරළෙමින් වළිකෑවා. ඩ්‍රැකන් මිසිස් ඕ'ලෙරීව හපා කන්න උත්සාහ කළා, ඒත් එයා හිටියේ සර්පයාගේ කටට ඕනෑවටත් වඩා කිට්ටුවෙනුයි. විෂ හතර අත ඉහිරෙමින්, නරාශ්වයෝ වගේම රාක්ෂයින් කීප දෙනෙක්වත් දූවිලිවලට දිය කර දැමුවා. ඒත් මිසිස් ඕ'ලෙරී සර්පයාගේ හිස වටෙන් යමින් ඌව සූරමින් සපා කෑවා.

"යාාාහ්!" මම රාක්ෂයාගේ වම් ඇහැ තුළට රිප්ටයිඩ් කිඳා බැස්සුවා. ඒ පිරික්සුම් පහන අඳුරු වුණා. ඩ්‍රැකන් සූ ගාමින් පහර ගැසීමට පස්සට වුණත්, ඊට කලින් මම පැත්තකට පෙරළුණා.

ඌ පදික වේදිකාවේ නාන තටාකයක් තරමේ කොටසක් හපා කෑවා. ඌ ඌගේ හොඳ ඇහැ මගේ පැත්තට හැරෙව්වා, ඒ වෙලාවේ මම ඌගේ දත් දිහා විතරක් බලා සිටියේ මාව ගල් නොගැසෙන්නයි. ඌගේ අවධානය වෙනතකට හරවන්න මිසිස් ඕ'ලෙරී එයාට හැකි උපරිමයෙන් වැඩ කළා. සර්පයාගේ ඔළුව උඩට කඩා පැන්න එයා

Scanned with CamScanner

පහුරු ගාමින් ගෙරෙව්වේ හොඳටෝම තරහා ගිය බොරු කොණ්ඩයක් වගෙයි.

සටනේ ඉතිරිය ඒ තරම් හොඳින් සිදු වෙමින් තිබුණේ නැහැ. යෝධයින්ගේ සහ රාක්ෂයින්ගේ ආක්‍රමණය මැද නරාශ්වයෝ භීතියෙන් කුලප්පු වී සිටියා. සටන් රැල්ල අතරින් පතර තැඹිලි පාට කඳවුරු ටී-ෂර්ට් එකක් මතු වුණත්, එය මතු වූ සැණින් ම වගේ නොපෙනී ගියා. ඊතල හඬ නගමින් ඇදී ගියා. සේනා දෙකෙන් ම ගිනි බෝම්බ දැලි පිට රැළි පුපුරා ගියා. ඒත් දැන් සටන වීදිය හරහා එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලේ දොරටුව දිහාවට එමින් තිබුණා. අපිව පසු බසිමින් තිබුණා.

එක්වර ම ඩ්‍රැකන්ගේ පිටුපසින් ඇනබෙත් ප්‍රාදූර්භූත වුණා. සර්පයාගේ කොරපොතු දෙකක් අතර සිදුරක් තුළට එයා ලෝකඩ කිණිස්ස බස්සද්දී එයාගේ අදෘශ්‍යමාන වෙන කැප් එක ඔළුවෙන් ගැලවී වැටුණා.

ඩ්‍රැකනයා මහ හඬින් ගිගුරුවා. ඌ ඇනබෙත්ව පිටෙන් පෙරළා දමමින් වටේට දඟර ගැසුණා.

ඇනබෙත්ව පොළොවේ ගැටෙද්දි ම වගේ මම එයා ළඟට ගියා. මම එයාව ඇදලා ගනිද්දී ම, සර්පයා පෙරළුණේ මොහොතකට කලින් එයා සිටි තැන තිබූ පහන් කණුවකුත් කුඩු කර දමමිනුයි.

"ස්තූතියි," එයා කිවුවා.

"මං ඔයාට කිවුවා නේද පරිස්සම් වෙන්න කියලා!"

"ඔව්. හොඳයි, පාත් වෙන්න!"

ඒ වාරේ එයා මාව බේරගත්තා. රාක්ෂයාගේ දත් මගේ ඔළුවට උඩින් පාත් වෙද්දී, එයා මාව පැත්තකට පෙරළුවා. ඩ්‍රැකන්ගේ අවධානය හරවගන්න මිසිස් ඕ'ලෙරී ඌගේ මූණේ හැපෙද්දී, අපි එතැනින් ඉවතට පෙරළුණා.

ඒ අතර වාරයේ අපේ මිත්‍ර පාක්ෂිකයෝ එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලේ දොරටුව දිහාවට පසු බැස තිබුණා. මුළු සතුරු හමුදාව ම එයාලව වට කරගෙන සිටියා.

අපිට තවත් කරන්න දෙයක් ඉතිරිව තිබුණේ නැහැ. අපේ උදවුවට තවත් කිසිවෙක් ආවෙත් නැහැ. අපිට ඔලිම්පස් කන්දට යන්න



ඇති ඉඩ ඇහිරෙන්න කලින් පහු බහින්න ඇනබෙත්ට සහ මට සිදුව තිබුණා.

ඒත් ඒ වෙලාවේ මට දකුණු පැත්තෙන් ගෙරවුමක් ඇහෙන්න ගත්තා. ඒක නිව්යෝක් නගරයට ඒ හැටි හුරු පුරුදු හඬක් නොවුණත්, මම එය එසැණින් ම හඳුනා ගත්තා: කරත්ත රෝදවල හඬ.

ගෑනු ළමයෙකුගේ හඬක් මොරගෑවා, "ඒරීස්!"

ඒත් එක්ක ම යුද කරත්ත දුසිමක් සටනට කඩා වැදුණා. ඒ හැමෙකක ම වල් ඌරු හිස සහිත රතු පාට කොඩි ලෙළ දුන්නා. ගිනි දලුවලින් සෑදුණු කේශර ඇති ඇටසැකිලි අශ්ව බාන බැගින් ඒ සෑම කරත්තයකට ම දිගේලි කර තිබුණා. වෛරයෙන් පිරුණු දෑස් ඇති ප්‍රාණවත් රණ ශූරයෝ තිස් දෙනෙක් දිලිසෙන සන්නාහවලින් සැරසී, හෙල්ල ඉදිරියට දිගු කරගෙන එකා වගේ ආවේ මාරයෝ රැළක් වගෙයි.

"ඒරීස්ගේ දරුවෝ!" ඇනබෙත් කිවුවේ විමතියෙන්. "රේචල් කොහොමද දැනගත්තේ?"

ඒකට උත්තර මගේ ළඟ තිබුණෙත් නැහැ. ඒ වුණත් ප්‍රහාරය මෙහෙයවමින් සිටියේ හුරු පුරුදු රතු පාට සන්නාහයකින් සැරසී, වල් ඌරු හිස්වැසුමකින් මුහුණ ආවරණය කරගත් ගෑනු ළමයෙක්. එයා ඉහළට ඔසවාගෙන සිටි හෙල්ලය මුදුනේ විදුලිය පුපුරු ගැසුවා. අපේ උදවුවට ක්ලැරිස් ම ඇවිල්ලා. එයාගේ කරත්තවලින් අඩක් රාක්ෂ හමුදාව වෙතට හැරෙද්දී, ක්ලැරිස් අනෙක් කරත්ත හය එක එල්ලේ ඩ්‍රැකනයා වෙතට මෙහෙයවූවා.

ආපස්සට එසවුණු සර්පයා කොහොමහරි මිසිස් ඕ'ලෙරීව පැත්තකට විසි කළා. ගොඩනැගිල්ලක බිත්තියේ වැදුණ මගේ අසරණ හුරතලා වේදනාවෙන් උඩු බිරුවා. මම එයාගේ උදවුවට දිවුවා, ඒත් සර්පයා ඒ වෙද්දිත් අලුත් ම තර්ජනයට අවධානය යොමු කරලා ඉවරයි. ඌගේ ඉතිරිව තිබුණු එක ඇහේ බැල්ම පවා කරත්ත ධාවකයෝ දෙන්නෙක්ව අප්‍රාණික කරන්න ප්‍රමාණවත් වුණා. නොමඟ ගිය එයාලගේ කරත්ත කාර් පෙළක් දෙසට හැරුණා. අනෙක් කරත්ත හතර නොනැවතී ඉදිරියට ආවා. පහර දෙන්න කට ඇරපු රාක්ෂයාට කටින් එකක් දිව්‍යමය ලෝකඩ හෙලි පාරවල් කන්න ලැබුණා.

"ඊඊඊඊඊඊස්ස්ස්!!" ඌ බෙරිහන් දුන්නා. සමහරවිට ඒ ඩ්‍රැකන් "ඌෟයි!" කියපු විදිහ වෙන්න ඇති.

Scanned with CamScanner

"ඒරීස්, මාත් එක්ක!" ක්ලැරිස් බෙරිහන් දුන්නා. එයාගේ කටහඬ වෙනදාට වඩා උච්ච ලෙයසි ඇහුණේ, ඒත් මං හිතන්නේ, එයා යෙදී සිටි සටන සමඟ බලද්දී ඒක පුදුම වෙන්න දෙයක් නෙවෙයි.

වීදියේ අනෙක් පසට ගිය කරත්ත හයෙන් පාටි පෝනියන්ට අලුත් බලාපොරොත්තුවක් ලැබුණා. එයාලා එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලේ දොරටු අසලට නැවත එක්රැස් වෙද්දී, සතුරු හමුදාව එක මොහොතකට ව්‍යාකුල වුණා.

මේ අතරේ, ක්ලැරිස්ගේ කරත්තය ඩ්‍රැකන් වටා රවුම් ගැසුවා. හෙල්ල රාක්ෂයාගේ හමේ වැදී බිඳුණා. ඇටසැකිලි අශ්වයෝ ගිනි පිඹිමින් හේෂාරාවය කළා. තවත් කරත්ත දෙකක් පෙරළුණත් ඒවාගේ සිටි රණ ශූරයෝ පහසුවෙන් ම බිමට පැනලා, කඩු අතට අරන් වැඩට බැස්සා. සතාගේ කොරපොතු අතර ඇති විවරවලට එයාලා කෙටුවා. රාක්ෂයා විෂ විදිද්දී එයාලා ඒවා මඟ ඇරියේ හරියට එයාලා මුළු ජීවිත කාලෙ ම මේකට ම පුහුණුවීම් කරලා වගෙයි. කොහොමත් ඉතින් එහෙමයි නේ.

ඒරීස් කඳවුරුකාරයෝ නිර්භීත නැහැ කියලා කාටවත් ම කියන්න බැහැ. ක්ලැරිස් එතැන ඉදිරියට ම ගොස් එයාගේ හෙල්ලයෙන් ඩ්‍රැකන්ගේ මුහුණට අනිමින්, ඌගේ අනෙක් ඇහැත් විනාශ කරන්න උත්සාහ කළා. ඒත් මම බලා සිටිද්දී ම, හැමදේම වරදින්න ගත්තා. ඒරීස් කඳවුරුකාරයෙක්ව ඩැහැගත්ත ඩ්‍රැකන් එයාව එක කටට ගිල දැමුවා. තවත් කෙනෙක්ව පෙරළා දැමූ ඌ තුන්වෙනියාට විෂ විද්දා. එයාගේ හෙල්මටය උණු වී වැගිරෙද්දී එයා භීතියෙන් පසුබෑවා.

"අපිට උදවු කරන්න වෙනවා," ඇනබෙත් කිවුවා.

එයා හරි. මම ඔච්චර වෙලා කළේ පුදුමයෙන් ගල් ගැහිලා බලාගෙන හිටපු එක විතරයි. නැඟිටින්න උත්සාහ කළ මිසිස් ඕ'ලෙරී වේදනාවෙන් කෑගසමින් ආපසු ඇද වැටුණා. එයාගේ එක කකුලකින් ලේ ගලමින් තිබුණා.

"ඔහොම ඉන්න, කෙල්ලේ," මම එයාට කිවුවා. "ඔයා දැනටමත් කරලා තියෙන දේවල් හොඳටම ඇති."

ඇනබෙත් සහ මම රාක්ෂයාගේ පිට උඩට පැනලා, ඌගේ හිස දිහාවට දිවුවේ, ඌගේ අවධානය ක්ලැරිස් වෙතින් ඉවතට හරවාගන්න උත්සාහ කරමිනුයි.



ක්ලැරිස්ගේ කැබින් සහයකයෝ හෙලිවලින් දමා ගැසුවා, ඒවායින් වැඩි ප්‍රමාණයක් කැඩී වැටුණත්, සමහර ඒවා රාක්ෂයාගේ දත් අතරේ හිර වුණා. ඌගේ කට කොළ පාට ලේ, කහ පාට පෙණ සහිත විෂ සහ කිරි ගැසුණු ආයුදවලින් පිරෙන තුරු ම ඌ හනු දෙක එකට ඇඹරුවා.

"ඔයාට ඒක කරන්න පුළුවන්!" මම ක්ලැරිස්ට කෑගසා කිවුවා. "ඒරීස්ගේ දරුවෙක් අතින් මැරුම් කන්නයි ඌගේ ඉරණම ලියවිලා තියෙන්නේ!"

එයාගේ යුද හිස්වැසුම තුළින් මට දකින්න ලැබුණේ එයාගේ ඇස් දෙක විතරයි- ඒත් මොකක්දෝ වැරැද්දක් ඇති බව මට එසැණින් ම තේරුණා. එයාගේ නිල් පාට ඇස් දෙක බයෙන් පිරිලා. ක්ලැරිස්ට කිසිම දවසක එහෙම පෙනුමක් තිබිලා නැහැ. ඒ වගේම එයාගේ ඇස් දෙක නිල් පාටත් නැහැ.

"ඒරීස්!" එයා නුහුරු උච්ච හඬකින් කෑගැසුවා. හෙල්ලය සමබර කරගත් එයා ඩ්‍රැකන්ට පහර දෙන්න පැන්නා.

"නෑ," මම කෙඳිරුවා. "ඔහොම ඉන්න!"

ඒත් රාක්ෂයා පහළ සිටි එයා දිහා බැලුවා- ඒ බැල්මේ තිබුණේ අවඥාවක් වගේ දෙයක්- ඊට පස්සේ ඌ කෙලින් ම එයාගේ මුහුණට විෂ විද්දා.

එයා මර හඬ දෙමින් ඇදගෙන වැටුණා.

"ක්ලැරිස්!" රාක්ෂයාගේ පිට මතින් පැන්න ඇනබෙත් එයාට උදවු කරන්න දිවුවා, ඒ අතරේ අනෙක් ඒරීස් කඳවුරුකරුවෝ, ඇද වැටුණු එයාලගේ උපදේශිකාව ආරක්ෂා කරන්න උත්සාහ කළා. සතාගේ කොරපොතු දෙකක් අතරට රිප්ටයිඩ් කිඳා බැස්සවූ මම ඌගේ අවධානය මගේ පැත්තට හරවාගන්න සමත් වුණා.

මාව ඌගේ පිට මතින් විසි වුණත්, මම මගේ දෙපා මතට ගොඩබෑවා. "මෙහෙ එනවා, මෝඩ පණුවා! මගේ දිහා බලනවා!"

ඊළඟ මිනිත්තු ගණනාව පුරාවට මට දකින්න ලැබුණේ දත් ගොඩක් විතරයි. මම පනු බහිමින් සහ විෂ මඟ අරිමින් හිටියත්, සතාට කිසිම හානියක් කරන්න මට බැරි වුණා.

පියාඹන කරත්තයක් පස්වෙනි මාවතට ගොඩ බානවා මගේ ඇස් කොණකට පෙනුණේ ඒ වෙලාවෙයි.

ඊට පස්සේ කවුදෝ අපේ දිහාවට දුවගෙන ආවා. කණගාටුවෙන් වෙවුලන ගෑනු ළමයෙකුගේ කටහඬක් කෑගැසුවා. "නෑ! ඔහේට ශාප කරනවා, ඇයි?"

ඒ දිහාවට බැල්මක් හෙළන්න තරම් මම නිර්භීත වුණත්, මට දකින්න ලැබුණේ කිසිම තේරුමක් නැති දෙයක්. ක්ලැරිස් ඇද වැටුණු තැන ම වැතිරී සිටියා. එයාගේ සන්නාහය විෂෙන් දුම් දැමුවා. ඇනබෙත් සහ ඒරීස් කඳවුරුකරුවෝ එයාගේ හෙල්මටය ගලවන්න දඟලමින් සිටියා. එයාලා අසල ම දණ ගසාගෙන සිටියේ, කඳවුරු ඇඳුමෙන් සැරසුණු, කඳුළුවලින් තෙමී ගිය මුහුණක් ඇති ගෑනු ළමයෙක්. එයා තමයි... ක්ලැරිස්.

මගේ ඔළුව කැරකෙන්න ගත්තා. ඇයි මට ඒක කලින් තේරුනේ නැත්තේ? ක්ලැරිස්ගේ සන්නාහය ඇඳගෙන හිටිය ගෑනු ළමයා ගොඩක් කෙට්ටුයි, ක්ලැරිස් තරම් උසත් නැහැ. ඒ වුණත් වෙන කවුරු හරි මොකටද ක්ලැරිස් වගේ රඟපාන්නේ?

මම තුෂ්ණීම්භූත වෙලා හිටපු ටිකට තව පොඩ්ඩෙන් ඩ්‍රැකනයා මාව හපලා දෙකට කඩනවා. මම පැත්තකට පනිද්දි ම, සතා ඌගේ හොම්බ ගඩොල් තාප්පෙක ඇන ගත්තා.

"ඇයි?" අනෙක් කඳවුරුකරුවෝ විෂ කාවැදුණු හෙල්මටය ගලවන්න දඟලන අතරේ ඇත්ත ක්ලැරිස් අනෙක් ගෑනු ළමයාව දෑතට අරන් ප්‍රශ්න කළා.

පියාඹන කරත්තයේ සිට ක්‍රිස් රොඩ්‍රිගස් එතැනට දුවගෙන ආවා. ඒ දෙන්නා කඳවුරේ සිට එන්න ඇත්තේ ක්ලැරිස් කියලා හිතාගෙන අනෙක් ගෑනු ළමයා සමඟ ආව ඒරීස් කඳවුරුකරුවන්ව ප්‍රහුබැඳගෙනයි. ඒත් තවමත් මට මේ පටලැවිල්ලේ අගක් මුලක් තේරුනේ නැහැ.

ගඩොල් තාප්පයෙන් හිස ගස්සා ඉවතට ගත් ඩ්‍රැකන් වියරුවෙන් බෙරිහන් දුන්නා.

"ඔන්න බලාගෙන!" ක්‍රිස් අනතුරු ඇඟෙව්වා.

ඒත් මගේ පැත්තට හැරෙනවා වෙනුවට ඩ්‍රැකන් ක්‍රිස්ගේ හඬ නැඟුණු දිහාවට වේගයෙන් හැරුණා. ඌ උප දෙවි කණ්ඩායම වෙතට දළ විලිස්සුවා.



ඩ්‍රැකනයා දිහා බලපු ඇත්ත ක්ලැරිස්ගේ මුහුණ තනි වෛරයෙන් පිරුණා. ඒ තරම් තීව්‍ර බැල්මක් මම මීට කලින් දැකලා තිබුණේ එක පාරයි. එයාගේ තාත්තා, ඒරීස් සමඟ මම මුහුණට-මුහුණ සටන් කළ දවසේ එයාගේ මූණේ තිබුණෙත් මේ බැල්මමයි.

"උඹට මැරෙන්ඩ ද ඕනෑ?" ක්ලැරිස් ඩ්‍රැකන්ට බෙරිහන් දුන්නා. "හරි, එහෙනම් එනවා!"

වැටී සිටි ගැහැනු ළමයාගෙන් එයාගේ හෙල්ලය ඩැහැගත් එයා කිසිම සන්නාහයක් හෝ පලිහක් නැතිව එයා ඩ්‍රැකන්ට පහර දෙන්න ගියා.

එයාගේ උදවුවට කිට්ටුවට යන්න මම උත්සාහ කළත්, ක්ලැරිස් ඊට වඩා වේගවත් වුණා. රාක්ෂයා කඩා පැනලා, එයා ඉදිරියේ පොළොව සුණුවිසුණු කර දමද්දී එයා පැත්තකට පැන්නා. ඊට පස්සේ එයා සතාගේ ඔළුව උඩට පැන්නා. ඌ ඉහළට එසවෙද්දී, එයා විදුලි හෙල්ලය සතාගේ හොඳ ඇහැ තුළට කිඳා බැස්සවූ වේගයට මායා ආයුදයේ මුළු බලය ම නිදහස් කරමින් එහි මිට කුඩු පට්ටම් වුණා.

සතාගේ ඔළුව හරහා විද්‍යුත් ධාරාවන් ගලා ගියේ ඌගේ මුළු ඇඟ ම වෙවුලවමින්. ඩ්‍රැකන්ගේ කටින් දුම් පිට පනිද්දී, එතැනින් ගැලවී බිමට පැන්න ක්ලැරිස් පැති මගේ ආරක්ෂිත තැනකට පෙරළුණා. ඩ්‍රැකනයාගේ මස් දිය වී ගොස්, ඌව ලෝහමය තහඩු කොරපොතුවලින් සැදුණු හිස් උමඟක් තුළට කඩා වැටුණා.

අපි හැමෝම ක්ලැරිස් දිහා බලා හිටියේ විස්මයෙන්. මීට කලින් කිසිම කෙනෙක් ඒ තරම් විශාල රාක්ෂයෙක්ව කිසිවෙකුගේ උපකාරයක් නැතිව තනියම විනාශ කරනවා මම කවදාවත් දැකලා තිබුණේ නැහැ. ඒත් ක්ලැරිස්ට නම් ඒක ගාණක්වත් නැහැ වගෙයි. එයා ආයෙමත් එයාගේ සන්නාහය හොරකම් කරපු, තුවාල ලත් ගෑනු ළමයා ළඟට දිවුවා.

අන්තිමේ දී ඒ ගෑනු ළමයාගේ හෙල්මටය ඉවත් කරන්න ඇනබෙත්ට හැකි වී තිබුණා. අපි හැමෝම එතැනට වට වුණා: ඒරීස් කඳවුරුකාරයෝ, ක්‍රිස්, ක්ලැරිස්, ඇනබෙත් සහ මම. තවමත් පස්වෙනි මාවත දිගට යුද්ධය ඇවිළුණත්, ඒ මොහොතේ දී ඇද වැටුණු ගැහැනු ළමයා වට කර සිටි අපේ පුංචි රවුම ඇර වෙන කිසිවක් පවතින බවක් අපිට දැනුනේ නැහැ.

වරක් පුන්දරව තිබුණු එයාගේ මූණුවර දත් ඩ්‍රැකනයාගේ විෂට දරුණු ලෙස පිළිස්සිලා. නෙක්ටාර් හෝ ඇම්බ්‍රෝසියා කොච්චර දුන්නත් එයාව බේරගන්න බැරි බව මට තේරුණා.

මෙකත් හරි සිද්ධ වෙන්නයි යන්නේ. රේචල්ගේ වචන මගේ කන් ඇතුළේ දෝංකාර දුන්නා. මරණයෙන් ඉවර වෙන උප්පරවැට්ටියක්.

එයා අදහස් කළ දේ තේරුමත්, ඒ වගේම ඒරිස් කැබිනය සටනට මෙහෙයවූ කෙනා කවුද කියලත් මට දැන් තේරුණා.

මම බිම වැතිරී සිටි සිලේනා බියුරිගාඩ්ගේ මියැදෙන මුහුණ දිහා බැලුවා.

# 17

# මම පඬුපුල් ආසනේ ඉඳගත්තා

"ඔහේ මොනවද හිතුවේ?" ක්ලැරිස් සිලේනාගේ හිස උකුලට ගත්තා.

සිලේනා කෙළ පොදක් ගිලින්න උත්සාහ කළා, ඒත් එයාගේ තොල් වේලිලා, පැළිලයි තිබුණේ. "ඇහුවෙ... නැහැ. කැබින් එක... ඔයා එක්ක විතරයි යන්නෙ."

"ඒ හින්දා ඔයා මගේ සත්තාහේ හොරකම් කරා," ක්ලැරිස් ඇසුවේ අදහාගන්න බැරිව. "ක්‍රිසුයි මමයි මුර සංචාරෙට යනකල් බලන් ඉඳලා, ඔහේ මගේ සත්තාහේ හොරකම් කරගෙන, මං වගේ රඟපෑවා." එයා එයාගේ සහෝදර සහෝදරියෝ දිහාවට රවලා බැලුවා. "ඒත් ඔහේලා කාටවත් ඒක තේරුනේ නැහැ?"

ඒරිස් කඳවුරුකරුවන්ට එයාලගේ සටනට පලදින බූට් සපත්තු ගැන හදිසි උනන්දුවක් පහළ වුණා.

"එයාලට බනින්න එපා," සිලේනා කිවුවා. "එයාලට විශ්වාස කරන්න ඕනෑ වුණා... මම තමයි ඔයා කියලා."

"මෝඩ ඇෆ්‍රෝඩයිට් කෙල්ල," ක්ලැරිස් ඉකි බින්දා. "ඔයා ඩ්‍රැකන් කෙනෙක්ට ගහන්ඩ ගියා? ඇයි ඒ?"

"හැමදේට ම වගකියන්න ඕනෑ මම," සිලේනා කියද්දි එයාගේ කම්මුල දිගේ කඳුළු බිංදුවක් පහළට ගලා ගියා. "ඩ්‍රැකන්, චාර්ලිගේ මරණේ... කඳවුර අනතුරේ වැටුණේ-"

Scanned with CamScanner

"ඕක නවත්තගන්නවා!" ක්ලැරිස් කිවුවා. "ඒක ඇත්ත නෙවෙයි."

සිලේනා අත දිග ඇරියා. එයාගේ අත්ල මත තිබුණේ දෑකැත්තක- ක්‍රෝනොස්ගේ සලකුණ- හැඩයේ යත්තරයක් සහිත රිදී බ්‍රේස්ලටයක්.

මට දැනුණේ මගේ හදවත සීතල අතකින් වෙළාගත්තා වගෙයි. "ඔයා තමයි ඔත්තුකාරයා."

සිලේනා ඔළුව වනන්න උත්සාහ කළා. "මම... මම චාර්ලිට කැමති වෙන්න කලින්, ලූක් මට හිතවත් වෙලා හිටියා. එයා ගොඩක්... හිත් ගන්න කෙනෙක් වුණා. කඩවසම්. පස්සේ, එයාට උදවු කරන එක නවත්තන්න මට ඕනෑ වුණා, ඒත් එයා මේ ගැන එළි කරනවා කියලා තර්ජනය කළා. එයා දිවුරුවා... එයා දිවුරලා කිවුවා මම කරන්නෙ ජීවිත බේරන එක කියලා. මේකෙන් තුවාල වෙන්නෙ බොහොම ටික දෙනෙක්ට විතරයි කිවුවා. එයා මට කිවුවා එයා... චාර්ලිට හිරිහැර කරන්නෑ කියලා. එයා මට කිවුවේ බොරු."

මම ඇනබෙත්ගේ දෑස් දිහා බැලුවා. එයාගේ මූණ හුණුවල පාටට හැරිලා. එයා හිටියේ මේ දක්වා එයාට තිබුණු එකම වාරුවත් ගිලිහිච්ච කෙනෙක් වගෙයි.

අපිට පිටුපසින්, යුද්ධය දරුණු ලෙස ඇවිළී ගියා.

ක්ලැරිස් එයාගේ කැබින් සහායකයින්ට තරහෙන් රැව්වා. "යනවල්ලා, ගිහිල්ලා නරාශ්වයින්ට උදවු කරනවල්ලා. දොරටු ආරක්ෂා කරගනිල්ලා. ඉතින් යනවා!"

එයාලා සටනට එකතු වෙන්න ගියා.

සිලේනා ගැඹුරු, වේදනාබර හුස්මක් ගත්තා. "මට සමාව දෙන්න."

"ඔහේ මැරෙන්නෙ නෑ," ක්ලැරිස් තදින් කිවුවා.

"චාර්ලී..." සිලේනාගේ ඇස් සැතපුම් මිලියන ගාණක් දුරට ගොස් තිබුණා. "චාර්ලිව පේනවා..."

එයා ආයේ කතා කළේ නැහැ.

ක්ලැරිස් එයාව දෑතින් දරාගෙන වැලපුණා. ක්‍රිස් එයාගේ උරහිස උඩින් අතක් තැබුවා.



අන්තිමේ දී ඇනබෙත් සිලේනාගේ දෑස් වැසුවා.

"අපිට සටන් කරන්න වෙනවා." ඇනබෙත්ගේ හඬ බිඳී තිබුණා. "අපිට උදවු කරන්න එයා ජීවිතේ දුන්නා. අපි එයාට ගරු කරන්න ඕනෑ."

ක්ලැරිස් නහය ඉහළට අදිමින්, පිස දැමුවා. "එයා වීරයෙක්, තේරුණා ද? වීරයෙක්."

මම ඔළුව වැනුවා. "එන්න යමු, ක්ලැරිස්."

ක්ලැරිස් මරණයට පත් වූ සහෝදරයෙකුගේ කඩුව අහුලා ගත්තා. "ක්‍රෝනොස්ට මේකට වන්දි ගෙවන්ඩ වෙනවා."

★★★

මම හතුරාව එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලෙන් ඉවතට පළවා හැරියා කියලා ඔයාට කියන්න මම කැමතියි. ඒත් ඇත්ත ම කියනවා නම්, ඒ හැම දෙයක් ම කළේ ක්ලැරිස්. සන්නාහය හෝ හෙල්ලය නැතිව වුණත් එයා යක්ෂණියක් වගේ සටන් කළා. එයාගේ කරත්තය එක එල්ලේ ටයිටන් හමුදාව වෙතට පදවාගෙන ගිය එයා, මඟ හරස් කළ සෑම දෙයක් ම පොඩිපට්ටම් කර දැමුවා.

එයාගේ බලපෑම කොයි තරම් ද කියනවා නම්, භීතියෙන් කුලප්පු වී සිටි නරාශ්වයෝ පවා නැවත රැස්වෙන්න පටන් ගත්තා. මරණයට පත්වූවන්ගෙන් ඊතල අහුලාගත් දඩයක්කාරියෝ සතුරා වෙතට හී මුර එක පිට එක දියත් කළා. ඒරීස් කැබිනය එයාලගේ ප්‍රියතම වැඩේ වුණ කැපීම් සහ කෙටීම් කරගෙන ගියා. රාක්ෂයින් තිස් පස්වෙනි වීදිය දෙසට පසුබැස්සා.

ඩ්‍රැකනයාගේ මළකුණ වෙතට කරත්තය පදවාගෙන ගිය ක්ලැරිස් ඌගේ ඇස් කෙවෙණි දෙක අතරින් ඇවුළුම් රැහැනක් දමා ගැට ගැසුවා. ඊට පස්සේ එයා චීන අලුත් අවුරුදු මකරෙක් වගේ කරත්තය පිටුපසින් ඩ්‍රැකනයාව ඇදගෙන ධාවනය කරන්න අසුන්ට සත් කළා. එයා නොසරුප් වචන මොර ගසමින්, එයාට විරුද්ධව සටනට එන්න අභියෝග කරමින්, පලා යන සතුරන්ව ලුහුබැන්දා. එයා කරත්තය ධාවනය කරගෙන යද්දී එයාව ඇත්තට ම දිස්න දෙන බව මට තේරුම් ගියා. එයා වටේට රතු පාට ගින්නෙන් සෑදුණු රැස් වළල්ලක් සැලෙමින් දිලිසුණා.

"ඒරීස්ගේ ආශිර්වාදය," තාලියා කිවුවා. "මමත් මීට කලින් කවදාවත් ඒක හැබැහින් දැකලා තිබුණේ නැහැ."

Scanned with CamScanner

එක මොහොතකට, ක්ලැරිසුත් මම වගේම කිසිම තුවාලයක් කළ නොහැකි කෙනෙක් වෙලා හිටියා. සතුරා හෙලි සහ ඊතලවලින් පහර දුන්නත්, ඒ කිසිවක් එයාගේ වැදුනේ නැහැ.

"මම තමයි ක්ලැරිස්, ඩ්‍රැකන්-මාරයා!" එයා මොර දුන්නා. "මං උඹලා ඔක්කොම මරලා දානවා! ක්‍රෝනොස් කොහෙද? ඒකව එළියට ගේනවා! ඒකා බයගුල්ලෙක් ද?"

"ක්ලැරිස්!" මම මොර ගැසුවා. "ඕක නවත්තන්න. ආපහු එන්න!"

"මොකක්ද ප්‍රශ්නේ, ටයිටන් රජෝ?" එයා මොර ගැසුවා. "එළියට එනවා!"

සතුරාගේ හැල හොල්මනක් නැති වුණා. ක්ලැරිස් පස්වෙනි මාවත වටේට කරත්තය පදවමින්, එයා ඉස්සරහට එන්න අභියෝග කරන අතරේ සතුරා හෙමින් සීරුවේ ඩ්‍රැකනෙයි පලිහවලින් සැදි පවුරක් පිටුපසට පසු බැස්සා. අඩි-දෙසීයක්-දිග-ඩ්‍රැකන් මළකුණ පදික වේදිකාව මතින් ඇදී යද්දී සීරුම් හඬක් නැගුණේ හරියට පිහි දාහක් බිම ඇතිල්ලෙනවා වගෙයි.

මේ අතරවාරයේ, අපි තුවාල ලැබූ අයව ප්‍රවේශ ශාලාව තුළට ගෙන ගොස් ප්‍රතිකාර කළා. සතුරා පෙනෙන මානයෙන් පසුබැස ගොස් සෑහෙන වෙලාවකට පසුවත් ක්ලැරිස් ක්‍රෝනොස්ට එයා සමඟ සටනට එන්න අභියෝග කරමින්, එයාගේ බිහිසුණු ජය සලකුණ සමඟ නොනැවතී කරත්තය මාවතේ ඉහළ-පහළ පදවමින් සිටියා.

"මම එයා ගැන බලාගන්නම්," ක්‍රිස් කිවුවා. "අන්තිමේදී එයාට හති වැටෙන්නෙ නැතෑ. ඊට පස්සෙ මම එයාව ඇතුළට අරන් එන්නම්."

"කඳවුරේ තත්ත්වෙ කොහොමද?" මම ඇහුවා. "එහෙ කවුරුහරි ඉතුරු වෙලා ඉන්නව ද?"

ක්‍රිස් ඔළුව හෙල්លුවා. "ආර්ගසුයි සොභාවික බලවේගයි විතරයි. පෙලියස් මකරා තාමත් ගහ මුර කරනවා."

"එයාලත් තව වැඩි කාලයක් ඉන්න එකක් නැහැ," මම කිවුවා. "ඒ කොහොම වුණත් ඔයා ආවට මට සන්තෝසයි."

ක්‍රිස් දුක්බරව ඔළුව වැනුවා. "ඒකට ගොඩක් කල් ගිය එකයි මට දුක. මම ක්ලැරිස්ට හේතු පහදලා දෙන්න හැදුවා. ඔයාලා ඔක්කොම මැරිලා ගියොත්, කඳවුර ආරක්ෂා කරගෙන ඉන්න එකේ තේරුමක්



නැහැ කියලා මම කිවුවා. අපේ යාළුවෝ ඔක්කොම මෙතැන නේ. මට කණගාටුයි සිලේනා..."

"මගේ දඩයක්කාරියෝ ඔයාලට මුරකාවල් පිහිටුවන්න උදවු කරයි," තාලියා කිවුවා. "ඇනබෙත්, පර්සි, ඔය දෙන්නා ඔලිම්පස්වලට යන්න ඕනෑ. අන්තිම රැකවල සැලසුම් කරන්න එයාලට ඔය දෙන්නව උඩට ඕනෑ වෙයි කියලා මට හිතෙනවා."

★★★

ප්‍රවේශ ශාලාවේ හිටපු දොරටු පාලකයා අතුරුදහන් වෙලා. එයාගේ පොත මේසය මත මුණින් අතට හරවා තිබුණා, එයාගේ පුටුව හිස් වෙලා. ඒ කොහොම වුණත්, ප්‍රවේශ ශාලාවේ ඉතිරිය තුවාල ලත් කඳවුරුකරුවන්ගෙන්, දඩයක්කාරියන්ගෙන් සහ සැටර්ලාගෙන් මුළුමනින් ම පිරිලයි තිබුණේ.

සෝපානය ළඟදී අපිට කොනර් සහ ට්‍රැවිස් ස්ටොල් මුණ ගැහුණා.

"ඒක ඇත්ත ද?" කොනර් ඇහුවා. "සිලේනා ගැන ආරංචිය?"

මම ඔළුව වැනුවා. "එයා වීරයෙක් වගේ මැරුණා."

ට්‍රැවිස් අපහසුවෙන් එහා මෙහා වුණා. "ම්, මට තව ආරංචියක් ආවා-"

"එච්චරයි," මම තදින් කිවුවා. "ඒ කතාව ඉවරයි."

"හරි," ට්‍රැවිස් කෙඳිරුවා. "අහන්න, අපි හිතන්නෙ ටයිටන් හමුදාවට සෝපානෙන් උඩට එන්න කරදර වෙයි. එයාලට වරකට කීප දෙනා ගාණේ තමයි යන්න වෙන්නේ. ඒ වගේම යෝධයින්ට කොහොමත් ම ඒක ඇතුළට යන්න බැරි වෙයි."

"ඒක තමයි අපිට තියෙන ලොකු ම වාසිය," මම කිවුවා. "සෝපානේ අක්‍රිය කරන්න මොකක්හරි ක්‍රමයක් තියෙනව ද?"

"ඒක මැජික්වලින් වැඩ කරන්නේ," ට්‍රැවිස් කිවුවා. "වෙනදට නම් ඔයාට ඒකට කී කාඩ් එකක් ඕනෑ වෙනවා, ඒත් දැන් දොරටු පාලකයා අතුරුදහන් වෙලා නේ. ඒ කියන්නේ රැකවල් කඩා වැටෙනවා. දැන් ඕනෑ ම කෙනෙක්ට සෝපානෙට ගොඩ වෙලා කෙලින් ම උඩට යන්න පුළුවන්."

"එහෙනම් අපිට උන්ව දොරටුවලින් ඈත් කරලා තියාගන්න වෙනවා," මම කිවුවා.

Scanned with CamScanner

"අපි ලොබියෙදි උන්ව මැඩ පවත්වමු."

"අපිට තව උදවු ඕනෑ," ට්‍රැවිස් කිව්වා. "උන් දිගින් දිගට ම එනවා. අන්තිමේ දී උන් කොහොමහරි අපිව යට කරලා දායි."

"අපිට ආයේ උදවු එන්නෙ නැහැ," කොනර් මැසිවිලි නැගුවා.

මම පිටත සිටි මිසිස් ඕ'ලෙරී දිහා බැලුවා. එයා හිටියේ වීදුරු දොරවල් මතට හති දමමින්, ඒවා යම බලු කෙළවලින් තාවමිනුයි.

"සමහරවිට ඒක ඇත්ත නොවෙන්නත් පුළුවන්," මම කිව්වා.

මම එළියට ගිහින් මිසිස් ඕ'ලෙරීගේ හොම්බ උඩින් අතක් තැබුවා. කයිරොන් එයාගේ කකුලට වෙළුම් දමා තිබුණත්, එයා තවමත් නොණ්ඩි ගැහුවා. එයාගේ ලොම් මඩ, කොළරොඩු, පීසා කෑලි සහ වියළුණු රාක්ෂ ලේවලින් එකට ඇලිලා තිබුණා.

"හේයි, කෙල්ලේ." මම උද්‍යෝගිමත් හඬින් කතා කරන්න උත්සාහ කළා. "ඔයාට මහන්සියි කියලා මං දන්නවා, ඒත් මට ඔයාගෙන් තව එක ලොකු උදවුවක් ඉල්ලන්න තියෙනවා."

මම එයා වෙතට නැමිලා එයාගේ කනට රහසක් කිව්වා.

★★★

මිසිස් ඕ'ලෙරී හෙවණැලි-ගමනින් යන්න ගියාට පස්සේ මම ප්‍රවේශ ශාලාවේ හිටපු ඇනබෙත්ට ආපහු එකතු වුණා. සෝපානයට යන මඟ දී, ග්‍රෝවර් තුවාල ලැබූ මහත සැටර් කෙනෙක් අසල දණ ගසාගෙන ඉන්නවා අපිට දකින්න ලැබුණා.

"ලෙනෙයස්!" මම කිව්වා.

නාකි සැටර්ගේ පෙනුම දරුණු වුණා. එයාගේ තොල් නිල් වෙලා. කැඩුණු හෙල්ලයක් එයාගේ බඩ මැදින් පිට පැනලා. එයාගේ ලොම් පිරුණු එළු කකුල් වේදනාබර ඉරියව්වකින් ඇඹරී තිබුණා.

එයා අපි දිහාවට බැල්ම යොමු කරන්න උත්සාහ කළත්, එයාට ටව පෙනුණා කියලා මං හිතන්නෙ නැහැ.

"ග්‍රෝවර්?" එයා මිමිණුවා.

"මම මෙතැන, ලෙනෙයස්." ලෙනෙයස් එයා ගැන කියලා තිබුණු නපුරු කතා හැමෙකකට ම පස්සෙත්, ග්‍රෝවර්ගේ ඇස්වල කඳුළු පිරිලා තිබුණා.

"අපි... අපි දිනුවා ද?"



"ම්... ඔව්." ග්‍රෝවර් බොරුවක් කිව්වා. "ඔයාට ස්තූති වෙන්න, ලෙනෙයස්. අපි හතුරන්ව එළවලා දැම්මා."

"ඔයාට කිව්වා නේ." නාකි සැටර් මිමිණුවා. "නියම නායකයෙක්. නියම..."

එයා සදහට ම ඇස් පියාගත්තා.

ග්‍රෝවර් ඉකියක් ගිල ගත්තා. ලෙනෙයස්ගේ නළල මත අත තැබූ එයා පෞරාණික ආශිර්වාදයක් මැතිරුවා. නාකි සැටර්ගේ සිරුර දිය වී ගියේ, අන්තිමට එතැන නැවුම් පස් ගොඩකින් පැන නැගුණු පැළයක් පමණක් ඉතිරි කරමින්.

"ලෝරල් පැළයක්," ග්‍රෝවර් කිව්වේ විමතියෙන්. "ඔහ්, වාසනාවන්ත නාකි එළුවා."

එයා පැළය දෝතට ගත්තා. "මම... මම එයාව පැළ කරන්න ඕනෑ. ඔලිම්පස්වල උයනක."

"අපිත් යන්නෙ ඒ පැත්තට තමයි," මම කිව්වා. "එන්න යමු."

සෝපානය ඉහළ නගින අතරේ කනට පහසු සංගීතයක් වාදනය වුණා. මට අවුරුදු දොළහේ දී ඔලිම්පස්වලට මුල් ම වරට ආව ගමන ගැන මට සිහි වුණා. ඒ වතාවේ දී ඇනබෙත් සහ ග්‍රෝවර් මාත් එක්ක හිටියෙ නැහැ. ඒත් දැන් එයාලා මගේ ළඟින් හිඳීම ගැන මම සතුටු වුණා. අපි තුන්දෙනා එක්ව යන අන්තිම වික්‍රමාන්විත ගමන මේක වෙන්නත් පුළුවන් කියලා මගේ හිත කිව්වා.

"පර්සි," ඇනබෙත් හෙමිහිට කතා කළා. "ඔයා ලූක් ගැන කිව්වා හරි." සිලේනා බියුරිගාඩ්ගේ මරණයෙන් පස්සේ එයා කතා කරපු මුල් ම වතාව ඒකයි. එයා මායාවී ලෙස ඉලක්කම් වැටෙනා සෝපානයේ පොළොව මත ම ඇස් රඳවාගෙන හිටියා: 400, 450, 500.

ග්‍රෝවරුයි මමයි බැල්මක් හුවමාරු කරගත්තා.

"ඇනබෙත්," මම කිව්වා. "මට කණගාටුයි-"

"ඔයා මට ඒක කියන්නයි හැදුවේ." එයාගේ කටහඬ වෙවුලුවා. "ලූක් කොහෙත්ම හොඳ කෙනෙක් නෙවෙයි. මට... මට එයා සිලේනාව පාවිච්චි කරපු විදිහ ගැන අහන්න ලැබෙනකල් ම මම එයාව විශ්වාස කරේ නැහැ. දැන් මම දන්නවා. මං හිතන්නේ ඔයාට දැන් සතුටු ඇති."

"ඒකෙන් මට ඇති සතුටක් නැහැ."

සෝපාන බිත්තියට ඔළුව හේත්තු කරගත් එයා මගේ ඇස් මඟ ඇරියා.

ග්‍රෝවර් එයාගේ අතේ තිබුණ ලෝරල් පැළය නැලෙව්වා. "හොඳයි... ආයෙමත් මෙහෙම එකට ඉන්න ලැබුණට සතුටුයි. රණ්ඩු වෙවී. මැරෙන්න ඔන්න-මෙන්න වැටිලා. පණ බයේ ගැහි ගැහී. ඔන්, බලන්න. අපේ තට්ටුවට ඇවිල්ලා."

'ඩින්ග් ' හඬ නගමින් විවර වූ දොර තුළින් අපි ගුවන් අඩි පාරට පිය මැන්නා.

ඔලිම්පස් කන්ද විස්තර කරන්න සාමාන්‍යයෙන් 'පීඩාකාරී' කියන වචනේ පාවිච්චි නොවුණත්, දැන් නම් එය පෙනුණේ ඒ වගෙයි. ගිනි අඟුරු බඳුන් එකකවත් ගිනි දැල්වුණේ නැහැ. මහල්වල ජනේල අඳුරු වෙලා. වීදි පාළුවට ගිහින්, මැඳුරුවල දොරවල් අගුළු දමලා. චලනයන් දකින්න ලැබුණු එක ම තැන වුණේ තාවකාලික රෝහල් පිහිටුවා තිබූ උයන්වල විතරයි. විල් සෝලේස් සහ අනෙක් ඇපලෝ කඳවුරුකරුවෝ එහා මෙහා යමින්, තුවාල ලැබූ අයට සාත්තු කළා. ජල දේවතාවන් සහ වන දේවතාවන් එයාලගේ සොබාදහමේ මායා ගීත පාවිච්චි කර පිළිස්සුම් හා විෂවලට ප්‍රතිකාර කරමින්, උදවු දුන්නා.

ග්‍රෝවර් ලෝරල් පැළය පැළ කරන අතරේ, ඇනබෙත් සහ මම වටේ යමින් තුවාල ලැබූ අයව දිරිමත් කරන්න උත්සාහ කළා. කකුලක් කැඩුණු සැටර් කෙනෙක්ව, හිසේ සිට පාදාන්තය දක්වා වෙළුම් යෙදූ උප දෙවියෙක්ව සහ ඇපලෝ කැබිනයේ රන්වන් ආදාහන සළුවකින් වැසූ සිරුරක් පසු කර මම ගියා. ඒක යට හිටියේ කවුද කියලා මම දැනගෙන හිටියේ නැහැ. මට දැනගන්න ඕනෑ වුණෙත් නැහැ.

මගේ හදවත ඊයම් බරුවකට හැරිලා වගේ මට දැනුණා, ඒත් අපි එයාලට කියන්න සුභවාදී දේවල් හොයාගන්න උත්සාහ කළා.

"ඉක්මනට ම ඔයාට ආපහු නැඟිටලා ටයිටන්ලා එක්ක සටන් කරන්න ලැබෙයි!" මම එක කඳවුරුකරුවෙකුට කිවුවා.

"ඔයාගේ පෙනුම නියමයි නේ," ඇනබෙත් තවත් කඳවුරුකරුවෙකුට කිවුවා.

"ලෙනෙයස් පඳුරකට හැරුණා!" ග්‍රෝවර් කෙඳිරිගාන සැටර් කෙනෙකුට කිවුවා.



ඩයනයිසියස්ගේ පුතා පොලක්ස්ව ගහකට හේත්තු කර සිටිද්දි මම හොයාගත්තා. එයාගේ අතක් කැඩිලා තිබුණත්, ඒ ඇරෙන්න එයා හොඳින් හිටියා.

"මට තාමත් අනිත් අතින් සටන් කරන්න පුළුවන්," එයා කිවුවේ දත්මිටි කමින්.

"නෑ," මම කිවුවා. "ඔයා දැනටමත් කරපුවා හොඳටෝම ඇති. ඔයා මෙහෙ ඉඳලා තුවාල වෙච්ච අයට උදවු කරන්න ඕනෑ."

"ඒත්-"

"පරිස්සම් වෙනවා කියලා මට පොරොන්දු වෙන්න," මම කිවුවා. "හරි ද? ඒක පෞද්ගලික උදවුවක්."

එයා අඩමානයෙන් රවාගත්තා. අපි කොහොමත් හොඳ යාළුවෝ වෙලා හිටපු අය නෙවෙයි, ඒත් මේක එයාගේ තාත්තගෙ ඉල්ලීමක් කියලා මම එයාට කියන්න ගියේ නැහැ. ඒකෙන් වෙන්නේ එයාව ලැජ්ජාවට පත්වෙන එක විතරයි. අන්තිමේ දී එයා පොරොන්දු වුණා. ඊට පස්සේ එයා ආපහු වාඩි වුණේ යම්කිසි සහනයකින් බව මට තේරුණා.

ඇනබෙත්, ග්‍රෝවර් සහ මම දිගට ම මාලිගාව දෙසට ගියා. ක්‍රෝනොස් යන්න බලාපොරොත්තු වෙන්නෙත් එතැනටයි. එයා සෝපානයෙන් ඉහළට ආව හැටියේ ම- එයා ඒක හොඳින් හෝ නරකින් කරනවා කියලා මට කිසිම සැකයක් තිබුණේ නැහැ- එයා දෙවිවරුන්ගේ බලයේ කේන්ද්‍රය වුණු සිංහාසන ශාලාව විනාශ කර දමාවි.

ලෝකඩ දොරවල් හඬ නගමින් ඇරුණා. අපේ පියවර හඬ කිරි ගරුඬ පොළොව මත දෝංකාර දුන්නා. මහ ශාලාවේ සිවිලිම මත තරු රටා උදාසීන ලෙස බැබළුණා. උඳුනේ ගින්න මලානික රතු දීප්තියකට හැරී තිබුණා. එය අද්දර හෙස්ටියා දුඹුරු පාට ලෝගුවකින් සැරසුණු පුංචි ගෑනු ළමයෙකුගේ ස්වරූපයෙන් වෙවුලමින් සිටියා. ඔෆියොටෝරස් එයාගේ ජල ගෝලය ඇතුළේ දුක්බරව එහා මෙහා පීනුවා. මාව දැක්කා ම එයා උදාසීන "උම්බෑ" හඬක් නැගුවා.

ගිනි උඳුනේ එළිය වැටී සිංහාසනවලින් හට ගත් දුෂ්ට-පෙනුමැති හෙවණැලි පෙනුණේ ඩැහැ ගන්න යමක් හොයන අත් වගෙයි.

Scanned with CamScanner

සියුස්ගේ සිංහාසනය පාමුල සිටගෙන, ඉහළින් පායා ඇති තරු දිහා බලමින් සිටියේ රේචල් එලිසබෙත් ඩෙයාර්. එයා ග්‍රීක පිඟන් මැටි පෝච්චියක් අතේ තබාගෙන සිටියා.

"රේචල්?" මම කතා කළා. "මේ, ඔයා මොනවද ඕක තියාගෙන ඉන්නේ?"

එයා මගේ දිහා බැලුවේ හීනෙකින් ඇහැරෙනවා වගෙයි. "මං ඒක හොයාගත්තා. මේ පැන්ඩෝරාගේ බරණිය, නේද?"

එයාගේ දෑස් වෙනදාට වඩා දීප්තිමත් වෙලා තියෙනවා දකිද්දි, එක්වර ම මගේ මතකයට එන්න ගත්තේ පිළුණු වූ සැන්ඩ්විච් සහ කර වුණු විස්කෝතු.

"අනේ ඔය බරණිය බිමින් තියන්න," මම කිව්වා.

"මේක ඇතුළේ බලාපොරොත්තුව තියෙනවා මට පේනවා." රේචල් එහි පිඟන් මැටි මෝස්තරය මතින් ඇඟිලි දිවෙව්වා. "ලේසියෙන් ම බිඳෙනසුලුයි."

"රේචල්."

මගේ හඬ එයාව ආපහු පියවි සිහියට ඇදලා ගත්තා වගෙයි පෙනුණේ. එයා බරණිය දිගු කළා ම මම එය ගත්තා. බරණියේ මැටි අයිස් තරම් සීතලට දැනුණා.

"ග්‍රෝවර්," ඇනබෙත් මිමිණුවා. "අපි මාලිගාව වටේ ඔත්තු බලමු. සමහරවිට අපිට තව ග්‍රීක ගින්දර ටිකක් හරි, හෙෆාස්ටස්ගේ උගුල් ටිකක් හරි හොයාගන්න පුළුවන් වෙයි."

"ඒත්-"

ඇනබෙත් එයාට වැළමිටෙන් ඇන්නා.

"හරි!" එයා වේදනාවෙන් කෑගැහුවා. "මං උගුල්වලට හරි ආසයි!"

ඇනබෙත් එයාව සිංහාසන ශාලාවෙන් පිටතට ඇදගෙන ගියා.

හෙස්ටියා ගින්න අසල ලෝගුව පොරවාගෙන ඉදිරියටත් පසුපසටත් පැද්දෙමින් හිටියා.

"මෙහෙ එන්න," මම රේචල්ට කතා කළා. "ඔයාව කෙනෙක්ට මුණ ගස්සන්න ඕනෑ."

අපි දෙවඟන අසලින් වාඩිවුණා.



"හෙස්ටියා උත්තමාවිය," මම කතා කළා.

"හලෝ, පර්සි ජැක්සන්," දෙවඟන මිමිණුවා. "සීතල වැඩි වෙනවා. ගින්න පවත්වගෙන යන්න අමාරුයි."

"මම දන්නවා," මම කිව්වා. "ටයිටන්ලා ළඟට ම ඇවිල්ලා."

හෙස්ටියා රේචල් දිහා බැලුවා. "හලෝ, මගෙ කෙල්ලේ. අන්තිමේ දී ඔයා අපේ ගෙදරට ආවා."

රේචල් තදින් ඇහි පිය ගැහුවා. "ඔයා මාව බලාපොරොත්තුවෙන් ද හිටියේ?"

හෙස්ටියා දෑත් ඉදිරියට දිගු කළා ම, ගිනි අඟුරු දිලිසෙන්න ගත්තා. ගින්න තුළින් මට රූප පෙනුණා: මගේ අම්මා, පෝල් සහ මම මුළුතැන්ගෙයි මේසයට වාඩි වෙලා තුති පිදීමේ දේව මෙහෙය දවසේ රාත්‍රී භෝජනය ගන්නවා; මගේ යාළුවෝ සහ මම අර්ධ-ලෝහිත කඳවුරේ ගිනි මැලය වටේ ඉඳගෙන සිංදු කියමින් මාෂ්මෙලෝස් කර කරනවා; රේචල් සහ මම පෝල්ගේ ප්‍රියස් රථය වෙරළ දිගේ පදවාගෙන යනවා.

රේචල්ටත් පෙනුණේ ඒ රූප ම ද කියලා මම දන්නෙ නැහැ, ඒත් එයාගේ උරහිස්වල තිබූ ආතතිය පහ වුණා. ගින්නේ උණුසුම එයා හරහා පැතිරෙනවා වගෙයි පෙනුණේ.

"ගිනි උඳුන ළඟ ඔයාගේ තැනට උරුමකම් කියන්න නම්," හෙස්ටියා එයාට කිව්වා. "ඔයා ඔයාගේ හිත වික්ෂිප්ත කරන දේවල් අතෑරලා දාන්න ඕනෑ. ඔයාට නොනැසී පවතින්න පුළුවන් එක ම ක්‍රමය ඒක විතරයි."

රේචල් ඔළුව වැනුවා. "මට... මට තේරුණා."

"පොඩ්ඩක් ඉන්න," මම කිව්වා. "එයා මොනවා ගැන ද කියන්නේ?"

රේචල් සැලෙන හුස්මක් ගත්තා. "පර්සි, මම මෙහෙට එද්දි... මං හිතුවේ මම ඔයා වෙනුවෙන් එනවා කියලා. ඒත් එහෙම නෙවෙයි. ඔයයි මමයි...." එයා ඔළුව හෙල්ලුවා.

"පොඩ්ඩක් ඉන්න. එතකොට දැන් මම ඔයාගේ හිත වික්ෂිප්ත කරන දෙයක් ද? මේක මේ 'වීරයා මම නෙවෙයි' කතාව නිසා ද?"

"මට මේක වචනවලින් තේරුම් කරන්න පුළුවන් වෙයි ද කියලා මට විශ්වාස නැහැ," එයා කිව්වා. "මම ඔයාට ආකර්ෂණය

වුණේ... මේ හැමදේකට ම මට දොර ඇරලා දුන්නෙ ඔයා නිසයි." එයා සිංහාසන ශාලාව පෙන්වමින් කිවුවා. "මට මගේ සැබෑ දෘෂ්ටිය තේරුම් ගන්න ඕනෑ වුණා. ඒත් ඔයයි මමයි, ඒකේ කොටසක් නෙවෙයි. අපේ ඉරණම් එකට බැඳිලා නැහැ. මං හිතන්නෙ, ඔයාගේ යටි හිතත් ඒක හැම වෙලාවෙ ම දැනගෙන හිටියා."

මම එයා දිහා බලාගෙන හිටියා. සමහරවිට, කෙල්ලෝ සම්බන්ධයෙන් මේ ලෝකෙ ඉන්න බුද්ධිමත් ම කොල්ලා මම නොවෙන්න පුළුවන්, ඒත් රේචල් මේ දැන් මට බූට් තිබ්බා කියලා නම් මට සහතික වුණා. ඒක මහ තෝණ්ඩියක් කියලා මට හිතුණේ අපි දෙන්නා කවදාවත් යාළුවෙලා හිටියෙත් නැති නිසයි.

"ඉතින්... මොකද," මම කිවුවා. "'මාව ඔලිම්පස්වලට අරන් ආවට ස්තුතියි. පස්සෙ හම්බවෙමු.' ඒක ද ඔයා කියන්න හදන්නේ?"

රේචල් ගින්න දිහා බලා සිටියා.

"පර්සි ජැක්සන්," හෙස්ටියා කතා කළා. "රේචල්, එයාට කියන්න පුළුවන් හැමදෙයක් ම ඔයාට කියලයි තියෙන්නේ. එයාගේ කාලය ළඟ එනවා, ඒත් ඔයාගේ තීරණය ඊටත් වඩා ඉක්මනින් ළං වෙනවා. ඔයා ඒකට සූදානම් වෙලා ද ඉන්නේ?"

නැහැ, මම ඒකට සූදානම් වෙන්න හිතලවත් නැහැ, කියලා දුක් ගැනවිලි කියන්නයි මට ඕනෑ වුණේ.

පැන්ඩෝරාගේ බරණිය දිහා බැලුව මට පළවෙනි වතාවට ඒක විවර කරන්න පෙලඹවීමක් ඇති වුණා. මේ වෙලාවේ මට දැනුණේ බලාපොරොත්තුව කියන්නෙ මහ වැඩකට නැති දෙයක් වගෙයි. මගේ යාළුවන්ගෙන් ගොඩක් මියැදිලා. රේචල් මාව අත ඇරලා දැම්මා. ඇනබෙත් මාත් එක්ක තරහා වෙලා. රාක්ෂ හමුදාවක් ගොඩනැගිල්ල වටලාගෙන ඉන්න අස්සෙ මගේ දෙමව්පියෝ පාරේ කොතැනදෝ නින්දට වැටිලා. ඔලිම්පස් පරාද වෙන්න අත ළඟයි. ඒ වගේ ම දෙවිවරු කරලා තියෙන කෲර දේවල් ගොඩක් මට දකින්න ලැබී තිබුණා: සියුස් මරියා ඩි ආන්ජෙලෝව විනාශ කරපු හැටි, අවසන් ඔරකල්ට හේඩීස් ශාප කළ හැටි, හර්මීස් තමන්ගේ පුතා දුෂ්ට අතට හැරෙන බව දැන දැන ම ලූක්ට පිටු පෑ හැටි.

යටත් වෙන්න, ප්‍රොමීතියස්ගේ හඬ මගේ කනට මිමිණුවා. එහෙම නැති වුණොත් ඔයාගේ ගෙදර විනාශ වෙලා යයි. ඔයාගේ වටිනා කියන කඳවුර පිච්චිලා අළු වෙලා යයි.



ඒ වෙලාවේ මම හෙස්ටියා දිහා බැලුවා. එයාගේ රතු පාට ඇස් උණුසුම් ලෙස බැබළුණා. එයාගේ ගිනි උඳුන තුළින් මට දකින්න ලැබුණු රූප මට සිහි වුණා- යාළුවෝ සහ පවුලේ අය, මම ආදරය කරන හැමදෙනාම.

ක්‍රිස් රොඩ්‍රිගස් කියපු දෙයක් මට මතක් වුණා: ඔයාලා ඔක්කොම මැරිලා ගියොත්, කඳවුර ආරක්ෂා කරගෙන ඉන්න එකේ තේරුමක් නැහැ. අපේ යාළුවෝ ඔක්කොම මෙතැන නේ. ඒ වගේම තිකෝ, එයාගේ තාත්තා, හේඩීස් ළඟ නැගී සිටි විදිහ: ඔලිම්පස් පැරදුනොත්, එයා කිවුවා, ඔයාගේ මාලිගාව විතරක් පරිස්සම් වුණා කියලා වැඩක් වෙන්නෙ නෑ.

මට පියවර හඬක් ඇහුණා. සිංහාසන ශාලාව තුළට ආපහු ආව ඇනබෙත් සහ ග්‍රෝවර් අපිව දැකලා නැවතුණා. මට හිතෙන්නෙ ඒ වෙලාවේ මගේ මුහුණේ සෑහෙන අමුතු බැල්මක් තියෙන්න ඇති.

"පර්සි?" ඇනබෙත්ගේ හඬේ තවදුරටත් තරහවක් තිබුණේ නැහැ- තිබුණේ සැලකිල්ලක් විතරයි. "අපි ආපහු, මේ, එළියට යන්න ද?"

එක්වර ම මට දැනුණේ කවුරුහරි මට වානේ එන්නත් කළා වගෙයි. කළ යුතු දේ මට තේරුණා.

මම රේචල් දිහා බැලුවා. "ඔයා මෝඩ වැඩ මුකුත් කරන්න යන්නෙ නැහැ නේද? මං කිවුවේ... ඔයා කයිරොන් එක්ක කතා කළා නේ, නේද?"

එයා යාන්තමින් හිනාවක් මතු කරගත්තා. "ඔයා වද වෙන්නේ මම මොකක් හරි මෝඩ වැඩක් කරයි කියල ද?"

"ඒත් මං කිවුවේ... ඔයාට ප්‍රශ්නයක් නැති වෙයි නේ?"

"මං දන්නෙ නෑ," එයා ඇත්ත ම කිවුවා. "ඒක රැඳිලා තියෙන්නෙ ඔයා ලෝකේ බේරගන්නව ද කියන එක උඩ, වීරයෝ."

මම පැන්ඩෝරාගේ බරණිය අතට ගත්තා. එය තුළ බලාපොරොත්තුවේ ආධ්‍යාත්මය තටු සලමින්, සීතල බඳුන උණුසුම් කරන්න උත්සාහ ගනිමින් සිටියා.

"හෙස්ටියා," මම කිවුවා, "මම මේක ඔයාට පූජා කරනවා."

Scanned with CamScanner

දෙවඟන ඔළුව පැත්තකට ඇල කරා. "මම තමයි දෙවිවරුන්ගෙන් පොඩි ම කෙනා. මේක සම්බන්ධයෙන් ඔයා මාව විශ්වාස කරන්නෙ ඇයි?"

"ඔයා තමයි අන්තිම ඔලිම්පියානුවා," මම කිවුවා. "ඒ වගේම වඩාත් ම වැදගත් කෙනා."

"ඒ ඇයි, පර්සි ජැක්සන්?"

"මොකද, බලාපොරොත්තුව හොඳින් ම නොනැසී පවතින්නේ ගෙදරදි," මම කිවුවා. "ඒක මං වෙනුවෙන් ආරක්ෂා කරන්න. එතකොට මම ආයෙමත් ඒක අත ඇරලා දාන්න පෙලඹෙන්නෙ නැති වෙයි."

දෙවඟන හිනා වුණා. එයා බරණිය අතට ගත්තා ම ඒක දිලිසෙන්න පටන් ගත්තා. උඳුනේ ගින්න පෙරට වඩා ටිකක් දීප්තිමත් ව ඇවිලෙන්න ගත්තා.

"බොහොම හොඳයි, පර්සි ජැක්සන්," එයා කිවුවා. "දෙවිවරුන්ගේ ආශිර්වාදය ඔයාට ලැබේවා."

"අපිට ඒක හොයාගන්න ලැබෙයි." මම ඇනබෙත් සහ ග්‍රෝවර් දිහා බැලුවා. "එනනකෝ යමු."

අපි මගේ තාත්තාගේ සිංහාසනය ළඟට ගමනේ ගියා.

★★★

පොසෙයිඩන්ගේ අසුන සියුස්ගේ අසුන ළඟින් ම දකුණු පසින් පිහිටා තිබුණත්, ඒකට අර තරම් ගරු ගාම්භීර පෙනුමක් තිබුණේ නැහැ. එහි පදම් කළ කළු ලෙදර් අසුන බමර පාදස්ථලයකට සවි කර තිබුණා. එහි එක් පසෙක යකඩ මුදු දෙකක් සවි කර තිබුණේ බිලී පිත්තක් (එහෙමත් නැත්නම් ත්‍රිශූලයක්) රුඳවිය හැකි වෙන්නයි. සරලව කියනවා නම් එයට තිබුණේ ගැඹුරු මුහුදේ යාත්‍රා කරන බෝට්ටුවක ඇති පුටුවක් වගෙයි.

දෙවිවරු සොභාවික තත්ත්වයේ ඉන්නකොට අඩි විස්සක් විතර උසයි. ඒ නිසා අත් දෙක උඩට ඉස්සුවාමත් මට ළඟා වෙන්න පුළුවන් වුණේ යාන්තමින් අසුනේ දාරයට විතරයි.

"මාව උස්සන්න," මම ඇනබෙත්ටයි ග්‍රෝවර්ටයි කිවුවා.

"ඔයාට පිස්සු ද?" ඇනබෙත් කිවුවා.

"ඒ වගේ," මම පිළිගත්තා.



"පර්සි," ග්‍රෝවර් කතා කළා, "තමන්ගේ සිංහාසනේ වෙන අය වාඩි වෙනවට දෙවිගොල්ලෝ කොහෙත්ම කැමති නැහැ. මං කියන්නේ, ඒක ඔයාව අළු ගොඩකට හරවන්න තරම් අකමැත්තක්."

"මට එයාගේ අවධානේ ගන්න ඕනෑ," මම කිවුවා. "මේක තමයි එක ම ක්‍රමේ."

ඒ දෙන්නා නොසන්සුන් බැල්මක් හුවමාරු කරගත්තා.

"හොඳයි," ඇනබෙත් කිවුවා, "මේකෙන් නම් එයාගේ අවධානේ හම්බ වෙයි."

ඒ දෙන්නා එකිනෙකාගේ දෑත් බැඳගෙන ඉණි පෙත්තක් හදලා, මාව සිංහාසනය මතට ඉස්සුවා. මගේ දෙපතුල් පොළොවෙන් ඒ තරම් ඉහළින් තියෙද්දී මට දැනුණේ චූටි බබෙක් වගෙයි. වටේට තිබුණ අනෙක් අඳුරු, හිස් සිංහාසන දිහා බැලූ මට ඔලිම්පියානු මන්ත්‍රණ සභාවක වාඩි වී සිටීම මොන වගේ ඇති ද මවාගන්න අපහසු වුණේ නැහැ- අති විශාල බලයක් තිබුණත්, තමන්ට උවමනා දේ කරගන්න උත්සාහ කරන තවත් දෙවිවරු එකොළොස් දෙනෙක් සමඟ නිතර ම වාද කරමින් ඉන්න හැටි. එතැන දී මානසිකව උමතු වෙන්න, විශේෂයෙන් ම මම පොසෙයිඩන් වුණා නම් මං කැමති දේවල් ගැන විතරක් වග බලාගන්න කෙනෙක් වෙන්න ඒ හැටි අපහසු නැහැ. පොසෙයිඩන් සිංහාසනයේ වාඩි වී සිටිද්දී මට දැනුනේ මුළු මහත් සමුද්‍ර ම- බලයෙන් සහ අබිරහස්වලින් කැළඹෙන, අපරිමාණ ඝන සැතපුම් ගණනක සාගරය ම මගේ අණසක යටතේ තියෙනවා වගෙයි. පොසෙයිඩන් වෙන කවුරුවත් කියන දේ අහන්නේ මොකටද? එයා දොළොස් දෙනාගෙන් ප්‍රධාන ම කෙනා නොවෙන්නේ මොකද?

ඊට පස්සේ මම ඔළුව තදින් හෙල්ලුවා. හිත ඒකාග්‍ර කරගන්න.

සිංහාසනය ගිගුරුවා. කෝපයෙන් පිරුණු තරංගයක් සැඩ සුළඟක බලයෙන් මගේ හිතේ වැදුණාඃ

මොන ජගත ද-

කටහඬ හිටි හැටියේ ම නැවතුණා. කෝපය පසු බා ගියා. ඒක නම් හොඳ දෙයක් වුණේ අර වචන දෙකට විතරක් මගේ හිත කෑලිවලට පුපුරා යන්න ඔන්න-මෙන්න ආව නිසයි.

පර්සි. මගේ තාත්තාගේ කටහඬේ තවමත් කේන්තියක් තිබුණත්, දැන් ඒක පාලනය කරගෙනයි හිටියේ. ඇත්තට ම- මොනවද- ඔයා මගේ සිංහාසනේ උඩ කරන්නේ?

Scanned with CamScanner

"මට සමා වෙන්න, තාත්තේ," මම කිව්වා. "මට ඔයාගේ අවධානේ ගන්නයි ඕනෑ වුණේ."

''මේක බොහොම අනතුරුදායක වැඩක්. ඔයාට වුණත්. මම පුපුරවලා දාන්න කලින් බැලුවෙ නැත්නම්, මෙලහකටත් ඔයා මුහුදු වතුර කඩිත්තක් වෙලා.''

"මට සමා වෙන්න," මම ආයෙමත් කිව්වා. "අහන්න, මෙහෙ හැමදෙයක් ම අවුල් වෙලා තියෙන්නේ."

සිදුවෙමින් පවතින දේවල් මම එයාට විස්තර කළා. ඊට පස්සේ මම එයාට මගේ සැලසුම පැහැදිලි කරා.

සෑහෙන වෙලාවක් යන තුරු එයාගේ කටහඬ නිහඬව තිබුණා.

පර්සි, ඔයා ඉල්ලන්නේ කොහෙත්ම කරන්න බැරි දෙයක්. මගේ මාලිගාව-

"තාත්තේ, ක්‍රෝනොස් ඔයාට විරුද්ධව වෙන ම හමුදාවක් එවුවේ ඕනෑකමින්මයි. එයාට ඔයාව අනිත් දෙවිවරුන්ගෙන් වෙන් කරන්න ඕනෑ වුණේ ඔයාට මේ මුළු යුද්ධය ම අනිත් පැත්තට හරවන්න පුළුවන් කියලා එයා හොඳටම දන්න නිසයි."

''ඒත් එහෙම වුණොත්, එයා මගේ ගෙදරට පහර දෙයි.''

"මම මේ ඉන්නෙ ඔයාගේ ගෙදර තමයි," මම කිව්වා. "ඔලිම්පස්වල."

පොළොව දෙදුරුවා. කෝප රැල්ලකින් මගේ හිත ම වැහිලා ගියා. මම ඕනෑවටත් වඩා දුර ගියා ද කියලා මට හිතුණා, ඒත් ටිකකින් දෙදිරීම අඩු වී ගියා. මගේ මනෝමය සම්බන්ධයට පසුබිමින්, මට දිය යට පිපුරුම් හඬවල් සහ රණ ඝෝෂාවන් ඇසුණාඃ සයික්ලොප්ස්ලාගේ මොර ගැසීම් සහ කිඳුරන්ගේ කෑගැසීම්.

"ටයිසන් හොඳින් ද?" මම ඇහුවා.

ඒ ප්‍රශ්නයෙන් මගේ තාත්තා පුදුම වුණා වගෙයි. ''එයා හොඳින්. මං හිතුවට වඩා ගොඩක් හොඳට වැඩේ කරගෙන යනවා. හැබැයි "පීනට් බටර්" කියන එක නම් ටිකක් අමුතු රණ ඝෝෂාවක් නේද?''

"ඔයා එයාට සටන් කරන්න ඉඩ දුන්න ද?"



''මාතෘකාව වෙනස් කරන්න එපා! ඔයා මට කරන්න කියන්නෙ මොකක්ද කියලා ඔයාට ම තේරෙනව ද? මගේ මාලිගාව ම විනාශ වෙලා යයි.''

"ඒත් ඔලිම්පස් බේරෙයි."

''මේ මාලිගාව අලුතෙන් හදන්න මට කොච්චර කාලයක් ගියා ද කියලා ඔයා දන්නව ද? ක්‍රීඩා කාමරය හදන්න විතරක් අවුරුදු හයසීයක් ගියා.''

"තාත්තේ-"

''හරි එහෙනම්! ඔයා කියන විදිහක්. හැබැයි මගෙ පුතේ, මේක හරියන්න කියලා යාඥා කරොත් හොඳයි.''

"මම මේ යාඥා කරනවා නේන්නම්. මම ඔයාට කතා කරකර නේ ඉන්නේ?"

''ඔහ්... ඔව්. හොඳ පොයින්ට් එකක්. ඇම්ෆිට්‍රයිට් - ඔන්න එනවා!''

අති විශාල පිපුරුමක හඬින් අපේ සම්බන්ධය බිඳී ගියා.

මම සිංහාසනය මතින් බිමට ලිස්සා ගියා.

ග්‍රෝවර් මගේ දිහා බලන් හිටියේ බයෙන් වගෙයි. "ඔයා හොඳින් ද? ඔයාව සුදුමැලි වෙලා, ඊට පස්සේ... දුම් දාන්න පටන් ගත්තා."

"එහෙම නෑ!" ඊට පස්සෙ මම මගේ අත් දෙක දිහා බැලුවා. මගේ කමිස අත්වලින් හුමාලය ඉහළ නගිමින් තිබුණා. මගේ අත්වල රෝම පිළිස්සිලා.

"ඔයා තව ටික වෙලාවක් හරි ඒකෙ ඉඳගෙන හිටියා නම්," ඇනබෙත් කිව්වා, "ඔයාව හිටිවන ම අළුවෙලා යනවා. මං හිතන්නෙ, ඔයා කරපු කතාබහ ඒ තරම් වටිනවා ඇති?"

''උම්බෑෑෑ,'' ජල ගෝලයේ සිටි ඔෆියොටෝරස් කිව්වා.

"අපිට ඉක්මනට ම ඒක දැනගන්න ලැබෙයි," මම කිව්වා.

එතකොට ම සිංහාසන ශාලාවේ දොර පියන් වේගයෙන් ඇරුණා. තාලියා ගමනේ ආවා. එයාගේ දුන්න දෙකට කැඩිලා, හී කොපුව හිස්වෙලයි තිබුණේ.

Scanned with CamScanner

"ඔයාලට පහළට එන්න වෙනවා," එයා අපිට කිවුවා. "හතුරෝ ඉස්සරහට ම එනවා. උන්ව මෙහෙයවන්නෙ ක්‍රෝනොස්."

## 18

## මගේ දෙමව්පියන්ගේ කමාන්ඩෝ මෙහෙයුම

## අපි වීදියට එද්දි පරක්කු වැඩියි.

කඳවුරුකරුවෝ සහ දඩයක්කාරියන් තුවාල ලබා තැන තැන වැටිලා. ක්ලැරිස් හයිපර්බෝරියානු යෝධයෙකුට විරුද්ධව කළ සටනකින් පැරදී ඇති බව පෙනුණේ එයා එයාගේ කරත්තය සමඟ අයිස් කුට්ටියක් ඇතුළේ ගල් ගැසී හිටපු නිසයි. නරාශ්වයෝ පේන මානෙක හිටියේ නැහැ. එක්කෝ එයාලා කුලප්පු වෙලා පැනලා යන්න ඇති, එහෙම නැත්නම් එයාලව විනාශ වෙන්න ඇති.

ටයිටන් හමුදාව දොරටුවලට අඩි විස්සක් විතර එපිටින් ගොඩනැගිල්ල වට කර සිටගෙන සිටියා. එහි පෙරමුණ ගෙන සිටියේ ක්‍රෝනොස්ගේ පෙරටු බල ඇණියයිඃ ඊතන් නකමුරා, කොළ පාට සන්නාහයකින් සැරසුණු ඩ්‍රැකනෙයි රැජින සහ හයිපර්බෝරියානුවෝ දෙන්නෙක්. ප්‍රොමීතියස් පේන්න හිටියෙ නැහැ. මට හිතෙන්නේ ඒ ජරා සතා එයාලගේ මූලස්ථානයේ හැංගිලා ඉන්න ඇති. ඒත් ක්‍රෝනොස් නම් එයාගේ දෑකැත්ත අතකින් දරාගෙන ඉදිරියෙන් ම සිටගෙන සිටියා.

එයාගේ මඟ අවහිර කරමින් සිටි එක ම කෙනා වුණේ...

"කයිරොන්," ඇනබෙත් කියද්දී එයාගේ කටහඬ වෙවුලුවා.

කයිරොන්ට අපිව ඇහුණත්, එයා පිළිතුරු දුන්නෙ නැහැ. දුන්නට ඊතලයක් අමුණාගෙන සිටි එයා එය එක එල්ලේ ක්‍රෝනොස්ගේ මුහුණට මානාගෙන සිටියා.

මාව දැකපු හැටියේ ක්‍රෝනොස්ගේ රන්වන් ඇස් ඇවිළුණා. මගේ ඇඟේ සෑම පේශියක් ම ගල් ගැසුණා. ඊට පස්සේ ටයිටන් රජා එයාගේ අවධානය නැවතත් කයිරොන්ට යොමු කළා. "පැත්තකට වෙනවා, චූටි පුතා."

ක්‍රෝනොස් කයිරොන්ට 'පුතා' කියලා කතා කරනවා ඇහෙද්දී මහා අමුත්තක් දැනුණා තමයි, ඒත් ක්‍රෝනොස් එයාගේ කටහඬට පිළිකුලක් එකතු කරගෙන ඒක කිවුවේ හරියට පුතා කියන්නේ එයාට මතක් කරගන්න පුළුවන් නරක ම වචනය වගෙයි.



"අපොයි බැහැ." කයිරොන්ට ඇත්තට ම කේන්ති ගිය වෙලාවට වෙනවා වගේ එයාගේ හඬ දැඩිවෙලා තිබුණා.

මම හෙලවෙන්න උත්සාහ කළත්, මගේ කකුල් කොන්ක්‍රීට් වගෙයි දැනුණේ. ඇනබෙත්, ග්‍රෝවර් සහ තාලියාත් තදින් ඇදෙමින් සිටියේ එයාලවත් ඒ විදිහට ම හිරවෙලා වගෙයි.

"කයිරොන්!" ඇනබෙත් කෑගැසුවා. "ඔන්න බලාගෙන!"

නොයිවසිලිමත් වූ ඩ්‍රැකනෙයි රැජින පහර දෙන්න පැන්නා. කයිරොන්ගේ ඊතලය එයාගේ ඇස් දෙක අතරින් ඉගිලී යද්දී එයාව එතැන ම කුඩු වී ගියේ, එයාගේ හිස් සන්නාහය හඬ නගා ගල් තාර මතට වට්ටමින්.

කයිරොන් තවත් ඊතලයක් ගන්න අත යැවූවත්, එයාගේ හී කොපුව හිස් වෙලා තිබුණා. දුන්න බිම දමූ එයා කඩුව ඇදලා ගත්තා. කඩුවකින් සටන් කරන්න එයා කොහෙත් ම කැමති නැති බව මම දැනගෙන හිටියා. ඒක කිසිම දවසක එයාගේ ප්‍රියතම ආයුදය වුණේ නැහැ.

ක්‍රෝනොස් කෙකර ගෑවා. එයා අඩියක් ඉස්සරහට තබද්දී, කයිරොන්ගේ අශ්ව-අර්ධය කලබලෙන් දඟලුවා. එයාගේ වලිගය දෙපැත්තට වැනුණා.

"නුඹ ගුරුවරයෙක් විතරයි," ක්‍රෝනොස් අවඥාවෙන් කිවුවා. "වීරයෙක් නෙවෙයි."

"ලූක් නම් වීරයෙක් වෙලයි හිටියේ," කයිරොන් කිවුවා. "එයා හොඳ ම කෙනෙක් වෙලයි හිටියේ, ඔහේ එයාව නරක් කරන්න කලින්."

"මෝඩයා!" ක්‍රෝනොස්ගේ හඬින් නගරය හෙල්ලුම් කෑවා. ''නුඹ කරේ බොරු පොරොන්දුවලින් එයාගේ ඔළුව පුරවපු එකයි. නුඹ කිවුවා දෙවිවරු මාව බලාගන්නවා කියලා!"

"මාව," කයිරොන් සැලකිල්ලට හසුවුණා. "ඔයා කිවුවේ මාව කියලා."

ක්‍රෝනොස් ව්‍යාකූල වුණා වගෙයි පෙනුණේ, ඒ මොහොතේ කයිරොන් එයාට පහර දුන්නා. ඇත්තට ම ඒක දක්ෂ උපායක්- බොරු පහරක් සමඟ මුහුණට ම එල්ල කළ ඍජු පහරක්. ඒක ඊට වඩා හොඳට කරන්න මටවත් බැහැ. ඒත් ක්‍රෝනොස් ඊට වඩා වේගවත් වුණා. එයාට ලූක්ගේ සටන් හැකියාවන් සියල්ල ම තිබුණා. ඒ කියන්නේ ලේසි පහසු

හැකියාවක් නෙවෙයි. කයිරොන්ගේ කඩු තලයට ගසා පසෙකට දැමූ එයා මොර ගැසුවා. "පස්සට යනවා!"

ටයිටන් සහ නරාශ්වයා අතර මැද ඇස් අන්ධ කරවන එළියක් පුපුරා ගියා. විසි වී ගිය කයිරොන් ගොඩනැගිල්ලක හැපුණු වේගයට බිත්තිය එයාගේ ඇඟ උඩට කඩා වැටුණා.

"නෑ!" ඇනබෙත් විලාප තැබුවා. අපිව ගල් ගැසී තිබුණු වශිය බිඳුණා. අපි අපේ ගුරුතුමා දිහාවට දිවුවා. ඒත් එයාගේ සලකුණක්වත් පේන්න තිබුණේ නැහැ. තාලියා සහ මම අසරණ ලෙස ගඩොල් ඇද දමන්න දඟලද්දී, ටයිටන් හමුදාව අතරේ අප්‍රිය හිනාවක් පැතිරුණා.

"ඔහේ!" ඇනබෙත් ලූක් වෙතට හැරුණා. "හිතන්නෙ මම... මං හිතුවෙ-"

එයා එයාගේ කිණිස්ස ඇදලා ගත්තා.

"ඇනබෙත්, එපා." මම එයාගේ අතින් අල්ලගන්න හැදුවත්, එයා මගේ අත ගසලා දැම්මා.

එයා ක්‍රෝනොස්ට පහර දෙන්න පනිද්දී, ක්‍රෝනොස්ගේ මූණේ තිබුණු තෘප්තිමත් හිනාව මැකිලා ගියා. බාගදා, එයා මේ ගෑනු ළමයට කැමැත්තෙන් හිටපු බව, එයා පුංචි කාලේ බලාගත්ත බව ලූක්ගේ කොටසකට සිහිපත් වෙන්න ඇති. ඇනබෙත් ලූක්ගේ සන්නාහයේ පටි අතරින්, හරියට ම එයාගේ ග්‍රීවාස්ථියට වේගවත් කිණිසි පහරක් ගැසුවා. හරි නම් කිණිසි තලය එයාගේ පපුව තුළට කිඳා බැසිය යුතු වුණත්, සිද්ධ වුණේ එය ආපස්සට පොළා පැනීම විතරයි. ඇනබෙත් එයාගේ අත බඩට තද කරගෙන දෙකට නැමුණා. සමහරවිට ඒ ගැස්සීම එයාගේ තුවාල වී තිබුණු උරහිස සන්ධිය පන්නන්න පවා ප්‍රමාණවත් වෙන්න ඇති.

මම එයාව ආපස්සට ඇදලා ගන්නකොට ම ක්‍රෝනොස් එයාගේ දෑකැත්ත වැනුවේ, තත්පරේකට කලින් ඇනබෙත් හිටපු තැන වාතය දෙපළු කරමින්.

ඇනබෙත් මාත් එක්ක පොර බදමින් බෙරිහන් දුන්නා, "මං ඔහේට වෛර කරනවා!" එයා ඒක කිවුවේ කාට ද, මට හරියටම විශ්වාස වුණේ නැහැ- මට ද, ලූක්ට ද, එහෙමත් නැත්නම් ක්‍රෝනොස්ට ද? එයාගේ මුහුණේ වූ දූවිලි මත වයිරම් අඳිමින් කඳුළු ගලා ගියා.

"මට එයා එක්ක සටන් කරන්න වෙනවා," මම එයාට කිවුවා.



"මේක මගෙත් සටන, පර්සි!"

ක්‍රෝනොස් මහ හඬින් හිනා වුණා. "කොච්චර ධෛර්යයක් ද? නුඹව ගලවගන්න ලූක්ට උවමනා වුණේ ඇයි කියලා මට පේනවා. අවාසනාවට, ඒක කරන්න පුළුවන් දෙයක් නෙවෙයි."

එයා දෑකැත්ත එසෙව්වා. මම ප්‍රති ප්‍රහාරයට සූදානම් වුණා, ඒත් ක්‍රෝනොස්ට පහර ගසන්න ඉඩක් ලැබෙන්න කලින්, ටයිටන් හමුදාවට පිටුපස කොතැනින්දෝ නැඟුණු බල්ලෙකුගේ උඩු බිරුම් හඬකින් ගුවන පසාරු වුණා.

"අඋෟෟෟෟෟෟව්ව්ව්ව්!!"

ඒක ඕනෑවටත් වඩා ලොකු බලාපොරොත්තුවක් වුණත් මම කතා කළා, "මිසිස් ඕ'ලෙරී?"

සතුරු බලකායන් නොසන්සුන්ව කැළඹුණා. පුදුමාකාර ම දේ සිද්ධ වුණේ ඒ වෙලාවෙයි. එයාලා දෙපසට වෙමින් වීදිය දිගට ඉඩ එළි පෙහෙළි කරේ හරියට එයාලට පිටුපසින් වූ යමකින් බලපෑම් එල්ල වෙනවා වගෙයි.

නොබෝ වේලාවකින් ම පස්වෙනි මාවත මැද නිදහස් ප්‍රවේශ මාර්ගයක් ඇති වී තිබුණා. එහි එහා කෙළවරේ සිටියේ මගේ යෝධ බැල්ල සහ කළු සන්නාහයකින් සැරසුණු පොඩ්ඩෙක්.

"නිකෝ?" මම කතා කළා.

"ඊර්වූෆ්ෆ්!" මඟ දෙපස ගොරවමින් සිටි රාක්ෂයින්ව තඹ සතේකට මායිම් නොකර මිසිස් ඕ'ලෙරී මගේ දිහාවට පිම්මේ දුව ආවා. නිකෝ දිගු අඩි තබමින් ඉදිරියට ආවා. එයා ඉදිරියේ සතුරු හමුදාව පසු බැස්සේ හරියට එයාගෙන් මරණයේ රැස් පිටවෙනවා වගෙයි. ඇත්ත වශයෙන් ම එහෙම තමයි.

හිස්කබලක හැඩයේ යුද හිස්වැසුමේ මුහුණු ආවරණය හරහා එයා හිනාවුණා. "ඔයාගේ පණිවුඩේ හම්බ වුණා. පාටියට එන්න පරක්කු වැඩි වුණා ද මන්දා?"

"හේඩීස්ගේ පුත්‍රයා." ක්‍රෝනොස් බිමට කෙළ ගැසුවා. "නුඹ මරණය අත්දැකලා බලන්න ප්‍රාර්ථනා කරන තරමට මරණයට ආසයි ද?"

"ඔහේගෙ මරණය," නිකෝ කිවුවා, "දකින්න මම හරි ම ආසයි."

"මම අමරණීයයි, මෝඩයෝ! මම ටාටරස්වලින් පැනලා ආවා. නුඹට මෙතැන ඇති වැඩක් නැහැ, ඒ වගේ ම ජීවත් වෙන්න කිසිම අවස්ථාවකුත් නැහැ."

නිකෝ කඩුව ඇදලා ගත්තා- දුෂ්ට ලෙස මුවහත ඇති, නපුරු හීනයක් වගේ කළු පාට ස්ටයිජියන් යකඩ අඩි තුනක්. "මම ඒකට එකඟ නැහැ."

පොළොව ගිගුරුවා. පාර, පැතිමං සහ ගොඩනැගිලි බිත්ති ඉරිතළා ගියා. ඇටසැකිලි දෑත්වලින් වාතය ඩැහැගන්න දඟලමින් ජීවමාන ලෝකය තුළට මළවුන් බඩගා ආවා. එතැන උන් දහස් ගාණක් හිටියා. උන් මතු වෙනවා දැකලා කලබල වුණ ටයිටන්ගේ රාක්ෂයෝ පසු බහින්න පටන් ගත්තා.

"ඔහොම හිටපල්ලා!" ක්‍රෝනොස් නියෝග කළා. "මැරිච්ච එවුන්ට අපිත් එක්ක හැප්පෙන්න බැහැ."

එක්වර ම අහස අඳුරු සහ සීතල වුණා. හෙවණැලි වඩාත් ඝන වුණා. කර්කශ යුද නළාවක හඬට මළ සොල්දාදුවෝ තුවක්කු, කඩු සහ හෙල්ල අත දරාගෙන පෙළ ගැසුණා. අති විශාල කරත්තයක් පස්වෙනි මාවත දිගේ ගුගුරමින් ඇදී ඇවිත් නිකෝ අසල නැවතුණා. එහි අශ්වයෝ ලෙස හිටියේ අන්ධකාරයෙන් නිර්මාණය කළ ජීවමාන සෙවණැලියි. කරත්තයට ඔබ්සිඩියන් සහ රන් වද්දා, වේදනාකාරී මරණයන්ගේ දර්ශනවලින් හැඩ කර තිබුණා. එහි තෝන් ලණු දරාගෙන හිටියේ මරණයට අධිපති හේඩීස්. එයාට පිටුපසින් ඩිමීටර් සහ පර්සෙෆෝන් සිටියා.

හේඩීස් කළු සන්නාහයකින් සහ නැවුම් රුධිරයේ පාට ලෝගුවකින් සැරසී සිටියා. එයාගේ සුදුමැලි ඔළු ගෙඩිය උඩ අන්ධකාරයේ හිස්වැසුමඃ තනිකර ම භීතියේ රැස් විහිදුවන ඔටුන්න රැඳී තිබුණා. මම බලා සිටිද්දී ම එහි හැඩය වෙනස් වුණා- මකර හිසක සිට කළු ගිනි දැල් වළල්ලකටත්, එයින් මිනිස් ඇටකටුවලින් සැදුණු ඔටුන්නකටත් එය මාරු වුණා. ඒත් බය උපදවන දේ වුණේ ඒක නෙවෙයි. මගේ මනස තුළට ඇතුළු වූ හිස්වැසුම මගේ නරක ම හීන, මගේ රහසිගත ම බයවල් ඇවිස්සුවා. ගුළක් අස්සට රිංගලා හැංගෙන්න මට ඕනෑකමක් ඇති වුණා. හතුරු හමුදාවටත් ඒක ඒ විදිහට ම දැනුණු බව මට තේරුණා. උන් රංචු පිටින් පලා යාම වැළකු එක ම දේ වුණේ ක්‍රෝනොස්ගේ බලය සහ ආධිපත්‍යය විතරයි.



හේඩීස් උදාසීන ලෙස හිනා වුණා. "හලෝ, තාත්තා. ඔයා හිටියට වඩා... තරුණ පාටයි."

"හේඩීස්," ක්‍රෝනොස් ගෙරෙව්වා. "නුඹයි ළමාතැනිලා දෙන්නයි ආවෙ නුඹලාගේ පක්ෂපාතීකම ප්‍රතිඥා දෙන්න වෙන්නැති."

"අපොයි නැහැ." හේඩීස් සුසුමක් හෙළුවා. "මෙතැන ඉන්න මගේ පුතා මට ඒත්තු ගැන්නුවා මම මගේ හතුරෝ ලැයිස්තුව ප්‍රමුඛතා පිළිවෙලට පෙළ ගැස්සුවොත් හොඳයි කියලා." එයා අප්පිරියාවෙන් වගේ මගේ දිහාවට බැල්මක් හෙළුවා. "සමහර 'අලුතෙන් මුදුනෝ වුණ' උප දෙවිවරුන්ට මම කොච්චර අකමැති වුණත්, ඒ නිසා ඔලිම්පස් පරාද වෙන්න දෙන්න බැහැ. මගේ සහෝදර සහෝදරියෝ එක්ක රණ්ඩු කරකර ඉන්න නැති වුණා ම මට පාළු හිතෙයි. ඒ වගේම අපි හැමෝම එකඟ වෙන එක දෙයක් හරි තියෙනවා නම්- ඒක තමයි ඔයා මහ දරුණු තාත්තෙක් කියන එක."

"ඒක නම් ඇත්ත," ඩිමීටර් කෙඳිරුවා. "කවදාවත් කෘෂිකර්මාන්තය අගේ කළේ නැහැ."

"අම්මේ!" පර්සෙෆෝන් මැසිවිලි නැගුවා.

හේඩීස් එයාගේ කඩුව- රිදියෙන් වැඩ දැමූ දෙපැත්ත කැපෙන ස්ටයිජියන් තලයක් ඇදලා ගත්තා. "දැන් මාත් එක්ක සටනට එනවා! මොකද අදින් පස්සේ හේඩීස්ගේ නිවාසය හඳුන්වන්නෙ ඔලිම්පස්වල ගැලවුම්කරුවෝ විදිහටයි."

"මට ඕවට වෙලාව නැහැ," ක්‍රෝනොස් ගෙරෙව්වා.

එයා දෑකැත්තෙන් පොළොවට ගැසුවා. එතැනින් හටගත් පැළුමක් එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල වට කරමින් දෙපසට ම විහිදුණා. පැළුම් රේඛාව දිගට ශක්තියෙන් සැදි ප්‍රාකාරයක් දිලිසෙන්න ගත්තේ ක්‍රෝනොස්ගේ පෙරටු බල ඇණිය, මගේ යහළුවන්ව සහ මාව හමුදාවන් දෙකේ ඉතිරි සෙනඟෙන් වෙන් කරමින්.

"එයා මොනවද කරන්නේ?" මම කෙඳිරුවා.

"අපිව කොටු කරනවා," තාලියා කිවුවා. "එයා මැන්හැටන් වටේට තියෙන මායා බාධකය කඩලා දානවා- මේ ගොඩනැගිල්ලයි, අපිවයි විතරක් වෙන් කරගන්නවා."

කිවුවත් වගේ ම, අපි වටා තිබූ බාධකයට පිටත කාර්වල එන්ජින් පණ ගැසුවා. අවදි වුණ මඟියෝ කිසිවක් තේරුම් ගන්න

බැරුව එයාලා වටේට සිටි රාක්ෂයෝ සහ පිල්ලි දිහා පුදුමයෙන් බලා සිටියා. මීදුම හරහා එයාලට දකින්න ලැබුණේ මොකක්ද කියන්න බැහැ, ඒත් ඒක සෑහෙන බය උපදවන දෙයක් වෙන්න ඇති කියලා නම් මට විශ්වාසයි. කාර්වල දොරවල් ඇරුණා. පෝල් බ්ලෝෆිස් සහ මගේ අම්මා එයාලගේ ප්‍රියස් රථයෙන් එළියට බැස්සා.

"නෑ," මම කිවුවා. "එපා..."

මගේ අම්මට මීදුම හරහා දකින්න හැකියාව තිබුණා. එතැන තත්ත්වයේ බරපතළකම එයාට තේරුම් ගිය බව එයාගේ මුහුණේ ස්වභාවයෙන් ම මට කියන්න පුළුවන් වුණා. අනෙක් පැත්ත හැරිලා දුවන්න තරම් මොළයක් එයාට ඇති කියලා මම බලාපොරොත්තු වුණා. ඒත් ඒ වෙනුවට මගේ ඇස් දිහා බලපු එයා පෝල්ට මොනවදෝ කියලා, එක එල්ලේ අපි දිහාවට දුවගෙන එන්න ගත්තා.

මට කෑගහලා එන්න එපා කියන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. මට කරන්න උවමනා අන්තිම දේ වුණේ ක්‍රෝනොස්ගේ අවධානයට එයාව හසු කරන එකයි.

වාසනාවට, හේඩීස් එතැන කලබැගෑනියක් ඇති කළා. එයා ශක්ති ප්‍රාකාරයට පහර දුන්නා, ඒත් එහි වේගයෙන් ගැටුණු එයාගේ කරත්තය පෙරළුණා විතරයි. ශාප කරමින් දෙපයින් නැගී සිටි එයා අඳුරු ශක්ති කදම්බයකින් ප්‍රාකාරයට දමා ගැසුවා. ඒත් බාධකය නොසැලී තිබුණා.

"පහර දෙනූ!" එයා ගිගුරුවා.

මළවුන් හමුදාව ටයිටන්ගේ රාක්ෂයින් සමඟ ගැටුණා. පස්වෙනි මාවත මුළුමනින් ම වියවුල් ගොඩකට හැරුණා. මනුෂ්‍යයින් යටිගිරියෙන් බෙරිහන් දෙමින් ආවරණ සොයා දිවුවා. ඩිමීටර් අතක් වැනුවා ම සමස්ත යෝධ භට පෙළක් ම තිරිඟු යායකට හැරුණා. පර්සෙෆෝන් ඩ්‍රැකනෙයිලාගේ හෙලි සූරියකාන්තවලට හැරෙව්වා. නිකෝ සතුරන්ව කපමින් කොටමින්, එයාට හැකි උපරිමයෙන් මගීන්ව ආරක්ෂා කරන්න උත්සාහ කළා. මගේ දෙමව්පියෝ රාක්ෂයින් සහ පිල්ලි මඟ අරිමින් මගේ දිහාවට දුවගෙන ආවා, ඒත් එයාලගේ උදවුවට මට කළ හැකි කිසිවක් තිබුණේ නැහැ.

"නකමුරා," ක්‍රෝනොස් කතා කළා. "මාත් එක්ක එනවා. යෝධයිනේ- මුන් ටිකව බලාගනිල්ලා."



එයා මගේ යාළුවන්ව සහ මාව පෙන්නුවා. ඊට පස්සේ එයා ප්‍රවේශ ශාලාව තුළට රිංගුවා.

එක තත්පරයකට මම පුදුමයෙන් ගල් ගැහුණා. මම සටනක් අපේක්ෂාවෙන් හිටියත්, ක්‍රෝනොස් මාව සහමුලින් ම නොසලකා හැරියේ හරියට එච්චර කරදර වෙන්න තරම් මම වටින කෙනෙක් නෙවෙයි වගෙයි. ඒකෙන් මගේ කේන්තිය ඇවිස්සුණා.

මුල් ම හයිපර්බෝරියානුවා එයාගේ මුගුරෙන් මට තඩිබෑවා. එයාගේ කකුල් දෙක අතරින් පෙරළී ගිය මම එයාගේ පිටිපස්සට රිප්ටයිඩ්ගෙන් ඇන්නා. එයා අයිස් පතුරු ගොඩකට කුඩු වුණා. හිටගන්නවත් පණ නැතිව හිටපු ඇනබෙත් දිහාවට දෙවෙනි යෝධයා තුහින පිම්බා, ඒත් ග්‍රෝවර් එයාව එතැනින් ඉවතට ඇදලා ගන්න අතරේ තාලියා වැඩට බැස්සා. මුව දෙනක් වගේ යෝධයාගේ පිට දිගේ ඉහළට දිවූ එයා, එයාගේ දඩයම් පිහිය යෝධයාගේ අති විශාල නිල් පාට බෙල්ල හරහා යවා, ලෝකේ ලොකු ම අයිස් කවන්ධ මූර්තිය නිර්මාණය කළා.

මම මායා බාධකයෙන් පිටතට ඇස් යැව්වා. නිකෝ සටන් කරමින් මගේ අම්මා සහ පෝල් දිහාවට මඟ පාදාගෙන ආවා, ඒත් එයාලා උදවු ලැබෙන තුරු බලා සිටියේ නැහැ. මියැදුණු වීරයෙකුගේ කඩුවක් අහුලා ගත් පෝල් ඩ්‍රැකනෙයි කෙනෙකුට හොඳ වැඩක් දුන්නා. පෝල් ඩ්‍රැකනෙයිගේ බඩට ඇන්න පහරින් එයා සුනුවිසුණු වී ගියා.

"පෝල්?" මම කිවුවේ ඇස් අදහාගන්න බැරිවයි.

මගේ දිහාවට හැරුණු එයා දත් නියෙව්වා. "මං මේ දැන් මරලා දැම්මේ රාක්ෂයෙක්ව වෙන්නැති නේද? ඉස්කෝලෙ යන කාලේ මම ශේක්ෂ්පියර්ගේ නාට්‍යවල රඟපාපු නළුවෙක්! ඒ කාලේ කඩු සටන් ටිකක් එහෙන් මෙහෙන් ඉගෙන ගත්තා!"

ඒ වෙනුවෙන් මම වෙනදාටත් වඩා එයාට කැමති වුණා, ඒත් එතකොට ම ලයිස්ට්‍රිගෝනියානු යෝධයෙක් මගේ අම්මා දිහාවට වේගයෙන් එන්න ගත්තා. මගේ අම්මා හිටියේ අතහැර දැමූ පොලිස් කාරයක් අවුස්සමින්- සමහරවිට හදිසි අවස්ථාවලට පාවිච්චි කරන රේඩියෝවක් හොයමින් වෙන්න ඇති- එයා හිටියේ යෝධයාට පස්ස හරවාගෙනයි.

"අම්මේ!" මම මොර ගැසුවා.

Scanned with CamScanner

රාක්ෂයා එයා උඩට පාත්වෙන්න යනකොට ම අම්මා වේගයෙන් අනෙක් පැත්තට හැරුණා. මං මුලින් ම හිතුවේ එයාගේ අතේ තිබුණේ කුඩයක් කියලයි. ඒත් එතකොට ම පතුරම් තුවක්කුවේ කොකා ගැස්සූ එයා රාක්ෂයාව අඩි විස්සක් පිටුපසට, හරියට ම නිකෝගේ කඩුව වෙතට විසි කළා.

"මරු පාර," පෝල් කිවුවා.

"ඔයා කවද ද පතුරම් තුවක්කුවකින් වෙඩි තියන්න ඉගෙන ගත්තේ?" මම ප්‍රශ්න කළා.

මගේ අම්මා මුහුණට වැටුණු කෙස් රොදකට පිම්බා. "තප්පර දෙකකට විතර කලින්. පර්සි, අපිට අවුලක් වෙන්නෙ නැහැ. යන්න!"

"ඔව්," නිකෝ එකඟ වුණා, "අපි හමුදාව ගැන බලාගන්නම්. ඔයා ක්‍රෝනොස්ව අල්ලගන්න ඕනෑ!"

"මෙහෙ එන්න, පාසි මොළේ!" ඇනබෙත් කිවුවා. මම ඔළුව වැනුවා. ඊට පස්සේ මම ගොඩනැගිල්ලේ පසෙක තිබුණු ගල් කැලි ගොඩ දිහා බැලුවා. මට දැනුණේ මගේ හදවත ඇඹරෙනවා වගෙයි. මට කයිරොන්ව අමතක වෙලයි තිබුණේ. මං කොහොමද එහෙම කළේ?

"මිසිස් ඕ'ලෙරී," මම කතා කළා. "අනේ, කයිරොන් අතන යට වෙලා. එයාව හාරලා ගොඩ ගන්න පුළුවන් කෙනෙක් ඉන්නවා නම්, ඒ තමයි ඔයා. එයාව හොයන්න! එයාට උදවු කරන්න!"

මම කියපු දේවල්වලින් කොච්චරක් එයාට තේරුණා ද මම දන්නෙ නැහැ, ඒත් ගල් ගොඩ ළඟට පිම්මේ දිවූ එයා ඒක හාරන්න පටන් ගත්තා. ඇනබෙත්, තාලියා, ග්‍රෝවර් සහ මම සෝපානය සොයා දිවුවා.

19

# අපි සදාකාලික නගරය හැඩි කළා

ඔලිම්පස්වලට යන පාලම කැඩී බිඳී යමින් තිබුණා. සෝපානයෙන් පිටට ආව අපි කිරි ගරුඬින් සැදි අඩි පාරට පය තැබූ හැටියේ ම වගේ අපේ දෙපා මුල ඉරිතැළුම් මතුවුණා.

"පනින්න!" ග්‍රෝවර් කිවුවා. එයාට නම් ඒක ලේසියි, මොකද එයා බාගෙට කඳුකර එළුවෙක් නේ.

එයා ඊළඟ පුවරුවට පනිද්දී අපි හිටපු පුවරුව බය හිතෙන විදිහට පැත්තකට ඇල වුණා.

"දෙයියනේ, මට උස තැන් පෙන්නන්න බැහැ!" තාලියායි මමයි පනින අතරේ එයා මොර ගැසුවා. ඒත් ඇනබෙත් හිටියේ පිම්මක් පනින්න පුළුවන් තත්ත්වෙක නෙවෙයි. පැකිළී වැටුණු එයා මොර දුන්නා, "පර්සී!"

පාදිකාව දූවිලිවලට කුඩු වෙමින් ඇද වැටෙද්දී ම මම එයාගේ අත අල්ල ගත්තා. එක තත්පරයකට මම හිතුවේ එයා අපි දෙන්නව ම ඇදගෙන පහළට වැටෙයි කියලයි. විවෘත අවකාශයේ එයාගේ දෙපා එල්ලෙමින් තිබුණා. එයාගේ අත ලිස්සා යන්න පටන් ගත්තේ අන්තිමේ දී මට එයාව ඇඟිලිවලින් විතරක් අල්ලගෙන ඉන්න සලස්වමින්. ඒ වෙලාවේ ග්‍රෝවරුයි තාලියායි මගේ කකුල් බදාගත්ත නිසා මට අතිරේක ශක්තියක් ලැබුණා. ඇනබෙත්ව කීයටවත් වැටෙන්න දෙන්නෙ නැහැ.

Scanned with CamScanner

මම එයාව උඩට ඇදලා ගත්තා, ඊට පස්සේ අපි දෙන්න ම පාදිකාව මත වැතිරී සිටියේ වෙවුලමින්. ටික වෙලාවකට පස්සේ එයා එක්වර ම ගැස්සෙන තුරු ම, අපි දෙන්නා හිටියේ එකිනෙකා වටේ දෑත් දමාගෙන කියලා මට තේරුනේ නැහැ.

"ම්ම්, ස්තුතියි." එයා කෙඳිරුවා.

'ඒක සුළු දෙයක් නේ,' කියන්න මම උත්සාහ කළත්, මගේ කටින් පිටවුණේ, "අහ් ඩහ්."

"දිගටම යමු!" ග්‍රෝවර් මගේ උරහිසෙන් ඇද්දා. එකිනෙකාගෙන් මිදුණු අපි අහස් පාලම දිගේ වේගයෙන් දුවද්දී, තව තවත් ගල් කෑලි කැඩී නොපෙනෙන අන්තයකට ඇද වැටුණා. අන්තිම කොටසත් කඩා වැටෙද්දී ම අපි කඳු ගැටයේ අද්දරට පැනගත්තා.

ඇනබෙත් ආපසු හැරී සෝපානය දිහා බැලුවා. දැන් ඒක තිබුණේ කොහෙත්ම ළඟා වෙන්න බැරි දුරකයි- දැන් ඒක මෑන්හැටන් නගරයට තට්ටු හයසීයක් ඉහළ අවකාශයේ කිසිවකට ඈඳී නැතිව පාවෙමින් තිබුණු ඔප දැමූ ලෝහමය දොරටුවක් විතරයි.

"අපිව අතරමං වුණා," එයා කිවුවා. "අපි තනි වුණා."

"බ්ල්හා-හා-හා!" ග්‍රෝවර් කිවුවා. "ඔලිම්පසුයි ඇමරිකාවයි අතරේ සම්බන්ධෙ කැඩිලා යනවා. ඒක නැවතුනොත්-"

"මේ වතාවේ දෙවිවරු තවත් රටකට මාරු වෙන්නෙ නැති වෙයි," තාලියා කිවුවා. "මේක ඔලිම්පස්වල අවසානය වෙයි. අන්තිම අවසානය."

අපි වීදි හරහා දිවුවා. මන්දිර ගිනි ගනිමින් තිබුණා. ප්‍රතිමා බිඳ දමලා. උයන්වල වූ ගස් පතුරු ගැහිලා. එතැන තිබුණේ කවුරුහරි යෝධ විසි කැත්තකින් නගරයට පහර දීලා වගේ පෙනුමක්.

"ක්‍රෝනොස්ගේ දෑකැත්ත," මම කිවුවා.

දඟර ගැසෙමින් දෙවිවරුන්ගේ මාලිගාව බලා ඇදෙන පාර දිගේ අපි ගියා. මේ අඩි පාර මේ තරම් දිග බවක් මට මතක තිබුණේ නැහැ. සමහරවිට ක්‍රෝනොස් කාලය මන්දගාමී කරලා තියෙන්න ඇති, එහෙමත් නැත්නම් සමහරවිට භීතිය මාව මන්දගාමී කරන්න ඇති. මුළු කඳු මුඳුන ම විනාශ වෙලයි තිබුණේ- සුන්දර ගොඩනැගිලි සහ උයන් මහ ගොඩක් වැනසී තිබුණා.



සුළු දෙවිවරු සහ සොභාවික බලවේග කීප දෙනෙක් ක්‍රෝනොස්ව නවත්වන්න උත්සාහ කර ඇති බව පෙනෙන්න තිබුණා. එයාලගෙන් ඉතිරි වූ දේවල් පාරේ තැන තැන විසිරී තිබුණා: කුඩු වී ගිය සන්නාහ, ඉරුණු ඇඳුම්, දෙකට කැඩුණු කඩු සහ හෙලි.

අපිට ඉදිරියේ කොතැනින්දෝ ක්‍රෝනොස්ගේ හඬ ගර්ජනා කළා: "ගලින් ගල! මම දිවුරුවේ එහෙමයි. ඒක ගලෙන් ගලට ගලවලා විනාශ කරනවා!"

රන් කොතක් සහිත කිරි ගරුඬ දේවස්ථානයක් එක්වර ම පුපුරා ගියා. කේතලයක පියන වගේ උඩ ගිය කොත කෑලි බිලියනයකට කුඩු වෙලා, මුළු නගරය පුරාවට ම ගල් කෑලි වැසි වැස්සුවා.

"ඒක ආර්ටෙමිස්ට හදලා තිබුණ සිද්ධස්ථානයක්," තාලියා ගෙරෙව්වා. "ඒ කරපු දේට එයාට වන්දි ගෙවන්න වෙනවා."

අපි සියුස්ගේ සහ හේරාගේ යෝධ ප්‍රතිමා දෙකක් ඇති කිරි ගරුඬ ආරුක්කුව යටින් දුවද්දී මුළු කන්ද ම ගෙරවුම් හඬ නගමින් දෙපැත්තට වැනෙන්න ගත්තේ කුණාටුවකට හසු වූ බෝට්ටුවක් වගෙයි.

"ඔන්න බලාගෙන!" ග්‍රෝවර් කෑගැසුවා. ආරුක්කුවේ කෑලි ගැලවී වැටෙන්න ගත්තා. උඩ බලපු මට තරහෙන් රවාගත් ටොන්-විස්සක හේරා අපි උඩට ඇද වැටෙනවා දකින්න ලැබුණා. ඒකට යට වෙලා ඇනබෙත්ව සහ මාව එතැන ම චප්ප වෙන්න තිබුණා, ඒත් තාලියා අපිව පිටුපසින් තල්ලු කළ නිසා අපිව යාන්තමින් ඒ අනතුරින් ගැලවුණා.

"තාලියා!" ග්‍රෝවර් බෙරිහන් දුන්නා.

කඳු ගැටයේ පැද්දීම නැවතී දූවිලි පහ වී ගියාට පස්සේ, තවමත් ජීවතුන් අතර සිටි එයාව අපිට හොයාගන්න ලැබුණා, ඒත් එයාගේ කකුල් දෙක ප්‍රතිමාවට යට වෙලයි තිබුණේ.

අපි ඒක ඔසවන්න උත්සාහ කළා, ඒත් ඒක කරන්න නම් සයික්ලොප්ස්ලා හතර පස් දෙනෙක්වත් ඕනෑ වෙයි. අපි ඒක යටින් තාලියාව ඇදලා ගන්න උත්සාහ කරද්දී එයා වේදනාවෙන් මොර දුන්නා.

"මම අච්චර සටන් ගොඩකින් පණ බේරගත්තා," එයා ගෙරෙව්වා. "ඒ කරලත් මේ ඔලමොට්ටල ගල් කුට්ටියකට පැරදුණා!"

Scanned with CamScanner

"ඒ හේරා," ඇනබෙත් කිව්වේ පුපුරා හැලෙන කෝපයෙන්. "එයා මේ මුළු අවුරුද්ද ම මගෙන් පළි ගන්නයි දඟලුවේ. ඔයා අපිව පැත්තකට තල්ලු නොකරා නම්, එයාගේ පිළිමේ මාව මරන්න ඉඩ තිබුණා."

තාලියාගේ මූණ වේදනාවෙන් ඇද වුණා. "හොඳයි, මෙතැනට වෙලා බලන් ඉඳලා හරියන්නෑ! මට අවුලක් නැහැ. යන්න!"

අපිට එයාව දාලා යන්න ඕනෑ වුණේ නැහැ, ඒත් දෙවිවරුන්ගේ ශාලාවට ළඟා වෙන ක්‍රෝනොස්ගේ හිනා හඬ මට ඇහුණා. තව තවත් ගොඩනැගිලි පුපුරා ගියා.

"අපි ආපහු එනවා," මම පොරොන්දු වුණා.

"මම කොහෙවත් යන්නෙ නැහැ," තාලියා කෙඳිරි ගෑවා.

කන්දේ එක් පසෙක, හරියට ම මාලිගාවේ ගේට්ටු අසලින් ගිනි බෝලයක් පැන නැඟුණා.

"අපිට දුවන්න වෙනවා," මම කිව්වා.

"මං හිතන්නෙ ඔයා කියනවා ඇත්තේ මෙතැනින් අහකට නෙවෙයි වෙන්න ඇති නේ," ග්‍රෝවර් බලාපොරොත්තු සහගතව මිමිණුවා.

මම මාලිගාව දිහාවට වේගයෙන් දුවද්දී, ඇනබෙත් මාත් එක්ක ම ආවා.

"ඕකට තමයි මං බයේ හිටියේ," සුසුමක් හෙළූ ග්‍රෝවර් ක්ලිප්-ක්ලොප් හඬ නගමින් අපි පසුපස ආවා.

★★★

මාලිගාවට තිබුණේ සංචාරක නැවක් පවා ඇතුළු කළ හැකි තරම් විශාල දොරටුවක්, ඒත් දැන් ඒවා සරණේරුවලින් උගුළුවලා කඩා බිඳ දමා තිබුණේ හරියට ඒවා පුළුන් රොදක් තරම්වත් බර නැහැ වගෙයි. මාලිගාවට ඇතුළු වෙන්න අපිට කැඩුණු ගල් සහ ඇඹරුණු ලෝහවලින් සෑදුණු ලොකු ගොඩැල්ලක් උඩින් යන්න සිද්ධ වුණා.

ක්‍රෝනොස් සිංහාසන ශාලාව මැද සිටගෙන, දෑත් දෙපසට විහිදාගෙන තරු පිරුණු සිවිලිම දිහා බලා සිටියේ ඒ සියල්ල ග්‍රහණය කරගන්න වගෙයි. එයාගේ හිනාවේ දෝංකාරය ටාටරස් ආගාධ පතුලෙන් නැඟුණාටත් වඩා තදින් ඇසුණා.



"අන්තිමේදී!" එයා ගිගුරුවා. "ඔලිම්පියානු මන්ත්‍රණ සභාව- මහා බලගතු උදාරම් තැන. මම ඉස්සෙල්ලා ම විනාශ කරන්නේ කොයි බල අසුන ද?"

තම ස්වාමියාගේ දෑකැත්තෙන් ඈත් වී ඉන්න උත්සාහ කරමින් ඊතන් නකමුරා පසෙකින් සිටගෙන සිටියා. මුළුමනින් ම වගේ නිවී ගොස් තිබුණු ගිනි උදුනේ දැන් තිබුණේ අළුවලට යටවී දිලිසෙන අඟුරු කීපයක් විතරයි. හෙස්ටියා පේන්න හිටියේ නැහැ. රේචල් හිටියෙත් නැහැ. එයා හොඳින් ඇති කියලා මම බලාපොරොත්තු වුණා, ඒත් මට දකින්න ලැබී තිබුණු විනාශයේ තරම නිසා ඒ ගැන හිතන්න පවා මම බය වුණා. ශාලාවේ ඈත කොණේ ජල ගෝලය තුළ පිහිනමින් සිටි ඔෆියොටෝරස් හඬ නොනගා ඉන්න තරම් බුද්ධිමත් වුණා, ඒත් එයාව ක්‍රෝනොස්ගේ අවධානයට හසු වෙන්න තව වැඩි වෙලාවක් යන එකක් නැහැ.

ඇනබෙත්, ග්‍රෝවර් සහ මම පන්දම් එළිය තුළට පිය මැන්නා. අපිව මුලින් ම දුටුවෙ ඊතන්.

"මගේ උතුමාණෙනි," එයා අනතුරු ඇඟෙව්වා.

ආපසු හැරුණු ක්‍රෝනොස් ලූක්ගේ මුහුණ තුළින් හිනා වුණා. මාව රන්වන් ඇස් ඇරෙන්න, එයාට තිබුණේ අවුරුදු හතරකට කලින්, ඇනබෙත් හර්මීස් කැබිනයට පිළිගත් වෙලාවේ තිබුණු පෙනුම ම යි. ඇනබෙත් උගුර යටින් වේදනාබර හඬක් නැඟුවේ හරියට මේ දැන් කවුරුහරි එයාට බලාපොරොත්තු නොවූ පාරක් ගැහුවා වගෙයි.

"අපි මුලින් ම නුඹව විනාශ කරලා ඉන්න ද, ජැක්සන්?" ක්‍රෝනොස් ඇහුවා. "ඒක ද නුඹ ගන්න තීරණය- යටත් වෙනවා වෙනුවට මාත් එක්ක සටන් කරලා මැරෙන එක? නුඹ දන්නවා නේ, අනාවැකි කවදාවත් හොඳ විදිහට ඉවර වෙන්නෙ නැහැ."

"ලූක් නම් සටන් කරන්නෙ කඩුවකින්," මම කිව්වා. "ඒත් ඔහේට ඒ තරම් දක්ෂකමක් ඇති කියලා මං හිතන්නෑ."

ක්‍රෝනොස් දත් විලිස්සුවා. වෙනස් වෙන්න පටන් ගත් එයාගේ දෑකැත්ත අන්තිමේ දී ලූක්ගේ පරණ ආයුදය- අර්ධ-වානේ, අර්ධ-දිව්‍යමය ලෝකඩ තලය සහිත බැක්බයිටර් බවට හැරුණා.

මට එහා පැත්තෙන් හිටපු ඇනබෙත් හීල්ලුවේ හරියට හදිසියේ ම එයාට අදහසක් පහළ වෙලා වගෙයි. "පර්සි, මේ තලය!"

Scanned with CamScanner

එයා එයාගේ කිණිස්ස කොපුවෙන් එළියට ඇදලා ගත්තා. "'ශාපලත් තලයෙන් වීරයාගේ ආත්මය නෙලා ගනීවි.'"

මේ වෙලාවේ එයා අනාවැකියේ ඒ පේළිය ම මට මතක් කරන්නේ ඇයි කියලා මට තේරුනේ නැහැ. ඇත්තට ම ඒක හිතේ ධෛර්යය වඩවන දෙයක් නෙවෙයි, ඒත් මට කිසිවක් කියන්න ඉඩක් ලැබෙන්න කලින් ක්‍රෝනොස් කඩුව එසෙව්වා.

"ඔහොම ඉන්න!" ඇනබෙත් මොර ගැසුවා.

ක්‍රෝනොස් සුළි සුළඟක් වගේ මාව හොයාගෙන ආවා.

ඒත් එක්ක ම මගේ සහජ බුද්ධිය පාලනය අතට ගත්තා. මම එයාව මඟ අරිමින්, කඩු පහර ගසමින්, පෙරළෙමින් ශිල්ප දැක්වූවත්, මට දැනුණේ මම කඩු සටන්කරුවෝ සිය දෙනෙක් සමඟ සටන් කරනවා වගෙයි. එක පැත්තකට පැනපු ඊතන් පිටුපසින් මට ළං වෙන්න උත්සාහ කළත්, ඇනබෙත් එයාට බාධා කළා. ඒ දෙන්නා සටන් කරන්න පටන් ගත්තා, ඒත් මට ඇනබෙත් වෙතට අවධානය යොමු කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ග්‍රෝවර් එයාගේ බටනළා වාදනය කරන බව මට යාන්තමින් වගේ දැනුණා. ඒ හඬ උණුසුමෙන් සහ ධෛර්යයෙන් මාව පිරවූවා- මේ යුද්ධයෙන් ගොඩක් ඈත තැනක, නිල් අහසේ පෑයූ හිරුගේ එළියෙන් නැහැවුණු සාමකාමී දෙණිබිමක් ගැන සිතුවිලි මගේ හිතට ගලා ආවා.

ක්‍රෝනොස් මාව හෙෆාස්ටස්ගේ සිංහාසනය ළඟට පසු බැස්සුවා- ඒක ලෝකඩ සහ රිදී ගියරවලින් වැහුණු සද්දන්ත යාන්ත්‍රික පුටුවක්. ක්‍රෝනොස්ගේ කඩු පහරක් මඟ අරිමින් කෙලින් ම අසුන උඩට පනින්න මට හැකි වුණා. ඒත් එක්ක ම සිංහාසනය රහසිගත යාන්ත්‍රණයකට අනුව ක්‍රියාත්මක වෙමින්, ගුමු ගුමු හඬ පිට කරන්න ගත්තා. 'ආරක්ෂක මාදිරිය.' එය අනතුරු ඇඟෙව්වා. 'ආරක්ෂක මාදිරිය.'

ඒක නම් හොඳ දෙයක් වෙන්න බැහැ. මම කෙලින් ම ක්‍රෝනොස්ගේ ඔළුවට උඩින් පනිනකොට ම, සිංහාසනයෙන් සෑම දිසාවකට ම විද්‍යුත් ධාරාවන් විදින්න ගත්තා. එයින් එකක් ක්‍රෝනොස්ගේ මුහුණේ වැදී එයාගේ ඇඟ පුරාමත්, කඩුව දිගේ ඉහළටත් දිවුවා.

"ආාාර්ග්ග්හ්!!" දණහිස් මතට කඩා වැටුණු ක්‍රෝනොස් අතින් බැක්බයිටර් අත ඇරුණා.



ඇනබෙත් ඒක අවස්ථාවක් කරගත්තා. ඊතන්ට පයින් ගහලා පැත්තකට විසි කළ එයා ක්‍රෝනොස් ළඟට දිවුවා. "ලූක්, අහන්න!"

එයාට කෑගහන්න; ක්‍රෝනොස්ට හේතු පහදලා දෙන්න යන්නෙ පිස්සු හැදිල ද කියලා අහන්න මට ඕනෑ වුණත්, ඒකට වෙලාවක් තිබුණේ නැහැ. ක්‍රෝනොස් අතක් වැනුවා. ඒත් එක්ක ම ආපස්සට උඩින් විසි වී ගිය ඇනබෙත්, එයාගේ අම්මාගේ සිංහාසනයේ වැදිලා බිමට ඇදගෙන වැටුණා.

"ඇනබෙත්!" මම බෙරිහන් දුන්නා.

ඊතන් නකමුරා දෙපයින් නැගී සිටියා. දැන් එයා සිටගෙන සිටියේ ඇනබෙත් සහ මං අතරමැදයි. ක්‍රෝනොස්ට පිටුපාන්නේ නැතිව එයා සමඟ සටන් කරන්න මට පුළුවන්කමක් තිබුණේ නැහැ.

ග්‍රෝවර්ගේ සංගීතය වඩාත් හදිසි තාලයකට හැරුණා. එයා ඇනබෙත් දිහාවට යන්න ගත්තා, ඒත් එයාට සංගීතය වාදනය කරන ගමන් වේගයෙන් යන්න හැකි වුණේ නැහැ. සිංහාසන ශාලාවේ පොළොව මත තණකොළ වැවුණා. කිරිගරුඬ ගල් අතර පැළුම් තුළින් පුංචි මුල් වැඩුණා.

ක්‍රෝනොස් එක දණහිසක් මතින් නැගී සිටියා. එයාගේ කොණ්ඩයෙන් දුම් දමමින් තිබුණා. එයාගේ මුහුණ විද්‍යුත් පිළිස්සුම්වලින් වැහිලා. එයා කඩුවට අත යැවූවා, ඒත් මේ වතාවේ ඒක එයාගේ අතට පියඹා ආවේ නැහැ.

"නකමුරා!" එයා කෙඳිරි ගෑවා. "නුඹ ගැන ඔප්පු කරලා පෙන්නන්න වෙලාව ඇවිල්ලා. ජැක්සන්ගේ රහසිගත දුර්වල තැන නුඹ දන්නවා නේ. ඒකව මරලා දානවා, ඊට පස්සේ නුඹට මනින්න බැරි තරම් තෑගි ලැබෙයි."

ඊතන්ගේ දෑස් මගේ ඇඟ මැදට එල්ල වෙද්දී, එයා ඒක දන්නා බව මට සහතික වුණා. එයාට මාව මරන්න බැරි වුණත්, එයාට කරන්න තිබුණේ ඒක ක්‍රෝනොස්ට කියන එක විතරයි. මට සදහට ම මාව ආරක්ෂා කරගන්න කොහෙත්ම බැරි බව මම දැන සිටියා.

"ඇස් ඇරලා වටපිට බලනවා, ඊතන්," මම කිවුවා. "ලෝකෙ අවසානය ඇවිල්ලා. ඔයාට ඕනෑ තෑග්ග මේක ද? හැමදෙයක් ම විනාශ කරලා දාන්න ඇත්තට ම ඔයාට ඕනෑ ද- නරක දේවල් එක්ක හොඳ දේවලුත්? හැම දෙයක් ම?"

ග්‍රෝවර් දූත් ඇනබෙත් ළඟට ම වගේ ගිහින් හිටියා. පොළොව මත තණකොළ වඩාත් ඝනව වැවුණා. බළල් රැවුල් ගස් වගේ මුල් දූත් අඩියක් විතර දිගු වී තිබුණා.

"මෙතැන නෙමෙසිස්ට සිංහාසනයක් නැහැ," ඊතන් කෙඳිරුවා. "මගේ අම්මට සිංහාසනයක් නැහැ."

"අන්න හරි!" නැගිටින්න උත්සාහ කළ ක්‍රෝනොස් ආයෙමත් ඇද වැටුණා. එයාගේ වම් කනට උඩින් වැලි පාට කෙස් රොදකින් තවමත් දුම් දැමුවා. "උන්ව විනාශ කරලා දානවා! උන් විඳවන්නයි ඕනෑ!"

"ඔයාගේ අම්මා සමබරතාවයේ දෙවඟන කියලා නේද ඔයා කිවුවේ," මම එයාට සිහිපත් කළා. "සුළු දෙවිවරුන්ට මීට වඩා හොඳ තැනක් ලැබෙන්න ඕනෑ තමයි, ඊතන්, ඒත් සමබරතාවය කියන්නේ හැමදෙයක් ම සහමුලින් විනාශ කරන එක නෙවෙයි. ක්‍රෝනොස් කිසිම දෙයක් ඉදි කරන්නෙ නැහැ. එයා කරන්නෙ විනාශ කරන එක විතරයි."

ඊතන් සිරි සිරි හඬ නගන හෙෆාස්ටස්ගේ සිංහාසනය දිහා බැලුවා. ග්‍රෝවර්ගේ සංගීතය දිගට ම වාදනය වෙද්දී ඊතන් එයට අනුව පැද්දුණේ හරියට ඒ සංගීතය එයාව සාංකාවකින් පුරවනවා වගෙයි- හරියට ලස්සන දවසක් දකින්න අපේක්ෂා කරනවා වගෙයි; මෙතැන හැර වෙන ඕනෑ ම තැනක ඉන්න අපේක්ෂා කරනවා වගෙයි. එයාගේ හොඳ ඇහැ තදින් ඇහි පිය සැලුවා.

ඊට පස්සේ එයා පහර දෙන්න පැන්නා... ඒත් මට නෙවෙයි.

ක්‍රෝනොස් තවමත් දණ ගසාගෙන සිටින අතරේ, ඊතන් එයාගේ කඩුව ටයිටන් රජාගේ බෙල්ලට එල්ල කරා. ඒ පහරින් එයා එසැණින් ම මිය යා යුතු වුණත්, ඒ වෙනුවට සිද්ධ වුණේ කඩු තලය කුඩු වී යාම විතරයි. ඊතන් බඩ බදාගෙන ආපස්සට ඇද වැටුණා. එයාගෙ ම කඩු තලයෙන් කැබැල්ලක් විසි වී ගොස් එයාගේ සන්නාහය සිදුරු කර තිබුණා.

අස්ථිර ලෙස සිටගත් ක්‍රෝනොස් එයාගේ සේවකයාට ඉහළින් නැගී සිටියා. "ද්‍රෝහියා," එයා දත් විලිස්සුවා.

ග්‍රෝවර්ගේ සංගීතය නොනැවතී වැයෙද්දී, ඊතන්ගේ සිරුර වටා තණකොළ වැවුණා. මගේ දිහා බලා සිටි ඊතන්ගේ මුහුණ වේදනාවෙන් තද වී තිබුණා.



"මීට වඩා හොඳ තැනක් ලැබෙන්න ඕනෑ," එයා පණ ඇද්දා. "එයාලටත්... සිංහාසන තිබුණා නම්-"

ක්‍රෝනොස් කකුලක් බිම ගැසුවා ම ඊතන් නකමුරා වටා පොළොව පැළුණා. කඳු ගැටයේ හදවත හරහා ඇති වූ විවරය තුළින් එක එල්ලේ ම විවෘත අහසට නෙමෙසිස්ගේ පුතා ඇද වැටුණා.

"එයා ඕනෑවට වැඩියි." ක්‍රෝනොස් කඩුව අහුල ගත්තා. "එතකොට දූත් උඹලා ටික."

***

මගේ එක ම සිතුවිල්ල වුණේ එයාව ඇනබෙත්ගෙන් ඈත් කර තබා ගැනීම විතරයි. ග්‍රෝවර් දූත් එයාගේ ළඟට ගිහින් තිබුණා. වාදනය නතර කළ එයා ඇනබෙත්ට ඇම්බ්‍රෝසියා කවමින් සිටියා.

ක්‍රෝනොස් පය තබන සෑම තැනක ම මුල් එයාගේ කකුල වටේ වෙළුණා, ඒත් ග්‍රෝවර් එයාගේ මායාව ඕනෑවට වඩා ඉක්මනින් නවතා තිබුණු නිසා ටයිටන්ව තරහා ගස්සනවට වඩා වැඩි යමක් කරන්න මුල්වල මහත හෝ ශක්තිය ප්‍රමාණවත් වුණේ නැහැ.

අපි ගිනි උඳුන හරහා යමින්, අඟුරු සහ ගිනි පුළිඟුවලට පයින් ගසමින් සටන් කළා. ක්‍රෝනොස්ගේ කඩු පහරකට ඒරීස්ගේ සිංහාසනයේ අත් ඇන්දක් කැපී වෙන්වුණා, මට නම් ඒක ප්‍රශ්නයක් වුණේ නැහැ, ඒත් ඊට පස්සේ එයා මාව මගේ තාත්තගේ සිංහාසනය දිහාවට පසු බැස්සුවා.

"ඔහ්, නියමයි," ක්‍රෝනොස් කිවුවා. "මේක නම් මගේ අලුත් ගිනි උඳුනට දරට ගන්න හොඳයි!"

අපේ කඩු තල එකිනෙක ගැටී ගිනි පුළිඟු වැසි වැටුණා. එයා මට වඩා ශක්තිමත් වුණත් ඒ මොහොතේ දී නම් මගේ දෑත්වලට සමුදුරේ ශක්තිය ගලා එනවා මට දැනුණා. එයාව ආපස්සට තල්ලු කළ මම නැවතත් පහර දුන්නා- එයාගේ උර තහඩුවට මම රිප්ටයිඩ්ගෙන් ගැසූ පහරේ සැරට දිව්‍යමය ලෝකඩ තහඩුවේ කැපුමක් ඇති වුණා.

එයා ආයෙමත් කකුල බිම ගැසුවා ම කාලය මන්දගාමී වුණා. මම එයාට පහර ගහන්න හැදුවත්, මගේ වේගය ග්ලැසියරයක් තරම් වුණා. ක්‍රෝනොස් නිවාඩු පාඩුවේ මහන්සි අරිමින් ඉදිරියට ආවා. මම හිත යටින් එයාට ශාප කරමින් ඉදිරියට යන්න දඟලන අතරේ, එයා එයාගේ උර තහඩුවේ වූ කැපුම පරීක්ෂා කළා. එයාට ඕනෑ තරම්

විවේක කාලයත් ගන්න හැකියාව තිබුණා. එයාට හිතු මනාපෙට මාව එක තැන ගල් කරන්න හැකියාව තිබුණා. මට තිබුණු එක ම බලාපොරොත්තුව වුණේ ඒ ප්‍රයත්නයට එයාගේ ශක්තිය වැය වේවි කියන එක විතරයි. මට එයාව වෙහෙසන්න පුළුවන් නම්...

"දූත් පරක්කු වැඩියි, පර්සි ජැක්සන්," එයා කිවුවා. "බලනවා."

එයා උඩුනට අත දිගු කළා ම, ගිනි අඟුරු දිලිසුණා. ගින්නෙන් ඉහළ නැඟුණු සුදු පාට දුම් කැරැල්ලක් අයිරිස්-පණිවුඩයක් වගේ රූප මවන්න ගත්තා. පහළ පස්වෙනි මාවතේ සතුරන්ගෙන් වට වූ නිකෝ සහ මගේ දෙමව්පියෝ බලාපොරොත්තු රහිත සටනක යෙදෙනවා මම දැක්කා. ඊට පසුබිමින් හේඩීස් එයාගේ කළු පාට කරත්තය මත සිට, පිල්ලි රැළක් පසුපස තවත් රැළක් බැගින් පොළොවෙන් පිටතට කැඳවමින් සටන් කළා. ඒත් ටයිටන්ගේ හමුදාවේ සේනාවන් ඊටත් වඩා එනවා වගෙයි පෙනුණේ. මේ අතරවාරයේ, මැන්හැටන් නගරය වැනසෙමින් තිබුණා. දූත් හොඳින් අවදි වී සිටි මනුෂ්‍යයින් භීතියෙන් ඔළුව හැරුණු අතේ දිවුවා. රථ වාහන පාරෙන් පිට පැනලා හැප්පුණා.

ඒ දර්ශනය මාරු වුණේ මට ඊටත් වඩා බය උපදවන දෙයක් පෙන්වමිනුයි.

හඩ්සන් ගඟට ළඟා වූ කුණාටු කදක්, ජර්සි වෙරළ දිගේ වේගයෙන් ඉදිරියට එමින් තිබුණා. එය වටා කරත්ත කැරකෙමින්, වලාකුළෙන් සැදි සතා සමඟ සටනේ යෙදුණා.

දෙවිවරු පහර දුන්නා. අකුණු විදුලි කෙටුවා. රොකට් එළි වගේ වලාකුළ තුළට ඇදී ගිය රන් සහ රිදී පාට ඊතල පුපුරා ගියා. හෙමින් හෙමින් වලාකුළ දෙබෑ වෙද්දී, මට පළමු වතාවට ටයිපූන්ව පැහැදිලිව දකින්න ලැබුණා.

ඒ වෙලාවේ මට තේරුම් ගිය එක ම දේ වුණේ මගේ ඉතිරි ජීවිත කාලය පුරාවට ම (සමහරවිට ඒක ඒ හැටි කාලයක් නොවෙන්නත් පුළුවන්) මට ඒ රූපය හිතෙන් ඉවත් කරන්න බැරි වෙන බවයි. එයාගේ ඔළුව නිරන්තරයෙන් වෙනස් වුණා. හැම මොහොතක ම එයා කලින් හිටියාට වඩා වෙනස්, වඩා බිහිසුණු රාක්ෂයෙකුට හැරුණා. එයාගේ මූණ දිහා බලාගෙන හිටියොත් මට පිස්සු හැදෙන්න ඉඩ තිබුණ නිසා මම එයාගේ කඳට අවධානය යොමු කළා. ඒක ඊට වඩා අන්තයි. එයාට මනුෂ්‍ය හැඩරුවක් තිබුණා වුණත්, එයාගේ හම දකිනකොට මට මතක් වුණේ ලාච්චුවක් අස්සේ අවුරුද්දක් විතර දාලා තියපු මස් සැන්ඩ්විච්



එකක්. කොළ පාටින් පුල්ලි වැටී තිබුණු එයාගේ හම ගොඩනැගිලි තරම් විශාල බිබිලි සහ ගිනි කන්දක් යට යුග ගාණක් හිර වී සිටීමෙන් ඇති වූ කළු පාට කැළැල්වලින් වැහිලා. එයාට මිනිස් දෑත් තිබුණත්, ඒවා කෙළවර රාජාලියෙකුගේ වගේ උල් නිය පහුරු තිබුණා. එයාගේ උරග දෙපා කොරපොතුවලින් වැහිලා.

"ඔලිම්පියානුවෝ උන්ගේ අන්තිම වෑයමත් ගන්නවා," ක්‍රෝනොස් මහ හඬින් හිනා වුණා. "අනේ පවු."

සියුස් එයාගේ කරත්තයේ සිට අකුණු විදුලියකින් දමා ගැසුවා. එහි පිපුරුමෙන් ලෝකය ම ආලෝකවත් වුණා. එහි කම්පනය ඔලිම්පස්වල හිටපු මට පවා දැනුණා, ඒත් දූවිල්ල පහ වී ගියාට පස්සේ දකින්න ලැබුණේ ටයිපූන් තවමත් දෙපයින් නැගී සිටින හැටියි. එයාගේ විරූපී ඔළු ගෙඩිය මුඳුනේ දුම් දමන වළක් ඇතිව, වැටෙන්න යනවා වගේ අස්ථිර ලෙස අඩි කීපයක් තැබුවත්, එයා කේන්තියෙන් ගර්ජනා කරමින් නොනැවතී ඉදිරියට ම ආවා.

මගේ අත් පා ලිහිල් වෙන්න පටන් ගත්තා. ඒක ක්‍රෝනොස්ට පෙනුනේ නැහැ වගෙයි. එයාගේ සම්පූර්ණ අවධානය ම යොමු වී තිබුණේ සටනට සහ එයාගේ අවසන් ජයග්‍රහණය වෙතටයි. මට තව තත්පර කීපයක් අල්ලගෙන යන්න පුළුවන් වුණොත්, ඒ වගේම මගේ තාත්තා දුන්න පොරොන්දුව ඉටු කළොත්...

හඩ්සන් ගඟට බැස්ස ටයිපූන්ව යාන්තමින් කෙණ්ඩයේ මැදට විතර ගිලුණා.

දූත්, දුමාරය තුළින් පෙනෙන රූපයෙන් මම අයැදුවා. කරුණාකරලා, ඒක දූත් සිද්ධ වෙන්න ම ඕනෑ.

ප්‍රාතිහාර්යයකින් වගේ, දුමාරයෙන් සැදි පින්තූරයෙන් හක් ගෙඩියක් නද දෙනවා ඇහුණා. සමුද්‍රේ කැඳවුම් හඬ. පොසෙයිඩන්ගේ ඇමතුම් හඬ.

ටයිපූන් වටා පුපුරා හැලුණු හඩ්සන් ගඟ අඩි හතළිහක් උස රැළිවලින් කැළඹුණා. වතුරෙන් පිටට අලුත් කරත්තයක් පැන නැංගා- මෙය ඇදගෙන ආවේ වතුරේ හා ගුවනේ එක විදිහට ම පිහිනන සද්දන්ත හිපොකැම්පිලායි. මගේ තාත්තා නිල් පාට බල රැස් කදක් මැද දිලෙමින්, යෝධයාගේ දෙපා වටා රවුමක් කැරකුණා. පොසෙයිඩන් තව දුරටත් වියපත් කෙනෙක් වුණේ නැහැ. එයා දූත් ආයෙමත් ඉස්සර වගේම කළු රැවුලක් සහ අව්වට දුඹුරු පැහැ ගැන්වුණු හමක් ඇති

ශක්තිවන්තයෙක් වී සිටියා. එයා ත්‍රිශූලය වනද්දී, ගඟ එයාට ප්‍රතිචාර දක්වමින් රාක්ෂයා වටා පුනීල හැඩයේ වලාකුළක් නිර්මාණය කළා.

"නෑ!" තුෂ්ණීම්භූතව ගෙවූ මොහොතකට පස්සෙ ක්‍රෝනොස් ගර්ජනා කළා. "නෑ!"

"දූන්, මගේ ඥාතිවරුනේ!" පොසෙයිඩන්ගේ හඬ කොච්චර සද්දෙට ඇහුණ ද කියනවා නම්, ඒක ඇහෙන්නෙ දුමාරයෙන් සැදුණු රූපයෙන් ද, එහෙමත් නැත්නම් හැබෑවට ම ද, මට විශ්වාස වුණේ නැහැ. "ඔලිම්පස් වෙනුවෙන් පහර දෙමු!"

සද්දන්ත මෝරුන්ගේ, මකරුන්ගේ සහ මුහුදු අසුන්ගේ පිට නැගී රළ පදිමින් රණ ශූරයෝ වතුරෙන් පිට පැන්නා. එතැන සිටියේ සයික්ලොප්ස්ලාගෙන් සැදුණු මහා හමුදාවක්. එයාලව යුද්ධයට මෙහෙයවමින් පෙරමුණේ සිටියේ...

"ටයිසන්!" මම මොර ගැසුවා.

එයාට මාව නෑසෙන බව මම දැන සිටියා, ඒත් මම එයා දිහා බලා සිටියේ ඇස් අදහාගන්න බැරි පුදුමයෙන්. එයා මැජික් එකකින් වගේ ලොකු වෙලා. දැන් අඩි තිහක් විතර උසට හිටපු එයා, එයාගේ වැඩිමල් නෑදෑයෝ තරමට ම ලොකුයි. ඒ වගේම පළවෙනි වතාවට එයා සම්පූර්ණ යුද සන්නාහයකින් සැරසී සිටියා. එයාට පිටුපසින් ආවේ අත්-සියයක් ඇත්තා, බ්‍රයර්ස්.

හැම සයික්ලොප්ස් කෙනෙක් ම කෙළවර ඇවුළුම් කොකු ඇති, දිග ම දිග කළු යකඩ දම්වැලක් අත දරාගෙන හිටියා- ඒවායින් එකක් යුද නැවක් නැංගුරම් දමන්න පවා ප්‍රමාණවත්. එයාලා ඒවා මළපුඩු වගේ කරකවමින් ටයිපූන්ට උගුල් දමන්න පටන් ගත්තා. සතාගේ දෑත් සහ දෙපා වටා දම්වැල් දැමූ එයාලා, ඒවා නොනැවතී එතෙන්න උදම් රළ පාවිච්චි කරමින්, ටයිපූන්ව හෙමින් හෙමින් පටලවන්න ගත්තා. ටයිපූන් දඟලමින්, ගොරවමින් සයික්ලොප්ස්ලා කීප දෙනෙක් සමඟ ම දම්වැල් ඇදලා ගත්තා; ඒත් එතැන දම්වැල් මහ ගොඩක් තිබුණා. සයික්ලොප්ස් බල ඇණියේ බරට ම විතරක් ටයිපූන්ව බිමට ඇදෙන්න පටන් ගත්තා. පොසෙයිඩන් එයාගේ ත්‍රිශූලයෙන් ගසා රාක්ෂයාගේ උගුරු දණ්ඩ සිදුරු කළා. ඒ තුවාලයෙන් වැගිරුණු රන්වන් ලේ, අමරණීයයන්ගේ අයිකොර්වලින් ගොඩනැගිල්ලකටත් වඩා උස දිය ඇල්ලක් සැදුණා. ත්‍රිශූලය ආපසු පොසෙයිඩන්ගේ අතට පියඹා ආවා.



අනෙක් දෙවිවරු අමුතුවෙන් ප්‍රාණවත් වූ ජවයකින් පහර එල්ල කරන්න පටන් ගත්තා. ඒරීස් ටයිපූන්ගේ නහයට ඇන්නා. ආර්ටෙමිස් රාක්ෂයාගේ ඇහැට රිදී ඊතල දුසිමක් විද්දා. ඇපලෝ දියත් කළ දැවෙන ඊතල මුරය වැදී රාක්ෂයාගේ අමුඩයට ගිනි ඇවිළුණා. ඒ වගේ ම සියුස් යෝධයාට අකුණු පහරවල් එක පිට එක ගැසුවා. අන්තිමේ දී වතුර හෙමිහිට ඉහළ නගිමින් දළඹු කෝෂයක් වගේ ටයිපූන්ව වෙළා ගනිද්දී, දම්වැල්වල බරට එයාව ගිලෙන්න පටන් ගත්තා. වේදනාවෙන් බෙරිහන් දුන් ටයිපූන් අත් පා ගසමින් දැගලූ වේගයට හට ගත් රළ තට්ටු පහක් උස ගොඩනැගිලි තෙමා දමමින් සහ ජෝර්ජ් වොෂින්ග්ටන් පාලම මතින් වැගිරෙමින් ජර්සි වෙරළට කඩා වැදුණා- ඒත් එයා යට යද්දී මගේ තාත්තා එයා වෙනුවෙන් ම විශේෂ උමඟක් ගං පතුලේ විවර කළා- එයාව කෙලින් ම ටාටරස්වලට ම ගෙනයාමට, කෙළවරක් නැති වෝටර්ස්ලයිඩයක්. කැකෑරෙන දිය සුළියට යට වී යෝධයාගේ හිස නොපෙනී ගියා. ඊට පස්සෙ එයා යන්න ම ගියා.

"බාාාන්න්!!" ක්‍රෝනොස් බෙරිහන් දුන්නා. කඩුවෙන් දුමට පහර ගැසූ එයා රූපය තීරුවලට කපා දැමුවා.

"එයාලා මඟ එනවා," මම කිවුවා. "ඔයා පැරදිලා ඉවරයි."

"මං තාම පටන් ගත්තෙවත් නැහැ."

ඇස් අන්ධ කරවන වේගයකින් එයා ඉදිරියට ආවා. ග්‍රෝවර්- අර නිර්භීත, මෝඩ සැටර්- මාව ආරක්ෂා කරන්න උත්සාහ කළා, ඒත් ක්‍රෝනොස් එයාව පැත්තකට විසි කළේ රෙදි බෝනික්කෙක් වගෙයි.

පැත්තකට අඩිය තැබූ මම ක්‍රෝනොස්ගේ ආවරණයට යටින් ඇන්නා. ඒක හොඳ උපක්‍රමයක් වුණත්, අවාසනාවට, ලූක් ඒක දැනගෙන හිටියා. ඒ පහරට ප්‍රතිප්‍රහාර එල්ල කළ ලූක්, එයා මට මුලින් ම උගන්වා තිබූ උපායක් පාවිච්චි කරමින් මාව නිරායුද කළා. බිම දිගේ විසි වී ගිය මගේ කඩුව විවර වී තිබුණු පැළුම තුළට වැටුණා.

"ඕක නවත්තනවා!" ඇනබෙත් කොහෙදෝ ඉඳන් ආවා.

එයා දිහාවට වේගයෙන් හැරුණ ක්‍රෝනොස් බැක්බයිටර්ගෙන් පහරක් එල්ල කළා, ඒත් ඇනබෙත් කොහොමදෝ ඒ පහර එයාගේ කිණිසි මිටෙන් වැළකුවා. ඒ ක්‍රමය වේගවත් ම සහ අති දක්ෂ කිණිසි සටන්කරුවෙකුට විතරක් කළ හැකි දෙයක්. එයා ඒකට ශක්තිය හොයාගත්තෙ කොහෙන්ද කියලා නම් මගෙන් අහන්න එපා. ඒත් එයාලගේ තල එකිනෙක හරස් වී තියෙද්දී, ඉදිරියට තවත් අඩියක් තැබූ

එයා එක මොහොතකට ටයිටන් රජාව එක තැන රඳවාගෙන, එයා සමඟ මුහුණට-මුහුණ සිටියා.

"ලූක්," එයා දත්මිටි කාගෙන කතා කළා, "මට දැන් තේරෙනවා, ඔයාට මාව විශ්වාස කරන්න වෙනවා."

ක්‍රෝනොස් වියරුවෙන් ගර්ජනා කළා. "ලූක් කාසල්න් මැරිලා ඉවරයි! මම මගේ නියම රූපාකාය ආරූඪ කරගනිද්දී එයාගේ ඇඟ අළු වෙලා යයි!"

මම හෙලවෙන්න උත්සාහ කළා, ඒත් මගේ ඇඟ තැවතත් ගල් ගැහිලයි තිබුණේ. පහර කාලා තුවාල වෙලා, මහන්සියෙන් බාගෙට පණ ගිය ඇනබෙත්ට ක්‍රෝනොස් වගේ ටයිටන් කෙනෙක් එක්ක සටන් කරන්න ශක්තිය කොහෙන්ද?

ක්‍රෝනොස් එයාව තල්ලු කරමින්, කඩු තලය ගලවගන්න උත්සාහ කළා, ඒත් ඇනබෙත් එයාව උන් තැන ම රඳවාගෙන සිටියා. ක්‍රෝනොස් කඩුව ඇනබෙත්ගේ බෙල්ල දෙසට තෙරපද්දී ඇනබෙත්ගේ දැත් වෙවුලුවා.

"ඔයාගේ අම්මා," ඇනබෙත් ගෙරෙව්වා. "එයා ඔයාගේ ඉරණම දැක්කා."

"ක්‍රෝනොස්ට සේවය කරන එක!" ටයිටන් ගිගුරුවා. "මේක තමයි මගේ ඉරණම."

"නෑ!" ඇනබෙත් තදින් කිවුවා. එයාගේ ඇස්වල කඳුළු පිරෙමින් තිබුණා, ඒත් ඒ දුකට ද නැත්නම් වේදනාවට ද, මට තේරුණේ නැහැ. "අවසානය ඒක නෙවෙයි, ලූක්. අනාවැකිය- ඔයා කරන්න යන දේ එයා දැක්කා. ඒක අදාළ වෙන්නෙ ඔයාටයි!"

"මං තුඹව පොඩි කරලා දානවා, ළමයා!" ක්‍රෝනොස් කෑගැහුවා.

"ඔයා එහෙම කරන්නෙ නැහැ," ඇනබෙත් කිවුවා. "ඔයා පොරොන්දු වුණා. ඔයා මේ දැන් පවා ක්‍රෝනොස්ට බාධා කරනවා."

"ඔය බොරු!" ක්‍රෝනොස් නැවත වරක් තල්ලු කළා, මේ වතාවේ ඇනබෙත්ට එයාගේ සමබරතාවය අහිමි වුණා. ක්‍රෝනොස් එයාගේ නිදහස් අතින් ඇනබෙත්ගේ මුහුණට පහර දුන්නා ම, එයාව ආපස්සට ලිස්සා ගියා.



මම මගේ මුළු ධෛර්යය ම එක්කාසු කරගත්තා. මට නැගිටගන්න පුළුවන් වුණත්, ඒක දැනුණේ හරියට ආයෙමත් වතාවක් අහසේ බර උසුලාගෙන ඉන්නවා වගෙයි.

ක්‍රෝනොස් කඩුව ඔසවාගෙන ඇනබෙත්ට ඉහළින් නැගී සිටියා.

ඇනබෙත්ගේ කට කොණකින් ලේ බිංදු වැගිරුණා. එයා උගුරෙන් කතා කළා, "එක පවුලක්, ලූක්. ඔයා පොරොන්දු වුණා."

මම වේදනාබර පියවරක් ඉදිරියට තැබුවා. එතා පැත්තේ හේරාගේ සිංහාසනය අසල ග්‍රෝවරුත් ආපසු දෙපයින් නැගී සිටියා, ඒත් මං වගේ ම එයත් ඉදිරියට එන්න වලි කනවා වගෙයි පෙනුණේ. අපි දෙන්නගෙන් කාටවත් ඇනබෙත් අහලකටවත් යන්න ලැබෙන්න කලින්, ක්‍රෝනොස් අස්ථිර ලෙස එහා මෙහා වැනුණා.

එයා ඇනබෙත්ගේ අතේ තිබුණු කිණිස්ස දිහාවත්, එයාගේ මුහුණේ තිබුණු ලේ දිහාවත් පුදුමයෙන් බලා සිටියා. "පොරොන්දුව."

ඊට පස්සෙ එක්වර ම එයා පණ අදින්න ගත්තේ හරියට එයාට හුස්ම ගන්න බැහැ වගෙයි. "ඇනබෙත්..." ඒත් ඒ ටයිටන්ගේ කටහඬ නෙවෙයි. ඒ හඬ ලූක්ගෙයි. එයාට එයාගෙ ම සිරුර පාලනය කරගන්න බැරිව වගේ ඉදිරියට පැකිළී වැටුණා. "ඔයාගේ ලේ ගලනවා නේ..."

"මගේ කිණිස්ස" ඇනබෙත් එයාගේ කිණිස්ස ඔසවන්න උත්සාහ කළත්, ඒක එයාගේ අතින් ගිලිහුණා. එයාගේ අත අසාමාන්‍ය ඉරියව්වකට නැමිලයි තිබුණේ. එයා බැගෑපත් බැල්මෙන් මගේ දිහා බැලුවා. "පර්සි, කරුණාකරලා...."

මට ආයෙමත් අත් පා සොලවන්න හැකි වී තිබුණා.

ඉස්සරහට පැන්න මම එයාගේ කිණිස්ස අහුලා ගත්තා. ලූක්ගේ අතේ තිබූ බැක්බයිටර්ට මම ගැහූ පයින් පාරට ඒක විසිවෙලා ගිහින් උළුන තුළට වැටුණා. ලූක් මං ගැන සැලකිල්ලක් දැක්වූයේ ම නැති තරම්. එයා ඇනබෙත් දිහාවට අඩිය තැබුවා. ඒත් මම ඒ දෙන්නා අතරට පැන්නා.

"එයාට අත තියන්නෑ," මම කිවුවා.

එයාගේ මූණ හරහා කෝන්තිය වාන් දැමුවා. ක්‍රෝනොස්ගේ කටහඬ ගෙරෙව්වා: "ජැක්සන්..." ඒක මම හිතින් මවාගත්ත දෙයක් ද,

එහෙම නැත්නම් ඇත්තටම එයාගේ මුළු ඇඟ ම රත්වලට හැරෙමින් දිලිසුණා ද?

එයා ආයෙමත් තදින් හුස්ම ඇද්දා. ලූක්ගේ කටහඬ: "එයා වෙනස් වෙනවා. උදවු කරන්න. එයා... එයා දැන් සම්පූර්ණයෙන් ම වගේ ලෑස්තියි. එයාට තවත් මගේ ඇඟ ඕනෑ වෙන්නෙ නැහැ. කරුණාකරලා-"

"නෑ!" ක්‍රෝනොස් මොරගෑවා. එයා කඩුව හොයමින් වටපිට බැලුවා, ඒත් දැන් ඒක තිබුණේ උඳුනේ අඟුරු අතර දිලිසෙමිනුයි.

එයා පැකිළෙන ගමනින් ඒ දිහාවට ගියා. මම එයාව නවත්වන්න උත්සාහ කරද්දී, එයා මාව තල්ලු කළ වේගයට උඩින් විසිවුණ මම ඇනබෙත් අසලට ම වැටුණේ, ඇතීනාගේ සිංහාසනයේ පාදමේ ඔළුව වද්දා ගනිමිනුයි.

"කිණිස්ස, පර්සි," ඇනබෙත් කෙඳිරුවා. එයා වේගයෙන් හුස්ම ගත්තා. "වීරයා... ශාපලත් තලය..."

මගේ පෙනීම ආයෙමත් නාභිගත වෙද්දී මට දකින්න ලැබුණේ ක්‍රෝනොස් එයාගේ කඩුවට අත යවන හැටියි. ඒත් එක්ක ම එයා වේදනාවෙන් උඩු බුරමින් ඒක අත ඇරියා. එයාගේ අත් පිළිස්සී දුම් දැමුවා. උඳුන තුළ ගින්න රතු පාටින් ගිනියම් වී තිබුණේ හරියට දැකැත්ත එයට ගැළපෙන්නෙ නැහැ වගෙයි. අළු අතර සැලෙමින් දිලිසුණ හෙස්ටියාගේ රූපයක් ක්‍රෝනොස්ට අප්‍රසාදය පළ කරමින් රවනවා මට පෙනුණා.

ආපසු හැරුණු ලූක් එයාගේ පිළිස්සුණු අත බදාගෙන ඇද වැටුණා. "කරුණාකරලා, පර්සි..."

අමාරුවෙන් දෙපයින් සිටගත් මම කිණිස්ස අරන් එයා ළඟට ගියා. මම එයාව මරන්න ඕනෑ. සැලසුම වුණේ ඒකයි.

මම සිතමින් සිටි දේ ලූක් දැනගෙන හිටියා වගෙයි පෙනුණේ. එයා දෙතොල් තෙත් කරගත්තා. "ඔයාට බැහැ... ඔයාට තනියම ඒක කරන්න බැහැ. එයා මගේ පාලනය යට කරලා දායි. මගේ අතින් විතරයි... එතැන මම දන්නවා. මට පුළුවන්... පුළුවන් එයාව පාලනය කරගන්න."

දැන් නම් එයා සිකුරට ම දිලිසෙමින් සිටියා. එයාගේ හම දුම් දාන්න පටන් ගත්තා.



පහර දෙන්න කිණිස්ස එසවූ මම ග්‍රෝවර්ගේ දෑතේ සිටි ඇනබෙත් දිහා බැලුවා. ඒත් එක්ක ම අන්තිමේ දී එයා කියන්න උත්සාහ කළ දේ මට තේරුම් ගියා.

වීරයා ඔයා නෙවෙයි, රේචල් කිවුවෙ එහෙමයි. ඒක ඔයා කරන දේවල්වලට බලපායි.

"කරුණාකරලා," ලූක් කෙඳිරි ගෑවා. "වෙලාව නෑ."

ක්‍රෝනොස් එයාගේ නියම රූපාකායට පත් වුණොත්, ඊට පස්සේ එයාව නවත්වන්න කොහෙත්ම බැරි වෙනවා. එයා එක්ක බලද්දී ටයිෆූන් නිකං ම නිකං පඟර නැට්ටෙක් වගේ පෙනෙයි.

මහා අනාවැකියේ එක පේළියක් මගේ ඔළුව ඇතුළේ දෝංකාර දුන්නා: ශාපලත් තලයෙන් වීරයාගේ ආත්මය නෙලා ගනීවි. මගේ මුළු ලෝකය ම උඩු යටිකුරු වෙද්දී, මම ලූක්ට කිණිස්ස දුන්නා.

ග්‍රෝවර් කෑගැසුවා. "පර්සි? ඔයාට... මේ..."

පිස්සු හැදිල ද? සිහිය විකල් වෙලා ද? මොළේ කොලොප්පං වෙලා ද. සමහරවිට.

ඒ කොහොම වුණත් ලූක් කිණිසි මිට ඩැහැගන්න දිහා මම බලා සිටියා.

මම එයා ඉදිරියේ සිටගෙන සිටියා- කිසිම ආරක්ෂාවක් නැතිව.

එයාගේ සන්නාහයේ දෙපස පටි ලිහා දැමූ ලූක්, එයාගේ වම් බාහුවේ යටි පැත්තේ එක පුංචි තැනක හම නිරාවරණය කරගත්තා- ඒක පහරක් එල්ල කරන්න හිතන්නවත් බැරි තැනක්. අමාරුවෙන් වුණත් එයා එයාට ම කිණිස්සෙන් ඇනගත්තා.

ඒක ඒ තරම් ගැඹුරු කැපුමක් නොවුණත්, ලූක් මොර ගැහුවා. එයාගේ දෑස් ලෝදිය වගේ දිලිසුණා. මාව බිමට ඇද වට්ටමින් සිංහාසන ශාලාව දෙදුරුවා. ලූක් වට කරගත් ශක්ති කදම්බයක් වඩ වඩාත් දීප්තිමත්ව වැඩෙන්න ගත්තා. දෑස් තදින් පියාගත් මට න්‍යෂ්ටික පිපුරුමක් වගේ බලයක් මගේ හමේ දිය බුබුළු ඇති කරමින් මගේ තොල් පුපුරවමින් පැතිරෙනවා දැනුණා.

සෑහෙන වෙලාවක් යනතුරු සියල්ල නිහඬ වුණා.

දෑස් ඇර බලද්දී මට දකින්න ලැබුණේ ගිනි උඳුන ළඟ අත් පා විහිදාගෙන වැටී සිටි ලූක්වයි. එයා වටා පොළොව මත අළුවලින්

Scanned with CamScanner

තළු ගැසුණු රවුමක් ඇති වී තිබුණා. උණු වූ ලෝහ ගොඩකට දිය වී ගිය ක්‍රෝනොස්ගේ දෑකැත්ත, දුන් කම්මල්කරුවෙකුගේ ලිපක් වගේ දිලිසුණු උඳුනේ අඟුරු මතට වැස්සුණා.

ලූක්ගේ සිරුරේ වම් ඇලය ලේ වැකිලා. එයාගේ දෑස් ඇරිලා තිබුණා- ඒවා දූන් ඉස්සර වගේ ම නිල් පාට වුණා. එයා හුස්ම ගනිද්දි ගැඹුරු හඬක් නැඟුණා.

"හොඳ... තලය," එයා රළු හඬින් කෙඳිරුවා.

මම එයා ළඟ දණ ගසාගත්තා. ඇනබෙත් ග්‍රෝවර්ගේ උදවු ඇතිව තොණ්ඩි ගසමින් එතැනට ආවා. ඒ දෙන්නගෙ ම ඇස්වල කඳුළු පිරිලා.

ලූක්ගේ බැල්ම ඇනබෙත් දිහාවට හැරුණා. "ඔයා දැනගෙන හිටියා. මම ඔයාව මරන්නයි හැදුවෙ, ඒත් ඔයා දැනගෙන හිටියා..."

"ෂ්ෂ්ෂ්," ඇනබෙත්ගේ හඬ වෙවුලුවා. "අන්තිමේ දී ඔයා වීරයෙක් වුණා, ලූක්. ඔයා ස්වර්ගයට යාවි."

එයා දුබල ලෙස ඔළුව වැනුවා. "හිතන්නෙ... ආපහු ඉපදෙන්න. තුන් පාරක් උත්සාහ කරනවා. ආශිර්වාදිතයින්ගේ දූපතට."

ඇනබෙත් නහය ඉහළට ඇද්දා. "ඔයා හැම වෙලාවෙ ම ඕනැවට වඩා බර ගත්තා."

ලූක් එයාගේ දවී කර වූ අත එසෙව්වා. ඇනබෙත් ඒ ඇඟිලි තුඩු අතගෑවා.

"ඔයා..." ලූක් කහිද්දි එයාගේ තොල් රතු පාටින් දිලිසුණා. "ඔයා මට ආදරේ කරා ද?"

ඇනබෙත් කඳුළු පිස දැමුවා. "එක කාලයක් මං හිතුවා... මෙහෙමයි, මං හිතුවා..." එයා මගේ දිහා බැලුවේ හරියට මම තවමත් මෙතැන ඉන්න බව තහවුරු කරගන්න වගෙයි. ඒ වෙලාවේ මට තේරුම් ගියේ මමත් කරමින් සිටියේ ඒ දේ ම බවයි. මුළු ලෝකය ම කඩා වැටෙමින් තිබුණත්, මට වැදගත් වූ එක ම දේ වුණේ ඇනබෙත් තවමත් ජීවතුන් අතර සිටීම විතරයි.

"ඔයා මට සහෝදරයෙක් වගෙයි, ලූක්," එයා මෘදුව කිවුවා. "ඒත් මම ඔයාට ආදරේ කළේ නැහැ."



එයා ඔළුව වැනුවේ, ඒක බලාපොරොත්තු වුණා වගෙයි. එයාගේ මූණ වේදනාවෙන් ඇඹරුණා.

"අපිට ඇම්බ්‍රෝසියා ගේන්න පුළුවන්," ග්‍රෝවර් කිවුවා. "අපිට පුළුවන්-"

"ග්‍රෝවර්," ලූක් කෙළ පොදක් ගිල්ලා. "මගේ ජීවිතේ දී හම්බ වුණ නිර්භීත ම සැටර් තමයි ඔයා. ඒත් නැහැ. මේක සනීප කරන්න බැහැ..." තවත් කැස්සක්.

එයා මගේ කමිස අත තදින් අල්ලා ගනිද්දි, මට දැනුණේ එයාගේ හම ගිනි ගන්නවා වගෙයි. "ඊතන්. මම. හිමිකම් නොකියපු හැමෝම. ඒකට ඉඩ තියන්න එපා... ඒක ආයෙමත් සිද්ධ වෙන්න ඉඩ තියන්න එපා."

එයාගේ දෑස්වල කේන්තියක් වගේ ම ආයාචනයකුත් තිබුණා.

"මම ඒකට ඉඩ තියන්නෙ නැහැ," මම කිවුවා. "මම පොරොන්දු වෙනවා."

. ලූක් ඔළුව වැනුවා, ඊට පස්සේ එයාගේ ග්‍රහණය ලිහුණා.

විනාඩි කීපයකට පස්සෙ දෙවිවරු එයාලගේ සම්පූර්ණ යුද ආයිත්තම් සමඟ සිංහාසන ශාලාව දෙදරවමින් ආවේ සටනක් අපේක්ෂාවෙනුයි.

ඒත් එයාලට හොයාගන්න ලැබුණේ ගිනි උඳුනේ මලානික උණුසුම් එළිය මැද, බිඳුණු අර්ධ-ලෝහිතයෙකුගේ සිරුර වටකර සිටගෙන සිටින ඇනබෙත්, ග්‍රෝවර් සහ මාවයි.

"පර්සි?" මගේ තාත්තගේ කටහඬේ තිබුණේ විමතියක්. "මොකද... මොකද මේ?"

ආපසු හැරුණු මම ඔලිම්පියානුවන්ට මුහුණ පෑවා.

"අපිට ආදාහන සළුවක් ඕනෑ වෙනවා," මම නිවේදනය කරද්දි මගේ හඬ බිඳුණා. "හර්මීස්ගේ පුතෙකුට ආදාහන සළුවක්."

## 20

# අපි මාහැඟි ත්‍යාග දිනාගත්තා

ලූක්ගේ සිරුර ගෙනියන්න ඉරණමේ ආච්චිලා තුන්දෙනා ම ආවා.

ඒ වයසක ගෑනු තුන් දෙනාව මම අවුරුදු ගාණකින්- හරියට ම කියනවා නම්, මට අවුරුදු දොළහේ දී පාර අයිනේ පලතුරු තට්ටුවක් ළඟ දී එයාලා ජීවන කෙන්දක් කපා දමනවා දකින්න ලැබුණට පස්සෙ ම දැකලා තිබුණේ නැහැ. ගොතන කටු සහ කැටි නූල් මලු අතැතිව ඉන්න මේ හොල්මන් වගේ නාකි ආච්චිලා තුන් දෙනා ඒ තාලේ වගේ ම දැනුත් මාව නොසෑහෙන්න බය කළා.

එයාලගෙන් එක්කෙනෙක් මගේ දිහා බැලුවා, එයා වචනයක්වත් නොකිවත්, ඒ මොහොතේ වචනාර්ථයෙන් ම මගේ ජීවිතේ මගේ ඇස් ඉදිරිපිට දිස් වුණා. එක්වර ම මම අවුරුදු විස්සක තරුණයෙක් වුණා. ඊට පස්සෙ මම මැදි වියේ පිරිමියෙකුට හැරුණා. ඊටත් පස්සෙ මම මහලු වෙලා අබල දුබල වුණා. මගේ ඇඟේ සියලූ ම ශක්තිය සිඳී ගියා. ඒ වගේ ම මට මගේ සොහොන් කොත සහ විවෘත මිනී වළත්, ඒක තුළට මිනී පෙට්ටියක් පහත් කරන හැටිත් පෙනුණා. මේ සියල්ල සිදුවෙන්න ගියේ තත්පරයකටත් අඩු කාලයක්.

ඒක ඉවරයි, එයා කිව්වා.

ඉරණම නිල් පාට කැටි නූල් කැබැල්ලක් ඔසවා පෙන්නුවා- මීට අවුරුදු හතරකට කලින් එයාලා කපා දමනවා මට දකින්න ලැබුණු



ජීවන කෙන්ද ඒකමයි කියලා මට තේරුණා. මම හිතාගෙන හිටියේ ඒ මගේ ජීවිතේ කියලයි. ඒත් ඒක ලූක්ගේ බව දැන් මට තේරුණා. එයාලා මට පෙන්වා තිබුණේ සියල්ල නිවැරදි කිරීමට කැප කරන්න සිදු වෙන ජීවිතයයි.

දැන් සුදු-සහ-කොළ පාට ආදාහන සළුවකින් වෙළා තිබූ ලූක්ගේ දේහය ඔසවාගත් එයාලා එය රැගෙන සිංහාසන ශාලාවෙන් පිටතට යන්න පටන් ගත්තා.

"ටිකක් ඉන්න," හර්මීස් කිව්වා.

පණිවුඩකරුවන්ගේ දෙවියා එයාගේ සාම්ප්‍රදායික ඇඳුම් කට්ටලය වූ සුදු පාට ග්‍රීක ලෝගුවකින්, සෙරෙප්පු ජෝඩුවකින් සහ හිස්වැසුමකින් සැරසී සිටියා. එයා ඇවිද යද්දී හිස්වැසුමේ වූ පියාපත් සැලුණා. එයාගේ කැඩූසියස් එක වටා වෙළී සිටි ජෝර්ජ් සහ මාර්තා හෙමිහිට මිමිණුවා: අනේ ලූක්, අසරණ ලූක්.

මට මේ කාසලන්ව, එයාගේ මුළුතැන්ගෙයි තනිවෙලා, ආයේ කිසිදාක ගෙදර නොඑන පුතා වෙනුවෙන් විස්කෝතු පුළුස්සමින්, සැන්ඩ්විච් පිළියෙළ කරමින් ඉන්න අසරණ අම්මාව සිහි වුණා.

ලූක්ගේ මුහුණ මතින් පොරෝණාව ඉවත් කළ හර්මීස් එයාගේ නළල සිපගත්තා. එයා පෞරාණික ග්‍රීක බසින් මොනවදෝ මිමිණුවා- අවසන් ආශිර්වාදයක්.

"සුභ ගමන්," එයා මිමිණුවා. ඊට පස්සේ එයා ඔළුව වනලා, ඉරණමේ තුන් කට්ටුවට එයාගේ පුතාගේ දේහය ඉවතට රැගෙන යන්න අවසර දුන්නා.

එයාලා පිට වී යද්දී, මම මහා අනාවැකිය ගැන කල්පනා කළා. දැන් එහි පදවල තේරුම මට හොඳින් වැටහුණා. ශාපලත් තලයෙන් වීරයාගේ ආත්මය නෙලා ගනීවි. ඒ කියවුණු වීරයා තමයි ලූක්. ශාපලත් තලය වුණේ ලූක් සෑහෙන කාලයකට කලින් ඇනබෙත්ට දීලා තිබුණු කිණිස්සයි- ඒක ශාපලත් එකක් වුණේ ලූක් දුන් පොරොන්දුව බිඳ දමලා, එයාගේ යාළුවන්ට ද්‍රෝහී වූ නිසයි. එක ම තීරණයක් ඔහුගේ කාලය අවසන් කරමින්, කියලා කියවුණේ ලූක් අතට කිණිස්ස දෙන්න මම ගත් තීරණය සහ ඇනබෙත් විශ්වාස කළා වගේ ම, වරද නිවැරදි කරන්න තවමත් ලූක්ට හැකියාව ඇති බව විශ්වාස කරන්න මම තෝරාගැනීමයි. ඔලිම්පස් ආරක්ෂණය හෝ නාශනය කරාවි. එයා

Scanned with CamScanner

තමන්ගේ ජීවිතය කැප කරලා, ඔලිම්පස් බේරගත්තා. රේචල් කිව්වා හරි. අන්තිමේ දී, වීරයා මම නෙවෙයි. ඒ වීරයා වුණේ ලූක්.

ඒ වගේ ම මට තවත් දෙයක් තේරුම් ගියා: ස්ටයික්ස් ගඟට බහින වෙලාවේ තමන්ගේ මනුෂ්‍ය ජීවිතයට ඇඳී ඉන්න යම්කිසි වැදගත් දෙයක් මත හිත ඒකාග්‍ර කරගන්න ලූක්ටත් සිද්ධ වෙන්න ඇති. එහෙම නැත්නම් එයාව දියවෙලා යන්න තිබුණා. ඒ අවස්ථාවේ දී මට දකින්න ලැබුණේ ඇනබෙත්වයි, ඒ වගේ ම ලූක්ටත් පෙනෙන්න ඇත්තේ එයාවමයි කියලා මට හැඟුණා. එයා හිතේ මවාගෙන ඇත්තේ හෙස්ටියා මට පෙන්වූ අර දසුන- තාලියා සහ ඇනබෙත් සමඟ එයා ගත කළ පරණ ලස්සන කාලයයි, එයාලා එක පවුලක් වෙනවා කියලා එයා පොරොන්දු වුණ කාලයයි. සටනේ දී ඇනබෙත්ට තුවාල කරන්න වීමෙන් ඇති වූ කම්පනය එයාට ඒ පොරොන්දුව සිහිපත් කරන්න මඟ පෑදුවා. එයින් එයාගේ මනුෂ්‍ය විඥානය නැවත පාලනය අතට අරන්, ක්‍රෝනොස්ව පරාද කළ යුතු බව තේරුම් ගත්තා. අපි හැමදෙනාව ම බේරාගත්තේ එයාගේ එක ම දුර්වල තැන- එයාගේ අකිලිස් ලපයයි.

මට එහා පැත්තේ සිටි ඇනබෙත්ගේ දණහිස් වාරු නැතිව ගියා. මම එයාව අල්ල ගනිද්දී එයා වේදනාවෙන් කෑගැසුවා. මම ඩැහැගෙන ඇත්තේ එයාගේ කැඩුණු අත බව මට තේරුණේ එතකොටයි.

"ඔහ්, දෙයියනේ," මම කිව්වා. "ඇනබෙත්, මට සමා වෙන්න."

"ඒකට කමක් නෑ," කියපු එයා මගේ අතේ දී ම සිහිසුන් වුණා.

"එයාට උදවු ඕනෑ!" මම මොර ගැසුවා.

"මං ඒක බලාගන්නම්." ඇපලෝ ඉදිරිපත් වුණා. එයාගේ දූවෙන සන්නාහයේ දීප්තියට එයා දිහා බලන්නත් අමාරු වුණා. ඒකට ම කැපෙන එයාගේ රේ-බෑන් අව් කණ්ණාඩි යුවළ සහ පරිපූර්ණ හිනාව නිසා එයාව පෙනුණේ යුද සන්නාහයක් නිරූපණය කරන මෝස්තර නිරූපණ ශිල්පියෙක් වගෙයි. "වෛද්‍ය ශාස්ත්‍රයේ දෙවියා ඔබේ සේවයට."

ඇනබෙත්ගේ මුහුණ මතින් අත යැවූ එයා මන්ත්‍රයක් ජප කෙරුවා. එසැණින් ම සීරුම් තුවාල මැකී ගියා. එයාගේ කැපුම් සහ තුවාල අතුරුදහන් වුණා. එයාගේ අතේ ඇද ඇරුණා. ඇනබෙත් නින්දෙන් ම සුසුමක් පිට කළා.

ඇපලෝ දත් නියෙව්වා. "විනාඩි දෙක තුනකින් එයාව සනීප වෙයි. අපේ ජයග්‍රහණේ ගැන කවියක් අමුණන්න මට ඒ වෙලාව



හොඳටම ඇති: 'ඇපලෝ සහ ඔහුගේ මිතුරෝ ඔලිම්පස් බේරාගනී.' එහෙම හොඳයි, නේද්?"

"ස්තූතියි, ඇපලෝ," මම කිව්වා. "මම, මේ, ඔයාට කවිය ගොතන්න දීලා යන්නම්."

ඊළඟ පැය කීපය ගෙවුණේ හීයක වේගයෙන්. මගේ අමුතු ඉල්ලීම අහලා සියුස් ඇහි පිල්ලමක්වත් ගැහුවේ නැහැ. අසුරක් ගැසූ එයා, ඊට පස්සේ එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලේ මුදුන දූන් නිල් පාටින් දූල්වෙන බව මට දූනුම් දුන්නා. ඒක දූකලා ගොඩක් මිනිස්සු පුදුම වේවි, ඒත් එයින් අදහස් වෙන දේ: මම ජීවතුන් අතර ඉන්න බව, ඔලිම්පස් සුරැකී ඇති බව මගේ අම්මා තේරුම් ගනීවි.

දෙවිවරු සිංහාසන ශාලාව පිළිසකර කරන්න පටන් ගත්තා. සුපිරි බල ඇති දොළොස් දෙනෙක් එකට එකතු වෙලා කරපු ඒ වැඩේ හිතාගන්නත් බැරි තරම් වේගයෙන් අවසන් වුණා. ග්‍රෝවර් සහ මම තුවාල ලැබූ අයට සාත්තු සප්පායම් කළා. අහස් පාලම ප්‍රතිසංස්කරණය කරාට පස්සේ අපිට යුද්ධයෙන් නොමැරී බේරුණු අපේ යාළුවන්ව පිළිගන්න ලැබුණා. සයික්ලොප්ස්ලා තාලියාව ඇද වැටුණු ප්‍රතිමාව යටින් ගලවාගෙන තිබුණා. එයාට කිහිලි කරු පාවිච්චි කරන්න සිදු වී තිබුණත්, ඒ ඇරෙන්න එයා යහතින් සිටියා. කොනර් සහ ට්‍රැවිස් ස්ටොල් දෙන්නටත් සිදු වී තිබුණේ සුළු තුවාල කීපයක් විතරයි. එයාලා නගරය වැඩිය මංකොල්ල කෑවෙත් නැහැ කියලා ඒ දෙන්නා මට දිවුරුවා. මගේ දෙමව්පියෝ යහතින් ඉන්න බව එයාලා මට කිව්වා. හැබැයි එයාලට ඔලිම්පස් කන්දට ඇතුළු වෙන්න අවසර ලැබිලා තිබුණේ නැහැ. ගල් ගොඩ තුළින් කයිරොන්ව හාරලා ඉවතට අරන් තිබුණු මිසිස් ඕ'ලෙරී, එයාව අරන් කඳවුරට දුවලා. අපේ නාකි නරාශ්වයා ගැන ස්ටොල් සහෝදරයෝ දෙන්නා ටිකක් කනස්සලු වෙනවා වගෙයි පෙනුණේ, ඒත් අඩු තරමේ එයා පණ පිටින් හිටියා නේ. යුද්ධයේ අවසාන භාගයේ දී රේචල් එලිසබෙත් ඩෙයාර් එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලෙන් එළියට දුවනවා දූකපු බව කේටි ගාර්ඩිනර් වාර්තා කළා. එයාට කිසිම කරදරයක් වුණ පාටක් පේන්න තිබිලා නැහැ, ඒත් එයා කොහේ ගියා ද කියලා කවුරුවත් දූනගෙන හිටියෙ නැහැ. මගේ හිතටත් ඒක වධ දුන්නා.

ඔලිම්පස්වලට ආව නිකෝ ඩි ආන්ජෙලෝට වීරයෙකුගේ පිළිගැනීමක් ලැබුණා. දක්ෂිණායනයේ දී පමණක් ඔලිම්පස්වලට ඇතුළු වෙන්න අවසර ඇති බව නොසලකා හේඩීසුත් එයා එක්ක ම

ආවා. හැදැයෝ එයාගේ පිටට තට්ටු කරද්දි මරණයට අධිපති දෙවියෝ පුදුමයෙන් ගල් ගැහුණා වගෙයි පෙනුණේ. මට හිතෙන්නේ එයාට මීට කලින් කවදාවත් ඒ වගේ උද්යෝගිමත් පිළිගැනීමක් ලැබිලා නැතිව ඇති.

උයිස් කුට්ටිය ඇතුළේ හිර වී ඉඳීම නිසා තවමත් වෙවුලමින් ත්ලැරිස් ඇතුළට එද්දී ඊරිස් මොරගැසුවා, "මේ ඉන්නෙ මගේ කෙල්ල!"

පුද්ධයට අධිපති දෙවියා ත්ලැරිස්ගේ කොණ්ඩය අවුස්සමින්, එයාගේ පිටට ගැහුවේ, මෙච්චර කාලයකට දකින්න ලැබුණු හොඳ ම රණ කුරයා එයා බව කියමිනුයි. "අර ඩ්‍රැකන්ව පෙති ගහපු විදිහ? අන්න ඒක තමයි මං කියන්නේ!"

ත්ලැරිස් හිටියේ හොල්මන් වෙලා වගෙයි. එයාට කරන්න පුළුවන් වුණ එක ම දේ වුණේ ඔළුව වනන එකයි. කොයි වෙලාවේ හරි එයාගේ කාක්කා ගෙන්න පටන් ගනීවි හිතලා බයෙන් ඉන්නවා වගේ කදින් ඇඹි පිය ගෙන එකයි විතරයි. ඒත් අන්තිමේ දි එයාගේ මූණටත් හිනාවක් ආවා.

හේරා සහ හෙෆාස්ටස් මාව පහු කරගෙන ගියා. එයාගේ සිංහාසනය උඩට මම නැගපු එක ගැන හෙෆාස්ටස් ටිකක් අවලාද කිවුවා වුණත්, එයා කිතුවේ මම "නියමෙට වැඩේ දුන්නා," කියලයි.

හේරා පිළිකුලෙන් වගේ නහයෙන් පිඹ්බා. "මං හිතන්නේ මට දන් මයාවයි අර පුංචි කෙල්ලවයි විනාශ කරන්න වෙන්නෙ නැති වෙයි."

"ඇනබෙත් තමයි ඔලිම්පස් බේරගත්තේ," මම එයාට කිවුවා. "ත්‍රෝනොස්ව නවත්තන්න කියලා ලූක්ට ඒත්තු ගැන්නුවේ එයා."

"හ්ම්ම්," හේරා කේන්තියෙන් පිඹිමින් එතැනින් යන්න ගියා, ඒ කොහොම වුණත් අපේ ජීවිතවලට අනතුරක් නැතිවෙයි කියලා- අඩු තරමේ ටික කාලෙකටවත්- මම තේරුම් ගත්තා.

ඩයනයිසියස්ගේ ඔළුව තවමත් වෙළුම් පටිවලින් ඔතලයි තිබුණේ. මගේ උඩ ඉඳන් පහළට ම බලපු එයා, "හොඳයි, පර්සි ජැක්සන්. පොලක්ස් පණ පිටින් ඉන්න බව මට පේනවා, ඒ නින්දා මං හිතන්නෙ ඔයා තනිකර ම මෝඩයෙක් නෙවෙයි. එහෙම වෙලා තියෙන්නෙ මම දුන්න පුහුණුවීම්වලට පිං සිද්ධ වෙන්න, මං හිතන්නේ."

"අ්ර්ම්, ඔව්, සර්," මම කිවුවා.



මිස්ටර් ඩී ඔළුව වැනුවා. "මගේ නිර්භීතකමට ස්තුතියක් විදිහට, සියුස් අර කාලකණ්ණි කඳවුරේ මට ගෙවන්න වෙලා තිබුණ පරිවාස කාලෙන් බාගයක් කපලා දම්මා. දැන් මට අවුරුදු සීයක් වෙනුවට, තව අවුරුදු පනහක් විතරයි ඉන්න තියෙන්නේ."

"අවුරුදු පනහක්, එහ්?" ඒ තරම් කාලයක් ජීවත් වෙන්න ලැබුනොත්, මට නාකි වෙනකල් ම ඩයනයිසියස් එක්ක ඉහ ගහගෙන ඉන්න වෙන විදිහ මැවිලා පෙනුණා.

"ඔච්චර සන්තෝස වෙන්නෙපා, ජැක්සන්," එයා කියද්දි, මට තේරුම් ගියේ එයා මගේ නම හරියට කියනවා කියලයි. "ඔයාලගේ ජීවිත කාලකණ්ණි කරන්න මම තාම සැලසුම් කරනවා."

මට හිනා නොවී ඉන්න බැරි වුණා. "නැතුව කොහොමද?"

"එතකොට අපිට එකිනෙකා තේරුම් ගන්න පුළුවන් නේ." අනෙක් පැත්ත හැරුණු එයා ගින්නෙන් පිළිස්සී තිබුණු එයාගේ මිදි වැල් සිංහාසනය පිළිසකර කරන්න පටන් ගත්තා.

ග්‍රෝවර් මගේ ළඟට ම වෙලා හිටියා. සැරින් සැරේට එයාගේ ඇස්වලින් කඳුළු කඩා වැටුණා. "සොබාවික බලවේග මහ ගොඩක් මැරුණා, පර්සි. මහ ගොඩක්."

මම එයාගේ කර වටා අතක් දමාගෙන, එයාට නහය හූරන්න රෙදි කෑල්ලක් දුන්නා. "ඔයා නියමෙට වැඩේ දුන්නා, එළ-කොල්ලෝ. අපි මෙතන ඉඳන් අලුතින් පටන් ගමු. අපි අලුතින් ගස් වවමු. අපි උද්‍යාන සුද්ද කරමු. එතකොට ඔයාගේ යාළුවන්ට තිබුණට වඩා හොඳ ලෝකෙක ආපහු ඉපදෙන්න ලැබෙයි."

එයා දුර්මුඛව නහය ඉහළට ඇද්දා. "මං... මං හිතනවා. ඒත් කලිනුත් එයාලව රැස් කරගන්න ගොඩක් අමාරු වුණා. මම තාමත් කොන් වෙලා ඉන්නේ. පෑන් ගැන මං කියන දේවල් අහන්න මම කට්ටියව නම්ම ගත්තෙත් බොහොම අමාරුවෙන්. දැන් ආයේ කිසිම දවසක එයාලා මං කියන දෙයක් අහයි ද? මං එයාලව මෙහෙයවගෙන ආවේ සමූල ඝාතනයකට නේ."

"එයාලා කියන දේ අහයි," මම පොරොන්දු වුණා. "මොකද ඔයා එයාලා ගැන හිතනවා. වෙන කාටත් වඩා ඔයා වනාන්තර ගැන හිතනවා."

එයා හිනාවෙන්න උත්සාහ කළා. "ස්තූතියි, පර්සි. මං හිතන්නේ... මං හිතන්නෙ ඔයා දන්නවා ඇති ඔයාගේ යාළුවා වෙන්න ලැබුණට මට කොච්චර ආඩම්බර ද කියලා."

මං එයාගේ අතට තට්ටුවක් දැම්මා. "ලූක් කියපු එක දෙයක් නම් හරියට හරි, එළු-කොල්ලෝ. මට මෙච්චර කාලෙකට හම්බ වුණු නිර්භීත ම සැටර් තමයි ඔයා."

එයා රතු වුණා, ඒත් එයාට මුකුත් කියන්න ලැබෙන්න කලින්, හක් ගෙඩි නද දුන්නා. පොසෙයිඩන්ගේ හමුදාව සිංහාසන ශාලාවට ගමනේ ආවා.

"පර්සි!" ටයිසන් මොර ගැහුවා. එයා අත් දෙක විහිදාගෙන මගේ දිහාවට දුවගෙන ආවා. වාසනාවට වගේ, එයා ආපහු සාමාන්‍ය ප්‍රමාණයට ඇකිළිලයි හිටියේ, ඒ නිසා එයාගේ වැලඳ ගැනීම දැනුණේ ට්‍රැක්ටරයක හැප්පුණා වගේ විතරයි. මුළු ගොවිපොළක ම හැප්පුණා වගේ නෙවෙයි.

"ඔයා මැරිලා නෑ!" එයා කිවුවා.

"ඔව්!" මම එකඟ වුණා. "පුදුමයි නේ?"

එයා අත්පුඩි ගහමින් සතුටින් හිනා වුණා. "මමත් මැරිලා නෑ. යේ..! අපි ටයිෆූන්ව දම්වැල්වලින් බැන්දා. ඒක ජොලි වැඩේ!"

එයාට පිටුපසින් සිටි සන්නාහයෙන් සැරසුණු සයික්ලොප්ස්ලා පනස් දෙනෙක් මහ හඬින් හිනා වෙමින්, ඔළු වනමින්, එකිනෙකාට 'පහක්' දමාගත්තා.

"ටයිසන් තමයි අපිව මෙහෙයුවේ," එකෙක් ගිගුරුවා. "එයා නිර්භීතයි!"

"සයික්ලොප්ස්ලගෙන් නිර්භීත ම කෙනා!" තවත් කෙනෙක් මොරගෑවා.

ටයිසන් රතු වුණා. "ඒක ඒ හැටි දෙයක් නෙවෙයි."

"මං ඔයාව දැක්කා!" මම කිවුවා. "ඔයා නම් මාරයි!"

දුප්පත් ග්‍රෝවර්ට එතැන ම සිහිය නැති වෙයි ද කියලා මට හිතුණා. එයා සයික්ලොප්ස්ලට පණ බයයි නේ. ඒ වුණත් එයා හිත තද කරගෙන කතා කළා, "ඔව්. ම්ම්... ටයිසන්ට හුරේ දාමු!"

"හුරේර්ර්!!" සයික්ලොප්ස්ලා මොර ගැසුවා.



"අනේ මාව කන්න නම් එපා," ග්‍රෝවර් කෙඳිරුවා, ඒත් ඒක වෙන කාටවත් ඇහෙන්න ඇති ද කියලා නම් මට විශ්වාස නැහැ.

නැවත වරක් හක් ගෙඩි නාද වුණා. දෙපසට වුණු සයික්ලොප්ස්ලා මැදින් යුද සන්නාහයෙන් සැරසී, දිලිසෙන ත්‍රිශූලය අත දරාගෙන මගේ තාත්තා සිංහාසන ශාලාවට ඇතුළු වුණා.

"ටයිසන්!" එයා බෙරිහන් දුන්නා. "නියමයි, මගෙ පුතා. එතකොට පර්සි-" එයාගේ මුහුණ දැඩි වුණා. එයා මට ඇඟිල්ලක් වනද්දී එක තත්පරේකට මම හිතුවේ එයා මාව කුඩු කරලා දාන්න යනවා කියලයි. "ඔයා මගේ සිංහාසනේ ඉඳගත්ත එකට පවා මම සමාව දෙනවා. ඔයා ඔලිම්පස් බේරගත්තා!"

දෑත් දිගු කළ එයා මාව වැලඳ ගත්තා. පුංචි පහේ ලැජ්ජාවකුත් එක්ක ඒ වෙලාවේ මට තේරුම් ගියේ මීට කලින් කවදාවත් මමු ඇත්තට ම මගේ තාත්තව වැලඳගෙන නැහැ නේ කියලයි. එයා ළඟ ගොඩක් උණුසුම්- හරියට සාමාන්‍ය මනුස්සයෙක් වගේමයි- ඒ වගේ ම එයා ළඟින් ලුණු මිශ්‍ර වෙරළක සහ නැවුම් සුළඟේ සුවඳ හැමුවා.

මගෙන් ඈත් වුණාට පස්සේ එයා මට කාරුණික හිනාවක් පෑවා. ඒකෙන් මගේ හිතට කොයි තරම් සතුටක් දැනුණා ද කියනවා නම්, මගේ ඇස්වලට පොඩි කඳුළක් පවා ඉනුවා. මං හිතන්නේ, ඒ මොහොත වෙනකල් ම මම පහුගිය දවස් කීපයේ දී කොච්චර බයවෙලා හිටිය ද කියලා මගේ හිතට තේරුම් ගන්න ඉඩ දීලා තිබුණේ නැහැ.

"තාත්තේ-"

"ෂ්ෂ්ෂ්," එයා කිවුවා. "කිසිම වීරයෙකුට බය නොදැනෙන්නෙ නැහැ, පර්සි. ඒ වගේ ම ඔයා අනිත් හැම වීරයෙකුට ම වඩා ඉහළයි. අඩු තරමේ හර්කියුලිස්ටවත්-"

"පොසෙයිඩන්!" කටහඬක් ගිගුරුවා.

සියුස් සිංහාසනාරූඪ වී සිටියා. එයා ශාලාව හරහා මගේ තාත්තට රවාගෙන ඉන්න අතරේ අනෙක් දෙවිවරු තම තමන්ගේ අසුන්වලට ගියා. අඩු තරමේ හේඩීස් පවා ගිනි උඳුන ළඟ සරල අමුත්තන්ගේ අසුනක වාඩි වී සිටියා. නිකෝ එයාගේ තාත්තාගේ දෙපා මුල එරමිණිය බැඳගෙන ඉඳගෙන හිටියා.

"හොඳයි, පොසෙයිඩන්?" සියුස් අවලාද නැගුවා. "අපිත් එක්ක මන්ත්‍රණ සභාවට එකතු නොවී ඉන්න තරම් ආඩම්බර වෙලා ද, මගේ සහෝදරයා?"

පොසෙයිඩන්ට තරහා යයි කියලයි මං හිතුවේ, ඒත් එයා කලේ මගේ දිහා බලලා ඇහැක් ගහපු එකයි. "ඒක මට ගෞරවයක්, සියුස් උතුමාණෙනි."

මං හිතන්නේ ප්‍රාතිහාර්යයන් ඇත්තට ම සිද්ධ වෙනවා. පොසෙයිඩන් දිගු අඩි තබමින් එයාගේ මාළු පුටුව වෙතට ගියා. ඊට පස්සේ ඔලිම්පියානු මන්ත්‍රණ සභාව ආරම්භ වුණා.

★★★

සියුස් කතාව පවත්වන අතරේ- දෙවිවරුන්ගේ නිර්භීතකම ගැනයි, තව තව දේවල් ගැනයි දිග ම දිග හැල්ලක්- ඇතුළට ආව ඇනබෙත් මගේ ළඟින් හිටගත්තා. ටික වෙලාවකට කලින් සිහිය නැතිවෙලා වැටුණ කෙනෙක් හැටියට බලද්දී එයා සෑහෙන හොඳ තත්ත්වෙක ඉන්න බව පෙනුණා.

"මට මොනවද මඟ ඇරුණේ?" එයා රහසින් ඇහුවා.

"තාම නම් අපිව මරන්න කවුරුත් සැලසුම් කරේ නැහැ," මම රහසින් පිළිතුරු දුන්නා.

"අද දවසේ පළවෙනි වතාවට."

මට හිනා ගියා, ඒත් හේරා අපේ දිහාවට කුණු බැලුම් හෙළනවා දකලා ග්‍රෝවර් මට වැළමිටෙන් ඇන්නා.

"මගේ සහෝදරයෝ ගැන කියනවා නම්," සියුස් කිවුවා, "අපි ස්තුතිවන්ත වෙනවා-" එයා උගුර පෑදුවේ හරියට වචන එළියට ගන්න අමාරුයි වගෙයි. "එර්ර්ම්ම්, ස්තුතිවන්ත වෙනවා හේඩීස් කරපු උපකාරයට."

මරණයට අධිපති ඔළුව වැනුවා. එයාගේ මූණේ තිබුණේ තෘප්තිමත් පෙනුමක්. ඒත් මං හිතන්නේ එයා ඒක උපයාගෙනයි තිබුණේ. එයා එයාගේ පුතා නිකෝගේ උරහිසට තට්ටුවක් දැම්මා. ඊට පස්සේ නිකෝ හිටියේ මම මීට කලින් කවදාවත් දකලා නැති තරම් සතුටින්.

"ඒ වගේ ම, ඇත්ත වශයෙන් ම," සියුස් කියාගෙන ගියත්, එයා හිටියේ නම් කලිසමට ගිනි ඇවිළුණ කෙනෙක් වගෙයි. "අපි... මේ... ස්තුති කරනවා පොසෙයිඩන්ටත්."

"සමා වෙන්න, සහෝදරයා," පොසෙයිඩන් කිවුවා. "ඔයා මොකක්ද කිවුවේ?"



"අපි පොසෙයිඩන්ටත් ස්තුති කරන්න ඕනෑ," සියුස් ගෙරෙව්වා. "එයා නොහිටින්න... අපිට අපහසු වෙන්න තිබුණා-"

"අපහසු?" පොසෙයිඩන් අහිංසක තාලෙට ඇහුවා.

"කොහෙත්ම බැරි වෙන්න තිබුණා," සියුස් කිවුවා. "ටයිෆූන්ව පරාද කරන්න අපිට කොහෙත්ම බැරි වෙනවා."

දෙවිවරු එයට එකඟතාවය පළ කර මුමුණමින්, එයාලගේ ආයුදවලට ගසමින් එය අනුමත කළා.

"දැන් අපිට ඉතුරු," සියුස් කිවුවා, "අපේ තරුණ උප දෙවි වීරයන්ට ස්තුති කරන එකයි. එයාලා බොහොම හොඳින් ඔලිම්පස් ආරක්ෂා කරගත්තා- මගේ සිංහාසනේට කඩතොලු දෙක තුනක් වෙලා තිබුණා වුණත්."

එයා තමන්ගේ දුව, තාලියාව මුලින් ම ඉදිරියට කැඳෙව්වා. ඊට පස්සේ දඩයක්කාරියන්ගේ මදිපාඩුව පුරවන්න උදවු කරන්න එයාට පොරොන්දු වුණා.

ආර්ටෙමිස් හිනා වුණා. "ඔයා හොඳින් කටයුතු කළා, මගේ ලෙෆ්ටිනන්ට්. ඔයා මට ආඩම්බර වෙන්න පුළුවන් තැනට වැඩ කළා. මට සේවය කරමින් මිය ගිය දඩයක්කාරියෝ හැමදෙනා ම කිසිම දවසක අමතක කරන්නෙ නැහැ. එයාලා ස්වර්ගයට යාවි, මට ඒක සහතිකයි."

එයා හේඩීස් දිහාවට රවා බැලුවා.

හේඩීස් උරහිස් ඇකිළුවා. "සමහරවිට."

ආර්ටෙමිස් තවත් ටිකක් එයාට රැව්වා.

"හරි," හේඩීස් අසන්තෝසෙන් ගෙරෙව්වා. "මං එයාලගේ ඉල්ලුම් පත්‍රවල වැඩ කටයුතු ඉක්මන් කරවන්නම්කෝ."

තාලියා ආඩම්බරයෙන් පිම්බුණා. "ස්තුතියි, මගේ උත්තමාවියනි." එයා දෙවිවරු හැමෝටම, හේඩීස්ට පවා නැමිලා ආචාර කරලා, ආර්ටෙමිස්ගේ ළඟින් හිටගන්න නොණ්ඩි ගහමින් ගියා.

"ටයිසන්, පොසෙයිඩන්ගේ පුත්‍රයා!" සියුස් අඬගැහුවා. ටයිසන් ටිකක් බයවෙලා ඉන්න බව පෙනුණා වුණත්, එයා මන්ත්‍රණ සභාව මැදට ගිහින් හිටගත්තා. සියුස් අමනාපයෙන් ගෙරෙව්වා.

Scanned with CamScanner

"කැම වේල් එකක්වත් මඟ අරින්නෙ නම් නැති පාටයි?" සියුස් කෙඳිරුවා. "ටයිසන්, යුද්ධයේ දී දක්වූ නිර්භීතභාවය වෙනුවෙන් සහ සයික්ලොප්ස්ලාව මෙහෙයවීම වෙනුවෙන් නුඹව ඔලිම්පස් හි හමුදාවන්ගේ ජෙනරල්වරයෙක් විදිහට පත් කරනවා. මින් ඉදිරියට, දෙවිවරුන්ට අවශ්‍ය වෙන ඕනෑ ම වෙලාවක නුඹගේ ඥාතීන්ව සටනට මෙහෙයවන්න ඕනෑ. ඒ වගේ ම නුඹට අලුත්... ම්ම්... මොන වගේ ආයුදයකට ද නුඹ කැමති? කඩුවක්? පොරොවක්?"

"කෝට්ටක්!" ටයිසන් එයාගේ කැඩුණු මුගුර පෙන්වමින් කිවුවා.

"බොහෝම හොඳයි," සියුස් කිවුවා. "අපි නුඹට අලුත් ම, එර්ර්, කෝට්ටක් ප්‍රදානය කරනවා. හොයාගන්න තියෙන හොඳ ම කෝට්ට."

"හුරේ!" ටයිසන් කෑගැහුවා. එයා ආපහු යද්දී සයික්ලොප්ස්ලා හැමෝම ඔල්වරසන් දෙමින් එයාගේ පිටට ගැසුවා.

"සැටර්ලාගේ ග්‍රෝවර් අන්ඩර්වුඩ්!" ඩයනයිසියස් කතා කළා.

ග්‍රෝවර් බයාදු විදිහට ඉස්සරහට ගියා.

"ඔහ්, කමිසේ කන එක නවත්තනවා," ඩයනයිසියස් දොස් කිවුවා. "ඇත්තට ම, මං ඔයාව කුඩු කරලා දාන්න නෙවෙයි මේ හදන්නේ. ඔයාගේ නිර්භීතකමටයි කැපකිරීමටයි, බ්ලාහ්, බ්ලාහ්, බ්ලාහ්, ඒ වගේම අපිට අවාසනාවන්ත පුරප්පාඩුවකුත් තියෙන නිසා, ඔයාව විදාහිත වැඩිහිටියන්ගේ මණ්ඩලේ සාමාජිකයෙක් විදිහට නම් කරන්න දෙවිවරු තීරණය කළා."

ග්‍රෝවර් එතැන ම කලන්තෙ දාලා වැටුණා.

"ඔහ්, නියමයි නේ," ග්‍රෝවර්ගේ උදවුවට ජල දෙවඟනෝ කිප දෙනෙක් ඉදිරියට එද්දී ඩයනයිසියස් සුසුමක් හෙළුවා. "හොඳයි, එයා ඇහැරුණා ම කවුරුහරි එයාට කියන්න එයා තව දුරටත් පිටුවහලෙක් නෙවෙයි කියලා. ඒ වගේ ම මින් මත්තට සියලූ ම සැටර්ලා, වන දෙවිවරු සහ අනිත් සොබාදහමේ බලවේග එයාට සියලූ ම අයිතීන්, වරප්‍රසාද සහ ගෞරව සහිත වනාන්තරයේ අධිපතියෙක් විදිහට සැලකිය යුතුයි, බ්ලාහ්, බ්ලාහ්, බ්ලාහ්. දැන් කරුණාකරලා, එයා ඇහැරලා මෙතැන බිම පෙරළෙන්න පටන් ගන්න කලින් එයාව මෙතැනින් අහකට ඇදගෙන යනවල්ලා."

"කෑෑෑම," සොභාවික බලවේග එයාව ඉවතට රැගෙන යද්දී ග්‍රෝවර් කෙඳිරි ගෑවා.



එයාට ප්‍රශ්නයක් නැතිවෙයි කියලා මම හිතුවා. එයා කැලේට අධිපතියෙක් විදිහට, ලස්සන වන දෙවඟනන්ගේ සැලකුම් මැද ඇහැරෙයි. තව මොන කතා ද.

ඇතීනා කතා කළා, "ඇනබෙත් චේස්, මගේ දුව."

මගේ අත තදින් මිරිකපු ඇනබෙත්, ඊට පස්සේ ඉස්සරහට ගිහින් එයාගේ අම්මා පාමුල දණ ගසාගත්තා.

ඇතීනා හිනා වුණා. "ඔයා, මගෙ දුවේ, හැම අපේක්ෂාවක් ම ඉක්මවා ගිහිල්ලයි තියෙන්නේ. ඔයා මේ නගරය සහ අපේ බල අසුන් ආරක්ෂා කරන්න ඔයාගේ බුද්ධිය, ශක්තිය සහ ධෛර්යය පාවිච්චි කළා. ඔලිම්පස් දැන්... හොඳයි, හැඩිවෙලා තියෙන බව අපිට පේනවා. ටයිටන් රජා කරලා තියෙන හානි අපිට පිළිසකර කරන්න වෙනවා. ඇත්තට ම, අපිට අපේ මායා බලයන් පාවිච්චි කරලා ඒවා තිබුණා වගේ ම ආපහු හදන්න පුළුවන්. ඒ වුණත් මේ නගරය තිබුණට වඩා වැඩි දියුණු කරන්න උවමනාවක් දෙවිවරුන්ට දැනෙනවා. ඉතින් අපි මේක ඒ වැඩේට අවස්ථාවක් කරගන්නවා. එතකොට මේක වැඩි දියුණු කළ යුතු විදිහ සැලසුම් කරන්නෙ ඔයයි, මගේ දුවේ."

ඇනබෙත් උඩ බැලුවේ පුදුමයෙන් තිගැස්සිලයි. "මගෙ... මගේ උත්තමාවියනි?"

ඇතීනා කට කොණකින් හිනාවුණා. "ඔයා ගෘහ නිර්මාණ ශිල්පියෙක්, එහෙම නෙවෙයි ද? ඔයා ඩේඩලස්ගේ ම ශිල්ප ක්‍රම අධ්‍යයනය කරලා තියෙනවා. ඉතින් ඔලිම්පස් නැවත නිර්මාණය කරලා, ඒක තවත් යුගයක් පවතින ස්මාරකයක් බවට පත් කරන්න මීට වඩා සුදුස්සා කවුද?"

"ඒ කියන්නේ... මං කැමති ඕනෑ ම දෙයක් මට සැලසුම් කරන්න පුළුවන්?"

"ඔයා කැමති ඕනෑ ම විදිහකට," දෙවඟන කිවුවා. "අපිට තව යුග ගාණක් පවතින නගරයක් හදලා දෙන්න."

"හැබැයි ඔන්න මගේ පිළිම හුඟක් තියෙන්නත් ඕනෑ," ඇපලෝ එකතු කළා.

"මගෙත්," ඇෆ්‍රොඩයිටුත් එකඟ වුණා.

"හේයි, එතකොට මගේ!" ඒරීස් කිවුවා. "දරුණු කඩුවක් එහෙම තියාගෙන ඉන්න ලොකු පිළිමයි, තව-"

"හරි හරි!" ඇතීනා එයාට බාධා කළා. "එයාට තේරෙනවා. නැගිටින්න, මගේ දුවේ, ඔලිම්පස් හි නිල ගෘහ නිර්මාණ ශිල්පිණිය."

මෝහනයකින් වගේ නැඟී සිටි ඇනබෙත් ආපසු මගේ ළඟට ඇවිද ආවා.

"ඔය තියෙන්නේ," මම එයාට කිවුවේ දත් නියවමින්.

පළවෙනි වතාවට ඇනබෙත්ට කතා කරගන්න වචන නැති වුණා. "මට... මට සැලසුම් හදන්න පටන් ගන්න වෙනවා... කටු සටහන් කොළ, තව, මේ, පැන්සල්-"

"පර්සි ජැක්සන්!" පොසෙයිඩන් නිවේදනය කළා. මුළු කුටිය පුරා මගේ නම දෝංකාර දුන්නා.

ඇසිල්ලකින් සියලූ කතාබහ නැවතුණා. උඳුන තුළ සටපට හඬ නඟන ගින්න හැර සියල්ල නිහඬ වුණා. හැම දෙනාගේ ම- සියලූ දෙවිවරුන්ගේ, උප දෙවිවරුන්ගේ, සයික්ලොප්ස්ලාගේ සහ සොභාවික බලවේගයන්ගේ ඇස් යොමු වී තිබුණේ මගේ දිහාවටයි. මම සිංහාසන ශාලාව මැදට ඇවිද ගියා. හෙස්ටියා මාව ධෛර්යමත් කරමින් හිනා වුණා. දැන් ආයෙමත් පුංචි ගැනු ළමයෙකුගේ ස්වරූපයෙන් පෙනී සිටි එයා, එයාගේ ගිනි මැලය අසල නැවතත් වාඩි වී ඉන්න ලැබීමෙන් සතුටු හා සෑහීමකට පත් වෙනවා වගෙයි පෙනුණේ. එයාගේ හිනාව මට ඉදිරියට ම යන්න දිරි දුන්නා.

මුලින් ම මම සියුස්ට ආචාර කළා. ඊට පස්සේ මම මගේ තාත්තා පාමුල දණ ගසාගත්තා.

"නැඟිටින්න, මගෙ පුතේ," පොසෙයිඩන් කිවුවා.

මම නොසන්සුන්ව නැඟී සිටියා.

"ශ්‍රේෂ්ඨ වීරයෙකුට ත්‍යාග හිමි විය යුතුමයි," පොසෙයිඩන් කිවුවා. "මෙතැන ඉන්න කවුරු හරි මගේ පුතා ඒකට සුදුසු නැහැ කියනව ද?"

කවුරුහරි විරෝධය පාමින් කෑගහනකල් මම බලා සිටියා. දෙවිවරු කවදාවත් කිසිම දේකට එකඟ වෙන්නෙ නැහැ නේ, ඒ වගේම එයාලගෙන් වැඩි දෙනෙක් තවමත් මට කැමති වුණෙත් නැහැ. ඒ වුණත් එක්කෙනෙක්වත් විරෝධය පළ කළේ නැහැ.

"දේව සභාව එකඟයි," සියුස් කිවුවා. "පර්සි ජැක්සන්, නුඹට දෙවිවරුන්ගෙන් එක තෑග්ගක් ලැබෙනවා."



මම ටිකක් පැකිළුණා. "ඕනෑ ම තෑග්ගක්?"

සියුස් බරපතළ තාලෙට ඔළුව වැනුවා. "නුඹ ඉල්ලන්න යන දේ මං දන්නවා. තෑගිවලින් වටිනා ම එක. ඔව්, නුඹට ඒක උවමනා නම්, ඒක නුඹට හිමි වෙනවා. දෙවිවරු සියවස් ගාණකින් මේ තෑග්ග මනුෂ්‍ය වීරයෙකුට පිරිනමලා නැහැ, ඒ වුණත්, පර්සියස් ජැක්සන්- නුඹ කැමති නම්- නුඹව දෙවි කෙනෙක් බවට පත් කරන්නම්. අමරණීයයෙක් බවට. නොමැරෙන කෙනෙක් බවට. නුඹට සදහට ම නුඹේ තාත්තාගේ ලෙෆ්ටිනන්ට් විදිහට සේවය කරන්න පුළුවන්."

මම ඇස් ලොකු කරගෙන එයා දිහා බලා හිටියේ පුදුමයෙන් ගල් වෙලයි. "මී... දෙවියෙක්?"

සියුස් ඇස් කැරකුවා. "මොට්ට දෙවියෙක්, පෙනෙන හැටියට. ඒත් ඔව්. සමස්ත සභාවේ ම පොදු එකඟතාවය මත, මට නුඹව අමරණීය කෙනෙක් බවට පත් කරන්න පුළුවන්. ඊට පස්සෙ ඉතින් මට සදහට ම නුඹත් එක්ක ඉහ ගහගෙන ඉන්න වෙනවා."

"හ්ම්ම්," ඒරීස් කල්පනා කළා. "ඒ කියන්නේ මං කැමති ඕනෑ ම වෙලාවක මට එයාව තලපයක් වෙන්න තළන්න පුළුවන්, ඊට පස්සෙත් එයා තව ගුටි කන්න ආයෙ ආයෙත් එයි. මං ඒ අදහසට කැමතියි."

"මමත් ඒක අනුමත කරනවා," ඇතීනා කිවුවත්, එයාගේ ඇස් රැඳිලා තිබුණේ ඇනබෙත් ළඟයි.

මම ආපස්සට බැල්මක් හෙළුවා. ඇනබෙත් හිටියේ මගේ ඇස් මඟ අරින්න උත්සාහ කරමිනුයි. එයාගේ මූණ සුදුමැලි වෙලා. ඒක දකිද්දී මගේ හිත මීට අවුරුදු දෙකකට කලින්, එයා ආර්ටෙමිස්ට ප්‍රතිඥා දීලා දඩයක්කාරියෙක් වෙන්න යනවා කියලා මම හිතපු මොහොතට දිවුවා. එදා එයාව මට නැති වෙන්න යනවා කියලා හිතලා මම හිටියේ බයෙන් අඩපණ වෙලයි. දැන්, ඇනබෙත්ට තිබුණෙත් ඒ පෙනුමමයි.

මම ඉරණමේ තුන් කට්ටුව ගැනත්, මගේ ජීවිතය මගේ ඇස් ඉදිරිපිට ඇඳුණු හැටි ගැනත් කල්පනා කළා. මට ඒ හැමදෙයක් ම මඟ අරින්න පුළුවන්. වයසට යන්නේ නැහැ, මැරෙන්න වෙන්නෙ නැහැ, මිනී වළට පහත් කරන්න සිරුරක් නැහැ. මට සදහට ම ගැටවරයෙක් විදිහට, උසස් ම තත්ත්වයේ, බලවත්ව සහ අමරණීයව මගේ තාත්තට සේවය කරමින් ඉන්න පුළුවන්. මට බලය සහ සදාකාලික ජීවිතයක් ලබාගන්න පුළුවන්.

ඒ වගේ දෙයක් එපා කියන්නේ කවුද?

ඊට පස්සෙ මම ආයෙමත් ඇනබෙත් දිහා බැලුවා. මම කඳවුරේ මගේ යාළුවෝ ගැන හිතුවා: චාර්ල්ස් බෙකන්ඩොර්ෆ්, මයිකල් යෙව්, සිලේනා බියුරිගාඩ්, දැන් මළවුන් අතර සිටි බොහෝ දෙනෙක් ගැන. මට ඊතන් නකමුරාව සහ ලූක්වත් සිහි වුණා.

ඒ වෙලාවේ කළ යුතු දේ මම දැනගත්තා.

"එපා," මම කිව්වා.

මුළු දේව සභාව ම ගොළු වුණා. දෙවිවරු නළල රැළි කරගෙන එකිනෙකා දිහා බලාගත්තේ හරියට ඇහුනේ නැති ද කියලා සැකයෙන් වගෙයි.

"එපා?" සියුස් ඇහුවා. "නුඹ... අපේ නිර්ලෝභී තෑග්ග අහක දානව ද?"

එයාගේ කටහඬ අනතුරුදායක සීමාවකට ඇවිත් තිබුණේ හරියට පුපුරා යන්න නියමිත අකුණු කුණාටුවක් වගෙයි.

"ඇත්තට ම ඒක මට ලොකු ගෞරවයක් තමයි," මම කිව්වා. "මාව වැරදියට තේරුම් ගන්න එපා. ඒක මේ... මට ජීවත් වෙන්න ජීවිතේ තව ගොඩක් ඉතුරු වෙලා තියෙනවා. දෙවෙනි අවුරුද්දෙන් විශ්වවිද්‍යාල ගමන මඟ නතර කරන්න මට ඕනෑ නෑ."

දෙවිවරු මට තරහෙන් රවාගෙන හිටියත්, ඇනබෙත් නම් හිටියේ දෑතින් ම කට වසාගෙනයි. එයාගේ ඇස් දිලිසෙමින් තිබුණා. ඒක දකිද්දී මගේ සියලු සැක සංකා නැත්තටම නැති වෙලා ගියා.

"හැබැයි, මට වෙන තෑග්ගක් ඕනෑ," මම කිව්වා. "මගේ ඉල්ලීම ඉෂ්ට කරලා දෙන්න ඔයා පොරොන්දු වෙනව ද?"

සියුස් ඒ ගැන කල්පනා කරලා බැලුවා. "ඒක අපේ බල සීමාව ඇතුළේ තියෙන දෙයක් නම්."

"එහෙම දෙයක් තමයි," මම කිව්වා. "ඒක එච්චර අමාරු දේකුත් නෙවෙයි. හැබැයි ඔයාලා ඒක කරනවා කියලා ස්ටයික්ස් ගඟ මත දිවුරන්න ඕනෑ."

"මොකක්?" ඩයනයිසියස් කෑගැසුවා. "ඔයාට අපිව විශ්වාස නැද්ද?"

"වතාවක් කෙනෙක් මට කිව්වා," මම කිව්වේ හේඩීස් දිහා බලමින්, "ඔයා හැම වෙලාවෙ ම විධිමත් දිවුරුමක් ගන්න ඕනෑ කියලා."



හේඩීස් උරහිස් ඇකිළුවා. "මගේ වැරැද්ද."

"බොහොම හොඳයි!" සියුස් ගෙරෙව්වා. "නුඹගේ 'සාධාරණ' ඉල්ලීම අපේ බල සීමාව තුළ ඇති තාක්, එය ඉෂ්ට කර දීමට දේව මණ්ඩලයේ නමින්, අපි ස්ටයික්ස් ගඟ මත දිවුරනවා."

අනෙක් දෙවිවරු එයාට එකඟතාවය පළ කරමින් මිමිණුවා. සිංහාසන ශාලාව දෙදරවමින් අකුණක් පුපුරා ගියා. ගනුදෙනුව ස්ථිරයි.

"අදින් පස්සේ, ඔයාලා දෙවිවරුන්ගේ දරුවන්ව නියම විදිහට හඳුනා ගන්න ඕනෑ," මම කිව්වා. "දෙවිවරු හැමෝගෙම... හැම දරුවෙක්ව ම."

ඔලිම්පියානුවෝ අපහසුවෙන් එහා මෙහා වුණා.

"පර්සි," මගේ තාත්තා කතා කළා, "ඇත්තට ම ඔයා මොකක්ද අදහස් කරන්නේ?"

"උප දෙවිවරු ගොඩක් දෙනෙකුට, තමන්ගේ අම්මලා තාත්තලා එයාලව අත් ඇරලා දාලා කියලා දැනුනේ නැත්නම්, ක්‍රෝනොස්ට අර විදිහට නැඟිටින්න ඉඩක් ලැබෙන්නෙ නැහැ," මම කිව්වා. "එයාලට තරහක්, අමනාපයක්, තමන්ට ආදරේ නොලැබෙන බවක් දැනුණා. ඒ වගේ ම ඒකට එයාලට හොඳ හේතුවක් තිබුණා."

සියුස්ගේ රාජකීය නාස් පුඩු පිම්බුණා. "නුඹ අපිට දොස් පවරන්න තරම්-"

"තවත් තීරණය නොකළ ළමයි ඉන්න බැහැ," මම කිව්වා. "ඔයාලා ඔයාලගේ දරුවන්ට- ඔයාලගේ උප දෙවි දරුවෝ හැමෝටම- වයස අවුරුදු දහතුන පිරෙන කාලය වෙද්දි හිමිකම් කියන්න පොරොන්දු වෙන්න ඕනෑ. එයාලව කාගෙවත් හව්හරණක් නැතුව, තනිය ම රාක්ෂයෝ මැද්දේ අතරමං වෙන්න ඉඩ තියන්න බැහැ. එයාලට හිමිකම් කියලා, නිවැරදි පුහුණුවක් ලබන්න, ඒ වගේ ම පණ බේරගෙන ඉන්න පුළුවන් වෙන්න කඳවුරට ඇරලන්න ඕනෑ."

"දැන්, පොඩ්ඩක් ඔහොම හිටියා නම්," ඇපලෝ කිව්වත්, මං නැවතුනේ නැහැ.

"ඒ වගේ ම සුළු දෙවිවරු," මම කිව්වා. "නෙමෙසිස්, හෙකේට්, මොර්ෆියස්, ජානුස්, හීබ්- එයාලා හැමෝටම පොදු සමාවක් සහ අර්ධ-ලෝහිත කඳවුරේ තැනක් ලැබෙන්න ඕනෑ. එයාලගේ දරුවන්ව

නොසලකා හරින්න බැහැ. කැලිප්සෝ සහ අනිත් සාමකාමී ටයිටන් වර්ගයාටත් සමාව ලැබෙන්න ඕනෑ. එතකොට හේඩීස්-"

"නුඹ කියන්නෙ මමත් සුළු දෙවියෙක් කියල ද?" හේඩීස් ගිගුරුවා.

"නැහැ, මගේ උතුමාණෙනි," මම ඉක්මනින් කිවුවා. "ඒත් ඔබතුමාගේ දරුවන්ව පිටමං කරන්න දෙන්න බැහැ. එයාලටත් කඳවුරේ කැබිනට් එකක් තියෙන්න ඕනෑ. නිකෝ ඒ බව ඔප්පු කරලයි තියෙන්නේ. මින් පස්සේ හිමිකම් නොකියපු උප දෙවිවරුන්ව හර්මීස් කැබින් එකට පුරවන්න බැහැ. එයාලට එයාලගේ ම කැබින්, හැම දෙවි කෙනෙක් වෙනුවෙන් ම තියේවි. ඒ වගේම ලොකු තුන්කට්ටුවේ ගිවිසුමත් අවලංගු කරන්න ඕනෑ. ඒක ඉතින් කොහොමත් වැඩ කළේ නැහැ නේ. බලගතු උප දෙවිවරුන්ව අයින් කරලා දාන්න ඔයාලා උත්සාහ කරන එක නතර කරන්න වෙනවා. ඒ වෙනුවට අපි එයාලව පුහුණු කරලා, බාර ගන්නවා. දෙවිවරුන්ගේ හැම දරුවෙක්ට ම පිළිගැනීමකුත්, ගෞරවාන්විත සැලකීමකුත් ලැබේවි. මම ඉල්ලන්නේ ඒකයි."

සියුස් මහ හඬින් නහයෙන් පිම්බා. "එච්චර ද?"

"පර්සි," පොසෙයිඩන් කතා කළා, "ඔයා ඉල්ලන්නේ සුළුපටු දෙයක් නෙවෙයි. ඔයා හිතනවා වැඩියි."

"මම ඔයාලව දිවුරවාගෙනයි තියෙන්නේ," මම කිවුවා. "ඔයාලා හැමෝවම."

මාව දැඩි බැලුම් ගොඩකට යට වුණා. පුදුමයකට වගේ කතා කරන්න ඉදිරිපත් වුණේ ඇතීනායි: "මේ කොල්ලා කියන දේ හරි. අපි අපේ දරුවන්ව නොසලකා ඉන්න තරම් අඥාන වුණා. ඒක මේ සටනේ දී යුද්ධෝපායමය වශයෙන් දුර්වලකමක් වුණා වගේ ම ඒ හේතුව නිසා අපි සහමුලින් ම වැනසෙන්නත් ගියා. පර්සි ජැක්සන්, ඔයා ගැන මගේ හිතේ සැකයක් තිබුණා තමයි, ඒ කොහොම වුණත් බාගදා-" ඇනබෙත් දිහාවට බැල්මක් හෙළූ එයා, ඊට පස්සේ ආයෙමත් කතා කළේ හරියට ඒ වචනවල ඇඹුල් රසක් තියෙනවා වගෙයි- "බාගදා මට වැරදීමක් වෙන්න ඇති. මම කියන්නේ අපි මේ කොල්ලගේ සැලසුම පිළිගන්න ඕනෑ."

"හ්ම්ම්ප්ෆ්," සියුස් කිවුවා. "කරන්න ඕනෑ දේ කජු කිරි කොල්ලෙක්ගෙන් අහගන්න වෙලා. ඒ වුණත් මං හිතන්නේ..."



"මේකට පක්ෂ අය," හර්මීස් කිවුවා.

දෙවිවරු හැමෝම අත් එසෙව්වා.

"ම්, ස්තුතියි," මම කිවුවා.

මම ආපසු හැරුණා, ඒත් මට එතැනින් පිට වී යන්න ඉඩ ලැබෙන්න කලින්, පොසෙයිඩන් කතා කළා, "ආචාර පෙළපාළිය!"

එසැණින් ම ඉදිරියට ආව සයික්ලොප්ස්ලා සිංහාසන අසල සිට දොරටුව දක්වා දෙපස පෙළ ගැසී, මට ඇවිද යන්න මැදි මඟක් සෑදුවා. එයාලා සීරුවෙන් සිටගත්තා.

"සැරදේවා, පර්සියස් ජැක්සන්," ටයිසන් කිවුවා. "ඔලිම්පස්වල වීරයා... මගේ ලොකු අයියා!"

Scanned with CamScanner

21

# බ්ලැක්ජැක්ව පැහැරගෙන ගියා

ඇනබෙතුයි මමයි ආපහු යන මඟ දී මට මාලිගාවේ පැති අංගනයක හිටපු හර්මීස්ව දකින්න ලැබුණා. එයා හිටියේ වතුර මලක හිරිකඩවලින් හටගත් අයිරිස්-පණිවුඩයක් දිහා බලාගෙනයි.

මම ඇනබෙත් දිහා බැලුවා. "මං ඔයාව සෝපානෙ දි අල්ල ගන්නම්."

"ඔයාට විශ්වාස ද?" එහෙම අහපු එයා ඊට පස්සේ මගේ දිහා සැලකිල්ලෙන් බලා සිටියා. "ඔව්, ඔයාට විශ්වාසයි."

මගේ පැමිණීම හර්මීස්ට දැනුනෙ නැහැ වගෙයි. අයිරිස්-පණිවුඩයේ රූප චලනය වූ වේගයට, මට ඒවා තේරුම් ගන්නත් අමාරු වුණා. මුළු රට පුරා ම විකාශනය වූ ප්‍රවෘත්ති ප්‍රචාර එහි දිස් වුණාඃ ටයිෆූන් කළ විනාශයේ දසුන්, මැන්හැටන් නගරය පුරා ඉතිරි වී තිබුණු අපේ සටනේ සුන්බුන්, ජනාධිපතිතුමා පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාව, නිව්යෝක් නගරයේ නගරාධිපති, ඇමරිකාස් මාවත පහළට ඇදෙන හමුදා රථ කිපයක්.

"පුදුමාකාරයි," හර්මීස් කෙඳිරුවා. එයා මගේ දිහාවට හැරුණා. "අවුරුදු තුන්දාහක් ගිහිල්ලත්, මට මීදුමේ බලය ගැන පුදුම නොවී ඉන්න බැහැ... ඒ වගේම මිනිස්සුන්ගේ ගොන්කම ගැන."

"ස්තුතියි, මං හිතන්නෙ."



"අයියෝ, ඔයාට නෙවෙයි කිවුවේ. හැබැයි, මං හිතන්නෙ ඔයා අර අමරණීයත්වේ එපා කියපු එක ගැන නම් මං පුදුම වෙන්න ඕනෑ."

"ඒක තමයි හරි ම තේරීම."

මගේ දිහා පුදුමයෙන් වගේ බලපු හර්මීස්, ඊට පස්සෙ එයාගේ අවධානය ආයෙමත් අයිරිස් පණිවුඩයට යොමු කළා. "බලන්නකෝ මේ දිහා. ටයිෆූන් කියන්නේ විකාර කුණාටු මාලාවක් කියලා එයාලා දැනටමත් තීරණයකට බැහැලා ඉවරයි. මටත් එහෙම පුළුවන් වුණා නම්. මැන්හැටන් පහළ කොටසේ තිබුණ පිළිම ඔක්කොම පාදස්ථලවලින් ගැලවිලා, කෑලි කෑලිවලට පෙති ගැහුණේ කොහොමද කියලා එයාලා තාම හොයාගෙන නැහැ. එයාලා දිගින් දිගට ම සුසාන් බී ඇන්තනී (1820-1906 කාලයේ ජීවත් වූ, ඇමරිකානු සමාජ සංශෝධකවරියක් සහ කාන්තා සම අයිතීන් සඳහා සටන් කළ තැනැත්තියකි.) ෆ්‍රෙඩ්රික් ඩග්ලස්ගේ (1818-1895 කාලයේ සිටි, සමාජ සංශෝධකයෙක්, ලේඛකයෙක්, දේශකයෙක් සහ රාජ්‍ය තාන්ත්‍රිකයෙක් ලෙස කටයුතු කළ අප්‍රිකානු-ඇමරිකානු ජාතිකයෙකි.) බෙල්ල මිරිකන දර්ශනයක් පෙන්නනවා. ඒත් මගෙ හිතේ, එයාලා අන්තිමේ දි ඒකටත් මොකක් හරි තාර්කික පැහැදිලි කිරීමක් හොයාගනී."

"නගරේ තත්ත්වේ කොච්චර නරක ද?"

හර්මීස් උරහිස් ඇකිළුවා. "පුදුමෙ කියන්නේ, එච්චරට ම නරක නැහැ. ඇත්තට ම, මනුෂ්‍යයෝ නම් ඉන්නෙ කම්පනය වෙලා තමයි. ඒත් ඉතින් මේ නිව්යෝර්ක් නේ. මේ තරම් පහසුවෙන් නැමෙන මිනිස්සු ටිකක් මීට කලින් මං කවදාවත් දැකලා නැහැ. මං හිතන්නේ සති තුන හතරක් යනකොට එයාලා ආපහු සාමාන්‍ය අතට හැරෙයි; ඒ වගේම ඇත්ත වශයෙන් ම ඒකට මමත් එයාලට උදවු කරනවා."

"ඔයා?"

"දෙවිවරුන්ගේ පණිවුඩකාරයා මම නේ. ඉතින්, මනුෂ්‍යයෝ කියන දේවල් අධීක්ෂණය කරන එක, ඒ වගේ ම අවශ්‍ය නම්, සිද්ධ වුණේ මොකක්ද කියලා තේරුම් ගන්න එයාලට උදවු කරන එක මගේ රස්සාව. මං එයාලව සනසන්නම්. මං කියනවට විශ්වාස කරන්න, එයාලා මේ වෙච්ච දේවල්වලට විකාර භූමිකම්පාවකට හරි සූර්ය ගිනි දැල්ලකට හරි වරද පටවයි. ඇත්තට ම සිද්ධ වුණ දේට ඇරෙන්න වෙන ඕනෑ ම දේකට."

Scanned with CamScanner

එයාගේ හඬේ තිබුණේ පරුෂ බවක්. ජෝර්ජ් සහ මාර්තා එයාගේ කැඩූසියස් එක වටේ එතිලා හිටියත්, ඒ දෙන්නා හිටියේ බොහෝම නිශ්ශබ්දවයි. එයින් මට හිතුණේ හර්මීස් ඉන්නවා ඇත්තේ ඇත්තට ම, හොඳටෝම කේන්තියෙන් කියලයි. මට තිබුණේ කට වහගෙන පාඩුවේ ඉන්නයි, ඒ වුණත් මම එයාට කතා කළා, "මම ඔයාගෙන් සමාව ඉල්ලන්න ඕනෑ."

හර්මීස් මගේ දිහා පරිස්සමෙන් බැලුවා. "ඒ මොකටද?"

"මං හිතුවේ ඔයා නරක තාත්තා කෙනෙක් කියලා," මම ඇත්ත ම කිවුවා. "මං හිතුවේ ඔයා ලූක්ගේ අනාගතේ ගැන දැනගෙන ඉඳලත්, ඒක නතර කරන්න මුකුත් කරන්නෙ නැතුව එයාව අතෑරලා දැම්මා කියලා."

"මං එයාගේ අනාගතේ දැනගෙන හිටියා තමයි," හර්මීස් මූසල විදිහට කිවුවා.

"ඒත් ඔයා නරක ම දේ- ඒ කියන්නෙ එයා දුෂ්ටයෙක් වෙනවා කියන දේට වඩා දෙයක් දැනගෙන හිටියා. අන්තිමේ දී එයා කරන්නෙ මොනවද කියලා ඔයා තේරුම් ගත්තා. එයා හරි තීරණය ගන්නවා කියලා ඔයා දැනගෙනයි හිටියේ. ඒත් ඔයාට ඒක එයාට කියන්න බැරි වුණා, එහෙම නේද?"

හර්මීස් ඇසි පිය නොහෙළා වතුර මල දිහා බලා සිටියා. ''ඉරණම එක්ක ඔට්ටු වෙන්න කාටවත් බැහැ, පර්සි, දෙවියෙකුටවත් බැහැ. ඉස්සරහට වෙන දේවල් ගැන මම එයාට අනතුරු අඟවලා තිබුණා නම්, එහෙම නැත්නම් එයාගේ තෝරා ගැනීම්වලට බලපෑම් කරන්න හැදුවා නම්, මේ දේවල් මීටත් වඩා නරක අතට හැරෙන්න තිබුණා. නිශ්ශබ්දව හිටපු එක, එයාගෙන් ඈත්වෙලා හිටපු එක... ඒක තමයි මම මෙච්චර කාලෙකට කරපු අමාරු ම දේ."

"එයාගේ පාර එයාට ම හොයාගන්න ඉඩ අරින්න ඔයාට සිද්ධ වුණා," මම කිවුවා, "ඊට පස්සේ ඔලිම්පස් බේරගන්න එයාගේ කොටස කරන්න අරින්නත්."

හර්මීස් සුසුමක් හෙළුවා. "මම ඇනබෙත් ගැන තරහා ගත්ත එක වැරදියි. එයාව හොයාගෙන ලූක් සැන් ෆ්‍රැන්සිස්කෝවලට ගියා ම... හොඳයි, ලූක්ගේ ඉරණම විසඳන්න ඇනබෙත්ටත් හවුල් වෙන්න වෙන බව මම දැනගෙන හිටියා. මම ඒ තරමට අනාගතේ දැකලයි තිබුණේ. මං හිතුවා බාගදා මට කරන්න බැරි වුණ දේ ඇනබෙත් කරලා, ලූක්ව



බේරගනියි කියලා. එයා ලූක් එක්ක යන්න බැහැ කිවුව ම, මට මගේ තරහා පාලනය කරගන්න බැරි වුණා. මට ඊට වඩා හිතන්න තිබුණා. ඇත්තට ම මම තරහින් හිටියේ මාත් එක්කමයි."

"ඇනබෙත් එයාව බේරගත්තා," මම කිවුවා. "ලූක් මැරුණේ වීරයෙක් විදිහට. එයා ක්‍රෝනොස්ව මරන්න එයාගේ ජීවිතේ කැප කළා."

"ඔයාගේ වචන මං අගේ කරනවා, පර්සි. ඒත් ක්‍රෝනොස් මැරුණේ නැහැ. ටයිටන් කෙනෙක්ව මරන්න ඔයාට බැහැ."

"එහෙනම්-"

"මං දන්නෙ නෑ," හර්මීස් ගෙරෙව්වා. "අපි කවුරුවත් දන්නෙ නැහැ. දූවිල්ලකට කුඩු වෙලා ගිහිල්ලා. හුළඟේ විසිරිලා ගිහිල්ලා. වාසනාව තිබුණොත්, එයාට ආයේ කවදාවත් රූපයක් තියා විඥානයක්වත් හදාගන්න බැරි වෙන තරම් තුනියට එයාව හැමතැන ම විසිරෙයි. ඒ වුණත් එයා මැරුණයි කියලා වැරදියට හිතන්න නම් එපා, පර්සි."

මගේ බඩ ඔක්කාරෙට එන්න වගේ කරණම් ගැහුවා. "එතකොට අනිත් ටයිටන්ලට මොකද වුණේ?"

"උන් හැංගිලා," හර්මීස් කිවුවා. "ක්‍රෝනොස්ට උදවු කරපු එක ගැන සමාවට කරුණු ගොඩක් කියලා ප්‍රොමීතියස් සියුස්ට පණිවුඩයක් එවලා තිබුණා. 'මම උත්සාහ කළේ සිද්ධ වෙන හානිය අවම කරන්න විතරයි,' බ්ලාහ්, බ්ලාහ්. එයාට මොළයක් කියලා දෙයක් තියෙනවා නම් තව සියවස් දෙක තුනක් යනකල් ඔළුව පාත් කරගෙන ඉඳියි. ක්‍රියෝස් පැනලා ගිහිල්ලා. ඔත්‍රිස් කන්ද කඩා වැටිලා විනාශ වෙලා. ක්‍රෝනොස් පැරදුණ බව පැහැදිලි වුණාට පස්සෙ ඔසිනස් ආපහු ගැඹුරු මුහුදට ලිස්සලා ගිහිල්ලා. මේ අතරවාරේ, මගේ පුතා ලූක් මැරුණා. එයා මැරුණේ මං එයා ගැන සැලකිල්ලක් දැක්වුවෙ නැහැ කියන විශ්වාසේ හිතේ තියාගෙනයි. ඒකට මම කවදාවත් මට සමාව දෙන්නෙ නැහැ."

හර්මීස් එයාගේ කැඩූසියස් එක මීදුම හරහා වැනුවා. අයිරිස්-පණිවුඩය නොපෙනී ගියා.

"සෑහෙන කාලෙකට ඉස්සර," මම කිවුවා, "ඔයා මට කිවුවා දෙවියෙක් වුණා ම අමාරු ම දේ තමයි තමන්ගේ දරුවන්ට උදවු කරන්න බැරි වෙන එක කියලා. ඒ වගේ ම ඔයා කිවුවා ඔයාට එහෙම

Scanned with CamScanner

කරන්න ම හිතෙන තැනට එයාලා වැඩ කළත්, ඔයාට ඔයාගේ පවුලේ අයව අත අරින්න බැහැ කියලා."

"එතකොට දැන් ඔයා දන්නවා මම ඉච්ඡාකාරයෙක් කියලා?"

"නෑ, ඔයා කිවුවා හරි, ලූක් ඔයාට ආදරේ කළා. අන්තිමේ දී, එයා එයාගේ ඉරණම තේරුම් ගත්තා. මං හිතන්නේ එයාට උදවු කරන්න ඔයාට බැහැ කියලා එයා තේරුම් ගත්තා. වඩාත් වැදගත් දේ මොකක්ද කියලා එයාට මතක් වුණා."

"ඒ වෙද්දි එයයි මමයි පරක්කු වැඩියි."

"ඔයාට තව දරුවෝ ඉන්නවා නේ. ලූක්ට ගරු කරන්න ඕනෑ නම් එයාලව හඳුනා ගන්න. දෙවිවරු හැමෝටම ඒක කරන්න පුළුවන් නේ."

හර්මීස්ගේ උරහිස් එල්ලා වැටුණා. "එයාලා උත්සාහ කරයි, පර්සි. ඔහ්, අපි හැමෝම අපේ පොරොන්දු රකින්න උත්සාහ කරනවා. සමහරවිට ටික කාලෙකට හැමදෙයක් ම හොඳ අතට හැරෙයි. ඒත් දෙවිවරු කියන්නෙ කවදාවත් දිවුරුම් රකින්න දක්ෂ ජාතියක් නෙවෙයි. ඔයා ඉපදුණෙත් ඒ වගේ බිඳුණු පොරොන්දුවක් නිසා, නෙහ්? කාලයක් යද්දි අපිට ඕවා මතක නැති වෙනවා. හැමදාමත් අපි එහෙමයි."

"ඉතින් ඔයාලට වෙනස් වෙන්න පුළුවන් නේ."

හර්මීස් මහ හඬින් හිනා වුණා. "අවුරුදු තුන්දාහක් ගියාටත් පස්සේ, දෙවිවරු එයාලගේ ගතිගුණ වෙනස් කරගනී කියලා ඔයා හිතනව ද?"

"ඔව්," මම කිවුවා. "මං එහෙම හිතනවා."

ඒ උත්තරෙන් හර්මීස් පුදුම වුණා වගෙයි. "ඔයා හිතන්නේ... ලූක් ඇත්තට ම මට ආදරේ කරන්න ඇති ද? සිද්ධ වෙච්ච් හැමදේකට ම පස්සෙත්?"

"මට ඒක සහතිකයි."

හර්මීස් වතුර මල දිහා බලා සිටියා. "මං ඔයාට මගේ දරුවන්ගේ නම් ලැයිස්තුවක් දෙන්නම්. විස්කොන්සින්වල කොල්ලෙක් ඉන්නවා. ලොස් ඇන්ජලීස්වල කෙල්ලො දෙන්නෙක් ඉන්නවා. තව දෙතුන් දෙනෙක් ම ඉන්නවා. එයාලව කඳවුරට ගෙන්න ගන්න ඔයාට පුළුවන් ද?"



"මං පොරොන්දු වෙනවා," මම කිවුවා. "ඒ වගේම මම නම් ඒක අමතක කරන්නෙ නැහැ."

ජෝර්ජ් සහ මාර්තා කැඩූසියස් එක වටා කැරකුණා. සර්පයින්ට හිනාවෙන්න බැහැ කියලා මම දන්නවා, ඒත් ඒ දෙන්නා නම් ඒකට උත්සාහ කරනවා වගෙයි පෙනුණේ.

"පර්සි ජැක්සන්," හර්මීස් කිවුවා, "අපිට පාඩමක් දෙකක් උගන්වන්න ඔයාට පුළුවන් වෙයි වගේ."

★★★

ඔලිම්පස්වලින් පිට වී යන පාරේ මම එන තුරු තවත් දෙවියෙක් බලා සිටියා. අත් දෙක පපුව හරහා බැඳගෙන පාර මැද හිටගෙන ඉන්නා ඇතීනාගේ මුහුණේ තිබුණු බැල්ම දකිද්දි මට හිතුණේ 'මං ඉවරයි ' කියලා. එයා සන්නාහය ගලවා දමලා, ජීන්ස් එකකින් සහ සුදු පාට බ්ලවුසයකින් සැරසී සිටියත්, එයින් එයාගේ යුදකාමී පෙනුම නම් අඩුවෙලා තිබුණේ නැහැ. එයාගේ අළු පාට ඇස් ඇවිළුණා.

"හොඳයි, පර්සි," එයා කිවුවා. "දැන් ඔයා මනුස්සයෙක් විදිහට ම ඉන්නයි යන්නේ."

"ම්ම්, ඔව්, මැඩම්."

"ඒකට හේතු දැනගන්න මං කැමතියි."

"මට සාමාන්‍ය කොල්ලෙක් වෙන්න ඕනෑ. මට ලොකු වෙන්න ඕනෑ. සාමාන්‍ය, ඔයා දන්නවා නේ, ඉස්කෝලේ කාලයක් අත්විඳින්න ඕනෑ."

"එතකොට මගේ දුව?"

"මට එයාව දාලා යන්න පුළුවන්කමක් තිබුණෙත් නැහැ," මම ඇත්ත ම කියද්දි මගේ කටේ කෙළත් හිඳිලයි තිබුණේ. "ග්‍රෝවර්වත්," මම ඉක්මනට එකතු කළා, "තව-"

"ඇති ඇති." ඇතීනා තවත් පියවරක් ළඟට එද්දී, එයාගේ බලයේ රශ්මිය මගේ හමේ කැසිල්ලක් ඇති කරනවා වගේ මට දැනුණා. "මං ඔයාට වතාවක් අනතුරු ඇඟෙව්වා, පර්සි ජැක්සන්, ඔයා යාළුවෙක්ව බේරගන්න මුළු ලෝකෙ ම විනාශ කරන්න වුණත් ඉඩ තියෙනවා කියලා. බාගදා මට වැරදිමක් වෙන්න ඇති. ඔයා ඔයාගේ යාළුවන්වයි ලෝකෙයි දෙක ම බේරගත්තා වගෙයි පේන්නේ. ඒත් මෙතැන ඉඳන් ඉස්සරහට වැඩ කරන විදිහ ගැන බොහොම පරිස්සමෙන් හිතලා

බලන්න. මං ඔයාට සැකයේ වාසිය දීලයි තියෙන්නේ. ඒක අවුල් කරගන්න එපා."

එයා කියපු දේවල් හරි කියලා ඔප්පු කරන්න වගේ ගිනි දලු කඳකට හැරුණු එයා චුත වෙලා ගියේ මගේ කමිසයේ ඉස්සරහ පදාසයක් ම පුච්චමිනුයි.

★★★

සෝපානය ළඟ ඇනබෙත් මම එන තුරු බලා සිටියා. "ඔයා ළඟින් කර ගඳක් එන්නෙ මොකද?"

"ඒක දිග කතාවක්," මම කිවුවා. අපි දෙන්නා සෝපානයෙන් පහළ වීදි මට්ටමට ආවා. ඒ අතර වාරයේ දී අපි දෙන්නගෙන් එක්කෙනෙක්වත් කතා කළේ නැහැ. එහි වාදනය වුණේ බිහිසුණු සංගීතයක්- නීල් ඩයමන්ඩ් ද කවුද මන්දා කෙනෙක්ගේ. අපරාදේ, මට තිබුණේ දෙවිවරුන්ගෙන් ගත්ත මගේ තෑග්ගට ඒකත් එකතු කරන්න: සෝපානයේ හොඳ සංගීතයක් වාදනය කළ යුතුයි.

ප්‍රවේශ ශාලාවට යද්දී මට දකින්න ලැබුණේ දැන් ආයෙමත් තමන්ගේ මුරපොළට ඇවිත් හිටපු තට්ට ආරක්ෂක නිලධාරියා සමඟ මගේ අම්මා සහ පෝල් වාද කරන හැටියි.

"මං ඔයාට කියන්නේ," මගේ අම්මා මොර දුන්නා, "අපිට උඩට යන්න ම ඕනෑ! මගේ පුතා-" ඒ වෙලාවේ මාව දැකලා එයාගේ ඇස් ලොකු වුණා. "පර්සි!"

එයා මාව වැලඳගත් වේගයට මගේ පෙණහලුවල තිබුණු හුළං ඔක්කොම එළියට පැන්නා.

"බිල්ඩිම නිල් පාටින් පත්තු වෙනවා අපි දැක්කා," එයා කිවුවා. "ඒත් ඊට පස්සේ ඔයා පහළට ආවෙ නැහැ නේ. ඔයා උඩට ගියේ පැය කීයකට කලින් ද!"

"එයා චුට්ටක් විතර බය වෙන්න ගත්තා," පෝල් ඇනුම්පදයක් කිවුවා.

"මට මුකුත් වුණේ නැහැ නේ ඉතින්," අම්මා ඇනබෙත්ව වැලඳ ගනිද්දී මම එයාට කිවුවා. "දැන් ඔක්කොම හරි."

"මිස්ටර් බ්ලෝෆිස්," ඇනබෙත් කතා කළා, "අර කඩුවෙන් දාපු සෙල්ලම නම් මාරයි."



පෝල් උරහිස් ඇකිළුවා. "ඒ වෙලාවේ එහෙම කරොත් හොඳයි හිතුණා. ඒක නෙවෙයි පර්සි, ඇත්ත ද මේ... මං අහන්නේ, මේ හයසිය වෙනි තට්ටුව ගැන කතාව?"

"ඔලිම්පස්," මම කිවුවා. "ඔව්."

සිවිලිම දිහා බලාගත් පෝල්ගේ මුහුණේ තිබුණේ දවල් හීන දකිනවා වගේ පෙනුමක්. "මාත් ආසයි ඒක බලන්න."

"පෝල්," මගේ අම්මා තරවටු කළා. "ඒක මිනිස්සුන්ට යන්න පුළුවන් තැනක් නෙවෙයි. කොහොම හරි, වැදගත් ම දේ තමයි දැන් අපි පරිස්සමෙන් ඉන්න එක. අපි හැමෝම."

මම හිටියේ විවේක ගන්න සූදානමින්. හැම දෙයක් ම පරිපූර්ණවයි දැනුණේ. ඇනබෙත් සහ මම හොඳින්. මගේ අම්මා සහ පෝල් පණ බේරගෙන. ඔලිම්පස් සුරක්ෂිතයි.

ඒත් උප දෙවියෙකුගේ ජීවිතේ කවදාවත් එච්චර ලේසි පහසු වෙන්නෙ නැහැ. එතකොට ම පාරේ ඉඳන් නිකෝ දුවගෙන ආවා. මොකක් හරි වැරැද්දක් වෙලා තියෙන බව එයාගේ මූණ දකිද්දි මට තේරුණා.

"රේචල්," එයා කිවුවා. "මට මේ දැන් තිස් දෙවෙනි වීදියේ දි එයාව හම්බවුණා."

ඇනබෙත් රවලා බැලුවා. "මේ පාර එයා මොකක්ද කරලා තියෙන්නේ?"

"එයා ගියපු තැන තමයි අවුල තියෙන්නෙ," නිකෝ කිවුවා. "ඒක කරන්න හැදුවොත් එයා මැරෙයි කියලා මං කිවුවා, ඒත් එයා ඇහුවේ නැහැ. එයා බ්ලැක්ජැක්වත් අරගෙන-"

"එයා මගේ පෙගසස්ව අරන් ගියා?" මම තදින් ඇහුවා.

නිකෝ ඔළුව වැනුවා. "එයා යන්නෙ අර්ධ-ලෝහිත කන්ද පැත්තට. එයා කිවුවා එයාට කඳවුරට යන්න වෙනවා කියලා."

Scanned with CamScanner

## 22

# මාව දැලේ පැටලුණා

කාටවත් මගේ පෙගසස්ව හොරකම් කරන්න බැහැ. අඩු තරමේ රේවල්ටවත් බැහැ. මම හිටියේ කේන්තියෙන් ද, පුදුමයෙන් ද, එහෙමත් නැත්නම් කනස්සල්ලෙන් ද කියලා මට ම හිතාගන්න බැරි වුණා.

"එයා මොනවා හිතාගෙන ද එහෙම කරේ?" අපි ගඟ දිහාවට දුවද්දි ඇනබෙත් ඇහුවා. අවාසනාවට, මට නම් ඒ ගැන හොඳ අදහසක් තිබුණා. ඒකෙන් වුණේ මගේ බය තවත් වැඩි වුණ එකයි.

පාරේ වාහන තදබදය දරුණු වුණා. හැමදෙනා ම පාරට බැහැලා යුද කලාපයේ අලාභ හානි නරඹමින් හිටියා. හැම ගොඩනැගිලි කාණ්ඩයක ම පොලිස් සයිරන් විලාප දුන්නා. එතැනින් කුලී වාහනයක් අල්ලගන්න කොහෙත්ම ඉඩක් තිබුණේ නැහැ, ඒ මදිවට පෙගසිලාත් යන්න ගිහිල්ලා. වෙලාවේ හැටියට පාටි පෝනියෝ දෙතුන් දෙනෙක් එක්ක හරි ගමන යන්න මම කැමති වුණත්, මිඩ්ටවුන්වල තිබුණු රූට් බියර් එක්ක ම එයාලත් අතුරුදහන් වෙලා තිබුණා. ඉතින්, අපි පැතිමං අනුරාගෙන හිටපු තෝන්තු වුණ මිනිස්සුන්ව තල්ලු කරගෙන දිවුවා.

"එයාට කීයටවත් රැකවල් හරහා යන්න ලැබෙන්නෙ නැහැ," ඇනබෙත් කිවුවා. "පෙලියස් එයාව කාලා දායි."

මට ඒ ගැන කල්පනා වෙලා තිබුණේ නැහැ. අනිත් මනුෂ්‍යයින්ව වගේ රේවල්ව මීදුමෙන් මුළා කරන්න බැහැ. ඒ නිසා කිසිම අමාරුවක්



නැතිව එයා කඳවුර හොයාගනියි, ඒත් මම බලාපොරොත්තු වෙමින් හිටියේ මායා බැම්ම බල ප්‍රාකාරයක් වගේ එයාව පිටමං කරලා තියා ගනීවි කියලයි. පෙලියස් එයාට පහර දෙයි කියලා මට මතක් වුණේ නැහැ.

"අපිට ඉක්මන් කරන්න වෙනවා." මම නිකෝ දිහාවට බැල්මක් හෙළුවා. "මං හිතන්නෙ ඔයාට ඇටකෝටු අශ්වයෝ දෙතුන් දෙනෙක්ව මවන්නත් බැරුව ඇති නේ."

අපිත් එක්ක ම දුවගෙන එන ගමන් එයා ඇදුම ලෙඩෙක් වගේ සද්දෙට හුස්ම ගත්තා. "ගොඩක් මහන්සියි... බලු ඇටකෝට්ටක්වත් කැඳවන්න බැහැ."

අන්තිමේ දී අපි කණ්ඩිය මතින් බඩගාගෙන ගං ඉවුරට ගියා. එතැන දී මම මහ හඬින් උරුවම් බෑවා. ඒක කරන්න ඇත්තට ම මම කැමති වුණේ නැහැ. මායා පිරිසිදු කිරීමක් කරගන්න මම නැගෙනහිර ගඟට සැන්ඩ් ඩොලරයක් දුන්නා වුණත්, තාමත් එහි වතුර සෑහෙන අපිරිසිදු වුණා. ඒවා නිසා මුහුදු සත්තු අසනීප වෙනවා දකින්න මට ඕනෑ වුණේ නැහැ. ඒ වුණත් මගේ කැඳවීමට එයාලා ආවා.

අඳුරු වතුරේ රේඛා තුනක් මතු වුණා. ටිකකින් හිපොකැම්පි රංචුවක් දියෙන් උඩට මතු වුණා. කේශරවල බැඳුණු රොන් මඩ ගසමින් එයාලා අසතුටින් හේෂාරාවය කළා. වෛවර්ණ මාළු වරල් සමඟ සුදු අශ්වයෙකුගේ හිසක් සහ ඉදිරි ගාත් ඇති එයාලා හරි ම ලස්සන සත්තු ජාතියක්. රැලේ ඉදිරියෙන් ම හිටපු හිපොකැම්පියා අනෙක් අයට වඩා ගොඩක් ලොකුයි- සයික්ලොප්ස් කෙනෙක්ව පිට මත තියාගෙන යන්න තරම් ලොකුයි.

"රේන්බෝ!" මම කතා කළා. "ඉතින් කොහොමද, යාළුවා?"

එයා දුක්ගැනවිල්ලක් හේෂාරාවය කළා.

"ඔව්, මට සමා වෙන්න," මම කිවුවා. "ඒත් මේක ලොකු ම ලොකු හදිස්සියක්. අපිට කඳවුරට යන්න ඕනෑ."

එයා නහයෙන් පිම්බා.

"ටයිසන් ද?" මම ඇහුවා. "ටයිසන් හොඳින් ඉන්නවා! එයාට මෙතැනට එන්න බැරි වුණාට කණගාටුයි. දැන් එයා සයික්ලොප්ස් හමුදාවේ ලොකු ජෙනරල් කෙනෙක් නේ."

"නී...ග්ග්හ්!!"

"ඔව්, ඒ මොනවා වුණත් එයා ඔයාට ඇපල් අරන් එයි කියලා මට විශ්වාසයි. දැන්, අර ගමන..."

වැඩි වෙලාවක් යන්න කලින් ම ඇනබෙත්, නිකෝ සහ මම ජෙට් ස්කිවලටත් වඩා වේගයෙන් නැගෙනහිර ගඟ දිගේ ඇදෙමින් සිටියා. ත්‍රොග්ස් නෙක් පාලම යටින් වේගයෙන් ගිය අපි ලෝන්ග් අයිලන්ඩ් මුහුදු තීරය දිහාවට හැරුණා.

***

අපිට කඳවුරේ වෙරළ පෙනෙන්න පටන් ගත්තේ කල්පයකට විතර පස්සෙ. හිපොකැම්පිලාට ස්තුති කරලා, වතුරට බැහැලා වෙරළ දිහාවට ඇවිදගෙන ගිය අපිට හොයාගන්න ලැබුණේ අපි එන තුරු බලා සිටි ආර්ගස්වයි. අත් දෙක පපුව හරහා බැඳගෙන වැල්ල මත හිටගෙන හිටපු එයාගේ ඇස් සියය ම අපිට රවාගෙන හිටියා.

"එයා මෙහෙට ආව ද?" මම ඇහුවා.

එයා බරපතළ තාලෙට ඔළුව වැනුවා.

"හැම දෙයක් ම හොඳින් ද?" ඇනබෙත් ඇහුවා.

ආර්ගස් ඔළුව හෙල්లුවා.

අපි එයා පසුපස අඩි පාර දිගේ ගියා. ආපහු කඳවුරට පැමිණීම අරුමයක් වගේ දැනුණේ, කඳවුරේ තිබුණු අදහාගන්න බැරි සාමකාමී පෙනුම නිසයිඃ ගිනි ගන්න ගොඩනැගිලි නැහැ, තුවාල ලැබූ සටන්කරුවෝ නැහැ. කැබින් කාමර ඉර එළිය මැද දීප්තිමත්ව දිලිසුණා, කෙත්වලට පිණි වැටිලා බබළමින් තිබුණා. ඒ වුණත් එතැන බොහෝ දුරට පාළු වුණා.

හැබැයි මහ ගෙදර පැත්තේ නම් මොකක් හරි වැරැද්දක් වෙලා තිබුණා. මම මේ කාසලන් ගැන දැකපු හීනෙ දී වුණා වගේ එහි හැම ජනේලයකින් ම කොළ පාට එළිය පිටට විහිදෙමින් තිබුණා. මීදුම-මායාවී ජාතිය- මිදුල වටා සුළි නැංවුවා. අත්පන්දු පිටිය ළඟ තැබූ අශ්ව-ප්‍රමාණයේ ගිලන් මැස්සක් මත වැතිරී සිටි කයිරොන්ව වට කරගෙන සැටර්ලා ගොඩක් හිටගෙන හිටියා. බ්ලැක්ජැක් තණගොල්ලේ කලබලෙන් ඇවිද්දා.

''ඔන්න මට නම් බනින්න එපා, බොස්!'' මාව දැකපු හැටියේ එයා බැගෑපත් වුණා. ''අර අමුතු කෙල්ල තමයි මට මේක කරන්න බල කළේ!''



රේචල් එලිසබෙත් ඩෙයාර් ඉදිරි දොර පඩි පාමුල හිටගෙන හිටියා. එයා අත් දෙක උඩට ඔසවාගෙන හිටියේ හරියට කවුරු හරි ගේ ඇතුළේ ඉඳන් එයාට බෝලයක් දානකල් බලන් ඉන්නවා වගෙයි.

"එයා මොනවද කරන්නේ?" ඇනබෙත් ප්‍රශ්න කළා. "එයා කොහොමද බැමි පහු කරගෙන ආවේ?"

"එයා පියාඹගෙන ආවේ," සැටර් කෙනෙක් කිවුවේ බ්ලැක්ජැක් දිහාවට චෝදනාත්මක බැල්මක් හෙළමිනුයි. "මකරාවත් පහු කරගෙන, මායා බැම්ම හරහා උඩින් ආවා."

"රේචල්!" මම කතා කළා, ඒත් මම එයාගේ ළඟට යන්න හදද්දි සැටර්ලා මාව නැවැත්තුවා.

"පර්සි, එපා," කයිරොන් අනතුරු ඇඟෙව්වා. හෙලවෙන්න උත්සාහ කරද්දි එයාගේ මූණ වේදනාවෙන් ඇඹරුණා. එයා හිටියේ වම් අත බෙල්ලේ එල්ලාගෙනයි, එයාගේ පසු ගාත් දෙකට ලී පතුරු තබා බැඳ තිබුණා. ඒ වගේ ම එයාගේ ඔළුවත් වෙළුම් පටිවලින් වෙළලයි තිබුණේ. "ඔයාට ඒකට බාධා කරන්න බැහැ."

"මං හිතුවෙ ඔයා මේ දේවල් එයාට පැහැදිලි කරලා දෙන්න ඇති කියලා!"

"මං එහෙම කළා. එයාට මෙහෙට එන්න ආරාධනා කළේ මමයි."

මම එයා දිහා බලාගෙන හිටියේ කන් අදහාගන්න බැරුවයි. "ආයේ කවදාවත් කිසිම කෙනෙක්ට මේකට උත්සාහ කරන්න ඉඩ දෙන්නෙ නැහැ කියලා නේද ඔයා කිවුවේ! ඔයා කිවුවා-"

"මං කිවුවේ මොනවද කියලා මම දන්නවා, පර්සි. ඒත් මම හිතුවා වැරදියි. හේඩීස්ගේ ශාපය ගැන දෘෂ්ටියක් රේචල්ට පෙනිලා තියෙනවා. දැන් ඒක අයින් කරන්න පුළුවන් වෙයි කියලා එයා විශ්වාස කරනවා. එයාට ඒකට අවස්ථාවක් ලැබෙන්න ඕනෑ කියලා එයා මට ඒත්තු ගැන්නුවා."

"ඒත් ශාපෙ අයින් වුණේ නැත්නම්? හේඩීස් තාම ඒකට අත ගහලා නැත්නම්, එයාට පිස්සු හැදෙයි!"

රේචල් වටා මීදුම සුළි නැංවුවා. එයා වෙවුලන්න ගත්තේ හරියට කම්පනයක් ඇති වෙලා වගෙයි.

"හේයි!" මම කෑගැහුවා. "ඕක නවත්තන්න!"

Scanned with CamScanner

මම සැටර්ලව නොතකමින් එයා දිහාවට දිවුවා. මම අඩි දහයක් තරම් ළඟට යද්දි ම අදෘශ්‍යමාන බීච් බෝලයක් වගේ මොකක්දෝ එකක් මගේ ඇඟේ තදින් හැප්පුණා. ආපස්සට විසිවෙලා ගියපු මම තණගොල්ල උඩ හතර ගාතෙන් ඇද වැටුණා.

ඇස් ඇර බැලූ රේචල් ආපහු හැරුණා. එයා හිටියේ නින්දෙන් ඇවිදින කෙනෙක් වගෙයි- හරියට එයාට මාව පෙනුණත්, ඒක හීනයක් විතරයි වගෙයි.

"ඒකට කමක් නැහැ," එයාගේ කටහඬ ඇසුණේ දුර ඈතකින් එනවා වගෙයි. "මං මෙහෙට ආවේ මේකටයි."

"ඔයාව විනාශ වෙලා යයි!"

එයා ඔළුව හෙල්లුවා. "මාව අයිති මෙතැනටයි, පර්සි. ඒකට හේතුව මට අන්තිමේ දී දැන් තේරෙනවා."

ඒ කතාවත් හරියට මේ කාසලත් කියලා තිබුණු කතාව වගේමයි. මට එයාව නවත්වන්න ඕනෑ වුණත්, මට අඩු තරමේ දෙපයින් හිටගන්නවත් පුළුවන් වුණේ නැහැ.

මුළු ගෙදර ම දෙදුරුවා. වේගයෙන් ඇරුණු දොර තුළින් කොළ පාට ආලෝකයක් පිටතට වැගිරුණා. එයින් හැමුව උණුසුම් පුස් බැඳුණු සර්ප ගඳ මම හඳුනා ගත්තා.

දුමාරයෙන් සැදි සර්පයෝ සිය ගාණකට හැරුණු මීදුම, පියස්සේ කුලුනු දිගේ ඉහළට බඩ ගාමින්, ගෙදර වටා කැරකෙන්න ගත්තා. ඊට පස්සේ ඔරකල් දොරකඩ පෙනී හිටියා.

දේදුනු පාට ගවුමෙන් සැරසී සිටි ඒ වේළුණු මමිය කකුල් අද්දවමින් ඉදිරියට ආවා. එයාගේ පෙනුම වෙනදාටත් වඩා අන්තයි. එයාගේ කොණ්ඩය පොකුරු පිටින් ගැලවී වැටෙමින් තිබුණා. එයාගේ ලෙදර් වගේ හම බසයක ගෙවී ගිය අසුනක් වගේ ඉරි තැළිලා. එයාගේ වීදුරු ඇස් හිස් බැල්මෙන් ඈත අවකාශයට යොමු වී තිබුණත්, එයා කෙලින් ම ඇදෙන්නේ රේචල් දිහාවට කියලා මට බියජනක හැඟීමක් දැනුණා.

රේචල් දෑත් ඉදිරියට දිගු කළා. එයා බය වෙලා ඉන්න බවක් පෙනුනේ නැහැ.

"ඔයා ගොඩක් කල් බලාගෙන හිටියා," රේචල් කිවුවා. "ඒත් දැන් මම ඇවිල්ලයි ඉන්නේ."



ඉර වඩාත් දීප්තිමත්ව දැල්වෙන්න ගත්තා. පියස්සට ඉහළින්, ගුවනේ පාවෙන පිරිමියෙක් ප්‍රාදූර්භූත වුණා- සුදු පාට ටෝගාවක් (පුරාණ රෝමන්වරුන්ගේ ඇඳුම) සහ අව් කණ්ණාඩි දෙකක් හැඳ පැළඳගත්, රන්වන් කොණ්ඩයක් සහ උද්දච්ච හිනාවක් ඇති හාදයෙක්.

"ඇපලෝ," මම කිවුවා.

එයා මට ඇහැක් ගැහුවත්, ඊට පස්සේ තොල් මත ඇඟිල්ලක් තබාගත්තා.

"රේචල් එලිසබෙත් ඩෙයාර්," එයා කතා කළා. "ඔබට අනාවැකි කීමේ ත්‍යාගය හිමි වී තියෙනවා. ඒත් ඒක ශාපයකුත් වෙනවා. මෙය උවමනා බව ඔබට විශ්වාස ද?"

රේචල් ඔළුව වැනුවා. "ඒක තමයි මගේ දෛවය."

"එහි අවදානම ඔබ බාරගන්නවා ද?"

"මම බාරගන්නවා."

"එහෙනම් කරගෙන යන්න," දෙවියා කිවුවා.

රේචල් දෑස් වසාගත්තා. "මම මේ කාර්යභාර්යය පිළිගනිමි. මම ඔරකල්ට අධිපති දෙවියන් වන ඇපලෝට මාව කැප කරමි. මම අනාගතයට මගේ දෙනෙත් විවර කර, අතීතය වැලඳ ගනිමි. මම ඩෙල්ෆි හී ආත්මය, දෙවිවරුන්ගේ හඬ, ප්‍රහේලිකා කථික සහ ඉරණමේ අනාගත වක්තෘත්ව භාරගනිමි."

ඒ වචන එයා කොහෙන් හොයා ගත්ත ද මම දන්නෙ නැහැ, ඒ වුණත් ඒවා එයාගේ කටින් ගලාගෙන එද්දි එයා වටා මීදුම තව තවත් ඝන වුණා. යෝධ පිඹුරෙක් වගේ කොළ පාට දුම් කදක් මමියේ මුව තුළින් දඟර අරිමින් පිටවී, පඩිපෙළ පහළට ලිස්සා ඇවිත්, රේචල්ගේ දෙපා වටා දයාබර ලෙස එතෙන්න ගත්තා. ඒත් එක්ක ම ඔරකල්ගේ මමිය කුඩු වෙමින් කඩා වැටෙන්න පටන් ගත්තේ අන්තිමේට පරණ බතික් ගවුමක් තුළ දූවිලි ගොඩක් පමණක් ඉතිරි කරමිනුයි. මීදුම රේචල්ව වසා ගත්තා.

එක මොහොතකට මට එයාව මුළුමනින් ම නොපෙනී ගියා. ටිකකින් දුමාරය පහ වුණා.

බිමට ඇද වැටුණු රේචල් මව් කුසේ ඉන්න දරුවෙක් වගේ බිම වකුටු වුණා. ඇනබෙත්, නිකෝ සහ මම එයා දිහාවට දිවුවත්, ඇපලෝ අපිට බාධා කළා. "නවතින්න! මේක තමයි වඩාත් ම සියුම් කොටස."

"මොනවද මේ සිද්ධ වෙන්නේ?" මම ප්‍රශ්න කළා. "ඔයා මොකක්ද අදහස් කළේ?"

ඇපලෝ රේචල්ව සැලකිල්ලෙන් අධ්‍යයනය කළා. "එක්කෝ ආත්මය එයාව ග්‍රහණය කර ගනියි, නැත්නම් නැති වෙයි."

"එතකොට එහෙම වුණේ නැත්නම්?" ඇනබෙත් ඇහුවා.

"වචන පහයි," ඇපලෝ කිවුවේ ඒවා එයාගේ ඇඟිලි නමා ගණන් කරමින්. "ඒක නම් ගොඩා...ක් නරක වෙයි."

ඇපලෝගේ අනතුරු ඇඟවීම පැත්තකට දාලා, මම දුවලා ගිහින් රේචල් ළඟ දණ ගසාගත්තා. දූන් අර අට්ටාලයේ ගඳ නැතිවෙලා. මීදුම පොළොව තුළට කිඳා බැහැලා, කොළ පාට එළිය වියැකී ගිහින් තිබුණා. ඒත් රේචල් තවමත් හිටියේ සුදුමැලි වෙලයි. එයා හුස්ම ගත්තෙත් යාන්තමින්.

ටිකකින් එයාගේ ඇස් සැලෙමින් විවර වුණා. එයා අමාරුවෙන් මගේ දිහා බැලුවා. "පර්සි."

"ඔයා හොඳින් ද?"

එයා නැඟිටලා වාඩි වෙන්න උත්සාහ කළා. "ඌයි." එයා නළල දෙකෙළවර දෑතින් තද කරගත්තා.

"රේචල්," නිකෝ කතා කළා, "ඔයාගේ ජීව රශ්මිය සම්පූර්ණයෙන් ම වගේ මැකිලා ගියා. ඔයා මැරෙන්න යනවා මට පෙනුණා."

"මට අවුලක් නැහැ," එයා මිමිණුවා. "අනේ, මට නැඟිටින්න උදවු කරන්නකෝ. මේ දෘෂ්ටිය- ඒවා චුට්ටක් අන්දමන්ද වෙලා ඉන්නේ."

"ඔයාට අවුලක් නැහැ කියලා විශ්වාස ද?" මම ඇහුවා.

ඇපලෝ පියස්සෙන් පහළට පාවෙලා ආවා. "නෝනාවරුණි, මහත්වරුණි, අභිනව ඩෙල්ෆි හි ඔරකල්ව හඳුන්වා දීමට මට අවසර ද?"

"ඔයා විහිළු කරනවා," ඇනබෙත් කිවුවා.

රේචල් දුබල හිනාවක් පෑවා. "ඒක මටත් පුංචි පුදුමයක් තමයි, ඒත් මේක තමයි මගේ ඉරණම. නිව්යෝර්ක්වල ඉන්නකොට මම ඒක දැක්කා. මම නියම දෘෂ්ටියක් එක්ක ඉපදිලා තියෙන්නෙ ඇයි කියලා මං දන්නවා. ඔරකල් බවට පත්වෙන්න හිටියේ මමයි."



මම තදින් ඇහි පිය ගැහුවා. "ඔයා කියන්නේ දැන් ඔයාට අනාගතේ කියන්න පුළුවන් කියල ද?"

"හැම වෙලාවෙ ම නෙවෙයි," එයා කිවුවා. "ඒත් සමහර වෙලාවට මගේ හිතේ දර්ශන, රූප, වචන මැවෙනවා. කවුරුහරි මගෙන් ප්‍රශ්නයක් අහපු වෙලාවට, මම... ඔහ් නැහැ-"

"ඔන්න ඒක පටන් ගන්නයි යන්නේ," ඇපලෝ නිවේදනය කළා.

කාගෙන් හරි බඩට පාරක් වැදුණා වගේ රේචල් දෙකට නැමුණා. ඊට පස්සේ එයා ආයෙමත් කෙලින් හිටගනිද්දි එයාගේ ඇස් සර්ප කොළ පාටින් දිලිසෙමින් තිබුණා.

එයා කතා කරන්න ගත්තා ම, එයාගේ හඬ තුන් ගුණයක් වෙලා ඇහුණේ හරියට රේචල්ලා තුන් දෙනෙක් එකවර කතා කරනවා වගෙයි:

"අර්ධ-ලෝහිතයෝ සත් දෙනෙක් කැඳවීමට පිළිතුරු දෙයි.

කුණාටුවෙන් හෝ ගින්නෙන්, මිහිකත ඇද වැටිය යුතුයි.

අවසන් හුස්ම සමඟින් දිවුරුම රකියි.

මරණයේ දොරටුව වෙනුවෙන් සතුරන් අත්වැල් බැඳගනියි."

අන්තිම වචනයේ දී රේචල් බිමට ඇදගෙන වැටුණා. නිකෝයි මමයි එයාව අල්ලගෙන, පියස්ස යටට ගෙන ගියා. එයාගේ ඇඟ උණ ගත්ත වගේ ගිනියම් වෙලයි තිබුණේ.

"මට අවුලක් නැහැ," එයා කියද්දි, එයාගේ කටහඬ සාමාන්‍ය අතට හැරෙමින් තිබුණා.

"ඒ මොකක්ද ඒ?"

එයා ඔළුව හෙල්ලුවේ අන්දබූත වෙලයි. "මොකක්ද?"

"මං විශ්වාස කරන විදිහට," ඇපලෝ කිවුවා, "අපිට මේ දැන් අහන්න ලැබුණේ ඊළඟ මහා අනාවැකිය."

"මොකක්ද ඒකේ තේරුම?" මම තදින් ඇහුවා.

රේචල්ගේ නළල රැළි ගැහුණා. "මං කිවුවේ මොනවද කියලවත් මට මතක නැහැ."

Scanned with CamScanner

"නැහැ," ඇපලෝ කල්පනාබරව කිව්වා. "ආත්මය ඔයා තුළින් කතා කරන්නේ ඉඳහිට සැරයක් විතරයි. ඉතුරු කාලයේ දි, අපේ රේචල් හිටියා වගේ ම ඉදියි. දැන් එයාට වද දුන්නා කියලා වැඩක් නැහැ, අඩු තරමේ එයා මේ දැන් ලෝකයේ අනාගතය ගැන ලොකු පෙරනිමිත්තක් පිටකළා වුණත්."

"මොකක්?" මම ඇහුවා. "ඒත්-"

"පර්සී," ඇපලෝ කතා කළා, "මම නම් ඒක ගැන ඒ හැටි වද වෙන්නෙ නැහැ. ඔයා ගැන කියවුණ අන්තිම මහා අනාවැකිය සම්පූර්ණ වෙන්න අවුරුදු හැත්තෑවක් ගියා. සමහරවිට මේක ඔයාගේ ජීවිත කාලෙ දී සිද්ධ නොවෙන්න පවා පුළුවන්."

අර ඇඟ හිරිවට්ටන හඬින් රේචල් කියපු වාක්‍ය ගැන මම කල්පනා කළා: අර කුණාටු සහ ගින්දර ගැනයි, මරණයේ දොරටු ගැනයි කියවුණු ඒවා. "සමහරවිට," මම කිව්වා, "හැබැයි ඒක ඒ හැටි හොඳ පාටක් නම් නැහැ."

"නෑ," ඇපලෝ කිව්වේ උද්‍යෝගයෙන්. "කොහෙත්ම නැහැ. මෙයා නම් නියම ඔරැකල් කෙනෙක් වෙන්නයි යන්නේ!"

***

ඒ මාතෘකාව අත ඇරලා දාන එක අමාරු වැඩක් වුණත්, රේචල් විවේක ගන්න ඕනෑ කියලා ඇපලෝ තරයේ කියා සිටියා. ඇත්තටම රේචල් හිටියෙත් සෑහෙන අන්දමන්ද වෙලා වගෙයි.

"මට සමා වෙන්න, පර්සි," එයා කිව්වා. "කලින් ඔලිම්පස්වල දී, මම හැමදෙයක් ම ඔයාට තේරුම් කරලා දුන්නෙ නැහැ, ඒත් මේ කැඳවීම මාව බය ගැන්නුවා. ඔයාට ඒක තේරුම් ගන්න පුළුවන් වෙයි කියලා මං හිතුවෙ නැහැ."

"මට තාමත් තේරෙන්නෙ නැහැ," මම ඇත්ත ම කිව්වා. "ඒත් මං හිතන්නේ, මට ඔයා ගැන සතුටුයි."

රේචල් හිනා වුණා. "මට හිතෙන්නේ එතැනට ගැළපෙන ම වචනේ 'සතුටුයි' නෙවෙයි. අනාගතය දකින එක ලේසි පහසු වැඩක් වෙන්නෙ නැති වෙයි, ඒ වුණත් ඒක තමයි මගේ දෛවය. මගේ එක ම බලාපොරොත්තුව මගේ පවුලේ අය..."

එයා ඒ සිතුවිල්ල සම්පූර්ණ කළේ නැහැ.



"ඔයා තවමත් ක්ලැරියන් බාලිකාවට යන්න ද ඉන්නේ?" මම ඇහුවා.

"මම මගේ තාත්තට පොරොන්දුවක් දුන්නා. මං හිතන්නේ ඉස්කෝලේ වාරවල දී සාමාන්‍ය ළමයෙක් වෙන්න මම උත්සාහ කළොත් හොඳයි, ඒත්-"

"ඒත් මේ දැන් ඔයා නිදාගත්තොත් හොඳයි," ඇපලෝ සැර කළා. "කයිරොන්, අපේ අලුත් ඔරැකල්ට ඉන්න අට්ටාලේ හොඳ තැනක් වෙයි කියලා මම නම් හිතන්නෙ නැහැ, නේද?"

"කොහෙත්ම නැහැ." ඇපලෝ එයාට කරපු වෛද්‍ය මායාවෙන් පස්සෙ කයිරොන් දැන් හිටියේ සෑහෙන හොඳ තත්ත්වයෙන්. "අපි මේ කාරණේ ගැන වැඩිදුර හිතලා බලනකල්, දැනට රේචල්ට මහ ගෙදර අමුත්තන්ගේ කාමරේ පාවිච්චි කරන්න පුළුවන්."

"මං හිතන්නේ කන්දේ තියෙන ගල් ගුහාවක් වැඩේට ගැළපෙයි," ඇපලෝ කල්පනාකාරීව කිව්වා. "දොරටුවට දම් පාට ලොකු දොර රෙද්දක් දාලා, පන්දම් පත්තු කරලා... නියම අබිරහස් විදිහට හදනවා. හැබැයි ඇතුළේ, ගේම් රූම් එකකුයි, අර හෝම් තියටර් සිස්ටම් එකකුයි දාලා පිස්සු හැදෙන්න සරසනවා."

කයිරොන් සද්දෙට උගුර පෑදුවා.

"මොකද?" ඇපලෝ ප්‍රශ්න කළා.

රේචල් මගේ කම්මුලට හාද්දක් දුන්නා. "ගුඩ් බායි, පර්සි." එයා මිමිණුවා. "මං හිතන්නේ දැන් ඔයා කරන්න ඕනෑ මොනවද කියන්න මං අනාගතේ බලන්න ම ඕනෑ නැහැ, එහෙම නේද?"

එයාගේ ඇස් දෙක වෙන කවරදාටත් වඩා විනිවිදයනසුලු වුණා.

මම රතු වුණා. "නැහැ."

"ඒක හොඳයි," එයා කිව්වා. ඊට පස්සේ අනෙක් පැත්තට හැරුණු එයා ඇපලෝ පසුපස මහ ගෙදර ඇතුළට ගියා.

***

දවසේ ඉතිරියත් ආරම්භය තරමට ම පුදුමාකාර වුණා. නිව්යෝර්ක්වල සිටි කඳවුරුකරුවෝ කාර්වලින්, පෙගසස්ලා පිටෙන් සහ කරත්තවලින් ටික ටික ආපහු ආවා. තුවාල ලැබුවන්ට සාත්තු

සජ්ජායම් කළා. මිය ගිය අයට කඳවුරු ගිනිමැලය ළඟ දී නියමාකාරයෙන් අවමංගල වතාවත් ඉටු කළා.

සිලේනාගේ ආදාහන සළුව තද රෝස පාට වුණත්, එය මැද එම්බ්‍රොයිඩර් කර තිබුණේ විදුලි හෙල්ලයක්. ඒරිස් සහ ඇෆ්‍රෝඩයිට් කැබින් දෙක ම එයාව වීරයෙක් ලෙස පිළිගත්තා. ඒ දෙගොල්ලෝ එකට එක් වී ආදාහන සළුවට ගිනි දැල්වූවා. කවුරුවත් ම 'ඔත්තුකාරයා' කියන වචනයවත් මතක් කළේ නැහැ. ඒ රහස දවා අළු කරමින්, විලවුන් සුවඳ දුමාරය අහසට නැගුණා.

ඊතන් නකමුරාට පවා ආදාහන සළුවක් වෙන් කර තිබුණා- තරාදියකට යටින් එකිනෙක හරස් කළ කඩු දෙකක සලකුණ ඇති කළු පාට සේද සළුවක්. එයාගේ සළුව ගිනි දලුවලින් වෙලී යද්දී, මම බලාපොරොත්තු වුණේ අවසානයේ දී එයා වෙනසක් ඇති කළ බව ඊතන් දන්නවා ඇති කියලයි. එයාට එක ඇහැකට වඩා ලොකු දෑලක් ගෙවන්න සිද්ධ වුණත් අවසානයේ දී සුළු දෙවිවරුන්ට ලැබිය යුතු ගෞරවය හිමිව තිබුණා.

භෝජන මණ්ඩපයේ පැවැත්වූ රාත්‍රී භෝජනය වෙනදා තරම් සාටෝපවත් වුණේ නැහැ. කැපී පෙනුණු එක ම දේ වුණේ හැමෝගෙම ප්‍රීතිඝෝෂා මැද ජුනිපර්, රුක් දෙවඟන, "ග්‍රෝවර්!" කියලා බෙරිහන් දීගෙන දුවගෙන ඇවිත්, එයාගේ පෙම්වතාව පෙරළගෙන වැලඳගත් එකයි. ඒ දෙන්නා හඳපානේ ඇවිදින්න වෙරළ පැත්තට ගියා. එයාලා ගැන මම සතුටු වුණත්, ඒ දසුන දකිද්දී මට සිලේනාව සහ බෙකන්ඩෝර්ෆ්ව සිහිවෙලා දුකකුත් දැනුණා.

මිසිස් ඕ'ලෙරී දුව පැන ඇවිදිමින්, හැමදෙනාගේ ම මේසවල ඉතිරිව තිබුණු කෑම කෑවා. නිකෝ කයිරොන් සහ මිස්ටර් ඩී සමඟ ප්‍රධාන මේසයේ වාඩි වී සිටියත්, ඒක නුසුදුසු වැඩක් කියලා කවුරුවත් හිතුවෙ නැහැ. හැමෝම නිකෝගේ පිටට තට්ටු කරමින්, එයා සටන් කරපු විදිහ වර්ණනා කළා. අඩු ගාණේ ඒරිස් ළමයි පවා එයා නියම කොල්ලෙක් කියලා හිතන බව පෙනුණා. හේයි, ඔයත් පිල්ලි හමුදාවක් එක්ක යුද්ධයක් මැදට පැනලා දවසේ වීරයා වෙලා බලන්න, ඊට පස්සේ එක පාරට ම ඔයා හැමෝගෙ ම හොඳ ම යාළුවා වෙනවා.

හෙමින් හෙමින් රෑ කෑමට ආව සෙනඟ ආපහු යන්න ගියා. සමහරු සංගීත සාජ්ජයක් පටන් ගන්න කඳවුරු ගිනි මැලය පැත්තට ඇදුණා. අනෙක් අය නිදාගන්න ගියා. මම පොසෙයිඩන් මේසයේ තනියම ඉඳගෙන ලෝන්ග් අයිලන්ඩ් මුහුදු තීරය හඳ එළියෙන්



එකාලෝක වී ඇති දිහා බලා සිටියා. ජුනිපර් සහ ග්‍රෝවර් වෙරළේ අත් අල්ලාගෙන, කතා කරමින් ඉන්නවා මට පෙනුණා. හැම දෙයක් ම ගොඩාක් සාමකාමී වුණා.

"හේයි." ඇනබෙත් බංකුවේ මගේ ළඟින් වාඩි වුණා. "සුභ උපන් දිනයක්."

එයා නිල් පාට අයිසින් දාපු, ඇද වෙච්ච් තඩි කප් කේක් එකක් අතේ තියාගෙනයි හිටියේ.

මම එයා දිහා පුදුමයෙන් බැලුවා. "මොකක්?"

"අද අගෝස්තු දහ අට නේ," එයා කිවුවා. "ඔයාගේ උපන් දිනේ, නේද?"

මම පුදුමයෙන් ගැස්සුණා. මට ඒ හාංකවිසියක් මතක තිබුණේ නැහැ. කොහොම වුණත් එයා හරි. මේ උදෑසන- මම ලූක් අතට කිණිස්ස දෙන්න තීරණය කළ උදෑසන මට අවුරුදු දහසය ලැබුවා. අනාවැකිය කියලා තිබුණු දිනේට ම සැබෑවක් බවට පත් වුණා. ඒත් මේක මගේ උපන් දිනය කියලා මට නිකමටවත් සිහිවෙලා තිබුණෙ නැහැ නෙ.

"ප්‍රාර්ථනාවක් කරන්න," එයා කිවුවා.

"මේ කේක් එක ඔයා ම ද හැදුවේ?" මම ඇහුවා.

"ටයිසනුත් උදවු කළා."

"ඒක තමයි එහෙනම් මේක චොකලට් ගඩොලක් වගේ පේන්නෙ," මම කිවුවා. "නිල් පාට සිමෙන්ති වැඩිපුරත් එක්ක දාපු."

ඇනබෙත් මහ හඬින් හිනා වුණා.

එක තත්පරයක් කල්පනා කළ මම ඊට පස්සෙ ඉටි පන්දම නිවා දැමුවා.

අපි කේක් එක දෙකට කපලා, බාගේ බාගේ බෙදාගෙන කෑවා. ඊට පස්සේ අපි දෙන්නා එක ළඟ වාඩි වෙලා මුහුද දිහා බලාගෙන හිටියා. කැලෑව තුළින් නැගුණු රෑහැයියන්ගේ සහ රාක්ෂයින්ගේ හඬවල් ඇරුණා ම, සියල්ල නිසොල්මන් වුණා.

"ඔයා ලෝකෙ බේරගත්තා," එයා කිවුවා.

"අපි ලෝකෙ බේරගත්තා."

"ඒ වගේම දැන් රේචල් තමයි අලුත් ඔරැකල්. ඒ කියන්නේ එයාට කාත් එක්කවත් පටලැවිලි තියාගන්න වෙන්නෙ නැහැ."

"ඔයාට නම් ඒකෙන් අවුලක් නැහැ වගෙයි," මම කිවුවා.

ඇනබෙත් උරහිස් ඇකිළුවා. "ඔහ්, මට මොකද?"

"අහ්-හහ්."

එයා ඇහි බැමක් එසෙව්වා. "මට මොනවා හරි කියන්න තියෙනව ද, පාසි මොළේ?"

"ඒක අහලා ඔයා මගේ හොම්බට දෙකක් අනියි ද දන්නෑ."

"ඔයා දන්නවා නේ, මං කොහොමත් ඔයාගේ හොම්බට දෙකක් අනිනවා තමයි."

මම අතේ තැවරිලා තිබුණු කේක් කුඩු පිහ දැමුවා. "මම කාටවත් නුවාල කරන්න බැරි ශක්තිමත් කෙනෙක්ට හැරෙන්න ස්ටයික්ස් ගඟට ගිය වෙලාවේ... නිකෝ කිවුවා මම මේ ලෝකයට මාව අමුණලා තියාගන්න දේකට, මට දිගට ම මනුස්සයෙක් වෙලා ඉන්න ඕනෑ කරන දේකට හිත එකාග්‍ර කරගන්න කියලා."

ඇනබෙත් ඈත ක්ෂිතිජය දිහා ම බලාගෙන හිටියා. "එහෙමද?"

"ඊට පස්සේ ඔලිම්පස්වල දී," මම කිවුවා , "එයාලට මාව දෙවියෙක් කරන්න ඕනෑ වුණා ම, මම දිගින් දිගට ම හිතුවෙ-"

"ඔහ්, ඒක කරන්නමයි ඔයාගේ හිත ගියේ."

"හොඳයි, සමහරවිට චුට්ටක් විතර. ඒත් මම එහෙම කළේ නැහැ, මොකද මම හිතුවේ- මට මේ දේවල් සදහට ම මේ විදිහට තියෙනවා දකින්න ඕනෑ වුණේ නැහැ, මොකද හැමදෙයක් ම, හැම වෙලාවෙ ම තිබුණට වඩා හොඳ අතට හැරෙන්න පුළුවන්. ඒ වගේම මම හිත හිතා හිටියේ..." මගේ උගුර හොඳටෝම වේළිලා වගෙයි දැනුණේ.

"කවුරු හරි විශේෂ කෙනෙක් ගැන ද?" ඇනබෙත් අහද්දී, එයාගේ කටහඬ ගොඩක් මෘදු වෙලා තිබුණා.

එයා දිහා බලද්දි මට පෙනුණේ එයා හිනා නොවී ඉන්න උත්සාහ කරන බවයි.

"ඔයා මට හිනා වෙනවා නේද?" මම මැසිවිලි නැඟුවා.

"එහෙම නෑ!"



"ඔයා මට මේක ලේසි කරන්නෙ නැහැ නේ."

ඒ වෙලාවේ ඇත්තට ම හිනා වුණ එයා, මගේ බෙල්ල වටේට දෑත් දමා ගත්තා. "මම කිසිම දවසක, කිසිම දෙයක් ඔයාට ලේසි වෙන්න අරින්නෙ නැහැ, පාසි මොළේ. ඒකට දැන් ඉඳල ම පුරුදු වෙන්න."

එයා මාව සිප ගනිද්දි, මට දැනුණේ මගේ මොළේ දියවෙලා ඇඟ පුරා ම ගලනවා වගෙයි.

මට සදහට ම වුණත් එහෙම ඉන්න පුළුවන්කම තිබුණා, ඒත් කරුමෙට අපිට පිටිපස්සෙන් වදකාරයෙක් මතු වුණා නේ, "හොඳායි, දැන් එහෙනම් නැකත ඇවිල්ලා!"

එක පාරට ම මණ්ඩපය පන්දම් එළිවලින් සහ කඳවුරුකරුවන්ගෙන් පිරුණා. අපේ කතාවට හොරෙන් කන් දිගෙන හිටපු අය අපි දෙන්නව උස්සලා කරවල් මතට ගනිද්දි, ක්ලැරිස් එයාලව මෙහෙයුවා.

"අයියෝ, මොනවද අප්පා!" මම අවලාද කිවුවා. "අපිට කිසිම පුද්ගලික නිදහසක් නැද්ද ආ?"

"ලව් බර්ඩ්ස්ලව නාවලා ගන්න එපැයි!" ක්ලැරිස් කිවුවේ උඩ පනිමින්.

"ඔරු පදින විලට!" කොනර් ස්ටොල් කෑගැහුවා.

ලොකු ප්‍රීති ඝෝෂාවක් එක්ක එයාලා අපිව කන්ද පහළට ඔසවාගෙන ගියා, හැබැයි එයාලා අපි දෙන්නට අත් අල්ලගෙන ඉන්න පුළුවන් වෙන තරම් ළං කරලා තියාගන්න වගබලා ගත්තා. ඇනබෙත් හිටියේ මහ හඬින් හිනා වෙමින්. මගේ මුළු මූණ ම රතු වෙලා තිබුණත්, මටත් හිනා නොවී ඉන්න බැරි වුණා.

එයාලා අපිව වතුරට අත අරින මොහොත වෙන තුරු ම අපි දෙන්නා හිටියේ අත් අල්ලගෙනයි.

ඊට පස්සේ, හිනා වෙන්න වාරේ ආවේ මටයි. මම විල් පතුලේ වායු බුබුළක් හැදුවා. අපේ යාළුවෝ අපි දෙන්නා උඩට මතු වෙනකල් ඔහේ බලාගෙන හිටියා, ඒත් හේයි- ඔයා පොසෙයිඩන්ගේ පුතෙක් වුණා ම, මොකට හදිස්සි වෙනව ද?

මං හිතන්නෙ ඒක තමයි මෙච්චර කාලෙකට ලෝකේ හොඳ ම දිය යට හාදුව.

Scanned with CamScanner

# 23

# අපි එකිනෙකාගෙන් සමුගත්තා, වගේ

ඒ ගිම්හානයේ කඳවුර අවසන් වෙන්න කල් ගියා. අලුත් පාසල් වාරය අත ළඟට එන තුරු ම, කඳවුර තවත් සති දෙකක කාලයක් පැවතුණා. ඒ වගේම මගේ ජීවිතේ හොඳම සති දෙක ඒකයි කියලා මම කියන්න ම ඕනේ.

ඇත්තටම මම එහෙම නොකිවුවොත් ඇනබෙත් මාව මරයි, ඒ වුණත් ඒ කාලයේ තවත් නියම වැඩ ගොඩක් සිද්ධ වුණා. සැටර් සොයන්නන්ගේ පාලනය අතට ගත්ත ග්‍රෝවර්, හිමිකම් නොකියපු අර්ධ-ලෝහිතයන්ව හොයන්න එයාලව ලෝකේ වටේ යැව්වා. මේ වන තුරු නම්, දෙවිවරු එයාලගේ පොරොන්දුව රැක්කා. අලුත් උපදෙවිවරු නිරන්තරයෙන් කඳවුරට මතු වෙන්න ගත්තා - ඇමෙරිකාවෙන් විතරක් නෙවෙයි, තවත් රටවල් ගොඩකිනුත්.

"අපිට මේක කරගෙන යන්න අමාරුයි," එක හැන්දෑ වරුවක අපි ඔරු පදින විල ළඟ විවේකයක් ගනිමින් ඉන්න වෙලාවේ ග්‍රෝවර් කිවුවා. "අපිට ගමන් බිමන්වලට මීට වඩා ලොකු බජට් එකක් ඕනේ වෙනවා, ඒ වගේම මට තව සැටර්ලා සීයක් හිටියත් මදි."

"ඔව්, ඒත් දැන් ඔයා ළඟ ඉන්න සැටර්ලා සෑහෙන මහන්සි වෙලා වැඩ කරනවා නේ," මම කිවුවා. "මං හිතන්නේ එයාලා ඔයාට බයයි."

ග්‍රෝවර් රතු වුණා. "ඒක මෝඩ වැඩක් නේ. මම හොල්මනක් යෑ."



"ඔයා වනාන්තරයට අධිපතියෙක් නේ, බං. පෑන් විසින් තෝරාගත්ත කෙනා. විධාරිත වැඩිහිටියන්ගේ මණ්ඩලේ සාමාජික-"

"ඕක නවත්ත ගන්නව ද!" ග්‍රෝවර් විරෝධය පෑවා. "ඔයයි ජුනිපරුයි දෙන්න ම එකයි. මං හිතන්නේ එයාට ඕනේ වෙලා තියෙන්නේ ඊළඟ ජනාධිපතිවරණෙටත් මාව යවන්න."

විලෙන් එගොඩ ඉදිවෙමින් තිබුණු අලුත් කැබින් පේළිය දිහා අපි බලා ඉන්න අතරේ එයා ටින් කෑනයක් ලැටි ගෑවා. ගොඩනැගිලි පිහිටා තිබූ ඉංග්‍රීසි හෝඩියේ 'යූ' අකුරේ හැඩය ඉක්මනින් ම ඍජුකෝණාස්‍රයක් බවට සම්පූර්ණ වේවි. උප දෙවිවරු මේ අලුත් රාජකාරියට බැහැල ම වැඩ කරේ හරි ම සතුටින්.

හේඩීස් කැබිනයේ ඉදිකිරීම් කටයුතුවලට නිකෝ පිල්ලි බාස්වරු කීප දෙනෙක් යොදාගෙන තිබුණා. එහි පදිංචි වෙන්න හිටපු එක ම ළමයා එයා විතරක් වුණත්, ඒ කැබිනය හදලා ඉවර වුණා ම නියමෙට ම තියේවි: දවසේ පැය විසි හතර ම කොළ පාට ගිනි දලු ඇවිලෙන පන්දම් සවි කරපු, ගන ඔබ්සිඩියන් පාෂාණයෙන් සෑදූ බිත්ති සහ ඉහළින් හිස්කබලක් සවි කළ දොරක් ඇති කැබිනයක්. ඊට එහායින් තිබුණේ අයිරිස්, නෙමෙසිස්, හෙකේට් සහ මම නොදන්නා තවත් දෙවිවරු කීප දෙනෙක් වෙනුවෙන් ඉදි වෙන කැබින්. එයාලා දිනපතා ම වගේ සැලසුමට අලුත් කැබින් එකතු කරමින් සිටියා. ඒ වැඩේ බොහොම හොඳින් සිදු වෙමින් තිබුණා. මේ අතරවාරේ ඇනබෙත් සහ කයිරොන් තවත් අලුත් කැබින් පෙළක් ම එකතු කරගන්න කතා වෙමින් හිටියේ, කඳවුරට ඇති තරම් ඉඩ ලබාගන්නයි.

දැන් හර්මීස් කැබිනයේ සෙනඟ ඉස්සරට වඩා ගොඩක් අඩු වෙලා තිබුණේ, එහි හිටපු හිමිකම් නොකී ළමයි ගොඩකට එයාලගේ දේවමය අම්මාගෙන් හෝ තාත්තාගෙන් සලකුණු ඇවිත් තිබුණ නිසයි. ඒක හැම රෑක ම වගේ සිද්ධ වුණා. ඒ වගේ ම හැම රෑක ම තව තවත් උප දෙවිවරු සැටර් මඟ පෙන්වන්නන් සමඟ ඉඩමේ මායිමට ඉබාගාතේ ආවා. පුරුදු විදිහට ම එයාලව එළවාගෙන මොකෙක් හරි නපුරු රාක්ෂයෙකුත් ආවත්, එයාලා හැමෝම වගේ පණ බේරගන්න සමත් වුණා.

"ඊළඟ ගිම්හානේ ගොඩක් වෙනස් එකක් වෙන්නයි යන්නේ," මම කිවුවා. "කයිරොන් හිතන්නෙ ඒ වෙද්දි කඳවුරුකාරයෝ දැන් ඉන්නවා වගේ දෙගුණයක් විතර ඉඳියි කියලා."

"ඔව්," ග්‍රෝවර් එකඟ වුණා, "ඒත් මෙතැන පරණ පුරුදු විදිහට ම තියෙයි."

එයා තෘප්තිමත් සුසුමක් හෙළුවා.

ටයිසන් සයික්ලොප්ස් ගොඩනැගිලි ඉදිකරන්නන් පිරිසක් මෙහෙයවන දිහා මම බලාගෙන හිටියා. එයාලා හෙකේට් කැබිනය ඉදිවෙන තැනට යෝධ ගල් කුට්ටි ඔසවමිනුයි හිටියේ. ඒක බොහෝම පරිස්සමෙන් කළ යුතු වැඩක් බව මම දැනගෙන හිටියා. ඒ සෑම ගල් කුට්ටියක ම මායා ලේඛන කැටයම් කරලයි තිබුණේ. ඉතින් එයාලා එකක් හරි අත ඇරියොත්, ඒක පුපුරා යාමට හෝ හැතැප්මක වපසරිය තුළ ඉන්න හැම දෙනාව ම ගහකට හරවන්න ඉඩ තිබුණා. එහෙම දෙයක් වෙනවට ග්‍රෝවර් ඇරෙන්න වෙන කවුරුවත් ම කැමති වෙන්නෙ නැති වෙයි කියලයි මට හිතුණේ.

"මට ගමන් බිමන් ගොඩක් යන්න වෙයි," ග්‍රෝවර් කල්තියා ම දැනුම් දුන්නා. "සොබාදහම ආරක්ෂා කරන්නයි, අර්ධ-ලෝහිතයන්ව හොයන්නයි. ඒ හින්දා මට සමහරවිට ඔයාව වැඩිය මුණගැහෙන්න බැරි වෙයි."

"ඒකට කමක් නෑ," මම කිවුවා. "මොනවා වුණත් ඔයා තමයි මගේ හොඳ ම යාළුවා."

එයා දත් නියෙව්වා. "ඇනබෙත් ඇරුණා ම."

"ඒක ඉතින් වෙනස් නේ."

"ඔව්," එයා එකඟ වුණා. "එහෙම තමයි."

★★★

එදා පස්වරුවේ, මම අවසාන වතාවට වෙරළ දිගේ ඇවිදිමින් ඉන්නකොට හුරුපුරුදු කටහඬක් ඇහුණා, "මාළු අල්ලන්න කියාපු දවස."

රළ ගහන සීමාවේ, දණවටක් ගැඹුරු වතුරේ හිටගෙන හිටියේ මගේ තාත්තා, පොසෙයිඩන්. එයා සුපුරුදු විදිහට ම බර්මියුඩා කොට කලිසමකින්, හම ගිය කැප් එකකින් සහ රෝස-සහ-කොළ පාට ටොමී බහමා කමිසයකින් සැරසී සිටියා. ගැඹුරු මුහුදේ මසුන් අල්ලන බිලි පිත්තක් අතේ තබාගෙන සිටි එයා, ඒක වතුරට විසි කරද්දි, තන්තුව ගොඩක් ඈතට- ලෝන්ග් අයිලන්ඩ් මුහුදු තීරයෙන් බාගයක් විතර දුරට ගියා.



"හේයි, තාත්තා," මම කතා කළා. "මේ පැත්තේ එන්න හිතුණේ මොකද?"

එයා ඇහැක් ඉඟි මැරුවා. "ඔලිම්පස්වල දි මට ඔයත් එක්ක තනියම කතා කරන්න ඉඩක් හම්බ වුණේ නැහැ නේ. මට ඕනෑ වුණේ ඔයාට ස්තුති කරන්න."

"මට ස්තුති කරන්න? ඔයා නේ අපිව බේරගන්න ආවේ."

"ඔව්, එහෙම කරන්න ගිහිල්ලා මගේ මාලිගාවත් විනාශ වුණා, ඒත් ඔයා දන්නවා නේ- මාලිගාවල් අලුතින් හදන්න පුළුවන්. මට අනිත් දෙවිවරුන්ගෙන් කොච්චර තැන්ක්-යූ කාඩ් ගොඩක් හම්බ වුණා ද දන්නව ද? අඩු ගාණේ ඒරීස් පවා එකක් එවලා තිබුණා, හැබැයි මට හිතෙන්නේ ඒක නම් හේරාගේ බල කිරිල්ලට එවන්න ඇත්තේ. ඒවා නිසා මට ගොඩාක් සතුටුයි. ඉතින්, ඔයාට ස්තුතියි. මං හිතන්නේ දෙවිවරුන්ටත් අලුත් පුරුදු ඉගෙන ගන්න පුළුවන්."

මුහුදු තීරය කැකෑරෙන්න පටන් ගත්තා. මගේ තාත්තාගේ තන්තුව කෙළවරින් යෝධ කොළ පාට මුහුදු සර්පයෙක් දියෙන් උඩට මතු වුණා. ඌ දඟලමින් පොර බැදුවා, ඒත් පොසෙයිඩන් සුසුමක් හෙළුවා විතරයි. එයා එක අතකින් බිලි පිත්ත අල්ලගෙන ඉන්න අතරේ ම, අනෙක් අතින් පිහිය ඇදලා අරන් තන්තුව කපා දැමුවා. රාක්ෂයා දිය යටට ගිලුණා.

"කෑමට ගන්න තරම් ලොකු නෑ," එයා මැසිවිලි නැඟුවා. "මට පුංචි එවුන්ව නිදහස් කරන්න වෙලා තියෙන්නේ, එහෙම නොකළොත් දඩයම් ආරක්ෂකයෝ මගේ ඔළුව කයි."

"පුංචි එවුන්?"

එයා දත් නියෙව්වා. "ඒක නෙවෙයි, ඔයාලා අර අලුත් කැබින්වල වැඩ නියමෙට කරගෙන යනවා නේ. මං හිතන්නේ, එතකොට දැන් මට මගේ ඉතුරු දුවලා, පුතාලා ඔක්කොටමත් හිමිකම් කියලා, ඊළඟ ගිම්හානෙ දී ඔයාට තව නංගිලා මල්ලිලා ටිකක් එවන්න පුළුවන් වෙයි."

"හහ්-හා."

පොසෙයිඩන් එයාගේ හිස් තන්තුව ඔතන්න ගත්තා.

මම කකුලකින් කකුලකට මාරු වුණා. "මේ, ඔයා විහිළුවක් නේද කළේ?"

පොසෙයිඩන් එයාට විතරක් තේරෙන විදිහේ විහිළුවක් කළ වෙලාවට වගේ මට ඇහැක් ගැහුවා, ඒත් එයා ඒ කතාව කිවුවේ ඇත්තටම ද, නැද්ද කියලා මට තවමත් තේරුනේ නැහැ. "මං ළඟදිම දවසක ඔයාව බලන්න එන්නම්, පර්සි. මතක තියාගන්න, ගොඩට බාගන්න තරම් ලොකු කොයි මාළුවා ද කියලා දන්නවා, නෙහ්?"

එයත් සමඟ එයා මුහුදු සුළඟට දිය වී ගියේ, බිලි පිත්ත විතරක් වැල්ල මත ඉතිරි කරමින්.

★★★

කඳවුරේ අන්තිම රැය වුණේ එදා රැයයි- ඒ කියන්නේ පබළු ප්‍රදානය කිරීමේ උත්සවය. මේ අවුරුද්දේ පබළුව නිර්මාණය කර තිබුණේ හෙෆාස්ටස් කැබිනයයි. එයින් නිරූපණය වූ එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල වටා ඔලිම්පස් ආරක්ෂා කිරීමට දිවි දුන් සියලූ ම විරුවන්ගේ නම් සිඟිති ග්‍රීක අකුරුවලින් සර්පිලාකාරව කැටයම් කර තිබුණා. එහි නම් ගොඩාරියක් තිබුණා වුණත්, ඒ පබළුව පලඳින්න ලැබීම ගැන මම ආඩම්බර වුණා. මම එයත් මගේ කඳවුරු මාලයට අමුණා ගත්තා- දැන් ඒකට පබළු හතරක් තිබුණා. මට දැනුණේ මම තලතුනා කෙනෙක් වෙලා වගෙයි. වයස අවුරුදු දොළහේ දී මම සහභාගී වුණ පළවෙනි කඳවුරු ගිනි මැලය ගැනත්, එදා මගේ ම ගෙදර වගේ කඳවුර දැනුණු හැටිත් මට සිහි වුණා. අඩු තරමේ ඒක නම් තවමත් වෙනස් වෙලා නැහැ.

"මේ ගිම්හානේ ජීවිතේට අමතක වෙන්නෙ නැහැ!" කයිරොන් අපිට කිවුවා. එයා පුදුම හිතෙන තරම් හොඳින් සනීප වෙලා හිටියා, හැබැයි එයා තවමත් ගිනි මැලය ඉදිරියේ ඇවිද්දේ යාන්තමින් තොණ්ඩි ගහමින්. "අපිට මේ ගිම්හානෙ දී නිර්භීතභාවය, මිත්‍රත්වය වගේ ම ධෛර්යයත් හොයාගන්න ලැබුණා. අපි අපේ කඳවුරේ ගෞරවය රැකගත්තා."

එයා මට හිනාවක් පාද්දී, හැමදෙනා ම ඔල්වරසන් හඬ නැඟුවා. ගිනි මැලය දිහාවට ඇස් යොමු කළ මට දකින්න ලැබුණේ දුඹුරු පාට ගවුමකින් සැරසුණු පුංචි ගෑනු ළමයෙක් ගින්න රැකබලා ගනිමින් ඉන්න හැටියි. එයා දිලිසෙන රතු ඇස්වලින් මට ඉඟිමැරුවා. එයාව වෙන කාගෙවත් සැලකිල්ලට හසු වුණ බවක් පෙනුනේ නැහැ, ඒත් එයා කැමති ඒ විදිහට වෙන්න ඇති කියලා මම හිතුවා.



"දැන් එහෙනම්," කයිරොන් කිවුවා, "වේලපහ ඇඳවල්වලට යමු! මතකයි නේ, ලබන අවුරුද්ද අපිත් එක්ක ඉන්න කටයුතු සූදානම් කරගෙන නැති හැමෝම හෙට ඉර මුදුන් වෙද්දි තම තමන්ගේ කැබින්වලින් පිටවෙන්න ඕනෑ. හැංගිලා ඉන්න කාව වුණත් පිරිසිදු කිරීම්වලට එන හාර්පිලා කාලා දායි, ඒ වගේ අප්‍රසන්න දේකින් මේ ගිම්හානේ ඉවර කරන්න මම නම් කැමති නැහැ!"

★★★

ඊළඟ උදෑසන ඇනබෙත් සහ මම අර්ධ-ලෝහිත කඳු මුදුනේ හිටගෙන හිටියා. කඳවුරුකරුවන්ගෙන් වැඩි දෙනෙක්ව ආපසු සැබෑ ලෝකයට අරගෙන බස් සහ වෑන් රථ පිටත් වෙන දිහා අපි බලා සිටියා. ජ්‍යෙෂ්ඨ කඳවුරුකරුවෝ කීප දෙනෙක් වගේ ම, අලුතෙන් ආව අය කීප දෙනෙකුත් කඳවුරේ නවතීවි, ඒත් මම නම් ගුඩ් උසස් පාසලේ මගේ දෙවෙනි අවුරුද්දේ අධ්‍යාපන කටයුතු පටන් ගන්න ආපහු යනවා- ජීවිතේ පළවෙනි වතාවට මට එක ම පාසලේ අවුරුදු දෙකක් ඉන්න පුළුවන් වෙලා.

"සුබ ගමන්!" ගමන් මල්ල කරේ එල්ලා ගනිමින් රේචල් අපිට කිවුවා. එයා හිටියේ ටිකක් කලබල වෙලා වගෙයි, ඒ වුණත් එයා නිව් හැම්ෂයර්වල ක්ලැරියන් බාලිකා විද්‍යාලයට යන්න එයාගේ තාත්තාට දුන් පොරොන්දුව කඩ නොකරන්න වගබලා ගත්තා. අපිට ආපහු අපේ ඔරකල්ව දකින්න ලැබෙන්නේ ඊළඟ ගිම්හානයේදියි.

"ඔයාට වැඩ ටික හොඳට කරගන්න පුළුවන් වෙයි." ඇනබෙත් එයාව වැලඳ ගත්තා. පුදුමේ කියන්නේ මේ දවස්වල එයා රේචල් එක්ක සෑහෙන්න එකතු වෙලයි හිටියේ.

රේචල් තොල හපාගත්තා. "මාත් ප්‍රාර්ථනා කරන්නෙ ඒක ම තමයි. මම ටිකක් විතර කරදරෙන් ඉන්නේ. ඊළඟ ගණිත විභාගෙට මොනවද එන්නෙ කියලා කවුරුහරි මගෙන් අහද්දි, මම ජ්‍යාමිතිය පන්තිය මැද අනාවැකියක් වමාරන්න ගත්තොත් කොහොමද? 'පයිතග රස්ගේ ප්‍රමේය දෙවෙනි ගැටළුව ලෙස ලැබෙනු ඇත...' දෙයියනේ, මට පොළොව පලාගෙන යන්න හිතෙයි."

ඇනබෙත් මහ හඬින් හිනා වුණා. ඒකෙන් රේචල්ගේ මූණටත් හිනාවක් නැඟුණේ මගේ හිත සැහැල්ලු කරමින්.

"හොඳයි," එයා කිවුවා, "ඔයාලා දෙන්නට දෙන්නා හොඳින් ඉන්න."

අනේ මන්දා. ඒ වුණත්, පුරුද්දක් විදිහට බාල්දි පෙරළගන්න කෙනෙක් දිහා බලනවා වගේ එයා මගේ දිහා බලපු බැල්ම නම් මට ඇල්ලුවේ නැහැ. මට ඒකට විරෝධය පාන්න ඉඩක් ලැබෙන්න කලින්, අපිට පුබ පැතු රේචල්, එයාගේ වාහනය අල්ල ගන්න කන්ද පහළට දිව්වා.

දෙවියන්ට ස්තුති වෙන්න, ඇනබෙත් මේ වාරේ නිව්යෝර්ක්වල ම නවතිනවා. එයා නගරයේ තිබුණු නේවාසික පාසලකට යන්න දෙමව්පියන්ගෙන් අවසර අරගෙන තිබුණේ, එතකොට එයාට ඔලිම්පස්වලට කිට්ටුවෙන් ඉඳගෙන, නැවත ගොඩ නැගෙන ගොඩනැගිලි බලා කියාගන්න හැකි වෙන්නයි.

"ඒ වගේම මට කිට්ටුවෙන් ඉන්නත් පුළුවන් නේ?" මම ඇහුවා.

"හොඳයි, සමහරු නම් තමන්ගේ වැදගත්කම ගැන මහ ඉහළින් හිතාගෙන ඉන්නවා වගෙයි." ඒ වුණත් එයා එයාගේ අත මගේ අතැඟිලි අතර පටලවා ගත්තා. නිව්යෝර්ක්වල දි එයා මට කියා තිබුණු දේ- එයාට මොකක් හරි ස්ථිරසාර දෙයක් ගොඩ නගන්න ඕනෑ කියපු කතාව මට සිහි වුණා. ඒ වෙලාවේ මට හිතුණේ- සමහරවිට- අපි දැනටමත් ඒ වගේ දේකට හොඳ පදනමක් දමා අවසන් කියලයි.

රන් බැටළු ලොම් සළුව යට, පයින් ගහ වටා දරණ ගසාගත් මුර මකරා පෙලියස් ගොරවන්න පටන් ගත්තේ, සෑම හුස්මක් සමඟ ම හුමාලය පිඹිමින්.

"ඔයා හිත හිතා හිටියේ රේචල්ගේ අනාවැකිය ගැන ද?" මම ඇනබෙත්ගෙන් ඇහුවා.

එයා රවා බැලුවා. "ඔයා කොහොමද ඒක දන්නේ?"

"මොකද මම ඔයාව දන්නවා නේ."

එයා මට උරහිසෙන් ගැහුවා. "හරි, මං හිතුවා තමයි. 'අර්ධ-ලෝහිතයෝ සත් දෙනෙක් කැඳවීමට පිළිතුරු දෙයි.' එයාලා කවුරු වෙයි ද කියලයි මට පුදුම. ඊළඟ ගිම්හානේ වෙනකොට අපිට අලුත් මූණු ගොඩක් ලැබෙන්නයි යන්නේ."

"ඔව්," මම එකඟ වුණා. "එතකොට අර ගින්නෙන් හරි කුණාටුවෙන් හරි ලෝකෙ ඇද වැටෙනවා කිවුව කතාව."

එයා දෙතොල් තදින් පියවා ගත්තා. "එතකොට මරණයේ දොරටුව වෙනුවෙන් හතුරෝ අත්වැල බැඳගන්නවලු. අනේ මන්දා,



පර්සි, ඒත් මම නම් ඒකට කැමති නැහැ. මං හිතුවේ... මෙහෙමයි, සමහරවිට වෙනසකටත් එක්ක අපිට ටිකක් නිවිහැනහිල්ලේ ඉන්න ලැබුණොත් හොඳයි කියලා."

"නිවිහැනහිල්ලේ ඉන්න පුළුවන් තැනක් වුණොත් මේක අර්ධ-ලෝහිත කඳවුර නෙවෙයි," මම කිවුවා.

"මං හිතන්නේ ඔයා හරි... සමහරවිට ඒ අනාවැකිය තව අවුරුදු ගාණකට සිද්ධ නොවෙන්න පුළුවන්."

"ඒක වෙන ම උප දෙවි පරම්පරාවක ප්‍රශ්නයක් වෙන්නත් පුළුවන්." මම එයා කියූ දේට එකඟ වුණා. "එතකොට අපිට පාඩුවේ පැත්තකට වෙලා විනෝද වෙන්න පුළුවන්."

එයා ඔළුව වැනුවත්, එයා තවමත් හිටියේ නොසන්සුන්ව වගෙයි. එයාට දොස් කියන්න මට බැහැ, ඒ වුණත් මෙච්චර ලස්සන දවසක, එයාට ඇත්තට ම සමු දෙන්න මට සිද්ධ නොවෙන බව දැනගෙන, එයා ළඟින් ඉන්න මේ වගේ වෙලාවක ඕනෑවට වඩා හිත අවුල් කරගන්න ලේසි වුණේ නැහැ. අපිට ඕනෑ තරම් තව කාලය තිබුණා.

"පාරට යනකල් තරගෙට දුවමු ද?" මම ඇහුවා.

"ඔයා පරදින්නයි යන්නේ." එයා අර්ධ-ලෝහිත කන්ද පහළට දුවද්දී, මම එයා පසුපස දිව්වා.

මේ වතාවේ දි නම්, මම ආපහු හැරිලා බැලුවෙ නැහැ.

■■■

Scanned with CamScanner